පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ භාවිතයට පහසු යුනිකේත අකුරු ක්‍රමයට සකසා **http://pitaka.lk** වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# මජ්ඣිම නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ
මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ
කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ
වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ
බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ
බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ
රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ
අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ
අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ
ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ
බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ
මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ
රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේ
මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ
පණ්ඩිත එච්. නන්දසාර මහතා
ආචාර්‍ය්‍ය ආර්‍ය්‍යරත්න රේරුකාන මහතා

පටුන



# මජ්ඣිම නිකාය

# 2

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

**ඒ. පී. ද සොයිසා මහතා**

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1954
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**මජ්ඣිම නිකාය 2**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඥාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.
http://pitaka.lk

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මඟ පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| | | පිට |
|---|---|---|
| 30 | චූලසාරෝපම සූත්‍රය | 469 |
| 31 | චූල ගොසිඞ්ග සූත්‍රය | 480 |
| 32 | මහා ගොසිඞ්ග සූත්‍රය | 493 |
| 33 | මහා ගොපාල සූත්‍රය | 506 |
| 34 | චූල ගොපාලක සූත්‍රය | 515 |
| 35 | චූල සච්චක සූත්‍රය | 518 |
| 36 | මහා සච්චක සූත්‍රය | 535 |
| 37 | චූල තණ්හා සංඛය සූත්‍රය | 561 |
| 38 | මහා තණ්හා සංඛය සූත්‍රය | 569 |
| 39 | මහා අස්සපුර සූත්‍රය | 600 |
| 40 | චූල අස්සපුර සූත්‍රය | 617 |
| 41 | සාලෙය්‍යක සූත්‍රය | 635 |
| 42 | වෙරඤ්ජක සූත්‍රය | 649 |
| 43 | මහා වෙදල්ල සූත්‍රය | 662 |
| 44 | චූල වෙදල්ල සූත්‍රය | 674 |
| 45 | චූල ධම්ම සමාදාන සූත්‍රය | 683 |
| 46 | මහා ධම්ම සමාදාන සූත්‍රය | 689 |
| 47 | වීමංසක සූත්‍රය | 699 |
| 48 | කොසම්බිය සූත්‍රය | 704 |
| 49 | බ්‍රහ්ම නිමන්තණික සූත්‍රය | 712 |
| 50 | මාර තජ්ජනිය සූත්‍රය | 726 |


**මජ්ඣිම පණ්ණාසකය**


| | | |
|---|---|---|
| 1 | කන්දරක සූත්‍රය | 738 |
| 2 | අට්ඨක නාගර සූත්‍රය | 754 |
| 3 | සෙඛ සූත්‍රය | 764 |

| | | |
|---|---|---|
| 4 | පොතලිය සූත්‍රය | 775 |
| 5 | ජීවක සූත්‍රය | 790 |
| 6 | උපාලි සූත්‍රය | 797 |
| 7 | කුක්කුරවතිය සූත්‍රය | 820 |
| 8 | අභය (රාජ කුමාර) සූත්‍රය | 828 |
| 9 | බහු වේදනීය සූත්‍රය | 835 |
| 10 | අපණ්ණක සූත්‍රය | 842 |
| 11 | අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය | 872 |
| 12 | මහා රාහුලෝවාද සූත්‍රය | 882 |
| 13 | චූල මාලුඞ්ක්‍ය සූත්‍රය | 889 |
| 14 | මහා මාලුඞ්ක්‍ය සූත්‍රය | 900 |
| 15 | භද්දාලී සූත්‍රය | 910 |

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ පස්වෙනිවූ මේ පොතට මජ්ඣිම නිකායෙන් සූත්‍ර තිස් හයක් පිළිවෙළට අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මජ්ඣිම නිකාය එක සඟියකි. සඟියේ සූත්‍ර මධ්‍යම ප්‍රමාණවූ බැවින් ඊට මජ්ඣිම නිකාය යන නාමය යෙදේ. එහි ඇති සූත්‍ර එකසිය පනස් දෙක මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරි පණ්ණාසකයයි පණ්ණාසක තුනකට බෙදා තිබේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, තමන්ට වැඩි සනීපයක්ද නැතුව සිටින නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයඹීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඹීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද ගුණපාල වීරසේකර මහත්මයාද ආධාර කළෝය.

ශොධ්‍යපත්‍ර බැලීමාදියෙන් උපකාර කළ අමරදාස පියසිරි මහත්මයාටද, සෝමා සේනානායක මහත්මියටද, ආයඹීවතී පෙරේරා මහත්මියටද අපේ අවංක ස්තුතිය පිරිනමමු. මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

474, ගාලුපාර,
කොල්ලුපිටිය.
19-12-53,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# මජ්ඣිම නිකාය

## 30. චූලසාරොපම සූත්‍රය.

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

1. **මා** විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර, අනේපිඩු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වෙසෙති, එකල්හි වනාහි පිංගලකොච්ඡ නම් බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතු සිහි කටයුතු කථාව කොට නිමවා එක්පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ පිංගලකොච්ඡ බුමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

"භවත් ගෞතමයන් වහන්ස, පැවිදිවූ සංඝ සමූහයා ඇත්තා වූද එබඳු සමූහයාගේ ගුරුන්වූද ප්‍රසිද්ධ වූද කීර්තිය ඇත්තා වූද බොහෝ දෙනා විසින් උතුමන්යයි සම්මත කරන ලද්දාවූද යම් මේ ශ්‍රමණ බ්‍රහ්මණ කෙනෙක් ඇත්තාහුද එනම්, පූරණකස්සපය, මක්ඛලිගොසාලය, අජිත කෙසකම්බලීය, පකුධකච්චායනය, සංජය බෙල්ලට්ඨී පුත්තය, නිගණ්ඨනාත පුත්තය යන මොහුය. ඒ සියලු දෙන ඔවුන් කියන්නාසේම දැනගත්තාහුද? සියලු දෙනාම එසේ නොදැනගත්තාහුද? නැතහොත් සමහරු දැනගත්තාහුද, සමහරු නොදැන ගත්තාහුද?

2. "බ්‍රාහ්මණය, ඒ සියලුදෙන ඔවුන් කියන්නාසේම දැනගත්තාහුද? සියලු දෙනාම එසේ නොදත්තාහුද? නැතහොත් සමහරු දැනගත්තාහුද? සමහරු නොදැනගත්තාහුද? යන මේ දැනගැණීමෙන් වැඩක් නැත. ඒ ප්‍රශ්ණය තිබේවා! බ්‍රාහ්මණය, මම තොපට ධර්මය දෙශනා කරන්නෙමි. එය අසව්, හොඳින් සිහි කරව්"යි (භාග්‍යවතුන් වහන්සේ වදාළහ.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"එසේය පින්වතුන් වහන්සැයි" පිංගලකොච්ඡ බමුණු තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා එලය ඉක්මවා, පොත්ත ඉක්මවා, සුඹුල ඉක්මවා අරටුවයයි සිතා අතු හා දලු සිඳ ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඔහු දැක මෙසේ කියන්නේය. "මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය, එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය, අතු හා දලු නොදත්තේය. එනිසා මේ පින්වත් පුරුෂයා, අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි ගසක අරටුව ඉක්මවා එලය ඉක්මවා, පොත්ත ඉක්මවා, සුඹුල ඉක්මවා අරටුවයයි සිතා අතු හා දලු සිඳ ගෙනයන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදු වන්නේය' කියායි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා, එලය ඉක්මවා පොත්ත ඉක්මවා අරටුවයයි සිතා සුඹුල ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය, එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, සුඹුල නොදත්තේය, අතු හා දලු නොදත්තේය, ඒ නිසා මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි ගසක අරටුව ඉක්මවා, එලය ඉක්මවා පොත්ත ඉක්මවා අරටුවයයි සිතා සුඹුල සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදු වන්නේය'කියායි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක පිහිටි) අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා, එලය ඉක්මවා, අරටුව යයි සිතා පොත්ත සිඳ ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය. එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය, අතු හා දලු නොදත්තේය, ඒ නිසා මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ, අරටුව ඉක්මවා එලය ඉක්මවා අරටුවයයි සිතා පොත්ත සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඒ වැඩය නොසිදු වන්නේය'කියායි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා, අරටුවයයි සිතා එලය සිඳ ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව නොදත්තේය, එලය නොදත්තේය, පොත්ත නොදත්තේය, පතුරු නොදත්තේය, අතු හා දලු නොදත්තේය. ඒ නිසා මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයෝජන ඇත්තේ අරටු සොයන්නේ අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා අරටුව යයි සිතා එලය සිඳගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදු වන්නේය' කියායි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුවයයි දැනගෙනම අරටුව සිඳ ගෙන යන්නේය. ඇස් ඇත්තාවූ පුරුෂයෙක් ඒ ඔහු දැක මෙසේ කියන්නේය. 'මේ පින්වත් පුරුෂයා ඒකාන්තයෙන් අරටුව දන්නේය, එලය දන්නේය, පොත්ත දන්නේය, පතුරු

දන්නේය, අතු හා දලු දන්නේය. ඒ නිසා මේ පින්වත් පුරුෂයා අරටුවෙන් ප්‍රයොජන ඇත්තේ, අරටු සොයන්නේ, අරටු සොයමින් හැසිරෙන්නේ (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුවයයි දැනගෙනම අරටුව සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය සිදු වන්නේය' කියායි.

3. 'බ්‍රාහ්මණය, එපරිද්දෙන්ම මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක්, ඉපදීමෙන්ද, ජරාවෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැලපීමෙන්ද, කායික දුකින්ද, මානසික දුකින්ද දැඩි වෙහෙසින්ද මැඩුනේ වෙමි, දුකින් මැඩුනේ වෙමි, දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාශියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයිද, හෙතෙම මෙසේ පැවිදි වූයේම ලාභ, සත්කාර, කීර්ති, ප්‍රශංසා උපදවයිද, ඔහු ඒ සත්කාර කීර්තිය නිසා සතුටට පැමිණෙයිද, සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයිද, ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස්කොට සිතයිද, අනුන් පහත්කොට සිතයිද, 'මම ලාභ සත්කාර කීර්ති ඇත්තෙක් වෙමි. අන්‍යවූ මේ භික්ෂූහු ප්‍රසිද්ධ නැත, පහත්ය'යි (සිතයි.) ඔහු ඒ ලාභ සත්කාර කීර්තියට වඩා අතිශයින් උසස් වූ ඉතා ප්‍රණීතවූ යම් ඒ (මාර්ග ඵල ආදී) ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත නූපදවයිද, උත්සාහ නොකරයිද, පසුබටවූ පැවතුම් ඇත්තේ, ලිහිල් වූ වීර්‍ය්‍යය ඇත්තේ වෙයිද,

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහගසක අරටුව ඉක්මවා, ඵලය ඉක්මවා, පොත්ත ඉක්මවා, සුඹුලු ඉක්මවා අරටුවයයි සිතා අතු හා දලු සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදුවන්නේය. බ්‍රාහ්මණය, මම මේ පුද්ගලයාද ඒ අරටුව සොයන පුරුෂයා වැනියයි කියමි.

4. "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ඉපදීමෙන්ද ජරාවට පැමිණීමෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද,

වැලපීමෙන්ද, කායික දුකින්ද, මානසික දුකින්ද දැඩි වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාසියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැ'යි, (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයිද, හෙතෙම මෙසේ පැවිදි වූයේම ලාභ සත්කාර කීර්ති උපදවයිද, ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටට නොපැමිණෙයිද, සම්පූර්ණ වූ අදහස් ඇත්තේ නොවෙයිද, ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයිද, අනුන් පහත් කොට නොසිතයිද,

"ඔහු ඒ ලාභ සත්කාර කීර්තියට වඩා ඉතා උසස්වූ ඉතා ප්‍රණීතවූ, යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර, ගැණීම පිණිස කැමැත්ත උපදවයිද, උත්සාහ කරයිද, හෙතෙමේ නොපසුබට වූ පැවතුම් ඇත්තේ සීල සම්පත්තිය සම්පූර්ණ කරයිද, ඔහු ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයිද, සම්පූර්ණ වූ අදහස් ඇත්තේ වෙයිද, ඔහු ඒ සීල සම්පත්තිය නිසා 'අන්‍යවූ මේ භික්ෂූහු දුස්සීලයෝය, පවිකම් ඇත්තෝය'යි තමන් උසස් කොට සිතයිද, අනුන් පහත් කොට සිතයිද, ඔහු ඒ සීල සම්පත්තියට වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත් කර ගැණීම පිණිස කැමැත්ත නොඋපදවයි, උත්සාහ නොකරයි. පසුබටවූ පැවතුම් ඇත්තේ වෙයි. ලිහිල්වූ වීර්‍ය්‍යය ඇත්තේ වෙයි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා, එලය ඉක්මවා පොත්ත ඉක්මවා අරටුවයයි සිතා සුඹුල සිඳගෙන යන්නේද ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේ නම් ඒ වැඩය නොසිදු වන්නේය. බ්‍රාහ්මණය, මම මේ පුද්ගලයාද ඒ අරටුව සොයන පුරුෂයා වැනියයි කියමි.

5. "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ඉපදීමෙන්ද, ජරාවට පැමිණීමෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැලපීමෙන්ද, කායික දුකින්ද, මානසික දුකින්ද, දැඩි වෙහෙසින්ද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාසියගේ කෙළවර කිරීමක් පෙනේ නම් ඉතා යෙහෙකැයි (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයිද, හෙතෙම මෙසේ පැවිදි වූයේම ලාභ සත්කාර කීර්ති යන මේවා උපදවයිද, ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටු වෙයිද, සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයිද, ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයිද, අනුන් පහත් කොට නොසිතයිද.

"ඔහු ඒ ලාභ සත්කාර කීර්තියට වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි, උත්සාහ කරයි, නොපසුබට වූ පැවතුම් ඇත්තේ, පටන්ගත් වීයර්‍ය ඇත්තේ, සීල සම්පත්තිය සම්පූර්ණ කරයිද, ඔහු ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයිද, සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයිද, ඔහු ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයිද, අනුන් පහත් කොට නොසිතයිද, ඒ සීල සම්පත්තියටද වඩා ඉතා උසස් වූද, ඉතා ප්‍රණීත වූද, යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසු බට වූ පැවතුම් ඇත්තේ පටන් ගත් වීයර්‍ය ඇත්තේ, ඔහු සමාධි සම්පත්තිය සම්පූර්ණ කරයිද, ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා සතුටු වෙයිද, සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයිද, ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා, මම 'සංසිඳුනු සිත් ඇත්තේ වෙමි. එකඟවූ සිත් ඇත්තේ වෙමි. අන්‍ය වූ මේ භික්ෂූහු නොසංසිඳුනු සිත් ඇත්තෝ, කැලඹුන සිත් ඇත්තෝ වෙති'යි තමන් උසස් කොට සිතයිද, අනුන් පහත් කොට සිතයිද,

ඒ සමාධි සම්පත්තියටද වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීත වූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත නූපදවයිද, උත්සාහ නොකරයිද, පසුබට වූ පැවතුම් ඇත්තේ ලිහිල්වූ වීයර්‍ය ඇත්තේ වෙයිද,

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තා වූ අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම්

තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුව ඉක්මවා, එලය ඉක්මවා අරටුවයයි සිතා පොත්ත සිඳ ගෙන යන්නේය. ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද, ඒ වැඩය නොසිදු වන්නේය. බ්‍රාහ්මණය, මම මේ පුද්ගලයාද ඒ සාර පරියෙසක (අරටු සොයන) පුද්ගලයා වැනියයි කියමි.

**6.** "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඉපදීමෙන්ද, ජරාවට පැමිණීමෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැලපීමෙන්ද, කායික දුකින්ද, මානසික දුකින්ද, දැඩි වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාසියගේ කෙළවර කිරීම පෙනේ නම් ඉතා යෙහෙකැයි, (සිතා) ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම සිව්පසය ලැබීමය, සත්කාර ලැබීමය, ගුණ කීමය යන මේවා උපදවයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටු වෙයි. සම්පූර්ණ වූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයි, අනුන් පහත් කොට නොසිතයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තියට වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි, උත්සාහ කරයි. නොපසු බටවූ පැවතුම් ඇත්තේ වෙයි. පටන් ගත් වීර්‍ය්‍යය ඇත්තේ සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. ඔහු ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයි. සම්පූර්ණ වූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. ඒ සීල සම්පත්තියටද වඩා ඉතා උසස් වූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසු බටවූ පැවතුම් ඇත්තේ පටන් ගත් වීර්‍ය්‍යය ඇත්තේ සමාධි සම්පත්තිය උපදවයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. ඒ සමාධි සම්පත්තියටද වඩා ඉතා උසස් වූද, ප්‍රණීත වූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත් කර

ගැණීම සඳහා කැමැත්ත උපදවයි, උත්සාහ කරයි. නොපසුබටවූ පැවතුම් ඇත්තේ, පටන් ගත් වීර්‍ය්‍යය ඇත්තේ ඥාන දර්ශන (පංච අභිඥාව) උපදවයි. ඔහු ඒ ඥාන දර්ශනයෙන් (පංච අභිඥාවෙන්) සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ වෙයි. ඔහු ඒ ඥාන දර්ශනය (පංච අභිඥාව) නිසා තමන් උසස් කොට සිතයි. අනුන් පහත්කොට සිතයි. 'මම දන්නෙමි, දකින්නෙමි, අන්‍යවූ මේ භික්ෂූහු නොදන්නේ නොදක්නේ වාසය කරති' (කියායි.) ඒ ඥාන දර්ශනයටද වඩා ඉතා උසස්වූද, ප්‍රණීතවූ යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීමට කැමැත්ත නූපදවයි. උත්සාහ නොකරයි, පසුබටවූ පැවතුම් ඇත්තේ වෙයි. ලිහිල්වූ වීර්‍ය්‍යය ඇත්තේ වෙයි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි ගසක අරටුව ඉක්මවා අරටුවයයි සිතා එලය සිඳගෙන යන්නේද, ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය නොසිදු වන්නේය. බ්‍රාහ්මණය, මම මේ පුද්ගලයා ඒ සාර පරියෙසක (අරටු සොයන) පුරුෂයා වැනියයි කියමි.

7 "බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් 'ඉපදීමෙන්ද, ජරාවට පැමිණීමෙන්ද, මරණයෙන්ද, ශොකයෙන්ද, වැළපීමෙන්ද, කායික දුකින්ද, මානසික දුකින්ද, දැඩි වෙහෙසින්ද මැඩුනේ වෙමි. දුකින් මැඩුනේ වෙමි. දුකින් පීඩා විඳින්නේ වෙමි. මේ සියලු දුක් රාසියගේ නැති කිරීම පෙනේ නම් ඉතා යෙහෙකැ'යි (සිතා) ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම ලාභ, සත්කාර, කීර්තිය යන මේවා උපදවයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස ඇත්තේ නොවෙයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසිතයි. ඔහු ඒ ලාභ සත්කාර කීර්තියටද වඩා ඉතා උසස් වූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසුබට වූ පැවතුම් ඇත්තේ පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තේ

සීල සම්පත්තිය සම්පූර්ණ කරයි. ඔහු ඒ සීල සම්පත්තියෙන් සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ සීල සම්පත්තිය නිසා තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. ඒ සීල සම්පත්තියටද වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද, යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසුබටවූ පැවතුම් ඇත්තේ පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තේ සමාධි සම්පත්තිය උපදවයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ සමාධි සම්පත්තිය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. ඒ සමාධි සම්පත්තියටද වඩා ඉතා උස්සවූද, ඉතා ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසුබටවූ පැවතුම් ඇත්තේ පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තේ ඥානදර්ශනය (පංච අභිඥාව) උපදවයි. ඔහු ඒ ඥානදර්ශනය නිසා සතුටු වෙයි. සම්පූර්ණවූ අදහස් ඇත්තේ නොවෙයි. ඔහු ඒ ඥාන දර්ශනය නිසා තමන් උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. ඒ ඥානදර්ශනයටද වඩා ඉතා උසස්වූද, ප්‍රණීතවූද යම් ඒ ධර්මයෝ වෙද්ද ඒ ධර්මයන් අත්කර ගැණීම පිණිස කැමැත්ත උපදවයි. උත්සාහ කරයි. නොපසුබටවූ පැවතුම් ඇත්තේ වෙයි. පටන්ගත් වීර්‍ය්‍යය ඇත්තේ වෙයි.

8. 'බ්‍රාහ්මණය, ඒ ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද, ප්‍රණීතවූද, ඒ ධර්මයෝ කවරහුද යත්?

"බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාම වස්තූන් ගෙන් වෙන්ව, විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇතිකරන්නාවූ සිතෙහි එකඟ බවයයි කියනලද විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන්

හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවැනිවූ ධ්‍යානයට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥාන දර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද ඒ භික්ෂුව ප්‍රීතියෙන් වෙන්වී මෙන්ද, උපේක්ෂාව (මැදහත් බව) ඇතිවද වාසය කරයි සිහියෙන් යුක්තවූයේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ කයින් සැපය විඳියි. යමක් උපෙක්ෂා සහිතවූයේ සිහියෙන් යුක්තවූයේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ (බුද්ධාදිඋත්තමයෝ) කියත්ද. ඒ තුන්වැනිවූ ධ්‍යානයට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීත වූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව (කායික) සැපය දුරු කිරීමෙන්ද, (කායික) දුක දුරු කිරීමෙන්ද පෙරමෙන් සතුට හා අසතුට (චෛතසික සැප දුක්) දුරු කිරීමෙන්ද, දුක් නැත්තාවූ සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් (මැදහත් බවෙන්) හටගත් පිරිසිදු සිහිය ඇති සතර වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥාන දර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

**9.** "බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මීම හේතු කොට ගෙන, ගැටීම් සංඥාවන්ගේ විනාශයෙන්ද, නානත්ත සංඥාවන්ගේ සිහි නොකිරීමෙන්ද, අනන්ත ආකාසය" යි (කියා) ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. බ්‍රාහ්මණය, මෙයද ඥාන දර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතන සමාපත්තිය ඉක්මවා, 'අනන්තවූ විඤ්ඤාණය'යි (කියා) විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ඉක්මවා 'කිසිවක් නැතැ'යි

(කියා) ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස් වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, නැවතද භික්ෂුව සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරන්නේය. ප්‍රඥාවෙන්ද දැකීමෙන් ඔහුගේ කෙලෙස් විනාශ වූවාහු වෙති. "බ්‍රාහ්මණය, මෙයද ඥානදර්ශනයට වඩා ඉතා උසස්වූද ඉතා ප්‍රණීතවූද ධර්මයකි.

"බ්‍රාහ්මණය, යම්සේ අරටුවෙන් ප්‍රයෝජන ඇත්තාවූ, අරටු සොයන්නාවූ, අරටු සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් (යම් තැනක) පිහිටි අරටුව ඇති මහ ගසක අරටුවයයි දැනගෙනම අරටුව සිඳගෙන යන්නේ ඔහුට අරටුවෙන් යම් වැඩක් ඇත්තේද ඒ වැඩය හොඳින් සිදුවන්නේය.

"බ්‍රාහ්මණය, මම මේ පුද්ගලයාද ඒ සාර පරියෙසක (අරටුව සොයන) පුරුෂයා වැනියයි කියමි.

10. "බ්‍රාහ්මණය, මෙසේ මේ ශාසන බ්‍රහ්මචරියාව ලාභ සත්කාර කීර්තිප්‍රශංසා පිණිස නොවන්නේය. සීල සමාපත්තිය පිණිස නොවන්නේය, ඥාන දර්ශනය පිණිස නොවන්නේය. බ්‍රාහ්මණය, යම් අර්හත් ඵල සමාධියක් වේද, බ්‍රාහ්මණය, මේ ශාසන බ්‍රහ්මචය්‍යීය මෙය අර්ථ (ප්‍රධාන) කොට ඇත්තේය. මෙය හරයයි. මේ අර්හත් ඵලය කෙළවරයයි" වදාළහ.

මෙසේ වදාළ කල පිංගල කොච්ඡ බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

"පින්වත් ගෞතමයන් වහන්ස, ධර්ම දෙශනාව යහපත්ය, පින්වත් ගෞතමයන් වහන්ස, ධර්ම දෙශනාව ඉතා යහපත්ය, පින්වත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ යම්සේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ යම්සේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහණක් දරන්නේ හෝ යම්සේද, එපරිද්දෙන්ම පින්වත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. මේ මම පින්වත් ගෞතමයාණන් වහන්සේද, ධර්මයද භික්ෂු සංඝයාද සරණකොට යමි. පින්වත් ගෞතමයාණන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයෙකුයයි මා දරා ගන්නා සේක්වායි" කීය.

**දසවෙනිවූ චූල සාරොපම සූත්‍රය නිමි.**

(කකචූපම සූත්‍රය, අලගද්දූපම සූත්‍රය, වම්මික සූත්‍රය, රථවිනීත සූත්‍රය, නිවාප සූත්‍රය, අරිය පරියෙසන සූත්‍රය, චූලහත්ථිපදොපම සූත්‍රය, මහා හත්ථිපදොපම සූත්‍රය, මහා සාරොපම සූත්‍රය, චූලසාරොපම සූත්‍රය යන සූත්‍ර දසයවූ)

**තුන්වන ඕපම්ම වර්ගයයි.**

## 31. චූලගොසිංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ නාදික නම් ගම (ගඩොලින්ම කළ හෙයින්) 'ගිඤ්ජකාවසථ' නම් වූ විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද 'ගොසිංග සාලවන' නම් වූ ආරණ්‍යයෙහි වාසය කළහ.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පල සමවතින් නැගී සිටියේ ගොසිංග සාලවන නම් ආරණ්‍ය සේනාසනය යම් තැනකද එතැනට වැඩියහ. වන පාලක පුරුෂ තෙම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුවේය. දැක, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ශ්‍රමණය, මේ වනයට

ඇතුළු නොවනු මැනවි. තමන්ට වැඩ කැමති ස්වභාව ඇත්තාවූ කුල පුත්‍රයෝ තුන් දෙනෙක් මෙහි වාසය කරති. ඔවුන්ට අපහසුවක් නොකරනු මැනවි.”

ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ, භාග්‍යවතුන් වහන්සේ සමග කරන්නාවූ වනපාලයාගේ කථාව ඇසූහ. අසා වනපාලයාට මෙසේ කීහ. “ඇවැත්නි, වනපාලයෙනි, භාග්‍යවතුන් වහන්සේ නොවලක්වව, අපගේ ශාස්තෘවූ භාග්‍යවතුන් වහන්සේ පැමිණියහ”යි (කීහ) ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේටද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේටද, මෙසේ කීහ. “එන්න ආයුෂ්මතුනි, එන්න ආයුෂ්මතුනි, අපගේ ශාස්තෘවූ භාග්‍යවතුන් වහන්සේ වැඩියහ”යි (කීහ.)

එවිට ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේ ද භාග්‍යවතුන් වහන්සේ ඉදිරියට ගමන් කොට එක නමක් භාග්‍යවතුන්වහන්සේගේ පාත්‍රය හා සිවුරු පිළිගත්තේය. එක නමක් ආසන පැණවීය. එක නමක් පා සේදීමට දිය තැබීය. භාග්‍යවතුන් වහන්සේ පනවනලද ආසනයෙහි වැඩ හිඳ පා සේදූහ. ඒ ආයුෂ්මත්හුද භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හිඳ ගත්හ. එක් පැත්තක උන්නාවූ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

**2.** “අනුරුද්ධයෙනි, කිමෙක්ද තොපට ඉරියව් ඉවසිය හැකිද? කිමෙක්ද දිවි පැවැත්විය හැකිද? කිමෙක්ද, පිණ්ඩපාතයෙන් අපහසු නොවන්නාහුද?” ස්වාමීනි, ඉවසිය හැකිය, දිවි පැවත්විය හැකිය. “ස්වාමීනි, අපි පිණ්ඩපාතයෙන් අපහසු නොවන්නෙමු”යි කීහ. “අනුරුද්ධයෙනි, කිමෙක්ද, තෙපි සමගිය, සතුටුව, විරුද්ධවාද නැතිව, කිරිත් වතුරත් මෙන් එක්ව, ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කරව්ද?”

"ස්වාමීනි, එකාන්තයෙන් අපි සමගිව, සතුටුව, විරුද්ධවාද නැතිව, කිරිත් වතුරත් මෙන් එක්ව, ඔවුනොවුන් ප්‍රිය ඇසින් දකිමින් වාසය කරමු"යි (කීහ)

"අනුරුද්ධයෙනි, තෙපි කෙසේ නම් සමගිව, සතුටුව, විරුද්ධවාද නැතිව, කිරිත් වතුරත් මෙන් එක්ව, ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වාසය කරන්නහුද?"

"ස්වාමීනි, මට මෙසේ කල්පනා වෙයි. යම්බඳුවූ මම මෙබඳුවූ සබ්‍රම්සරුන් (එකට මහණ දම් පුරන්නන්) සමග වාසය කරම්ද, ඒ මට එකාන්තයෙන් ලාභයකි, එකාන්තයෙන් හොඳ ලාභයකි' (යනුවෙනි) මේ ආයුෂ්මතුන් කෙරෙහි, ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද ඒ මාගේ මෛත්‍රී සහගත ක්‍රියා ඇත්තීය. ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත වචන ඇත්තේය. ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත සිත් ඇත්තේය. ස්වාමීනි, එසේවූ මට යම් හෙයකින් මගේ සිත යටහත් කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් අනුවම වාසය කරම් නම් යෙහෙකැයි අදහස් වෙයි. ස්වාමීනි, ඒ මම මගේ සිත යටහත්කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් අනුවම වාසය කරමි. ස්වාමීනි, අපගේ ශරීර පමණක් වෙන්ව පවත්නාහුය. සිත් වනාහි එකක්මයයි හඟිමි."

ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි මට මෙසේ කල්පනාවෙයි. යම්බඳුවූ මම මෙබඳුවූ සබ්‍රම්සරුන් (එකට මහණදම්පුරන්නන්) සමග වාසය කරම්ද, ඒ මට එකාන්තයෙන් ලාභයකි, එකාන්තයෙන් හොඳ ලාභයකි' (යනුවෙනි.) මේ ආයුෂ්මතුන් කෙරෙහි, ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත ක්‍රියා ඇත්තීය, ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත වචන ඇත්තේය. ඉදිරියෙහි ඇති තැනද ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත සිත් ඇත්තේය. ස්වාමීනි, එසේවූ මට යම් හෙයකින් මගේ සිත යටහත් කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් අනුවම වාසය කරම් නම් යෙහෙකැයි

අදහස් වෙයි. ස්වාමීනි, ඒ මම මගේ සිත යටහත් කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් අනුවම වාසය කරමි. ස්වාමීනි, අපගේ ශරීර පමණක් වෙන්ව පවත්නාහුය. සිත් වනාහි එකක්මයයි හඟිමි.”

ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. “ස්වාමීනි, මට මෙසේ කල්පනා වෙයි. ‘යම්බඳුවූ මම මෙබඳුවූ සබ්‍රම්සරුන් සමග වාසය කරම්ද, ඒ මට එකාන්තයෙන් ලාභයකි. එකාන්තයෙන් හොඳ ලාභයකි’ (යනුවෙනි) මේ ආයුෂ්මතුන් කෙරෙහි, ඉදිරියෙහි ඇති තැනද ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත ක්‍රියා ඇත්තීය. ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත වචන ඇත්තේය. ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද මෛත්‍රී සහගත සිත් ඇත්තේය.

ස්වාමීනි, එසේවූ මට යම් හෙයකින් මගේ සිත යටහත් කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත අනුවම වාසය කරම් නම් යෙහෙකැයි අදහස් වෙයි. ස්වාමීනි, ඒ මම මගේ සිත යටහත්කර තබා මේ ආයුෂ්මතුන්ලාගේ සිත් අනුවම වාසය කරමි. ස්වාමීනි, අපගේ ශරීර පමණක් වෙන්ව පවත්නාහුය. සිත් වනාහි එකක්මයයි හඟිමි.”

3. “අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත, අනුරුද්ධයෙනි, කිමෙක්ද? තෙපි අප්‍රමාද වූවාහු, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තාහු, සතර මාර්ගයෙහි යවනලද සිත් ඇත්තාහු වාසය කරව්ද?”

“ස්වාමීනි, අපි එකාන්තයෙන් අප්‍රමාද වූවාහු, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූවාහු, සතර මඟ යවනලද සිත් ඇත්තාහු වාසය කරමු.”

“අනුරුද්ධයෙනි, තෙපි කෙසේ නම් අප්‍රමාද වූවාහු, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තාහු, සතර මඟ යවනලද සිත් ඇත්තාහු වාසය කරව්ද?”

“ස්වාමීනි, මෙහි අප අතුරෙන් යමෙක් පළමු කොට ගමෙන් පිඩු පිණිස හැසිරීමෙන් ආපසු එයිද, හෙතෙම ආසන පණවයි.

පානය කළ යුතු ජලයද, පරිභොග කළයුතු ජලයද ගෙනවුත් තබයි. යමෙක් පසුව ගමින් පිඩු පිණිස හැසිරීමෙන් ආපසු එයිද, හෙතෙම ඉඳින් අනුභවයෙන් ඉතිරි ඇත්තේ වේනම්, ඉඳින් කැමැත්තේ වේනම් වළඳයි. ඉඳින් නො කැමති නම් නිල් තණ කොළ නැති තැනක හෝ, (ඉන් නැසෙන) පණුවන් නැති ජලයක හෝ පාකර හරියි. හෙතෙම ආසන තැන්පත් කර තබයි. පියයුතු පැන්ද, පරිභොග කළයුතු පැන්ද තැන්පත් කරයි. වැඩි ආහාර ලන බඳුන් නියම තැන තබයි. බොජුන් හල අමදියි, යමෙක් බොන පැන් තබන කළය හෝ, සෝදන පැන් තබන කළය හෝ, වැසිකිළියෙහි පැන් තබන කළය හෝ හිස්ව තිබෙනු දකීද, හෙතෙම එහි දිය වත්කරයි. ඉඳින් ඔහු විසින් එය නොඉසිලිය හැකි වේද, අතින් සංඥා කිරීමෙන් දෙවැන්නකු කැඳවා දෙ අත් එක්කොට අත් උඩ තබා ගැන්මෙන් ගෙන ගොස් තබයි. ස්වාමීනි, අපි ඒ සඳහාවත් කථා නොකරන්නෙමු.

"ස්වාමීනි, අපි පස් දවසකට වරක් මුළු රාත්‍රියෙහිම දැහැමි කථාවෙන් යුක්තව සමගිව හිඳිමු. ස්වාමීනි, මෙපරිද්දෙන් අපි අප්‍රමාද වූවාහු වීර්‍ය්‍යවත් වූවාහු සතර මාර්ගයෙහි යැවූ සිත් ඇත්තාහු වෙසෙමු"යි (කීහ)

4. "අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මෙසේ අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, සිවු මඟ යැවූ සිත් ඇතිව වාසය කරන්නාවූ තොප විසින් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍යභාවය ඇති කිරීමට සමර්ථවූ සැප විහරණයක් අවබොධ කරන ලද්දේද?" "ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? අපි යම් විටක කැමති වෙමු නම්, කාමයන් කෙරෙන් වෙන්වම අකුසල ධර්මයන් ගෙන් වෙන්වම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු. ස්වාමීනි, අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, මාර්ගඵලයන්ට යැවූ සිත් ඇතිව වාසය කරන්නාවූ අප විසින් මනුෂ්‍ය ධර්මයට වඩා උසස් වූ ආර්‍ය්‍යභාවය ඇති කිරීමට සමර්ථවූ මේ සැප විහරණය අවබොධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථ වූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, අපි මෙහි යම් විටෙක කැමති වෙමු නම්, (එකෙනෙහි) විතර්ක විචාර. සංසිඳවීමෙන් ඇතුළත පැහැදීම සහිත හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති, ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථ වූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ, ආර්‍ය්‍යභාවය ඇති කිරීමට සමර්ථ වූ අනික් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, (එකෙණෙහි) ප්‍රීතියෙහිද, නොඇල්මෙන් මැදහත් බවෙන් යුක්තව සිහියෙන් හා මනා නුවණින් යුක්තව කයින්ද සැපය විඳින්නෙමු. යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ සැප විහරණයකැයි ආර්‍ය්‍යයෝ කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථ වූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩි වූ, ආර්‍ය්‍ය භාවය ඇති

කිරීමට සමර්ථ වූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, (එකෙණෙහි) සැපය නැති කිරීමෙන්ද, දුක නැති කිරීමෙන්ද, පළමුව සොම්නසත් දොම්නසත් නැති කිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදුවූ සතර වැනි ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය."

5. "අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්ම වීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, සම්පූර්ණයෙන් රූප හැඟීම් ඉක්ම වීමෙන් ගැටීම් හැඟීම් දුරු කිරීමෙන්, නොයෙක් හැඟීම් මෙනෙහි නොකිරීමෙන් 'ආකාශය අනන්තය'යි ආකාසානඤ්චායතන ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථ වූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණඤ්චායතන

ධ්‍යානයට පැමිණ වාසය කරන්නෙමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇතිකිරීමට සමර්ථ වූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය.

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍යධර්මයට වැඩිවූ ආර්‍ය්‍යභාවය ඇතිකිරීමට සමර්ථවූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා 'කිසිවක් නැතැ'යි ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ මේ අනෙක් සැප විහරණය අවබොධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, මේ විහරණය ඉක්මවීම පිණිස, මේ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානයට පැමිණ වාසය කරමු. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ මේ අනෙක් සැප විහරණය අවබෝධ කරන ලද්දේය."

"අනුරුද්ධයෙනි, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධයෙනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස, මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය ඥානදර්ශනය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඇති කිරීමට සමර්ථවූ වෙනත් සැප විහරණයක් තොප විසින් අවබොධ කරන ලද්දේද?"

"ස්වාමීනි, කෙසේ නම් නැත්තේද? ස්වාමීනි, මෙහි අපි යම් විටෙක කැමැත්තෙමු නම්, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤා වෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරන්නෙමු. අප විසින් ඒ නිරොධය ප්‍රඥාවෙනුදු දැක ආශ්‍රව ධර්මයෝ නැති කරන ලදහ. ස්වාමීනි, ඒ විහරණය ඉක්මවීම පිණිස, ඒ විහරණය සංසිඳවීම පිණිස අප විසින් මේ මනුෂ්‍ය ධර්මයට වඩා උතුම්වූ ආර්‍ය්‍ය ඥානදර්ශන විශෙෂය ඇති කිරීමෙහි සමර්ථවූ, මේ පහසු විහරණය අවබෝධ කරන ලද්දේය. ස්වාමීනි, මේ පහසු විහරණයට වඩා වැඩිවූද, ප්‍රණීතවූද අනික් පහසු විහරණයක් නොදක්නෙමු'යි (කීහ)

**6.** "අනුරුද්ධයෙනි, යහපත, යහපත. මේ පහසු විහරණයට වඩා වැඩිවූද, ප්‍රණීතවූද අනෙක් පහසු විහරණයක් නැත."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ද, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන්ද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන්ද දැහැමි කථාවකින් කරුණු දක්වා, සමාදන් කරවා, උත්සාහ කරවා, සතුටු කරවා හුන් ආසනයෙන් නැගිට වැඩියහ.

ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද භාග්‍යවතුන් වහන්සේට පසු ගමන් කොට ආපසු අවුත්, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන්වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ආයුෂ්මතුන් වහන්සේ බුදුන් ඉදිරියේදී අපගේ අර්හත්වය දක්වා මාර්ගඵල ලබා සිටින බව කීවාහුය. කිමෙක්ද, 'අපි මේ මේ විහරණ, මේ මේ සමාපත්ති ලැබ සිටින්නෙමුය'යි ඔබ සමග කීයෙමුද?" "අපි මේ මේ විහරණ, මේ මේ සමාපත්ති ලැබ සිටින්නෙමු"යයි ආයුෂ්මත්හු මට නොකීවාහුය. එහෙත් මා විසින් මාගේ සිතින් ආයුෂ්මතුන්ගේ සිත පිරිසිඳ මේ මේ

විහරණ, මේ මේ සමාපත්තීන් ලබා සිටින්නාහුයයි දක්නාලදී. දෙවතාවෝද, ආයුෂ්මතුන් මේ මේ විහරණ, මේ මේ සමාපත්තීන් ලබා ඇත්තාහුයයි යන මේ කාරණය මට දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ විසින් විචාරණ ලද්දාවූ මා විසින් මේ කාරණය ප්‍රකාශ කරනලදී.”

7. ඉක්බිති දීඝ නම් යක්ෂ සේනාපති සමූහයට අයත් පරජන නම් යක්ෂ සේනාපතිතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ, එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ දීඝ පරජන යක්ෂ සේනාපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

“ස්වාමීනි, යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් නන්දිය ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරයන් වහන්සේද යන කුල පුත්‍රයෝ තිදෙනාත් වාසය කරද්ද, ඒ වැදෑරට වැසියන්හට, වජ්ජි ජනයාට ලාභයකි, මහත්ලාභයකි”යි (කීයේය)

දීඝ පරජන නම් වූ යක්ෂ සේනාපතියාගේ මේ ශබ්දය අසා බූමාටු දෙවියෝ ‘යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජි ජනයාට ලාභයකි. මහත් ලාභයකි,’යි ශබ්ද නැගූහ.

බූමාටු දෙවියන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජික දෙවියෝ “යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුල පුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජි ජනයාට ලාභයකි, මහත් ලාභයකි”යි ශබ්ද නැගූහ.

චාතුර්මහාරාජික දෙවියන්ගේ ශබ්දය අසා තව්තිසා වැසි දෙවියෝ “යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි, ශබ්ද නැගූහ.

තව්තිසා වැසි දෙවියන්ගේ ශබ්දය අසා යාම දෙවියෝ, "යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුල පුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි ශබ්ද නැගූහ.

යාම දෙවියන්ගේ ශබ්දය අසා තුසිත දෙවියෝ "යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරද්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි, ශබ්ද නැගූහ.

තුසිත දෙවියන්ගේ ශබ්දය අසා නිර්මාණරතී දෙවියෝ "යම් තැනක තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි, ශබ්ද නැගූහ.

නිර්මාණරතී දෙවියන්ගේ ශබ්දය අසා පරනිර්මිත වසවර්ති දෙවියෝ "යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි, ශබ්ද නැගූහ.

පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ ශබ්දය අසා බ්‍රහ්ම කායික දෙවියෝ "යම් තැනක තථාගත අර්හත් සම්‍යක් සම්බුද්ධයන්

වහන්සේත්, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරය, ආයුෂ්මත් නන්දිය ස්ථවිරය, ආයුෂ්මත් කිම්බිල ස්ථවිරය යන කුලපුත්‍රයෝ තිදෙනාත් වාසය කරත්ද, ඒ වැදෑරට වැසියන්ට, වජ්ජී ජනයාට ලාභයකි, මහත් ලාභයකි"යි, ශබ්ද නැගූහ.

මෙසේ ඒ ආයුෂ්මත් වරු තිදෙන එකෙණෙහි, ඒ මොහොතෙහි බ්‍රහ්මලොකය දක්වා ප්‍රසිද්ධවූහ.

8. "දීඝය, ඒ එසේමය, ඒ එසේමය. දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙන යම් කුලයකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූවාහුද, ඒ කුලය පවා මේ කුලපුත්‍රයන් තිදෙනා පැහැදුනු සිතින් සිහි කරත් නම්, ඒ කුලයටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙන යම් කුල පරම්පරාවකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූවාහුද, ඒ කුල පරම්පරාව පවා මේ කුල පුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත් නම් ඒ කුල පරම්පරාවටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙනා යම් ගමකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූවාහුද, ඒ ගම පවා මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත් නම් ඒ ගමටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙනා යම් නියම් ගමකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූවාහුද, ඒ නියම් ගම පවා මේ කුල පුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත්නම් ඒ නියම් ගමටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙන යම් නගරයකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදි වූවාහුද, ඒ නගරය පවා මේ කුලපුත්‍රයන් තිදෙනා පැහැදුනු සිතින් සිහිකරත් නම් ඒ නගරයටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"දීඝය, මේ කුල පුත්‍රයෝ තිදෙනා, යම් ජනපදයකින් ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදිවූවාහුද, ඒ ජනපදය පවා මේ කුල පුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත්නම් ඒ නගරයටත් දීර්ඝ කාලයක් මුළුල්ලේ හිත පිණිස, සැප පිණිස වන්නේය.

**9.** "දීඝය, සියලු ක්ෂත්‍රියයෝ, මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත්නම්, ඒ සියලු ක්ෂත්‍රියයන්ට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, සියලු බ්‍රාහ්මණයෝ මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත් නම්, ඒ බ්‍රාහ්මණයන්ට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, සියලු වෛශ්‍යයෝ මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත් නම්, ඒ වෛශ්‍යයන්ට දීර්ඝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, සියලු ශුද්‍රයෝ, මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත්නම්, ඒ ශුද්‍රයන්ට බොහෝ කාලයක් මුළුල්ලෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

"දීඝය, දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිතවූ, දෙව් මිනිසුන් සහිත ප්‍රජාවවූ සියලු ලෝවැසියා මේ කුලපුත්‍රයන් තිදෙනා, පැහැදුනු සිතින් සිහි කරත්නම්, දෙවියන් සහිත, මාරයන් සහිත, බ්‍රහ්මයන් සහිත, දෙව්මිනිසුන් සහිත සියලු සත්වයන්ට හිත පිණිස, සැප පිණිස වන්නේය. දීඝය, යම්තාක් මේ කුල පුත්‍රයෝ තිදෙන බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස ලොවට අනුකම්පා පිණිස පිළිපන්නාහුද, ඒ මේ යහපත් ආකාරය බලව"යි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුවූ දීඝපරජන යක්ෂතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය

**පළමුවෙනිවූ චූලගොසිංග සූත්‍රය නිමි (4-1)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 32. මහා ගොසිංග සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ගොසිංග සාලවන නම් අරණ්‍යයෙහි සුප්‍රසිද්ධ සුප්‍රසිද්ධ බොහෝ ස්ථවිර ශ්‍රාවකයන් සමග,-එනම්:- ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේ, ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්වහන්සේ, ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සහ මෙයින් අන්‍යවූද අතිශයින් ප්‍රසිද්ධව; ස්ථවිර ශ්‍රාවකයින් වහන්සේලා සමඟ-වැඩ වාසය කරති.

ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි ඵල සමාපත්තියෙන් නැගී සිට ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතනට ගියහ. ගොස්, "ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයෙනි, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද බණ අසනු පිණිස එහි යමු"යි කීහ. ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ "ඇවැත්නි, එසේය"යි ආයුෂ්මත් මහා මෞද්ගල්‍යාන ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ.

ඉක්බිති ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද, බණ අසනු පිණිස එහි ගියහ. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවීරයන් වහන්සේ යම් තැනකද, බණ අසනු පිණිස එහි යනු දුටහ. දැක ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එහි ගියහ. ගොස් ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ආයුෂ්මත් රෙවත ස්ථවිරයෙනි, අසවල් සත්පුරුෂයෝ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද, බණ අසනු පිණිස එහි යන්නාහ. ආයුෂ්මත් රෙවත ස්ථවිරයෙනි, අපිත් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද බණ අසනු පිණිස එහි යමු" (කියායි) ඇවැත්නි, "එසේය"යි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්හ. ඉක්බිති ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද බණ අසනු පිණිස එහි ගියහ.

2. ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ එසේ එන්නාවූ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් වහන්සේද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේද දුරදීම දුටහ. දැක, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ආයුෂ්මත් ආනන්දයෙනි, එනු මැනවි. භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකවූ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි හැසිරෙන්නාවූ ආයුෂ්මත් ආනන්දයන්ගේ මෙහි පැමිණීම ඉතා යහපත්ය.

"ඇවැත්නි, ආනන්දයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍යසුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් ආනන්දයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොට ගෙන ගොසිංගසාලවනය හොබනේදැ"යි (විචාළහ.) "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ සාසනයෙහි භික්ෂුවක් බොහෝ ඇසූපිරූ තැන් ඇත්තේ වෙයිද, ඇසූ දේ සිත්හි දරන්නේ වෙයිද, ඇසූ ධර්මය සිත්හි රැස්කර ගත්තේ වෙයිද, මුල යහපත්වූ මැද යහපත්වූ අග යහපත්වූ අර්ථ සහිත ව්‍යඤ්ජන සහිතවූ යම් ඒ ධර්මකෙනෙක් මුළුමනින් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචරියාව ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ ධර්ම ඔහු විසින් බොහෝකොට අසන ලද්දාහු වෙත්ද, ප්‍රගුණ කරන ලද්දාහු වෙත්ද, වචනයෙන් කීම් වසයෙන් පුරුදුකරණ ලද්දාහු වෙත්ද, සිතින් සලකන ලද්දාහු

වෙත්ද, ප්‍රඥාවෙන් මනාව අවබොධ කරණ ලද්දාහු වෙත්ද හෙතෙම ආශ්‍රව (කෙලෙස්) නැති කිරීම පිණිස සිවුවණක් පිරිසට පද බ්‍යඤ්ජන සම්පත්තියෙන් සම්පූර්ණ කර ධර්මය දෙශනා කරයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, එබඳු භික්ෂුවක් කරණකොට ගෙන ගොසිංගසාලවනය හොබනේය'යි (කීහ.)

3 මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් රෙවත ස්ථවිරයන්ට මෙසේ කීහ.

"ඇවැත් රෙවතයෙනි, ආයුෂ්මත් ආනන්දයන් විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරන ලද්දේය. එහිලා දැන් ආයුෂ්මත් රෙවතයන් විචාරමු. ඇවැත් රෙවතයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳපහනින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් රෙවතයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේදැ"යි (විචාළහ.) "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් පලසමවත්හි ඇලුනේ පලසමවත්හි කැමැත්ත ඇත්තේ තමාගේ හිත සමාධිගත කිරීමෙහි යෙදුනේ පහනොකළ ධ්‍යාන ඇත්තේ විදර්ශනායෙන් යුක්තවූයේ ශූන්‍යාගාරයෙහි භාවනාවන් වඩන්නේ වෙයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාල වනය හොබනේය"යි (කීහ.)

4. මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට මෙසේ කීහ. "ඇවැත් අනුරුද්ධයෙනි, ආයුෂ්මත් රෙවතයන් විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරන ලද්දේය. එහිලා දැන් අපි ආයුෂ්මත් අනුරුද්ධයන් විචාරමු. ඇවැත්නි, අනුරුද්ධයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය. රාත්‍රිය සඳපහනින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් අනුරුද්ධයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොට ගෙන ගොසිංගසාල වනය හොබනේදැයි, (විචාළහ.)

"ඇවැත්නි, ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුව පිරිසුදුවූ, මිනිස්බව ඉක්මවූ දිවඇසින් දහසක් ලොකධාතුව බලයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ඇස් ඇති පුරුෂයෙක් උඩුමහල් තලයකට ගියේ නිම්වළලු දහසක් දකින්නේ යම්සේද, එසේම භික්ෂුව පිරිසුදුවූ, මිනිස් බව ඉක්මවූ දිවඇසින් දහසක් ලොකධාතුව බලයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේය"යි (කීහ.)

**5.** මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන්ට මෙසේ කීහ. "ඇවැත් මහා කාශ්‍යප ස්ථවිරයෙනි, ආයුෂ්මත් අනුරුද්ධයන් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලද්දේය. එහිලා දැන් අපි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන් විචාරමු. ඇවැත් මහාකාශ්‍යපයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය. සල් ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් මහාකාශ්‍යපයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේදැයි (විචාළහ.)

"ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක්, තෙමේද සමාදන්වූ ආරණ්‍යකාංග ඇත්තේවේද, ආරණ්‍යකාංග පිරීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද පිණ්ඩපාතිකවූයේ පිණ්ඩපාතික වීමෙහි ගුණ කියන්නේවේද, තෙමේද පංශුකූලිකාංග ඇත්තේ පංශුකූලික වීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද තෙචීවරිකාංග ඇත්තේ, (තුන් සිවුරු පමණක් දැරීම) තෙචීවරික වීමෙහි ගුණ කියන්නේවේද, තෙමේද අල්පෙච්ඡ (ස්වල්පයකින් සතුටුවීම) වූයේ අල්පෙච්ඡ වීමෙහි ගුණකියන්නේවේද, තෙමේද ලදදෙයින් සතුටුවන්නේ ලදදෙයින් සතුටු වීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද විවේකයෙන් යුක්ත වූයේ විවේකයෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සංසර්ගයෙන් (එකට ගැටී විසීම) තොරවූයේ අසංසර්ගයෙහි ගුණ කියන්නේවේද, තෙමේද පටන්ගත් වීය්‍ර්‍ය ඇත්තේ වීය්‍ර්‍ය

කිරීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සීලයෙන් යුක්තවූයේ සීල සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සමාධියෙන් යුක්තවූයේ සමාධිසම්පත්තියෙහි ගුණ කියන්නේවේද, තෙමේද ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥා සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, තෙමේද විමුක්තියෙන් යුක්ත වූයේ විමුක්ති සම්පත්තියෙහි ගුණ කියන්නේවේද, තෙමේද විමුක්තිඥාන දර්ශනයෙන් යුක්තවූයේ විමුක්ති ඥාන දර්ශන සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුව කරණකොටගෙණ ගොසිංගසාල වනය හොබනේය"යි (කීහ.)

මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් මහා මෞද්ගල්‍යාන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ:- "ඇවැත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයෙනි, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරන ලද්දේය. එහිලා දැන් අපි ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් විචාරමු. ඇවැත් මෞද්ගල්‍යායනයෙහි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය. සල් ගස්මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේ දැ"යි (විචාළහ.) "ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂූන් දෙනමක් අභිධර්ම කථා පවත්වත්ද, ඔවුහු ඔවුනොවුන් ප්‍රශ්න විචාරත්ද, ඔවුනොවුන් විසින් අසන ලද ප්‍රශ්න විසඳත්ද, කරුණු යටපත් නොකරත්ද, ඔවුන් අතර දැහැමි කථාව පවත්නී වෙයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුව කරණකොටගෙන ගොසිංගසාල වනය හොබනේය'යි (කීහ.)

ඉක්බිති මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ. "ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, අප හැමදෙනා විසින් අපේ වැටහීම පරිදි ප්‍රකාශ කරන ලදී. මෙහිලා අපි දැන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් විචාරමු. ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සල් ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොට ගෙන ගොසිංගසාලවනය හොබනේදැ"යි, (විචාළහ)

**6.** "ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මේ ශාසනයෙහි භික්ෂුව හිත වසඟ කර ගනියිද හිතට වසඟ වීමෙන් නොපවතියිද, හෙතෙම යම් ධ්‍යාන සමාපත්තියකින් යුක්තව උදය කාලයෙහි වාසය කරන්ට කැමති වේද, ඒ ධ්‍යාන සමාපත්තියෙන් යුක්තව උදය කාලයෙහි වාසය කෙරෙයිද, යම් ධ්‍යාන සමාපත්තියකින් දවල් කාලයෙහි වාසය කරන්ට කැමති වෙයිද, ඒ ධ්‍යාන සමාපත්තියෙන් දවල් කාලයෙහි වාසය කරයිද, සවස් කාලයෙහි යම් ධ්‍යාන සමාපත්තියකින් වාසය කරන්නට කැමතිවෙයිද, සවස් කාලයෙහි ඒ ධ්‍යාන සමාපත්තියෙන් වාසය කරයිද, ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, රජ කෙනෙකුගේ හෝ රාජ මහාමාත්‍යයෙකුගේ හෝ ඇඳුම් ගබඩාව නොයෙක් වර්ණ ඇති ඇඳුම්වලින් පිරුණේ වේද, හෙතෙම උදය කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමති වෙයි නම් ඒ වස්ත්‍ර දෙක උදය කාලයෙහි අඳියිද, දවල් කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමති වෙයි නම් ඒ වස්ත්‍ර දෙක දවල් කාලයෙහි අඳියිද, සවස් කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමති වෙයි නම් ඒ වස්ත්‍ර දෙක සවස් කාලයෙහි අඳියිද, ඇවැත් මෞද්ගල්‍යායනයෙහි, මෙසේම මහණතෙම හිත වසඟ කර ගනියිද, හිතට වසඟව නොපවතියිද, හෙතෙම යම් ධ්‍යාන සමාපත්තියකින් යුක්තව උදය කාලයෙහි වාසය කරන්නට කැමති නම් ඒ ධ්‍යාන සමාපත්තියෙන් යුක්තව උදය කාලයෙහි වාසය කරයිද, යම් ධ්‍යාන සමාපත්තියකින් දාවල් කාලයෙහි වාසය කරන්ට කැමති වෙයි නම් ඒ ධ්‍යාන සමාපත්තියෙන් දවල් කාලයෙහි වාසය කරයිද සවස් කාලයෙහි යම් ධ්‍යාන සමාපත්තියකින් වාසය කරන්නට කැමති වෙයි නම් සවස් කාලයෙහි ඒ ධ්‍යාන සම්පත්තියෙන් වාසය කරයිද, ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මෙබඳු ස්වභාව ඇති භික්ෂුව කරණ කොට ගෙන ගොසිංගසාලවනය හොබනේය"යි (කීහ.)

ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ඒ ආයුෂ්මතුන් වහන්සේලාට මෙසේ කීහ. "ඇවැත්නි, අප සියලුදෙනා විසින් අපේ දැනීම පරිදි ප්‍රකාශ කරනලදී. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි යමු; ගොස්, මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට සැල කරමු. භාග්‍යවතුන් වහන්සේ අපට යම් ආකාරයකින් ප්‍රකාශ කරත් නම් එසේ මෙය දරා ගනිමු"යි (කීහ.) 'එසේය, ඇවැත්නි'යි ඒ ආයුෂ්මත්වරු ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේට පිළිතුරු දුන්හ. ඉක්බිති ඒ (සියලු) ආයුෂ්මතුන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි ගියහ. ගොස්, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකත්පස්ව උන්හ. එකත්පසෙක උන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, ආයුෂ්මත් රෙවත තෙමේද, ආයුෂ්මත් ආනන්ද තෙමේද බණ අසනු පිණිස මා වෙත පැමිණියහ. ස්වාමීනි, මම මෙසේ එන්නාවූ ආයුෂ්මත් රෙවතයන් හා ආයුෂ්මත් ආනන්දයන් දුරදීම දුටුවෙමි. දැක, ආයුෂ්මත් ආනන්දයන්ට මෙසේ කීවෙමි.

"භාග්‍යවතුන් වහන්සේගේ උපස්ථායකවූ, භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහිම හැසිරෙන්නාවූ ආයුෂ්මත් ආනන්දයන්ගේ මෙහි පැමිණීම යහපත්ය. ඇවැත් ආනන්දයෙනි, ගොසිංගසාල වනය සිත්කලුය, රාත්‍රිය සඳහපතින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් ආනන්දයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාල වනය හොබනේදැ"යි (ඇසීමි.)

"ස්වාමීනි, මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද තෙමේ මට මෙසේ කීය. 'ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් බොහෝ ඇසූපිරූ තැන් ඇත්තේ වෙයිද, ඇසූ දේ හිතෙහි දරන්නේ වෙයිද, ඇසූ ධර්මය සිත්හි රැස්කර ගත්තේ වෙයිද. මුල යහපත්වූ, මැද යහපත්වූ, අග යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ යම් ඒ ධර්මකෙනෙක් මුළුමනින් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචරියාව ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ ධර්ම ඔහු විසින්

බොහෝකොට අසන ලද්දාහු වෙත්ද, ප්‍රගුණ කරන ලද්දාහු වෙත්ද, වචනයෙන් කීම් වසයෙන් පුරුදුකරණ ලද්දාහු වෙත්ද, සිතින් සලකන ලද්දාහු වෙත්ද, ප්‍රඥාවෙන් මනාව අවබොධ කරණ ලද්දාහු වෙත්ද හෙතෙම ආශ්‍රව (කෙලෙස්) නැතිකිරීම පිණිස සිවුවණක් පිරිසට පද බ්‍යඤ්ජන සම්පත්තියෙන් සම්පූර්ණ කර ධර්මය දෙශනා කරයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, එබඳු භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේය'යි (කීය)

7. "ශාරීපුත්‍රය, ඉතා යහපති, ඉතා යහපති. ආනන්ද මනාව ප්‍රකාශ කරන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය. ශාරීපුත්‍රය, ආනන්ද බොහෝ ඇසූපිරූතැන් ඇත්තේය. ඇසූ දේ හිත්හි දරන්නේය, ඇසූ දේ සිත්හි රැස්කරගෙන සිටින්නේය. මුල යහපත්වූ, මැද යහපත්වූ, අග යහපත්වූ, අර්ථ සහිතවූ, බ්‍යඤ්ජන සහිතවූ, යම් ඒ ධර්ම කෙනෙක් මුළුමනින් සම්පූර්ණවූ පිරිසිදු බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරත්ද. එබඳු ධර්ම ඔහු විසින් බොහෝ අසන ලද්දාහු වෙත්. ප්‍රගුණ කරන ලද්දාහු වෙත්. වචනයෙන් කීම් වශයෙන් පුරුදු කරන ලද්දාහු වෙත්, සිතින් සලකන ලද්දාහු වෙත්. හෙතෙම ආශ්‍රව (කෙලෙස්) නැතිකිරීම පිණිස සිව් පිරිසට පද බ්‍යඤ්ජන සම්පත්තියෙන් සම්පූර්ණකර ධර්මය දෙශනා කරයි"

"ස්වාමීනි, මෙසේ කී කල්හි මම ආයුෂ්මත් රෙවතයන්ට මෙසේ කීවෙමි. 'ඇවැත් රෙවතයෙනි, ආයුෂ්මත් ආනන්ද විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරන ලද්දේය. එහිලා දැන් අපි ආයුෂ්මත් රෙවත ස්ථවිරයන් විචාරමු. ඇවැත් රෙවතයෙනි, ගොසිංග සාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය සල්ගස් මුලසිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් රෙවතයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොට ගෙන ගොසිංගසාල වනය හොබනේදැ'යි (ඇසීමි.) ස්වාමීනි, මෙසේ ඇසූ කල්හි ආයුෂ්මත් රෙවත තෙමේ මට මෙසේ කීයේය. ඇවත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් පලසමවත්හි ඇලුනේ, පලසමවත්හි කැමැත්ත ඇත්තේ, තමාගේ හිත සමාධිගත කිරීමෙහි යෙදුනේ පහනොකළ ධ්‍යාන

ඇත්තේ, විදර්ශනායෙහි යුක්ත වූයේ ශූන්‍යාගාරයෙහි භාවනාවන් වඩන්නේ වෙයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුවක් කරණකොටගෙන ගොසිංග සාලවනය හොබනේය'යි (කීය.)

8. 'ශාරීපුත්‍රය, ඉතා යහපත, ඉතා යහපත. රෙවත මනාව ප්‍රකාශ කරන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය, ශාරීපුත්‍රය, රෙවත වනාහි පලසමවත්හි ඇළුනේය, පලසමවත්හි කැමැත්ත ඇත්තේය. තමාගේ හිත සමාධිගත කිරීමෙහි යෙදුනේය, පහනොකළ ධ්‍යාන ඇත්තේය, විදර්ශනාවෙන් යුක්තය. ශූන්‍යාගාරයෙහි වඩන භාවනා ඇත්තේය.

"ස්වාමීනි, මෙසේ කී කල්හි මම ආයුෂ්මත් අනුරුද්ධයන්ට මෙසේ කීවෙමි. 'ඇවැත් අනුරුද්ධයෙනි, ආයුෂ්මත් රෙවත විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරණ ලද්දේය. එහිලා දැන් අපි ආයුෂ්මත් අනුරුද්ධයන් විචාරමු. ඇවැත් අනුරුද්ධයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳ පහනින් බබලන්නීය. සල් ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් අනුරුද්ධයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොටගෙන ගොසිංගසාලවනය හොබනේදැ'යි (ඇසීමි.) මෙසේ ඇසූ කල්හි ස්වාමීනි, ආයුෂ්මත් අනුරුද්ධ තෙමේ මට මෙසේ කීයේය. 'ඇවැත් ශාරිපුත්‍රයෙනි, මේ ශාසනයෙහි භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව ඇසින් දහසක් ලොකධාතුව බලයිද, ඇවැත් ශාරිපුත්‍ර ස්ථවිරයෙනි, ඇස් ඇති පුරුෂයෙක් උඩුමහල්තලයකට ගියේ නිම්වළලු දහසක් දකින්නේ යම්සේද, එසේම භික්ෂුව පිරිසිදුවූ මිනිස් බව ඉක්මවූ දිව ඇසින් දහසක් ලොක ධාතුව බලයිද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේය'යි (කීහ.)

9. "ශාරීපුත්‍රය, ඉතා යහපත, ඉතා යහපත. අනුරුද්ධ මනාව ප්‍රකාශ කරන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය. ශාරීපුත්‍රය, අනුරුද්ධ වනාහි පිරිසිදුවූ, මිනිස් බව ඉක්මවූ දිව ඇසින් දහසක් ලොක ධාතුව බලන්නේය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, මෙසේ කී කල්හි මම ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරයන්ට මෙසේ කීවෙමි. 'ඇවැත් මහාකාශ්‍යපයෙනි, ආයුෂ්මත් අනුරුද්ධයන් විසින් ස්වකීය වැටහීම පරිදි ප්‍රකාශ කරනලදී. මෙහිදී අපි ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් විචාරමු. ඇවැත් මහාකාශ්‍යපයෙනි, ගොසිංග සාලවනය සිත්කලුය. රාත්‍රිය සඳපහනින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් මහා කාශ්‍යපයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොට ගෙන ගොසිංගසාලවනය හොබනේදැ"යි ඇසීමි.

"ස්වාමීනි, මෙසේ ඇසූ කල්හි ආයුෂ්මත් මහාකාශ්‍යප ස්ථවිරතෙමේ මට මෙසේ කීයේය. ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් තෙමේද සමාදන්වූ ආරණ්‍යකාංග "ඇත්තේ ආරණ්‍යකාංග පිරීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද පිණ්ඩපාතිකවූයේ පිණ්ඩපාතික වීමෙහි ගුණ කියන්නේවේද, තෙමේද පාංශුකූලිකාංග ඇත්තේ පාංශුකූලික වීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද තෙචීවරිකාංග ඇත්තේ (තුන් සිවුරු පමණක් දැරීම) තෙචීවරික වීමෙහි ගුණ කියන්නේවේද, තෙමේද අල්පෙච්ඡ (ස්වල්පයකින් සතුටුවීම) වූයේ අල්පෙච්ඡවීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද ලද දෙයින් සතුටුවන්නේ ලදදෙයින් සතුටුවීමෙහි ගුණකියන්නේ වේද, තෙමේද විවේකයෙන් යුක්තවූයේ විවේකයෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සංසර්ගයෙන් (එකට ගැටී විසීම) තොරවූයේ අසංසර්ගයෙහි ගුණ කියන්නේ වේද, තෙමේද පටන්ගත් වීය්‍ර්‍යය ඇත්තේ වීය්‍ර්‍ය කිරීමෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සීලයෙන් යුක්තවූයේ සීල සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, තෙමේද සමාධියෙන් යුක්තවූයේ සමාධි සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, තෙමේද ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාසම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, තෙමේද විමුක්තියෙන් යුක්තවූයේ විමුක්ති සම්පත්තියෙහි ගුණ කියන්නේවේද, තෙමේද විමුක්ති ඥානදර්ශනයෙන් යුක්තවූයේ විමුක්තිඥානදර්ශන සම්පත්තියෙහි ගුණ කියන්නේ වේද, ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුව කරණ කොටගෙන ගොසිංගසාලවනය හොබනේය"යි (කීය.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

10. "ශාරීපුත්‍රය, ඉතා යහපත, ඉතා යහපත. කාශ්‍යප මනාව ප්‍රකාශ කරන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය. ශාරීපුත්‍රය, කාශ්‍යප වනාහි තෙමේ සමාදන්වූ ආරණ්‍යකාංග ඇත්තේ, ආරණ්‍යකාංග පිරීමෙහි ගුණ කියන්නේය. තෙමේද පිණ්ඩපාතික වූයේ, පිණ්ඩපාතික වීමෙහි ගුණ කියන්නේය. තෙමේද පාංශුකූලික වූයේ, පාංශුකූලික වීමෙහි ගුණ කියන්නේය. තෙමේද තෙචීවරිකාංග ඇත්තේ, (තුන් සිවුරු පමණක් දැරීම) තෙචීවරික වීමෙහි ගුණ කියන්නේය. තෙමේද අල්පෙච්ඡ (ස්වල්පයකින් සතුටුවීම) වූයේ, අල්පෙච්ඡ වීමෙහි ගුණ කියන්නේය. තෙමේද ලද දෙයින් සතුටු වන්නේ, ලද දෙයින් සතුටුවීමෙහි ගුණ කියන්නේය. තෙමේද විවේකයෙන් යුක්ත වූයේ, විවෙකයෙහි ගුණ කියන්නේය තෙමේද සංසර්ගයෙන් (එකට ගැටී සිටීම) තොරවූයේ, අසංසර්ගයෙහි ගුණ කියන්නේය. තෙමේද පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තේ, වීර්‍ය්‍ය කිරීමෙහි ගුණ කියන්නේය. තෙමේද සීලයෙන් යුක්තවූයේ, සීල සම්පත්තියෙහි ගුණ කියන්නේය. තෙමේද ප්‍රඥාවෙන් යුක්ත වූයේ, ප්‍රඥාසම්පත්තියෙහි ගුණ කියන්නේය තෙමේද විමුක්තියෙන් යුක්තවූයේ, විමුක්ති සම්පත්තියෙහි ගුණ කියන්නේය. තෙමේද විමුක්ති ඥානදර්ශනයෙන්, යුක්තවූයේ විමුක්තිඥාන දර්ශන සම්පත්තියෙහි ගුණ කියන්නේය.

"ස්වාමීනි, මෙසේ කීකල්හි මම ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන්ට මෙසේ කීමි. 'ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන් විසින් තමාගේ වැටහීම පරිදි ප්‍රකාශ කරනලදී. මෙහිලා අපි ආයුෂ්මත් මෞද්ගල්‍යායන ස්ථවිරයන් විචාරමු. ආයුෂ්මත් මෞද්ගල්‍යායනයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳපහනින් බබලන්නීය. සල්ගස් මුල සිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණ කොටගෙන ගොසිංගසාලවනය හොබනේදැ'යි (ඇසීමි.) ස්වාමීනි, මෙසේ ඇසූ කල්හි ආයුෂ්මත් මෞද්ගල්‍යායනස්ථවිර තෙමේ මට මෙසේ කීයේය. 'ඇවැත් ශාරීපුත්‍රයෙනි, මේ ශාසනයෙහි භික්ෂූන්

දෙනමක් අභිධර්ම කථා කියත්ද, ඔවුහු ඔවුනොවුන් ප්‍රශ්න විචාරත්ද, ඔවුනොවුන් විසින් අසනලද ප්‍රශ්න විසඳත්ද, කරුණු යටපත් නොකරත්ද, ඔවුන් අතර දැහැමි කථාව පවත්නී වෙයිද, ඇවැත් ශාරීපුත්‍රස්ථවිරයෙනි, මෙබඳු භික්ෂුව කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේය'යි (කීය.)

11. "ශාරීපුත්‍රය, ඉතා යහපත, ඉතා යහපත. මෞද්ගල්‍යායන මනාව ප්‍රකාශ කරන්නේ මෙසේ ප්‍රකාශ කරන්නේය. ශාරීපුත්‍රය, මෞද්ගල්‍යායන වනාහි ධර්මකථිකය."

මෙසේ කී කල්හි ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ඉක්බිති ස්වාමීනි, මම ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේට මෙසේ කීවෙමි. 'ඇවැත් ශාරීපුත්‍රයෙනි, අප හැමදෙනා විසින් අපේ වැටහීම පරිදි ප්‍රකාශ කරනලදී. මෙහිලා අපි දැන් ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් විචාරමු. ඇවැත් ශාරීපුත්‍ර ස්ථවිරයෙනි, ගොසිංගසාලවනය සිත්කලුය, රාත්‍රිය සඳපහනින් බබලන්නීය. සල්ගස් මුලසිට අග දක්වා පිපී සිටියහ. දිව්‍ය සුගන්ධය වැනි සුවඳ හමයි. ඇවැත් ශාරීපුත්‍රය, කෙබඳු ස්වභාව ඇති භික්ෂුවක් කරණකොටගෙන ගොසිංගසාලවනය හොබනේදැ'යි (ඇසීමි.) ස්වාමීනි, මෙසේ ඇසූ කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මට මෙසේ කීහ. "ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මේ ශාසනයෙහි භික්ෂුව හිත වසඟකර ගනියිද, හිතට වසඟ වීමෙන් නොපවතියිද, හෙතෙම යම් සමාපත්තියකින් යුක්තව උදය කාලයෙහි වාසය කරන්ට කැමති වේ නම් ඒ ධ්‍යාන සමාපත්තියෙන් යුක්තව උදය කාලයෙහි වාසය කරයිද, යම් ධ්‍යාන සමාපත්තියකින් දවල් කාලයෙහි වාසය කරන්ට කැමතිවෙයි නම් ඒ ධ්‍යාන සමාපත්තියෙන් දවල් කාලය වාසය කරයිද, සවස් කාලයෙහි යම් ධ්‍යාන සමාපත්තියකින් වාසය කරන්නට කැමති වෙයි නම් සවස් කාලයෙහි ඒ ධ්‍යාන සමාපත්තියෙන් වාසය කරයිද, ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, රජකෙනෙකුගේ හෝ රාජ මහාමාත්‍යයෙකුගේ හෝ ඇඳුම් ගබඩාව නොයෙක් වර්ණ ඇති ඇඳුම් වලින් පිරුනේ වේද, හෙතෙම උදය කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වෙයි නම් ඒ වස්ත්‍ර දෙක උදය කාලයෙහි අඳියි, දවල් කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමතිවෙයි නම් ඒ වස්ත්‍ර දෙක දවල් කාලයෙහි අඳියි, සවස් කාලයෙහි යම් වස්ත්‍ර දෙකක් අඳින්නට කැමතිවෙයි නම් ඒ වස්ත්‍ර දෙක සවස් කාලයෙහි අඳින්නේද, ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මෙසේම මහණතෙම හිත වසඟකර ගනියිද, හිතට වසඟව නොපවතියිද, ඇවැත් මෞද්ගල්‍යායනයෙනි, මෙබඳු ස්වභාව ඇති භික්ෂුව කරණ කොටගෙන ගොසිංගසාලවනය හොබනේය”යි (කීහ.)

12. “මෞද්ගල්‍යායනයෙනි, ඉතා යහපත, ඉතා යහපත, ශාරීපුත්‍ර මනාව ප්‍රකාශකරන්නේ මෙසේ ප්‍රකාශකරන්නේය. මෞද්ගල්‍යායනයෙනි, ශාරීපුත්‍ර වනාහි උදයකාලයෙහි යම් සමාපත්තියකින් වාසය කරන්නට කැමතිනම් උදය කාලයෙහි ඒ සමාපත්තියෙන් වාසයකරන්නේය. දවල් කාලයෙහි යම් සමාපත්තියකින් වාසය කරන්නට කැමතිනම් දවල් කාලයෙහි ඒ සමාපත්තියෙන් වාසයකරන්නේය. සවස් කාලයෙහි යම් සමාපත්තියකින් වාසය කරන්නට කැමතිනම් සවස් කාලයෙහි ඒ සමාපත්තියෙන් වාසය කරන්නේය.

මෙසේ කී කල්හි ආයුෂ්මත් ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේකීහ. “ස්වාමීනි, කවරෙකුගේ ප්‍රකාශය යහපත් ප්‍රකාශය වන්නේද?” “ශාරීපුත්‍රය, තොප සියලුදෙනාගේ ප්‍රකාශ ඒ ඒ කාරණයෙන් යහපත් ප්‍රකාශමය. එහෙත් ‘කෙබඳු භික්ෂුවක් කරණ කොටගෙන ගොසිංග සාලවනය හොබනේදැ’යි මගෙන්ද අසව්. ශාරීපුත්‍රය, මේ ශාසනයෙහි මහණ තෙම බතෙන් පසුව පිණ්ඩපාතයෙන් වැළකුණේ පලක් බැඳගෙන කය ඍජුකොට පිහිටුවා සිහිය ඉදිරිකොට පිහිටුවාගෙන, මගේ සිත යම්තාක් උපාදානයන්ගෙන් වෙන්ව, කෙලෙසුන් කෙරෙන් නොමිදෙන්නේද, ඒතාක් පය්‍යංකය නොබිඳින්නෙමියි හිඳියිද, ශාරීපුත්‍රය, මෙබඳු භික්ෂුව කරණ කොට ගෙණ ගොසිංග සාලවනය හොබනේය.” භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇත්තාවූ ඒ ආයුෂ්මත්හු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**දෙවැනිවූ මහා ගොසිංග සූත්‍රය නිමි. (4-2)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 33. මහා ගොපාල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි අනේ පිඩු සිටුහු විසින් කරවන ලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීන්වහන්ස"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, එකොළොස් අංගයකින් යුක්තවූ ගොපලු තෙම ගව සමූහයා හසුරුවන්ටද, දියුණු කරන්ටද නුසුදුසු වෙයි. කවර අංග එකළොසකින්ද යත්: මහණෙනි, මේ ලොකයෙහි ගොපලු තෙම, ගවයන්ගේ ගණන හෝ වර්ණ සටහන් හෝ නොදන්නේ වේද, (ගවයන්ගේ ශරීරයෙහි ඇති) ලකුණු නොදන්නේ වෙයිද, (ගවසිරුරෙහි හටගත්) වණ බෙහෙත් ලා ශුද්ධ නොකරන්නේ වෙයිද, වණය බෙහෙත් යොදා වසා නොබඳින්නේ වෙයිද, බෙහෙත් දුම් නොඅල්ලන්නේ වෙයිද, තොටවල් මනාව නොදනියිද, ගවයින් පැන් බිවූ හෝ නොබිවුබව නොදනියිද, මඟනොදනියිද, ඒ ඒ දිනවල ගවයන් හැසිරවිය යුතු තැන් නොදනියිද, (පැටවුන්ට ඉතිරි නොකර) සියලු කිරි දොවින්නේ වෙයිද, ගව පියන්වූ. ගව නායකයන්වූ වෘෂභයන්හට විශෙෂ සැලකිලි නොකරන්නේ වෙයිද, මහණෙනි, මේ අංග එකොළසින් යුක්තවූ; ගොපලු තෙම ගවසමූහයා හසුරුවන්නටද දියුණු කරන්ටද නුසුදුසු වෙයි. මහණෙනි, එපරිද්දෙන්ම ධර්ම එකොළොසකින් යුක්තවූ, මහණ තෙම මේ ශාසනයෙහි වැඩීමටද, දියුණුවටද, විපුල බවටද පැමිණෙන්ට සුදුසු නොවෙයි. කවර එකොළොසකින්ද යත්:- මහණෙනි, මේ සස්නෙහි මහණතෙම රූප නොදන්නේ වේද, ලක්ෂණ නොදන්නේවේද, පණුබිජු ඉවත්නොකරන්නේ වේද, තුවාල නොවසන්නේ වේද, දුම් නොඅල්ලන්නේ වේද, තොටුපල නොදනීද, බොන ලද්ද නොදනීද, වීථිය නොදනීද, ගොචරයෙහි අදක්ෂ වේද, ඉතිරි නොකර දොවන්නේ වේද, බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිවී

බොහෝ කල් ගිය ඒ ස්ථවිර භික්ෂූහු වෙත්ද, ඔවුන්ට අන්‍යයන්ට වැඩිවූ පූජාවෙන් නොපුදන්නේ වේද.

2. "මහණෙනි, මහණතෙම කෙසේනම් රූප නොදන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම යම් කිසි රූපයක්වෙයි නම් ඒ සියලු රූපය සතර මහාභූත රූපයන් හා සතර මහා භූතයන් නිසා පවත්නා රූපයයි ඇති සැටියෙන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම රූප නොදන්නේ වෙයි. මහණෙනි, මහණ තෙම කෙසේනම් ලක්ෂණයෙහි අදක්ෂවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම අඥානයා (අකුසල) කර්මය ලක්ෂණ කොට ඇත්තේය, ඥානවන්තයා (කුසල) කර්මය ලක්ෂණ කොට ඇත්තේයයි ඇතිසැටියෙන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම ලක්ෂණයෙහි අදක්ෂවූයේ වෙයි.

3. "මහණෙනි, මහණ තෙම කෙසේ නම් පණු බිජු ඉවත් නොකරන්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම තමාගේ සිතෙහි පහළවූ කාමකල්පනා ඉවසාද, දුරුනොකරයිද ඉවත් නොකරයිද, විනාශ නොකරයිද, අභාවයට නොපමුණුවයිද, උපන්නාවූ ව්‍යාපාද කල්පනා ඉවසාද, දුරු නොකරයිද, විනාශ නොකෙරේද, අභාවයට නොපමුණුවයිද. උපන්නාවූ විහිංසා කල්පනා ඉවසාද, දුරු නොකරයිද, ඉවත් නොකෙරේද, විනාශ නොකෙරේද, අභාවයට නොපමුණුවයිද, උපනුපන් ලාමක අකුසල කල්පනා ඉවසාද ඉවත් නොකෙරේද, විනාශ නොකෙරේද, අභාවයට නොපමුණුවාද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පණු බිජු ඉවත්නොකරන්නේ වේ.

4. "මහණෙනි, කෙසේ නම් මහණතෙම තුවාල නොවසන්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඇසින් රූප දැක ශුභවසයෙන් ගන්නේ වෙයිද, ඉතාහොඳයයි ගන්නේ වෙයිද, යමක් හෙතුකොටගෙණ ඇසින් අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ රැස් වන්නාහුද, ඒ ඇස සංවර කරගැනීමට නොපිළිපදියිද, ඇස නොරකියිද, ඇස සම්බන්ධයෙන් සංවරයට

නොපැමිණෙයිද, කණින් ශබ්දය අසා ශුභ වශයෙන් ගන්නේ වෙයිද, ඉතා හොඳ යයි ගන්නේ වෙයිද, යමක් හේතු කොට ගෙන කණින් අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ කණ සංවර කර නොගනියිද, කණ නොරකියිද, කණ පිළිබඳව සංවරයට නොපැමිණෙයිද, නාසයෙන් සුවඳ දැන ශුභ වශයෙන් ගන්නේ වෙයිද ඉතා හොඳයයි ගන්නේ වෙයිද, යමක් හේතු කොට ගෙණ නාසයෙන් අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුසල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ නාසය සංවරකර නොගනියිද, නාසය නොරකියිද, නාසයෙහි සංවරයට නොපැමිණෙයිද, දිවෙන් රසය විඳ ශුභ වශයෙන් ගන්නේ වෙයිද, ඉතා හොඳයයි ගන්නේ වෙයිද, යමක් හෙතු කොට ගෙන දිවෙන් අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ රැස්වන්නාහුද ඒ දිව සංවර කර නොගනියිද, දිව නොරකියිද, දිව පිළිබඳව සංවරයට නොපැමිණෙයිද, කයින් ස්පර්ශය විඳ ශුභ වශයෙන් ගන්නේ වෙයිද, ඉතා හොඳයයි ගන්නේ වෙයිද, යමක් හේතුකොටගෙන කයින් අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ කය සංවරකර නොගනියිද, කය නොරකියිද, කය පිළිබඳව සංවරයට නොපැමිණෙයිද, සිතින් අරමුණු දැන ශුභ වශයෙන් ගන්නේ වෙයිද, ඉතා හොඳයයි ගන්නේ වෙයිද, යමක් හේතු කොට ගෙන (සිත) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ සිත සංවරකර නොගනියිද, සිත නොරකියිද, සිත පිළිබඳව සංවරයට නොපැමිණෙයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පණුබිජු ඉවත් නොකරන්නේ වේ.

"මහණෙනි, මහණතෙම කෙසේ නම් දුම් නොදෙන්නේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම ඇසූ පරිදි, පුහුණු කළ පරිදි අනුන්ට විස්තර වශයෙන් ධර්මය නොදෙසන්නේවේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම දුම් නොදෙන්නේ වෙයි.

5. "මහණෙනි, මහණතෙම කෙසේනම් තොටවල් නොදන්නේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බොහෝ ඇසූ පිරූ තැන් ඇති, උගත් ආගම ඇති, දහම් දරන්නාවූ, විනය දරන්නාවූ මාතෘකා පාලි දරන්නාවූ යම් ඒ භික්ෂූහු වෙත්ද, ඔවුන්වෙත කලින්කල පැමිණ, 'ස්වාමීනි, මෙය කෙසේද, මේ පදයාගේ අර්ථය කවරේදැ'යි නොවිචාරයිද, නැවත නැවත නොවිචාරයිද, ඒ ආයුෂ්මත්හු ඔහුට අප්‍රකට කාරණය ප්‍රකට කර නොදෙත්ද. නොයෙක් සැක කටයුත්තන්හි සැක දුරු නොකරත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම තොටවල් නොදන්නේ වෙයි.

"මහණෙනි, කෙසේනම් මහණතෙම පානය කළයුතු දෙය නොදනීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම තථාගතයන් වහන්සේ විසින් වදාළාවූ ධර්ම විනය දෙශනා කරනු ලබන කල්හි අර්ථය දැනීමෙන් සතුටක් නොලබයිද, පාළිය දැනීමෙන් සතුටක් නොලබයිද, ධර්මයෙන් යුක්තව සතුටක් නොලබයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පානය කළයුත්ත නොදනියි.

"මහණෙනි, මහණතෙම කෙසේනම් වීථිය නොදනීද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආයර්‍යවූ අෂ්ටාඞ්ගික මාර්ගය ඇති සැටියෙන් නොදනීද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම වීථිය නොදන්නේ වෙයි.

"මහණෙනි, මහණතෙම කෙසේනම් ගොචරයෙහි අදක්ෂවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සතර සතිපට්ඨානයන් ඇති සැටියෙන් නොදනියිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ගොචරයෙහි අදක්ෂ වෙයි.

"මහණෙනි, මහණතෙම කෙසේනම් ඉතිරි නොකර දොවින්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවට ශ්‍රද්ධා සිත් ඇත්තාවූ ගිහියෝ සිවුරුය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් පවරත්ද, ඒ මහණ තෙම ඒ සිව්පසය පිළිගැනීමෙහි පමණ නොදනීද මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ඉතුරු නොකොට දොවින්නේ වේ.

6 "මහණෙනි, මහණතෙම බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිව බොහෝ කල් ගියාවූ සංඝපිතෘවූ සංඝනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙත්ද, ඔවුන් විශෙෂ පූජාවෙන් කෙසේ නොපුදන්නේවේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිව බොහොකල් ගියාවූ, සංඝ පිතෘවූ, සංඝනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රී සහගත කායකර්ම නොපවත්වයිද, ඇතිතැනද නැතිතැනද මෛත්‍රී සහගත වාක් කර්ම නොපවත්වයිද, ඇතිතැනද නැතිතැනද මෛත්‍රී සහගත මනොකර්ම නොපවත්වයිද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම බොහෝ දේ දන්නාවූ, පැවිදිවී බොහෝ කල් ගියාවූ, සංඝපිතෘවූ සංඝනායකවූ යම් ඒ ස්ථවිර භික්ෂුහු වෙත්ද, ඔවුන් විශෙෂ පූජාවෙන් නොපුදන්නේ වෙයි. මහණෙනි, මේ අංග එකොළොසින් යුක්තවූ මහණතෙම මේ ශාසනයෙහි වැඩීමටද, අභිවෘද්ධියටද, විපුල භාවයටද පැමිණෙන්ට සුදුසු නොවේ.

7. "මහණෙනි, අංග එකොළොසකින් යුක්තවූ ගොපලු තෙම ගව සමූහය හසුරුවන්ටද, දියුණු කරන්ටද සුදුසු වෙයි. කවර එකොළසකින් ද යත්:- මහණෙනි, මේ ලොකයෙහි ගොපලු තෙම (ගවයින්ගේ) රූප සටහන් දන්නේ වෙයිද, ලකුණු දන්නේවේද, පණු බිජු ඉවත් කරන්නේ වේද, ගව වණ වසන්නේ වේද, දුම් දෙන්නේ වේද, තොටවල් දන්නේ වේද, පානය දනියිද, මඟ නොමඟ දනියිද, ගොචරයෙහි දක්ෂ වෙයිද, (පැටවුන්ට) ඉතිරිකොට කිරි දොවින්නේ වෙයිද, ගව පිතෘවූ, ගවනායකවූ යම් ඒ වෘෂභයෝ වෙත්ද, ඔවුන්ට විශෙෂයෙන් සලකන්නේ වෙයිද,

"මහණෙනි, මේ එකොළොස් අංගයෙන් යුත් ගව පාලක තෙම ගව සමූහය හසුරුවන්ටද දියුණු කරන්ට සුදුසු වෙයි.

"මහණෙනි, එමෙන්ම කරුණු එකොළසකින් යුක්ත වූ භික්ෂුව මේ ශාසනයෙහි දියුණු බවටද, අභිවෘද්ධියටද, මහත් බවටද පැමිණෙන්ට සුදුසු වේ. කවර එකොළසකින්ද යත්? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම රූප අඳුනන්නේ වේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලකුණු දන්නේ වේද, පණු බිජු ඉවත් කරන්නේ වේද, තුවාලය වසන්නේ වේද, දුම් දෙන්නේ වේද, තොට දන්නේ වේද, පානය දන්නේ වේද, වීථිය දන්නේ වේද, ගොචරයෙහි දක්ෂ වේද, ඉතිරිකර දොවන්නේ වේද, බොහෝ රාත්‍රි දන්නාවූ පැවිදිව බොහෝ කල් ගියාවූ සංඝ පිතෘවූ සංඝ නායක වූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද ඔවුන් අතිරේක පූජාවෙන් පුදන්නේ වේද, යන (එකොළසයි)

"මහණෙනි, මහණතෙම කෙසේ නම් රූප අඳුනන්නේ වේද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම යම් රූපයක් වේද, 'මේ සියලු රූප සතර මහා භූත රූප හා සතර මහා භූතයන්ගේ උපාදාය රූපයයි ඇති සැටියෙන් දනියි ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම රූප අඳුනන්නේ වේ.

"මහණෙනි, මහණතෙම කෙසේ නම් ලකුණු අඳුනන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අඥානයා (අකුසල) කර්මය ලක්ෂණ කොට පවතී, පණ්ඩිතයා (කුසල) කර්මය ලක්ෂණ කොට පවතීයයි ඇතිසැටියෙන් දනීද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම ලකුණු අඳුනන්නේ නම් වේ.

8. "මහණෙනි, මහණතෙම කෙසේ නම් පණුබිජු ඉවත් කරන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උපන්නාවූ කාම විතර්කය නොඉවසාද, දුරලයිද, ඉවත් කරයිද, විනාශ කරයිද, අභාවයට පමුණුවයිද, උපන්නාවූ ව්‍යාපාද විතර්කය නොඉවසයිද, දුරලයිද, ඉවත් කරයිද, විනාශ කරයිද, අභාවයට පමුණුවයිද, උපන්නාවූ විහිංසා විතර්කය නොඉවසයිද, දුරලයිද, ඉවත් කරයිද, විනාශ කරයිද, අභාවයට පමුණුවයිද. උපනුපන් ලාමක අකුශල විතර්කයන් නොඉවසයිද, දුරලයිද, ඉවත් කරයිද, විනාශ කරයිද අභාවයට පමුණුවයිද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම පණු බිජු ඉවත් කරන්නේ වේ.

"මහණෙනි, මහණතෙම කෙසේ නම් තුවාලය වසන්නේ වේද? ඇසින් රූපය දැක, ශුභ වශයෙන් නොගන්නේ වෙයි ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතුකොට ගෙන

චක්ෂු ඉන්ද්‍රියය (ඇස) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන අකුසල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ ඇස සංවර කර ගනියි, ඇස රකියි. ඇස පිළිබඳව සංවරයට පැමිණෙයි.

"කණින් ශබ්දය අසා ශුභ වශයෙන් නොගන්නේවෙයි. ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතු කොට ගෙන ශ්‍රොත ඉන්ද්‍රියය (කණ) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන අකුශලධර්මයෝ රැස්වන්නාහුද ඒ කණ සංවර කර ගනියි. කණ රකියි. කණ පිළිබඳව සංවරයට පැමිණෙයි. නාසයෙන් සුවඳ දැන ශුභ වශයෙන් නොගන්නේ වෙයි. ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතු කොට ගෙණ ඝ්‍රාණ ඉන්ද්‍රියය (නාසය) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන අකුශලධර්මයෝ රැස්වන්නාහුද, ඒ නාසය සංවරකර ගනියි. නාසය රකියි. නාසය පිළිබඳව සංවරයට පැමිණෙයි. දිවෙන් රසය විඳ ශුභ වශයෙන් නොගන්නේ වෙයි. ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතු කොට ගෙන ජිව්හා ඉන්ද්‍රියය (දිව) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන අකුශලධර්මයෝ රැස්වන්නාහුද, ඒ දිව සංවර කරගනියි. දිව රකියි. දිව පිළිබඳව සංවරයට පැමිණෙයි.

"කයින් ස්පර්ශය විඳ ශුභ වශයෙන් නොගන්නේ වෙයි. ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතු කොට ගෙන කාය ඉන්ද්‍රියය (ශරීරය) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශලධර්මයෝ රැස්වන්නාහුද ඒ ශරීරය සංවර කර ගනියි. ශරීරය රකියි. ශරීරය පිළිබඳව සංවරයට පැමිණෙයි.

"සිතින් අරමුණු දැන ශුභ වශයෙන් නොගන්නේ වෙයි. ඉතා හොඳයයි නොගන්නේ වෙයි. යමක් හේතු කොට ගෙන මනින්ද්‍රියය (සිත) අසංවරව වසන්නහුට දැඩි ලොභය හා දොම්නස යන ලාමක අකුශලධර්මයෝ රැස් වන්නාහුද, ඒ සිත සංවර කර ගනියි. සිත රකියි. සිත පිළිබඳව සංවරයට පැමිණෙයි. මහණෙනි, මෙසේ වනාහි මහණතෙම තුවාල වසන්නේ වෙයි.

"මහණෙනි, මහණතෙම කෙසේනම් දුම් දෙන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම අසනලද පරිදි, පුහුණු කරන ලද පරිදි, විස්තර වශයෙන් අනුන්ට ධර්මය දෙශනා කරන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම දුම් දෙන්නේ වෙයි.

**9.** "මහණෙනි, මහණතෙම කෙසේ නම් තොටවල් දන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම බොහෝ ඇසූපිරූ තැන් ඇති (උගත්) ආගම් උගත් ධර්මය දරන්නාවූ, විනය දරන්නාවූ මාතෘකාපාලිය (විනය අභිධර්මය) දරන්නාවූ යම් ඒ භික්ෂූහු වෙද්ද, ඔවුන් වෙත කලින් කල පැමිණ, 'ස්වාමීනි, මෙය කෙසේද? මේ පදයේ තේරුම කවරේදැ'යි අසයි නැවත නැවත අසයි. ඒ ආයුෂ්මත්හු වැසූ අදහසක් පහදා දක්වත්. සැඟවුන දෙයක් ප්‍රකට (එළි) කර දක්වත්. නොයෙක් ආකාරවූ සැක කටයුතුවූ ධර්මයන්හි සැකය දුරලත් මහණෙනි මෙසේ වනාහි මහණතෙම තොට දන්නේ වෙයි.

"මහණෙනි, මහණතෙම කෙසේ නම් පානය දන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරනලද ධර්ම විනය දෙශනා කරනු ලබන කල්හි අර්ථය දැනීමෙන් ලබන සතුට ලබයිද, ධර්මය අවබෝධයෙන් ලබන සතුට ලබයිද, ධර්මයෙන් යුක්තවූ ප්‍රීතිය ලබයිද, මහණෙනි මහණ තෙම මෙසේ වනාහි පානය දන්නේ වෙයි.

"මහණෙනි, මහණ තෙම කෙසේ නම් මාර්ගය දන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම උතුම්වූ අෂ්ටාංගික මාර්ගය ඇති සැටියෙන් දන්නේ වෙයිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි මාර්ගය දන්නේ නම්වේ.

මහණෙනි, මහණතෙම කෙසේනම් අනුභව කළ යුත්ත දන්නේ වේද? මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම සතර සතිපට්ඨානයන් ඇති සැටියෙන් දන්නේවේද මහණෙනි, මහණ තෙම මෙසේ වනාහි ගොචරය දන්නේවෙයි.

මහණෙනි, මහණතෙම කෙසේනම් ඉතුරු කොට දොවින්නේ වේද? මහණෙනි මේ ශාසනයෙහි මහණතෙම, ශ්‍රද්ධා ඇත්තාවූ ගිහියෝ සිවුරුය, ආහාරය, සේනාසනය ගිලන්පස හා බෙහෙත් පිරිකර යන මෙයින් කැමතිසේ ගත මැනවැයි පවරත්. එහි භික්ෂුව පිළිගැනීමෙහි ප්‍රමාණය දනියිද, මහණෙනි, මහණතෙම මෙසේ වනාහි ඉතිරි කොට දොවින්නේවේ.

**10.** "මහණෙනි, මහණතෙම කෙසේ නම් බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිව බොහෝ කල් ගියාවූ සංඝ පීතෘවූ, සංඝ නායකවූ යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද ඔවුන් විශෙෂ පූජාවෙන් පුදන්නේ වේද?

"මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිව බොහෝ කල් ගියාවූ සංඝ පිතෘවූ සංඝ නායකවූ, යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් කෙරෙහි මෛත්‍රී සහගත කයින් කරණ කර්මයෙන් ඉදිරි පිටද නැතිතැනද පුදන්නේ වේද, මෛත්‍රී සහගත වචනයෙන් ඉදිරිපිටද නැති තැනද පුදන්නේ වේද, මෛත්‍රී සහගත සිතින් ඉදිරිපිටද නැති තැනද පුදන්නේ වේද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම බොහෝ රාත්‍රි දන්නාවූ, පැවිදිව බොහෝ කල් ගියාවූ සංඝ පිතෘවූ සංඝ නායකවූ, යම් ඒ ස්ථවිර භික්ෂූහු වෙද්ද, ඔවුන් විශෙෂ පූජාවෙන් පුදන්නේ වේ.

"මහණෙනි, මේ එකොළොස් ධර්මයන්ගෙන් යුක්තවූ මහණතෙම මේ ධර්ම විනය නම්වූ ශාසනයෙහි වැඩීමටද උසස් බවටද, මහත් බවටද පැමිණෙන්ට සුදුසු වන්නේය."

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**තුන්වෙනිවූ මහා ගොපාල සූත්‍රය නිමි. (4-3)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 34. චූල ගොපාලක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ වජ්ජි ජනපදයෙහි උක්කවෙලා නම් නුවර සමීපයෙහි ගංගානම් ගංතෙර වැඩ වාසය කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීන් වහන්ස"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, පෙර වූවක් කියමි. එනම්, ඉතා අඥාන ස්වභාව ඇති මගධ රට වැසිවූ ගොපල්ලෙක් වස්සාන ඍතුවේ අන්තිම මාසයෙහි ශරත් කාලයෙහි, ගංගානම් නදියෙහි මෙතෙර නොසලකා එතෙර නොසලකා විදෙහ රටට එතෙර කරනු පිණිස නුසුදුසු තොටින් ගවයන් ගඟට බැස්වීය.

"මහණෙනි, ඉක්බිති ගවයෝ ගංගානම් නදියෙහි මැද සැඩ පහරෙහි දිය සුලියකට අසුවී එහිම විනාශයට පත්වූහ. ඊට හේතු කවරේද? මහණෙනි, ඉතා අඥාන ස්වභාව ඇති මගධ රට වැසි ඒ ගවපාලකයා වස්සාන ඍතුවේ අන්තිම මාසයෙහි සරත් කාලයෙහි ගංගා නම් ගඟෙහි මෙතෙර නොසලකා එතෙර නොසලකා විදෙහ රටට එතෙර කරනු පිණිස ගවයන් ගඟට බැස්වීය. (එහෙයිනි.)

"මහණෙනි, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ ලොකය පිළිබඳව අදක්ෂයෝ වෙත්ද, පරලොව පිළිබඳව අදක්ෂයෝ වෙත්ද, මාරයාට අයත්වූවෙහි අදක්ෂයෝ වෙත්ද, මාරයාට අයත් නොවූවෙහි අදක්ෂයෝ වෙත්ද, මැරෙන ස්වභාව ඇති දෙයෙහි අදක්ෂයෝ වෙත්ද, නොමැරෙන ස්වභාව ඇති දෙයෙහි අදක්ෂයෝ වෙත්ද, ඔවුන්ගේ ධර්මය ඇසිය යුතුයයිද, ඇදහිය යුතුයයිද, යම් කෙනෙක් හඟින්නාහුද, ඔවුන්ට ඒ ඇසීම හෝ ඇදහීම හෝ බොහෝ කාලයක් මුලුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස වන්නේය.

2. "මහණෙනි, පෙර වූවක් කියමි. නුවණැත්තාවූ මගධරට වැසි ගොපල්ලෙක් වර්ෂා ඍතුවේ අවසාන මාසයෙහි සරත්

කාලයෙහි ගංගානම් ගඟෙහි මෙතෙර සලකා බලා එතෙර සලකා බලා විදෙහ රටට එතෙර කරනු පිණිස සුදුසු තොටින් ගවයන් ගඟට බැස්වීය. හෙතෙම පළමු කොටම ගව පියන්වූ, ගවනායකවූ යම් ඒ වෘෂභයෝ වෙත්ද, ඔවුන් ගඟට බැස්වීය. ඒ ගවයෝ ගඟෙහි සැඩපහර සිඳ ගඟ හරහා සැපසේ එතෙරට ගියාහුය. ඊට අනතුරුව බලවත් වූද දමනය කටයුතුවූද ගවයින් ගඟට බැස්වීය. ඔවුහුද සැඩපහර සිඳ ගඟ හරහා සැපසේ එතෙරට ගියාහුය. ඊළඟට නහඹු වැස්සන් හා නහඹු වැස්සියන්ද බැස්වීය. ඔවුහුද සැඩපහර සිඳ ගඟ හරහා සැපසේ එතෙරට ගියාහුය. ඊළඟට කුඩා වසුපැටවුන් ගඟට බැස්වීය. ඔවුහුද සැඩපහර සිඳ ගඟ හරහා සැපසේ එතෙරට ගියාහුය. මහණෙනි, ඉතා බාලවූ එකෙණෙහිම උපන් මවු දෙනගේ හඬින් ගෙන යනු ලබන වසුපැටියා පවා ගඟෙහි සැඩපහර සරසට කපා සුවසේ එතර වීය.

"නුවණ ඇත්තාවූ මගධ රට වැසි ගොපලු තෙම වර්ෂා ඍතුවෙහි අන්තිම මාසයෙහි සරත් ඍතුවෙහි ගංගානම් ගඟෙහි මෙතෙර සලකා බලා එතෙර සලකා බලා එතෙරවූ විදෙහ රටට නිසි තොටින්ම ගවයන් එතෙර කළේය. මහණෙනි, එසේම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ මේ ලොකයෙහි (ස්කන්ධ ආයතනාදියෙහි) දක්ෂයෝ වෙද්ද, පරලොකයෙහි දක්ෂයෝ වෙද්ද, මාරයාට අයත් වූවෙහි දක්ෂයෝ වෙද්ද, මාරයාට අයත් නොවූවෙහි දක්ෂයෝ වෙද්ද, මැරෙන ස්වභාව ඇති දෙයෙහි දක්ෂයෝ වෙද්ද, නොමැරෙන ස්වභාව ඇති දෙයෙහි දක්ෂයෝ වෙද්ද, යමෙක තුමූ ඔවුන්ගේ ධර්මය ඇසියයුතු කොට, ඇදහියයුතු කොට හඟින්නාහුද, ඔවුන්හට ඒ ඇසීම හා ඇදහීම බොහෝ කලක් මුලුල්லෙහි හිත පිණිස, සැප පිණිස වන්නේය.

3. "මහණෙනි, යම්සේ ගවපියන්වූ ගවයින්ට ප්‍රධානවූ යම් ඒ වෘෂභයෝ ගඟෙහි සැඩපහර සිඳගෙන සැපසේ එතෙරට ගියාහුද, මහණෙනි, එපරිද්දෙන්ම යම් ඒ භික්ෂු කෙනෙක් නැතිකළ කෙලෙස් ඇති වැස නිමවූ බ්‍රහ්මචරියා ඇති, නිමවූ කටයුතු ඇති, බහා තබනලද කෙලෙස් බර ඇති, පිළිවෙළින්

පැමිණි රහත්බව ඇති, නැතිකළ භවසංයොජන ඇති මනා කොට දැන කෙලෙසුන්ගෙන් මිදුන රහතන් වහන්සේලා වෙත්ද, ඔවුහු මාරයාගේ (තෘෂ්ණා) සැඩපහර සිඳ සැපසේ (නිර්වාණයට) එතෙරට යන්නාහ.

"මහණෙනි, යම්සේ ඒ බලවත් ගවයෝද, හික්ම විය යුතු ගවයෝද සැඩපහර සිඳ ගඟ හරහා සුවසේ ගියාහුද, මහණෙනි, එසේම යම් ඒ භික්ෂුකෙනෙක් ඔරංභාගිය සංයෝජනයන් සිඳී මෙන් බඹලොව ඔපපාතිකව ඉපද එයින් කාම ලොකයට නොපැමිණෙන්නාවූ, අනාගාමි පුද්ගලයෝ වෙත්ද, ඔවුහුද මාරයාගේ සැඩපහර කපා සුවසේ එතරවන්නාහුය.

"මහණෙනි, යම්සේ නහඹු වස්සෝද, නැහැඹි වැස්සියෝද, සැඩපහර සිඳ ගඟ හරහා සුවසේ එතර වූවාහුද, මහණෙනි, එසේම යම් ඒ භික්ෂූහු ත්‍රිවිධ සංයොජනයන් නැති කිරීමෙන් රාග ද්වෙෂ මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමිවූවාහු එක් වරක්ම මේ කාමලොකයට එන ස්වභාව ඇතිව දුක් කෙළවර කරන්නාහු වෙත්ද, ඔවුහුද මාරයාගේ (තණ්හා) සැඩපහර සිඳ සුවසේ එතෙරට යන්නාහුය.

"මහණෙනි, යම්සේ දුර්වලවූ වස්සෝ සැඩපහර සිඳ ගඟ හරහා සුවසේ එතෙර වූවාහුද, මහණෙනි, එපරිද්දෙන්ම යම් ඒ භික්ෂූහු සංයොජන තුන නැති කිරීමෙන් සෝවාන් වූවාහු සතර අපායෙහි නොවැටෙන සුලුවූවාහු, නියතයෙන්ම රහත් බව ලබන්නාහු වෙත්ද, ඔවුහුද මාරයාගේ (තණ්හා) සැඩ පහර සිඳ සුවසේ එතෙරට යන්නාහුය.

"මහණෙනි, යම්සේ එකෙණෙහි උපන් ළදරු වසු පැටවාද මව්දෙනගේ ශබ්දය අනුව එතර වන්නේ සැඩපහර සිඳ ගඟ හරහා සුවසේ එතෙරට ගියේද, එපරිද්දෙන්ම ධම්මානුසාරීනම් වූද, සංඝානුසාරීනම්වූද යම් ඒ සෝවාන් භික්ෂූහු වෙත්ද, ඔවුහුද මාරයාගේ (තණ්හා) සැඩපහර සිඳ සුවසේ එතෙරට යන්නාහුය.

4. "මහණෙනි, මම වනාහි මේ ලොකය පිළිබඳවද දක්ෂවෙමි. පරලොකය පිළිබඳවද (ස්කන්ධධාතු ආයතනාදියෙහි)

දක්ෂවෙමි. මාරයාට අයත් දෙය දැනීමෙහි දක්ෂවෙමි. මාරයාට අයත් නොවූ දෙය දැනීමෙහි දක්ෂවෙමි. මැරෙන ස්වභාව ඇති දෙය දැනීමෙහි දක්ෂවෙමි. නොමැරෙන ස්වභාව ඇති දෙය දැනීමෙහි දක්ෂවෙමි.

"මහණෙනි, යම් කෙනෙක් තුමූ මාගේ ධර්මය ඇසිය යුතුයයි, ඇදහිය යුතුයයි හඟින්නාහුද, ඔවුන්ට එය බොහෝ කාලයක් මුලුල්ලෙහි හිත පිණිස සැප පිණිස වන්නේය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. මෙය වදාරා ශාස්තෘන් වහන්සේ නැවත මේ ගාථාද ප්‍රකාශ කළහ.

"සියල්ල දත් සර්වඥයන් වහන්සේ විසින් මෙලොව (ස්කන්ධධාතු ආයතනාදිය)ද, පරලොව (ස්කන්ධධාතු ආයතනාදිය) ද මනාව වදාරණලදී. මරහු විසින් පැමිණෙනලද යම් ධර්මයක් වේද, මරහු විසින් නොපැමිණෙනලද යම් ධර්මයක් වේද, සියල්ල දත් සර්වඥයන් වහන්සේ ඒ සියල්ල දැන නිවණට පැමිණීම පිණිස නිර්භයවූ මාර්ග දොරටුව විවෘත කරන ලදී."

මාරයාගේ තෘෂ්ණා සැඩපහර සිඳින ලදී, මානය නමැති සුලඟ විනාශ කරනලදී. එහෙයින් මහණෙනි, සතුට බහුලකොට ඇත්තාහු වව්, නිර්වාණය පතව්.

**සතරවෙනිවූ චූල ගොපාල සූත්‍රය නිමි. (4-4)**

## 35. චූල සච්චක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර මහ වනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩ වාසය කළහ. එකල්හි කථාවෙහි දක්ෂවූ, තමා පණ්ඩිතයෙකැයි කියන්නාවූ, බොහෝදෙනා විසින් උගතෙකැයි කියනු ලබන්නාවූ නිගණ්ඨපුත්‍රවූ සච්චක තෙමේ විසාලාමහනුවර වාසය කරයි. හෙතෙම විසාලාමහනුවර පිරිස්මැද මෙබඳු කථාවක් කියයි. "මා සමග වාදයට පැමිණෙන යම් කිසිවෙක් කම්පා නොවෙයිද, විශෙෂයෙන් කම්පා නොවෙයිද, නොවෙවුලා සිටියිද, යමෙකුගේ කිහිලි වලින් ඩහදිය නොපෙරෙයිද, එබඳුවූ

ශිෂ්‍ය සමූහ නායකවූ, ගණ නායකවූ, ගණ ආචාරියවූ ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ 'මම අර්හත් සම්‍යක්සම්බුද්ධය'යි කියාගන්නා කෙනෙකු හෝ නොදකිමි. ඉදින් මම හිත් පිත් නැති කණුවක් හා වාද කරන්නෙම් නම් ඒ කණුවද කම්පාවන්නේය, විශෙෂයෙන් කම්පාවන්නේය. වෙවුලා සිටින්නේය. මනුෂ්‍යවූවෙකු ගැන කියනුම කවරේද?" (කියාය.)

එකල්හි ආයුෂ්මත් අස්සජි ස්ථවිරයන් වහන්සේ උදය කාලයෙහි, පාත්‍ර සිවුරු ගෙන පිඩු පිණිස විසාලාමහනුවරට වැඩියහ. විශාලාමහනුවර ඒ මේ තැන පයින් ඇවිදිමින් සිටි නිගණ්ඨ පුත්‍ර සච්චක තෙමේ ඒ එන්නාවූ ආයුෂ්මත් අස්සජි ස්ථවිරයන් වහන්සේ දුරදීම දුටුයේය. දැක, ආයුෂ්මත් අස්සජි ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස්, ආයුෂ්මත් අස්සජි ස්ථවිරයන්වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතු සිහිකටයුතු කථාව කොට නිමවා එකපැත්තක උන්නේය. එකපැත්තක උන්නාවූ සච්චක නිගණ්ඨ පුත්‍රතෙම ආයුෂ්මත් අස්සජි ස්ථවිරයන් වහන්සේට මෙසේ කීවේය.

2. "පින්වත් අස්සජි ස්ථවිරයෙනි, ශ්‍රමණ ගෞතමතෙම කෙසේ නම් ශ්‍රාවකයන් හික්මවන්නේද? ශ්‍රාවකයන් විෂයෙහි ශ්‍රමණ ගෞතමයන්ගේ කෙබඳු අනුශාසනාවක් බහුලකොට පවතීද?"

"අග්ගිවෙස්සනය, (සච්චකයාට නමකි.) භාග්‍යවතුන් වහන්සේ මෙසේ වනාහි ශ්‍රාවකයන් හික්මවන්නාහ. ශ්‍රාවකයන් විෂයෙහි භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳු අනුශාසනාව බහුල කොට පවතී: (එනම්) "මහණෙනි, රූපය අනිත්‍යය, වෙදනාව අනිත්‍යය, සංඥාව අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ, විඥානය අනිත්‍යය, මහණෙනි, රූපය ආත්ම රහිතය, වේදනා තොම ආත්ම රහිතය. සංඥාව ආත්ම රහිතය, සංස්කාරයෝ ආත්ම රහිතයහ, විඥානය ආත්ම රහිතය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, සියලු ධර්මයෝ අනාත්මයහ" (කියායි.)

"අග්ගිවෙස්සනය, මේ ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් හික්මවති. මෙබඳු කොටස් ඇති අනුශාසනාව

භාග්‍යවතුන් වහන්සේ ශ්‍රාවකයන් විෂයෙහි බොහෝ සෙයින් පවත්වන්නාහ." "පින්වත් අස්සජි ස්ථවිරයෙනි, යම්බඳුවූ අපි ශ්‍රමණ ගෞතමයන් මෙබඳු වාද ඇත්තෙකැයි ඇසුවෙමුද, ඒ අපි නොඇසිය යුත්තක් ඇසුවෙමු. අපි කිසියම් දවසක ඒ භවත් ගෞතමයන් සමග එක්වන්නෙමු නම් ඉතා යෙහෙක. යම් කථා සල්ලාපයක් වන්නේ නම් ඉතා යෙහෙක. ඒ ලාමකවූ මිථ්‍යාදෘෂ්ටියෙන් (ඔවුන්) තොරකරන්නෙමු නම් ඉතා යෙහෙකැයි'යි (කීයේය.)

3. එකල්හි වනාහි කිසියම් කටයුත්තක් සඳහා පන්සියයක් පමණ ලිච්ඡවීහු සන්ථාගාර ශාලාවෙහි රැස්ව සිටියහ. එකල්හි සච්චක නිගණ්ඨපුත්‍ර තෙම ඒ ලිච්ඡවීහු යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ ඒ ලිච්ඡවීන්ට මෙසේ කීවේය. "පින්වත් ලිච්ඡවියෙනි මෙහි එත්වා, පින්වත් ලිච්ඡවියෙනි, මෙහි එත්වා අද ශ්‍රමණ ගෞතමයන් සමග මාගේ කථාවක් වන්නේය. ඉදින් ශ්‍රමණ ගෞතම තෙම ඔහුගේ ප්‍රසිද්ධ ශිෂ්‍යයන් අතුරෙන් එක්තරා කෙනෙකුවූ අස්සජිනම් භික්ෂුව ප්‍රකාශ කළ පරිදිම ප්‍රකාශ කළහොත්, යම්සේ ශක්තිමත් පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවකු ලොම්වලින් ගෙන ඉදිරියට අදින්නේද, පස්සට අදින්නේද, හාත්පස එහා මෙහා අදින්නේද, එපරිද්දෙන්ම මම ශ්‍රමණ ගෞතමයන් කථා මාර්ගයෙන් දොෂය නගා ඉදිරියට අදින්නෙමි, පස්සට අදින්නෙමි. හාත්පස එහාමෙහා අදින්නෙමි. යම්සේ බලවත්වූ, රා සැලෙහි වැඩකරුවෙක්, රා සැලෙහි එලන කලාලයක් (පැදුරක්) ගැඹුරුවූ දිය විලක බහා කොණකින් අල්වාගෙන ඉදිරියට අදීද, පස්සට අදීද, හාත්පසින් අදීද, එපරිද්දෙන් මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාදය නගා ඉදිරියට අදින්නෙමි, පස්සට අදින්නෙමි, හාත්පස අදින්නෙමි. යම්සේ බලවත්වූ සුරාධූර්තයෙක් රා පෙරහන කොනින් අල්වා ගෙන යටිකුරු කොට සොලවාද, උඩුහුරු කොට සොලවාද, නැවත නැවත ගසාද එපරිද්දෙන් මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාදය නගා ඉදිරියට අදින්නෙමි. පස්සට අදින්නෙමි හාත්පස අදින්නෙමි. සැටවස් පිරුණු ඇතෙක් ගැඹුරුවූ පොකුණකට බැස සණධොවික (හණ සේදීම නම්වූ ක්‍රීඩා

විශෙෂය) කෙරේද, එපරිද්දෙන් මම ශ්‍රමණ ගෞතමයන් හා සණ්ඩොවික (හණ සෝදන) ක්‍රීඩාව කරන්නාක් මෙන් ක්‍රීඩා කරමි.

"පින්වත් ලිච්ඡවියෙනි, එත්වා, පින්වත් ලිච්ඡවියෙනි, එත්වා. අද ශ්‍රමණ ගෞතමයින් සමග මාගේ කථාවක් වන්නේය'යි (කීයේය.)

4. ඒ සමූහයෙහි ඇතැම් ලිච්ඡවීහු මෙසේ කීවාහුය. කිමෙක්ද? "ශ්‍රමණ ගෞතමතෙම සච්චක නිගණ්ඨපුත්‍රයාට වාදය නගන්නේද? නැතහොත් සච්චක නිගණ්ඨපුත්‍රතෙම ශ්‍රමණ ගෞතමයින්ට වාදය නගන්නේද?" ඇතැම් ලිච්ඡවීහු මෙසේ කීහ. "සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට වාදය නගන්නේ නම් කෙසේ හොබනේද? භාග්‍යවතුන් වහන්සේම නිගණ්ඨ පුත්‍රවූ සච්චකයාට වාදය නගන්නේය" (කියායි.) ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රතෙම පන්සියයක් පමණ ලිච්ඡවීන් විසින් පිරිවරණ ලද්දේ මහවනයෙහි කූටාගාර සාලාව යම් තැනක්හිද, එහි ගියේය. එකල්හි බොහෝ භික්ෂූහු එළිමහණෙහි සක්මන්කරති. ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රතෙම ඒ භික්ෂූන් යම් තැනෙක්හිද එහි ගියේය. ගොස් ඒ භික්ෂූන්ට මෙසේ කීයේය. "පින්වත්නි, දැන් ඒ පින්වත් ශ්‍රමණ ගෞතම තෙම කොහි වෙසේද? අපි ඒ පින්වත් ගෞතමයන් දකිනු කැමැත්තම්හ." "අග්ගිවෙස්සනය, භාග්‍යවතුන් වහන්සේ මහවනයට වැද එක්තරා රුකක් සමීපයෙහි දිවා විහරණ වසයෙන් වැඩහිඳිති"යි (කීහ.) ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රතෙම මහත් ලිච්ඡවි පිරිස සමග මහවනයට ගොස් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතු සිහි කටයුතු කථා කොට නිමවා, එකපැත්තක උන්නේය. ඒ ලිච්ඡවීහුද සමහරෙක් භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකපැත්තක උන්හ. සමහරෙක් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථා කොට නිමවා එකපැත්තක හුන්හ. ඇතැම් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ යම් පැත්තකද ඒ පැත්තට දොහොත් නගා (වැඳ)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

එකපැත්තක උන්හ. සමහරෙක් බුදුන් හමුවෙහි තමන්ගේ නම් ගොත් කියා එක පැත්තක උන්හ. සමහරු නිශ්ශබ්දව එක පැත්තක උන්හ.

එක පැත්තක උන්නාවූ සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ඉදින් භවත් ගෞතම තෙම ප්‍රශ්න ඇසීම පිණිස මට අවසර දෙන්නේ නම් මම භවත් ගෞතමයින්ගෙන් යමක් අසන්නෙමි"යි (කීයේය.) "අග්ගිවෙස්සනය, යමක් කැමැත්තෙහි නම් (එය) අසව"යි (වදාළහ.) "භවත් ගෞතමයාණෙනි, භවත් ගෞතම තෙමේ කෙසේ වනාහි ශ්‍රාවකයන් හික්මවන්නේද, භවත් ගෞතමයන්ගේ කෙබඳු අනුශාසනාවක් ශ්‍රාවකයන් විෂයෙහි බහුල කොට පවතීදැ"යි (ඇසීය.)

**5.** "අග්ගිවෙස්සනය, මම මෙසේ වනාහි ශ්‍රාවකයන් හික්මවමි. ශ්‍රාවකයන් විෂයෙහි මගේ මෙබඳු අනුශාසනාව බහුලකොට පවතියි. "මහණෙනි, රූපය අනිත්‍යය, වෙදනාව අනිත්‍යය සංඥා තොමෝ අනිත්‍යය, සංස්කාරයෝ අනිත්‍යයහ. විඤ්ඤාණය අනිත්‍යය. මහණෙනි, රූපය ආත්ම රහිතය, වෙදනාව ආත්මරහිතය, සංඥාව ආත්මරහිතය, සංස්කාරයෝ ආත්මරහිතයහ, විඥානය ආත්මරහිතය, සියලු සංස්කාරයෝ අනිත්‍යයහ, සියලු ධර්මයෝ අනාත්මයහ"යි අග්ගිවෙස්සනය, මෙසේ වනාහි මම ශ්‍රාවකයන් හික්මවමි. ශ්‍රාවකයන් විෂයෙහි මෙබඳු මාගේ අනුශාසනාව බහුල කොට පවතීය"යි වදාළ සේක.

"භවත් ගෞතමයිනි, මට උපමාවක් වැටහෙයි" (සච්චක කීය.) "අග්ගිවෙස්සනය, තොපට වැටහේවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. "භවත් ගෞතමයිනි, යම් ඒ ධාන්‍ය වර්ග හා ගස් වැල් ආදිය පැලවීමට, වැඩීමට, මහත්වීමට පැමිණෙත්ද, ඒ සියල්ල පොළොව නිසා, පොළොවෙහි පිහිටා ඒ ධාන්‍ය ඇට හා ගස්වැල් ආදිය යම්සේ පැල වෙත්ද, වැඩෙත්ද, මහත්වීමට යෙද්ද, භවත් ගෞතමයාණෙනි, යම්සේ ශරීර ශක්තියෙන් කටයුතුවූ යම්කිසි කර්මාන්තයෝ වෙත්ද, ඒ සියලු දෙය පොළොව නිසා පොළොවෙහි පිහිටා යම්සේ කරනු ලැබෙත්ද,

භවත් ගෞතමයාණෙනි, එපරිද්දෙන්ම රූපය ආත්මකොට ඇති මේ පුරුෂ තෙම තමා ආත්මයයි ගත් රූපයෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස්කරයි. වේදනාව ආත්මකොට ඇති මේ පුද්ගලතෙම වේදනාවෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. සංඥාව ආත්මකොට ඇති පුද්ගලතෙම සංඥාවෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. සංස්කාරයන් ආත්ම කොට ඇති මේ පුද්ගලතෙම සංස්කාරයන්හි පිහිටා පින් හෝ පව් හෝ රැස් කරයි. විඥානය ආත්මකොට ඇති මේ පුද්ගලතෙම විඥානයෙහි පිහිටා පින් හෝ පව් හෝ රැස් කෙරේය"යි (කීයේය.)

**6.** "අග්ගිවෙස්සනය, තොපි රූපය මගේ ආත්මයයි, වේදනාව මාගේ ආත්මයයි, සංඥාව මගේ ආත්මයයි, සංස්කාරයෝ මාගේ ආත්මයයි, විඥානය මාගේ ආත්මය'යි කියා කියන්නහුද?"

"භවත් ගෞතමයෙනි මමද රූපය මාගේ ආත්මයයිද, වෙදනාව මාගේ ආත්මයයිද, සංඥාව මාගේ ආත්මයයිද, සංස්කාරයෝ මාගේ ආත්මයයිද, විඤ්ඤාණය මාගේ ආත්මයයිද, මෙසේ කියමි. මේ මහජන සමූහයාද එසේ කියන්නේය"යි (කීය.)

"අග්ගිවෙස්සනය, මහජන සමූහයා කුමක් කරන්නේද? අග්ගිවෙස්සනය, එබැවින් තොපම ස්වකීය වාදය ගැටළු රහිත කරව."

"භවත් ගෞතමයෙනි, මම වනාහි රූපය මාගේ ආත්මයයිද, වේදනාව මාගේ ආත්මයයිද, සංඥාව මාගේ ආත්මයයිද, සංස්කාරයෝ මාගේ ආත්මයයිද, විඥානය මාගේ ආත්මයයිද මෙසේ කියමි"යි (කීයේය.)

"අග්ගිවෙස්සනය, එසේ නම් මෙහිලා තොපම විචාරමි. තොප යම්සේ කැමති නම් එසේ ප්‍රකාශ කරව, අග්ගිවෙස්සනය, පසේනදි කොසොල් රජද, මගධරට වෙදෙහි පුත්‍ර අජාසත් රජද වැනි මුදුනෙහි අභිෂෙක කරනු ලැබූ ක්ෂත්‍රිය රජ කෙනෙකුට තමාගේ රටේ නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළයුත්තෙකුගේ ධනය විනාශ කරන්නට හෝ, රටින් නෙරපිය

යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලයක් ඇත්තේයැයි සිතන්නෙහිද?"

7. "භවත් ගෞතමයෙනි, පසේනදි කොසොල් රජ මගධ රට වෙදෙහි පුත්‍රවූ අජාසත් රජවැනි මුදුනෙහි අභිෂෙක කරනලද ක්ෂත්‍රිය රජ කෙනෙකුට තමන්ගේ රටේ නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළයුත්තෙකුගේ ධනය විනාශ කිරීමට හෝ, රටින් නෙරපිය යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලය ඇත්තේය. භවත් ගෞතමයෙනි, සමූහවූ මහපිරිස් ඇති වැදෑරට වැසි ලිච්ඡවීන්හටද, මල්ල රජවරුන්හටද, තමන්ගේ රටේ නැසිය යුත්තෙකු නසන්නට හෝ, ධනය විනාශ කළ යුත්තෙකුගේ ධනය විනාශ කරන්නට හෝ, රටින් නෙරපිය යුත්තෙකු රටින් නෙරපන්නට හෝ බලය ඇත්තේය.

"පසේනදි කොසොල් රජ මගධ රට වෙදෙහිපුත්‍රවූ අජාසත් රජ වැනි මුදුනෙහි අභිෂෙක කරනලද ක්ෂත්‍රිය රජෙකු ගැන කියනුම කවරේද? භවත් ගෞතමයෙනි, ඔවුනට ඒ බලය ඇත්තේමය. තිබෙන්නට සුදුසුමය"

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? රූපය මාගේ ආත්මයැයි නුඹ කියන්නෙහිය. 'මගේ රූපය මෙසේ (ලස්සන) වේවා. මගේ රූපය මෙසේ (අවලස්සන) නොවේවා' යැයි ඒ රූපය කෙරෙහි තොපට බලයක් පැවැත්විය හැකිද?"

මෙසේ කීකල්හි සච්චක නිගණ්ඨ පුත්‍රතෙමේ නිශ්ශබ්ද විය. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨ පුත්‍රයාට මෙසේ කීහ.

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? රූපය මගේ ආත්මයැයි නුඹ කියන්නෙහිය. මාගේ රූපය මෙසේ (ලස්සන) වේවා. මාගේ රූපය මෙසේ (අවලස්සන) නොවේවායැයි ඒ රූපය කෙරෙහි තොපට බලයක් පැවැත්විය හැකිද?"

දෙවනුවද සච්චක නිගණ්ඨ පුත්‍ර තෙමේ නිශ්ශබ්දවිය, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨ පුත්‍රයාට මෙසේ

කීහ. "අග්ගිවෙස්සනය, කියව, තොපට නිශ්ශබ්දවීමට කාලය නොවේ. අග්ගිවෙස්සනය, තථාගතයන් විසින් තුන්වෙනි වර දක්වා කරුණු සහිතව ප්‍රශ්න කරනු ලැබූ යම් කිසිවෙක් පිළිතුරු නොදෙයිද, මෙහිම ඔහුගේ හිස හත්කඩකට පැලෙන්නේය.

එකල්හි වජ්‍රපාණී නම් යක්ෂතෙම (සක්දෙව්රජ) ගිනිගෙන දිලිසෙන හාත්පස ගිනිදැල් සහිතවූ අයොමය වජ්‍රායුධයක්ගෙන සච්චක නිගණ්ඨපුත්‍රයාගේ හිසට උඩින් අහසෙහි සිටියේ වෙයි. (කුමකටද යත්:-) "ඉදින් මේ සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන්වහන්සේ විසින් තුන්වෙනිවර දක්වා කරුණු සහිතව ප්‍රශ්න විචාරණ ලද්දේ උත්තර නොදෙන්නේද, මෙහිම ඔහුගේ හිස සත්කඩකට පලන්නෙමි"යි (කියායි.) භාග්‍යවතුන් වහන්සේද, සච්චක නිගණ්ඨපුත්‍ර තෙමේද, ඒ වජ්‍රපාණී යක්ෂයා දකියි. (සෙස්සන්ට නොපෙනේ.)

8. ඉක්බිති සච්චක නිගණ්ඨපුත්‍රතෙම බියපත් වූයේ, සංවේගයට පැමිණියේ, ලොමුදැහැගත්තේ භාග්‍යවතුන් වහන්සේගේම පිහිට සෙවීය. භාග්‍යවතුන් වහන්සේම සැඟවීමට ස්ථානයයි සෙවුවේය. භාග්‍යවතුන් වහන්සේම පිහිටයයි සෙව්වේය. හෙතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "භවත් ගෞතමතෙම මා විචාරාවා ප්‍රකාශ කරන්නෙමි"යි (කීය.)

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? 'රූපය මගේ ආත්මය යැ'යි නුඹ කියන්නෙහිය, මගේ රූපය මෙසේ (ලස්සන) වේවා. මගේ රූපය මෙසේ (අවලස්සන) නොවේවා' යි ඒ රූපය කෙරෙහි තොපට බලයක් පැවැත්විය හැකිද?"

"භවත් ගෞතමයෙනි, මෙය නොවේමය." "අග්ගිවෙස්සනය, සිහි කරව. අග්ගිවෙස්සනය, සිහිකර උත්තර දෙව. නුඹගේ පළමු කථාව හා පසු කථාවද, පසු කථාව හා පළමු කථාවද නොගැළපේමය.

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? වෙදනාව මගේ ආත්මයයයි නුඹ කියන්නෙහිය, (ආත්ම වශයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ගත්) 'ඒ මාගේ වෙදනාව මෙසේ වේවා. මාගේ වේදනාව මෙසේ නොවේවා'යි ඒ වේදනාව කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකිද?"

"භවත් ගෞතමයෙනි, මෙය නොවේමය."

"අග්ගිවෙස්සනය, සිහි කරව, අග්ගි වෙස්සනය සිහි කර උත්තර කියව. නුඹගේ පළමු කථාව හා පසු කථාවද, පසු කථාව හා පළමු කථාවද නොගැළපේමය.

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? නුඹ සංඥාව මාගේ ආත්මයයයි කියන්නෙහිය, (ආත්ම වශයෙන් ගත්) 'ඒ මාගේ සංඥාව මෙසේ වේවා. මාගේ සංඥාව මෙසේ නොවේවා'යි ඒ සංඥාව කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකිද?"

"භවත් ගෞතමයෙනි, මෙය නොවේමය" "අග්ගිවෙස්සනය, සිහි කරව. අග්ගිවෙස්සනය, සිහිකර උත්තර කියව. නුඹගේ පළමු කථාව හා පසු කථාවද, පසු කථාව හා පළමු කථාවද නොගැළපේමය.

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කලපනාව කෙසේද? නුඹ 'සංස්කාරයෝ මාගේ ආත්මය ය'යි කියන්නෙහිය. (ආත්මවසයෙන් ගත්) 'ඒ මාගේ සංස්කාරයෝ මෙසේ වෙත්වා, මාගේ සංස්කාරයෝ මෙසේ නොවෙත්වා'යි ඒ සංස්කාරයන් කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකිද?"

"භවත් ගෞතමයෙනි, මෙය නොවේමය."

"අග්ගිවෙස්සනය, සිහි කරව, අග්ගිවෙස්සනය, සිහි කර උත්තර කියව. නුඹගේ පළම කථාව හා පසු කථාවද පසු කථාව හා පළමු කථාවද නොගැළපේමය.

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? විඤ්ඤාණය මාගේ ආත්මයයයි නුඹ කියන්නෙහිය. (ආත්ම වශයෙන් ගත්) 'ඒ මාගේ විඤ්ඤාණය මෙසේ වේවා. මාගේ විඤ්ඤාණය මෙසේ නොවේවා'යි ඒ විඤ්ඤාණය කෙරෙහි නුඹට බලයක් පැවැත්විය හැකිද?"

"භවත් ගෞතමයෙනි, මෙය නොවේමය.

"අග්ගිවෙස්සනය සිහි කරව, අග්ගිවෙස්සනය සිහි කර උත්තර කියව, නුඹගේ පළමු කථාව හා පසු කථාවද, පසු කථාව හා පළමු කථාවද නොගැළපේමය.

**9.** "අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? රූපය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, එය දුක්ය" "යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරළෙනසුළු නම් එය, 'මෙය මගේය, එය මම වෙමි. ඒ මගේ ආත්මයයැ'යි සලකන්නට සුදුසුද?"

"භවත් ගෞතමයෙනි, සුදුසු නොවන්නේය."

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? වෙදනාව නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද,

"භවත් ගෞතමයෙනි, අනිත්‍යය"

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේද? සැප හෝ වේද?

"භවත් ගෞතමයෙනි, දුක්ය."

"යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව ඇත්තේ නම්, එය 'මෙය මාගේය, මෙය මම වෙමි' මෙතෙම මාගේ ආත්මය'යි දකින්ට සුදුසුද?"

"භවත් ගෞතමයෙනි, සුදුසු නොවන්නේය."

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? සංඥාව නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, දුක්ය."

"යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව ඇත්තේ නම් එය, 'මෙය මාගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මය'යි දකින්ට සුදුසුද?"

"භවත් ගෞතමයෙනි, සුදුසු නොවන්නේය."

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? සංස්කාරයෝ නිත්‍ය හෝ වෙත්ද, අනිත්‍ය හෝ වෙත්ද?"

"භවත් ගෞතමයෙනි, අනිත්‍යය."

"යමක් අනිත්‍ය නම් එය දුක් හෝ වේද, සැප හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, ඒ දුක්ය."

"යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව ඇත්තේ නම්, එය "මෙය මාගේය, මෙය මම වෙමි. මෙය මාගේ ආත්මය'යි ගැනීමට සුදුසුද?"

"භවත් ගෞතමයෙනි, සුදුසු නොවන්නේය."

"අග්ගිවෙස්සනය, මේ ගැන තොපගේ කල්පනාව කෙසේද? විඤ්ඤාණය නිත්‍ය හෝ වේද, අනිත්‍ය හෝ වේද,

"භවත් ගෞතමයෙනි, අනිත්‍යය"

"යමක් අනිත්‍ය නම්, එය දුක් හෝ වේද, සැප හෝ වේද?"

"භවත් ගෞතමයෙනි, එය දුක්ය"

"යමක් අනිත්‍ය නම්, දුක් නම්, පෙරලෙන ස්වභාව ඇත්තේ නම් එය, 'මෙය මාගේය, මෙය මම වෙමි. මෙය මාගේ ආත්මය'යි ගැනීමට සුදුසුද?

"භවත් ගෞතමයෙනි, සුදුසු නොවන්නේය."

"අග්ගිවෙස්සනය, හරයෙන් (අරටුවෙන්) ප්‍රයෝජන ඇත්තාවූ, හරය සොයන්නාවූ, හරය සොයමින් හැසිරෙන්නාවූ පුරුෂයෙක් තෙම තියුණු පොරොවක් ගෙන වනයට පිවිසෙන්නේය. හෙතෙම එහි නොමේරූ ඇද නැති අලුත්වූ මහත් කෙසෙල් කඳක් දක්නේය. හෙතෙම ඒ කෙසෙල් කඳ

මුලින් සිඳින්නේය. මුල සිඳ අග සිඳින්නේය. අග සිඳ පතුරු ගළවන්නේය. පතුරු ගලවන්නාවූ හෙතෙම එලයක්වත් නොලබන්නේය. හරයක් කොයින් ලබාද? අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම නුඹ ස්වකීය වාදයෙහි මා විසින් යොදනු ලබන්නේ, කරුණු ගන්වනු ලබන්නේ, කරුණු කියනු ලබන්නේ සාර රහිත වූයේ, එහෙයින්ම ශූන්‍යවූයේ පැරදුනෙහිය.

"අග්ගිවෙස්සනය, විසාලාමහනුවර පිරිසෙහිදී නුඹ විසින් මේ වචනය කියන ලද්දේ නොවේද? "මා සමග වාදයට පැමිණෙන යම්කිසිවෙක් කම්පා නොවෙයිද, විශෙෂයෙන් කම්පා නොවෙයිද, නොවෙවුලා සිටියිද, යමෙකුගේ කිහිලිවලින් ඩහදිය නොගලයිද, එබඳුවූ ශිෂ්‍ය සමූහනායකවූ ගණ නායකවූ, ගණ ආචරියවූ ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ 'මම අර්හත් සම්‍යක් සම්බුද්ධයැ'යි කියාගන්නා කෙනෙකු හෝ නොදකිමි. ඉදින් මම හිත්පිත් නැති කණුවක් සමග වාද කරන්නෙම් නම් ඒ කණුවද කම්පාවන්නේය, විශෙෂයෙන් කම්පාවන්නේය. වෙවුලා සිටින්නේය. මනුෂ්‍යවූවෙකු ගැන කියනුම කවරේද?" (කියාය.)

"අග්ගිවෙස්සනය, නුඹගේ වනාහි ඇතැම් ඩහදිය බිඳු නළලින් ගිලිහුනාහු උතුරු සළුව පලාගෙන බිමට වැටුනාහ. අග්ගිවෙස්සනය, දැන් මාගේ ශරීරයෙහි ඩහදිය නැත්තේය." මෙසේ භාග්‍යවතුන් වහන්සේ ඒ පිරිසෙහි රන්වන්වූ ශ්‍රී ශරීරය (ගෙළ අසල සතරඟුළක් පමණ) විවෘත කළහ.

මෙසේ කී කල්හි සච්චක නිගණ්ඨ පුත්‍රතෙම නිශ්ශබ්ද වූයේ මකු වූයේ පහතට ලූ ගෙළ ඇත්තේ, මුහුණ යටට හරවා ගත්තේ, සිතිවිලි සිතන්නේ, වැටහීම් රහිතවූයේ හුන්නේය.

ඉක්බිති දුම්මුඛ නම් ලිච්ඡවි රාජපුත්‍රතෙම නිශ්ශබ්දවූ, මකුවූ, පහතට ලූ ගෙළ ඇති, යටිකුරුවූ මුහුණ ඇති, සිතිවිලි සිතන, වැටහීම් රහිතවූ සච්චක නිගණ්ඨපුත්‍රයා දැක, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ භාග්‍යවතුන් වහන්ස, මට උපමාවක් වැටහේ"යයි (කියායි.)

"දුම්මුඛය, නුඹට වැටහේවා"යි භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

**10.** "ස්වාමීනි, යම්සේ ගමක් හෝ නියම් ගමක් හෝ අසල පොකුණක් ඇත්තේය. ඒ පොකුණෙහි කකුළුවෙක් වෙසෙයි. ස්වාමීනි, එකල බොහෝ ළදරුවෝ හෝ ළදැරියෝ හෝ ඒ ගමින් හෝ නියම්ගමින් හෝ නික්ම ඒ පොකුණ යම් තැනෙක්හිද එතැන්හි පැමිණෙන්නාහ, පැමිණ, ඒ පොකුණට බැස ඒ කකුළුවා දියෙන් ගොඩගෙන ගොඩබිමෙහි තබන්නාහුය. ස්වාමීනි, ඒ කකුළුවා යම්කිසි අඬුවක් ඉදිරියට නමාද ඒ දරුවෝ හෝ ඒ දැරියෝ හෝ ඒ අඬුව ගල්කැටයකින් හෝ කැබලිත්තකින් හෝ සිඳින්නාහුය. බිඳින්නාහුය. හාත්පසින් බිඳින්නාහුය. ස්වාමීනි, මෙසේ වනාහි සියලු අඬු සිඳින ලද්දාවූ, බිඳින ලද්දාවූ ඒ කකුළුතෙම පෙරමෙන් ඒ පොකුණට බසින්නට නුසුදුසු වෙයිද, ස්වාමීනි, එපරිද්දෙන්ම සච්චක නිගණ්ඨ පුත්‍රයාගේ කිසියම් දෘෂ්ටි නමැති හුල් වූවාහුද, දෘෂ්ටි පැවතුම් වූවාහුද, දෘෂ්ටි කම්පන වූවාහුද ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේ විසින් සිඳින ලදහ. බිඳින ලදහ. හාත්පසින් බිඳින ලදහ. ස්වාමීනි, දැන් සච්චක නිගණ්ඨ පුත්‍රතෙම වාද කරන අදහස් ඇතිව නැවත භාග්‍යවතුන් වහන්සේ කරා එළඹෙන්නට නුසුදුසුය."

මෙසේ කී කල්හි සච්චක නිගණ්ඨ පුත්‍රතෙම දුම්මුඛ ලිච්ඡවි පුත්‍රයාට මෙසේ කීයේය. "දුම්මුඛය, නුඹ නවතුව, දුම්මුඛය, නුඹ නවතුව. අපි තා සමග කථා නොකරමු. මෙහි අපි භවත් ගෞතමයින් සමග කථා කරමු. භවත් ගෞතමයෙනි, අපගේද අන්‍යවූ බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේද, මේ කථා තොම තිබුණා වේ, ඒ වචන ප්‍රලාපයක් මෙනි, නොහොත් ප්‍රලාප මාත්‍රයෙකි. කොපමණකින් භවත් ගෞතමයින්ගේ ශ්‍රාවකතෙම අනුශාසනාව කරන්නේ, අවවාදයට අනුව ක්‍රියා කරන්නේ, සැකයෙන් එතෙරවූයේ, කෙසේ කෙසේදැයි පැවති සැකය පහවූයේ, පහවූ සැක ඇත්තේ, විශාරද බවට පැමිණියේ, අනුන්ගේ පිහිට නොසොයන්නේ, ශාස්තෘ ශාසනයෙහි වාසය කෙරේද?"

11. "අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවක තෙම පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් රූපයක් වේද, ඒ සියලු රූපය 'මෙය මගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දකීද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ තමා තුළ වූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස් වූද, දුරවූද, ළඟවූද, යම් වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ' යයි මෙසේ ඇති සැටියෙන් යහපත් නුවණින් දකීද, පසුගිය කාලය මතු කාලය දැන් කාලය යන තුන් කාලයෙහිවූ, තමා තුළ වූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ'යයි, මෙසේ ඇති සැටියෙන් යහපත් නුවණින් දකීද, පසුගිය කාලය මතු කාලය දැන් කාලය යන තුන් කාලයෙහිවූ තමාතුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උස්සවූද, දුරවූද, ලඟවූද, යම් සංස්කාරයෝ වෙත්ද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දකීද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහි තමා තුල වූද පිටත්හි වූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ලඟවූද, යම් විඤ්ඤාණයක් වේද, ඒ සියලු විඤ්ඤාණය 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දකීද,

"අග්ගිවෙස්සනය, මෙපමණකින් මාගේ ශ්‍රාවකතෙම අනුශාසනාව කරන්නේ, අවවාදයට අනුව ක්‍රියා කරන්නේ සැකයෙන් එතරවූයේ, කෙසේ කෙසේ දැයි පැවති සැකය පහවූයේ, විශාරද බවටද පැමිණියේ, අනුන්ගේ පිහිට නොසොයන්නේ ශාස්තෘ ශාසනයෙහි වාසය කරයි."

"භවත් ගෞතමයෙනි, මහණතෙම කොපමණකින් නැතිකළ කෙලෙස් ඇත්තේ, වැස නිමවනලද බ්‍රහ්මචරියා ඇත්තේ, කළ කටයුතු ඇත්තේ, බහා තබනලද කෙලෙස් බර ඇත්තේ අර්හත් බවට පැමිණියේ භවසංයොජන (සසර බැඳුම්) විනාශ කළේ, හොඳින් දැන මිදුනේ, අර්හත්වේද?

12. "අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි මහණ තෙම පසුගිය කාලය, දැන් කාලය, මතු කාලය යන තුන් කාලයෙහිවූ තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් රූපයක් වේද, ඒ සියලු රූපය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි, මෙය මාගේ ආත්මය නොවේය'යි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන මිදුනේ වෙයිද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ, තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් වේදනාවක් වේද, ඒ සියලු වේදනාව 'මෙය මාගේ නොවෙයි, මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ' යයි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නොගෙන මිදුනේ වෙයිද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ, තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් සංඥාවක් වේද, ඒ සියලු සංඥාව 'මෙය මාගේ නොවෙයි මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේ'යයි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන මිදුනේ වෙයිද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ, තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් සංස්කාරයෝ වෙද්ද, ඒ සියලු සංස්කාරයෝ 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේය'යි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන මිදුනේ වෙයිද, පසුගිය කාලය, මතු කාලය, දැන් කාලය යන තුන් කාලයෙහිවූ, තමා තුළවූද, පිටත්හිවූද, මහත්වූද, සියුම්වූද, පහත්වූද, උසස්වූද, දුරවූද, ළඟවූද, යම් විඥ්ඥාණයක්

වේද, ඒ සියලු විඤ්ඤාණය 'මෙය මාගේ නොවෙයි. මෙය මම නොවෙමි. මෙය මාගේ ආත්මය නොවේය'යි මෙසේ ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙන මිදුනේ වෙයිද,

"අග්ගිවෙස්සනය, මෙපමණකින් මහණතෙම කෙලෙස් නැතිකරන ලද්දේ, වැස නිමවනලද බ්‍රහ්මචරිය ඇත්තේ, කළ කටයුතු ඇත්තේ, බහා තබන ලද කෙලෙස් බර ඇත්තේ, අර්හත් බවට පැමිණියේ, භවසංයෝජන (සසර බැඳුම්) විනාශ කළේ, හොඳින් දැන මිදුනේ, අර්හත් වෙයි.

13. "අග්ගිවෙස්සනය, මෙසේ මිදුන සිත් ඇති භික්ෂුව දස්සනානුත්තරිය (අර්හත් මාර්ගඥානය,) පටිපදානුත්තරිය (ඉතිරි මාර්ගඥානය,) විමුත්තානුත්තරිය (අර්හත්ඵලය,) යන අනුත්තරිය ධර්ම තුනකින් යුක්තවූයේ වෙයි. අග්ගිවෙස්සනය, මෙසේ මිදුණු සිත් ඇති භික්ෂුව, 'චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කළාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධය පිණිස ධර්මය දෙසනා කරති. දැමුනාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ (ඉන්ද්‍රිය) දමනය පිණිස ධර්මය දෙසනා කරති. (සියලු කෙලෙස් සංසිඳීමෙන්) ශාන්තවූ ඒ භාග්‍යවතුන් වහන්සේ කෙලෙස් සංසිඳීම පිණිස ධර්මය දෙසනා කරති. (කෙලෙස් සැඩපහර) තරණය කළාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ (කෙලෙස් සැඩපහර) තරණය පිණිස ධර්මය දෙසනා කරති. (කෙලෙස්) පරිනිර්වාණය කළාවූ ඒ භාග්‍යවතුන් වහන්සේ (කෙලෙස්) පරිනිර්වාණය පිණිස ධර්මය දෙසනා කරති'යි භාග්‍යවතුන් වහන්සේටම සත්කාර කරයි, ගරු කරයි, බුහුමන් කරයි."

මෙසේ වදාළ කල්හි, සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "යම්බඳු අපි භවත් ගෞතමයින් වාදයෙන් වාදය ගැටියයුතු කොට සිතුයෙමුද, භවත් ගෞතමයිනි, ඒ අපිම ගුණයෙන් පිරිහුනෙමු. අපිම ආඩම්බර වචන ඇත්තෝ වූවෙමු. භවත් ගෞතමයාණෙනි, මත් ඇතෙකුට පහරදී පුරුෂයෙකුට නිදහසක් ඇත්තේය. භවත් ගෞතමයින්ට ගටා පුරුෂයෙකුට යහපතක් නොවේමැයි. භවත්

ගෞතමයාණෙනි, දරුණු විෂ ඇති සර්පයෙකුට පහරදී පුරුෂයෙකුට නිදහස ඇත්තේය. භවත් ගෞතමයන්ට ගටා පුරුෂයෙකුට යහපතක් නොවේමැයි, භවත් ගෞතමයෙනි, දිලිසෙන ගිනිකඳක හැපී පුරුෂයෙකුට නිදහසක් ඇත්තේය. භවත් ගෞතමයන්ට ගටා පුරුෂයෙකුට යහපතක් නොවේමැයි.”

“භවත් ගෞතමයෙනි, යම්බඳු අපි භවත් ගෞතමයින් වාදයෙන් වාදය ගැටියයුතු කොට සිතුයෙමුද, භවත් ගෞතමයිනි, ඒ අපිම ගුණයෙන් පිරිහුනෙමු. අපිම ආඩම්බර වචන ඇත්තෝ වූවෙමු. භවත් ගෞතමතෙම හෙට දවසට භික්ෂු සංඝයා සමග මාගේ බත ඉවසුව මැනව”යි (කීය) භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ.

14. ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන ඒ ලිච්ඡවීන්ට මෙසේ කීය. “පින්වත් ලිච්ඡවියෙනි, මාගේ වචනය අසත්වා. මා විසින් ශ්‍රමණ ගෞතම තෙම භික්ෂු සංඝයා සමග සෙට දවසට බතින් පවරන ලදී. යමක් උන්වහන්සේට කැපයයි හඟිව්ද? මා වෙතට එය එවව්”. ඉක්බිති ලිච්ඡවීහු, ඒ රාත්‍රිහුගේ ඇවෑමෙන් සච්චක නිගණ්ඨ පුත්‍රයාට පන්සියයක් පමණ බත්සැලි යැවූහ. එවිට සච්චක නිගණ්ඨපුත්‍ර තෙම සිය අරමෙහි ප්‍රණීතවූ කෑයුතුදෑද, බුදියයුතුදෑද, පිළියෙල කරවා ‘භවත් ගෞතමයෙනි සුදුසු කාලයයි බත නිමියේය’යි භාග්‍යවතුන් වහන්සේට කාලය මතක් කර යැවීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙන සච්චක නිගණ්ඨපුත්‍රයාගේ ආරාමය යම් තැනෙක්හිද එතැන්හි වැඩියහ. වැඩ, භික්ෂු සංඝයා සමග පණවනලද අස්නෙහි උන්හ. ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍ර තෙම බුදුන් ප්‍රධානකොට ඇති භික්ෂු සංඝයා ප්‍රණීතවූ කෑ යුත්තෙන්ද, බොජුනෙන් ද, සියතින් වැළඳවීය. ඉක්බිති සච්චක නිගණ්ඨපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ වළඳා අවසන්වූ පසු එක්තරා මිටි ආසනයක් ගෙන එක්පැත්තක උන්නේය. එක්පැත්තක උන්නාවූ සච්චක නිගණ්ඨපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. “භවත් ගෞතමයාණෙනි, දානමය

පුණ්‍යක්‍රියාවෙහි යම් මේ පිණකුත් විපාකයකුත් වේ නම් එය මේ දානය එවූ දායකයින්ට සැප පිණිස වේවා”යි (කීයේය.) අග්ගිවෙස්සනය, පහනොකළ රාගය ඇති, පහනොකළ ද්වෙෂය ඇති, පහනොකළ මොහෙය ඇති යම්බඳු දක්ෂිණාර්හයෙකු වෙතට පැමිණ ඒ පුණ්‍ය විපාකය දායකයින්ට වන්නේය. අග්ගිවෙස්සනය, පහකළ රාගය ඇති, පහකළ ද්වෙෂය ඇති, පහකළ මොහය ඇති මා වැනි දක්ෂිණාර්හයෙකු වෙත අවුත් ඒ පුණ්‍ය විපාකය නුඹට වන්නේයයි” වදාළහ.

**පස්වෙනිවූ චූල සච්චක සූත්‍රය නිමි (4-5)**

## 36. මහා සච්චක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහාවනයෙහි කූටාගාරශාලාවෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි පා සිවුරු ගෙන විසාලාමහනුවරට පිඩුපිණිස වඩිනු කැමතිව මනාව හැඳ පෙරව වැඩ සිටියහ. එවිට සච්චක නිගණ්ඨ පුත්‍රතෙමේ පයින් සක්මන් කිරීම සඳහා ඇවිදින අතර මහාවනයෙහි කූටාගාර ශාලාව යම් තැනෙක්හිද එහි පැමිණියේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ එන්නාවූ සච්චක නිගණ්ඨපුත්‍රයා දුරදීම දුටහ. දැක භාග්‍යවතුන් වහන්සේට, “ස්වාමීනි, කථාවෙහි දක්ෂවූ තමා පණ්ඩිතයෙකැයි කියන්නාවූ, බොහෝ දෙනා විසින් සම්මාන කරණ ලද්දාවූ මේ සච්චක නිගණ්ඨ පුත්‍රතෙම එන්නේය. ස්වාමීනි, මෙතෙම වනාහි බුදුන්ගේ අගුණ කියනු කැමැත්තේය. ධර්මයෙහි අගුණ කියනු කැමැත්තේය. සංඝයාගේ අගුණ කියනු කැමැත්තේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා උපදවා මොහොතක් වැඩහිඳිනු මැනවැ”යි කීහ. භාග්‍යවතුන් වහන්සේ පණවනලද අස්නෙහි වැඩහුන්හ.

2. ඉක්බිති සච්චක නිගණ්ඨපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනක්හිද එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතුවූ, සිහිකටයුතුවූ, කථාව

කොට නිමවා එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය.

"භවත් ගෞතමයෙනි, කායභාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ, එහෙත් චිත්ත භාවනාවක් නොකරන්නාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. භවත් ගෞතමයෙනි, ඔවුහු ශරීරයෙහි හටගත් දුක් වේදනාව විඳිත්. භවත් ගෞතමයෙනි, පෙරවූවක් කියමි. ශරීරයෙහි හටගත්තාවූ දුක් වේදනා විඳින්නහුට කලවා හිරිවැටීමද, ළයද පැළෙන්නේය. උණුලේද වමනය කරන්නේය. උමතු බවටද, හිත අවුල් බවටද පැමිණෙන්නේය. භවත් ගෞතමයාණෙනි, ඔහුගේ සිත කය අනුව ගියේ වෙයි. කයට අනුව පවතියි. ඊට හේතු කවරේද? සිත නොවැඩූ හෙයිනි, භවත් ගෞතමයෙනි, චිත්තභාවනාවෙහි යෙදෙන්නාවූ එහෙත් කාය භාවනාවක් නොකරන්නාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. භවත් ගෞතමයානෙනි, ඔවුහු චෛතසිකවූ දුක් වේදනා විඳිත්. භවත් ගෞතමයෙනි, පෙර වූවක් කියමි. සිතේ දුක් වෙදනාවෙන් පෙළෙන්නාහට කලවා තදවීමක්ද වන්නේය. ළයද පැළෙන්නේය. උණුලේද වමනය කරන්නේය. උමතු බවටද, සිත අවුල් බවටද, පැමිණෙන්නේය.

"භවත් ගෞතමයෙනි, ඔහුගේ මේ ශරීරය සිත අනුව ගියේ වෙයි. සිතට අනුව පවතියි. ඊට හේතු කවරේද? ශරීරය නොවැඩූ බැවිනි, භවත් ගෞතමයෙනි, ඒ මට මෙසේ සිතක් වෙයි. ඒකාන්තයෙන් භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ චිත්ත භාවනානුයොගයෙහි යෙදුනාහු වාසය කරති. කායභාවනාවෙහි නොයෙදුනාහුය"යි (කියායි.)

"අග්ගිවෙස්සනය, නුඹ විසින් කාය භාවනාව කුමකැයි අසන ලදද?"

3. "මෙසේ අසනලදී. එනම්: භවත් ගෞතමයෙනි, නන්දවච්ඡය, කිසසංකිච්චය, මක්ඛලිගොසාලය යන මොවුහු වස්ත්‍ර නොහඳින්නෝය, යහපත් පැවතුම් නැත්තෝය. අත ලෙවකන්නෝය නොහොත් අතින් මල පිසදමන්නෝය. එව,

වහන්ස, කියා දුන් දෙය නොපිළිගනිත්. සිටුව, වහන්ස, කියා දුන් දෙය නොපිළිගනිත්. ඉදිරියෙන් ගෙනෙනලද දෙය නොපිළිගනිත්. ඔවුන් උදෙසා කරනලද දෙය නොපිළිගනිත්. ආරාධනාකොට දුන් දෙය නොපිළිගනිත්. කළකටින් ගෙන දුන් දෙය නොපිළිගනිත්. සැලි කටින් ගෙන දුන් දෙය නොපිළිගනිත්. එලිපත අතරකොට දුන් දෙය නොපිළිගනිත්. දණ්ඩක් අතරකොට සිට දුන් දෙය නොපිළිගනිත්. මෝල්ගසක් අතර කොට දුන් දෙය නොපිළිගනිත්. අනුභව කරන්නාවූ දෙදෙනෙකුගෙන් එකෙකු දුන් දෙය නොපිළිගනිත්. ගැබිණිය විසින් දුන් දෙය නොපිළිගනිත්. කිරි පොවන්නිය විසින් දුන් දෙය නොපිළිගනිත්. පුරුෂයෙකු වෙත ගිය තැනැත්තිය විසින් දුන් දෙය නොපිළිගනිත්. සම්මාදම් කළ දෙයින් කිසිවක් නොපිළිගනිත්. යම් තැනක බල්ලෙක් පැමිණ සිටියේ නම් (ඔහුට නොදී) එහිදී දුන් දෙය නොපිළිගනිත්. යම් තැනක මැස්සෝ කැටි කැටිව හැසිරෙද්ද, එහිදී දුන් දෙය නොපිළිගනිත්. දිය මස් නොකන්නාහ. ගොඩ මස් නොකන්නාහ. සුරා නොබොන්නාහ. (මල් යුසින්) කළ මත් පැන් නොබොන්නාහ කාඩි දිය නොබොන්නාහ. ඔවුහු එක ගෙයකින් පමණක් පිඩු සිඟන්නෝ හෝ වෙත්. එකම බත්පිඩකින් යැපෙන්නෝ හෝ වෙත්. ගෙවල් දෙකක පිඩු සිඟන්නෝ හෝ වෙත්. බත් පිඩු දෙකකින් යැපෙන්නෝ හෝ වෙත්. ගෙවල් සතක පිඩු සිඟන්නෝ හෝ වෙත්. බත් පිඩු සතකින් යැපෙන්නෝ හෝ වෙත්. එක් කුඩා බත් තැටියකින් යැපෙන්නෝ හෝ වෙත්. බත්තැටි දෙකකින් යැපෙන්නෝ හෝ වෙත්. බත් තැටි සතකින් යැපෙන්නෝ හෝ වෙත්. එක දවසකට වරක් හෝ ආහාර ගනිති. දෙදිනකට වරක් හෝ ආහාර ගනිති. සත්දිනකට වරක් හෝ ආහාර ගනිති. මෙසේ අඩමසකට වරක් ආහාර ගනිමින්ද වාර භොජනයෙහි යෙදී වාසය කරන්නාහ."

"අග්ගිවෙස්සනය, කිමෙක්ද ඔවුහු එපමණකින්ම යැපෙත්ද?"

"භවත් ගෞතමයාණෙනි, ඒ එසේ නොවේමැයි. භවත් ගෞතමයාණෙනි, ඇතැම් දවස්වල ඔවුහු ඉතා ප්‍රණීත කෑම කන්නෝය, ඉතා ප්‍රණීත භොජන වළඳන්නෝය, ඉතා ප්‍රණීත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දෙය රසවිඳින්නෝය. ඉතා ප්‍රණීත පාන පානය කරන්නාහුය. ඔවුහු මේ ආහාරයන් කරණ කොටගෙන ශරීරය බලගන්වත්; වඩත්; ඔජා වර්ධනය කරත්.”

“අග්ගිවෙස්සනය, යම් හෙයකින් ඔවුහු පළමු කළ දුෂ්කර ක්‍රියා හැර පසුව ප්‍රණීත ආහාරයෙන් ශරීරය වඩත්ද, මෙසේ මේ ශරීරයාගේ වැඩීම හා නොවැඩීම වෙයි.

“අග්ගිවෙස්සනය, නුඹ විසින් චිත්තභාවනාව කුමකැයි කියා අසන ලදද?” භාග්‍යවතුන් වහන්සේ විසින් චිත්තභාවනාව පිළිබඳව විචාරනු ලැබූ සච්චක නිගණ්ඨපුත්‍රතෙම පිළිතුරක් සොයා කියන්නට අසමර්ථ විය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සච්චක නිගණ්ඨ පුත්‍රයාට මෙය කීහ. “අග්ගිවෙස්සනය, නුඹ විසින් පළමුව යම් මේ කායභාවනාවක් කියන ලදද? එය බුද්ධශාසනයෙහි ධර්මයට එකඟවූ කායභාවනාවක් නම් නොවෙයි. අග්ගිවෙස්සනය, නුඹ කායභාවනාවවත් නොදන්නෙහිය. චිත්තභාවනාව කොයින් දන්නේද? එහෙත් අග්ගිවෙස්සනය, යම්සේ නොවඩනලද කායභාවනා ඇත්තේ වේද? නොවඩනලද චිත්තභාවනා ඇත්තේවේද, වඩනලද කායභාවනා ඇත්තේ වේද, වඩනලද චිත්තභාවනා ඇත්තේවේද, එය අසව. මනාකොට සිහියට ගනුව කියන්නෙමි”යි වදාළහ.

“එසේය පින්වතුන් වහන්ස,”යි කියා සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

5. “අග්ගිවෙස්සනය, කෙසේ නම් නොවඩනලද කාය භාවනා ඇත්තේවේද? නොවඩනලද චිත්තභාවනා ඇත්තේ වේද? අග්ගිවෙස්සනය, මේ ලෝකයෙහි නූගත් පෘථග්ජනයාට සැප වේදනාවක් උපදියිද. හෙතෙම සැප වේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේම සැපයෙහි ඇලෙයි. සැපයෙහි ඇලීම් බවට පැමිණෙයි, ඔහුගේ ඒ සුඛවේදනා නැතිවෙයිද, සැප වේදනාව නැතිවීමෙන් දුක්වේදනාව උපදියි. හෙතෙම දුක්වේදනාවෙන්

ස්පර්ශ කරන ලද්දේම, ශොක කෙරෙයි; ක්ලාන්ත වෙයි; වැළපෙයි; පපුවේ අතගසමින් හඬයි, මුළාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, ඔහුගේ උපන්නාවූ, සැප වේදනාව කුසල් සිත විනාශ කරයි. (කුමක් හෙයින්ද යත්:) කය නොවැඩූ හෙයිනි. උපන්නාවූද දුක් වේදනාව කුසල් සිත විනාශ කරයි. සිත නොවැඩූ බැවිනි. අග්ගිවෙස්සනය, යමෙකුට මේ දෙයාකාරයෙන් උපන්නාවූ සුඛවෙදනාවද, කුසල් සිත විනාශ කරයි. කුමක් හෙයින්ද? කය නොවැඩූ හෙයිනි. උපන් දුක් වෙදනාවද කුසල් සිත විනාශ කරයි කුමක් හෙයින්ද? සිත නොවැඩූ හෙයිනි. අග්ගිවෙස්සනය, මෙසේ වනාහි නොවඩනලද කය ඇත්තේත් වෙයි. නොවඩන ලද සිත් ඇත්තේත් වෙයි.

6. "අග්ගිවෙස්සනය, කෙසේනම් වඩනලද කය ඇත්තේ වේද, වඩනාලද සිත් ඇත්තේ වේද, අග්ගිවෙස්සනය, මේ ශාසනයෙහි නුවණ ඇති ආයුෂ්මත් ශ්‍රාවකයාහට සැප වේදනාව උපදියිද, හෙතෙම සැපවේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේම, සැපයෙහි නොඇලෙයි, සැපයෙහි ඇලුම් බවට නොපැමිණෙයි, ඔහුගේ ඒ සැපවේදනාව නැතිවෙයි, සැපවේදනාව නැති වීමෙන් දුක්වේදනාව උපදියි, හෙතෙම දුක්වේදනාවෙන් ස්පර්ශ කරන ලද්දේම, ශොක නොකෙරෙයි, ක්ලාන්ත නොවෙයි, නොවැළපෙයි, පපුවේ අතගසමින් නොහඬයි. මුළාවට නොපැමිණෙයි. අග්ගිවෙස්සනය, ඔහුගේ උපන්නාවූද, මේ සැපවේදනාව කුසල් සිත විනාශ නොකරයි. (කුමක් හෙයින්ද යත්:) කය වැඩූ හෙයිනි, උපන්නාවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි. සිත වැඩූ බැවිනි. අග්ගිවෙස්සනය, යමෙකුට මෙසේ දෙයාකාරයකින් උපන්නාවූද, සැප වේදනාව කුසල් සිත විනාශ නොකරයි. කුමක් හෙයින්ද? කය වැඩූ හෙයිනි. උපන්නාවූද දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි. කුමක් හෙයින්ද? සිත වැඩූ හෙයිනි. අග්ගිවෙස්සනය, මෙසේ වනාහි වඩන ලද කය ඇත්තේත් වෙයි, වඩනලද සිත ඇත්තේත් වෙයි.

7. "මෙයින් මම භවත් ගෞතමයන් කෙරෙහි පැහැදුනේ වෙමි. භවත් ගෞතම තෙම ඒකාන්තයෙන් වඩන ලද කායභාවනා ඇත්තේ වෙයි. වඩනාලද චිත්තභාවනා ඇත්තේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වෙයි.” “අග්ගිවෙස්සනය, නුඹ විසින් ඒකාන්තයෙන්ම ගුණ ගටා, ගුණ පහළකර මේ වචන කියනලදී. යලිදු මම නුඹට විස්තර කරන්නෙමි. අග්ගිවෙස්සනය, යම් කලක පටන් මම ඉසකේ දැළි රැවුලු බහා, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙම්ද, ඒකාන්තයෙන් ඒ කාලය මුලුල්ලෙහි මට, ‘උපන්නාවූද, සැපවේදනාව කුසල් සිත විනාශ කරන්නේය. උපන්නාවූද, දුක්වේදනාව කුසල් සිත් විනාශ කරන්නේය’ යන මේ කාරණය සිදු නොවෙයි. “භවත් ගෞතමයින්ට යම් බඳුවූ සැප වෙදනාවක් කුසල් සිත විනාශ කරයිද, එබඳු සැප වෙදනාවක් නූපන්නා විය හැකිය. යම් බඳුවූ දුක් වේදනාවක් කුසල් සිත විනාශ කරයිද, එබඳු දුක් වේදනාවක් නූපන්නා විය හැකිය.”

“අග්ගිවෙස්සනය, කෙසේ නම් එසේ නොවන්නේද, අග්ගිවෙස්සනය, බුද්ධත්වයට පළමුවෙන්ම බුදුනොවූ බෝසත්වූම මට මෙබඳු අදහසක් විය. ගිහිගෙයි විසීම අවහිර සහිතය, කෙලෙස් රජස් උපදින මාර්ගයයි. මහණකම අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් පිරිසිදුවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ ලියවනලද සකක් බඳුවූ මේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීම පහසු නොවෙයි. මම හිසකේ දැළි රැවුලු කපා හැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැයි (කියාය.) අග්ගිවෙස්සනය, ඒ මම එයින් ටික කලකට පසු තරුණ වයස් ඇත්තේම, කළුවූ හිසකෙස් ඇත්තේම, පළමුවෙනි වයසෙහි යහපත් තරුණ භාවයෙන් යුක්තවූයේම නොකැමතිවූ මවුපියන් අඬද්දී, හිස කෙස් දැළිරැවුල් කපාහැර කසා වත් හැඳගෙන ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදිවීමි.

8. “මෙසේ පැවිදිවූ මම කුසල් කුමක්දැයි සොයන්නේ නිරුත්තර උතුම් නිර්වාණය සොයන්නේ ආළාරකාලාම නම් තවුස්තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි ගොස්, ආළාරකාලාම තාපසයාට මෙසේ කීවෙමි.

“ඇවැත්නි, කාලාමයෙනි, තොපගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට මම කැමැත්තෙමි’යි (කීවෙමි)

අග්ගිවෙස්සනය, මම මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම මට මෙසේ කීවේය. "යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්‍ය්‍යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නේද, මේ ධර්මයද එබඳුය, එහෙයින් ආයුෂ්මත් තෙම වාසය කෙරේවා" (කියායි.)

අග්ගිවෙස්සනය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය අසාම ඉගෙන ගත්තෙමි. අග්ගිවෙස්සනය, ඒ මම (කියන්ට) තොල පෙරලූ පමණින්, (ඔහු) කියනදේ නැවත කී පමණින් මෙබඳු ස්වල්ප කාලයකින් ඥාණවාදයද, (දනිමියයි කීමද) කියමි. ථෙර වාදයද (එහි ස්ථිරයයි කීමද) දනිමියිද දකිමියිද පිළිගනිමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත විය. ආළාරකාලාම තෙම මේ ධර්මය ඇදහීම් පමණකින් තමාම උසස් නුවණින් අවබොධ කොට ඊට පැමිණ වාසය කරමියි නොකියයි. ආළාරකාලාම තෙම මේ ධර්මය දැන දැක වාසය කරයි. (කියායි.) අග්ගිවෙස්සනය, ඉන්පසු මම ආළාරකාලාම යම් තැනකද එහි ගියෙමි. ගොස්, ආළාරකාලාමහට මෙසේකීවෙමි. ඇවැත්නි, කාලාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේදැ'යි (කියායි.)

"අග්ගිවෙස්සනය, මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම ආකිඤ්චඤ්ඤායතනය කෙළවරකොට ඇති සමාපත්තිය දැක්වූයේය. අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත විය. ආළාරකාලාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. ආළාරකාලාමහට පමණක් වීය්‍ය්‍යීය ඇත්තේ නොවෙයි, මටද වීය්‍ය්‍යීය ඇත. ආළාරකාලාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත, ආළාරකාලාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි, මටද සමාධිය ඇත ආළාරකාලාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි, මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් ආළාරකාලාම තෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමියි, කියයි නම් ඒ

ධර්මය අත්කර ගැණීම පිණිස මම උත්සාහ කරන්නෙම් නම් හොඳය (කියායි.)

**9.** "අග්ගිවෙස්සනය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කෙළෙමි. අග්ගිවෙස්සනය ඉන්පසු මම ආළාරකාලාම තෙම යම් තැනකද එතැනට ගියෙමි. ගොස්, ඇවැත්නි කාලාමයෙනි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ'යි (ඇසීමි) 'ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙම් මෙපමණකින්ය'යි (ආළාරකාලාම තෙම) කීය. 'ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමි'යි (කීවෙමි) 'ඇවැත්නි, යම් බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචය්‍ය්‍ය ඇත්තෙකු දකින්නෙමුද, ඒ අපට ලාභයකි. උතුම් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නෙම්ද ඔබද ඒ ධර්මය දන්නෙහිය, යම් හේතුවකින් ඔබ යම් ධර්මයක් දන්නේද, මමද ඒ ධර්මය දන්නෙමි, මෙසේ මම යම් බඳුද ඔබත් එබඳුය. ඔබ යම් බඳුද මාත් එබඳුය. ඇවැත්නි, එනු මැනව, දෙදෙනම එක්ව මේ පිරිස පාලනය කරමු'යි (කීවේය) අග්ගිවෙස්සනය, මෙසේ මාගේ ආචාය්‍ය්‍යවූම ආළාරකාලාම තෙම අතවැසි (ශිෂ්‍ය) වූ ඔහු හා සම සම ස්ථානයෙහි තැබීය. උත්තමවූ පූජාවෙන් මා පිදුවේය.

"අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ සිතුනේය, මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතියි. සසර නොඇල්ම පිණිස නොපවතියි. කෙලෙස් නැති කිරීම පිණිස නොපවතියි. (දතයුතු ධර්මයන්) දැනීම පිණිස නොපවතියි. (චතුරාය්‍ය්‍ය සත්‍යය) අවබොධය පිණිස නොපවතියි. නිර්වාණය පිණිස නොපවතියි. ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්මලොකයෙහි ඉපදීම පිණිස පමණක්

පවතියි. අග්ගිවෙස්සනය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොවේයයි සිතා, ඒ ධර්මයෙහි කලකිරී ඉවත්ව ගියෙමි.

10. "අග්ගිවෙස්සනය, ඒ මම කුසල් කුමක්දැයි සොයන්නේ, නිරුත්තරවූ උතුම් නිර්වාණය සොයන්නේ උද්දකරාම පුත්තතෙම යම් තැනකද එතැනට පැමිණියෙමි. පැමිණ, උද්දකරාමපුත්තහට මෙසේ කීවෙමි. ඇවැත්නි, රාමයෙනි, මේ ධර්ම විනයෙහි බ්‍රහ්මචය්‍ර්‍යාව රකින්ට මම කැමැත්තෙමි (කීවෙමි.) "අග්ගිවෙස්සනය, මෙසේ කී කල්හි උද්දකරාමපුත්තතෙම මට මෙසේ කීවේය. "යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාය්‍ර්‍යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නේද මේ ධර්මයද එබඳුය. එහෙයින් ආයුෂ්මත්තෙම වාසය කෙරේවා" (කියායි)

11. "අග්ගිවෙස්සනය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය ඉගෙනගත්තෙමි. අග්ගිවෙස්සනය, ඒ මම කීමට තොල සෙලවූ පමණින්, වචනයක් කී පමණින් දනිමි යන වචනයද, දැනීම ස්ථිරය යන වචනයද ප්‍රකාශ කරමි. මම දනිමි, දකිමියයි කියමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත විය. උද්දකරාමපුත්ත තෙම මේ ධර්මය ඇදහීම් පමණකින් තමාම උසස් නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසයකරමියි නොකියයි. උද්දකරාම පුත්ත තෙම මේ ධර්මය දැන, දැක වාසය කළේයයි (මට කල්පනා විය.) අග්ගිවෙස්සනය, ඉන්පසු මම උද්දකරාමපුත්ත යම්තැනකද එතැනට ගියෙමි. ගොස්, උද්දකරාම පුත්තහට මෙසේ කීවෙමි. ඇවැත්නි, රාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේදැයි (කියායි.)

"අග්ගිවෙස්සනය, මෙසේ කී කල්හි උද්දකරාමපුත්ත නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, කෙළවර කොට ඇති සමාපත්තිය දැන්වූයේය. අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත විය. රාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව

ඇත. රාමහට පමණක් වීර්‍ය්‍යය ඇත්තේ නොවෙයි. මටද වීර්‍ය්‍යය ඇත. රාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත. රාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි. මටද සමාධිය ඇත. රාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි. මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් රාමපුත්ත තෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමියි කියයිනම් ඒ ධර්මය තමන්ම ප්‍රත්‍යක්ෂ කර ගැණීම පිණිස වීර්‍ය්‍යය කරන්නෙම් නම් යහපත්ය. (කියායි.)

"අග්ගිවෙස්සනය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කෙළෙමි. අග්ගිවෙස්සනය, ඉන් පසු මම උද්දකරාමපුත්ත යම් තැනකද එතැනට ගියෙමි. ගොස්, උද්දකරාමපුත්තහට මෙසේ කීවෙමි.

"ඇවැත්නි, රාමයෙනි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ"යි ඇසීමි. 'ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙම් මෙපමණකින්ය'යි (උද්දකරාමතෙම) කීය. 'ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමි"යි (කීවෙමි)

"ඇවැත්නි, යම්බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචරියා ඇත්තෙකු දකින්නෙමුද ඒ අපට ලාභයකි. මහත් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නේද ඔබද ඒ ධර්මය දන්නෙහිය. ඔබ යම් ධර්මයක් දන්නේද, මමද ඒ ධර්මය දන්නෙමි. මෙසේ මම යම්බඳුද ඔබත් එබඳුය. ඔබ යම් බඳුද මමත් එබඳුය. ඇවැත්නි, එව දෙදෙනම එක්ව මේ පිරිස පාලනය කරමුයි (කීවේය). අග්ගිවෙස්සනය, මෙසේ මාගේ ආචාර්‍ය්‍යවූම

උද්දකරාමපුත්ත තෙම අතවැසි (ශිෂ්‍ය) වූ මා ඔහු හා සම සම ස්ථානයෙහි තැබීය උතුම්වූ පූජාවෙන් මට පිදුවේය.

12. "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ සිතුනේය. මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතී. සසර නොඇල්ම පිණිස නොපවතී. කෙලෙස් නැතිකිරීම පිණිස නොපවතී (දතයුතුධර්මයන්) දැනීම පිණිස නොපවතී (චතුරාර්‍ය්‍ය සත්‍යය) අවබොධය පිණිස නොපවතී. නිර්වාණය පිණිස නොපවතී. යම්තාක් නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්ම ලොකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. අග්ගිවෙස්සනය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොකොට කලකිරී ඒ ධර්මයෙන් ඉවත්ව ගියෙමි.

13. "අග්ගිවෙස්සනය, ඒ මම කුසල් කුමක්දැයි සොයමින්, නිරුත්තරවූ නිර්වාණය සොයමින් මගධ ජනපදයෙහි පිළිවෙලින් ගමන්කරන්නේ උරුවෙල් දනව්වෙහි සේනානී නම් නියම්ගම යම් තැනකද එහි පැමිණියෙමි. එහි සුදුවැලි තලා ඇත්තාවූද, යහපත් තොටවල් ඇත්තාවූද, ගලායන ගඟ ඇත්තාවූද, අවට ගොදුරු ගම් ඇත්තාවූද, ප්‍රසාදය ඇති කරන්නාවූද, සිත් සතුටු කරන්නාවූද වනලැහැබක් ඇති බිම් පෙදෙසක් දුටිමි. අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත පහළ විය. ඒකාන්තයෙන් භූමි ප්‍රදෙශය සිත් අලවන්නේය. වන ලැහැබ සතුට උපදවන්නේය, සුදු වැලිතලා ඇති හොඳ තොටුපලවල් ඇති ගංගාවද සිත් අලවන්නීය. හාත්පස ගොදුරු ගමද වෙයි. වීර්‍ය්‍යය කරන කුලපුත්‍රයෙකුට වීර්‍ය්‍යය කිරීමට මෙය ඒකාන්තයෙන් සුදුසුයි. අග්ගිවෙස්සනය, ඒ මම මේ ස්ථානය වීර්‍ය්‍යය කිරීමට සුදුසුයයි සිතා වීර්‍ය්‍ය වැඩීම පිණිස එහිම උන්නෙමි.

"අග්ගිවෙස්සනය, මට ආශ්චර්‍ය්‍යවූ, පෙර නොඇසූ විරූ උපමා තුනක් වැටහුනාහුය, අග්ගිවෙස්සනය, යම්සේ කිරි සහිතවූ අමු දියේ දමනලද තෙත්වූ (දිඹුල්) ලීකැබැල්ලක් වේද, ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන්නෙමියි ගින්දර ඇතිකරන්නෙමියි, කියා එන්නේය. අග්ගිවෙස්සනය, ඒ පුරුෂතෙම ජලයෙහි බහාලනලද ඒ කිරිසහිත අමු (දිඹුල්) ලී කැබෙල්ල ගිනි ගානා දණ්ඩෙන් මැදීමෙන් ගිනි නිපදවන්නේද?

ගිනි පහළ කරන්නේද?” “භවත් ගෞතමයෙනි, එය සිදු නොවන්නේය. ඊට හේතු කවරේදයත්:- භවත් ගෞතමයෙනි, (දිඹුල්) ලී කඩ වනාහි අමුය, කිරි සහිතය, එපමණක් නොව ජලයෙහිද බහා ලන ලද්දේය. (එහෙයිනි) (ඒ ලීයෙන් ගිනි උපදවනු කැමැති) ඒ පුරුෂතෙම ක්ලාන්තයටද, වෙහෙසටද පැමිණීම පමණක් සිදුවන්නේය.” අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් වස්තු කාමයන්ගෙන් වෙන්ව වාසය නොකරත්ද, කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ යම්කිසි ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මූර්ඡාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, ඒ ක්ලේශ කාමය තමා තුල මනාව නැති නොවූයේ වේද, මනාව මැඩපවත්වන ලද්දේ නොවේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිත්. ඔවුහු ආයර්‍ය මාර්ගඥාන දර්ශනයටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝ මය. අග්ගිවෙස්සනය, ආශ්චර්‍යවූ පෙර නොඇසුවිරූ මේ පළමුවන උපමාව මට වැටහුණි.

14. “අග්ගිවෙස්සනය, ආශ්චර්‍යවූ පෙර නොඇසුවිරූ අන්‍යවූ දෙවෙනි උපමාවක්ද මට වැටහිණි. අග්ගිවෙස්සනය යම්සේ කිරි සහිතවූ අමු (දිඹුල්) ලීයක් දියෙන් ඈත්කොට ගොඩබිමෙහි බහා තබන ලද්දේ වේද. ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩ ගෙන ගිනි නිපද වන්නෙමි. ගින්න පහළ කරන්නෙමියි, කියා එන්නේය. අග්ගිවෙස්සනය, ඒ පුරුෂතෙම කිරි සහිතවූ, දියෙන් ගෙන ගොඩ තබන ලද්දාවූ, ඒ අමු ලීය ගිනි ගානා දණ්ඩෙන් මැදීමෙන් ගිනි උපදවන්නේද? ගින්දර පහළ කරන්නේද?” “භවත් ගෞතමයෙනි, එය සිදු නොවන්නේය. ඊට හේතු කවරේද යත්:- භවත් ගෞතමයෙනි, ඒ ලී කඩ ජලයෙන් බැහැර කර ගොඩබිමෙහි දමා තිබුණත් කිරි සහිතය (අමුය) එහෙයිනි. ඒ පුරුෂයා ක්ලාන්තයටද, වෙහෙසටද පත්වීම පමණක් නම් සිදුවන්නේය.” “අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන් ගෙන් වෙන්ව වාසය කරත්ද, (එහෙත්) කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ ඇල්මක් වේද, කාම ආශාවක් වේද, කාම

මුර්ඡාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, එය අභ්‍යන්තරයෙහි මනාව නැති නොවූයේ වේද, මනාව මැඩ නොපවත්වන ලද්දේ වේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්‍යඥාන දර්ශනයටද, නිරුත්තර අවබොධයටද නුසුදුස්සෝමය.

ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් ඉදින් නොවිඳින්නාහුද, ඥානදර්ශනය ලැබීමටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝමය. අග්ගිවෙස්සනය, මේ වනාහි මට වැටහුනු පුදුමවූ, පෙර නොඇසුවාවූ දෙවෙනි උපමාවයි.

15. "අග්ගිවෙස්සනය, පුදුමවූ පෙර නොඇසුවාවූ තුන් වෙනිවූ අන්‍ය උපමාවක්ද මට වැටහුනේය. අග්ගිවෙස්සනය, වියලුනාවූ, කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩබිමෙහි තබනලද වියලි දරලීයක් වේද, එකල්හි පුරුෂයෙක් ගිනිගානා දණ්ඩ ගෙන ගිනි උපදවන්නෙමි. ගින්න ඇති කරන්නෙමියි එන්නේය. අග්ගිවෙස්සනය, ඒ පුරුෂතෙම වියලුනාවූ කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩ තබනලද ඒ ලීය ඒ ගිනි ගානා දණ්ඩ ගෙන මැදීමෙන් ගිනි උපදවන්නේද? ගින්න ඇති කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එසේය. ඊට හේතු කවරේද? භවත් ගෞතමයෙනි, ඒ ලීය වියලුනේ වෙයි, කිරි සිඳුනේවෙයි, දියෙන් ගෙන ගොඩ තබන ලද්දේත් වෙයි." "අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන්ගෙන් වෙන්ව වාසය කරත්ද, ඔවුන්ගේ කාමවස්තූන් කෙරෙහි යම් ඇල්මක් වේද, කාමආසාවක් වේද, කාම මුර්ඡාවක් වේද, කාම දැවිල්ලක් වේද ඒ කාමආශාව අධ්‍යාත්මයෙහි (ඇතුලත) හොඳින් ප්‍රහීනවූයේ වේද, හොඳින් මැඩ පැවතියේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, තියුණුවූ, කටුකවූ, වෙදනාවන් නොවිඳිත්. ඔවුහු මාර්ගඥානදර්ශනය පිණිස, නිරුත්තරවූ අවබොධය පිණිස සුදුස්සෝමැයි.

"අග්ගිවෙස්සනය, ආශ්චර්‍යවූ පෙර නොඇසූ විරූ මේ උපමාතුන මට වැටහුනාහුය.

**16.** "අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත පහළ විය. යම් හෙයකින් මට යටි දත් පෙළෙහි උඩු දත් පෙළ තදකරගෙන (දත් මිටි කාගෙන,) දිව උඩුතල්ලෙහි තද කරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නෙම් නම්, පෙළන්නෙම් නම් යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම දත්මිටිකාගෙන දිවඋඩුතල්ලෙහි තදකරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරමි, පෙළමි, තවමි. අග්ගිවෙස්සනය, දත්මිටි කාගෙන, දිව උඩුතල්ලෙහි තද කරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙන්නේය.

"අග්ගිවෙස්සනය, යම්සේ බලවත් පුරුෂයෙක්තෙම වඩා දුර්වල පුරුෂයෙකු හිසින් හෝ අල්වාගෙන, බෙල්ලෙන් හෝ අල්වාගෙන තදකරන්නේද, පෙළන්නේද, තවන්නේද, අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම දත්මිටිකාගෙන, දිව උඩු තල්ලෙහි තදකරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙයි.

"අග්ගිවෙස්සනය, මා විසින් නොහැකුළුණු වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේය. සිහිය එළඹ සිටියාය. එහෙයින්ම නුමුළාවිය. ප්‍රධාන වීර්‍ය්‍යයෙන් මඩන ලද්දාවූම මාගේ ශරීරය දාහ සහිත විය. නොසන්සිඳුනේ විය. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක්වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

**17.** "අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත පහළ විය යම් හෙයකින් මම ආශ්වාසකිරීම් රහිත ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක (කියාය.) අග්ගිවෙස්සනය, ඒ මම කටින්ද, නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. අග්ගිවෙස්සනය, කටින්ද, නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි. මයින හමක් පිඹින කල්හි යම්සේ අධික ශබ්දයක් ඇතිවේද, එපරිද්දෙන්ම අග්ගිවෙස්සනය, මාගේ මුඛයෙන්ද නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි.

"අග්ගිවෙස්සනය, මා විසින් නොහැකුළුණු වීර්‍ය්‍යය පටන්ගන්නා ලදී. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළා නොවීය. ප්‍රධාන වීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වෙයි. නොසන්සිඳුනේ වෙයි. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

18. "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. අග්ගිවෙස්සනය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධික වාතය හිස්මුදුන පලන්නාක් මෙන් වෙයි අග්ගිවෙස්සනය, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු කටුවකින් හිස්මුදුන විදින්නේද, එපරිද්දෙන්ම අග්ගිවෙස්සනය, මගේ මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ, කල්හි අධික වාතය හිස්මුදුන පලන්නා සේ වෙයි

"අග්ගිවෙස්සනය, මා විසින් නොහැකුළුණු වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

19. "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. අග්ගිවෙස්සනය, මුඛයෙන්ද නාසයෙන්ද කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි හිසෙහි අධික වේදනාව ඇති වෙයි. අග්ගිවෙස්සනය, යම් සේ බලවත් පුරුෂයෙක් දැඩි වරපට බැම්මකින් හිස වෙළයිද, එපරිද්දෙන්ම අග්ගිවෙස්සනය,

මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ හිසෙහි වේදනාව ඇති වෙයි.

"අග්ගිවෙස්සනය, මා විසින් නොහැකුළුණු වීය්‍ය්‍යීය පටන්ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය ප්‍රධාන වීය්‍ය්‍යීයෙන් වීය්‍ය්‍යී වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

**20.** "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූවෙමි. අග්ගිවෙස්සනය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධිකවූ වාතයෝ කුස සිඳිත්.

"අග්ගිවෙස්සනය, දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගෙරින් කපන තියුණු ආයුධයකින් බඩ කපන්නේ යම්සේද, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධික වාතය උදරය කපන්නාසේ වෙයි.

"අග්ගිවෙස්සනය, මා විසින් නොහැකුළුණු වීය්‍ය්‍යීය පටන් ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීය්‍ය්‍යීයෙන් වීය්‍ය්‍යී කරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වෙයි. නොසංසිඳුනේ වෙයි. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

**21.** "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. ආශ්වාස රහිතවූ ධ්‍යානය වඩන්නෙම්නම් යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වුයෙමි. අග්ගිවෙස්සනය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළක්වූ කල්හි ශරීරයෙහි අධික දැවිල්ලක් වෙයි. අග්ගිවෙස්සනය, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වල පුරුෂයෙකු අත් දෙකෙන්

අල්ලා ගෙන අඟුරු වළකට අල්ලා තවන්නාහුද, අතිශයින් තවන්නාහුද, අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ ශරීරයේ අධික දැවිල්ලක් වෙයි.

"අග්ගිවෙස්සනය, මා විසින් වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේමය. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්‍ය්‍යයෙන් වීර්‍ය්‍යකරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වීර්‍ය්‍යයෙන්ම විඩා සහිත වෙයි. නොසංසිඳුනේ වෙයි. අග්ගිවෙස්සනය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

"එකල්හි දේවතාවෝ මා දැක මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය කළේය' (කියායි) ඇතැම් දේවතා කෙනෙක් මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතමතෙම කළුරිය නොකෙළේය. එහෙත් කළුරිය කරන්නේය' (කියායි.) ඇතැම් දෙවතා කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම කලුරිය කළේත් නොවේ. කලුරිය කරන්නේත් නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම රහත්ය. රහතුන්ගේ වාසය කිරීමකැ'යි (කීහ.)

**21.** "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. යම් හෙයකින් මම මුළුමනින් ආහාර නොවැළඳීම පිණිස පිළිපදින්නෙම් නම් ඉතා යෙහෙක' (කියායි.) අග්ගිවෙස්සනය, එවිට දේවතාවෝ මා වෙත පැමිණ මෙසේ කීහ. 'නිදුකාණෙනි, ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටින්නට නොසිතුව මැනවි. යම් හෙයකින් ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටිය හොත් අපි ඔබගේ ලෝම සිදුරුවලින් දිව්‍ය ඕජස් ශරීරගත කරන්නෙමු. ඔබ එයින් යැපෙන්නෙහිය.' අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ කල්පනා විය. මම වනාහි මුළුමනින් නිරාහාරව සිටීමට සිතින් එකඟ වුනෙමි. එහෙත් මේ දේවතාවෝ මාගේ ලොම් සිදුරුවලින් දිව්‍ය ඕජස ගිල්වන්නාහු නම් එයින් මම යැපෙන්නෙමි. එය මාගේ මුසාවක් වන්නේය. (කියායි.) අග්ගිවෙස්සනය, ඒ මම ඒ දෙවියන් වැළැක්වූයෙමි. වුවමනා නැතැයි කීයෙමි.

"අග්ගිවෙස්සනය, ඒ මට මේ සිත පහළ විය. යම් හෙයකින් මම පතක් පතක් පමණවූ මුංතැම්බු දිය හෝ කොල්ලු තැම්බූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්පවූ ආහාරයක් වළඳන්නෙම් නම් යෙහෙකි (කියායි.)

"අග්ගිවෙස්සනය, ඒ මම පතක් පතක් පමණවූ, මුංතැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාරය වැළඳුවෙමි. අග්ගිවෙස්සනය, ඒ මම පතක් පතක් පමණවූ මුං තැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාර ගන්නාවූ ඒ මාගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේ වෙයි. අසූ වසක් ගිය වැලක පුරුක් හෝ කලුවැල් නම් වැලක පුරුක් හෝ යම්සේද මාගේ අඟපසඟ ඒ නිරාහාරභාවය නිසාම එබඳුවිය. ඔටුපියවර යම්සේ මැද ගැඹුරුවේද, එපරිද්දෙන්ම ඒ නිරාහාර භාවයෙන් මාගේ නිසීදනමාංසය (තට්ටම) මැදින් ගැඹුරු විය. රැහැණක ඇවුණු දැව වැටිය යම්සේ අතරතුර උස් මිටි වේද, එපරිද්දෙන් ඒ නිරාහාර භාවයෙන් මාගේ කොඳු ඇටය උස් මිටිවෙයි. යම්සේ දිරූ ශාලාවක පරාල උඩු යටි වශයෙන් නැමුනාහු වෙද්ද, එපරිද්දෙන් මාගේ ඉළඇට උඩුයටි වශයෙන් නැමුනාහු වෙත්. ගැඹුරුවූ ළිඳෙක දියයට පෙණෙන තුරු ගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත්ද, එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මාගේ ඇස්වල නෙත්තරු වලගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත්. යම්සේ නම් තිත්ත ලබු ගෙඩියක් අමුවෙන් කපන ලද්දේ අව්සුළඟින් හැකුලුණේද මැලවුනේද, එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මගේ හිසේ සම හැකුලුණේ මැලවුනේ වෙයි.

"අග්ගිවෙස්සනය, ඒ මම බඩේ සම අතගාන්නෙමියි පිට කටුවම අතගාන්නෙමි. පිට කටුව අල්වමියි බඩේ සම අල්ලමි. අග්ගිවෙස්සනය, ඒ ස්වල්ප ආහාරය නිසා එපමණට මාගේ බඩේ සම කොඳු ඇටයෙහි ඇලුනේ වෙයි. ඒ මම වර්චස් හෝ මුත්‍ර හෝ කරන්නෙමියි හුන්නේ ඒ ස්වල්ප ආහාරය නිසාම එහිම යටිකුරුව වැටෙමි. මම මේ ශරීරය අස්වසමියි අතින් ශරීරාවයව පිරිමදිමි. අග්ගිවෙස්සනය, එසේ ශරීරයේ අවයව

අතගානවිට, ඒ ස්වල්ප ආහාරය නිසාම මුල්කුණුවූ ලොම් ශරීරයෙන් වැටෙත්.

"අග්ගිවෙස්සනය, සමහර මිනිස්සු මා දැක මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලුය.' ඇතැම් මිනිස්සු මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලු නොවෙයි පලාවන් පාටය.' ඇතැම් මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලුත් නොවෙයි, පලාවන් පාටත් නොවෙයි, ශ්‍රමණ ගෞතමතෙම රන් වන් සිවි ඇත්තේයි.' අග්ගිවෙස්සනය, මෙසේ කීමට තරමටම මාගේ පිරිසිදුවූ හාත්පසින් බබලන්නාවූ ශරීරවර්ණය ඒ නිරාහාරභාවය නිසාම නැසුනේ වෙයි.

22. "අග්ගිවෙස්සනය, ඒ මට මෙසේ සිතුනේය. අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා වින්දාහු නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා විඳින්නාහු නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. මේ වර්තමාන කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ දුක්වූ, තියුණුවූ වෙදනාවන් විඳිත් නම් ඒ මේ තරම්ම වෙයි මීට වඩා වැඩි නොවෙයි. මම වනාහි මේ කටුකවූ දුෂ්කරක්‍රියාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්‍ය්‍ය භාවය ඇති කිරීමට සමර්ථවූ ඥානදර්ශන විශෙෂයක් නොලබමි. මාර්ගාවබොධය පිණිස අන්‍ය මාර්ගයෙක් ඇත්තේදැයි (කල්පනා විය.)

23. "අග්ගිවෙස්සනය, ඒ මට මේ අදහස විය. මම, පියවූ ශුද්ධොදන ශාක්‍ය රාජයාගේ වප්මගුල් දිනයෙහි සිහිල්වූ දඹ රුක් සෙවනෙහි හුන්නේ කාමයන් ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කළබව දනිමි. ඒ මාර්ගය මාර්ගඥාන අවබොධය පිණිස වන්නේයි (අදහස් විය.) අග්ගිවෙස්සනය, ඒමට අවබොධය

පිණිස මේ මාර්ගයමැයි සිහිය අනුව පැවති විඥ්ඥාණය පහළවිය. අග්ගිවෙස්සනය, ඒ මට මේ අදහස විය. කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්වූ යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය වෙම්ද (කියාය.) අග්ගිවෙස්සනය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය නොවෙම්යි (කීවාය.) අග්ගිවෙස්සනය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. මෙ තරම් දුර්වලවූ ශරීරයකින් යුක්තව ඒ (ප්‍රථමධ්‍යාන) සැපය ලබන්නට බැරිය. යම්හෙයකින් මම බත් හා කොමුපිඩු ආදි ඖදාරික ආහාරයක් ගන්නෙම් නම් හොඳය (කියාය.)

"අග්ගිවෙස්සනය, ඒ මම බත්, කොමපිඩුයැයි කියන ඔළාරික ආහාරයක් ගත්තෙමි. අග්ගිවෙස්සනය, ඒ කාලයෙහි 'ශ්‍රමණ ගෞතමතෙම යම් ලොවුතුරා දහමක් ලැබුයේ නම් එය අපට කියන්නේය' යන අදහසින් භික්ෂූන් පස්දෙනෙක් මට උපස්ථාන කරමින් සිටියහ. අග්ගිවෙස්සනය, යම් කලක පටන් මම බත් හා කොමුපිඩු ආහාර ගන්නට වූයෙම්ද, එකල්හි ඒ භික්ෂුහු 'ශ්‍රමණ ගෞතමතෙම ප්‍රත්‍යය බහුලකොට ඇත්තේය. රසයෙහි ගිජුව ප්‍රණීත පිණ්ඩපාතාදිය වැළඳීමට හැරුණේය. වීයර්‍ය කිරීමෙන් පිරිහුණේයැ'යි කියා කලකිරී බැහැර ගියාහුය.

"අග්ගිවෙස්සනය, ඒ මම ඕලාරික ආහාරගෙන ශරීර ශක්තිය ලැබ කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙළෙම් අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

විතක්ක විචාර සංසිඳීමෙන් අභ්‍යන්තර පැහැදීම ඇති හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙළෙම්. අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූද සැප වෙදනාවද මගේ කුසල් සිත විනාශ නොකරයි. මැඩගෙන නොසිටියි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය

කෙළෙමි. සිහියෙන් හා මනා නුවණින් යුක්තවූයේ කයින්ද සැපය වින්දෙමි. යමක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේයැයි ආය්‍යීයෝ කියත්ද. ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි. සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක්නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදුබව ඇති සතර වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳු වූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි.

**24.** "ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූකල්හි (පිරිසිදු හෙයින්ම) දීප්තිමත්වූ කල්හි අංගන (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, පහවූ උවදුරු ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි සිත ස්ථිරවූ කල්හි පෙර ජාති දැනීමේ ඥාණය පිණිස සිත නැමුයෙමි. ඒ මම නොයෙක් ආකාරවූ පූර්වෙනිවාසය (පෙර උපන් ජාති,) සිහිකරමි. එනම් එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසුවල් තැන උපන්නෙමි, එහිදී මේ නම් ඇත්තේ වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේවීමි. මෙබඳු ආහාර ඇත්තේවීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතවූ, දැක්වීම් සහිතවූ, නොයෙක් ආකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි.

"අග්ගිවෙස්සනය, මා විසින් රාත්‍රියේ පළමුවෙනි යාමයෙහි මේ පළමුවන විද්‍යාව (පෙර විසූ තැන් දන්නා නුවණ) ලබන ලදී. (එය වසන) අවිද්‍යාව නසනලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේවිය. අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි.

**25.** "ඒ මම මෙසේ (හිත සමාධියෙන්) එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, (පිරිසුදු හෙයින්) දීප්තිමත්වූ කල්හි, අංගණ (රාගාදි කෙලෙස්) රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දැකීම පිණිස සිත නැමීමි. ඒ මම පිරිසිදුවූ, මිනිස් බව ඉක්මවා සිටි දිවඇසින්, චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මියගියාවූ, සත්වයන් දකිමි.

"ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන, නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනො සුචරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් නොකීවාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමක වූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද කර්මය පරිදි මියගියාවූ සත්වයන් දනිමි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"අග්ගිවෙස්සනය, මා විසින් රාත්‍රියෙහි මැද යාමයෙහි මේ දෙවන විද්‍යාව (චුතවීම්, ඉපදීම් දක්නා නුවණ) ලබනලදී. (එය වසන) අවිද්‍යාව නසනලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ වීය. අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

**26.** "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, ආශ්‍රව ක්ෂයකර ඥානය (කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත නැමුයෙමි. ඒ මම, මෙය දුකය'යි තතුසේ දත්තෙමි. මේ 'දුක් ඉපදීමට හේතුවය'යි තතුසේ දත්තෙමි. මේ 'දුක් නැති කිරීමය'යි තතුසේ දත්තෙමි. මෙ 'දුක් නැති කිරීමය'යි තතුසේ දත්තෙමි. 'මේ දුක නැති කිරීමේ මාර්ගය'යයි තතුසේ දත්තෙමි. 'මොහු ආශ්‍රවයෝය'යි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන්ගේ හටගැන්මය'යි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමය'යයි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන් නැති කිරීමේ මාර්ගය'යි තතුසේ දැනගතිමි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ සිත කාමාශ්‍රවයන්ගෙන් මිදුනේය. භවාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. මිදුන කල්හි මිදුනේයයි දැනීම පහළවිය. උත්පත්තිය කෙළවර විය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. කළයුතු අනිකක් නැත්තේයයි දැනගතිමි.

"අග්ගිවෙස්සනය, රාත්‍රියෙහි අන්තිම යාමයෙහි මේ තුන්වෙනි විද්‍යාව (ආශ්‍රවක්ෂයකරඥාන නම්වූ අර්හත් මාර්ගය) මා විසින් ලබනලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය.

අග්ගිවෙස්සනය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

"අග්ගිවෙස්සනය, මම වනාහි නොයෙක් සියගණන් පිරිසෙහි ධර්මය දෙශනා කළ බව දනිමි. (එහිදී) 'මටම ශ්‍රමණ ගෞතමතෙම ධර්මය දෙශනා කරන්නේය'යි එක් එක් පුද්ගලයා සිතයි. අග්ගිවෙස්සනය, මේ කාරණය මෙසේ නොදත යුතුයි. තථාගතතෙම අන්‍යයන්ට ධර්මය අවබොධ කිරීම පිණිසම ධර්මය දෙශනා කරති. අග්ගිවෙස්සනය, ඒ මම ඒ දෙශනාව අවසානයෙහිත් මුලදිත් යම් කිසි සමාධියකින් නිතර වාසය කරන්නෙම් නම් ඒ සමාධියෙහිම සිත පිහිටුවමි, හිඳුවමි, එකඟ කරමි, සමාධිගත කරමි."

"යම් ඵලසමාපත්තියකින් නිතරම වාසයකරමි'යි (වදාරන සේක්ද) අර්හත්වූ සම්‍යක්සම්බුද්ධ කෙනෙකුට යම්සේ නම් එසේම භවත් ගෞතමයින්ගේ මේ සමාපත්තියට සමවැදීම ඇදහිය යුතුය භවත් ගෞතමතෙම දවල් නිදාගත් බවක් දන්න සේක්ද?" "අග්ගිවෙස්සනය, ග්‍රීෂ්ම ඍතුවෙහි අන්තිම මාසයෙහි බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුනේ සඟල සිවුර සතර පටක් කොට එළා සිහි ඇතිව මනා නුවණ ඇතිව දකුණු ඇලයෙන් නිදාගත් බව මම දනිමි." "භවත් ගෞතමයෙනි, ඇතැම් මහණ බමුණෝ මේ දහවල් නිදීම වනාහි සම්මොහ විහරණයයි (මුළාවී වාසය කිරීමක්යයි) කියත්." "අග්ගිවෙස්සනය, මෙපමණකින් මුළාවූවෙක් හෝ නුමුළාවූවෙක් හෝ නොවෙයි. අග්ගිවෙස්සනය, යම්සේ මුළාවූවෙක් වේද, මුළානොවූවෙක් හෝ වේද, එය අසව, මනාකොට සිතෙහි තබාගනුව, කියන්නෙමි.' "එසේය, පින්වතුන්වහන්ස" කියා සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

27. "අග්ගිවෙස්සනය, යම් කිසිවෙකුට සිත කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇතිකරන්නාවූ දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නාවූ යම් ආශ්‍රවයෝ වෙද්ද, ඔවුහු නැති නොවූවාහුද, ඔහු මුළාවූවෙකැයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මම කියමි. අග්ගිවෙස්සනය, ආශ්‍රවයන්ගේ නැති නොකිරීම නිසා මුළාවෙයි.

"අග්ගිවෙස්සනය, යම් කිසිවෙකුට සිත කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක දෙන්නාවූ මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නාවූ යම් ආශ්‍රවකෙනෙක් වෙද්ද, ඔවුහු නැතිවූවාහුද, මම ඔහු නොමුළාවූවෙකැයි කියමි. අග්ගිවෙස්සනය, කෙලෙසුන් නැති කිරීමෙන් නොමුළාවූයේ වෙයි.

"අග්ගිවෙස්සනය, තථාගතයන් වහන්සේට වනාහි සිත කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූද, දැවිලි සහිතවූ, දුක් විපාක ඇතිකරන්නාවූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නාවූ යම් ආශ්‍රවයෝ වෙත්ද, ඔවුහු නැති වූවාහුය, සිඳිනලද මුල් ඇත්තාහ. මුලින් උදුරන ලද තල් ගසක් මෙන් කරන ලදහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදින ස්වභාව ඇත්තාහ. අග්ගිවෙස්සනය, මුදුන කපන ලද තල් ගසක් යම්සේ නැවත වැඩෙන්නට නොසුදුසුද, අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම තථාගතයන් වහන්සේගේ, සිත කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇති කරන්නාවූ, මත්තෙහි ජාති ජරා මරණ පිණිස පවත්නාවූ යම් ක්ලෙසයෝ වෙත්ද, ඔවුහු නැති වූහ. මුල් සිඳින ලද්දාහ. මුලින් උදුරන ලද තල් ගසක් මෙන් කරන ලදහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදින ස්වභාව ඇත්තාහ.

මෙසේ වදාළ කල්හි සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. 'භවත් ගෞතමයාණෙනි, ආශ්චර්‍ය්‍යය, භවත් ගෞතමයාණෙනි, අද්භූතය, මෙසේ ගට ගටා කියනු ලබන්නාවූ, එලව එලවා කියනලද, වචනවලින් ව්‍යවහාර කරනු ලබන්නාවූ භවත් ගෞතමයින්ගේ ශරීරවර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්‍යක් සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේය.

"භවත් ගෞතමයාණෙනි, මම පූරණ කාශ්‍යපහට වාද කථාවෙන් වාදය ආරොපණය කළබව දනිමි. හෙතෙම වනාහී

මා විසින් වාද කථාවෙන් වාදය පටන් ගන්නා ලද්දේ අන්‍ය කථාවකින්, කථාව යටපත් කෙළේය. කථාව පිටතට නැමීය. කෝපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කෙළේය. මෙසේ ගට ගටා කියනු ලබන්නාවූ වෙත පමුනුවන ලද්දාවූ, වචනවලින් ව්‍යවහාර කරනු ලබන්නාවූ භවත් ගෞතමයින්ගේ වනාහි ශරීරවර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්‍යක් සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේමය. භවත් ගෞතමයාණෙනි, මක්ඛලිගොසාලහටද, වාදයෙන් වාදය නැගුවා දනිමි. ඔහු වනාහි මා විසින් වාදයෙන් වාදය පටන් ගන්නා ලද්දේ වෙන කථාවකින් කථාව යට කළේය. කථාව පිටතට නැමීය. කෝපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කළේය. මෙසේ ගටගටා කියනු ලබන්නාවූ, වෙත පමුණුවනු ලද්දාවූ, වචනවලින් ව්‍යවහාර කරනු ලබන්නාවූ භවත් ගෞතමයින්ගේ වනාහි ශරීර වර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්මාසම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේයි.

"අජිතකෙසකම්බලහටද, වාදයෙන් වාදය නැගුවා දනිමි. ඔහුවනාහි මා විසින් වාදයෙන් වාදය පටන් ගන්නා ලද්දේ වෙන කථාවකින් කථාව යට කළේය. කථාව පිටතට නැමීය. කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කළේය. මෙසේ ගට ගටා කියනු ලබන්නාවූ, වෙත පමුණුවන වචනවලින් ව්‍යවහාරකරනු ලබන්නාවූ භවත් ගෞතමයන්ගේ ශරීර වර්ණයද බබලයී. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්මා සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේයි.

"පකුධකච්චායනටද, වාදයෙන් වාදය නැගුවා දනිමි. ඔහු වනාහි මා විසින් වාදයෙන් වාදය පටන් ගන්නා ලද්දේ, වෙන කථාවකින් කථාව යට කළේය. කථාව පිටතට නැමීය. කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කෙළේය. මෙසේ ගට ගටා කියනු ලබන්නාවූ, වෙත පමුණුවන වචනවලින් ව්‍යවහාර කරනු ලබන්නාවූ භවත් ගෞතමයන්ගේ ශරීර වර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්මා සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"සංජය බෙලට්ඨිපුත්තටද, වාදයෙන් වාදය නැගුවා දනිමි. ඔහු වනාහි මා විසින් වාදයෙන් වාදය පටන්ගන්නා ලද්දේ වෙන කථාවකින් කථාව යට කළේය. කථාව පිටතට නැමීය. කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කළේය. මෙසේ ගට ගටා කියනු ලබන්නාවූ, වෙත පමුණුවන වචනවලින් ව්‍යවහාර කරනු ලබන්නාවූ භවත් ගෞතමයන්ගේ ශරීර වර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්මා සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේය,

"නිගණ්ඨනාතපුත්තටද, වාදයෙන් වාදය නැගුවා දනිමි ඔහු වනාහි මා විසින් වාදයෙන් වාදය පටන් ගන්නා ලද්දේ වෙන කථාවකින් කථාව යට කළේය. කථාව පිටතට නැමීය. කොපයද, ද්වෙෂයද, නොසතුටද පහළ කෙළේය. මෙසේ ගටගටා කියනු ලබන්නාවූ, වෙත පමුණුවන වචන වලින් ව්‍යවහාර කරණු ලබන්නාවූ භවත් ගෞතමයන්ගේ ශරීරවර්ණයද බබලයි. මුහුණෙහි වර්ණයද පහදියි. අර්හත්වූ සම්මා සම්බුදු කෙනෙකුට යම්සේ නම් එසේය.

"භවත් ගෞතමයාණෙනි, දැන් අපි යන්නෙමු. අපි බොහෝ වැඩ කටයුතු ඇත්තෝ වෙමු." "අග්ගිවෙස්සනය, නුඹ යමක් සඳහා සුදුසුයයි හඟින්නෙහිද, දැන් ඊට කාලය"යි වදාළහ. ඉක්බිති සච්චක නිගණ්ඨ පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගෙන උන් ආසනයෙන් නැගිට ගියේය.

**සයවෙනිවූ මහා සච්චක සූත්‍රය නිමි. (4-6)**

## 37. චූල තණ්හා සංඛය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පූර්වාරාම නම්වූ මිගාර මාතු ප්‍රාසාදයෙහි වාසයකරති. එකල්හි සක්දෙව් රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ සක්දෙව් රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "ස්වාමීනි,

භික්ෂුවක් කොතෙක් කරුණුවලින් නිවන් අරමුණුකොට කෙලෙස්වලින් මිදුණු 'ඉපදීම් මැරීම් දෙක නිමකළ' ඒකාන්තයෙන් කෙලෙස් බැම්වලින් මිදුණු නිත්‍ය බ්‍රහ්මචරියා ඇති, ඒකාන්ත කෙළවර ඇති දෙවි මිනිසුන්ට ශ්‍රෙෂ්ඨයෙක් වන ප්‍රතිපදාව කොටින් කුමක්දැයි ඇසීය.

"දෙවෙන්ද්‍රය, මේ ශාසනයෙහි මහණහු විසින් (පංචස්කන්ධ, දොළොස්ආයතන, අටලොස්ධාතු යන) සියලු ධර්මයෝ (තෘෂ්ණා දෘෂ්ටි දෙකින්) 'මමය මාගේය'යි අල්වාගැනීමට සුදුසු නොවේ යයි අසන ලද්දේ වේද, දෙවෙන්ද්‍රය, එසේ භික්ෂුව විසින් සියලු ධර්මයෝ 'මමය මාගේය'යි ගැනීමට සුදුසු නොවේයයි අසන ලද්දේ නම්, හෙතෙම සියලු ධර්මයන් ස්කන්ධ ධාතු ආදි වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් පිරිසිඳ දැන සැප වූ හෝ දුක් වූ හෝ, දුක්ද නොවූ සැපද නොවූ හෝ වෙදනාවක් විඳියිද, ඒ වෙදනා කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විරාගය අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි. දුරලීම අනුව බලමින් වාසය කරයි. හෙතෙම ඒ වේදනාවන් කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නේ විරාගය අනුව බලමින් වාසය කරන්නේ, නිරොධය අනුව බලමින් වාසය කරන්නේ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නේ ලෝකයේ කිසියම් සංස්කාරයක් (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගනියි. (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගන්නේ තැති නොගනියි, තැති නොගන්නේ මේ ආත්මයෙදීම ක්ලෙශ පරිනිර්වාණය කරයි. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. කටයුත්ත කරනලදී. මින්පසු තවත් කළයුත්තක් නැත්තේයයි දනියි.

"දෙවෙන්ද්‍රය මෙපමණකින් මහණතෙම කොටින් නිවන් අරමුණු කොට කෙලෙසුන් කෙරෙන් මිදුණ, ඉපදීම් මැරීම් දෙක නිමකළ, කෙලෙස් බැම්වලින් මිදුණ ඒකාන්ත බ්‍රහ්මචරියාව, ඇති ඒකාන්ත කෙළවර ඇති, දෙවි මිනිසුන්ට ශ්‍රෙෂ්ඨයෙක් වන්නේය'යි, (වදාළේය)

**2.** ඉක්බිති සක්දෙව් රජතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවී අනුමෝදන්ව බුදුන් වැඳ පැදකුණු කොට එහිම අතුරුදන්විය. එකල්හි මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට නොදුරෙහි හුන්හ. ඉක්බිති මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට මේ සිත පහළ විය 'කිමෙක්ද සක්දෙව්තෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව දැන සතුටුවීද, නොහොත් එසේ නොවීද, යම් හෙයකින් මේ දෙව්තෙම භාග්‍යවතුන්වහන්සේගේ වචන දැන සතුටුවීද, නැතහොත් එසේ නොවීදැයි, දැනගන්නෙම් නම් යහපති' (කියායි)

ඉක්බිති මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ යම්සේ ශක්තිමත් පුරුෂයෙක් හකුලන ලද අත දික් කරන්නේද, දික්කළ අත හකුලන්නේද, එමෙන් ඇසිල්ලකින් පූර්වාරාමනම්වූ මිගාරමාතු ප්‍රාසාදයෙහි අතුරුදන්වූයේ තව්තිසා දෙව්ලොවෙහි පහළවූහ.

එකල්හි සක්දෙව් රජතෙම එකපුණ්ඩරීක නම් උයනෙහි දිව්‍යමයවූ තූර්‍ය්‍යභාණ්ඩ පන්සියයකින් පිරිවරන ලදුව ඒ (නැටුම් ගැයුම් වැයුම්) රස විඳිමින් සිටියේය. සක්දෙව් රජ තෙම එන්නාවූ මහාමෞද්ගල්ල්‍යායන ස්ථවිරයන් වහන්සේ දුරදීම දැක, ඒ තූර්‍ය්‍ය වාදන පන්සියය නවත්වා ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය. "නිදුක්වූ මෞද්ගල්‍යායනයන් වහන්ස, මෙහි වඩිනු මැනවි, නිදුක්වූ මෞද්ගල්‍යායනයන් වහන්ස සුබ ගමනක් වේවා! නිදුක්වූ මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්ස, බොහෝ කලකින් මෙහි වැඩියහ. පින්වත් මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්ස, පනවා තිබෙන මේ අසුනෙහි වැඩ හිඳිනු මැනවි". මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ පනවන ලද ආසනයෙහි වැඩහුන්හ. ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේද, එක්තරා මිටි ආසනයක් ගෙන එක පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූ ශක්‍රදෙවේන්ද්‍රයාට මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ.

3. "කොසියයෙනි, (ශක්‍රයාට නමකි) භාග්‍යවතුන් වහන්සේ තොපට තෘෂ්ණා විමුක්තිය වදාළේ කෙසේද? අපිද ඒ කථාව ඇසීමට කොටස්කාරයෝ වෙමු නම් හොඳය" (කියාය) "මෞද්ගල්‍යායනයන් වහන්ස, අපි බොහෝ කටයුතු ඇත්තම්හ. වැඩ බහුලයම්හ. ස්වල්පවූ ස්වකීය කටයුතුවලින්ද, තව්තිසා වැසි දෙවියන්ගේ බොහෝ කටයුතුවලින්ද වැඩ බහුලය. එහෙයින් මෞද්ගල්‍යායනයන් වහන්ස, අප විසින් යමක් මනාව අසන ලද්දේද, මනාව ඉගෙන ගන්නා ලද්දේද, මනාව හිත තබා ගන්නා ලද්දේද, මනාව දරණ ලද්දේද, එය වහාම මතක නැතිවීයයි. මෞද්ගල්‍යායනයන් වහන්ස, පෙරවූවක් කියමි. දෙවියන් හා අසුරයන් අතර යුද්ධයක් විය. මෞද්ගල්‍යයනයන් වහන්ස, ඒ යුද්ධයෙන් දෙවියෝ දිනූහ. අසුරයෝ පැරදුනාහ. පින්වත් මෞද්ගල්‍යායනයන් වහන්ස, ඒ මම වනාහි ඒ යුද්ධය දිනා හැරී අවුත් වෛජයන්ත නම් ප්‍රාසාදයක් මැවීමි. මෞද්ගල්‍යායනයන් වහන්ස, ඒ විජයොත්පායෙහි දොරටු සියයෙකි. එක එක දොරටුවෙහි කුළුගෙවල් සත් සියයෙකි. එක එක කුළුගෙයි දිව්‍යප්සරාවෝ සත් සත් දෙනෙක් වෙත්. එක එක දිව්‍යප්සරාවට පිරිවර ස්ත්‍රීහු සත් සත් දෙන වෙති. මෞද්ගල්‍යායනයන් වහන්ස, ඔබවහන්සේ වෛජයන්ත ප්‍රාසාදයෙහි රමණීය භාවය දකින්නට සතුටුද?' මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ එය නිශ්ශබ්දව ඉවසූහ.

ඉක්බිති සක්දෙව් රජද, වෙසවුණු මහරජද මහ මුගලන් තෙරුන්වහන්සේ පෙරටුකොට ගෙන විජයොත් පහය යම් තැනක්හිද එතැනට ගියහ. සක්දෙවිඳුගේ පාදපරිචාරිකා ස්ත්‍රීහු දුරින්ම එන්නාවූ මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ දුටුවාහුමය, දැක බිය වෙමින්ද, ලජ්ජා වෙමින්ද තම තමන්ගේ කාමරවලට වැදුණාහුය. යම්සේ නම් ලේලිය මාමා දැක බියවේද, ලජ්ජා වේද, එපරිද්දෙන්ම සක්දෙවිඳුගේ පාදපරිචාරිකා ස්ත්‍රීහු දුරින්ම එන්නාවූ මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ දැක බිය වෙමින්ද, ලජ්ජා වෙමින්ද තම තමන්ගේ කාමරවලට වැදුණාහුය.

ඉක්බිති සක්දෙව්රජද වෙසවුණු රජද මහ මුගලන් තෙරුන් වහන්සේ විජයොත් පහයෙහි සක්මන් කරවත්, හසුරුවත්, "මෞද්ගල්‍යායනයන් වහන්ස, විජයොත් පහයෙහි මේ රමණීය බවද බලනු මැනව. මෞද්ගල්‍යායනයන් වහන්ස, වෛජයන්ත ප්‍රාසාදයෙහි මේ රමණීය බවද බලනු මැනව" යි කියමින් ප්‍රාසාදය පෙන්වති. පෙර කළ පින් ඇත්තෙකුට යම්සේ නම්, එසේම මෙය ආයුෂ්මත් කොසියයන්හට හොබනේය. කිසියම් රමණීය බවක් දක්නාවූ මනුෂ්‍යයෝද, මෙසේ කියති. 'තව්තිසා දෙව්ලොව වැසි දෙවියන්ට සුදුසුය.' (යනුවෙනි) පෙර කළ පින් ඇත්තෙකුට යම්සේනම් එසේම මෙය ආයුෂ්මත් කොසියන්හට සුදුසුයයි (මුගලන් තෙරුන් වහන්සේ කීහ)

4. ඉක්බිති මහ මුගලන් තෙරුන්වහන්සේට මේ අදහස විය. "මේ දෙවිතෙම ඉතා දැඩිසේ ප්‍රමාදව වෙසෙයි. මම යම්හෙයකින් මේ දෙවියා සංවේගයට පමුණුවන්නෙම් නම් ඉතා යෙහෙක" (කියායි.) ඉක්බිති මහ මුගලන් තෙරණුවෝ යම්සේ විජයොත්පහය පය මාපටැඟිල්ලෙන් ගැසීමෙන් කම්පාවේද, අතිශයින් කම්පාවේද, වෙවුලායාද, එබඳු ඍද්ධියක් කළහ. ඉක්බිති සක්දෙව්රජුද, වෙසෙවුණු රජුද තව්තිසා වැසි දෙවියෝද, ආශ්චර්‍ය්‍ය අද්භූත සිත් ඇත්තෝ වූහ. "යමෙක් වනාහි මේ දිව්‍ය භවනය, පය මාපටැඟිල්ලෙන් කම්පා කෙළේද, විශෙෂයෙන් කම්පා කළේද, සෙලවූයේද, පින්වත්නි, ඒකාන්තයෙන් ඒ ශ්‍රමණයාගේ මහත් ඍද්ධි ඇති බව, මහත් අනුභාව ඇතිබව ආශ්චර්‍ය්‍යයි" (කියාය.)

ඉක්බිති මහ මුගලන් ස්ථවිරයන් වහන්සේ, සංවෙගයට පැමිණි, ලොමු ඩැහැගත් බවට පැමිණි සක්දෙව්රජු දැන ඔහුට මෙසේ කීහ. "කොසියයෙනි, භාග්‍යවතුන් වහන්සේ තොපට තෘෂ්ණා විමුක්තිය වදාළේ කෙසේද? අපිද ඒ කථාව ඇසීමට කොටස් කාරයෝ වෙමුනම් මැනවි." (කියායි) "නිදුක්වූ මෞද්ගල්‍යායනයන් වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෙමි. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක උන්නෙමි. එක පැත්තක උන්නාවූ මම භාග්‍යවතුන්වහන්සේට මෙසේ කීවෙමි. 'ස්වාමීනි, කොපමණකින්

මහණ තෙම කොටින් තණ්හාවෙන් මිදුනු සිත් ඇත්තේ ඒකාන්ත අවශානය ඇත්තේ, ඒකාන්තයෙන් කෙලෙස් බැම්වලින් මිදුනේ, ඒකාන්ත බ්‍රහ්මචරියා ඇත්තේ, ඒකාන්ත කෙළවර ඇත්තේ දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨ වේදැ'යි (කියාය) නිදුක්වූ මෞද්ගල්‍යායනයන් වහන්ස මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ වදාළෝය.

"දෙවෙන්ද්‍රය, මේ ශාසනයෙහි මහණහු විසින් (පංචස්කන්ධය, දොළොස් ආයතන, අටලොස් ධාතු යන) සියලු ධර්මයෝ (තෘෂ්ණා දෘෂ්ටි දෙකින්) 'මමය මාගේය'යි අල්වා ගැනීමට සුදුසු නොවේ යයි අසන ලද්දේ වේද, දෙවෙන්ද්‍රය, මෙසේ සියලු ධර්මයෝ 'මමය මාගේය'යි ගැනීමට සුදුසු නොවේය, යි භික්ෂුව විසින් අසන ලද්දේ නම්, හෙතෙම සියලු ධර්මයන් ස්කන්ධ ධාතු ආදි වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් පිරිසිඳ දැන සැප වූ හෝ දුක් වූ හෝ දුක්ද, නොවූ සැපද නොවූ හෝ වෙදනාවක් විඳියිද, ඒ වෙදනා කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරයි. විරාගය අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි. දුරලීම අනුව බලමින් වාසය කරයි. හෙතෙම ඒ වෙදනාවන් කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නේ, විරාගය අනුව බලමින් වාසය කරන්නේ නිරොධය අනුව බලමින් වාසය කරන්නේ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නේ ලෝකයේ කිසියම් සංස්කාරයක් (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගනියි. (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගන්නේ තැති නොගනියි, තැති නොගන්නේ මේ ආත්මයේදීම ක්ලෙශ පරිනිර්වාණය කරයි. ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. කටයුත්තකරන ලදී. තවත් කළයුත්තක් මින්පසු නැත්තේයයි දනියි.

"දෙවෙන්ද්‍රය මෙපමණකින් මහණතෙම කොටින් නිවන් අරමුණු කොට කෙලෙසුන් කෙරෙන් මිදුණ, ඉපදීම් මැරීම් දෙක නිමකළ, කෙලෙස් බැම්වලින් මිදුණ ඒකාන්ත බ්‍රහ්ම චරියාව ඇති ඒකාන්ත කෙළවර ඇති දෙව් මිනිසුන්ට ශ්‍රෙෂ්ඨයෙක් වන්නේය'යි (වදාළේය.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නිදුක් මෞද්ගල්‍යායනයන් වහන්ස, මෙසේ වනාහි භාග්‍යවතුන් වහන්සේ සංක්ෂෙපයෙන් තෘෂ්ණා විමුක්තිය වදාළෝය."

5. එවිට මහමුගලන් ස්ථවිරයන් වහන්සේ ශක්‍රදෙවෙන්ද්‍රයාගේ වචනයට සතුටුව, අනුමෝදන්ව, යම්සේ ශක්තිමත් පුරුෂයෙක් නැමූ අතක් දිග හරින්නේද, දිග හැරිය අතක් නමන්නේද, එපරිද්දෙන්ම තව්තිසා දිව්‍ය ලොකයෙහි අතුරුදන්වූයේ පූර්වාරාම නම්වූ මිගාරමාතු ප්‍රාසාදයෙහි පහළවූහ. ඉක්බිති සක්දෙව්ඳුගේ පරිචාරිකා ස්ත්‍රීහු මහ මුගලන් තෙරුන් වහන්සේ බැහැර ගිය නොබෝ වේලාවකින් සක්දෙව්ඳුට මෙසේ කීවාහ. "නිදුකාණෙනි, ඔබගේ ශාස්තෘවූ ඒ භාග්‍යවතුන් වහන්සේ මුන්වහන්සේදැ"යි (කියාය.) "නිදුකාණෙනි, මෙතෙම මාගේ ශාස්තෘන් වහන්සේ නොවෙයි. මාගේ සබ්‍රම්සරුවූ (යහළුවූ) මහ මුගලන් තෙරණුවෝය"යි (සක්දෙව්රජ කීය) "නිදුකාණෙනි, යම්බඳු ඔබගේ සබ්‍රහ්ම චාරිතෙම මෙසේ මහත් ඍද්ධි ඇත්තේද, මහත් අනුභාව ඇත්තේද, ඒ ඔබට මහත් ලාභයකි. ඔබගේ ශාස්තෘවූ යම් ඒ භාග්‍යවත් කෙනෙක් වේද, උන්වහන්සේගේ ඍද්ධ්‍යනුභාවය එකාන්තයෙන් මහත් විය යුතුමය."

ඉන්පසු ආයුෂ්මත් මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක පැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලොකයෙහි ප්‍රසිද්ධ වූවන් අතුරෙන් කෙනෙක්වූ මහෙශාක්‍යවූ දෙවියෙකුට තෘෂ්ණා විමුක්තිය වදාළබව දැන වදාරන්නේද? "මෞද්ගල්‍යායනය, මම එය දෙශනා කළ බව දනිමි. සක්දෙව් රජතෙම, මම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ, මට හොඳින් වැඳ, එක පැත්තක උන්නේය. එකපැත්තක උන්නාවූ ශක්‍ර දෙවෙන්ද්‍ර තෙම මට මෙසේ කීවේය. ස්වාමීනි, කොපමණකින් මහණතෙම නිවන් අරමුණුකොට කෙලෙස් බැම්වලින් මිදුනු සිත් ඇත්තේ එකාන්ත

අවශානය ඇත්තේ, එකාන්තයෙන් කෙලෙස් බැම්වලින් මිදුනේ, එකාන්ත බ්‍රහ්මචරියා ඇත්තේ, එකාන්ත කෙළවර ඇත්තේ දෙවි මිනිසුන්ට ශ්‍රෙෂ්ඨ වේදැ'යි (කියායි.) මෞද්ගල්‍යායනය, මෙසේ ඇසූ කල්හි ශක්‍රදෙවෙන්ද්‍රයාට මම මෙසේ කීවෙමි.

**6.** "දෙවෙන්ද්‍රය, මේ ශාසනයෙහි මහණහු විසින් පංචස්කන්ධ, (දොළොස් ආයතන. අටලොස් ධාතු යන) සියලු ධර්මයෝ (තෘෂ්ණා දෘෂ්ටි දෙකින්) 'මමය මාගේය'යි අල්වා ගැනීමට සුදුසු නොවේ යයි අසන ලද්දේ වේද, දෙවෙන්ද්‍රය මෙසේ සියලු ධර්මයෝ 'මමය මාගේය'යි ගැනීමට සුදුසු නොවේයයි භික්ෂුව විසින් අසනලද්දේ නම්, හෙතෙම සියලු ධර්මයන් ස්කන්ධ ධාතු ආදි වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් පිරිසිඳ දනියි. සියලු ධර්මයන් පිරිසිඳ දැන සැප වූ හෝ, දුක් වූ හෝ, දුක්ද නොවූ සැපද නොවූ හෝ වෙදනාවක් විඳියිද, ඒ වෙදනාව අනුව බලමින් වාසය කරයි. නිරොධය අනුව බලමින් වාසය කරයි, දුරලීම අනුව බලමින් වාසය කරයි. හෙතෙම ඒ වෙදනාවන් කෙරෙහි අනිත්‍යය අනුව බලමින් වාසය කරන්නේ විරාගය අනුව බලමින් වාසය කරන්නේ, නිරොධය අනුව බලමින් වාසය කරන්නේ, නොඇලීම අනුව බලමින් වාසය කරන්නේ ලෝකයේ කිසියම් සංස්කාරයක් (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගනියි. (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොගන්නේ තැති නොගනියි, තැති නොගන්නේ මේ ආත්මයේදීම ක්ලෙශ පරිනිර්වාණය කරයි, ජාතිය ක්ෂය විය. බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. කටයුත්ත කරනලදී. තවත් කළයුත්තක් මින්පසු නැත්තේයයි දනියි.

"මෞද්ගල්‍යායනය, මෙසේ තෘෂ්ණා විමුක්තිය ශක්‍ර දෙවෙන්ද්‍රයාට කී බව දනිමි"

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**හත්වෙනිවූ චූල තණ්හාසංඛය සූත්‍රය නිමි. (4-7)**

## 38. මහා තණ්හා සංඛය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි වූ, අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි වනාහි කෙවට්ටපුත්‍ර වූ සාති නම් භික්ෂුවට මෙබඳු ලාමක වූ මිථ්‍යා දෘෂ්ටියක් උපන්නේ වෙයි. (එනම්) "මේ එකම විඥානය (භවයෙන් භවයට උත්පත්ති වසයෙන්) දුවයි, හැසිරෙයි අනිකක් නොවෙයි. භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමියි" (කියායි.)

කෙවට්ටපුත්‍ර වූ සාති නම් භික්ෂුවට මෙබඳු වූ ලාමක මිථ්‍යාදෘෂ්ටියක් පහළවී තිබෙනබව බොහෝ භික්ෂූන්වහන්සේලා ඇසූහ. (කෙබඳු දෘෂ්ටියක්ද යත්) 'මේ එකම විඤ්ඤාණය (භවයෙන් භවයට) දුවයි, හැසිරෙයි, අනිකක් නොවෙයි, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි" (කියායි.) ඉක්බිති ඒ භික්ෂූහු කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව යම් තැනෙක්හිද එතැනට ගියහ. ගොස්, කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුවට මෙසේ කීවාහුය. "ඇවැත්නි, තොපට මෙබඳු ලාමක වූ මිථ්‍යා දෘෂ්ටියක් උපන්නේය, යනු ඇත්තක්ද? 'මේ එකම විඤ්ඤාණය (භවයෙන් භවයට) දුවයි, හැසිරෙයි, අනිකක් නොවෙයි භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි' (කියායි.) "ඇවැත්නි, මේ එකම විඤ්ඤාණය භවයෙන් භවයට යයි හැසිරෙයි, අනිකක් නොවේයයි, භාග්‍යවතුන් වහන්සේ විසින් එපරිද්දෙන් දෙශනාකරනලද ධර්මය මම දනිමි'යි (සාති භික්ෂුව කීය.)

2. ඉක්බිති ඒ භික්ෂූහු, කෙවට්ටපුත්‍රවූ සාති නම් භික්ෂුව, ලාමකවූ මේ මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන් කරණු කැමැත්තාහු මතය විචාරමින් කරුණු කියති, මතයෙහි පිහිටුවමින් කරුණු කියති, ඊටහේතු අසමින් කරුණු කියති. 'ඇවැත්නි, සාතිය, මෙසේ නොකියව, භාග්‍යවතුන් වහන්සේට දොෂාරොපණය නොකරව භාග්‍යවතුන් වහන්සේට දොස් කීම හොඳ නැත. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නොවදාරන්නාහ. සාතිය, නොයෙක් ක්‍රමයෙන්

භාග්‍යවතුන් වහන්සේ විසින් 'විඥානය ප්‍රත්‍යයෙන් උපදින්නේයයිද, ප්‍රත්‍යයෙන් තොරව විඥානයාගේ පහළවීමක් නැතැ'යිද වදාරණ ලදී. (කියායි.)

මෙසේද ඒ භික්ෂූන් විසින් මතය විචාරමින් කරුණු කියනු ලැබූ, මතයෙහි පිහිටුවමින් කරුණු කියනු ලැබූ, ඊට හේතු අසමින් කරුණු කියනු ලැබූ සාති භික්ෂුව 'මේ එකම විඤ්ඤාණය (භවයෙන් භවයට) දුවයි, හැසිරෙයි, අනිකක් නොවෙයි, භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරන ලද බව මම දනිමි'යි ඒ ලාමක මිථ්‍යා දෘෂ්ටියම තරයේ අල්ලා ගෙන ව්‍යවහාර කරයි.

3. යම් විටෙක ඒ භික්ෂූහු කෙවට්ටපුත්‍රවූ සාති භික්ෂුව ඒ මේ ලාමක මිථ්‍යාදෘෂ්ටියෙන් වෙන්කරන්නට නොහැකි වූවාහුද, එවිට ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද, එතැනට ගියහ. ගොස්, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකපැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය.

"ස්වාමීනි, කෙවට්ටපුත්‍රවූ සාති නම් භික්ෂුවට, 'මේ එකම විඥානය (භවයෙන් භවයට) දුවයි, හැසිරෙයි, අනිකක් නොවේයයි එසේ භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය දෙශනා කරනලද බව මම දනිමි'යි, මෙබඳුවූ, ලාමකවූ මිථ්‍යාදෘෂ්ටියක් උපන්නේ වෙයි.

"ස්වාමීනි, කෙවට්ටපුත්‍රවූ සාති භික්ෂුවට 'මේ එකම විඤ්ඤාණය (භවයෙන් භවයට) දුවයි, හැසිරෙයි, අනිකක් නොවේයයි එසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය දෙශනා කරනලද බව දනිමියි' මෙබඳු ලාමක මිථ්‍යා දෘෂ්ටියක් උපන් බව අපි ඇසීමු.

"ස්වාමීනි, ඉන්පසු අපි කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව යම් තැනකද එහි ගියෙමු ගොස් කෙවට්ටපුත්‍රවූ සාති භික්ෂුව ගෙන් මෙසේ ඇසීමු. 'ඇවැත්නි, තොපට මෙබඳු වූ ලාමක දෘෂ්ටියක් උපන්නේය යනු ඇත්තක්ද? 'මේ එකම විඤ්ඤාණය (භවයෙන්

භවයට) දුවයි හැසිරෙයි, අනිකක් නොවේ යයි භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද ධර්මය මම දනිමි' (කියාය) මෙසේ ඇසූ කල්හි කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව අපට මෙසේ කීවේය. 'ඇවැත්නි මේ එකම විඤ්ඤාණය භවයෙන් භවයට යයි හැසිරෙයි භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි" (කියායි.)

"ස්වාමීනි, ඉන්පසු අපි කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව ලාමක වූ මේ මිථ්‍යාදෘෂ්ටියෙන් මුදනු කැමැත්තමෝ, මතය විචාරමින් කරුණු කීවෙමු. මතයෙහි පිහිටුවමින් කරුණු කීවෙමු. ඊට හේතු අසමින් කරුණු කීවෙමු. ඇවැත් සාතිය, මෙසේනොකියව, භාග්‍යවතුන් වහන්සේට දොස් නොකියව. භාග්‍යවතුන් වහන්සේට දොස් කීම නුසුදුසුය. සාතිය, භාග්‍යවතුන්වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් 'විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් උපදින්නේය, ප්‍රත්‍යයෙන් තොරව විඤ්ඤාණයාගේ ඇතිවීමක් නැතැ'යි දෙශනා කරන ලද්දේය. (යනුවෙනි)

"ස්වාමීනි, මෙසේද මතය විචාරමින් කරුණු කියනු ලැබූ මතයෙහි පිහිටුවමින් කරුණු කියනුලැබූ, ඊටහේතු විචාරමින් කරුණු කියනු ලැබූ කෙවට්ටපුත්‍ර සාති භික්ෂුව 'ඇවැත්නි මේ එකම විඤ්ඤාණය භවයෙන් භවයට යයි. හැසිරෙයි, අනිකක් නොවේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි'යි ලාමක වූ ඒ මිථ්‍යා දෘෂ්ටියම තදින් අල්වාගෙන ව්‍යවහාර කරයි.

"ස්වාමීනි, යම් විටෙක අපි කෙවට්ටපුත්‍රවූ සාති භික්ෂුව මේ ලාමක දෘෂ්ටියෙන් වෙන්කරන්ට නොහැකි වීමුද, එහෙයින් අපි භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කියමු."

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවූහ: (කැඳවා) "මහණ මෙහි එව මගේ වචනයෙන් 'ඇවැත්නි සාතිය, ශාස්තෘන් වහන්සේ කැඳවති'යි කෙවට්ට පුත්‍ර සාති භික්ෂුව කැඳවා එව'යි (කීහ.) 'එසේය, ස්වාමීනි' යි කියා ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට උත්තරදී කෙවට්ට පුත්‍රවූ සාති භික්ෂුව යම් තැනක්හිද එතැනට ගියේය. ගොස්, කෙවට්ටපුත්‍රවූ

සාති භික්ෂුවට මෙසේ කීවේය. ‘ඇවැත් සාතිය, ශාස්තෲන් වහන්සේ තොප කැඳවන්නාහ (කියායි.) ‘එසේය, ඇවැත්නි’යි කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව ඒ භික්ෂුවට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුවගෙන් භාග්‍යවතුන් වහන්සේ මෙසේ ඇසූහ. “සාතිය, තොපට මෙබඳු වූ ලාමක දෘෂ්ටියක් උපන්නේය යනු සැබෑද? ‘මේ එකම විඥ්ඥාණය (භවයෙන් භවයට) යයි, හැසිරෙයි, අනිකක් නොවේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි”යි (කියායි) “ස්වාමීනි එසේය, ‘මේ එකම විඥ්ඥාණය (භවයෙන් භවයට) යයි, හැසිරෙයි. අනිකක් නොවේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් එසේ ධර්මය දෙශනා කරනලද බව මම දනිමි”යි (කීය.)

“සාතිය, තොප කියන ඒ විඥානය කුමක්ද?”

“ස්වාමීනි, යමෙක්තෙම කථාකෙරේද? සැපදුක් විඳීද? ඒ ඒ භවයෙහි කුසලාකුසල වූ කර්මයන්ගේ විපාකය විඳීද (මාකියන විඥ්ඥාණය) ඒය.”

“හිස් පුරුෂය, කවරෙකුට නම් මා විසින් මෙසේ ධර්මය දෙශනා කරනලද බව තෝ දන්නෙහිද? හිස් පුරුෂය, මාවිසින් නොයෙක් ආකාරයෙන් විඥ්ඥාණය ප්‍රත්‍යයෙන් උපදින්නේයයි කියන ලද්දේ නොවේද? ප්‍රත්‍යයෙන් තොරව විඥ්ඥාණයාගේ හටගැන්මක් නැතැ’යි කියන ලද්දේ නොවේද? එසේ තිබියදීත් හිස් පුරුෂය, තෝ තමා වරදවා ගත් මතයෙන් අපටද දොස් නගන්නෙහිය, තමාද නැසෙන්නෙහිය, බොහෝ පව්ද රැස්කර ගන්නෙහිය. හිස් පුරුෂය, තොපට මෙය බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස පවතින්නේය.”

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අනෙක් භික්ෂූන්ගෙන් මෙසේ ඇසූහ. “මහණෙනි, කෙවට්ටපුත්‍රවූ මේ සාති භික්ෂුවට මේ ශාසනයෙන් ලබන ඥානය නමැති ගින්නෙහි උණුසුමවත් ඇත්තේද?”

"ස්වාමීනි, කෙසේ නම් වන්නේද, ස්වාමීනි, එසේ නොවන්නේමය."

**5** මෙසේ කී කල්හි කෙවට්ටපුත්‍රවූ සාති මහණතෙම නිශ්ශබ්ද වූයේ, හැකුළුනු මුහුණ ඇත්තේ, කඳ නමාගත්තේ, මුහුණ පහතට හරවා ගත්තේ, කල්පනා කරන්නේ, කිසිවක් සිතාගත නොහැකිව උන්නේය. එවිට භාග්‍යවතුන් වහන්සේ කේවට්ටපුත්‍ර සාති භික්ෂුව නිශ්ශබ්දව, හැකුළුනු මුහුණ ඇතිව කඳ නමාගෙන, මුහුණ පහතට හරවාගෙන, කල්පනා කරමින්, කිසිවක් නොවැටහී සිටිනු දැක, කෙවට්ටපුත්‍රවූ සාති භික්ෂුවට මෙසේ වදාළහ.

"හිස් පුරුෂය, තෝ මේ තොපගේ ලාමක වැරදි මතයෙන් ප්‍රකට වන්නෙහිය. මම භික්ෂූන් විචාරන්නෙමි"යි කියා භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ගෙන් මෙසේ විචාළහ.

"මහණෙනි, කෙවට්ටපුත්‍ර වූ සාති භික්ෂුව යම්සේ තමා වරදවා ගත් මතයෙන් අපටත් දොස් නගයිද, තමන් වැනසෙයිද, බොහෝ අකුසලුත් රැස්කර ගනියිද, එබඳුවූ ධර්මයක් මා දෙශනා කළ බව තොපි දන්නහුද;"

"නැත ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අපට නොයෙක් ක්‍රමයෙන් 'විඥානය ප්‍රත්‍යයෙන් උපදින්නේය'යි වදාරණලදී. 'ප්‍රත්‍යයෙන් තොරව විඥානයාගේ හටගැන්මක් නැතැ'යි වදාරණලදී."

"මහණෙනි, යහපත, මාදෙසූ ධර්මය තොප දන්නා සැටි යහපත්ය, මහණෙනි, තොපට මා විසින් නොයෙක් ක්‍රමයෙන් විඤ්ඤාණය ප්‍රත්‍යයෙන් උපන්නේයයිද, ප්‍රත්‍යයෙන් තොරව විඤ්ඤාණයාගේ හටගැන්මක් නැතැයිද කියන ලදී. මේ කෙවට්ට පුත්‍රවූ සාති මහණ තමා විසින් වරදවා ගන්නා ලද්ද නිසා අපටද දොෂාරොපනය කරයි. තමාද වැනසෙයි. බොහෝ අකුසල්ද රැස් කරයි. ඒ වනාහි ඒ හිස් පුරුෂයාහටද බොහෝ කලක් මුළුල්ලෙහි අහිත පිණිස, දුක් පිණිස පවත්නේය.

**6.** "මහණෙනි, යම් යම් ප්‍රත්‍යයක් නිසා විඥානය උපදීද, ඒ ඒ ප්‍රත්‍යයාගේ නාමයෙන්ම ඒ විඤ්ඤාණය ව්‍යවහාරයට

යයි. ඇස නිසාද, රූප නිසාද, විඤ්ඤාණයක් උපදී. එය ‘චක්ඛු විඤ්ඤාණය’යි ව්‍යවහාරයට යයි. ශ්‍රොතය (කණ) නිසාද, ශබ්ද නිසාද විඤ්ඤාණයක් උපදී. එය ශ්‍රොත විඤ්ඤාණයයි ව්‍යවහාරයට යයි. ඝ්‍රාණය (නැහැය) නිසාද, ගඳ නිසාද, විඤ්ඤාණයක් උපදී. එය ඝාණවිඤ්ඤාණයයි ව්‍යවහාරයට යයි. දිව නිසාද, රස නිසාද, විඤ්ඤාණයක් උපදී. එය ජිව්හා විඤ්ඤාණයයි ව්‍යවහාරයටයයි. කය නිසාද ස්පර්ශ නිසාද විඤ්ඤාණයක් උපදී. එය කායවිඤ්ඤාණයයි ව්‍යවහාරයට යයි. මනස (හිත) නිසාද ධර්මනිසාද විඤ්ඤාණයක් උපදී. එය මනොවිඤ්ඤාණයයි ව්‍යවහාරයට යයි.

“මහණෙනි, යම් යම් ප්‍රත්‍යයක් නිසා යම්සේ ගින්න ඇවිලේද, ඒ ඒ දෙයෙහි නමින්ම ඒ ගින්න ව්‍යවහාරයට යයි. කාෂ්ටය (දර) නිසා ගින්න ඇවිලේද, එය කාෂ්ට ගින්නයයි ව්‍යවහාරයට යයි. සකලික (ගස් පතුරු) නිසා ගින්න ඇවිලේද, එය සකලික ගින්නයයි ව්‍යවහාරයට යයි. තෘණ (වියලි තණ කොල) නිසා ගින්න ඇවිලේද, එය තෘණ ගින්නයයි ව්‍යවහාරයට යයි. ගොමවැරටි නිසා ගින්න ඇවිලේද, එය ගොම වැරටි ගින්නයයි ව්‍යවහාරයට යයි ථුස (දහයියා) නිසා ගින්න ඇවිලේද, එය ථුස ගින්නයයි ව්‍යවහාරයට යයි. සංකාර (කුණු රොඩු) නිසා ගින්න ඇවිලේද, එය සංකාර ගින්නයයි ව්‍යවහාරයට යයි.

මහණෙනි, එපරිද්දෙන්ම යම් යම් ප්‍රත්‍යයක් නිසා විඤ්ඤාණය උපදීද, ඒ ඒ ප්‍රත්‍යයයන්ගේ නාමයෙන්ම ඒ ඒ විඤ්ඤාණය ව්‍යවහාරයට යයි. ඇස නිසාද, රූපයන් නිසාද, විඤ්ඤාණයක් උපදී. එය චක්ඛුවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි. කණ නිසාද, ශබ්දයන් නිසාද, විඤ්ඤාණයක් උපදී. එය සොතවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි. නාසය නිසාද, ගන්ධයන් නිසාද, විඤ්ඤාණයක් උපදී. එය ඝාණවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි. දිව නිසාද, රසයන් නිසාද විඤ්ඤාණයක් උපදී. එය ජිව්හාවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි. කය නිසාද, ස්පර්ශයන් නිසාද විඤ්ඤාණයක් උපදී. එය කායවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි. සිත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නිසාද, ධර්මයන් නිසාද විඤ්ඤාණය උපදී. එය මනොවිඤ්ඤාණයයි කියාම ව්‍යවහාරයට යයි.

"මහණෙනි, මෙය (මේ පංචස්කන්ධය) ප්‍රත්‍යයෙන් හට ගත් එකකැයි දක්නහුද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, එය ආහාරයෙන් (හෙතුවෙන්) හටගත් එකකැයි දක්නහුද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, ආහාරය (හෙතුවෙන්) නැතිවීමෙන්, ආහාරය නිසා හටගත් එය නැති වන ස්වභාව ඇත්තේ යැයි දක්නහුද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, මෙය (පංචස්කන්ධය) ප්‍රත්‍යයෙන් හටගත්තේද, නැද්දැයි යන සැකයෙන් විචිකිච්ඡාව පහළ වේද?"

"එසේය, ස්වාමීනි."

"එය ආහාරයෙන් (හෙතුවෙන්) හටගත්තේද, නැද්ද යන සැකයෙන් විචිකිච්ඡාව පහළ වේද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, ආහාරය (හෙතුව) නැතිවීමෙන් ආහාරය නිසා හටගත් එය නැතිවන්නේද? නැද්ද? යන සැකයෙන් විචිකිච්ඡාව පහළ වේද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, මෙය ප්‍රත්‍යයයෙන් හටගත්තේයයි තතුසේ යහපත් නුවණින් දක්නහුට යම් විචිකිච්ඡාවක් වීනම් එය නැති වේද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, එය ආහාරයෙන් (හෙතුවෙන්) හටගත්තේ යයි තතුසේ යහපත් නුවණින් දක්නහුට යම් විචිකිච්ඡාවක් වී නම් එය නැති වේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, ඒ ආහාරය (හෙතුව) නැතිවීමෙන් ආහාරය නිසා හටගත් එය නැතිවන ස්වභාව ඇත්තේයයි තතුසේ යහපත් නුවණින් දක්නහුට යම් විචිකිච්ඡාවක් වී නම් එය නැතිවේද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, මේ පංචස්කන්ධය ප්‍රත්‍යයෙන් හටගත්තේය යන කාරණය සම්බන්ධයෙන් තොපට සැක නැද්ද?"

"එසේය, නැත ස්වාමීනි."

"මහණෙනි, එය ආහාරයෙන් (ප්‍රත්‍යයෙන්) හටගත්තේය යන කාරණය සම්බන්ධයෙන් සැක නැත්ද?"

"එසේය, නැත ස්වාමීනි."

"මහණෙනි, ප්‍රත්‍යය නැතිවීමෙන් එයින් හටගත් යමක් ඇත්තේද, එය නැතිවන ස්වභාව ඇත්තේය යන කාරණය සම්බන්ධයෙන් සැක නැත්ද?"

"එසේය, නැත ස්වාමීනි."

"මහණෙනි, මෙය ප්‍රත්‍යයෙන් හටගත්තේයයි, තතුසේ යහපත් නුවණින් දක්නා ලදද?"

"එසේය, ස්වාමීනි."

"මහණෙනි, එය ආහාර ප්‍රත්‍යයෙන් හටගත්තේය යන කාරණය සම්බන්ධයෙන් සැක නැත්ද?"

"එසේය, නැත ස්වාමීනි."

"මහණෙනි, ප්‍රත්‍යය නැතිවීමෙන් එයින් හටගත් යමක් ඇත්තේද එය නැති වන ස්වභාව ඇත්තේය යන කාරණය සම්බන්ධයෙන් සැක නැත්ද?"

"එසේය, නැත ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ පිරිසිදුවූ, මෙසේ පැහැදිලිවූ මේ දැකීම (තෘෂ්ණා දෘෂ්ටි දෙකින්) අල්වාගනිව් නම්, (තෘෂ්ණා දෘෂ්ටි

දෙකින්) ක්‍රීඩා කරව් නම්, (ධනයකට මෙන්) ඊට කැමතිවව් නම් එකෙනෙහි මමත්වයක් ඇතිකර ගනිව් නම්, තෙපි මා විසින් සසර එතෙර කිරීම පිණිස මිස; අල්වා නොගැනීම පිණිස පහුරකට උපමා කොට දෙශනා කරනලද ධර්මය දන්නෝ වන්නහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ පිරිසිදුවූ, මෙසේ පැහැදිලිවූ මේ දැකීම (තෘෂ්ණා දෘෂ්ටි දෙකින්) අල්වා නොගනිව් නම්, (තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ක්‍රීඩා නොකරව් නම්, (ධනයකට මෙන්) ඊට කැමති නොවව් නම්, මමත්වයක් ඇතිකර නොගනිව් නම් තොපි මා විසින් සසර එතෙරකිරීම පිණිස මිස අල්වා නොගැනීම පිණිස පහුරකට උපමාකොට දෙශනා කරනලද ධර්මය දන්නෝ වන්නහුද?"

"එසේය, ස්වාමීනි."

8. "මහණෙනි, උපන් සත්වයන්ගේ පැවැත්ම පිණිසද, සම්භවය (උත්පත්තිය) සොයන සත්වයන්හට අනුග්‍රහ පිණිසද පවතින මේ ආහාර සතරක් වෙත්. කවර සතරක්ද යත්:- දැඩිවූ හෝ සියුම් හෝ පිඩු කොට ගතයුතු ද්‍රව්‍යයෙන්යුත් කබලිංකාර ආහාරය, දෙවැනිවූ ස්පර්ශ ආහාරය, තුන්වැනිවූ මනොසඤ්චෙතනා ආහාරය, සතර වැනිවූ විඤ්ඤාණ ආහාරය යන සතරයි.

"මහණෙනි, මේ ආහාර සතර කුමක් නිදාන (මූල කාරණ) කොට ඇත්තාහුද? කුමක් උත්පත්තිකොට ඇත්තාහුද? කුමක් ජාතිකොට ඇත්තාහුද? කුමක් ප්‍රභවකොට ඇත්තාහුද? මේ සතර ආහාරයෝ තෘෂ්ණාව නිදානකොට ඇත්තාහ. තෘෂ්ණාව උත්පත්තිකොට ඇත්තාහ. තෘෂ්ණාව ජාතිකොට ඇත්තාහ. තෘෂ්ණාව ප්‍රභවකොට ඇත්තාහ.

"මහණෙනි, මේ තෘෂ්ණාවද, කුමක් නිදානකොට ඇත්තීද? කුමක් සමුදය (පහළවීමට හේතුව) කොට ඇත්තීද? කුමක් ජාතිකොට ඇත්තීද? කුමක් ප්‍රභවකොට ඇත්තීද?" තෘෂ්ණාව,

වේදනාව නිදානකොට ඇත්තීය. වේදනාව සමුදය කොට ඇත්තීය. වේදනාව ජාතිකොට ඇත්තීය, වේදනාව ප්‍රභවකොට ඇත්තීය.

“මහණෙනි, මේ වේදනාවද කුමක් නිදානකොට ඇත්තීද? කුමක් සමුදයකොට ඇත්තීද? කුමක් ජාතිකොට ඇත්තීද? කුමක් ප්‍රභවකොට ඇත්තීද? වේදනාව ස්පර්ශය නිදානකොට ඇත්තීය. ස්පර්ශය සමුදයකොට ඇත්තීය. ස්පර්ශය ජාති කොට ඇත්තීය. ස්පර්ශය ප්‍රභවකොට ඇත්තීය.

“මහණෙනි, මේ ස්පර්ශයද කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? ස්පර්ශය තෙම ෂඩායතන (ඉන්ද්‍රිය සය) නිදානකොට ඇත්තේය. ෂඩායතන සමුදය කොට ඇත්තේය, ෂඩායතන ජාතිකොට ඇත්තේය, ෂඩායතන ප්‍රභවකොට ඇත්තේය.

“මහණෙනි, මේ ෂඩායතනයෝ කුමක් නිදානකොට ඇත්තාහුද? කුමක් සමුදයකොට ඇත්තාහුද? කුමක් ජාතිකොට ඇත්තාහුද? කුමක් ප්‍රභවකොට ඇත්තාහුද? ෂඩායතනයෝ නාමරූපයන් නිදානකොට ඇත්තාහ. නාමරූපයන් සමුදයකොට ඇත්තාහ. නාමරූපයන් ජාති කොට ඇත්තාහ. නාමරූපයන් ප්‍රභවකොට ඇත්තාහ.

“මහණෙනි, මේ නාම රූපයෝද කුමක් නිදානකොට ඇත්තාහුද? කුමක් සමුදයකොට ඇත්තාහුද? කුමක් ජාතිකොට ඇත්තාහුද? කුමක් ප්‍රභවකොට ඇත්තාහුද? නාමරූපයෝ විඤ්ඤාණය නිදානකොට ඇත්තාහ, විඤ්ඤාණය සමුදයකොට ඇත්තාහ, විඤ්ඤාණය ප්‍රභවකොට ඇත්තාහ.

“මහණෙනි, මේ විඤ්ඤාණය කුමක් නිදානකොට ඇත්තේද? කුමක් සමුදයකොට ඇත්තේද? කුමක් ජාතිකොට ඇත්තේද? කුමක් ප්‍රභවකොට ඇත්තේද? විඤ්ඤාණය සංස්කාර නිදානකොට ඇත්තේය, සංස්කාර සමුදයකොට ඇත්තේය සංස්කාර ජාතිකොට ඇත්තේය, සංස්කාර ප්‍රභවකොට ඇත්තේය.

"මහණෙනි, මේ සංස්කාරයෝ කුමක් නිදානකොට ඇත්තාහුද, කුමක් සමුදයකොට ඇත්තාහුද, කුමක් ජාති කොට ඇත්තාහුද, කුමක් ප්‍රභවකොට ඇත්තාහුද, සංස්කාරයෝ අවිද්‍යාව නිදානකොට ඇත්තාහ, අවිද්‍යාව සමුදය කොට ඇත්තාහ, අවිද්‍යාව ජාතිකොට ඇත්තාහ, අවිද්‍යාව ප්‍රභවකොට ඇත්තාහ.

**9.** "මහණෙනි, මෙසේ වනාහි අවිද්‍යා ප්‍රත්‍යයෙන් (අවිද්‍යාව නිසා) සංස්කාරයෝ වෙති. සංස්කාරයන් නිසා විඤ්ඤාණය වෙයි. විඤ්ඤාණය නිසා නාමරූපයෝ වෙති. නාමරූපයන් නිසා ෂඩායතනයෝ වෙති. ෂඩායතනයන් නිසා ස්පර්ශය වෙයි. ස්පර්ශය නිසා වේදනාව වන්නීය. වේදනාව නිසා තෘෂ්ණාව වන්නීය, තෘෂ්ණාව නිසා උපදානය වෙයි. උපදානය නිසා භවය වෙයි භවය නිසා ජාතිය වන්නීය. ජාතිය නිසා ජරාවද, මරණයද, සොකය, වැලපීමය, කායික දුකය, චෛතසික දුකය (දොම්නසය), දැඩි වෙහෙසය, යන මොහු වෙත්. මෙසේ මේ සියලු දුක් රාශියගේ හටගැන්ම වෙයි. 'ජාති ප්‍රත්‍යයෙන් (ජාතිය නිසා) ජරා මරණ දෙක ඇති වේයයි" මෙසේ මෙය කියනලදී. මහණෙනි, ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වේද? නොවේද? තොපට මෙහිලා කෙසේ අදහස් වේද?" ස්වාමීනි, ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණ වෙති. ජාති ප්‍රත්‍යයෙන් ජරාමරණ වන්නාහයි මෙසේ අපට මෙහි අදහස් වෙයි.

"භවප්‍රත්‍යයෙන් ජාතිය වේයයි" මෙසේ මෙය කියන ලදී. "මහණෙනි භවප්‍රත්‍යයෙන් ජාතිය වේද? නොවේද? තොපට මෙහි කෙසේ අදහස් වේද?" "ස්වාමීනි, භවප්‍රත්‍යයෙන් ජාතිය වෙයි. භවප්‍රත්‍යයෙන් ජාතියවේයයි, අපට මෙහි අදහස් වෙයි.

"උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේය"යි මෙසේ මෙය කියන ලදි. "මහණෙනි, උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේද? නොවේද? තොපට මෙහි කෙසේ අදහස් වේද?" "ස්වාමීනි, උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. උපාදාන ප්‍රත්‍යයෙන් භවය වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.

"තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය වේය"යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය වේද?

නොවේද? තොපට මෙහි කෙසේ අදහස් වේද?” ස්වාමීනි, තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය වෙයි තණ්හා ප්‍රත්‍යයෙන් උපාදානය වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.

වෙදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වන්නීය”යි මෙසේ මෙය කියනලදී. “මහණෙනි, වෙදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වන්නීද? නොවන්නීද? තොපට මෙහි කෙසේ අදහස් වේද?” ස්වාමීනි, වෙදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වෙයි. වෙදනා ප්‍රත්‍යයෙන් තණ්හාව වේයයි” මෙසේ අපට මෙහි අදහස් වේ.

“ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වේයයි’ මෙසේ මෙය කියනලදී. “මහණෙනි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වන්නීද? නොවන්නීද? තොපට මෙහි කෙසේ අදහස් වේද?” “ස්වාමීනි, ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාව වන්නීය. ස්පර්ශ ප්‍රත්‍යයෙන් වෙදනාව වන්නීයයි” මෙසේ අපට මෙහි අදහස් වේ.

“ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේය’යි මෙසේ මෙය කියන ලදී. මහණෙනි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේද? නොවේද? තොපට මෙහි කෙසේ අදහස් වේද?” “ස්වාමීනි, ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශ වෙයි. ෂඩායතන ප්‍රත්‍යයෙන් ස්පර්ශය වේයයි” මෙසේ අපට මෙහි අදහස් වේ.

“නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙත්ය’යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙත්ද? නොවෙත්ද? තොපට මෙහි කෙසේ අදහස් වේද? “ස්වාමීනි, නාමරූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙත්. නාම රූප ප්‍රත්‍යයෙන් ෂඩායතන වෙත්යයී මෙසේ අපට මෙහි අදහස් වේ.

“විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වෙත්ය’යි මෙසේ මෙය කියනලදී “මහණෙනි, විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වෙත්ද? නොවෙත්ද? තොපට මෙහි කෙසේ අදහස් වේද? “ස්වාමීනි විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වෙත්. විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාමරූප වෙත්යයි මෙසේ අපට මෙහි අදහස් වේ.

“සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේය’යි මෙසේ මෙය කියනලදී මහණෙනි, සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේද?

නොවේද? තොපට මෙහි කෙසේ අදහස් වේද?" "ස්වාමීනි, සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වෙයි. සංස්කාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණය වේයයි, මෙසේ අපට මෙහි අදහස් වේ.

"අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්ය'යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්ද? නොවෙත්ද? තොපට මෙහි කෙසේ අදහස් වේද?" "ස්වාමීනි, අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙත්යයි මෙසේ අපට මෙහි අදහස් වේ.

10. 'මහණෙනි මැනවි. මහණෙනි, මෙය වනාහි තොපිද මෙසේ කියව්, මමද එසේ කියමි. මෙසේ මේ හෙතුව ඇති කල්හි මේ ඵලය වෙයි. මොහුගේ උත්පත්තියෙන් මේ ඵලය උපදියි. එනම්-අවිද්‍යාව ප්‍රත්‍යය කොට සංස්කාරයෝ වෙත්. සංස්කාර ප්‍රත්‍යය කොට විඤ්ඤාණය වෙයි. විඤ්ඤාණය ප්‍රත්‍යය කොට නාමරූපය වෙයි. නාම රූප ප්‍රත්‍යය කොට ෂඩායතනය වෙයි. ෂඩායතනය ප්‍රත්‍යයකොට ස්පර්ශය වෙයි. ස්පර්ශය ප්‍රත්‍යයකොට වෙදනාව වෙයි. වෙදනාව ප්‍රත්‍යය කොට තණ්හාව වෙයි. තණ්හාව ප්‍රත්‍යයකොට භවය වෙයි. භවය ප්‍රත්‍යයකොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යය කොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කායික දුකය, මානසික දුකය, දැඩි වෙහෙසය යන මොහු හටගනිත්." මෙසේ මේ සියලු දුක් රාශියගේ හටගැන්ම වෙයි.

11. "අවිද්‍යාවගේම ඉතිරි නොකර නැතිකිරීමෙන් සංස්කාරයෝ නිරුද්ධ (නැතිකිරීම) වෙත්. සංස්කාර නිරොධයෙන් විඤ්ඤාණ නිරොධය වෙයි. විඤ්ඤාණ නිරොධයෙන් නාම රූප නිරුද්ධ වෙයි. නාමරූපය නිරුද්ධවීමෙන් ෂඩායතනය නිරුද්ධ වෙයි. ෂඩායතනය නිරුද්ධ වීමෙන් ස්පර්ශය නිරුද්ධ වෙයි. ස්පර්ශය නිරුද්ධ වීමෙන් වෙදනාව නිරුද්ධ වෙයි. වෙදනාව නිරුද්ධ වීමෙන් තණ්හාව නිරුද්ධ වෙයි. තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදානය නිරුද්ධ වෙයි. උපාදානය නිරුද්ධවීමෙන් භවය නිරුද්ධ වෙයි භවය නිරුද්ධවීමෙන් ජාතිය නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධවීමෙන් ජරා, මරණ, ශොක,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වැළපීම, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ වෙත්. මෙසේ සියලු දුක් රාසියගේ නිරොධය වෙයි.

"ජාති නිරොධයෙන් ජරා, මරණ, නිරොධය වේය' යි මෙසේ මෙය කියන ලදී. මහණෙනි, ජාති නිරොධයෙන් ජරා මරණ නිරොධය වේද? නොවේද? මෙහි තොපට කෙසේ හෝ අදහස් වේද?

"ස්වාමීනි, ජාති නිරොධයෙන් ජරා මරණ නිරොධය වෙයි. ජාති නිරොධයෙන් ජරා මරණ නිරොධය වේයයි මෙසේ අපට මෙහි අදහස් වෙයි." "භවය නිරුද්ධවීමෙන් ජාතිය නිරුද්ධ වේයයි' මෙසේ මෙය කියනලදී. මහණෙනි, භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධ වේද? නොවේද? මෙහි තොපට කෙසේ හෝ අදහස් වේද? "ස්වාමීනි, භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධවේ. භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධ වේයයි මෙසේ අපට මෙහි අදහස්වේ."

"උපාදානය නිරුද්ධවීමෙන් භවය නිරුද්ධ වේය'යි මෙසේ මෙය කියනලදී. "මහණෙනි, උපාදානය නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වේද? නොවේද? තොපට කෙසේ හෝ අදහස් වේද? "ස්වාමීනි, උපාදානය නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. උපාදානය නිරුද්ධවීමෙන් භවය නිරුද්ධ වේයයි, මෙසේ අපට මෙහි අදහස් වේ.

"තණ්හාව නිරුද්ධවීමෙන් උපාදානය නිරුද්ධවේය'යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදානය නිරුද්ධ වේද? නොවේද? මෙහි තොපට කෙසේ හෝ අදහස් වේද?" "ස්වාමීනි, තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදානය නිරුද්ධ වෙයි. තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදානය නිරුද්ධවේයයි මෙසේ අපට මෙහි අදහස් වෙයි."

"වෙදනාව නිරුද්ධවීමෙන් තණ්හාව නිරුද්ධ වේය'යි මෙසේ මෙය කියන ලදී. මහණෙනි, වෙදනාව නිරුද්ධවීමෙන් තණ්හාව නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?" "ස්වාමීනි, වෙදනාව නිරුද්ධවීමෙන් තණ්හාව

නිරුද්ධවේ. වෙදනාව නිරුද්ධ වීමෙන් තණ්හාව නිරුද්ධ වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.”

“ස්පර්ශය නිරුද්ධවීමෙන් වෙදනාව නිරුද්ධවේය’යි මෙසේ මෙය කියන ලදී. මහණෙනි, ස්පර්ශය නිරුද්ධවීමෙන් වෙදනාව නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?” “ස්වාමීනි, ස්පර්ශය නිරුද්ධවීමෙන් වේදනාව නිරුද්ධ වේ. ස්පර්ශය නිරුද්ධ වීමෙන් වෙදනාව නිරුද්ධ වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.”

“ෂඩායතන නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධවේය’යි මෙසේ මෙය කියනලදී. “මහණෙනි, ෂඩායතන නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද? “ස්වාමීනි, ෂඩායතන නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධවෙයි. ෂඩායතන නිරුද්ධවීමෙන් ස්පර්ශය නිරුද්ධ වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.”

“නාමරූප නිරුද්ධවීමෙන් ෂඩායතනය නිරුද්ධ වේය’යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, නාමරූප නිරුද්ධවීමෙන් ෂඩායතනය නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?” “ස්වාමීනි, නාම රූප නිරුද්ධවීමෙන් ෂඩායතන නිරුද්ධ වෙයි. නාම රූප නිරුද්ධවීමෙන් ෂඩායතනය නිරුද්ධ වේය’යි මෙසේ අපට මෙහි අදහස් වේ”

“විඤ්ඤාණය නිරුද්ධවීමෙන් නාම රූපය නිරුද්ධ වේය’යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, විඤ්ඤාණය නිරුද්ධ වීමෙන් නාම රූපය නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?” “ස්වාමීනි, විඤ්ඤාණය නිරුද්ධවීමෙන් නාම රූපය නිරුද්ධ වේ. විඤ්ඤාණය නිරුද්ධවීමෙන් නාම රූපය නිරුද්ධවේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.”

“සංස්කාරයන්ගේ නිරුද්ධවීමෙන් විඤ්ඤාණය නිරුද්ධවේය’යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, සංස්කාරයන්ගේ නිරුද්ධවීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වේද? නොවේද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?” “ස්වාමීනි, සංස්කාරයන්ගේ නිරුද්ධවීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සංස්කාරයන්ගේ නිරුද්ධවීමෙන් විඤ්ඤාණය නිරුද්ධ වේයයි මෙසේ අපට මෙහි අදහස් වේ.”

“අවිද්‍යාව නිරුද්ධවීමෙන් සංස්කාරයෝ නිරුද්ධ වෙත්ය’යි මෙසේ මෙය කියනලදී. මහණෙනි, අවිද්‍යාව නිරුද්ධවීමෙන් සංස්කාරයෝ නිරුද්ධ වෙත්ද? නොවෙත්ද? තොපට මෙහි කෙසේ හෝ අදහස් වේද?” “ස්වාමීනි, අවිද්‍යාව නිරුද්ධවීමෙන් සංස්කාරයෝ නිරුද්ධ වෙත්. අවිද්‍යාව නිරුද්ධවීමෙන් සංස්කාරයෝ නිරුද්ධ වෙත්ය’යි මෙසේ අපට මෙහි අදහස් වේ.”

12. “මහණෙනි, මැනවි. මහණෙනි, මෙය වනාහි තොපද මෙසේ කියන්නාහුය. මමද එසේ කියන්නෙමි. මේ හේතුව නැතිකල්හි මේ ඵලය නොවෙයි. මේ හේතුහුගේ නිරොධයෙන් මේ ඵලය නිරුද්ධ වෙයි. එනම් අවිද්‍යාව නිරුද්ධවීමෙන් සංස්කාර නිරුද්ධවෙයි. සංස්කාර නිරුද්ධවීමෙන් නාමරූප නිරුද්ධ වෙයි. නාම රූප නිරුද්ධ වීමෙන් ෂඩායතනය නිරුද්ධ වෙයි. ෂඩායතනය නිරුද්ධ වීමෙන් ස්පර්ශය නිරුද්ධ වෙයි. ස්පර්ශය නිරුද්ධවීමෙන් වෙදනාව නිරුද්ධ වෙයි. වෙදනාව නිරුද්ධවීමෙන් තණ්හාව නිරුද්ධ වෙයි. තණ්හාව නිරුද්ධ වීමෙන් උපාදාන නිරුද්ධ වෙයි. උපාදානය නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාතිය නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධවීමෙන් ජරා, මරණ, ශොක, වැලපීම, දුක්, දොම්නස්, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක් රාශියගේ නිරොධය වෙයි. මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු, ‘අපි අතීතකාලයෙහි වූයෙමුද? නොවූයෙමුද? අතීත කාලයෙහි කවුරුන් වූයෙමුද? අතීත කාලයෙහි කෙසේ හෝ වූයෙමුද? අතීත කාලයෙහි කවුරුන් වී කවුරුන් වීමුදැ’යි (තෘෂ්ණා දෘෂ්ටි වසයෙන්) අතීතයට දුවන්නාහුද?”

“නැත, ස්වාමීනි.”

“මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු, අපි අනාගත කාලයෙහි වන්නෙමුද? අනාගත කාලයෙහි නොවන්නෙමුද? අනාගත කාලයෙහි කවරෙක් වන්නෙමුද?

අනාගත කාලයෙහි කෙසේ හෝ වන්නෙමුද? අනාගත කාලයෙහි කවුරුන්වී කවුරුන් වන්නෙමුද? කියා අනාගත කෙළවරට (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) දුවන්නහුද?

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු මම වෙම්ද? මම නොවෙම්ද? කුමක් වෙම්ද? කෙසේ වෙම්ද? මේ සත්වතෙම කොයින් ආයේද? හෙතෙම කොහි යන්නෙක් වන්නේදැයි දැන් පවත්නා කාලය සම්බන්ධයෙන් තමා ගැන කෙසේ කෙසේදැයි පැවැති සැක ඇත්තාහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු, අපගේ ශාස්තෘන් වහන්සේ ගරු කටයුත්තෙක, අපි ශාස්තෘන් වහන්සේ කෙරෙහි, ගෞරවයෙන් මෙසේ කියමු'යි කියන්නහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු, 'ශ්‍රමණ තෙම අපට මෙසේ කීයේය. ශ්‍රමණයන්ගේ වචනයෙන් අපි මෙසේ කියමු"යි කියන්නාහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු, අන්‍ය ශාස්තෘවරයෙකු අදහන්නාහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි මෙසේ දන්නාහු, මෙසේ දක්නාහු නොයෙක් තීර්ථකයන්ගේ හා බමුණන්ගේ වත් පිළිවෙත් හා ඇදහීම් සාර වසයෙන් පිළිගන්නාහුද?"

"නැත, ස්වාමීනි."

"මහණෙනි, තෙපි, තමන් විසින් යමක් දැන ගන්නා ලද නම්, තමන් විසින් යමක් දක්නාලද නම් තමන් විසින් යමක් අවබොධ කරගන්නාලද නම් තොප කියන්නේ එයම නොවේද?"

"එසේය, ස්වාමීනි."

13. "මහණෙනි, යහපත මහණෙනි, මා විසින් මේ මෙ ලොවදීම විපාක දෙන්නාවූ, කල් නොයවා විපාක දෙන්නාවූ, එව, බලව, යන විධියට සුදුසුවූ, තම තමන්ගේ සිතට පැමිණවිය යුතුවූ. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුතුවූ ධර්මයෙන් තෙපි (නිර්වාණයට) පමුණුවන ලද්දාහ. මහණෙනි, මේ ධර්මය මොලොව දීම විපාක දෙන සුළුය, කල් නොයවා විපාක දෙන සුළුය, එව, බලව යන විධියට සුදුසුය. තම තමන්ගේ සිතට එලවිය යුතු ගුණයෙන් යුක්තය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහිලා දතයුතුයැ'යි මෙසේ යමක් කියන ලදද? එය මේ සඳහා කියනලදී.

"මහණෙනි, කරුණු තුනකගේ එක්වීමෙන් ගර්භයාගේ හටගැනීම වෙයි. මේ ලොකයෙහි මව්පිය දෙදෙනා එක්වූවාහු නමුත් මවුතොමෝත් ඔසප් නොවූවාද, ගන්ධර්වයා (ගර්භයෙහි ඉපදිය යුතු තැනැත්තා) එළඹ නොසිටියේවේද ඒතාක් ගර්භය හටගැනීමක් නොවේ. මෙහි, මවුපිය දෙදෙනා එක්වූවාහු වෙත්ද, මවුතොමෝත් ඔසප්වූවා වේද, ඉපදිය යුතු පුද්ගලයා එළඹ නොසිටියේ නම් ඒතාක් ගර්භය හටගැණීම නොසිදු වෙයි.

14. 'මහණෙනි, යම් හෙයකින් මව්පිය දෙදෙන එක්වූවාහුද මව් තොමෝද ඔසප්වූවා වේද, ඉපදිය යුතු පුද්ගලයාත් එළඹ සිටියේ වේද, මේ කරුණු තුන එක්වීමෙන් ගර්භයාගේ හටගැනීම වෙයි, මහණෙනි, මව්තොම නවමසක් හෝ දසමසක් හෝ මහත්වූ ජීවිත සැකයෙන් යුක්තවූ ඒ මේ ගැබ කුසින් පාලනය කරයි. මහණෙනි, නවමසක් ඇවෑමෙන් හෝ දසමසක් ඇවෑමෙන් හෝ මහත් සැකයෙන් යුක්තව ඒ දරුගැබ වදයි. මවුතොමෝ උපන්නාවූ මොහු සිය ලෙයින් පොෂ්‍ය කරයි. මහණෙනි, තනකිරිය යි යමක් වේද, එය මේ ශාසනයෙහි 'ලේ' යයි ව්‍යවහාර වෙයි.

"මහණෙනි, ඒ මේ කුමාර තෙම වැඩීමට පැමිණ, ඉන්ද්‍රියයන්ගේ මේරීමට පැමිණ, කුමරුවන්ගේ යම් ක්‍රීඩා භාණ්ඩයෝ වෙත්ද, එයින් සෙල්ලම් කරයි. එනම්:- (ගම්දරුවන්

සෙල්ලම් කරන) කුඩා නගුල්ය, ගුඩු ගැසීමය, රෝද ගැසීමය, හුළංපෙති කරකැවීමය, වැලි කෙළීමය, කුඩාරථ පැදීමය, කුඩා දුනුවලින් විදීමය (යන සෙල්ලම් කරයි.)

"මහණෙනි, ඒ මේ කුමාරතෙම වැඩීමට පැමිණ, ඉන්ද්‍රියයන්ගේ මේරීමට පැමිණ, පංචකාම සම්පත්තියෙන් සම්පූර්ණ වූයේ, යුක්තවූයේ ඉන්ද්‍රියයන් පිනවයි. ඇසින් බලා දතයුතුවූ යහපත්වූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇති, ආසාව ඇති කරන්නාවූ, සිත් අලවන්නාවූ රූපයන්ගෙන්ද, කණින් අසා දතයුතුවූ යහපත්වූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇති ආසාව ඇති කරන්නාවූ, සිත් අලවන්නාවූ, ශබ්දයන් ගෙන්ද, නාසයෙන්ද විඳ දතයුතුවූ යහපත්වූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇති, ආසාව ඇති කරන්නාවූ, සිත් අලවන්නාවූ ගන්ධයෙන්ද, දිවෙන් විඳ දතයුතුවූ යහපත්වූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇති, ආසාව ඇති කරන්නාවූ, සිත් අලවන්නාවූ, රසයෙන්ද, කයින් විඳ දතයුතුවූ යහපත්වූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇති, ආසාව ඇති කරන්නාවූ, සිත් අලවන්නාවූ ස්පර්ශයෙන්ද, (පස්කම් සැප විඳියි)

"හෙතෙම ඇසින් රූපය දැක, ප්‍රිය ස්වභාව ඇති රූපාරම්මණයෙහි ඇලෙයි. ප්‍රිය ස්වභාව නැති රූපයෙහි නොසතුටට පැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය නැතිව, අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනෙක ඔහුගේ මේ ලාමක අකුසලයෝ ඉතිරි නොවී නැති වෙත්ද, ඒ චෙතො විමුක්තිය හෝ ප්‍රඥා විමුක්තිය හෝ නොදනියි.

"හෙතෙම මෙසේ රාගයට හා ද්වෙෂයට (තරහවට) පැමිණියේ සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද, යම්කිසි වේදනාවක් විඳීද, හෙතෙම ඒ වේදනාව තෘෂ්ණා වසයෙන් ගෙන සතුටු වෙයි. අනේ සැපයයි කියයි. එහිම ගිලී සිටියි. ඒ වේදනාවෙන් සතුටු වන්නාවූ, එය සැපයයි කියන්නාවූ, එහිම ගැලී සිටින්නාවූ ඔහුට තණ්හාව උපදියි. වේදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඕහට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යයකොට ජාතිය වෙයි. ජාතිය

ප්‍රත්‍යයකොට ජරාවය, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, දැඩි වෙහෙසය යන මොවුහු ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය ඇතිවීම වෙයි.

"කණින් ශබ්දය අසා ප්‍රිය ස්වභාව ඇති ශබ්දයෙහි ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ශබ්දයෙහි නොසතුටට පැමිණෙයි. කය පිළිබඳ සිහිය එළඹ නොසිටියේ අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල් ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙත්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් නොදනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට පැමිණියේ සැපවූද, දුක්වූද උපෙක්ෂා සහගතවූද, යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වේදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටුවෙයි. තෘෂ්ණා වශයෙන් ගෙන සැපයයි කියයි. තෘෂ්ණාවෙන් ගැලී සිටියි. ඒ වේදනාවෙන් සතුටු වන්නාවූ, මගේ යයි කියන්නාවූ, ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදී. වෙදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඔහුට උපාදානය ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යය කොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යයකොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, දැඩි වෙහෙසය යන මොවූහු ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් රාසියගේ ඇතිවීම වෙයි.

"නාසයෙන් ගන්ධය ආඝ්‍රාණයකොට ප්‍රිය ස්වභාව ඇති ගන්ධයෙහි ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ගන්ධයෙහි නොසතුටට පැමිණෙයි. කය පිළිබඳ සිහිය එළඹ නොසිටියේ, අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇතිසැටියෙන් නොදනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට පැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද, යම්කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු වෙයි (තෘෂ්ණා වශයෙන් ගෙන සැපයයි) කියයි. තෘෂ්ණාවෙන් ගැලී සිටියි. ඒ වේදනාවෙන් සතුටු වන්නාවූ, මගේයයි කියන්නාවූ, ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදී.

වෙදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඔහුට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යය කොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යයකොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, දැඩි වෙහෙසය යන මොවුහු ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් රාසියගේ ඇතිවීම වෙයි.

15. "දිවෙන් රසයවිඳ ප්‍රිය ස්වභාව ඇති රසයෙහි ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති රසයෙහි නොසතුටට පැමිණෙයි. කයපිළිබඳ සිහිය එළඹ නොසිටියේ, අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වේද්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් නොදනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට පැමිණියේ සැපවූද, දුක්වූද උපෙක්ෂා සහගතවූද, යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු වෙයි. (තෘෂ්ණා වශයෙන් ගෙන සැපයයි) කියයි. තෘෂ්ණාවෙන් ගැලී සිටියි. ඒ වෙදනාවෙන් සතුටු වන්නාවූ, මගේයයි කියන්නාවූ ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදී. වෙදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඔහු උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යය කොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යයකොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, දැඩි වෙහෙසය යන මොවුහු ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් රාසියගේ ඇතිවීම වෙයි.

"කයින් ස්පර්ශයක් ස්පර්ශකොට ප්‍රිය ස්වභාවය ඇති ස්පර්ශයෙහි ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ස්පර්ශයෙහි නොසතුටට පැමිණෙයි. කය පිළිබඳ සිහිය එළඹ නොසිටියේ, අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වේද්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් නොදනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට පැමිණියේ සැපවූද, දුක්වූද උපෙක්ෂා සහගතවූද, යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු වෙයි. (තෘෂ්ණා වශයෙන් ගෙන සැපයයි)

කියයි. තෘෂ්ණාවෙන් ගැලී සිටියි. ඒ වෙදනාවෙන් සතුටු වන්නාවූ, මගේයයි කියන්නාවූ, ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදී. වෙදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඔහුට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යය කොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යයකොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය, සිතෙහි දුකය, දැඩි වෙහෙසය යන මොවුහු ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් රාසියගේ ඇතිවීම වෙයි.

"සිතින් ධර්ම අරමුණු දැන ප්‍රිය ස්වභාව ඇති අරමුණෙහි ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති අරමුණෙහි නොසතුටට පැමිණෙයි. කය පිළිබඳ සිහිය එළඹ නොසිටියේ අකුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද, ඇති සැටියෙන් නොදනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට පැමිණියේ සැපවූද, දුක්වූද උපෙක්ෂා සහගතවූද, යම්කිසි වෙදනාවක් විඳීද, ඒ වේදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු වෙයි, (තෘෂ්ණා වශයෙන් ගෙන සැපයයි) කියයි. තෘෂ්ණාවෙන් ගැලීසිටියි. ඒ වෙදනාවෙන් සතුටු වන්නාවූ, මගේයයි කියන්නාවූ, ගැලී සිටින්නාවූ ඔහුට තෘෂ්ණාව උපදී. වෙදනාවන් කෙරෙහි යම් තෘෂ්ණාවක් වේද, එය උපාදානයයි. ඔහුට උපාදාන ප්‍රත්‍යයෙන් භවය වෙයි. භවය ප්‍රත්‍යයකොට ජාතිය වෙයි. ජාතිය ප්‍රත්‍යයකොට ජරාව, මරණය, ශොකය, වැළපීමය, කයෙහි දුකය සිතෙහි දුකය දැඩි වෙහෙසය යන මොවුහු ඇති වෙත්. මෙසේ මේ සියලු දුක් රාසියගේ ඇතිවීම වෙයි.

**16.** "මහණෙනි, එසේම මේලොකයෙහි අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්වූ, චතුස්සත්‍යය අවබොධ කළාවූ තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ,

බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙව් මිනිසුන් සහිතවූ, මේ ලොකය ස්වකීය විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරයි. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූද, මැද යහපත්වූ අවසානය යහපත්වූද, අර්ථ සහිතවූ, දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති.

"ඒ ධර්මය ගෘහපතියෙක් හෝ, ගෘහපති පුත්‍රයෙක් හෝ, අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද, ඔහු ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. 'ගිහිගෙයි විසීම අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි කියායි.

17. "ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත්හැර, ස්වල්පවූ හෝ බොහෝවූ හෝ නෑ පිරිස් හැර, කෙස් දැළිරැවුලු කපා දමා, සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම, සස්නෙහි මහණ වන්නේය. එසේ මහණවූ හෙතෙම භික්ෂු සීලයෙන් යුක්තවූයේ, ප්‍රාණවධය හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුධ ඇත්තේ, පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමති වන්නේ, සොර නොවූ, පිරිසිදුවූ සිතින් යුක්තව වාසයකෙරේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරීවේ. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, සැබෑ වචන කියන්නේ, සැබැවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය

යුතු වචන ඇත්තේ, ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. පිසුනු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේ, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේ, මෙසේ භෙද වූවන් ගලපන්නේ, සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ වචන කියන්නේය. ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, යම් වචනයක් නිදොස් වේද, කණට මිහිරිද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ වචනම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්තවූ විනයයෙන් යුක්තවූ වචන කියන්නේ, සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

18. "හෙතෙම තණ, ගස්, වැල්, සිඳීම් බිඳීම් ආදියෙන් වැළකුණේ වෙයි, එක් වේලක් වළඳන්නේ රාත්‍රි භොජනයත් හා විකාල භොජනයත් වැළකුණේ වෙයි. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළකුණේ වෙයි. මල්, ගඳ විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් වැළකුණේ වෙයි. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළකුණේ වෙයි. රිදී රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. ස්ත්‍රීන්, තරුණියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් තොර වූයේවෙයි, එළුවන් බැටලුවන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඌරන්, කුකුළන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඇතුන්, ගවයින්, අසුන්, වෙළඹුන් පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. කෙත්, වත්, පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ගිහියන්ගේ දූත මෙහෙවරය,

ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් වැළකුණේ වෙයි. විකිණීම මිළට ගැනීම යන මෙයින් වැළකුණේ වෙයි. තරාදියෙන් හොර කිරීම, රන් නොරන් කිරීමාදියෙන් හොර කිරීම, මැනීමෙන් හොර කිරීමාදියෙන් වැළකුණේ වෙයි. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළකුණේ වෙයි. කැපීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම් ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින් වැළකුණේ වෙයි.

**19.** "හෙතෙමේ යම්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් ඒ ඒ තැනට එය ගෙන යන්නේ වෙයි. යම්සේ පක්ෂියෙක් යම් තැනකට පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණින් යුක්තව පියඹා යේ ද, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය වැසීමට ප්‍රමාණවූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වන්නේවේ. ඔහු යම් තැනකට යා නම් ඒ ඒ තැන එය රැගෙණම යයි. හෙතෙමේ මේ උතුම් සීලයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි නිරවද්‍යවූ සැපය විඳින්නේය.

"හෙතෙමේ, ඇසින් රූපයක් දැක, එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක් වන සේ සිතට නොගනී. යමක් හේතුකොටගෙන ලොභ, ද්වෙෂ අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එහි සංවරය පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ චක්ෂු ඉන්ද්‍රියය රකී, චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

"කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ නොගනී යමක් හේතුකොටගෙන ශ්‍රොතෙන්ද්‍රිය (කන්) අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ ශ්‍රොත ඉන්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොත ඉන්ද්‍රියය රකී. ශ්‍රොත ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ සිතට නොගනී. යමක් හෙතුකොටගෙන ඝ්‍රාණෙන්ද්‍රියය (නාසය) අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ඝාණෙන්ද්‍රියය රකියි. ඝාණෙන්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. දිවෙන් රසයක් විඳ එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක් වනසේ සිතට නොගනී. යමක් හේතුකොටගෙන ජිව්හේන්ද්‍රියය සංවර නොකොට වාසය කරන්නාහට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද එහි සංවරය පිණිස පිළිපදියි. ජිව්හේන්ද්‍රියය (දිව) ආරක්ෂා කරයි. ජිව්හේන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"කයින් පහසක් ස්පර්ශකොට නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතු කොට කායෙන්ද්‍රියය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ කායෙන්ද්‍රියය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රියය ආරක්ෂාකරයි. කායෙන්ද්‍රියේ සංවරයට පැමිණෙයි. සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවතත් මතක්වනසේ සිතට නොගනී. යම් හෙයකින් සිත අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ මනින්ද්‍රියය (සිත) සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රියය රකී. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හෙතෙමේ මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳින්නේය.

20. "හෙතෙමේ ඉදිරියට යාමෙහිද, ආපසු යාමෙහිද, නුවණින් යුක්තවූයෙ වෙයි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද නුවණින් යුක්තවූයෙ වෙයි. අත් පා පැකිලීමෙහිද දිගු කිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. සඟළ සිවුරු සහ පාත්‍රා, සිව්රු දැරීමෙහි නුවණින් යුක්තවූයේ වෙයි.

අනුභව කිරීමය, පානය කිරීමය, රස විඳීමය යන මෙහිද නුවණින් යුක්තවූයෙ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින්

යුක්තවූයේ වෙයි. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද වීම් යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි.

"උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද, උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, පර්වතද, කඳුරැලිද, ගල් ගුහාද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑද, හිස් තැන්ද, පිදුරු ගොඩවල්ද යන මේ විවේක සෙනාසන භජනය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළකුණේ, පයඞ්කය බැඳ, ශරීරය කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි.

21. "ඔහු ස්කන්ධ ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව වාසය කරයි. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. ක්‍රොධයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරු කොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරු කොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. සැකය දුරු කොට, පහකළ සැක ඇත්තේ, කුශල ධර්ම විෂයෙහි එසේද මෙසේදැයි සැක නැතිව විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

'හෙතෙම සිත කිලුටු කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංචනීවරණයන් දුරුකොට, කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුලත පැහැදීම ඇති, හිතේ එකඟ

බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයි. සිහියෙන් යුක්ත වූයේ, නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්‍ය්‍යයෝ යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇති සිහි ඇති, සැප විහරණ ඇත්තේයයි කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද (ධ්‍යානය ලැබීමට) පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන්, දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

**22.** "හෙතෙම ඇසින් රූපය දැක, ප්‍රිය ස්වභාව ඇති රූප අරමුණෙහි නොඇලෙයි, අප්‍රිය ස්වභාව ඇති රූපයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම්තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්තවිමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නො පැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද, යම්කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි; සැපයයි නොකියයි. (තෘෂ්ණාවෙන්) ගැලී නොසිටියි. ඒ වෙදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේයයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධවීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාතිය (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සොක, වැළපීම, කයෙහි දුක, සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

"හෙතෙම කණින් ශබ්දය අසා, ප්‍රිය ස්වභාව ඇති ශබ්දයෙහි නොසතුටට නොපැමිණෙයි. අප්‍රිය ස්වභාව ඇති ශබ්දයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්තවිමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නොපැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි, සැපයයි නොකියයි. (තෘෂ්ණාවෙන්) ගැලී නොසිටියි. ඒ වෙදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේයයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධ වීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාතිය (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සොක වැළපීම, කයෙහි දුක, සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

"හෙතෙම නාසයෙන් ගන්ධය විඳ, ප්‍රිය ස්වභාව ඇති ගන්ධයෙහි නො ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ගන්ධයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්තවිමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නොපැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි. සැපයයි නොකියයි. (තෘෂ්ණාවෙන්) ගැලී නොසිටියි. ඒ වෙදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේ යයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධ වීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාතිය (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සොක, වැළපීම, කයෙහි දුක,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

23. "හෙතෙම දිවෙන් රසය විඳ, ප්‍රිය ස්වභාව ඇති රසයෙහි නොඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති රසයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නොපැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි. සැපයයි නොකියයි, (තෘෂ්ණාවෙන්) ගැලී නොසිටියි. ඒ වේදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේයයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධ වීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධවීමෙන් ජාතිය (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධවීමෙන් ජරා, මරණ, සොක, වැළපීම, කයෙහි දුක, සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

24. "හෙතෙම කයින් ස්පර්ශයක් විඳ, ප්‍රිය ස්වභාව ඇති ස්පර්ශයෙහි නො ඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ස්පර්ශයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්ත විමුක්තියද ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නොපැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද, යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි. සැපයයි නොකියයි. (තෘෂ්ණාවෙන්) ගැලි නොසිටියි. ඒ වේදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේයයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධවීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය

වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාතිය (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සොක, වැළපීම, කයෙහි දුක, සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

"හෙතෙම සිතින් ධර්ම අරමුණක් විඳ ප්‍රිය ස්වභාව ඇති ධර්මයෙහි නොඇලෙයි. අප්‍රිය ස්වභාව ඇති ධර්මයෙහි නොසතුටට නොපැමිණෙයි. ශරීරය පිළිබඳව සිහිය එළඹ සිටියේ, කුසල් සිත් ඇතිව වාසය කරයි. යම් තැනක ඔහුගේ ලාමකවූ අකුසල ධර්මයෝ සම්පූර්ණයෙන් විනාශ වෙද්ද, ඒ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද ඇති සැටියෙන් දනී. හෙතෙම මෙසේ රාග ද්වෙෂ දෙකට නොපැමිණියේ, සැපවූද, දුක්වූද, උපෙක්ෂා සහගතවූද යම් කිසි වෙදනාවක් විඳීද, ඒ වෙදනාව තෘෂ්ණා වශයෙන් ගෙන සතුටු නොවෙයි, සැපයයි නොකියයි. (තෘෂ්ණාවෙන්) ගැලී නොසිටියි. ඒ වේදනාවෙන් සතුටු නොවන්නාවූ, (මගේයයි) නොකියන්නාවූ ඔහුට තෘෂ්ණාව නූපදී. ඒ තෘෂ්ණාවගේ නිරුද්ධ වීමෙන් (නැතිවීම) උපාදාන නිරොධය වෙයි. උපාදානයන්ගේ නිරුද්ධ වීමෙන් භවය නිරුද්ධ වෙයි. භවය නිරුද්ධ වීමෙන් ජාති (උත්පත්තිය) නිරුද්ධ වෙයි. ජාතිය නිරුද්ධ වීමෙන් ජරා, මරණ, සොක, වැළපීම්, කයෙහි දුක, සිතෙහි දුක, දැඩි වෙහෙස යන මොවුහු නිරුද්ධ (නැති) වෙත්. මෙසේ මේ සියලු දුක් රාසිය නැතිවීම වෙයි.

"මහණෙනි, තොපි මා විසින් සංක්ෂෙපයෙන් දෙශනා කරනලද තෘෂ්ණාක්ෂයවිමුක්ති ධර්මය නිතර දරව්, කෙවට්ට පුත්‍ර වූ සාති භික්ෂුව මහත් තෘෂ්ණා නැමැති දැලෙහි තෘෂ්ණා නැමැති අවුලෙහි ගැළුණෙකු කොට සලකව්.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු වූහ.

**අටවෙනිවූ මහා තණ්හා සංඛය සූත්‍රය නිමි. (4-8)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 39. මහා අස්සපුර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අඞ්ග දනව් වැසියන්ගේ අස්සපුර නම් නියම්ගමෙහි වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි'යි කියා භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීනි" කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'මහණෙනි, මහජනයා තොපි ශ්‍රමණයෝය, ශ්‍රමණයෝය' කියා හඳුනයි. තොපිදු 'තෙපි කවරහුදැ'යි විචාරණ ලද්දාහු, 'අපි ශ්‍රමණයෝ වෙමු'යි ප්‍රතිඥා කරන්නහුය. මහණෙනි, මෙසේ හඳුනනු ලබන්නාවූ, මෙසේ ප්‍රතිඥා කරන්නාවූ ඒ තොපගේ ශ්‍රමණ බව ඇතිකරන්නාවූද, බ්‍රාහ්මණ බව ඇතිකරන්නාවූද යම් ධර්ම කෙනෙක් වෙද්ද, ඒ ධර්මයන් සමාදන්ව පවතින්නෙමු නම් මෙසේ ඒ හැඳින්වීම සත්‍යවන්නේය. අපගේ ප්‍රතිඥාවද ඇත්තක් වන්නේය. අපි යම් කෙණෙකුන්ගේ සිව්රු, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර වළඳමුද අප විෂයෙහි කරන්නාවූ ඔවුන්ගේ ඒ සත්කාරයෝ මහත් ඵල, මහත් අනුසස් වන්නාහ. අපගේද මේ මහණකම හිස් නොවූ, ඵල සහිතවූ, වැඩීම් සහිතවූ එකක් වන්නේය'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුය.

2. "මහණෙනි, ශ්‍රමණ බව කරන්නාවූද, බ්‍රාහ්මණ බව කරන්නාවූද. ධර්මයෝ කවරහුද? 'හිරි ඔතප් (ලජ්ජා, භය) දෙකින් යුක්ත වූවෝ වන්නෙමු'යි මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි. මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැක්කේය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවීමු. මේ ප්‍රමාණ වන්නේය. මෙපමණකින් කටයුතු කෙළෙමු. අප විසින් මහණකමෙහි පල ලබනලදී. මින්පසු කළයුත්තක් නැතැ'යි තෙපි මෙපමණකින්ම සතුටට පැමිණිය හැකිය.

"මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි. මත්තෙහි කටයුතු ඇති කල්හි මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා.

"මහණෙනි, මත්තෙහි කටයුතු නම් කුමක්ද? 'අපගේ කයින් හැසිරීම පිරිසිදු වන්නේය. ප්‍රකටය. නොවැසුනේය. සිදුරු නැත්තේය. සංවර වූයේය. ඒ කයින් පිරිසුදු බව ඇතිකම නිසා තමන් උසස්කොට නොදකින්නෙමු, අනුන් පහත් කොට නොදකින්නෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් වියහැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු. අපගේ කයින් හැසිරීම පිරිසිදුය. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කළෝ වෙමු. අප විසින් මහණ කමෙහි ඵලය ලබනලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි තෙපි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

3 "මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි. මහණෙනි, මත්තෙහි කටයුතු ඇතිකල්හි මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා මහණෙනි, මත්තෙහි කටයුතු නම් කුමක්ද අපගේ වචනයේ පැවැත්ම පිරිසිදුය, ප්‍රකටය, නොවැසුනේය. සිදුරු නැත්තේය සංවර වූයේය ඒ පිරිසිදු වචන ඇති බැවින් තමන් උසස්කොට නොදක්නෙමු, අනුන් පහත් කොට නොදක්නෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් වියහැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු. අපගේ කයින් හැසිරීම පිරිසිදුය වචනයේ පැවැත්ම පිරිසිදුය මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරණලදී. අප විසින් මහණ කමෙහි ඵල ලබනලදී. අපට මින්පසු කළයුතු කිසිවක් නැතැ මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

4. "මහණෙනි, තොපට කියමි. තොපට දන්වමි. මහණෙනි, මත්තෙහි කටයුතු ඇති කල්හි, මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා, මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'අපගේ සිතේ පැවැත්ම පිරිසිදුය, ප්‍රකටය, නොවැසුනේය, සිදුරු නැත්තේය, සංවරවූයේය. ඒ පිරිසිදු සිතේ පැවැත්ම ඇති බැවින් තමන් උසස්කොට

නොදකින්නෙමු. අනුන් පහත්කොට නොදකින්නෙමු'යි. මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු. අපගේ කයේ පැවැත්ම පිරිසිදුය. වචනයේ පැවැත්ම පිරිසිදුය. සිතේ පැවැත්ම පිරිසිදුය. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරනලදී. අප විසින් මහණකමෙහි පල ලබනලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

**5.** "මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි. තොපට මත්තෙහි කටයුතු ඇති කල්හි, මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා. මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'අපගේ ජීවිකාව පිරිසිදුය, ප්‍රකටය, නොවැසුණේය, සිදුරු නැත්තේය, සංවර කරන ලද්දේය. ඒ පිරිසිදු ජීවිකාව ඇති බැවින් තමන් උසස් කොට නොදක්නෙමු. අනුන් පහත්කොට නොදක්නෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු. අපගේ කයේ පැවැත්ම පිරිසිදුය. වචනයේ පැවැත්ම පිරිසිදුය. සිතේ පැවැත්ම පිරිසිදුය. ජීවිකාව පිරිසිදුය. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරනලදී. අප විසින් මහණකමෙහි පල ලබන ලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

**6.** "මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි. තොපට මත්තෙහි කටයුතු ඇති කල්හි මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණ කමේ පලය නොපිරිහේවා. මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'ඉන්ද්‍රියයන්හි වසන ලද දොරවල් ඇත්තෝ වන්නෙමු. ඇසින් රූපය දැක සිතට නොගන්නේ, නැවත නැවත මතක් වනසේ සිතට නොගන්නේ මේ චක්ෂුරෙන්ද්‍රිය (ඇස) අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන ලොභ ද්වෙෂ ආදී අකුශල ධර්මයෝ රැස් වන්නාහුද,

ඒ චක්ෂුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදින්නෙමු. චක්ෂුරින්ද්‍රිය රකින්නෙමු. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙන්නෙමු.

"කණින් ශබ්දය අසා සිතට නොගන්නේ තදින් සිතට නොගන්නේ, මේ සොත ඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන ලොභ දොස අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ සොත ඉන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදින්නෙමු. ඒ සොත ඉන්ද්‍රියය රකින්නෙමු. ඒ සොත ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙමු.

"නාසයෙන් ගන්ධය දැන එය සිතට නොගන්නේ, තදින් සිතට නොගන්නේ, මේ ඝාණ ඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන ලොභ දොස ආදී අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ ඝාණ ඉන්ද්‍රියය සංවරය පිණිස පිළිපදින්නෙමු. ඒ ඝාණ ඉන්ද්‍රිය රකින්නෙමු. ඒ ඝාණ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙමු.

"දිවෙන් රසය විඳ එය සිතට නොගන්නේ, තදින් සිතට නොගන්නේ, මේ ජිව්හා ඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන දැඩි ආසාව හා කලකිරීම ආදී අකුසල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ ජිව්හා ඉන්ද්‍රියය සංවරය පිණිස පිළිපදින්නෙමු. ඒ ජිව්හා ඉන්ද්‍රියය රකින්නෙමු. ඒ ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙමු.

"කයින් ස්පර්ශයක් විඳ එය සිතට නොගන්නේ, තදින් සිතට නොගන්නේ, මේ කාය ඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන ලොභ දොස ආදි අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ කාය ඉන්ද්‍රියය සංවරය පිණිස පිළිපදින්නෙමු. ඒ කාය ඉන්ද්‍රියය රකින්නෙමු. ඒ කාය ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙමු.

"සිතින් යම් (ධර්ම) අරමුණක් දැන එය සිතට නොගන්නේ, තදින් සිතට නොගන්නේ, මේ මනො ඉන්ද්‍රියය අසංවරව වාසය කරන්නාහට යමක් හේතු කොට ගෙන ලොභ දොස ආදී අකුශල ධර්මයෝ රැස්වන්නාහුද, ඒ මනො ඉන්ද්‍රිය සංවරය පිණිස

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පිළිපදින්නෙමු. ඒ මනො ඉන්ද්‍රියය රකින්නෙමු. ඒ මනො ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙන්නෙමු'යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතුය.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තයෝ වෙමු. අපගේ කයේ පැවැත්ම පිරිසිදුය. වචනයේ පැවැත්ම පිරිසිදුය. සිතේ පැවැත්ම පිරිසිදුය. ජීවිකාව පිරිසිදුය. ඉන්ද්‍රියයන්හි වසනලද දොරවල් ඇත්තෙමු. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරන ලදී. අප විසින් මහණකමෙහි ඵලය ලබනලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

7. "මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි. මත්තෙහි කටයුතු ඇතිකල්හි, මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා, මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'භොජනයෙහි පමණ දන්නෝ වන්නෙමු. නුවණින් සලකා බලා ආහාර අනුභව කරන්නෙමු. (ඒ අනුභවය) ක්‍රීඩා පිණිස නොවෙයි. මද වැඩීම පිණිස නොවෙයි. සැරසීම පිණිස නොවෙයි, අලංකාරය පිණිස නොවෙයි. යම්තම් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස, හිංසා දුරලීම පිණිස, බ්‍රහ්මචරියාවට අනුග්‍රහ පිණිසය. මෙසේ පැරණි වේදනාවන් නසන්නෙමි. අලුත් වේදනාවන් නො උපදවන්නෙමි, මාගේ දිවි පැවැත්මද වන්නේය. නිවරැදි බවද, සැප විහරණයද වන්නේය' (කියායි) මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්ත වෙමු. අපගේ කයේ පැවැත්ම පිරිසිදුය, වචනයේ පැවැත්ම පිරිසිදුය, සිතේ පැවැත්ම පිරිසිදුය, ජීවිකාව පිරිසිදුය, ඉන්ද්‍රියයන්හි වසනලද දොරවල් ඇත්තෙමු, භොජනයෙහි පමණ දැන වළඳන්නෙමු, මෙපමණක් ඇත මෙපමණකින් සිව් මග කටයුතු කරනලදී. අප විසින් මහණකමෙහි පල ලබනලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

8. "මහණෙනි, තොපට කියමි තොපට දන්වමි. මහණෙනි, මත්තෙහි කටයුතු ඇතිකල්හි, මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා. මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'නිදි තොරකිරීමෙහි යෙදුනෝ වන්නෙමු. දවල් කාලය මුලුල්ලෙහි සක්මන් කිරීමෙන් හිඳීමෙන් නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නෙමු. රාත්‍රියෙහි ප්‍රථම යාමය සක්මනින්ද, හිඳීමෙන්ද, නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නෙමු. රාත්‍රියෙහි මධ්‍යම යාමය දකුණු ඇලයෙන් දකුණු පයෙහි වම් පය මදක් ඇද තබා සිහියෙන් යුක්තව, හොඳ ප්‍රඥාව ඇතිව, නැගිටිමි යන සංඥාව සිත්හි තබාගෙන සිංහසෙය්‍යාවෙන් සැතපෙන්නෙමු. රාත්‍රියෙහි අන්තිම යාමයෙහි නැගිට සක්මන් කිරීමෙන්ද, හිඳීමෙන්ද, නීවරණ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නෙමු'යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතුයි.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය. 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු. 'අපගේ කායසමාචාරය පිරිසිදුය, වචීසමාචාරය පිරිසිදුය, මනොසමාචාරය පිරිසිදුය, ජීවිකාව පිරිසිදුය, ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තෝ වෙමු. භොජනයෙහි පමණ දැන වළඳන්නෝ වෙමු. නිදි තොර කිරීමෙහි යෙදුනෝ වෙමු. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරනලදී. අප විසින් මහණකමෙහි පල ලබන ලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැත'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

9. "මහණෙනි, තොපට කියමි. මහණෙනි, තොපට දන්වමි තොපට මත්තෙහි කටයුතු ඇති කල්හි මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා. මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? 'සිහියෙන් හා යහපත් ප්‍රඥාවෙන් යුක්තවූවෝ වන්නෙමු. ඉදිරි ගමනෙහිද, ආපසු ගමනෙහිද, නුවණින් ක්‍රියා කරන්නේය. ඉදිරි බැලීමෙහිද, වට පිට බැලීමෙහිද නුවණින් බලන්නේය. අත්පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද මනා නුවණින් යුක්තව එසේ කරන්නේය. දෙපට සිවුරය, පාත්‍රය,

සිවුරුය යන මේ දේ දැරීමෙහිද, මනා නුවණින් දැන එසේ කරන්නේය. අනුභව කිරීමය, පානය කිරීමය, වැළඳීමය, රස විඳීමය යන මෙහිද මනා නුවණින් යෙදී එසේ කරන්නේය. මල මුත්‍ර පහකිරීමද නුවණින් සලකා කරන්නේය. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොරකිරීම්, කථා කිරීම්, නිශ්ශබ්දව සිටීම් යන මේ දේ මනා නුවණින් දැන එසේ කරන්නේය'යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතුය.

"මහණෙනි, තොපට මෙබඳු අදහසක් විය හැකිය, 'අපි හිරි ඔතප් දෙකින් යුක්තවූවෝ වෙමු, අපගේ කාය සමාචාරය පිරිසිදුය, වචී සමාචාරය පිරිසිදුය, මනො සමාචාරය පිරිසිදුය, ජීවිකාව පිරිසිදුය, ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තෝ වෙමු. භොජනයෙහි පමණ දැන වළඳන්නෝ වෙමු. නිදි තොර කිරීමෙහි යෙදුනෝ වෙමු. සිහියෙන් හා යහපත් නුවණින් යුක්තවූවෝ වෙමු. මෙපමණක් ඇත. මෙපමණකින් කටයුතු කරනලදී. අප විසින් මහණකමෙහි පල ලබනලදී. අපට මත්තෙහි කළයුතු කිසිවක් නැතැ'යි මෙපමණකින් සතුටට පැමිණිය හැකිය.

"මහණෙනි, තොපට කියමි, මහණෙනි, තොපට දන්වමි. තොපට මත්තෙහි කටයුතු ඇති කල්හි, මහණකමින් පල ලබනු කැමති තොපගේ මහණකමෙහි පලය නොපිරිහේවා. මහණෙනි, මත්තෙහි කටයුතු කුමක්ද? මේ ශාසනයෙහි මහණතෙම, ආරණ්‍ය සෙනාසනය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැළිය, පර්වතගුහාය, සොහොනය, ඈත වන මැද සෙනාසනය, එළිමහනය, පිදුරු බිස්සය යන විවේක සෙනසුනක් සෙවනය කරයි. හෙතෙම බතින් පසුව පිණ්ඩපාතයෙන් වැළකුණේ පයඹිංකය බැඳ ශරීරය කෙලින් තබා සිහිය ඉදිරිකොට තබා හිඳියි. හෙතෙම ශරීර නමැති ලොකයෙහි අභිද්‍යාව (ආශාව) දුරුකොට පහවූ අභිද්‍යා ඇත්තේ අභිද්‍යාවෙන් හිත පිරිසිදු කරයි, ව්‍යාපාදය (ක්‍රොධය) හැර ව්‍යාපාද රහිත සිත් ඇත්තේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පා ඇත්තේ වාසය කරයි. ව්‍යාපාදයෙන් හිත පිරිසිදු කරයි. ථිනමිද්ධය හැර පහවූ ථිනමිද්ධ ඇත්තේ, ආලොක සංඥා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ යහපත් ප්‍රඥා ඇත්තේ වාසය

කරයි. ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කරයි, උද්ධච්චකුක්කුච්චය හැර විසිරනොගිය සිත් ඇතිව වාසය කරයි. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව දුරලා පහකළ විචිකිච්ඡා ඇත්තේ, කුසල ධර්මයන්හි, කෙසේ කෙසේදැයි, පැවති සැකනැතිව වාසය කරයි, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කරයි.

10. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම ණයට මුදල් ගෙන කර්මාන්තයන්හි යොදවයිද, ඔහුගේ ඒ කර්මාන්තයෝ දියුණු වෙත්ද, හෙතෙම ඒ පැරණි ණයත් ගෙවන්නේද, අඹු දරුවන් පොෂණය පිණිසද යම් මුදලක් ඉතිරිවන්නේද, ඔහුට මෙසේ අදහස් වන්නේය. මම වනාහි පෙර ණය ගෙන කර්මාන්තයන්හි යෙදූයෙමි. ඒ මාගේ කර්මාන්තයෝ දියුණුවූහ. ඒ මම පැරණි යම් ණය මුදලක් වීනම් ඒ මුදල්ද ගෙව්වෙමි අඹු දරුවන් පොෂණයටද මුදල් ඉතිරිවීයයි හෙතෙම ඒ හේතු කොට ගෙන සතුට ලබයිද, සොම්නසටද පැමිණෙයිද.

"මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම ආබාධයකින් යුක්තවූයේ, එයින් හටගත් දුක් ඇත්තේ, දැඩි ගිලන් වෙයිද, ඔහුට ආහාරයද, රුචි නොවන්නේය. ඔහුගේ ශරීරයෙහි ශක්තියද නැත්තේය. ටික කලකින් හෙතෙම ඒ රොගයෙන් මිදුනේ, ඔහුට බතද රුචි වන්නේය. ඔහුගේ ශරීරයෙහි බලයද වන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මම වනාහි පෙර ලෙඩ වූයෙමි, එයින් හටගත් දුක් වේදනා ඇත්තේ වීමි. දැඩි ගිලන්වීමි. මට බතද රුචි නොවීය. මාගේ ශරීරයෙහි ශක්තියද නැතිවිය. ඒ මම දැන් ඒ රොගයෙන් මිදුනෙමි. මට බතද රුචිය. මාගේ කයෙහි ශක්තිය ඇත. හෙතෙම ඒ හේතු කොටගෙන සතුටට පත්වෙයිද, සොම්නසටද පැමිණෙයිද

"මහණෙනි, යම්සේ පුරුෂයෙක්තෙම සිරගෙයි බැඳුනේද, හෙතෙම පසු කලෙක ඒ බන්ධනයෙන් සැපසේ වියදමක් නැතිව මිදෙන්නේද, ඔහුගේ භොගයන්ගේ කිසි විනාශයකුත් නොවන්නේද, ඔහුට මෙසේ අදහස් වන්නේය. මම වනාහි පෙර සිරගෙයි බඳනා ලද්දෙක් වීමි. ඒ මම දැන් ඒ බන්ධනයෙන්

සැපසේ වියදමක් නැතිව මිදුනෙමි. මාගේ භොගයන්ගේ කිසි හානියක්ද නැත. හෙතෙම ඒ හේතු කොටගෙන සතුට ලබයිද සොම්නසටද පැමිණෙයිද

"මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම තමා ප්‍රධාන නොවූ, අන්‍යයෙකුට යටත්වූ, කැමතිසේ හැසිරෙන්නට ඉඩ නොලබන දාසයෙක් වේද, හෙතෙම පසු කලෙක ඒ දාසභාවයෙන් මිදී තමාම ප්‍රධාන කොට ඇත්තේ, අනුන් ස්වාමි කොට නැත්තේ නිදහස් වූයේ කැමති සේ හැසිරෙන්නට ඉඩ ලබයිද, ඔහුට මෙසේ අදහස් වන්නේය. මම වනාහි පෙර ස්වාධීන නොවූ අනුන්ට යටත්වූ, කැමතිතැනක නොයා හැකිවූ දාසයෙක්වීමි. ඒ මම දැන් ඒ දාස භාවයෙන් මිදුනේ ස්වාධීනවූයේ, පරාධීන නොවූයේ කැමති තැනකට යාහැකි වූයෙමියි. හෙතෙම ඒ හේතුකොටගෙන සතුට ලබයිද. සොම්නසටද පැමිණෙයිද.

"මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම ධන සහිතවූයේ, භොග සහිත වූයේ, කාන්තාරයෙහි දීර්ඝ මාර්ගයකට බැස්සේ වෙයිද, හෙතෙම ටික කලකට පසු ඒ කාන්තාරයෙන් සැපසේ වියදමක් නැතිව එතර වන්නේය. ඔහුගේ සම්පත්තීන්ගේ කිසිහානියක්ද නොවන්නේය. ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මම වනාහි පෙර ධන සහිත වූයේ භොග සහිතවූයේ කාන්තාරයෙහි දීර්ඝ මාර්ගයට පැමිණියෙමි. ඒ මම දැන් ඒ කාන්තාරයෙන් සැපසේ, වියදමක් නැතිව එතර වූයෙමි. මාගේ සම්පත්තීන්හි කිසි හානියක්ද නැතැයි, හෙතෙම ඒ හේතුකොටගෙන සතුට ලබයිද, සොම්නසටද පැමිණෙයිද,

"මහණෙනි, මහණතෙම ණය යම්සේද, රෝගය යම්සේද, සිරගෙය යම්සේද, දාසභාවය යම්සේද, කාන්තාර මාර්ගය යම්සේද එපරිද්දෙන්ම නැති නොවූ මේ පංචනීවරණ ධර්මයන් තමා කෙරෙහි දකියි. මහණෙනි, ණය රහිත බව යම්සේද, නිරොගි බව යම්සේද, හිරගෙයින් මිදීම යම්සේද, නිදහස් බව යම්සේද, නිර්භය ස්ථානය යම්සේද, එපරිද්දෙන්ම මහණතෙම නැතිවූ මේ පංචනීවරණයන් තමා කෙරෙහි දකියි.

11. "හෙතෙම හිත කෙලෙසන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංචනීවරණ ධර්මයන් දුරුකොට කාමයන්ගෙන් වෙන් වූයේම, අකුශල ධර්මයන් කෙරෙන් වෙන්වූයෙම විතර්ක සහිතවූ, විචාර සහිතවූ සිතෙහි විවේකයෙන් උපන් ප්‍රීතියම සැප කොට ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි, හෙතෙම මේ ශරීරය විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි, පුරවයි, හාත්පසින් ස්පර්ශ කරයි ඔහුගේ සියලු ශරීරයෙහි කිසියම් ප්‍රදෙශයක් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරන ලද්දේ නොවෙයි. මහණෙනි, යම්සේ දක්ෂවූ නාවන්නෙක් හෝ නාවන්නෙකුගේ අතවැසියෙක් හෝ ලොහො තලියක ඇඟගාන සුවඳසුණු දමා දියෙන් තෙම තෙමා පිඩුකරන්නේය. ඒ නහණ සුණු පිඩ දියෙන් යුක්ත වූයේ දියෙන් වළඳනා ලද්දේ, ඇතුළත පිටත දියෙන් ස්පර්ශ කරන ලද්දේ වෙයිද, එයින් දිය නොවැගිරෙයිද, මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි. සැම තන්හි පතුරුවයි, ඔහුගේ සියලු ශරීරයෙහි ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරනලද තැනක් නැත.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණෙනි, භික්ෂුව, විතක්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා තුළ මනා පැහැදීම ඇතිකරන්නාවූ සිත පිළිබඳ එකඟ බව ඇති, සමාධියෙන් හටගත් ප්‍රීතිසැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මේ ශරීරයම ද්විතීය ධ්‍යාන සමාධියෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපයෙන් තෙමයි. හාත්පසින් තෙමයි. පුරවයි, පතුරුවයි, ඔහුගේ සියලු ශරීරයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරනලද තැනක් නැත්තේය. මහණෙනි, උල්පතින් ජලය ලැබෙන දිය විලක් යම්සේ වේද, ඒ විලට නැගෙනහිරින්ද, ජලය ඇතුළුවන මාර්ගයක් නැත්තේය. බටහිර දිගින්ද ජලය ඇතුළුවන මාර්ගයක් නැත්තේය. උතුරු දිගින්ද ජලය ඇතුළුවන මාර්ගයක් නැත්තේය. දකුණු දිගින්ද ජලය ඇතුළුවන මාර්ගයක් නැත්තේය. වැස්සද කලින් කල ඊට හොඳින් නොවසින්නේය. එහෙත් ඒ දිය විලෙන්ම සිසිල්වූ ජලධාරාවෝ උඩට නැඟී ඒ

දිය විල මුළුල්ලම සිසිල් ජලයෙන් තෙමන්නේය. හාත්පසින් තෙමන්නේය, සම්පූර්ණයෙන් පුරවන්නේය, ඒ මුළු දිය විලෙහි කිසියම් පෙදෙසක් සිසිල් දියෙන් ස්පර්ශ නොකරන ලද්දේ නොවෙයිද,

"මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සෑම තන්හි පතුරුවයි, ඔහුගේ සියලු ශරීරයෙහි සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් ස්පර්ශ නොකරනලද තැනක් නැත.

12. "මහණෙනි, නැවත අනෙකක් ද කියමි. භික්ෂුව ප්‍රීතියෙහිද නොඇල්මෙන් මැදහත් බව ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා (මැදහත්) විඳීම ඇත්තේ, සිහි ඇත්තේ, සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මේ ශරීරය ප්‍රීති රහිතවූ සැපයෙන් හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සෑම තන්හි පතුරුවයි, ඔහුගේ සියලු ශරීරයෙහි ප්‍රීති රහිත සැපයෙන් ස්පර්ශ නොකරනලද තැනක් නැත. මහණෙනි, යම්සේ උපුල් විලක හෝ පියුම් විලක හෝ හෙළපියුම් විලක හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ හෙළපියුම් හෝ දියෙහි හටගත්තාහු, දියෙහි වැඩුනාහු, දිය අනුව ගියාහු, ඇතුළත වැද වැඩෙන්නාහු, අගදක්වාද, මුලදක්වාද, සිහිල් දියෙන් තෙමුනාහු, හාත්පසින් තෙමුනාහු, පිරුණාහු දියෙන් ස්පර්ශ කරන ලද්දාහු වෙත්ද, ඒ උපුල් අතුරෙන් හෝ පියුම් අතුරෙන් හෝ හෙළ පියුම් අතුරෙන් හෝ කිසිවක් මුළුමනින් සිහිල් දියෙන් ස්පර්ශ නොකරන ලද්දේ නොවන්නේද, මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව ප්‍රීති රහිත සැපයෙන් මේ ශරීරය තෙමයි, හාත්පසින් තෙමයි, සම්පූර්ණයෙන් පුරවයි, සෑම තන්හි පතුරුවයි, ඔහුගේ සියලු ශරීරයෙහි ප්‍රීති රහිත සැපයෙන් ස්පර්ශ නොකරනලද තැනක් නැත්තේය.

13. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුව සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද, පළමු කොටම සැප දුක්

වේදනා නැතිව යාමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂාසති යන මොවුන්ගේ පිරිසිදු බව ඇති හතරවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. පිරිසිදුවූ පැහැදිලිවූ සිතින් පතුරුවා උන්නේවෙයි, ඔහුගේ සියලු අවයව ඇති ශරීරයාගේ කිසියම් ප්‍රදෙශයක් පිරිසිදුවූ පැහැදිලිවූ සිතින් ස්පර්ශ නොකරණ ලද්දේ නොවෙයි. මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම සුදු වස්ත්‍රයකින් හිස සහිතව පොරවා හුන්නේද, ඔහුගේ මුළු ශරීරයේ කිසියම් ප්‍රදෙශයක් පිරිසිදු සුදුවස්ත්‍රයෙන් නොවැසුණේ නොවෙයි. මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම මේ ශරීරයම පිරිසුදුවූ පැහැදිලිවූ සිතින් පැතිර වාසය කරයි. ඔහුගේ මුළු ශරීරයේ කොතැනක්වත් පිරිසුදුවූ පැහැදිලිවූ හිතින් ස්පර්ශ නොකරන ලද්දේ නොවෙයි.

14. "හෙතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි. මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කරයි. ඉදිරිපත්කොට (ඊට) නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කරයි. කෙසේදයත්: එක් ජාතියක් ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිහක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක්දහසක්ද, නොයෙක් විනාශවෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, අසුවල් තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කරයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, පුරුෂයෙක් යම්සේ තම ගමින් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් අන් ගමකට යන්නේද, ඒ ගමිනුත් තමන්ගේ ගමට එන්නේද, 'මම, සිය ගමින් අසුවල් ගමට ගියෙමි, එහි මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනුදු අසුවල් ගමට ගියෙමි, එහිද මෙසේ සිටියෙමි, මෙසේ හුන්නෙමි, මෙසේ කථාකෙළෙමි, මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම ඒ ගමින් සිය ගමට පැමිණියෙමි'යි හෙතෙම දන්නේය

15 "මහණෙනි, එපරිද්දෙන්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, කෙලෙස් පහවූ කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවටපැමිණි කල්හි, පෙර ජාති සිහිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කරයි. ඉදිරිපත් කොට නමයි. හේ නොයෙක් පෙරවිසීම් සිහි කරයි. කෙසේදයත්: එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද නොයෙක් විනාශවෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් හෝ විනාශවෙමින් හෝ පවතින කල්පයන්ද, අසුවල් තැන වීමි. මෙබඳු නම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු පාට ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි මෙබඳු සැප දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව අසුවල්තැන උපන්නෙමි; එහිදු මෙනම් ඇත්තෙමි, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු පාට ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුව දුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිත, (පෙරවිසූ පිළිවෙළ) දැක්වීම් සහිත, නොයෙක් ආකාරවූ පෙරවිසීම් සිහි කරයි.

16 "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, කෙලෙස් පහව ගිය

කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, සත්වයන්ගේ මරණින් පසු උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කරයි, ඉදිරිපත් කොට නමයි. හේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොව ගියාවූද, නරක ලොව ගියාවූද, කර්මය ලෙස පැමිණි සත්වයන් දනී. 'මේ පින්වත් සත්වයෝ කාය (ශරීර) දුශ්චරිතයෙන් යුක්තය, වාග් (වචනය) දුශ්චරිතයෙන් යුක්තය, මනො (හිතේ) දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයන්ට බණින්නෝය, මිථ්‍යා දෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝය. ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්වයෝ කාය (ශරීර) සුචරිතයෙන් යුක්තය, වාග් (වචන) සුචරිතයෙන් යුක්තය, මනො (හිතේ) සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබණින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. මරණින් මතු යහපත් පැමිණීමවූ ස්වර්ගලොකයෙහි උපන්නාවූ මෙසේ පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණ වූද, හොඳ ලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනී

"මහණෙනි, දොරවල් සහිතවූ ගෙවල් දෙකක් යම්සේ වන්නාහුද, එහි ඇස් ඇති පුරුෂයෙක් තෙම මධ්‍යයෙහි සිටියේ ගෙට පිවිසෙන්නාවූද, නික්මෙන්නාවූද, සක්මන් කරන්නාවූද, මනුෂ්‍යයන් දක්නේද, මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම පිරිසුදුවූ මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොව ගියාවූද, නරක ලොව ගියාවූද, කර්මය ලෙස උපන් සත්වයන් දකී.

17. "මහණෙනි, එසේම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, කෙලෙස්පහව ගිය

කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත ඉදිරිපත් කරයි, සිත ඉදිරිපත් කොට නමයි. හේ මිනිස් ඇස ඉක්මවූ දිවඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොව ගියාවූද නරක ලොව ගියාවූද කර්මය ලෙස පැමිණි සත්වයන් දනි. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තය, වාග් දුශ්චරිතයෙන් යුක්තය, මනො දුශ්චරිතයෙන් යුක්තය, උත්තමයින්ට බණින්නෝය, මිථ්‍යාදෘෂ්ටිකයෝය, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝය. ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු අපායවූ, දුර්ගතියවූ, දුකවූ, නිරයට පැමිණෙත්.' නැතහොත්, 'මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තය, වාග් සුචරිතයෙන් යුක්තය, මනො සුචරිතයෙන් යුක්තය, උත්තමයින්ට නොබනින්නෝය, සත්‍යය අදහන්නෝය, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝය. ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු සුගතියවූ, ස්වර්ගලෝකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී, පහත්වූද උස්සවූද ලක්ෂණවූද අවලක්ෂණවූද සුගතියට පැමිණියාවූද දුර්ගතියට පැමිණියාවූද කර්මයලෙස පැමිණි සත්වයන් දනී.

18. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි කම්පා නොවන බවට පැමිණි කල්හි, සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය (ආශ්‍රව ක්ෂයකර ඥානය) පිණිස සිත ඉදිරිපත් කරයි, ඉදිරිපත් කොට නමයි. ඔහු මේ දුකයයි තතුලෙස දැනගනී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගනී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගනී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී, මේ පැසවන කෙලෙස් (ආශ්‍රව) යයි තතු ලෙස දැනගනී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුයයි තතු ලෙස දැනගනී, මේ ඒ කෙළෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගනී, මේ ඒ කෙළෙස් නැති කිරීමේ

මාර්ගයයි තතු ලෙස දැනගනී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශ්‍රවයන් කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවයන් කෙරෙන්ද මිදේ, අවිද්‍යා ආශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙයි. ඉපදීම නැතිවිය උතුම් හැසිරීමෙහි වසන ලදී, කටයුත්ත කරණලදී, මින්පසු වෙනත් කළයුත්තක් නැතැ'යිද දැනගනී.

"මහණෙනි, යම්සේ පර්වත මුදුනක පිරිසිදු, සිත් සතුටු කරන නොකැළඹුණු, දිය විලක් වේද, එහි ඉවුරේ ඇස් ඇති පුරුෂයෙක් සිටියේ, නැවතී තිබෙන්නාවූ සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන්ද, කැටකැබලිතිද, එහා මෙහා යන්නාවූ මසුන් රැන්ද, දක්නේද, ඔහුට මෙසේ සිතෙන්නේය: 'මේ දිය විල පිරිසිදුය, මනා සිත් ප්‍රිය කරන්නේය, නොකැළඹුණේය. එහි මේ සිප්පි බෙල්ලන් හා සක් බෙල්ලන්ද, කැටකැබලිතිද, නැවතී තිබේ. මසුන් තිබේ. මසුන් රැන් හැසිරෙත්ය' කියායි. මහණෙනි, එලෙසින්ම භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිත කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, බොහෝ කල් සිට එන ක්ලෙශයන් නැතිකිරීමේ ඥානය පිණිස සිත ඉදිරිපත් කරයි. ඉදිරිපත්කොට නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැනගණී. මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස්, යයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් හේතුයයි තතු ලෙස දැනගණී, මේ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී. මේ කෙලෙස් නැතිකිරීමේ මාර්ගයයි තතුලෙස දැනගණී. මෙසේ දන්නා ඔහුගේ සිත කාම ආශ්‍රවයන් කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවයන් කෙරෙන්ද මිදේ. අවිද්‍යා ආශ්‍රවයන් කෙරෙන්ද සිත මිදේ. මිදුනු කල්හි මිදුනේය යන සිත වෙය. ඉපදීම නැති විය, උතුම් හැසිරීමෙහි වසනලදී. කටයුත්ත කරණලදී. මින් පසු අනික් කළයුත්තක් නැතැ'යිද දැනගනී.

19. "මහණෙනි, මේ මහණ තෙම, 'සමණ' යයිද, 'බ්‍රාහ්මණ' යයිද, 'නහාතක' යයිද, 'වෙදගූ' යයිද, 'සොත්තිය' යයිද, 'ආයයී' යයිද, 'අර්හත්' යයිද, කියනු ලැබේ.

"මහණෙනි, කෙසේ මහණ තෙම "ශ්‍රමණ" නම් වේද? ලාමකවූ කෙලසීම කරන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති, ජරා, මරණ ඇතිකරන්නාවූ, අකුශල ධර්මයෝ යමෙක් විසින් සංසිඳුවන ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම ශ්‍රමණ නම් වෙයි

"මහණෙනි, මහණතෙම කෙසේ "බ්‍රාහ්මණ" නම් වේද? කෙලෙසීම කරන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ මත්තෙහි ජාති, ජරා, මරණ ඇති කරන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ යමෙකු විසින් බැහැර කරණ ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම බ්‍රාහ්මණ නම් වෙයි.

"මහණෙනි, මහණතෙම කෙසේ "නහාතක" නම් වේද? කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති, ජරා, මරණ ඇති කරන්නාවූ ලාමකවූ අකුසල ධර්මයෝ යමෙකු විසින් සෝදා හරින ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණ තෙම "නහාතක" නම් වේ.

"මහණෙනි, මහණතෙම කෙසේ "වෙදගූ" නම් වේද? කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති, ජරා, මරණ ඇතිකරන්නාවූ ලාමක අකුසල ධර්මයෝ යමෙකු විසින් (සතර මාර්ගඥානයෙන්) දන්නා ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම 'වෙදගූ' නම් වේ.

මහණෙනි, මහණතෙම කෙසේ "සොත්තිය" නම් වේද? කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති-ජරා-මරණ ඇති කරන්නාවූ

ලාමක අකුසල ධර්මයෝ යමෙකු විසින් ඉවත් කරන ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම "සොත්තිය" නම් වේ.

මහණෙනි, මහණතෙම කෙසේ "අරිය" නම් වේද? කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති-ජරා-මරණ ඇති කරන්නාවූ ලාමක අකුසල ධර්මයෝ යමෙකු විසින් දුරු කරන ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම "අරිය" නම් වේ.

මහණෙනි, මහණතෙම කෙසේ "අර්හත්" නම් වේද? කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇතිකරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති, ජරා, මරණ ඇති කරන්නාවූ ලාමක අකුසල ධර්මයෝ යමෙකු විසින් ඈත්කරන ලද්දාහු වෙත්ද, මහණෙනි, මෙසේ වනාහි මහණතෙම 'අර්හත්' නම් වෙයි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**නවවෙනිවූ මහා අස්සපුර සූත්‍රය නිමි. (4-9)**

## 40. චූල අස්සපුර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ අඟු ජනපද වාසීන්ගේ අස්සපුර නම් නියම් ගමෙහි වැඩ වාසය කරති. ඒ කල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, මහජනයා තොප ශ්‍රමණයෝය, ශ්‍රමණයෝ යයි හඳුනයි. තොපද, තොප කවරහුදැයි විචාරණ ලද්දාහු, "අපි ශ්‍රමණයෝ වෙමු"යි ප්‍රතිඥා කරන්නාහුය. මහණෙනි, මෙසේ

හඳුනනු ලබන්නාවූ, මෙසේ ප්‍රතිඥා කරන්නාවූ ඒ තොපගේ ශ්‍රමණයන්ට සුදුසුවූ යම් (සාමීචි ප්‍රතිපදාවක්) පිළිපැදීමක් වේද, ඒ ප්‍රතිපත්තිය පිළිපදින්නෙමු නම් මෙසේ අපගේ ඒ හැඳිනීමද සත්‍යවන්නේය ප්‍රතිඥාවද ඇත්තක් වන්නේය. අපි යම් කෙනෙකුන්ගේ සිව්රුය. පිණ්ඩාහාරය. සෙනාසනය, ගිලන්පසය, බෙහෙත් පිරිකරය යන මෙය වළඳමුද, අපට ඔවුන්ගේ ඒ දන්දීම්ද, මහත්ඵල වන්නාහුය. මහා ආනිසංස වන්නාහුය, අපගේද, මේ මහණකම හිස් නොවන්නේය, ඵල සහිත වන්නේය, වැඩීම් සහිත වන්නේයයි. මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුයි.

2. "මහණෙනි, මහණතෙම කෙසේ නම් ශ්‍රමණ සාමීචි ප්‍රතිපදාව පිළිපදින්නෙක් වෙයිද, මහණෙනි, අභිද්‍යා (දැඩිලොභය) බහුලවූ යම්කිසි මහණෙකුගේ දැඩි ලොභය නැති නොවූයේ වේද, ව්‍යාපාද සිත් (අනුන්ගේ විනාශය කැමති සිත්) ඇත්තහුගේ ඒ ව්‍යාපාදය, නැති නොවූයේ වේද, ක්‍රොධ කරන (කිපෙනසුළු) පුද්ගලයාගේ ඒ ක්‍රොධය නැති නොවූයේ වේද, බද්ධ වෛර ඇත්තහුගේ ඒ බද්ධ වෛරය, නැති නූවූයේ වේද, මකුගුණ ඇත්තහුගේ ඒ මකුගුණය, නැති නූවූයේ වේද, යුගග්‍රාහ (ගුණ නැතිව සිටිමින් උසස් ගුණවතුන් හා තමා සමානයයි සැලකීම) ඇත්තහුගේ ඒ යුගග්‍රාහය, නැති නූවූයේ වේද, ඊර්ෂ්‍යාව ඇත්තහුගේ ඒ ඊර්ෂ්‍යාව නැති නූවූයේ වේද, මාත්සය්‍ය්‍යය (මසුරුකම) ඇත්තහුගේ මාත්සය්‍ය්‍යය නැති නූවූයේ වේද, කෛරාටික වූවහුගේ ඒ කෛරාටික බව නැති නුවූයේ වේද, රැවටිලි ඇත්තහුගේ ඒ රැවටිල්ල නැති නුවූයේ වේද, ලාමක අදහස් ඇත්තහුගේ ඒ ලාමක අදහස් නැති නුවූයේ වේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුගේ ඒ මිථ්‍යාදෘෂ්ටිය නැති නුවූයේ වේද, මහණෙනි, මම වනාහි ශ්‍රමණයන් කිලිටි කරන ශ්‍රමණ මලයන්වූ, ශ්‍රමණයන් දූෂ්‍ය කරන ශ්‍රමණ දොෂයන්වූ ශ්‍රමණයන් සාර රහිත කරන ශ්‍රමණ කසටයන්වූ, අපායෙහි ඉපදීමට කරුණුවූ, දුගතියෙහි, විපාක විඳීමට සලසන්නාවූ, මේ දොෂයන් නැති නොකළ තැනැත්තා ශ්‍රමණ ප්‍රතිපදාවෙහි පිළිපන්නේයයි නොකියමි. මහණෙනි, යම්සේ දෙපස මුවහත් ඇති පණපොවා

මුවහත් තැබුවාවූ, මටජ නම් ආයුධ විශෙෂයක් වේද, එය දෙපොට සිවුරකින් වසන ලද්දේ මනාව වෙළන ලද්දේ වේද, මහණෙනි, මෙබඳු මහණහුගේ මහණකම සිවුරෙන් වැසූ මටජ නම් දෙපැත්ත කැපෙන ආයුධයට සමාන යයි කියමි.

3. "මහණෙනි, සඟළ සිවුරු දරන්නහුගේ සඟළ සිවුරු දැරීම් පමණින් ශ්‍රමණ වේයයි මම නොකියමි. මහණෙනි, මම අචෙලකයාගේ (වස්ත්‍ර නොඅඳින්නාගේ) අචෙලක කමින් පමණක් ශ්‍රමණ වේයයි මම නොකියමි.

4. "මහණෙනි, දූවිලි දැලි දරන්නහුගේ ඒ දූවිලි දැලි දැරීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි, (දවසට තුන් වරක් ව්‍රත පිණිස) දියට බසින්නහුගේ ඒ දියට බැසීම පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි, ගසක් මුල හිඳින්න හුගේ ඒ ගසමුල හිඳීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි මහණෙනි, අභ්‍යවකාශයෙහි (එළිමහනෙහි) සිටින්නහුගේ ඒ අභ්‍යවකාශයෙහි සිටීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි, උඩුකුරුව සිටින්නහුගේ ඒ උඩුකුරුවසිටීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි, වාර භක්තිකයාගේ (පක්ෂයකට හෝ මසකට වරක් බත් කන්නහුගේ) ඒ වාර භක්තමාත්‍රයෙන් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි, මන්ත්‍ර හදාරන්නහුගේ ඒ මන්ත්‍ර, හැදෑරීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි. මහණෙනි ජටා දරන්නහුගේ ඒ ජටා දැරීම් පමණින් ඔහු ශ්‍රමණයයි මම නොකියමි.

5. "මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති සඟල සිවුරු දරන්නාගේ ඒ සඟල සිවුරු දැරීම් පමණින් දැඩි ලොභය නැතිවන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැතිවන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැතිවන්නේ නම්, බද්ධ වෛර ඇත්තහුගේ බද්ධ වෛරය නැතිවන්නේ නම්, ගුණමකු බව ඇත්තහුගේ ගුණමකු බව නැතිවන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තහුගේ, අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේ නම්, ඊර්ෂ්‍යාව ඇත්තහුගේ ඊර්ෂ්‍යාව

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නැතිවන්නේ නම් මසුරු බව ඇත්තහුගේ මසුරු බව නැතිවන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැතිවන්නේ නම්, රැවටිලි ඇත්තහුගේ රැවටිලි ගතිය නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තහුගේ ලාමක අදහස් නැතිවන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුගේ මිථ්‍යාදෘෂ්ටිය නැතිවන්නේ නම්, අඳුනන මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඔහු උපන් කෙනෙහිම සිවුරු දරන්නෙකු කරන්නාහුය. සිවුරු දැරීමෙහි සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත මෙහි එව, නුඹ සඟල සිවුරු දරන්නෙක් වෙව, සඟල සිවුරු දරන්නාවූම දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය පහවන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත පහවන්නේය. ක්‍රොධ සිත් ඇති නුඹගේ ක්‍රොධ සිත පහවන්නේය. බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධවෛරය පහවන්නේය. ගුණමකු බව ඇති නුඹගේ ගුණමකු බව පහවන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය පහවන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව පහවන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව පහවන්නේය. කෛරාටික බව ඇති නුඹගේ කෛරාටික බව පහවන්නේය. රැවටිලි ඇති නුඹගේ රැවටිලි බව පහවන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් පහවන්නේය. මිථ්‍යාදෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යා දෘෂ්ටිය පහවන්නේය. (කියායි.)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ, සඟළ සිවුරු දරන්නෙකු දකිම්ද, එහෙයින් මම සඟළ සිවුරු දරන්නෙකුගේ සඟළ සිවුර දැරීම් පමණින් ඔහු ශ්‍රමණයයි නොකියමි.

**6.** "මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති අචෙලකයාගේ (වස්ත්‍ර නැතිව තපස් කරන්නාගේ) ඒ අචෙලක

බවෙන්ම දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැතිවන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැතිවන්නේ නම්, බද්ධ වෛර ඇත්තහුගේ බද්ධ වෛරය නැතිවන්නේ නම්, ගුණමකු බව ඇත්තාගේ ගුණමකු බව නැතිවන්නේ නම්, අනුන්ගේ දොස් සොයන තැනැත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේ නම්, ඊර්ෂ්‍යා ඇත්තාගේ ඊර්ෂ්‍යාව නැතිවන්නේ නම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැතිවන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැතිවන්නේ නම්, රැවටිලි ඇත්තාගේ රැවටිලි ඇති බව නැතිවන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැතිවන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැතිවන්නේ නම්, අඳුනන මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඔහු උපන් කෙණෙහිම අචෙලකයෙකු කරන්නාහුය. අචෙලක බවෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ අචෙලකයෙක් වෙව. අචෙලක වූ විට දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැතිවන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැතිවන්නේය. ක්‍රොධ සිත් ඇති නුඹගේ ක්‍රොධ සිත නැතිවන්නේය. බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධ වෛරය නැතිවන්නේය. ගුණ මකු බව ඇති නුඹගේ ගුණමකු බව නැතිවන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව නැතිවන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව නැතිවන්නේය, කෛරාටික බව ඇති නුඹගේ කෛරාටික බව නැතිවන්නේය. රැවටිලි බව ඇති නුඹගේ රැවටිලි බව නැතිවන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැතිවන්නේය. මිථ්‍යාදෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය (කියාය.)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටික වූ රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ

අචෙලකයෙකු දකිම්ද, එහෙයින් අචෙලකයෙකු අචෙලක වත දැරූ පමණින් ශ්‍රමණයයි නොකියමි.

7. "මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති දූවිලි දැලි දරන්නාගේ ඒ දූවිලි දැලි දැරීම් පමණින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැතිවන්නේ නම්, බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැතිවන්නේ නම්, ගුණමකු බව ඇත්තාගේ ගුණමකු බව නැතිවන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේ නම්, ඊෂ්‍යාව ඇත්තාගේ ඊෂ්‍යාව නැතිවන්නේ නම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේ නම්, රැවටිලි ඇත්තාගේ රැවටිලි ගතිය නැතිවන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැතිවන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැතිවන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද ඔහු උපන් කෙණෙහිම දූවිලි දැලි දරන්නෙකු කරන්නාහුය. දූවිලි දැලි දරන බවෙහිම සමාදන් කරවන්නාහුය (කෙසේද?) යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ දූවිලි දැලි දරන්නෙක් වෙව. දූවිලි දැලි දරන්නාවූම දැඩි ලෝභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධ සිත් ඇති නුඹගේ ක්‍රොධ සිත නැති වන්නේය. බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණ මකු බව ඇති නුඹගේ ගුණමකු බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊෂ්‍යාව ඇති නුඹගේ ඊෂ්‍යාව නැති වන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛයිරාටික බව ඇති නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය' (කියායි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාවූ, දූවිලි දැලි දරන්නෙකු දකිම්ද, එහෙයින් දූවිලි දැලි දරන්නෙකුගේ ඒ දූවිලි දැලි දැරීම් පමණින් ඔහු 'ශ්‍රමණ' යයි නොකියමි.

8. "මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති (ශුද්ධිය පිණිස) දියට බසින්නාගේ ඒ දියට බැසීම් පමණින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධ සිත නැති වන්නේනම්, බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැතිවන්නේ නම්, ගුණමකු බව ඇත්තාගේ ගුණමකු බව නැති වන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගති නැති වන්නේ නම්, ඊෂ්‍යාව ඇත්තාගේ ඊෂ්‍යාව නැති වන්නේ නම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේ නම්, රැවටිලි ඇත්තාගේ රැවටිලි ගතිය නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඔහු උපන් කෙණෙහිම දියට බැසීමේ වත ඇත්තෙකු කරන්නාහුය. දියට බසින වතෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ දියට බසින වත ඇත්තෙක් වෙව, දියට බසින වත ඇත්තාවූම දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධය ඇති නුඹගේ ක්‍රොධය නැති වන්නේය. බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණමකු බව ඇති නුඹගේ ගුණමකු බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊෂ්‍යාව ඇති නුඹගේ ඊෂ්‍යාව නැතිවන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව

නැති වන්නේය. කෛරාටික බව ඇති නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටිය ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය' (කියාය.)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ, (ශුද්ධිය පිණිස) දියට බසින වත ඇත්තෙකු දකිම්ද, එහෙයින් දියට බසින වත ඇත්තෙකුගේ දියට බසින වත ඇති පමණින් ඔහු 'ශ්‍රමණ'යයි මම නොකියමි

**9.** "මහණෙනි, දැඩි ලොභය බහුලකොට ඇති රුක් මුල හිඳින්නාගේ ඒ රුක් මුල හිඳීම් පමණින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැති වන්නේ නම් බද්ධවෛර ඇත්තාගේ බද්ධවෛරය නැති වන්නේ නම්, ඊෂ්‍යාව ඇත්තාගේ ඊෂ්‍යාව නැති වන්නේ නම්, මසුරුබව ඇත්තාගේ මසුරුබව නැතිවන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේ නම්, රැවටිලි ගතිය ඇත්තහුගේ රැවටිලි ගතිය නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඔහු උපන් කෙනෙහිම රුක් මුල හිඳීමේ වත ඇත්තෙකු කරන්නාහුය. රුක් මුල හිඳීමේ වතෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ රුක් මුල හිඳීමේ වත ඇත්තෙක් වෙව. රුක් මුල හිඳීමේ වත දරන්නාවූ ම දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය, නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය.

"මහණෙනි, යම් හේතුවකින් දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ සිත් ඇත්තාවූ, බද්ධ වෛර ඇත්තාවූ,

අනුන්ගේ දොස් සොයන්නාවූ, ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටිවූ රුක්මුල හිඳින වත ඇත්තෙකු දකිම්ද, එහෙයින් රුක්මුල හිඳින වත ඇත්තෙකුගේ ඒ රුක්මුල හිඳීම් පමණකින් ඔහු 'ශ්‍රමණ'යයි නොකියමි.

10. "මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති අභ්‍යවකාශයෙහි සිටින්නාගේ (එළිමහණෙහි සිටින්නාගේ) ඒ අභ්‍යවකාශයෙහි සිටීම් පමණකින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැතිවන්නේ නම් බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැතිවන්නේ නම්, ගුණමකු බව ඇත්තාගේ ගුණමකු බව නැතිවන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේ නම්, ඊර්ෂ්‍යාව ඇත්තාගේ ඊර්ෂ්‍යාව නැතිවන්නේ නම් කෛරාටික වූවහුගේ කෛරාටික බව නැතිවන්නේ නම් රැවටිලි ගතිය ඇත්තාගේ රැවටිලි ගතිය නැතිවන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැතිවන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටිය ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැතිවන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද ඔහු උපන් කෙනෙහිම එළිමහෙණහි සිටීමේ වත ඇත්තෙකු කරන්නාහුය. එළිමහනෙහි සිටීමේ වතෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) 'යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ එළිමනෙහි සිටීමේ වත ඇත්තෙක් වෙව. එළිමහනෙහි සිටීමේ වත ඇත්තාවූම දැඩි ලොභය බහුලවූ නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධය ඇති නුඹගේ ක්‍රොධය නැති වන්නේය. බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණමකු බව ඇති නුඹගේ ගුණමකු බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව නැති වන්නේය. මසුරුබව ඇති නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛරාටිකබව ඇති නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති

වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යා දෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යා දෘෂ්ටිය නැති වන්නේය" (කියාය)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ කරන්නාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණ මකුවූ අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාවූ එළිමහනෙහි සිටීමේ වත ඇත්තෙකු දකිම්ද, එහෙයින් එළිමහනෙහි සිටීමේ වත ඇත්තෙකු ඒ එළිමහනෙහි සිටීමේ වත දැරූ පමණින් ඔහු 'ශ්‍රමණ'යයි නොකියමි.

11. "මහණෙනි, දැඩි ලොභය බහුලකොට ඇති, උඩුකුරුව සිටින්නාගේ ඒ උඩුකුරුව සිටීම් පමණින් දැඩි ලොභය නැති වන්නේනම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේනම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැති වන්නේනම්, බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැති වන්නේනම්, ගුණමකු වූවහුගේ ගුණමකු බව නැති වන්නේනම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේනම් ඊෂ්‍යාව ඇත්තාගේ ඊෂ්‍යාව නැති වන්නේනම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේනම් රැවටිලි ගතිය ඇත්තාගේ රැවටිලි ගතිය නැති වන්නේනම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම් මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැතිවන්නේ නම් ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද, ඔහු උපන් කෙනෙහිම උඩුකුරුව සිටීමේ වත ඇත්තෙකු කරන්නාහුය. උඩුකුරුව සිටීමෙහි සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත, මෙහි එව, නුඹ උඩුකුරුව සිටින වත ඇත්තෙක් වෙව, උඩුකුරුව සිටින්නාවූම දැඩි ලොභ බහුල නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධ කරන නුඹගේ ක්‍රොධය නැති වන්නේය. බද්ධ වෛර ඇති නුඹගේ බද්ධ වෛරය නැතිවන්නේය ගුණමකු බව ඇති නුඹගේ ගුණමකු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව නැති වන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛරාටිකවූ නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටිය ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය' (කියාය.)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ කරන්නාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාවූ උඩු කුරුව සිටීමේ වත ඇත්තෙකු දකිම්ද, එහෙයින් උඩුකුරුව සිටින්නෙකුගේ උඩු කුරුව සිටීම් පමණින් ඔහු 'ශ්‍රමණ'යයි නොකියමි.

12. "මහණෙනි, දැඩි ලොභය බහුලකොට ඇති නියමිත වාරයන්හි පමණක් ආහාර ගන්නා වත දරන්නාගේ ඒ වාර භත්තික වත දැරීම් පමණින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැති වන්නේ නම්, බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැති වන්නේ නම්, ගුණමකු වූවහුගේ ගුණමකු බව නැති වන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේනම්, ඊර්ෂ්‍යාව ඇත්තාගේ ඊර්ෂ්‍යාව නැති වන්නේ නම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේ නම්, රැවටිලි ගති ඇත්තාගේ රැවටිලි ගතිය නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද ඔහු උපන් කෙනෙහිම වාර භත්තික වත ඇත්තෙකු කරන්නාහුය.

වාර භත්තික වතෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) ‘යහපත් තැනැත්ත, එව, නුඹ වාර භත්තික වත දරන්නෙක් වෙව, වාර භත්තික වත දරන්නාවූම දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධ කරන නුඹගේ ක්‍රොධය නැති වන්නේය බද්ධ වෛරය ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණමකුවූ නුඹගේ ගුණමකු බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව නැති වන්නේය. මසුරු බව ඇති නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛරාටික බව ඇති නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය.’ (කියාය)

“මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ කරන්නාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යා දෘෂ්ටිවූ වාර භත්තික වත දරන්නෙකු දකිම්ද, එහෙයින් වාර භත්තික වත දරන්නාගේ ඒ වාර භත්තික වත දැරීම් පමණින් ‘ශ්‍රමණ’යයි නොකියමි.

13. “මහණෙනි, දැඩි ලොභය බහුල කොට ඇති මන්ත්‍ර හදාරන්නාගේ ඒ මන්ත්‍රහැදෑරීම් පමණින් දැඩි ලොභය නැති වන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම්, ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැති වන්නේ නම් බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැති වන්නේ නම් ගුණමකු බව ඇත්තාගේ ගුණමකු බව නැති වන්නේ නම්, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේ නම්, ඊර්ෂ්‍යාව ඇත්තාගේ ඊර්ෂ්‍යාව නැති වන්නේ නම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති

වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික ගතිය නැති වන්නේ නම්, රැවටිලි ගති ඇත්තාගේ රැවටිලි ගතිය නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටිය ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද ඔහු උපන් කෙනෙහිම මන්ත්‍ර ඉගෙන ගන්නෙකු කරන්නාහුය. මන්ත්‍ර ඉගෙණීමෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) 'යහපත් තැනැත්ත, මෙහි එව නුඹ මන්ත්‍ර හදාරන්නෙක් වෙව, මන්ත්‍ර හදාරන්නාවූම දැඩි ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැති වන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධ සිත් ඇති නුඹගේ ක්‍රොධය නැති වන්නේය. බද්ධ වෛර ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණමකුවූ නුඹගේ ගුණමකු බව නැති වන්නේය. අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැතිවන්නේය. ඊෂ්‍යීාව ඇති නුඹගේ ඊෂ්‍යීාව නැති වන්නේය. මසුරුවූ නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛරාටිකවූ නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය පහවන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටි ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය' (කියාය)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ කරන්නාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකු බව ඇත්තාවූ, අනුන්ගේ දොස් සොයන ගති ඇත්තාවූ, ඊෂ්‍යීා කරන්නාවූ මසුරුවූ, කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටි වූ මන්ත්‍ර හදාරන්නෙකු දකිම්ද, එහෙයින් මන්ත්‍ර හදාරන්නෙකුගේ ඒ මන්ත්‍ර හැදෑරීම් පමණින් ඔහු 'ශ්‍රමණ'යයි නොකියමි.

14. "මහණෙනි, දැඩි ලොභය බහුලකොට ඇති ජටා දරන්නාගේ (ජටිලයාගේ) ඒ ජටා දැරීම් පමණින් දැඩි ලොභය නැතිවන්නේ නම්, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාද සිත නැති වන්නේ නම් ක්‍රොධ කරන්නාගේ ක්‍රොධය නැති වන්නේ නම්, ගුණමකු වූවහුගේ ගුණමකුබව නැති වන්නේනම්, අනුන්ගේ

දොස් සොයන ගති ඇත්තාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේනම්, ඊර්ෂ්‍යා කරන්නහුගේ ඊර්ෂ්‍යාව නැති වන්නේනම්, මසුරු බව ඇත්තාගේ මසුරු බව නැති වන්නේ නම්, කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වන්නේ නම් රැවටිලි ගති ඇත්තාගේ රැවටිලි ගති නැති වන්නේ නම්, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වන්නේ නම්, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේ නම්, ඔහුගේ අඳුනන මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඔහු උපන් කෙණෙහිම ජටා දරන වත ඇත්තෙකු කරන්නාහුය. ජටා දරන වතෙහිම සමාදන් කරවන්නාහුය. (කෙසේද?) යහපත් තැනැත්ත මෙහි එව, නුඹ ජටා දරන්නෙක් වෙව. ජටා දරන්නාවූම ලොභ බහුලවූ නුඹගේ දැඩි ලොභය නැතිවන්නේය. ව්‍යාපාද සිත් ඇති නුඹගේ ව්‍යාපාද සිත නැති වන්නේය. ක්‍රොධ සිත් ඇති නුඹගේ ක්‍රොධය නැති වන්නේය. බද්ධ වෛර ඇති නුඹගේ බද්ධ වෛරය නැති වන්නේය. ගුණමකුවූ නුඹගේ ගුණමකු බව නැති වන්නේය අනුන්ගේ දොස් සොයන ගති ඇති නුඹගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වන්නේය. ඊර්ෂ්‍යාව ඇති නුඹගේ ඊර්ෂ්‍යාව නැති වන්නේය. මසුරුවූ නුඹගේ මසුරු බව නැති වන්නේය. කෛරාටිකවූ නුඹගේ කෛරාටික බව නැති වන්නේය. රැවටිලි ගති ඇති නුඹගේ රැවටිලි ගතිය නැති වන්නේය. මිථ්‍යාදෘෂ්ටිය ඇති නුඹගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වන්නේය. ලාමක අදහස් ඇති නුඹගේ ලාමක අදහස් නැති වන්නේය' (කියාය)

"මහණෙනි, යම් හේතුවකින් මේ ලොකයෙහි දැඩි ලොභ බහුලවූ, ව්‍යාපාද සිත් ඇත්තාවූ, ක්‍රොධ කරන්නාවූ, බද්ධ වෛර ඇත්තාවූ, ගුණමකුවූ, අනුන්ගේ දොස් සොයන්නාවූ, ඊර්ෂ්‍යා කරන්නාවූ, මසුරුවූ කෛරාටිකවූ, රැවටිලි සහිතවූ, ලාමක අදහස් ඇත්තාවූ, මිථ්‍යාදෘෂ්ටිවූ ජටා දරන්නෙකු දකිම්ද, එහෙයින් ජටා දරන්නෙකුගේ ඒ ජටා දැරීම් පමණින් 'ශ්‍රමණ'යයි නො කියමි.

15. "මහණෙනි, මහණ තෙම කෙසේනම් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේ වෙයිද, මහණෙනි, දැඩි ලොභ බහුලවූ යම්කිසි මහණෙකුගේ දැඩි ලොභය නැති වූයේ වේද, ව්‍යාපාද සිත් ඇත්තාගේ ව්‍යාපාදය නැති වූයේ වේද, ක්‍රොධ

කරන්නාගේ ක්‍රොධය නැතිවූයේ වේද, බද්ධ වෛර ඇත්තාගේ බද්ධ වෛරය නැති වූයේ වේද, ගුණමකු වූවහුගේ ගුණමකු බව නැතිවූයේ වේද, අනුන්ගේ දොස් සොයන්නාගේ අනුන්ගේ දොස් සොයන ගතිය නැති වූයේ වේද, ඊර්ෂ්‍යා ඇත්තාගේ ඊර්ෂ්‍යාව නැතිවූයේ වේද, මසුරු වූවහුගේ මසුරු බව නැති වූයේ වේද. කෛරාටික වූවහුගේ කෛරාටික බව නැති වූයේ වේද, රැවටිලි සහිත වූවහුගේ රැවටිලි බව නැති වූයේ වේද, ලාමක අදහස් ඇත්තාගේ ලාමක අදහස් නැති වූයේ වේද, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාගේ මිථ්‍යාදෘෂ්ටිය නැති වූයේ වේද, මහණෙනි, මම ශ්‍රමණ මලවූ, ශ්‍රමණ දොෂයන්වූ, ශ්‍රමණ කසටයන්වූ, අපායෙහි ඉපදීමට කරුණුවූ, දුගතියෙහි විපාක දෙන්නාවූ මේ දොෂයන් නැති කිරීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි.

**16.** "හෙතෙම ලාමකවූ මේ සියලු අකුශල ධර්මයන් ගෙන් පිරිසිදුවූ තමා දකියි, මිදුනාවූ තමා දකියි, ලාමකවූ මේ සියලු අකුශල ධර්මයන්ගෙන් පිරිසිදුවූ තමා දකින, මිදුනාවූ තමා දකින ඔහුට සතුට ඇති වෙයි. සතුටු වූවහුට ප්‍රීතිය හටගණී. ප්‍රීති සිත් ඇත්තහුගේ කය සංසිඳෙයි, සංසිඳුණ කය ඇත්තේ සැපය විඳියි. සැප ඇත්තහුගේ සිත සමාධිගත වෙයි. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවැනි දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස යන සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ, සියලු ලොකය මහත් බවට පැමිණි, අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ යට සරස සියලු තන්හි, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත් බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතවරන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දිශාවද මෙසේ උඩ යට සරස යන සියලු තන්හි, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත් බවට පැමිණි අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

"උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ යට සරස යන සියලු තන්හි, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත් බවට පැමිණි අප්‍රමාණවූ වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි.

17. "මහණෙනි, පැහැදිලි ජලය ඇති, සැපදායක ජලය ඇති, සිහිල් ජලය ඇති, සුදු වැලිතලා ඇති යහපත් කොටු ඇති, සිත්කලුවූ, පොකුණක් වේද, නැගෙනහිර දිශාවෙන්ද, ග්‍රීෂ්මයෙන් තැවුණු, ග්‍රීෂ්මයෙන් පීඩිතවූ, ක්ලාන්තවූ, තැති ගත්තාවූ, පිපාසය හටගත්තාවූ, පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ පොකුණට පැමිණ දිය පිපාසය දුරු කර ගන්නේද, ග්‍රීෂ්ම දාහය දුරු කර ගන්නේද, බස්නාහිර දිශාවෙන්ද ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ, ක්ලාන්තවූ, තැති ගත්තාවූ, පිපාසය හටගත්තාවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ පොකුණට පැමිණ දිය පිපාසය දුරු කර ගන්නේද, ග්‍රීෂ්ම දැවිල්ල දුරු කර ගන්නේද, උතුරු දිශාවෙන්ද ග්‍රීෂ්මයෙන් තැවුණාවූ, ග්‍රීෂ්මයෙන් පීඩිතවූ ක්ලාන්තවූ, තැති ගත්තාවූ, පිපාසය හටගත්තාවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ පොකුණට පැමිණ දිය පිපාසය දුරු කර ගන්නේද, ග්‍රීෂ්ම දැවිල්ල දුරු කර ගන්නේද, දකුණු දිශාවෙන්ද ග්‍රීෂ්මයෙන් තැවුණාවූ, ග්‍රීෂ්මයෙන් පීඩිතවූ, ක්ලාන්තවූ, තැතිගත්තාවූ, පිපාසය හටගත්තාවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ පොකුණට පැමිණ දිය පිපාසය දුරු කර ගන්නේද, ග්‍රීෂ්ම දැවිල්ල දුරු කර ගන්නේද,

"යම්කිසි දිශාවකින් වුවද ග්‍රීෂ්මයෙන් තැවුනාවූ ග්‍රීෂ්මයෙන් පීඩිතවූ, ක්ලාන්තවූ, තැති ගත්තාවූ, පිපාසය හට ගත්තාවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඒ පොකුණට පැමිණ දිය පිපාසය දුරු කර ගන්නේද, ග්‍රීෂ්ම දැවිල්ල දුරු කරගන්නේද,

18. "මහණෙනි, එපරිද්දෙන්ම ක්ෂත්‍රිය කුලයෙන්ද, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද තථාගතයන් වහන්සේ වදාළ ධර්මවිනය නම්වූ ශාසනයට පැමිණ මෙසේ මෛත්‍රියද, කරුණාවද, මුදිතාවද, උපෙක්ෂාවද වඩයි. තමා තුළ සංසිඳීම ලබයි. තමා තුළ සංසිඳීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි. බ්‍රාහ්මණ කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද තථාගතයන් වහන්සේ වදාළ ධර්මවිනය නම්වූ ශාසනයට පැමිණ මෙසේ මෛත්‍රියද, කරුණාවද, මුදිතාවද, උපෙක්ෂාවද වඩයි. තමා තුළ සංසිඳීම ලබයි. තමා තුළ සංසිඳීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි

"වෛශ්‍ය කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද තථාගතයන් වහන්සේ වදාළ ධර්ම විනය නම්වූ ශාසනයට පැමිණ මෙසේ මෛත්‍රියද, කරුණාවද, මුදිතාවද, උපෙක්ෂාවද වඩයි. තමා තුළ සංසිඳීම ලබයි. තමා තුළ සංසිඳීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි.

"ක්ෂුද්‍ර කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද තථාගතයන් වහන්සේ වදාළ ධර්මවිනය නම්වූ ශාසනයට පැමිණ මෙසේ මෛත්‍රියද, කරුණාවද, මුදිතාවද, උපෙක්ෂාවද වඩයි. තමා තුළ සංසිඳීම ලබයි. තමා තුළ සංසිඳීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි.

"යම් යම් කුලයකින්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද තථාගතයන් වහන්සේ වදාළ ධර්මවිනය නම්වූ ශාසනයට පැමිණ මෙසේ මෛත්‍රියද, කරුණාවද මුදිතාවද, උපෙක්ෂාවද වඩයි, තමා තුළ සංසිඳීම ලබයි. තමා තුළ සංසිඳීමෙන් ශ්‍රමණයන් පිළිබඳ නිවැරදි පිළිපැදීමට පිළිපන්නේයයි කියමි.

"ක්ෂත්‍රිය කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන්, කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද මේ

ආත්මයෙහි තමාම උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයි. ආශ්‍රවයන් නැති කිරීමෙන් ‘ශ්‍රමණ’ වෙයි.

“බ්‍රාහ්මණ කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, හෙතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන්, කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද මේ ආත්මයෙහි තමාම උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් ‘ශ්‍රමණ’ වෙයි.

“වෛශ්‍ය කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද? හෙතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද මේ ආත්මයෙහි තමාම උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි, ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් ‘ශ්‍රමණ’ වෙයි.

“ක්ෂුද්‍ර කුලයෙන්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද? හෙතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන්, කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියද, ප්‍රඥා විමුක්තියද මේ ආත්මයෙහි තමාම උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් ‘ශ්‍රමණ’ වෙයි.

“යම් යම් කුලයකින්ද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. හෙතෙමේද ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියද, ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහි තමාම උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරයි. ආශ්‍රවයන් (කෙලෙස්) නැති කිරීමෙන් ‘ශ්‍රමණ’ වෙයි.”

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට විශෙෂයෙන් සතුටු වූහ.

**දසවෙනිවූ චූල අස්සපුර සූත්‍රය නිමි. (4-10)**

(චූලගොසිංග සූත්‍රය, මහාගොසිංග සූත්‍රය, මහාගොපාලක සූත්‍රය, චූල ගොපාලක සූත්‍රය, චූල සච්චක සූත්‍රය, මහාසච්චක සූත්‍රය, චූල තණ්හා සංඛය සූත්‍රය, මහා තණ්හා සංඛය සූත්‍රය, මහා අස්සපුර සූත්‍රය, චූල අස්සපුර සූත්‍රය යන සූත්‍ර දසයවූ)

**සතර වෙනිවූ මහා යමක වර්ගය නිමි.**

## 41. සාලෙය්‍යක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ මහා භික්ෂු සංඝයා සමග කෙසොල් ජනපදයෙහි හැසිරෙන සේක් කොසලයන්ගේ සාල නම් බමුණු ගම යම් තැනෙක්හිද එහි වැඩියහ. සාල ගම්වැසිවූ බ්‍රාහ්මණ ගෘහපතියෝ ‘ශාක්‍ය පුත්‍රවූ, ශාක්‍ය වංශයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතමතෙමේ මහත් භික්ෂු සමූහයා කැටිව කොසොල් දනව්වෙහි හැසිරෙනසේක් සාල නම් ගමට පැමිණියහ’යි ඇසුවාහුය. ඒ භවත් ගෞතමයින්ගේ මෙබඳුවූ යහපත්වූ කීර්ති ශබ්දයක් උස්ව නැංගේ වෙයි.

“ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ, සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තයහ, යහපත් ගති ඇත්තාහ. සියලු ලොකයන් දන්නාහ. ශ්‍රෙෂ්ඨයහ. හික්මවිය යුතු පුරුෂයන් හික්මවීමෙහි රියැදුරෙකු වැනියහ. දෙවි මිනිසුන්ට ශාස්තෘහ, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබොධ කළහ. භාග්‍යවත්හ. ඒ තථාගතයන්වහන්සේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා තමන් උසස් ඥාණයෙන් දැන පැහැදිලිකොට ප්‍රකාශ කරන්නාහ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ අර්ථ සහිතවූ, බ්‍යංජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ ශාසන මාර්ග බ්‍රහ්මචරියාව ගෙන හැර දක්වති. එබඳුවූ රහතුන්ගේ දැකුම යහපත්ය” (කියායි) ඉක්බිති සාලගම් වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නාහුය. ඇතැම්හු

භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එක පැත්තක උන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සිටින දිශාවට ඇඳිලි බැඳ වැඳ එක පැත්තක උන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි (තමන්ගේ) නාම ගොත්‍ර කියා එක පැත්තක උන්නාහුය. ඇතැම්හු නිශ්ශබ්දවම එක පැත්තක උන්නාහුය. එක පැත්තක හුන්නාවූම, සාලගම් වාසීවූ බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය.

"භවත් ගෞතමයාණෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ, නපුරු ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපදිති. ඊට හේතුව කුමක්ද? ඊට ප්‍රත්‍යය කවරේද?

"භවත් ගෞතමයාණෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍ය ලොකයෙහි උපදිති. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?"

**2.** "ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ අධාර්මික හැසිරීමයැයි කියන විෂම හැසිරීම හේතුකොටගෙන කය බිඳීමෙන් මරණින් මතු අපාය නම්වූ නපුරුගති ඇති නරකයෙහි උපදිත්. ගෘහපතියෙනි, මේ ලොකයෙහි ධාර්මික හැසිරීම යැයි කියන සමචර්‍ය්‍යාව හෙතුකොටගෙන ඇතැම් සත්ත්වයෝ කාය භෙදයෙන් මරණින් මතු සුගති නම්වූ දිව්‍ය ලොකයෙහි උපදිත්."

"අපි භවත් ගෞතමයින්ගේ සංක්ෂෙපයෙන් කියන ලද්දාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද්දාවූ, මේ ධර්මයෙහි විස්තර වසයෙන් අර්ථය නොදනිමු. යම්සේ අපි භවත් ගෞතමයින්ගේ කොටින් දෙශනා කරන ලද්දාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද්දාවූ, මේ ධර්මය විස්තර වශයෙන් දැන ගන්නෙමුද, භවත් ගෞතමතෙම එසේ ධර්මය දෙශනා කරන සේක්වා." "ගෘහපතියෙනි, එසේවීනම් අසව්. මනාකොට සිත්හි තබා ගනිව්. කියන්නෙමි" "එසේය පින්වතුන්

වහන්ස"යි සාලෙය්‍යක බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

3. "ගෘහපතියෙනි, තුන් පරිද්දෙකින් කයින් අධම පැවතුම් විෂම පැවතුම් වෙයි. වචනයෙන් සතර ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වෙයි. සිතින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වෙයි. ගෘහපතියෙනි, කෙසේ කයින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වේද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් රෞද්‍ර වූයේ, ලෙයින් තෙමුණු අත් ඇත්තේ, අන්‍යයන් පෙළීමෙහි, නැසීමෙහි යෙදුනේ, සත්ත්වයන් කෙරෙහි දයාවක් නැතිව ප්‍රාණඝාත කරන්නේ වෙයිද, සොරකම් කරන්නේ වෙයිද, ගමෙහිද, ආරණ්‍යයෙහිද, අන්සතු යමක් වේද, එය සොර සිතින් පැහැර ගන්නේ වෙයිද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයිද, මව විසින් රක්නා ලද්දාවූද, පියා විසින් රක්නා ලද්දාවූද, මව් පියන් විසින් රක්නා ලද්දාවූද, සොහොයුරා විසින් රක්නා ලද්දාවූද, සොහොයුරිය විසින් රක්නා ලද්දාවූද, නෑයන් විසින් රක්නා ලද්දාවූද, ගොත්‍රයෙන් රකින ලද්දාවූද, කුල චාරිත්‍ර ධර්මයෙන් රකින ලද්දාවූද, හිමියන් සහිතවූද, (අසුවල් ස්ත්‍රිය වෙත ගියහොත් දඩයයි නියම කරනලද) දඬුවම් සහිතවූද, යටත්පිරිසෙයින් (මැය මගේ භාර්‍ය්‍යාව වන්නීයයි පිරිමියෙකු විසින්) මල්දමක් දමනු ලැබුවාවූද, යම් ඒ ස්ත්‍රීහු වෙත්ද, එබඳු ස්ත්‍රීන් සමග හැසිරීමට පැමිණියේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වනාහි කයින් සිදුවන්නාවූ අධර්ම පැවතුම් විෂම පැවතුම් තුන් ආකාර වෙයි.

4. "ගෘහපතියෙනි, කෙසේ නම් වචනයෙන් අධර්ම පැවතුම් විෂම පැවතුම් සතර ආකාර වෙයිද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් බොරු කියන්නේ වෙයිද, සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සමූහයා මැදට ගියේ හෝ රාජකුලයා මැදට ගියේ හෝ 'පින්වත් පුරුෂය, මෙහි එව යමක් දන්නෙහි නම් එය කියව'යි ඉදිරියට පමුණුවන ලද්දේ සාක්ෂි අසන ලද්දේ නොදැන හෝ දනිමියි කියයි. දැන හෝ නොදනිමියි කියායි. දැක හෝ

නුදුටුයෙමියි කියයි. නොදැක හෝ දුටුවෙමියි කියායි. මෙසේ තමා නිසා හෝ අන්‍යයන් නිසා හෝ කිසියම් ලාභයක් නිසා හෝ දැන දැන බොරු කියන්නේ වෙයි. කේලම් කියන්නේ වෙයි. මෙතැනින් අසා මොවුන් බිඳුවනු පිණිස අසුවල්තැන කියන්නේය. අසුවල් තැනින් හෝ අසා අසුවලුන් බිඳුවනු පිණිස මොවුන්ට කියන්නේය. මෙසේ සමගි වූවන් බිඳින්නේ හෝ වෙයි, බිඳුනවුන්හට අනුබල දෙන්නේ හෝ වෙයි. භෙදවීමෙහි ඇලුණේ, භෙද කිරීමෙහි සතුටු වන්නේ, භෙදකරන වචන කියන්නේ වෙයි, ඵරුෂ වචන කියන්නේ වෙයි. යම් ඒ වචනයක් ගැටීම් ගැරහීමාදීන් දොෂ සහිතද, කුණු සැරව වැහෙන්නාක් මෙන් අප්‍රියද, අන්‍යයන්ගේ සිත් නරක් කරන්නේද, අන්‍යයන්හට පහරක් වැනිද ක්‍රොධයට කිට්ටුද, සමාධිය පිණිස නොපවතීද, එබඳු වචන කියන්නේ වෙයි. සම්ඵප්‍රලාප (හිස් වචන) කියන්නේ වෙයිද, නුසුදුසු කාලයෙහි කියන්නේද, නුවූවක් කියන්නේ වෙයිද, අනර්ථයක් කියන්නේ වෙයිද, අධර්මයක් කියන්නේ වෙයිද, අවිනයක් කියන්නේ වෙයිද, සිතෙහි තබා ගැනීමට නුසුදුසු වචන කියන්නේ වෙයිද, නුසුදුසු කාලයෙහි, නිදර්ශන දැක්වීම් ආදියක් නැතිව අගක් මුලක් නැති, අවැඩින් යුක්තවූ වචන කියන්නේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වචනයෙන් සතර ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වෙයි.

5. "ගෘහපතියෙනි, කෙසේ සිතින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වේද ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් දැඩි ලොභ ඇත්තේ වෙයිද, යම් ඒ අනුන්ගේ වස්තුවක් වේද, එය අධික ලොභයෙන් බලන්නේද, අනුන්ට අයිති යමක් වේද, 'අනේ එය මට වන්නේ නම් ඉතා යෙහෙකැ'යි (අධික ලොභයෙන්) සිතයිද, මේ සත්ත්වයෝ නැසෙත්වා, විනාශ වෙත්වා, සිඳෙත්වා, නැතිවී යෙත්වායි ව්‍යාපාද සිත් ඇත්තේ, නපුරු අදහස් ඇත්තේ වෙයිද, විපරීත දැකීම් ඇති මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයිද, දෙන ලද්දෙහි විපාක නැත, දුන් දෙයෙහි ඵල නැත, පිදූ දෙයෙහි විපාකය නැත, කුශලාකුශල කර්මයන්ගේ ඵලයද විපාකයද නැත, මෙලොවක් නැත, පරලොවක් නැත. මව් කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක නැත.

පියා කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක නැත. මැරී උපදින සත්ත්වයෝ නැත. යහපත් මාර්ගයෙහි ගියාවූ යහපත්ව පිළිපදින්නාවූ යම් කෙනෙක් මේ ලෝකයද පරලොකයද තුමූ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරත්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතැයි ගනිත්ද, ගෘහපතියෙනි, මෙසේ තුන් ආකාරයකින් සිතින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වෙයි. ගෘහපතියෙනි, මෙසේ අධර්ම පැවතුම් විෂම පැවතුම් හෙතුකොටගෙන ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, නපුරු වැටීමක් ඇති නිරයෙහි උපදිති.

**6.** "ගෘහපතියෙනි, තුන් ආකාරයකින් කයින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. සතර ආකාරයකින් වචනයෙන් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. තුන් ආකාරයකින් සිතින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. ගෘහපතියෙනි, කෙසේ නම් තුන් ආකාරයකින් කයින් ධර්මපැවතුම් සමපැවතුම් වෙයිද? ගෘහපතියනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීම හැර සතුන් මැරීමෙන් වැළකුනේ බහා තැබූ දඬු ඇත්තේ, බහා තැබූ ආයුධ ඇත්තේ ලජ්ජා ඇත්තේ කරුණාවත් බවට පැමිණියේ සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වෙසෙයිද, නුදුන්දෙය ගැනීම අත්හැර නුදුන් දෙය ගැනීමෙන් වැළකුනේ වෙයිද, ගමෙහිද, අරණ්‍යයෙහිද අනුන් සතුවූ යම් වස්තුවක් වේ නම් එය සොර සිතින් නොගන්නේ වෙයිද. කාමයන්හි වරදවා හැසිරීම හැර කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේ මව විසින් රක්නා ලද්දාවූද, පියා විසින් රක්නා ලද්දාවූද, මව්පියන් විසින් රක්නා ලද්දාවූද, සහෝදරයා විසින් රක්නා ලද්දාවූද, සහෝදරිය විසින් රක්නා ලද්දාවූද, නෑයන් විසින් රක්නා ලද්දාවූද, ගොත්‍රයෙන් රක්නා ලද්දාවූද, කුලචාරිත්‍ර ධර්මයෙන් රක්නා ලද්දාවූද, හිමියන් සහිතවූද, දඬුවම් සහිතවූද, යටත් පිරිසෙයින් මල්දමක් පළඳවන ලද්දාවූද යම් ස්ත්‍රීහු වෙද්ද, එබඳු ස්ත්‍රීන් හා හැසිරීමට නොපැමිණියේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වනාහි තුන් ආකාරයකින් කයින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "ගෘහපතියෙනි, කෙසේ නම් වචනයෙන් සතර ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වෙයිද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතමෙක් බොරුකීම අත්හැර බොරු කීමෙන් වැළකුණේ වෙයි. සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සමූහයා මැදට ගියේ හෝ රාජකුලයා මැදට ගියේ හෝ, 'පින්වත් පුරුෂය, මෙහි එව, යමක් දන්නෙහි නම් එය කියව'යි ඉදිරියට පමුණුවන ලද්දේ, සාක්ෂි අසන ලද්දේ හෙතෙම නොදන්නේ හෝ නොදනිමියි කියයි. දන්නේ හෝ දනිමියි කියයි. නුදුටුයේ හෝ නොදුටුවෙමියිද, දුටුයේ හෝ දුටුවෙමියිද කියයි. මෙසේ තමන් නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් ලාභයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේ වෙයි.

කේලාම් කීම අත්හැර, කේලාම් කීමෙන් වැළකුණේ වෙයි. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස අසුවල් තැන නොකියන්නේය. අසුවල් තැනින් අසා අසුවලුන් බිඳවීම පිණිස මොවුන්ට නොකියන්නේය. මෙසේ බිඳුනවුන් ගළපන්නේ වෙයි. එක්වූවන්ට සමගියෙහි අනුසස් කියා අනුබල දෙන්නේ වෙයි. සමගියෙහි ඇලුනේ, සමගියෙහි ආශා ඇත්තේ, සමගියට සතුටුවන්නේ, සමගි වචන කියන්නේ වෙයි. යම් ඒ වචනයක් දොෂ රහිතද, කණට සැපද ප්‍රෙම කටයුතුද, හෘදයංගමද, ගුණයෙන් පිරුණේද, බොහෝදෙනාට කැමතිද, බොහෝදෙනාට මනාපද, එබඳු වචන කියන්නේ වෙයි. හිස්වචන කීම අත්හැර හිස්වචන කීමෙන් දුරුවූයේ සුදුසු කාලයෙහි කියන්නේ, වූවක්ම කියන්නේ, වැඩ ඇති දෙයක්ම කියන්නේ, ඇතිවූවක්ම කියන්නේ, හික්මීම පිළිබඳ වූවක්ම කියන්නේ, සිතෙහි තැන්පත් කර ගැණීමට සුදුසුවූ, කාලයෙහි කියන්නාවූ, කරුණු සහිතවූ, දැක්වීම් සහිතවූ, වැඩ දායකවූ වචන කියන්නේ වෙයි. ගෘහපතියනි, මෙසේ වචනයෙන් සතර ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වෙයි

8 "ගෘහපතියෙනි, කෙසේනම් සිතින් තුන් ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වේද? ගෘහපතියනි, මේ ලොකයෙහි ඇතමෙක් අධික ලොභ නැත්තේද, අනුන්ගේ සිත් සතුටු කරන

යම් ඒ අන්සතු වස්තුවක් වේද, එය අධික ලොභයෙන් නොබලන්නේ වේද, 'යමක් අනුන් සතුව ඇද්ද එය මට වන්නේ නම් ඉතා යෙහෙකැ'යි නොසිතන්නේ වේද, ක්‍රොධ සිත් නැත්තේ, පිරිසිදුවූ යහපත් කල්පනා ඇත්තේ, මෙසේද මේ සත්වයෝ වෛර නැත්තෝ, ක්‍රොධ නැත්තෝ, දුක් නැත්තෝ සුවසේ ආත්ම පරිහරනය කරත්වායි (සිතන්නේද,) වරදවා ගැනීම් නැත්තේ සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දුන් දෙයෙහි විපාක ඇත. පරිත්‍යාග කරන ලද්දෙහි විපාක ඇත. පිදූ දෙයෙහි විපාක ඇත. කරන ලද යහපත් අයහපත් කර්මයන්ගේ ඵල විපාක ඇත. මේ ලොකය ඇත. පරලොකය ඇත. මව් කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක ඇත. පියා කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක ඇත. මැරී උපදින සත්වයෝ ඇත. යහපත් මාර්ගයෙහි ගියාවූ, යහපත්ව පිළිපදින්නාවූ යම් කෙනෙක් මේ ලොකයද පරලොකයද තුමූ ප්‍රඥාවෙන් අවබොධකොට ප්‍රකාශ කරද්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතැයි (සිතද්ද) ගෘහපතියෙනි, මෙසේ සිතින් තුන් ආකාර ධර්මපැවතුම් සමපැවතුම් වෙයි. ගෘහපතියනි, මෙසේ ධර්ම පැවතුම් සමපැවතුම් හේතුකොටගෙන ලොකයෙහි ඇතැම් කෙනෙක් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදිති.

**9.** "ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ක්ෂත්‍රිය මහා සාරයන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ක්ෂත්‍රිය මහාසරයන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි)

"ගෘහපතියනි 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු බ්‍රාහ්මණ මහාසාරයන් හා එක්වීමට උත්පත්ත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු බ්‍රාහ්මණ මහාසාර කුලය හා එක්වීමට උත්පත්ති වශයෙන්

පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචය්‍යීා සමචය්‍යීා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, ධර්මචය්‍යීා සමචය්‍යීා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ගෘහපති මහාසාර කුලයට එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ගෘහපති මහාසාර කුලය හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද, හෙතෙම ධර්මචය්‍යීා සමචය්‍යීා ඇත්තේය (එහෙයිනි.)

10. "ගෘහපතියනි, 'ධර්චය්‍යීා සමචය්‍යීා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, කය බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණ සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචය්‍යීා සමචය්‍යීා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචය්‍යීා සමචය්‍යීා ඇති මම, අනේ ඒකාන්තයෙන් තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචය්‍යීා සමචය්‍යීා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචය්‍යීා සමචය්‍යීා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු යාම දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු යාම දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචය්‍යීා සමචය්‍යීා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචයර්‍යා සමචයර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු තුසිත දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු තුසිත දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචයර්‍යා සමචයර්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචයර්‍යා සමචයර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු නිම්මාණරතී දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු නිම්මාණරතී දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද හෙතෙම ධර්මචයර්‍යා සමචයර්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචයර්‍යා සමචයර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචයර්‍යා සමචයර්‍යා ඇත්තේය (එහෙයිනි.)

11. "ගෘහපතියනි, 'ධර්මචයර්‍යා සමචයර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්ම කායික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචයර්‍යා සමචයර්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචයර්‍යා සමචයර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආභ නම් දෙවියන්

හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආභ දෙවියන් හා එක් වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරිත්තාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරිත්තාභ දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආභස්සර නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආභස්සර නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුභනම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරිත්තසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරිත්තසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුභකිණ්ණක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුභකිණ්ණක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු වෙහප්ඵල දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු වෙහප්ඵල දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අවිහ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අවිහ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අතප්ප නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අතප්ප නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුදස්ස නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුදස්ස නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුදස්සී නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුදස්සී නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අකනිට්ඨක නම්

දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අකනිට්ඨක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

12. "ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආකාසානඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආකාසානඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු විඤ්ඤාණඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු විඤ්ඤාණඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආකිඤ්චඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආකිඤ්චඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

13. "ගෘහපතියනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කෙලෙස් නැතිකිරීමෙන් කෙලෙස් රහිතවූ චිත්තවිමුක්තියද ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහි තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කෙලෙස් නැතිකිරීමෙන්, කෙලෙස් රහිතවූ චිත්තවිමුක්තියද, ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහිම තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊටහේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය" (එහෙයිනි.)

මෙසේ වදාළ කල්හි සාලෙය්‍යක ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දෙශනාව යහපත. භවත් ගෞතමයන්වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කළ බඳුනක් උඩුකුරු කරන්නේද, වැසී තිබුන දෙයක් විවෘත කරන්නේද, මංමුළා වූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහණක් දරන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. ඒ ධර්මය ඇසුවාවූ අපි භවත් ගෞතමයන් වහන්සේ සරණ යමු. ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමු. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයන් කොට අප සලකන සේක්වා.

**පළමුවෙනිවූ සාලෙය්‍යක සූත්‍රය නිමි. (5-1)**

# 42. වෙරඤ්ජක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ අනේපිඩු මහසිටුහු විසින් කරවනලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි වෙරඤ්ජා පුරවැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ කිසියම් කටයුත්තක් සඳහා සැවැත්නුවර වෙසෙත්. වෙරංජක බ්‍රාහ්මණ ගෘහපතියෝ 'ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය වංශයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතම තෙම සැවැත් නුවර අනේපිඩු මහ සිටුහු විසින් කරවනලද ජේතවනාරාමයෙහි වැඩවසතියි ඇසුවාහුය. ඒ භවත් ගෞතමයින්ගේ මෙබඳුවූ යහපත්වූ කීර්ති ශබ්දයක් උස්ව නැංගේ වෙයි.

"ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්යහ, සම්‍යක් සම්බුද්ධයහ, අෂ්ට විද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තයහ, යහපත් ගති ඇත්තාහ. සියලු ලොකයන් දන්නාහ. ශ්‍රෙෂ්ඨයහ. හික්මවිය යුතු පුරුෂයන් හික්ම වීමෙහි රියැදුරෙකු වැනියහ. දෙව් මිනිසුන්ට ශාස්තෘහ, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබොධ කළහ. භාග්‍යවත්හ. ඒ තථාගතයන්වහන්සේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා තමන් උසස් ඥාණයෙන් දැන පැහැදිලිකොට ප්‍රකාශ කරන්නාහ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ අර්ථ සහිතවූ, ඛ්‍යංජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ ශාසන මාර්ග බ්‍රහ්මචරියාව ගෙන හැර දක්වති. එබඳුවූ රහතුන්ගේ දැකුම් යහපත්ය." (කියායි) ඉක්බිති වෙරඤ්ජාවැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එක පැත්තක උන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සිටින දිශාවට ඇඳිලි බැඳ වැඳ එක පැත්තක උන්නාහුය. ඇතැම්හු භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි (තමන්ගේ) නාම ගොත්‍ර කියා එක පැත්තක උන්නාහුය. ඇතැම්හු නිශ්ශබ්දවම එක පැත්තක උන්නාහුය.

එකපැත්තක හුන්නාවූම, වෙරඤ්ජක බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය.

"භවත් ගෞතමයාණෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපදිති. ඊට හේතුව කුමක්ද? ඊට ප්‍රත්‍යය කවරේද?

"භවත් ගෞතමයාණෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති දිව්‍ය ලොකයෙහි උපදිති. ඊට හේතු කවරේද? ඊට ප්‍රත්‍යය කවරේද?"

2. "ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් සත්ත්වයෝ අධාර්මික හැසිරීමයැයි කියන විෂම හැසිරීම හේතුකොටගෙන කය බිඳීමෙන් මරණින් මතු අපාය නම්වූ නපුරුගති ඇති නරකයෙහි උපදිත්. ගෘහපතියෙනි, මේ ලොකයෙහි ධාර්මික හැසිරීම යැයි කියන සමචයර්‍ය්‍යාව හෙතුකොටගෙන ඇතැම් සත්ත්වයෝ කාය භෙදයෙන් මරණින් මතු සුගති නම්වූ දිව්‍ය ලොකයෙහි උපදිත්."

"අපි භවත් ගෞතමයින්ගේ සංක්ෂෙපයෙන් කියන ලද්දාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද්දාවූ, මේ ධර්මයෙහි විස්තර වසයෙන් අර්ථය නොදනිමු. යම්සේ අපි භවත් ගෞතමයින්ගේ කොටින් දෙශනා කරන ලද්දාවූ, විස්තර වශයෙන් අර්ථය නොබෙදන ලද්දාවූ, මේ ධර්මය විස්තර වශයෙන් දැන ගන්නෙමුද, භවත් ගෞතමතෙම එසේ ධර්මය දෙශනා කරන සේක්වා." "ගෘහපතියෙනි, එසේවීනම් අසව්. මනාකොට සිත්හි තබා ගනිව්. කියන්නෙමි" "එසේය පින්වතුන් වහන්ස"යි වෙරඤ්ජක බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

3. "ගෘහපතියෙනි, තුන් පරිද්දෙකින් කයින් අධර්ම පැවතුම් විෂම පැවතුම් ඇත්තේ වෙයි. වචනයෙන් සතර ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් ඇත්තේ වෙයි. සිතින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් ඇත්තේ වෙයි.

ගෘහපතියෙනි, කෙසේ කයින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් ඇත්තේ වේද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් රෞද්‍ර වූයේ, ලෙයින් තෙමුණු අත් ඇත්තේ, අන්‍යයන් පෙලීමෙහි, නැසීමෙහි යෙදුනේ, සත්ත්වයන් කෙරෙහි දයාවක් නැතිව ප්‍රාණඝාත කරන්නේ වෙයිද, සොරකම් කරන්නේ වෙයිද, ගමෙහි හෝ ආරණ්‍යයෙහි හෝ අනුන් සතු යමක් වේද එය සොර සිතින් පැහැර ගන්නේ වෙයිද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයිද, මව විසින් රක්නා ලද්දාවූද, පියා විසින් රක්නා ලද්දාවූද, මව්පියන් විසින් රක්නා ලද්දාවූද, සොහොයුරා විසින් රක්නා ලද්දාවූද, සොහොයුරිය විසින් රක්නා ලද්දාවූද, නෑයන් විසින් රක්නා ලද්දාවූද, ගොත්‍රයෙන් රකින ලද්දාවූද, කුල චාරිත්‍රධර්මයෙන් රකින ලද්දාවූද, හිමියන් සහිතවූද, (අසුවල් ස්ත්‍රිය වෙත ගියහොත් දඬයයි නියම කරනලද) දඬුවම් සහිතවූද, යටත්පිරිසෙයින් (මැය මගේ භාර්‍යාව වන්නීයයි පිරිමියෙකු විසින්) මල්දමක් දමනු ලැබුවා වූද, යම් ඒ ස්ත්‍රීහු වෙත්ද, එබඳු ස්ත්‍රීන් සමග හැසිරීමට පැමිණියේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වනාහි කයින් සිදුවන්නාවූ අධර්ම පැවතුම් විෂම පැවතුම් තුන් ආකාර වෙයි.

"ගෘහපතියෙනි, කෙසේ නම් වචනයෙන් සතර ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් ඇත්තේ වෙයිද, ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් බොරු කියන්නේ වෙයිද, සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සමූහයා මැදට ගියේ හෝ රාජකුලයා මැදට ගියේ හෝ 'පින්වත් පුරුෂය, මෙහි එව, යමක් දන්නෙහි නම් එය කියව'යි ඉදිරියට පමුණුවන ලද්දේ සාක්ෂි අසන ලද්දේ නොදැන හෝ දනිමියි කියයි. දැන හෝ නොදනිමියි කියයි. දැක හෝ නුදුටුයෙමියි කියයි. නොදැක හෝ දුටුවෙමියි කියායි. මෙසේ තමා නිසා හෝ අන්‍යයන් නිසා හෝ කිසියම් ලාභයක් නිසා හෝ දැන දැන බොරු කියන්නේ වෙයි. කේලම් කියන්නේ වෙයි. මෙතැනින් අසා මොවුන් බිඳුවනු පිණිස අසුවල්තැන කියන්නේය. අසුවල් තැනින් හෝ අසා අසුවලුන් බිඳුවනු පිණිස මොවුන්ට කියන්නේය. මෙසේ සමගි වූවන් බිඳින්නේ හෝ

වෙයි, බිඳුනවුන්හට අනුබල දෙන්නේ හෝ වෙයි. භේදවීමෙහි ඇලුණේ, භේද කිරීමෙහි සතුටු වන්නේ, භේදකරන වචන කියන්නේ වෙයි, ඵරුෂ වචන කියන්නේ වෙයි. යම් ඒ වචනයක් ගැටීම් ගැරහීමාදීන් දොෂ සහිතද, කුණු සැරව වෑහෙන්නාක් මෙන් අප්‍රියද, අන්‍යයන්ගේ සිත් නරක් කරන්නේද, අන්‍යයන්හට පහරක් වැනිද ක්‍රොධයට කිට්ටුද, සමාධිය පිණිස නොපවතීද, එබඳු වචන කියන්නේ වෙයි. සම්ඵප්‍රලාප (හිස් වචන) කියන්නේ වෙයිද, නුසුදුසු කාලයෙහි කියන්නේද, නුවූවක් කියන්නේ වෙයිද, අනර්ථයක් කියන්නේ වෙයිද, අධර්මයක් කියන්නේ වෙයිද, අවිනයක් කියන්නේ වෙයිද, සිතෙහි තබා ගැනීමට නුසුදුසු වචන කියන්නේ වෙයිද, නුසුදුසු කාලයෙහි, නිදර්ශන දැක්වීම් ආදියක් නැතිව අගක් මුලක් නැති, අවැඩින් යුක්තවූ වචන කියන්නේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වචනයෙන් සතර ආකාරයෙන් අධර්ම පැවතුම් විෂම පැවතුම් වෙයි.

5. "ගෘහපතියෙනි, කෙසේ සිතින් තුන් ආකාරයකින් අධර්ම පැවතුම් විෂම පැවතුම් වේද, ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් දැඩි ලොභ ඇත්තේ වෙයිද, යම් ඒ අනුන්ගේ වස්තුවක් වේද, එය අධික ලොභයෙන් බලන්නේද, අනුන්ට අයිති යමක් වේද, 'අනේ එය මට වන්නේ නම් ඉතා යෙහෙකැ'යි (අධික ලොභයෙන්) සිතයිද, මේ සත්ත්වයෝ නැසෙත්වා, විනාශ වෙත්වා, සිඳෙත්වා, නැතිවී යෙත්වායි ව්‍යාපාද සිත් ඇත්තේ, නපුරු අදහස් ඇත්තේ වෙයිද, විපරිත දැකීම් ඇති මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයිද, දෙන ලද්දෙහි විපාක නැත, දුන් දෙයෙහි ඵල නැත, පිදූ දෙයෙහි විපාකය නැත, කුශලාකුසල කර්මයන්ගේ ඵලයද විපාකයද නැත, මෙලොවක් නැත, පරලොවක් නැත, මව් කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක නැත. පියා කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක නැත. මැරී උපදින සත්ත්වයෝ නැත. යහපත් මාර්ගයෙහි ගියාවූ යහපත්ව පිළිපදින්නාවූ යම් කෙනෙක් මේ ලෝකයද පරලොකයද තුමූ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරත්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ නැතැයි ගනිත්ද, ගෘහපතියෙනි, මෙසේ තුන් ආකාරයකින් සිතින් අධර්ම පැවතුම් විෂම පැවතුම්

වෙයි. ගෘහපතියෙනි, මෙසේ අධර්ම පැවතුම් විෂම පැවතුම් හෙතුකොටගනෙ ඇතැම් සත්වයෝ කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, නපුරු වැටීමක් ඇති නිරයෙහි උපදිති.

**6.** "ගෘහපතියෙනි, තුන් ආකාරයකින් කයින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. සතර ආකාරයකින් වචනයෙන් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. තුන් ආකාරයකින් සිතින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි. ගෘහපතියෙනි, කෙසේ නම් තුන් ආකාරයකින් කයින් ධර්මපැවතුම් සමපැවතුම් වෙයිද? ගෘහපතියනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් සතුන් මැරීම හැර සතුන් මැරීමෙන් වැළකුනේ බහා තැබූ දඬු ඇත්තේ, බහා තැබූ ආයුධ ඇත්තේ ලජ්ජා ඇත්තේ කරුණාවත් බවට පැමිණියේ සියලු සත්ත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වෙසෙයිද, නුදුන්දෙය ගැනීම අත්හැර නුදුන් දෙය ගැනීමෙන් වැළකුනේ වෙයිද, ගමෙහිද, අරණ්‍යයෙහිද අනුන් සතුවූ යම් වස්තුවක් වේ නම් එය සොර සිතින් නොගන්නේ වෙයිද. කාමයන්හි වරදවා හැසිරීම හැර කාමමිථ්‍යාචාරයෙන් වැළකුණේ මව විසින් රක්නා ලද්දාවූද, පියා විසින් රක්නා ලද්දාවූද, මව්පියන් විසින් රක්නා ලද්දාවූද, සහෝදරයා විසින් රක්නා ලද්දාවූද, සහෝදරිය විසින් රක්නා ලද්දාවූද, නෑයන් විසින් රක්නා ලද්දාවූද, ගොත්‍රයෙන් රක්නා ලද්දාවූද, කුලචාරිත්‍ර ධර්මයෙන් රක්නා ලද්දාවූද, හිමියන් සහිතවූද, දඬුවම් සහිතවූද, යටත් පිරිසෙයින් මල්දමක් පළඳවන ලද්දාවූද යම් ඒ ස්ත්‍රීහු වෙද්ද, එබඳු ස්ත්‍රීන් හා හැසිරීමට නොපැමිණියේ වෙයිද, ගෘහපතියෙනි, මෙසේ වනාහි තුන් ආකාරයකින් කයින් ධර්ම පැවතුම් සමපැවතුම් වෙයි.

**7.** "ගෘහපතියෙනි, කෙසේ නම් වචනයෙන් සතර ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වෙයිද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතමෙක් බොරුකීම අත්හැර බොරු කීමෙන් වැළකුණේ වෙයි. සභාවකට ගියේ හෝ පිරිසකට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සමූහයා මැදට ගියේ හෝ රාජකුලයා මැදට ගියේ හෝ, 'පින්වත් පුරුෂය, මෙහි එව, යමක් දන්නෙහි නම් එය කියව'යි ඉදිරියට පමුණුවන ලද්දේ, සාක්ෂි අසන ලද්දේ හෙතෙම

නොදන්නේ හෝ නොදනිමියි කියයි. දන්නේ හෝ දනිමියි කියයි. නුදුටුයේ හෝ නොදුටුවෙමියිද, දුටුයේ හෝ දුටුවෙමියිද කියයි. මෙසේ තමන් නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් ලාභයක් නිසා හෝ දැන දැන බොරු නොකියන්නේ වෙයි.

කේලාම් කීම අත්හැර, කේලාම් කීමෙන් වැළකුණේ වෙයි. මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස අසුවල් තැන නොකියන්නේය. අසුවල් තැනින් අසා අසුවලුන් බිඳවීම පිණිස මොවුන්ට නොකියන්නේය. මෙසේ බිඳුනවුන් ගළපන්නේ වෙයි. එක්වූවන්ට සමගියෙහි අනුසස් කියා අනුබල දෙන්නේ වෙයි. සමගියෙහි ඇලුනේ, සමගියෙහි ආශා ඇත්තේ, සමගියට සතුටුවන්නේ, සමගි වචන කියන්නේ වෙයි. යම් ඒ වචනයක් දොෂ රහිතද, කණට සැපද ප්‍රෙම කටයුතුද, හෘදයාංගමද, ගුණයෙන් පිරුණේද, බොහෝදෙනාට කැමතිද, බොහෝදෙනාට මනාපද, එබඳු වචන කියන්නේ වෙයි. හිස්වචන කීම අත්හැර හිස්වචන කීමෙන් දුරුවූයේ සුදුසු කාලයෙහි කියන්නේ, වූවක්ම කියන්නේ, වැඩ ඇති දෙයක්ම කියන්නේ, ඇතිවූවක්ම කියන්නේ, හික්මීම පිළිබඳ වූවක්ම කියන්නේ, සිතෙහි තැන්පත් කර ගැණීමට සුදුසුවූ කාලයෙහි කියන්නාවූ, කරුණු සහිතවූ, දැක්වීම් සහිතවූ, වැඩ දායකවූ වචන කියන්නේ වෙයි. ගෘහපතියනි, මෙසේ වචනයෙන් සතර ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වෙයි.

8 "ගෘහපතියෙනි, කෙසේනම් සිතින් තුන් ආකාරවූ ධර්මපැවතුම් සමපැවතුම් වේද? ගෘහපතියෙනි, මේ ලොකයෙහි ඇතමෙක් අධික ලොභ නැත්තේද, අනුන්ගේ සිත් සතුටු කරන යම් ඒ අන්සතු වස්තුවක් වේද, එය අධික ලොභයෙන් නොබලන්නේ වේද, 'යමක් අනුන් සතුව ඇද්ද එය මට වන්නේ නම් ඉතා යෙහෙකැ'යි නොසිතන්නේ වේද, ක්‍රොධ සිත් නැත්තේ, පිරිසිදුවූ යහපත් කල්පනා ඇත්තේ, මෙසේද මේ සත්වයෝ වෛර නැත්තෝ, ක්‍රොධ නැත්තෝ, දුක් නැත්තෝ සුවසේ ආත්ම පරිහරනය කරත්වායි (සිතන්නේද,) වරදවා ගැනීම් නැත්තේ සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයිද, දුන් දෙයෙහි විපාක ඇත. පරිත්‍යාග කරන ලද්දෙහි විපාක ඇත. පිදූ දෙයෙහි විපාක

ඇත. කරන ලද යහපත් අයහපත් කර්මයන්ගේ ඵල විපාක ඇත. මේ ලොකය ඇත. පරලොකය ඇත. මව් කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක ඇත. පියා කෙරෙහි හොඳ හෝ නරක පැවැත්මෙහි විපාක ඇත. මැරී උපදින සත්වයෝ ඇත. යහපත් මාර්ගයෙහි ගියාවූ, යහපත්ව පිළිපදින්නාවූ යම් කෙනෙක් මේ ලොකයද පරලොකයද තුමූ ප්‍රඥාවෙන් අවබොධකොට ප්‍රකාශ කරද්ද, එබඳුවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇතැයි (සිතද්ද) ගෘහපතියෙනි, මෙසේ සිතින් තුන් ආකාර ධර්මපැවතුම් සමපැවතුම් වෙයි. ගෘහපතියනි, මෙසේ ධර්ම පැවතුම් සමපැවතුම් හේතුකොටගෙන ලොකයෙහි ඇතැම් කෙනෙක් කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදිති.

**9.** "ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ක්ෂත්‍රිය මහා සාරයන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ක්ෂත්‍රිය මහාසරයන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය. (එහෙයිනි)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු බ්‍රාහ්මණ මහාසාරයන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු බ්‍රාහ්මණ මහාසාර කුලය හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ගෘහපති මහාසාර කුලයට එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ගෘහපති මහාසාර කුලය හා එක්වීමට උත්පත්ති වශයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි.)

**10.** "ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, කය බිඳීමෙන් මරණින් මතු චාතුර්මහාරාජික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණ සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු තව්තිසා වැසි දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු යාම දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු යාම දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ එකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු තුසිත දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු තුසිත දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇති මම, අහෝ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු නිම්මාණරතී දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙම්'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු නිම්මාණරතී දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇති මම, අහෝ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙම්'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇත්තේය. (එහෙයිනි.)

11. "ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇති මම, අහෝ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙම්'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්මකායික දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇත්තේය. (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇති මම, අහෝ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙම්'යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආභ දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇත්තේය. (එහෙයිනි)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා‍ සමචර්‍යා‍ ඇති මම, අහෝ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරිත්තාභ නම්

දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි’යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරිත්තාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි.)

“ගෘහපතියෙනි, ‘ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි’යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණාභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

“ගෘහපතියෙනි, ‘ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආභස්සර නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි’යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආභස්සර නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදු වෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

“ගෘහපතියෙනි, ‘ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුභනම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි’යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය. (එහෙයිනි)

“ගෘහපතියෙනි, ‘ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු පරිත්තසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි’යි ඉදින් කැමැතිවන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු පරිත්තසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අප්පමාණසුභ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුභකිණ්ණක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුභකිණ්ණක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු වෙහප්ඵල දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු වෙහප්ඵල දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අවිහ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අවිහ නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අතප්ප නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අතප්ප නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුදස්ස නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුදස්ස නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු සුදස්සී නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සුදස්සී නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු අකනිට්ඨක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු අකනිට්ඨක නම් දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය (එහෙයිනි)

**12.** "ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආකාසානඤ්චායතන

දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආකාසානඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු විඤ්ඤාණඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු විඤ්ඤාණඤ්චායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය. (එහෙයිනි)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු ආකිඤ්චඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු ආකිඤ්චඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය (එහෙයිනි.)

"ගෘහපතියෙනි, 'ධර්මචර්‍යා සමචර්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කය බිඳීමෙන් මරණින් මතු නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නෙමි'යි ඉදින් කැමැති වන්නේ නම්, හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු නෙවසඤ්ඤානාසඤ්ඤායතන දෙවියන් හා එක්වීමට උත්පත්ති වශයෙන් පැමිණෙන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊට හේතු කවරේද? හෙතෙම ධර්මචර්‍යා සමචර්‍යා ඇත්තේය (එහෙයිනි.)

13. "ගෘහපතියෙනි, 'ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇති මම, අනේ ඒකාන්තයෙන් කෙලෙස් නැතිකිරීමෙන් කෙලෙස් රහිතවූ චිත්තවිමුක්තියද ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහිම තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙන්නෙමි'යි ඉදින් කැමති වන්නේ නම්, හෙතෙම කෙලෙස් නැතිකිරීමෙන්, කෙලෙස් රහිතවූ චිත්තවිමුක්තියද, ප්‍රඥාවිමුක්තියද මේ ආත්මයෙහිම තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නේය යන මේ කාරණය සිදුවෙයි. ඊටහේතු කවරේද? හෙතෙම ධර්මචර්‍ය්‍යා සමචර්‍ය්‍යා ඇත්තේය" (එහෙයිනි.)

මෙසේ වදාළ කල්හි වෙරඤ්ජක ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ.

"භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දෙශනාව යහපත. භවත් ගෞතමයන්වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කළ බඳුනක් උඩුකුරු කරන්නේද, වැසී තිබුන දෙයක් විවෘත කරන්නේද, මංමුළා වූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහණක් දරන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. ඒ ධර්මය ඇසුවාවූ අපි භවත් ගෞතමයන් වහන්සේ සරණ යමු. ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමු. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයන් කොට අප සලකන සේක්වා.

දෙවෙනිවූ වෙරඤ්ජක සූත්‍රය නිමි. (5-2)

## 43. මහා වෙදල්ල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වූ, අනේපිඩු මහ සිටුහු විසින් කරවන ලද ජේතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගීසිටියේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්

වහන්සේ යම් තැනෙක්හිද එතැනට ගියහ. ගොස්, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූහ. සතුටු විය යුතු සිහි කටයුතු කථාකොට නිමවා එකපැත්තක උන්හ. එකපැත්තක උන්නාවූ ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ, ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ.

"ඇවැත්නි, 'දුෂ්ප්‍රාඥාය, දුෂ්ප්‍රාඥය'යි (නුවණ නැති තැනැත්තේය, නුවණ නැතිතැනැත්තේයයි) කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් දුෂ්ප්‍රාඥයයි කියනු ලැබේද, ඇවැත්නි, නොදනියි, නොදනියි, යන අර්ථයෙන් දුෂ්ප්‍රාඥ (නුවණ නැත්තේ) යයි කියනු ලැබේ. කුමක් නොදනීද? මෙය දුකයයි නොදනී. මේ දුක් ඉපදීමට හේතුවයයි නොදනී. මේ දුක් නැතිකිරීමයයි නොදනී, මේ දුක් නැතිකිරීමේ මගයයි නොදනී. ඇවැත්නි, යම් හෙයකින් නොදනීද නොදනීද එහෙයින් දුෂ්ප්‍රාඥයයි කියනු ලැබේ."

"යහපත ඇවැත්නි,' කියා ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමෝදන්ව ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන්ගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළහ. "ඇවැත්නි, ප්‍රාඥය ප්‍රාඥය (නුවණ ඇතිතැනැත්තේය, නුවණ ඇතිතැනැත්තේය) යයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් ප්‍රාඥයයි කියනු ලැබේද?" "ඇවැත්නි, යම් හෙයකින් මනාව දනියිද මනාව දනියිද, එහෙයින් ප්‍රාඥයයි කියනු ලැබේ. කුමක් දනීද? මෙය දුකයයි දනියි. මේ දුක් ඉපදීමේ හේතුවයයි දනියි. මේ දුක් නැතිකිරීමයයි දනියි. මේ දුක් නැති කිරීමේ මගයයි දනියි. ඇවැත්නි, යම් හෙයකින් දනීද දනීද එහෙයින් ප්‍රාඥයයි කියනු ලැබේ.

"ඇවැත්නි, විඤ්ඤාණය විඤ්ඤාණය (විශෙෂයෙන් දැනීම විශෙෂයෙන් දැනීම) යයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් විඥානයයයි කියනු ලැබේද?" "ඇවැත්නි, යම් හෙයකින් විශෙෂයෙන් දනීද, විශෙෂයෙන් දනීද, එහෙයින් විඥානයයි කියනු ලැබේ." "කුමක් දනීද?" මේ සැප වේදනාවයයි දනියිද.

මේ දුක් වේදනාවයයි දනීද, මේ උපෙක්ෂා වේදනාවයයි දනීද, ඇවැත්නි, යම් හෙයකින් විශෙෂයෙන් දනීද, විශෙෂයෙන් දනීද, එහෙයින් විඥානයයි කියනු ලැබේ

"ඇවැත්නි, යම් මේ ප්‍රඥාවක් වේද, යම් මේ විඥානයක් වේද, මේ ධර්මයෝ ඔවුනොවුන් එක්ව පවත්නාහුද? නැතහොත් වෙන් වෙන්ව පවත්නාහුද, මේ ධර්මයන් ඔවුනොවුන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට හැකිද?" "ඇවැත්නි, යම් මේ ප්‍රඥාවක් වේද, යම් මේ විඥානයක් වේද, මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන් වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට නොහැකිය. ඇවැත්නි, යමක් ප්‍රඥාවෙන් දනීද, විඥානයෙන් එය දනියි. විඥානයෙන් යමක් දනීද, ප්‍රඥාවෙන්ද එය දනියි. එහෙයින් මේ ධර්මයෝ එක්ව පවත්නාහුය වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් ඔවුනොවුන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස දක්වන්නට බැරිය."

"ඇවැත්නි, යම් ප්‍රඥාවකුත් වේද, යම් විඥානයකුත් වේද, එක්ව පවත්නාවූ වෙන්ව නොපවත්නාවූ මේ ධර්මයන්ගේ වෙනස කවරේද?" "ඇවැත්නි, යම් ප්‍රඥාවකුත් වේද, යම් විඥානයකුත් වේද, එක්ව පවත්නාවූ වෙන්ව නොපවත්නාවූ මේ ධර්මයන් අතුරෙන් ප්‍රඥාව වැඩිය යුතුය. විඥානය පිරිසිඳ දතයුතුය. මෙය ඔවුන්ගේ වෙනසයි."

**2.** "ඇවැත්නි, වේදනාවය, වේදනාවයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් වේදනාවයයි කියනු ලැබේද?" "ඇවැත්නි, යම් හෙයකින් විඳීද, විඳීද එහෙයින් වේදනාවයයි කියනු ලැබේ." "කුමක් විඳීද" සැපද විඳියි, දුකද විඳියි, උපෙක්ෂාවද විඳියි. ඇවැත්නි, යම් හෙයකින් විඳීද, විඳීද එහෙයින් වේදනාවයයි කියනු ලැබේ."

"ඇවැත්නි, සංඥාවය, සංඥාවයයි කියනු ලැබේ. ඇවැත්නි, කොපමණකින් සංඥාවයයි කියනු ලැබේද?" "යම් හෙයකින් හඳුනයිද, හඳුනයිද, ඇවැත්නි, එහෙයින් සංඥාවයයි කියනු ලැබේ." "කුමක් හඳුනයිද?" නිල් පාටයයි හඳුනයි. කහපාටයයි

හඳුනයි. ලේ පාටයයි හඳුනයි. සුදු පාටයයි හඳුනයි. ඇවැත්නි, යම් හෙයකින් හඳුනයිද, හඳුනයිද එහෙයින් සංඥාවයයි කියනු ලැබේ.”

“ඇවැත්නි, යම් වේදනාවක් වේද, යම් සංඥාවක් වේද, යම් විඥානයක් වේද, මේ ධර්මයෝ එක්ව පවත්නාහුද? නොහොත් වෙන් වෙන්ව පවත්නාහුද? මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්නට හැකිද?” “ඇවැත්නි, යම් වේදනාවක් වේද, යම් සංඥාවක් වේද, යම් විඤ්ඤාණයක් වේද මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්නට නොහැකිය. ඇවැත්නි, යමක් විඳීද එය හඳුනයි යමක් හඳුනාද එය විශෙෂයෙන් දනියි. එහෙයින් මේ ධර්මයෝ එක්ව පවත්නාහුය. වෙන්ව නොපවත්නාහුය. මේ ධර්මයන් වෙන් වෙන් කොට ඔවුන්ගේ වෙනස පෙන්වන්ට නොහැකිය.”

“ඇවැත්නි, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් තොරව, (උපක්ලේශ රහිත හෙයින්) පිරිසිදුවූ මනො විඤ්ඤාණයෙන් (රූපාවචර චතුර්ථද්ධ්‍යාන සිතින්) කුමක් දතයුතුද?” “ඇවැත්නි, පඤ්චෙන්ද්‍රියයන්ගෙන් තොරවූ පිරිසිදුවූ මනොවිඤ්ඤාණයෙන් ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතනය දතයුතුයි. විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනය දතයුතුයි. කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනය දතයුතුයි.”

3. “ඇවැත්නි, නෙය ධර්මය (දතයුතු ධර්මය) කුමකින් දනීද” “ඇවැත්නි, දතයුතු ධර්මය ප්‍රඥා ඇසින් දනියි.

“ඇවැත්නි, ප්‍රඥාව කුමක් ප්‍රයෝජන කොට ඇත්තීද?” “ඇවැත්නි, ප්‍රඥාව වනාහි දතයුතු ධර්මයන් දැනීම සඳහාද පිරිසිඳිය යුතු ධර්මයන් පිරිසිඳීම පිණිසද පහකළ යුතු ධර්මයන් පහකිරීම සඳහාද පවතියි.”

4. “ඇවැත්නි, සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනා ප්‍රඥාව හා මාර්ග ප්‍රඥාව) ඉපදීමට කෙතෙක් ප්‍රත්‍යයෝ වෙත්ද?” “ඇවැත්නි,

සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනාප්‍රඥාව හා මාර්ගප්‍රඥාව) ඉපදීමට ප්‍රත්‍යය දෙකක් වෙති. පරතො ඝොෂය හා යොනිසොමනසිකාරය (අන්‍යයන් ගෙන් බණ ඇසීම හා නුවණින් කල්පනා කිරීම) යන දෙකයි. ඇවැත්නි, මේ ප්‍රත්‍යය දෙක සම්‍යක් දෘෂ්ටිය (විදර්ශනා ප්‍රඥාව හා මාර්ගප්‍රඥාව) ඉපදීම පිණිස වෙති.

"ඇවැත්නි, කෙතෙක් අංගයකින් ලබනලද උපකාර ඇති අර්හත්මාර්ග සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය (කෙලෙසුන් කෙරෙන් මිදීම) ඵලය කොට ඇත්තී වේද? චිත්ත විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීද? ප්‍රඥා විමුක්තිය ඵලය කොට ඇත්තීද? ප්‍රඥා විමුක්ති ඵලය අනුසස්කොට ඇත්තීද?"

"ඇවැත්නි, අංගපසකින් උපකාර ලද්දාවූ සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය ඵලය කොට ඇත්තීය. චිත්ත විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීය. ප්‍රඥා විමුක්ති ඵලය කොට ඇත්තීය. ප්‍රඥා විමුක්ති ඵලය අනුසස් කොට ඇත්තීය. ඇවැත්නි, මේ ශාසනයෙහි සම්‍යක් දෘෂ්ටිය ශීලයෙන් ලබන ලද උපකාර ඇත්තී වේද, බහුශ්‍රැත බවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, සාකච්ඡාවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, සමථයෙන් ලබනලද උපකාර ඇත්තී වේද, විදර්ශනාවෙන් ලබනලද උපකාර ඇත්තී වේද, ඇවැත්නි, මේ ධර්ම පසකින් උපකාර ලද සම්‍යක් දෘෂ්ටිය චිත්ත විමුක්තිය ඵලය කොට ඇත්තීද වේ. චිත්ත විමුක්ති ඵලය ප්‍රයෝජන කොට ඇත්තීද වේ. ප්‍රඥාවිමුක්තිය ඵලය කොට ඇත්තීද වේ. ප්‍රඥාවිමුක්ති ඵලය ප්‍රයෝජනය කොට ඇත්තීද වේ.

5. "ඇවැත්නි, භවයෝ කී දෙනෙක්ද?" "ඇවැත්නි, කාමභවය රූපභවය, අරූප භවයයයි මේ භව තුනකි."

"ඇවැත්නි, කෙසේ නම් නැවත නැවත ඉපදීම වේද?"

"ඇවැත්නි, අවිද්‍යාවෙන් වැසුනාවූ, තෘෂ්ණාවෙන් බැඳුනාවූ සත්ත්වයින්ගේ ඒ ඒ භවයෙහි ඇලීම ඇතිවෙයි. මෙසේ නැවත නැවත භවයෙහි ඉපදීම ඇති වෙයි."

"ඇවැත්නි, කෙසේ නම් නැවත නැවත භවයෙහි ඉපදීම නොවේද?" "ඇවැත්නි, අවිද්‍යාව නැති කිරීමෙන් අර්හත් මාර්ග විද්‍යාව පහළවීමෙන් තෘෂ්ණාව නැති කිරීමෙන් මෙසේ නැවත නැවත භවයෙහි ඉපදීම සිදු නොවේ."

**6.** "ඇවැත්නි, ප්‍රථමද්ධ්‍යානය නම් කවරේද?" "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සැප ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ වාසය කරයි, ඇවැත්නි, මේ ප්‍රථමධ්‍යානයයි කියනු ලැබේ."

"ඇවැත්නි, ප්‍රථමධ්‍යානය කෙතෙක් අංගයකින් යුක්තද?" "ඇවැත්නි, ප්‍රථමධ්‍යානය අංග පසකින් යුක්තය. ඇවැත්නි, මේ ශාසනයෙහි ප්‍රථමධ්‍යානයට සමවදින්නාවූ මහණහට විතර්කයද විචාරයද, ප්‍රීතියද, සැපයද සිත එකඟබවද පවතියි ඇවැත්නි, ප්‍රථමධ්‍යානය මෙසේ අංග පසක් ඇත්තේ වෙයි."

"ඇවැත්නි, ප්‍රථමධ්‍යානය කෙතෙක් අංගයකින් දුරුවේද, කෙතෙක් අංගයකින් යුක්තද?" "ඇවැත්නි, ප්‍රථම ධ්‍යානය අංගපසකින් දුරුවේ. අංග පසකින් යුක්තවේ. ඇවැත්නි, මේ ශාසනයෙහි ප්‍රථමද්ධ්‍යානයට සමවැදුනාවූ භික්ෂු වගේ කාමච්ඡන්ද නීවරණය නැති වූයේ වෙයි. ව්‍යාපාද නීවරණය නැති වූයේ වෙයි. ථීනමිද්ධ නීවරණය නැති වූයේ වෙයි. උද්ධච්චකුක්කුච්ච නීවරණය නැති වූයේ වෙයි. විචිකිච්ඡා නීවරණය නැති වූයේ වෙයි. විතර්කයද, විචාරයද, ප්‍රීතියද, සැපයද සිත එකඟ බවද පවතියි. ඇවැත්නි, මෙසේ ප්‍රථම ධ්‍යානය අංග පසකින් දුරු වූයේද, අංග පසකින් යුක්ත වූයේද වෙයි."

**7.** "ඇවැත්නි, නොයෙක් අරමුණු විෂයකොට ඇති, නොයෙක් අරමුණු ගොදුරුකොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු නොගන්නා මේ ඉන්ද්‍රිය පසක් වෙත්. ඔහු කවරහුද? චක්ෂු ඉන්ද්‍රියය, ශ්‍රොත ඉන්ද්‍රියය, ඝ්‍රාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය යනුයි. ඇවැත්නි, නොයෙක් අරමුණු විෂය කොට ඇති, නොයෙක් අරමුණු ගොදුරු කොට ඇති, එකිනෙකට

අයත්වූ අරමුණු නොගන්නාවූ මේ ඉන්ද්‍රියයන්ගේ පිහිටීම කුමක්ද, ඔවුන්ගේ අරමුණු රසය කවරෙක් විඳීද?"

"ඇවැත්නි, නොයෙක් අරමුණු විෂයකොට ඇති, නොයෙක් අරමුණු ගොදුරුකොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු නොගන්නා මේ ඉන්ද්‍රිය පසක් වෙත්. ඔවුහු කවරහුද? චක්ඛු ඉන්ද්‍රියය, සොත ඉන්ද්‍රියය, ඝාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය (යනුයි) ඇවැත්නි, නොයෙක් අරමුණු විෂය කොට ඇති, නොයෙක් අරමුණු ගොදුරු කොට ඇති, එකිනෙකට අයත්වූ අරමුණු රසය නොගන්නාවූ මේ ඉන්ද්‍රියය පසට සිත පිහිටයි. සිත ඔවුන්ගේ අරමුණු රසය අනුභව කරයි."

"ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පසක් වෙත්. කවරහුද? චක්ඛු ඉන්ද්‍රියය, සොත ඉන්ද්‍රියය, ඝාණ ඉන්ද්‍රියය, ජිව්හා ඉන්ද්‍රියය, කාය ඉන්ද්‍රියය (යනුයි.) ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පස කුමක් නිසා පවතිත්ද?" "ඇවැත්නි, මේ ඉන්ද්‍රිය පස ආයුෂ (ජීවිත ඉන්ද්‍රිය) නිසා පවතිත්.

"ඇවැත්නි, ආයුෂය වනාහි කුමක් නිසා පවතීද? ආයුෂය උෂ්ණය (කර්මයෙන් උපන් තෙජෝ ධාතුව) නිසා පවතියි." "ඇවැත්නි, උෂ්ණය කුමක් නිසා පවතීද?" උෂ්ණය ආයුෂ (ජීවිතෙන්ද්‍රිය) නිසා පවතියි."

"ඇවැත්නි, ආයුෂය උෂ්ණය නිසා පවතීයයි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ කීම අපි දැන් මෙසේ දනිමු. ඇවැත්නි, උෂ්ණය ආයුෂය නිසා පවතීයයි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ කීම අපි දැන් මෙසේ දනිමු. ඇවැත්නි, කෙසේ නම් මේ කීමෙහි අර්ථය දත යුතුද?" ඇවැත්නි, එසේවී නම් තොපට උපමාවක් කියමි. මේ ලොකයෙහි ඇතැම් නුවණ ඇත්තෝ උපමාවෙන්ද කියන ලද්දෙහි අර්ථය දැන ගනිති. ඇවැත්නි, ඇවිලෙන්නාවූ තෙල් පහනෙහි ගිනිදලුව නිසා ආලොකය පෙනේද, ආලොකය නිසා ගිනිදලුව පෙනේද, ඇවැත්නි, එපරිද්දෙන්ම ආයුෂය උෂ්ණය නිසා පවතියි. උෂ්ණය ආයුෂ නිසා පවතියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වෙදනා ධර්මයෝත් එකක්මද? නැතහොත් ආයුසංස්කාරයෝ වෙනමද? වෙදනා ධර්මයෝ වෙනමද?" "ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වෙදනා ධර්මයෝත් එකක්ම නොවෙති. ඇවැත්නි, ආයුසංස්කාරයෝත් වෙදනාධර්මයෝත් එකක්ම වූවාහු නම් නිරොධ සමාපත්තියට පැමිණියාවූ භික්ෂුවගේ නැගී සිටීම නොපෙණෙයි. ඇවැත්නි, යම් හෙයකින් ආයුසංස්කාරයෝ අන්‍යයෝද, වෙදනාධර්මයෝ අන්‍යයෝද එහෙයින් නිරොධ සමාපත්තියට පැමිණියාවූ භික්ෂුවගේ නැගීසිටීම පෙණෙයි"

"ඇවැත්නි, යම් විටෙක මේ ශරීරය හරණලද, ඉවත දමනලද, සිත් නැති දඬුකඩක් මෙන් පවතීද, එවිට මේ ශරීරය කෙතෙක් ධර්ම අත්හරියිද?" "ඇවැත්නි, යම්විටෙක ආයුෂය, උෂ්ණය, විඤ්ඤාණය යන ධර්මතුන මේ ශරීරය අත්හරිද්ද, එකල මේ ශරීරය හරනලද, ඉවත දමනලද, සිත්නැති දඬු කඩක් මෙන් පවතියි."

9 "ඇවැත්නි, යම් මේ සත්ත්වයෙක් තෙම මළේද, කලුරිය කෙළේද, යම් මේ භික්ෂුවක් තෙම නිරොධ සමාපත්තියට පැමිණියේද, මොවුන් දෙදෙනාගේ වෙනස කුමක්ද?" "ඇවැත්නි, යම් මේ පුද්ගලයෙක් තෙම මළේද, කලුරිය කෙළේද, ඔහුගේ කායසංස්කාරය (ආශ්වාස ප්‍රශ්වාස) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි. වාක්සංස්කාරය (විතර්ක විචාර) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි. චිත්ත සංස්කාරය (සංඥා වේදනා) නැතිවුණේ වෙයි, සංසිඳුනේ වෙයි, ආයුෂය ගෙවුනේය. උෂ්ණය (කර්මජ තෙජස) සංසිඳුනේය. ඉන්ද්‍රියයෝ බිඳුනාහ. යම් මේ භික්ෂුවක් තෙම නිරොධසමාපත්තියට පැමිණියේද ඔහුගේද කායසංස්කාර (ආශ්වාස ප්‍රශ්වාස) නැතිවුණේ වෙයි, සංසිඳුණේ වෙයි. වචී සංස්කාරය (විතර්ක විචාර) නැතිවුණේ වෙයි, සංසිඳුණේ වෙයි. චිත්ත සංස්කාර (සංඥා වේදනා) නැතිවුනේ වෙයි, සංසිඳුණේ වෙයි. එහෙත් ආයුෂය නොගෙවුනේය. උෂ්ණය නොසන්සිඳුනේය. ඇස් ආදී ඉන්ද්‍රියයෝ විශෙෂයෙන් පැහැදිලියහ. ඇවැත්නි, යම් මේ සත්වයෙක් මළේද, කළුරිය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කළේද, යම් මේ භික්ෂුවක් නිරොධ සමාපත්තියට සම වැදුනේද මොවුන් දෙදෙනාගේ මේ වෙනසයි."

**10.** "ඇවැත්නි, අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චිත්තවිමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යයෝ කෙතෙක්ද?" "ඇවැත්නි, අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චෙතො විමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යය සතරක් වෙත්. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සැපය නැති කිරීමෙන්ද, දුක නැති කිරීමෙන්ද, පළමු කොටම සොම්නස් දොම්නස් දෙක දුරලීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඇවැත්නි, මේ වනාහි අදුක්ඛමසුඛ (දුක්ද නොවූ සැපද නොවූ) චිත්ත විමුක්තියට පැමිණීමේ ප්‍රත්‍යය සතරයි."

"ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට (නිරොධ සමාපත්තියෙන් නැගී සිටින ඵලසමාපත්තියට) සමවැදීමෙහි ප්‍රත්‍යය කෙතෙක්ද? "ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට පැමිණීමෙහි ප්‍රත්‍යය දෙකකි. සියලු රූපාදී අරමුණු මෙනෙහි නොකිරීම හා නිර්වාණ ධාතුව මෙනෙහි කිරීමය. ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තියට පැමිණීමෙහි මේ ප්‍රත්‍යය දෙක වෙයි"

"ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තිහුගේ පැවැත්ම පිණිස ප්‍රත්‍යය කෙතෙක්ද?" "ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තිහුගේ පැවැත්ම පිණිස ප්‍රත්‍යය තුනෙකි. සියලු රූපාදී නිමිති මෙනෙහි නොකිරීමද, නිර්වාණධාතුව මෙනෙහි කිරීමද, සමවැදීමට පළමුව කාලය පිරිසිදීමද යන (තුනයි.) ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තිහුගේ පැවැත්මට මේ ප්‍රත්‍යය තුන වෙයි."

"ඇවැත්නි, ඵල සමාපත්තියෙන් නැගීසිටීමට ප්‍රත්‍යය කෙතෙක්ද?" සියලු රූපාදි නිමිති මෙනෙහි නොකිරීමද, නිර්වාණ ධාතුව මෙනෙහි නොකිරීමද යන දෙකයි, ඇවැත්නි, අනිමිත්ත චෙතොවිමුක්තියෙන් නැගී සිටීමට මේ ප්‍රත්‍ය දෙක වෙයි."

"ඇවැත්නි, අප්පමාණ නම්වූ යම් චිත්ත විමුක්තියක් වේද, ආකිඤ්චඤ්ඤ නම්වූ යම් චිත්තවිමුක්තියක් වේද, යම් සුඤ්ඤත

නම් චිත්ත විමුක්තියක් වේද, යම් අනිමිත්ත නම්වූ චිත්ත විමුක්තියක් වේද, මේ ධර්මයෝ නොයෙක් අර්ථ ඇත්තාහුද? නොයෙක් අක්ෂර ඇත්තාහුද? නොහොත් එකම අර්ථ ඇත්තෝද? අක්ෂර පමණක් වෙනස්ද."

"ඇවැත්නි, යම් අප්පමාණ නම් චිත්තවිමුක්තියක් වේද, යම් ආකිංචඤ්ඤ නම් චිත්තවිමුක්තියක් වේද, යම් සුඤ්ඤත නම් චිත්තවිමුක්තියක් වේද, යම් අනිමිත්ත නම් චිත්තවිමුක්තියක් වේද, ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථ ඇත්තාහු නොයෙක් අක්ෂර ඇත්තාහු වෙත්ද, එබඳු ක්‍රමයක්ද ඇත. ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ එකම අර්ථ ඇත්තාහු අක්ෂරයෙන් පමණක් වෙනස්වූවාහු වෙත්ද, එබඳු ක්‍රමයක්ද ඇත."

11 "ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ නොයෙක් අර්ථවත් වූවාහු අක්ෂරයෙන් වෙනස් වූවාහු වෙද්ද, ඒ ක්‍රමය කුමක්ද?" "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම මෛත්‍රී සහගතවූ සිතින් එක් දිසාවක් පැතිර වාසය කරයිද, එසේම දෙවන දිසාවද එසේම තුන්වන දිසාවද එසේම සතරවන දිසාවද, මෙසේ උඩ යට, සරස සියලු තන්හි, සියලු ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්වූ, මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මෛත්‍රී සහගත සිතින් පැතිර වාසය කරයිද, කරුණා සහගත සිතින් එක් දිශාවක් පැතිර වාසය කරයිද, එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි, සියලු ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ, මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ කරුණා සහගත සිතින් පැතිර වාසය කරයිද.

"මුදිතා සහගත සිතින් එක් දිශාවක පැතිර වාසය කරයිද එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි, සියලු ආකාරයෙන්, සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්වූ මහත් බවට

පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මුදිතා සහගත සිතින් පැතිර වාසය කරයිද.

"උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක පැතිර වාසය කරයිද එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ, යට, සරස, සියලු තැන්හි සියලු ආකාරයෙන් සියල්ලෙන් යුක්තවූ ලොකය, මහත්වූ, මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ෂා සහිත සිතින් පැතිර වාසය කරයි. ඇවැත්නි, මේ වනාහි අප්‍රමාණ චෙතොවිමුක්තිය යයි කියනු ලැබේ."

12. "ඇවැත්නි, ආකිඤ්චඤ්ඤායතන චිත්ත විමුක්තිය කවරීද" ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, මෙය ආකිචඤ්ඤ නම් චිත්ත විමුක්තියයි කියනු ලැබේ." "ඇවැත්නි, සුඤ්ඤත චිත්ත විමුක්තිය කවරීද" "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම අරණ්‍යකට ගියේ හෝ රුකක් මුලට ගියේ හෝ ශුන්‍යාගාරයකට ගියේ හෝ 'මෙය ආත්මයෙන් හෝ, ආත්මය පිළිබඳ වූවකින් හෝ හිස්ය'යි කල්පනා කරයිද ඇවැත්නි, මෙය සුඤ්ඤත චෙතොවිමුක්තියයයි කියනු ලැබේ."

"ඇවැත්නි, අනිමිත්ත චිත්තවිමුක්තිය කවරීද" "ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සියලු රූපාදි නිමිති මෙනෙහි නොකිරීමෙන් නිමිත්ත රහිතවූ චිත්ත සමාධියට පැමිණ වාසය කරයිද, ඇවැත්නි, මෝ තොම අනිමිත්ත චිත්ත විමුක්තියයි කියනු ලැබේ. ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ වෙනස් අර්ථ ඇත්තාහු වෙත්ද, වෙනස් අක්ෂර ඇත්තාහු වෙත්ද මේ ඒ ක්‍රමයයි.

13. "ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ අර්ථයෙන් එකක් වූවාහුද, අක්ෂරයෙන් පමණක් වෙනස් වෙත්ද, ඒ ක්‍රමය කවරේද?" "ඇවැත්නි, රාගය වනාහි ප්‍රමාණ කරණ

(පුද්ගලයාගේ ප්‍රමාණය දක්වන) ධර්මයෙකි. ද්වෙෂය ප්‍රමාණ කරණ ධර්මයෙකි. මොහය ප්‍රමාණ කරණ ධර්මයෙකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. උදුරනලද මුල් ඇත්තාහුය. අගින් කැපූ තල් ගසක් මෙන් කරන ලද්දහ. විනාශ කරන ලදහ. මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, අප්‍රමාණ චිත්තවිමුක්තීහු යම් පමණක් වෙත්ද, ඔවුන් අතුරෙන් අර්හත්ඵල චිත්ත විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චිත්ත විමුක්තිය රාගයෙන් හිස්ය. ද්වෙෂයෙන් හිස්ය. මොහයෙන් හිස්ය.

"ඇවැත්නි, රාගය වනාහි (සත්ත්වයන් මඩින හෙයින්) පළිබොධයෙකි. ද්වෙෂය පළිබොධයෙකි. මොහය පළිබොධයෙකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. මුල් උදුරන ලද්දාහුය. සිඳිනලද තල් ගසක් මෙන් කරනලදහ. මතු නූපදින ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, ආකිඤ්චඤ්ඤ චිත්තවිමුත්තීහු යම් පමණ වෙත්ද, ඔවුනතුරෙන් අර්හත්ඵල චිත්ත විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත් ඵල විමුක්තිය රාගයෙන් හිස්ය, ද්වෙෂයෙන් හිස්ය, මොහයෙන් හිස්ය.

"ඇවැත්නී, රාගය වනාහි (පෘථග්ජන පුද්ගලයා) හැඳින ගැණීමට ලකුණකි. ද්වෙෂය හැඳින ගැනීමට ලකුණකි. මොහය හැඳින ගැනීමට ලකුණකි. රහත් භික්ෂුවගේ ඒ රාගාදිය නැති වූවාහුය. සිඳිනලද මුල් ඇත්තාහ. සිඳිනලද තල් ගසක් මෙන් කරන ලදහ. නැති කරණ ලදහ. මත්තෙහි නූපදිනා ස්වභාව ඇත්තාහ. ඇවැත්නි, අනිමිත්ත චිත්ත විමුක්තීහු යම් පමණ වෙත්ද, ඔවුනතුරෙන් අර්හත්ඵල විමුක්තිය අග්‍රයයි කියනු ලැබේ. ඒ අර්හත්ඵල චිත්තවිමුක්තිය රාගයෙන් හිස්ය, ද්වෙෂයෙන් හිස්ය, මොහයෙන් හිස්ය, ඇවැත්නි, යම් ක්‍රමයකට පැමිණ මේ ධර්මයෝ එකාට ඇත්තාහු වෙත්ද, අක්ෂරයෙන් පමණක් වෙනස් වෙත්ද, මේ ඒ ක්‍රමයයි." ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. සතුටුවූ මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**තුන්වෙනිවූ මහා වෙදල්ල සූත්‍රය නිමි. (5-3)**

## 44. චූල වෙදල්ල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ, වේලුවනාරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි, විසාඛනම් උපාසක තෙම ධම්ම දින්නා නම් මෙහෙණිය යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් ධම්මදින්නා මෙහෙණියට වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ විසාඛ උපාසක තෙම ධම්මදින්නා මෙහෙණියට මෙසේ කීයේය.

"ආයර්‍ය්‍යාවෙනි, සක්කාය සක්කාය යයි කියනු ලැබේ. ආයර්‍ය්‍යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කවරක් වනාහි සක්කායයයි වදාරණ ලදද?" "ඇවැත්නි, විසාඛයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ උපාදානස්කන්ධ පස සක්කායයයි වදාරණ ලදී. කවරහුද? රූප උපාදාන ස්කන්ධය, වෙදනා උපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංඛාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය, යන පසයි. ඇවැත්නි, විසාඛයෙනි, මේ පඤ්චවිධ උපාදානස්කන්ධයෝ භාග්‍යවතුන් වහන්සේ විසින් සක්කායයි වදාරණ ලදහ."

2. "ආයර්‍ය්‍යාවෙනි, යහපතැයි" විසාඛ උපාසක තෙම ධම්ම දින්නා නම් භික්ෂුණියගේ වචනයට සතුටුවී එය පිළිගෙන ධම්ම දින්නා භික්ෂුණියගෙන් ඊළඟ ප්‍රශ්නය විචාළේය. "ආයර්‍ය්‍යාවෙනි සක්කාය සමුදය සක්කාය සමුදය (සක්කාය දෘෂ්ටිය පහළ වීමට හේතුව) යයි කියනු ලැබේ. ආයර්‍ය්‍යාවෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කවරක් නම් සක්කාය සමුදයයයි වදාරණ ලදද?" ඇවැත් විසාඛයෙනි, නැවත ඉපදීම ඇති කරන්නාවූ, නන්දිරාගය හා එක්ව පැවැත්තාවූ, ඒ ඒ රූපාදි අරමුණෙහි, සතුටු වන්නාවූ, යම් මේ තෘෂ්ණාවක් වේද, එනම්:- (කාම වස්තු විෂයෙහි පැවැති) කාමතෘෂ්ණාවය, (ශාශ්වත දෘෂ්ටි සහගත) භවතෘෂ්ණාවය, (උච්ඡෙද දෘෂ්ටි සහගත) විභව තෘෂ්ණාවය, යන තෘෂ්ණාවයි. ඇවැත්නි, විසාඛයෙනි, මේ තෘෂ්ණාව වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සක්කාය සමුදයයයි වදාරණ ලදී."

3 "ආයුෂ්මතුන්වෙනි, සක්කාය නිරොධය සක්කාය නිරොධය (සක්කාය දෘෂ්ටිය නැතිකිරීම) යයි කියනු ලැබේ. ආයුෂ්මතුන්වෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලද, සක්කාය නිරොධය කවරේද?" "ඇවැත් විසාඛයෙනි, ඒ පළමු දැක්වූ තෘෂ්ණාවගේම ඉතිරි නොකර නැති කිරීමක් වේද, බැහැර කිරීමක් වේද' දුරලීමක් වේද, මිදීමක් වේද, නොඇල්මක් වේද ඇවැත් විසාඛායෙනි, මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් සක්කාය නිරොධයයයි වදාරණ ලද්දේය."

"ආයුෂ්මතුන්වෙනි, සක්කාය නිරොධ ගාමිනී ප්‍රතිපදාව, සක්කාය නිරොධය ගාමිනී ප්‍රතිපදාවයයි (සක්කාය දෘෂ්ටිය නැති කිරීමේ මග) කියනු ලැබේ. ආයුෂ්මතුන්වෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් කවරක් සක්කාය නිරොධ ගාමිනි ප්‍රතිපදාව යයි, වදාරණ ලදද?" "ඇවැත්නි විසාඛයෙනි, මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයම භාග්‍යවතුන් වහන්සේ විසින් සක්කාය නිරොධ ගාමිනී ප්‍රතිපදාවයයි වදාරණ ලදී. එනම්:- නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාව, නිවැරදි උත්සාහය, නිවැරදි සිහිය, නිවැරදි සමාධිය යන මොහුයි."

4. "ආයුෂ්මතුන්වෙනි, උපාදානයත් උපාදාන, ස්කන්ධ පසත් එකමද? නැතහොත් උපාදානය උපාදාන ස්කන්ධපසෙන් වෙනස්ද?" "ඇවැත්නි, විසාඛයෙනි, උපාදානයත් උපාදාන ස්කන්ධ පසත් එකම නොවේ. උපාදාන ස්කන්ධ පස හැර උපාදානයක්ද නැත. ඇවැත්නි, විසාඛයෙනි, උපාදාන ස්කන්ධ පස කෙරෙහි යම් ඇලීමක් වේ නම් එය එහි උපාදානයයි"

5 "ආයුෂ්මතුන්වෙනි, කෙසේ නම් සක්කාය දෘෂ්ටිය වේද? ඇවැත්නි, විසාඛයෙනි, මේ ලොකයෙහි බුද්ධාදි ආර්‍ය්‍යයන් නොදැක්කාවූ, ආර්‍ය්‍යධර්මයෙහි අදක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, බුද්ධාදී සත්පුරුෂයන් නුදුටුවාවූ, සත්පුරුෂ ධර්මයෙහි, අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ නූගත් පෘථග්ජනතෙම රූපය තමා වශයෙන් හෝ දකියි තමා රූප සහිත යයි කියා හෝ දකියි. තමා කෙරෙහි රූපය ඇතැයි හෝ

දකියි. රූපය තමා කෙරෙහි පිහිටියේයයි හෝ දකියි. වෙදනාව තමා වශයෙන් හෝ දකියි තමා වේදනාව සහිතය කියා හෝ දකියි තමා කෙරෙහි වේදනාව පිහිටියේයයි හෝ දකියි. වේදනාවෙහි තමා පිහිටියේයයි හෝ දකියි. සංඥාව තමා වශයෙන් හෝ දකියි. තමා සංඥා සහිතය කියා හෝ දකියි. තමා කෙරෙහි සංඥාව පිහිටියේයයි කියා හෝ දකියි. සංඥාවෙහි තමා පිහිටියේයයි හෝ දකියි. සංස්කාරයන් තමා වශයෙන් හෝ දකියි. තමා සංස්කාර සහිතය කියා හෝ දකියි. තමා කෙරෙහි සංස්කාරයන් පිහිටියේයයි කියා හෝ දකියි. සංස්කාරයන් කෙරෙහි තමා පිහිටියේයයි හෝ දකියි. විඥානය තමා වශයෙන් දකියි. තමා විඥානය සහිතය කියා හෝ දකියි. තමා කෙරෙහි විඥානය පිහිටියේයයි හෝ දකියි. විඥානයෙහි තමා පිහිටියේයයි හෝ දකියි. විසාඛය, මෙසේ වනාහි සක්කාය දෘෂ්ටිය වෙයි.”

“ආයුෂ්මාවෙනි, කෙසේ නම් සක්කාය දෘෂ්ටිය නොවේද?” “ඇවැත්නි, විසාඛයෙනි, බුද්ධාදී ආයර්‍යයන් නුවණැසින් දුටුවාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි මනාව හික්මුනාවූ බුද්ධාදී සත්පුරුෂයන් දුටුවාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි හික්මුනාවූ උගත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපය තමා වශයෙන් නොදකියි. තමා රූපය සහිතයයි කියා හෝ නොදකියි. තමා කෙරෙහි රූපය ඇතැයි හෝ නොදකියි. රූපයෙහි තමා පිහිටියේයයි හෝ නොදකියි. වෙදනාව තමා වශයෙන් හෝ නොදකියි. තමා වෙදනාව සහිතයයි හෝ නොදකියි තමාකෙරෙහි වෙදනාව පිහිටියේයයි හෝ නොදකියි. වෙදනාවෙහි තමා පිහිටියේයයි හෝ නොදකියි. සංඥාව තමා වශයෙන් නොදකියි. තමා සංඥාව සහිතයයි හෝ නොදකියි. තමා කෙරෙහි සංඥාව පිහිටියේයයි හෝ නොදකියි. සංඥාවෙහි තමා පිහිටියේයයි හෝ නොදකියි. සංස්කාරයන් ආත්ම වශයෙන් හෝ නොදකියි. තමා සංස්කාරය සහිතයයි හෝ නොදකියි. තමා කෙරෙහි සංස්කාරයන් පිහිටියේයයි හෝ නොදකියි. සංස්කාරයන්හි තමා පිහිටියේයයි හෝ නොදකියි. විඤ්ඤාණය තමා වශයෙන් හෝ නොදකියි. තමා විඤ්ඤාණය සහිතයයි

පටුන



හෝ නොදකියි. විඥ්ඥාණයෙහි තමා පිහිටියේයයි හෝ නොදකියි. ඇවැත් විසාඛයෙනි, මෙසේ සක්කාය දෘෂ්ටිය නොවේ."

**6.** "ආයෂ්‍යාවෙනි, ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගයතෙම කවරේද?" "ඇවැත්නි, විසාඛයෙනි, අංග අටක් ඇති මේ ආයෂ්‍ය මාර්ගය මැයි. එනම් නිවැරදි දැකීමය, නිවැරදි කල්පනාවය, නිවැරදි වචනය, නිවැරදි කර්මාන්තය, නිවැරදි ජීවිකාවය, නිවැරදි උත්සාහයය, නිවැරදි සිහියය, නිවැරදි සමාධියය' (යන අටයි)

"ආයෂ්‍යාවෙනි, ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගය තෙම හේතූන් නිසා හටගන්නා ලද්දක්ද? නැතහොත් හේතූන් නිසා හට නොගන්නා ලද්දක්ද?" "ඇවැත් විසාඛයෙනි, ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගයතෙම හේතූන් නිසා හටගන්නා ලද්දකි." "ආයෂ්‍යාවෙනි, ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි ස්කන්ධ තුන සංග්‍රහ කරන ලද්දාහුද? නැතහොත් සීලාදී ස්කන්ධ තුණෙහි ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරන ලද්දේද?" "ඇවැත් විසාඛයෙනි, ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගයෙහි සීලාදී ස්කන්ධ තුන සංග්‍රහ කරණ ලද්දේ නොවේ. ඇවැත්නි විසාඛයෙනි, ස්කන්ධ තුනෙහි ආයෂ්‍ය අෂ්ටාංගික මාර්ගය සංග්‍රහ කරණලදී. ඇවැත්නි, විසාඛයෙනි, යම් නිවැරදි වචනයක් වේද, යම් නිවැරදි කර්මාන්තයක් වේද, යම් නිවැරදි ජීවිකාවක් වේද, මේ ධර්මයෝ ශීල ස්කන්ධයෙහි ඇතුළත් කරන ලදහ. යම් නිවැරදි උත්සාහයක් වේද, යම් නිවැරදි සිහියක් වේද, යම් නිවැරදි සමාධියක් වේද, මේ ධර්මයෝ සමාධිස්කන්ධයෙහි ඇතුළත් කරන ලදහ. යම් නිවැරදි දැනීමක් වේද, යම් නිවැරදි කල්පනාවක් වේද, මේ ධර්මයෝ ප්‍රඥා ස්කන්ධයෙහි ඇතුළත් කරන ලදහ."

7 "ආයෂ්‍යාවෙනි, සමාධිය කවරේද? සමාධි නිමිති කවරහුද? සමාධි පිරිවර කවරහුද? සමාධි භාවනාව කවරීද?" ඇවැත් විසාඛයෙනි, හිතෙහි යම් එකඟබවක් වේද ඒ සමාධියයි. සතර සතිපට්ඨානය, සමාධි නිමිත්තයෝය. සම්‍යක් ප්‍රධාන වීයෂ්‍ය සතර සමාධි පිරිවරය, ඒ ධර්මයන්ගෙන්ම සෙවනය කිරීම, වැඩීම, බහුල කිරීම, යන යමක් ඇද්ද ඒ එහි සමාධි භාවනාවයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8 "ආයය්‍ර්‍යාවෙනි, සංස්කාරයෝ කීදෙනෙක්ද?" "ඇවැත්නි, විසාඛයෙනි, මේ සංස්කාරයෝ තුන්දෙනෙකි. කාය සංස්කාරය, වාක් සංස්කාරය, චිත්ත සංස්කාරය" (යන තුනයි.)

"ආයය්‍ර්‍යාවෙනි, කාය සංස්කාරය කවරේද? වාක් සංස්කාරය කවරේද? චිත්ත සංස්කාරය කවරේද?" "ඇවැත් විසාඛයෙනි, ආශ්වාස ප්‍රශ්වාසයෝ කාය සංස්කාරයෝයි විතර්ක විචාරයෝ වාක් සංස්කාරයෝ වෙත්. සංඥාවත්, වේදනාවත් චිත්ත සංස්කාරයයි."

"ආයය්‍ර්‍යාවෙනි, ආශ්වාස ප්‍රශ්වාසයෝ කවර හෙයින් කාය සංස්කාර නම් වේද? විතර්ක විචාර දෙක කවර හෙයින් වාක් සංස්කාර නම් වේද? සංඥා වේදනා දෙක කවර හෙයින් චිත්ත සංස්කාර නම් වේද?" "ඇවැත් විසාඛයෙනි, ආශ්වාස ප්‍රශ්වාසයෝ වනාහි කයෙහි හටගත්තාහුය. මේ ධර්මයෝ වනාහි කය පිළිබඳය (හෙවත් කය ඇතිකල්හි මිස නැති කල්හි ඇති නොවන්නාහ.) එහෙයින් ආශ්වාස ප්‍රශ්වාස දෙක කාය සංස්කාර නමි. ඇවැත් විසාඛයෙනි, පළමුකොටම කල්පනා කොට විචාරණය කොට, පසුව වචන කථාකරනු ලැබේ. එහෙයින් විතර්ක විචාරයෝ වාක් සංස්කාරයි, සංඥාවත් වේදනාවත් සිතෙහි හටගන්නාහුය. මේ ධර්මයෝ සිත පිළිබඳය, (සිත ඇති කල්හි ම හටගන්නාහුය.) එහෙයින් සංඥාවත් වේදනාවත් චිත්ත සංස්කාරයි."

**9.** "ආයය්‍ර්‍යාවෙනි, කෙසේ වනාහි සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තිය (සංඥා වේදනාවන් නිරුද්ධවීම් ඇති සමාපත්තිය) වේද?" "ඇවැත් විසාඛයෙනි, නිරොධ සමාපත්තියට පැමිණෙන්නාවූ භික්ෂුහට 'මම නිරොධසමාපත්තියට පැමිණෙන්නෙමි'යි කියා හෝ 'මම සංඥාවේදයිත නිරොධ සමාපත්තියට සමවදිමි' කියා හෝ 'මම නිරොධ සමාපත්තියට සමවැදුනෙමි කියා හෝ මෙබඳු සිතක් ඇති නොවෙයි. එහෙත් යම් සිතක් ඒ අචිත්තක භාවය (සිත් නැති බව) පිණිස පමුණුවාද, ඒ සිත නිරොධ සමාපත්තිය සමවදින්නට පළමුවෙන්ම එසේ වඩන ලද්දේ වෙයි."

"ආයුෂ්මතුනි, සඤ්ඤාවේදයිත නිරොධසමාපත්තියට පැමිණෙන්නාවූ, මහණහට කවර ධර්මයෝ පළමුකොට නැති වෙත්ද? කාය සංස්කාරය හෝ නැතිවේද, වාක්සංස්කාරය හෝ නැතිවේද? චිත්ත සංස්කාරය හෝ නැති වේද?" "ඇවැත්නි, විශාඛයෙනි, සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියට පැමිණෙන්නාවූ භික්ෂුවහට පළමුව වාක් සංස්කාරය නැති වෙයි. ඉන්පසුව කාය සංස්කාරයද, ඉන්පසු චිත්ත සංස්කාරයද, නැතිවෙයි."

"ආයුෂ්මතුනි, කෙසේ නම් සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී සිටීම වේද?" "ඇවැත් විසාඛයෙනි, සඤ්ඤාවෙදයිත නිරොධ සමාප්තියෙන් නැගී සිටින්නාවූ භික්ෂුවහට මෙබඳු අදහසක් නොවෙයි. මම සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැඟිසිටින්නෙමි කියා හෝ මම සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගිටිමි කියා හෝ මම සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගිටියෙමි කියා හෝ (අදහස් නොවෙයි) එහෙත් ඔහු විසින් යම් සිතක් ඒ අචිත්තභාවය පිණිස පමුණුවාද, සමවැදීමට පළමු කොටම ඒ සිත එසේ වඩන ලද්දේ වෙයි."

"ආයුෂ්මතුනි, සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී සිටින භික්ෂුවහට කවර ධර්මයෝ පළමු කොට උපදිද්ද? කාය සංස්කාරයද? වාක් සංස්කාරයද? චිත්ත සංස්කාරයද?" "ඇවැත් විසාඛයෙනි, සඤ්ඤාවේදයිත නිරොධ සමාපත්තියෙන් නැගීසිටින භික්ෂුවහට පළමුකොට චිත්ත සංස්කාරය උපදියි. ඉන්පසු කාය සංස්කාරය උපදියි. ඊට පසු වාක් සංස්කාරය උපදියි."

"ආයුෂ්මතුනි, සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී සිටියාවූ මහණහු කෙතෙක් ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්ද?" "ඇවැත් විසාඛයෙනි, සඤ්ඤාවෙදයිත නිරොධසමාපත්තියෙන් නැගී සිටි භික්ෂුව ස්පර්ශ තුනක් ස්පර්ශ කරති, ශූන්‍යතා ස්පර්ශය, අනිමිත්ත ස්පර්ශය, අප්‍රණිහිත ස්පර්ශය යන තුනයි."

"ආයුෂ්මතුනි, සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියෙන් නැගී සිටියාවූ, භික්ෂුවගේ සිත කුමකට නැමුණේ වේද? කුමකට

හැරුණේ වේද? කුමකට බරවූයේ වේද?" "ඇවැත් විසාඛයෙනි, සඤ්ඤාවේදයිත නිරොධ සමාපත්තියෙන් නැගී සිටි භික්ෂුවගේ සිත විවේකයට (නිර්වාණයට) නැමුනේවෙයි. නිර්වාණයට හැරුණේවෙයි. නිර්වාණයට බරවූයේ වෙයි."

**10.** "ආයුෂ්මාවෙනි, වේදනාවෝ කෙතෙක්ද?" "ඇවැත් විසාඛයෙනි, වේදනා තුනකි. සැප වේදනාවය, දුක් වේදනාවය, උපෙක්ෂා වේදනාවය" (යන තුනය) "ආයුෂ්මාවෙනි, සැප වේදනාව කවරීද? දුක් වේදනාව කවරීද? උපෙක්ෂා වේදනාව කවරීද?" "ඇවැත් විසාඛයෙනි, කයෙහි හටගත්තාවූද, සිතෙහි හටගත්තාවූද, සැපවූ, මධුරවූ, යම් වේදනාවක් වේද, මේ සැප වේදනාවයි. ඇවැත් විසාඛයෙනි, කයෙහි හටගත්තාවූද, සිතෙහි හටගත්තාවූද, දුක්වූ, අමිහිරිවූ, යම් වේදනාවක්වේද, මේ දුක් වේදනාවයි. ඇවැත් විසාඛයෙනි, කයෙහි හටගත්තාවූද, සිතෙහි හටගත්තාවූද, මිහිරිද නොවූ, අමිහිරිද නොවූ යම් වේදනාවක් වේද, මෙය උපෙක්ෂා වේදනාවයි."

"ආයුෂ්මාවෙනි, සැප වේදනාව කුමක් සැපකොට ඇත්තීද? කුමක් දුක් කොට ඇත්තීද? දුක් වේදනාව කුමක් දුක් කොට ඇත්තීද? කුමක් සැප කොට ඇත්තීද? උපෙක්ෂා වේදනාව කුමක් දුක් කොට ඇත්තීද? කුමක් සැප කොට ඇත්තීද?" "ඇවැත් විසාඛයෙනි, සැප වේදනාවගේ පැවැත්ම සැපය, නැතිවීම දුක්ය. දුක් වේදනාව පැවැත්ම දුක්ය. නැතිවීම සැපය. උපෙක්ෂා වේදනාව දැනීම සැපය. නොදැනීම දුකය."

**11.** "ආයුෂ්මාවෙනි, සැප වේදනාවෙහි කවර අනුශය ධර්මයක් (අනුව සයනය කළාක්මෙන්) එක්ව හැසිරේද? දුක් වේදනාවෙහි කවර අනුසය ධර්මයක් එක්ව හැසිරේද? උපෙක්ෂා වෙදනාවෙහි කවර අනුසය ධර්මයක් එක්ව හැසිරේද?" "ඇවැත් විසාඛයෙනි, සැප වේදනාවෙහි රාග අනුශය එක්ව හැසිරෙයි. දුක් වේදනාවෙහි ප්‍රතිඝ අනුසය එක්ව හැසිරෙයි, උපෙක්ෂා වේදනාවෙහි අවිද්‍යා අනුසය එක්ව හැසිරෙයි."

"ආයුෂ්මාවෙනි, සියලු සැප වේදනාවෙහි රාගානුසය එක්ව හැසිරේද? සියලු දුක් වේදනාවෙහි, ප්‍රතිඝානුසය, එක්ව හැසිරේද?

සියලු උපෙක්ෂා වේදනාවෙහි, අවිද්‍යානුසය එක්ව හැසිරේද?" "ඇවැත්නි, විසාඛයෙනි, සියලු සැප වේදනාවෙහි රාගානුසය එක්ව නොහැසිරෙයි. සියලු දුක් වේදනාවෙහි ප්‍රතිඝානුසය එක්ව නොහැසිරෙයි. සියලු උපෙක්ෂා වේදනාවෙහි අවිද්‍යානුසය එක්ව නොහැසිරෙයි."

"ආයර්‍ය්‍යාවෙනි, සැප වේදනාවෙහි කුමක් පහකළ යුතුද? දුක් වේදනාවෙහි කුමක් පහකළ යුතුද? උපෙක්ෂා වේදනාවෙහි කුමක් පහකළ යුතුද?" "ඇවැත් විසාඛයෙනි, සැප වේදනාවෙහි රාගානුසය පහකළ යුතුයි. දුක් වේදනාවෙහි ප්‍රතිඝානුසය පහකළ යුතුය. උපෙක්ෂා වෙදනාවෙහි, අවිද්‍යානුසය පහකළ යුතුය."

"ආයර්‍ය්‍යාවෙනි, සියලු සැප වේදනාවෙහි, රාගානුසය පහකළ යුතුද? සියලු දුක් වේදනාවෙහි ප්‍රතිඝානුසය පහකළ යුතුද? සියලු උපෙක්ෂා වේදනාවෙහි අවිද්‍යානුසය පහකළ යුතුද?" "ඇවැත් විසාඛයෙනි, සියලු සැප වේදනාවෙහි රාගානුසය පහකළ යුතු නොවෙයි. සියලු දුක් වේදනාවෙහි ප්‍රතිඝානුසය පහකළ යුතු නොවෙයි. සියලු උපෙක්ෂා වේදනාවෙහි අවිද්‍යානුසය පහකළ යුතු නොවෙයි. ඇවැත් විසාඛයෙනි, මේ ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ ප්‍රථමධ්‍යානය කරණකොටගෙන රාගය දුරලයි. ඒ ප්‍රථම ධ්‍යානයෙහි, රාගානුසය තෙම එක්ව නොහැසිරේ.

"ඇවැත් විසාඛයෙනි, මේ ශාසනයෙහි මහණතෙම, මෙසේ බලාපොරොත්තු වෙයි. 'දැන් ආයර්‍ය්‍යයන් වහන්සේලා (රහත් ඵලයයි කියනු ලබන) යම් ආයතනයකට පැමිණ වෙසෙද්ද, ඒ අර්හත්වයට මම කවර දවසෙක පැමිණ වාසය කරන්නෙම්ද?' මෙසේ උතුම්වූ, (අර්හත් මාර්ගඵලයයි කියන ලද) මිදීමෙහි කැමැත්ත ඇතිකරන්නහුට ප්‍රාර්ථනාව මුල්කොට ඇති දොම්නස උපදියි. එයින් ප්‍රතිඝය දුරු කරයි. එහි ප්‍රතිඝානුසය එක්ව නොහැසිරේ. ඇවැත්නි, මේ ශාසනයෙහි මහණතෙම සැප නැති කිරීමෙන්ද, දුක් නැති කිරීමෙන්ද පළමු කොටම සොම්නස්

දොම්නස් දෙක දුරලීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ, උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. එයින් අවිද්‍යාව දුරු කරයි. එහි අවිද්‍යානුසය එක්ව නොහැසිරේ.”

“ආයර්‍ය්‍යාවෙනි, සැප වේදනාවට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත්නි, විසාඛයෙනි, සැප වේදනාවට දුක් වේදනාව ප්‍රතිවිරුද්ධයි.”

“ආයර්‍ය්‍යාවෙනි, දුක් වේදනාවට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත් විසාඛයෙනි, දුක් වේදනාවට සැප වේදනාව ප්‍රතිවිරුද්ධයි.”

“ආයර්‍ය්‍යාවෙනි, උපෙක්ෂා වේදනාවට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත් විසාඛයෙනි, උපෙක්ෂා වේදනාවට අවිද්‍යාව ප්‍රතිවිරුද්ධයි.”

“ආයර්‍ය්‍යාවෙනි, අවිද්‍යාවට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත් විසාඛයෙනි, අවිද්‍යාවට, විද්‍යාව ප්‍රති විරුද්ධයි.”

“ආයර්‍ය්‍යාවෙනි, විද්‍යාවට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත් විසාඛයෙනි, විද්‍යාවට විමුක්තිය අර්හත්ඵලය ප්‍රතිවිරුද්ධයි.”

“ආයර්‍ය්‍යාවෙනි, විමුක්තියට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත්නි විසාඛයෙනි, විමුක්තියට නිර්වාණය ප්‍රතිවිරුද්ධයි.”

ආයර්‍ය්‍යාවෙනි, නිර්වාණයට කුමක් ප්‍රතිවිරුද්ධද?” “ඇවැත් විසාඛයෙනි, ප්‍රශ්නය සීමාව ඉක්මවා ගියේය. ප්‍රශ්නයන්ගේ කෙළවර ගන්නට නොහැකිය. ඇවැත් විසාඛයෙනි, මාර්ග බ්‍රහ්මචරියාව නිර්වාණයට පිවිසුනේ වෙයි. නිර්වාණය පිහිට කොට ඇත්තේ වෙයි. නිර්වාණය අවසන්කොට ඇත්තේ වෙයි. ඇවැත් විසාඛයෙනි, ඔබ කැමැත්තෙහි නම් භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් මේ කාරණය විචාරව යම්සේ භාග්‍යවතුන් වහන්සේ වදාරණසේක්ද, එසේ පිළිගනුව.”

ඉක්බිති විසාඛ උපාසක තෙම ධම්මදින්නා භික්ෂුණින් වහන්සේගේ දෙශනාවට සතුටුවී එය පිළිගෙන හුනස්නෙන් නැගිට ධම්මදින්නා භික්ෂුණිය වැඳ පැදකුණුකොට භාග්‍යවතුන් වහන්සේ යම්තැනකද එතැනට පැමිණියේය. පැමිණ,

භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකපැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ, විසාඛ උපාසක තෙම ධම්මදින්නා භික්ෂුණිය සමග පැවති කථාව යම් තරමක් වීද, ඒ සියල්ල භාග්‍යවතුන්වහන්සේට කීවේය. මෙසේ කීකල්හි භාග්‍යවතුන් වහන්සේ විසාඛ උපාසකයාට මෙය කීහ. විසාඛය, ධම්මදින්නා භික්ෂුණිය පණ්ඩිතය. විසාඛය, ධම්මදින්නා භික්ෂුණිය ගැඹුරු ප්‍රඥාව ඇත්තීය. විසාඛයෙනි, නුඹ මාගෙන්ද මේ කාරණය ඇසුවෙහි නම් යම්සේ එය ධම්මදින්නා භික්ෂුණිය විසින් ප්‍රකාශ කරන ලදද, මමද, එය එපරිද්දෙන්ම ප්‍රකාශ කරන්නෙමි. මෙහි අර්ථය මෙයමැයි. මෙසේ මෙය දරව"යි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. සතුටුවූ විසාඛ උපාසක තෙම භාග්‍යවතුන්වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

**හතරවෙනිවූ චූල වෙදල්ල සූත්‍රය නිමි. (5-4)**

## 45. චූල ධම්ම සමාදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි'යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

"මහණෙනි, මේ ධර්ම සමාදාන (ධර්මයයි ගන්නා ලද ගැනීම්) සතරක් වෙත්. කවර සතරක්ද යත්:- මහණෙනි, දැන් (මේ ජාතියෙහි) සැප ඇති, මත්තෙහි (මතු ජාතියෙහි) දුක්විපාක ඇති ධර්ම සමාදානයක් ඇත, මහණෙනි, දැනුත් දුක්වූ, මත්තෙහිත් දුක්විපාක ඇති ධර්ම සමාදානයක් ඇත. මහණෙනි, දැන් දුක්වූ, මත්තෙහි සැප විපාක ඇති ධර්ම සමාදානයක් ඇත. මහණෙනි, දැනුත් සැපවූ, මත්තෙහිත් සැප විපාක ඇති. ධර්ම සමාදානයක් ඇත.

2. "මහණෙනි, මේ ජාතියෙහි සැපවූ, පරලොව දුක් විපාකඇති ධර්ම සමාදානය කවරේද? මහණෙනි, කාමයන්හි

දෝෂයක් නැතැයි කියන්නාවූ, දොෂයක් නැත යන දෘෂ්ටි ඇත්තාවූ, ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. ඔවුහු කැමතිසේ කාම සම්පත් අනුභව කරති. ඔව්හු වනාහි හිස මුදුනේ බැඳි කොණ්ඩා ඇති පරිබ්‍රාජක ගැහැණුන් සමග හැසිරෙත්, ඔවුහු මෙසේ කියති. 'ඒ පින්වත් මහණ බමුණෝ කාමයන්හි මත්තෙහි කවර නම් භයක් දකිමින් කාමසම්පත් අත්හරින්නට කියත්ද? තරුණවූ මෘදුවූ, ලොම් ඇති මේ පරිබ්‍රාජිකාවගේ අතෙහි ස්පර්ශය සැපය'යි කියමින් ඔවුහු කැමතිසේ කාම සම්පත් අනුභව කරති. ඔවුහු කැමතිසේ කම්සැප විඳ ශරීරය බිඳීමෙන් මරණයෙන් මතු සැපයක් නැති දුක් ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපදිති, ඔවුහු එහි දුක්වූ තියුණුවූ කටුකවූ, වේදනා විඳිති. ඔවුහු මෙසේ කියති. 'ඒ පින්වත් මහණ බමුණෝ වනාහි කාමයන්හි, මතු ඇතිවන මේ භය දැක කාමසම්පත් අත්හරින්නට කියති. අපි වනාහී කාමයන් හේතු කොට ගෙන කාමයන් මුල් කොට ගෙන දුක්වූ තියුණුවූ, කටුකවූ, මේ වේදනාවන් විඳිමු'යි. (කියති)

3. "මහණෙනි, ග්‍රීෂ්ම ඍතුවේ අන්තිම මාසයෙහි මාලුවා කරලක් පැසී පුපුරන්නේය. මහණෙනි, ඉක්බිති ඒ මාලුවා ඇටය එක්තරා සල් රුකක් මුල වැටෙන්නේය. මහණෙනි, එකල්හි ඒ සල්ගසෙහි යම් දෙවියෙක් වාසය කරන්නේද ඒ දෙවිතෙම භයට පත්ව, සංවේගයට පැමිණ, තැති ගැනීමට පැමිණෙන්නේය. මහණෙනි, ඉක්බිති, ඒ සල් ගසෙහි වසන දෙවියාගේ මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ආරාමවල වසන දෙවියෝද, වන දෙවියෝද, රුක් දෙවියෝද, (අරළු ආදී) ඖෂධ වෘක්ෂ වලද, තල් පොල් ආදී (තෘණ) වෘක්ෂ වලද, නුග බෝ ආදී (වනස්පති) වෘක්ෂ වලද වාසය කරන්නාවූ දෙවියෝද එක්ව රැස්ව, මෙසේ, අස්වසන්නාහුය. 'පින්වත, භය නොවෙව, පින්වත, භය නොවෙව, ඒ මාලුවා ඇටය මොනරෙක් හෝ ගිලිනවා ඇත, මුවෙක් හෝ කනවා ඇත, ලැව් ගින්නකින් හෝ දැවෙනවා ඇත, වනයෙහි වැඩ කරන්නෙක් හෝ උදුරා දමනවා ඇත, වේයන් හෝ කනවා ඇත, බොල් වන්නට හෝ පුළුවන, (කියායි)

4. "මහණෙනි, ඉක්බිති, ඒ මාලුවා ඇටය, මොනරෙක් හෝ නොගිලියි. මුවෙක් හෝ නොකයි. ලැව් ගින්නක් හෝ

නොදවයි, වනයෙහි වැඩ කරන්නෙක් හෝ උදුරා නොදමයි. වේයෝ හෝ නොකන්නාහුය, සාරවත් බීජයක්ම වන්නේය. ඒ වනාහි මහ වැස්සෙන් තෙමී පැලවී මනාව වැඩෙන්නේය. ඒමාලුවා වැල ලපටිවූවා, මෘදුවූවා, බූව සහිතවූවා, ලෙලදෙන්නී වෙයි. ඒ වැල ඒ සල්ගස වැලඳ ගන්නීය. මහණෙනි, ඉක්බිති, ඒ සල්ගසෙහි වසන දේවතාවාට මෙසේ කල්පනා වෙයි. 'ඒ පින්වත් මිත්‍රයෝද, නෑ සහ ලේ නෑයෝද, ආරාම දෙවතාවෝද වන දෙවියෝද, ඖෂධ, තෘණ, වනස්පතී වෘක්ෂවල වසන දෙවියෝද, එක්ව රැස්ව, 'පින්වත, භය නොවෙව. පින්වත, භය නොවෙව. ඒ මාලුවා ඇටය මොණරෙක් හෝ ගිලිනවා ඇත, මුවෙක් හෝ කනවා ඇත. ලැව් ගින්නකින් හෝ දැවෙනවා ඇත. වනයෙහි වැඩ කරන්නෙක් හෝ උගුල්ලා දමනවා ඇත. වේයන් හෝ කනවා ඇත. බොල් වන්නට හෝ පුළුවන' කියමින් ඒ මාලුවා ඇටයෙන් මතු ඇති වන කිනම් භයක් දැක මා අස්වැසුවාහුද? තරුණවූ, මෘදුවූ, බූව සහිතවූ, ලෙලදෙන්නාවූ, මේ මාලුවා වැලෙහි, ස්පර්ශය සැපයයි ඒ වැල ඒ සල්ගස වැලඳගන්නීය. වැළඳගෙන සල්ගස මත්තෙහි කුඩයක් මෙන් සිටින්නීය. හෙවත් අතු මත්තෙහි පැතිර ඇටුවම් බස් වන්නේය. (වැල් නැවත පොළොවට පාත් වන්නේය.) ඇටුවම් බැස, ඒ සල් ගසෙහි යම් කලෙක ලොකු අතු වෙයිනම් ඒවා පලන්නීය. මහණෙනි, එවිට සල් ගසෙහි වසන දෙවියාට මෙබඳු කල්පනාවක් වෙයි. ඒ පින්වත් මිත්‍රයෝද නෑ සහලේ නෑයෝද, ආරාම දෙවතාවෝද, ඖෂධ, තෘණ, වනස්පතී වෘක්ෂවල වසන දෙවියෝද ඒ මාලුවා පැලයෙන් මතු ඇති වන භය දක්නාහු එක්ව රැස්ව 'පින්වත, භය නොවෙව, පින්වත, භය නොවෙව, ඒ මාලුවා ඇටය මොණරෙක් හෝ ගිලිනවා ඇත, මුවෙක් හෝ කනවා ඇත, ලැව් ගින්නකින් හෝ දැවෙනවා ඇත, වේයන් හෝ කනවා ඇත. බොල් හෝ වන්නට පුළුවන' කියමින් මා අස්වැසූහ. මම වනාහි ඒ මාලුවා ඇටය හේතු කොට ගෙන දුක් වූ, නපුරු වූ, කටුක වූ වෙදනා විඳිමි.' (කියාය)

5. "මහණෙනි, එපරිද්දෙන්ම, කාමයන්හි දොෂයක් නැතැයි කියන්නාවූ, දොෂයක් නැත යන දෘෂ්ටි ඇති ඇතැම් මහණ

බමුණෝ ඇත්තාහ, ඔවුහු කැමතිසේ කාම සම්පත් අනුභව කරති. ඔවුහු හිස මුදුනේ බැඳි කොණ්ඩා ඇති පරිබ්‍රාජක ස්ත්‍රීන් සමග හැසිරෙති. ඔවුහු මෙසේ කියති. 'ඒ පින්වත් මහණ බමුණෝ කාමයන්හි අනාගතයෙහි කවර නම් භයක් දකිමින් කාම සම්පත් අත්හරින්නට කියත්ද? තරුණ වූ මොලොක්වූ ලොම් ඇති මේ පරිබ්‍රාජකාවගේ අතේ ස්පර්ශය සැපය'යි. ඔවුහු කැමතිසේ කම්සැප විඳිති. ඔවුහු කැමතිසේ සම්පත් විඳ කය බිඳීමෙන් මරණින් මතු සැප නැති දුක් ඇති, උඩු කුරුව වැටෙන නරකයෙහි උපදිති. ඔවුහු එහි දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා විඳිති. ඔවුහු මෙසේ කියති, 'ඒ පින්වත් මහණ බමුණෝ කාමයන්හි මතු ඇතිවන මේ භය දැක කාම සම්පත් අත්හරින්නට කියති. අපි වනාහි, කාමයන් හෙතුකොට කාමයන් මුල් කොට දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනා විඳිමු'යි. (කියායි) මහණෙනි, මේ වනාහි මෙලොව සැප ඇති මත්තෙහි දුක් විපාක ඇති, ධර්ම සමාදානයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, මේ වර්තමානයෙහිත් දුක් ඇති අනාගතයෙහිත් දුක් විපාක ඇති ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැමෙක් යහපත් පැවතුම් නැති, නිර්වස්ත්‍රයෙක් වෙයි. දිවෙන් අතලොවින්නේ නොහොත් මළ පහකොට (දණ්ඩක්යයි හිතාගෙන) අතින් පිසින්නේ වෙයි. ආහාර දීම පිණිස එව වහන්සැයි කී කල්හි නොපිළිගන්නේ වෙයි. සිටුව වහන්සැයි කියා දුන්දෙය නොපිළිගනියි. පෙරටුව ගෙණෙන ලද ආහාරය නොපිළි ගනියි. ඔහු උදෙසා කරණ ලද්ද හෙතෙම නොපිළිගනියි. ආරාධනා කර දුන් බත නොඉවසයි. කළගෙඩි කටින් ගෙණ දුන් දෙය නොපිළිගනියි. සැළිකටින් ගෙණ දුන් දෙය නොපිළිගනියි. එළිපත අතරකොට සිට දුන්දෙය නොපිළි ගනියි. දණ්ඩක් අතරකොට සිට දුන්දෙය නොපිළිගනියි. මෝල්ගසක් අතරකොට සිට දුන්දෙය නොපිළිගනියි. අනුභව කරන්නාවූ දෙදෙනෙකුගෙන් එකෙකු දුන්දෙය නොපිළිගනියි. ගැබිනිය විසින් දුන්දෙය නොපිළිගනියි. කිරි පොවන්නිය විසින් දුන්දෙය නොපිළිගනියි. පුරුෂයෙකු වෙත ගිය තැනැත්තිය විසින් දුන්දෙය නොපිළිගනියි. සම්මාදම්

කළ දෙයින් කිසිවක් නොපිළිගනියි. යම් තැනක බල්ලෙක් එළඹ සිටියේද (ඔහුට නොදී) එහිදී දුන්දෙය නොපිළිගනියි. දියමස් අනුභව නොකරයි. ගොඩමස් අනුභව නොකරයි. සුරාව නොබොයි. මේරය (මල්යුසින් කළ මත්පැන්) නොබොයි. කාඩිදිය නොබොයි හෙතෙම පිඬු සිඟීමට එකම ගෙයක් ඇත්තේ හෝ වෙයි. එකම බත් පිඩකින් යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් දෙකක පිඬු සිඟන්නේ හෝ වෙයි. බත් පිඬු දෙකකින් යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් සතක පිඬු සිඟන්නේ හෝ වෙයි. බත් පිඩු සතකින් යැපෙන්නේ හෝ වෙයි. එක් කුඩා බත් තැටියකින් යැපෙන්නේ හෝ වෙයි. බත් තැටි දෙකකින් යැපෙන්නේ හෝ වෙයි. බත් තැටි සතකින් යැපෙන්නේ හෝ වෙයි. එක දවසකට වරක් හෝ ආහාර ගනියි. දෙදිනකට වරක් හෝ ආහාර ගනියි. සත් දිනකට වරක් හෝ ආහාර ගනියි. මෙපරිද්දෙන් අඩමසකට වරක් හෝ ආහාර ගනිමින්ද වාර භොජනයෙහි යෙදී වාසය කරයි.

7. "හෙතෙම අමුපලා කන්නේ හෝ වෙයි. බඩහමු කන්නේ හෝ වෙයි. උ෴රුහැල් (වනයෙහි ඉබේට හැදෙන වී වර්ගයක්) කන්නේ හෝ වෙයි. සම්කැලි කන්නේ හෝ වෙයි. මැලියම් කන්නේ හෝ වෙයි. කුඩු අනුභව කරන්නේ හෝ වෙයි. දන්කුඩ කන්නේ හෝ වෙයි. තල ආදී මුරුවට කන්නේ හෝ වෙයි. ලා තණ කොළ කන්නේ හෝ වෙයි. වනමුල් එල ආහාර කොට ඇත්තේ ඉබේ වැටුණ ඵල අනුභව කරන්නේ හෝ යැපෙයි. හෙතෙම වැහැරිත් අඳියි. මිශ්‍ර වස්ත්‍රත් අඳියි. මිනියෙන් ඉවත්කළ වස්ත්‍රත් අඳියි. පාංශුකූල වස්ත්‍රත් අඳියි. ගස්වල පතුරුත් අඳියි. අඳුන්දිවි සම්ද දරයි, මැදින් පැලූ අඳුන්දිවි සම්ද අඳියි. කුසතණ වැහැරිද අඳියි. නියඳ වැහැරිද අඳියි. පට්ටාද අඳියි. ඉසකේවලින් කළ කම්බිලිද දරයි. බකමුහුණු පිහාටුවලින් කළ වැහැරිද දරයි. ඉසකේ රැවුල් උගුල්ලන්නෙක් වෙයි. ඉසකේ රැවුල් ඉගිල්ලීමෙහි යෙදුනේ, ආසනවල වාඩි නොවන්නේ නැගිට සිටින්නේ වෙයි. උඩුකුරුව සිටීමේ වීර්‍ය්‍යයෙන් යුක්තවූයේ උඩුකුරුව සිටින්නේ වෙයි. කටු යහනෙහි හේත්තුවන්නේ වෙයි. කටු ඇතිරිලි මතුයෙහි සයනය කරයි. සවස තුන්වැනි කොට (දවසට තුන්වරක්) දියට

බැසීමෙහි යෙදුනේ වාසය කරයි. මෙසේ නොයෙක් ආකාරයෙන් ශරීරය තවන පෙළන තපස්කම්වල යෙදී වාසය කරයි. හෙතෙම කය, බිඳීමෙන් මරණින් මතු සැපයෙන් තොරවූ නපුරු ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නිරයෙහි උපදියි. මහණෙනි, මෙය වනාහි මෙලොව දුක් ඇති, මත්තෙහිද දුක් විපාක ඇති ධර්ම සමාදාන යයි කියනු ලැබේ.

8. "මහණෙනි, දැන් (මේ ජාතියෙහි) දුක්වූ, මත්තෙහි සැප විපාක ඇති ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කෙනෙක් ස්වභාවයෙන්ම තියුණුවූ, රාග ස්වභාව ඇත්තේවෙයි. හෙතෙම නිතර රාගයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. ස්වභාවයෙන්ම බලවත් ද්වෙෂ ස්වභාව ඇත්තේ වෙයි. හෙතෙම නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. ස්වභාවයෙන්ම තියුණු මොහය ස්වභාව කොට ඇත්තේවෙයි, හෙතෙම නිතර මොහයෙන් හටගත් දුක් දොම්නස් විඳියි. හෙතෙම දුක් සහිතව, දොම්නස් සහිතව, කඳුලු වැකුණු මුහුණු ඇතිව, හඬමින් පිරිසිදුව බ්‍රහ්මචරියාව රකියි. හෙතෙම ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. මහණෙනි, මෙය මේ ආත්මයෙහි දුක්වූ, මත්තෙහි සැප විපාක ඇති ධර්ම සමාදාන යයි කියනු ලැබේ.

**9.** මහණෙනි, මේ ජාතියෙහිත් සැප ඇත්තාවූ, මත්තෙහිත් සැප විපාක ඇත්තාවූ, ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මෙහි ඇතැම් කෙනෙක් ස්වභාවයෙන් තියුණු රාගස්වභාව නැත්තේ වේද, හෙතෙම නිතර රාගයෙන් හටගත් දුක් දොම්නස් නොවිඳියි. ස්වභාවයෙන්ම තියුණු දොෂ ස්වභාව ඇත්තේ නොවෙයි. හෙතෙම නිතර ද්වෙෂයෙන් හටගත් දුක් දොම්නස් නොවිඳියි. ස්වභාවෙයන්ම තියුණු මොහ ස්වභාව නැත්තේ වෙයි. හෙතෙම නිතර මොහයෙන් හටගත් දුක් දොම්නස නොවිඳියි. හෙතෙම කාමයන්ගෙන් වෙන්වම, අකුශල ධර්මයන්ගෙන් වෙන්වම, විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සැප ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"විතක්ත විචාර දෙක සංසිඳීමෙන් තමා තුළ මනා පැහැදීම ඇති කරන්නාවූ, හිත පිළිබඳ එකග බව ඇති විතක්ක විචාර

රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීති සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"ප්‍රීතියෙහිද නොඇල්මෙන් උපෙක්ෂාව ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ කයින්ද සැපයක් විඳියි. යම් ධ්‍යානයක් පිළිබඳව උපෙක්ෂාවෙන් යුක්තවූයේ, සිහි ඇත්තේ, සැපයෙන් යුක්තව වාසය කරන්නේයයි ආර්‍ය්‍යයෝ කියද්ද, ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි.

"සැප දුරු කිරීමෙන්ද, දුක් දුරු කිරීමෙන්දපළමු කොටම සොම්නස් දොම්නස් දෙක දුරුකොට, දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදියි. මහණෙනි, මේ වනාහි දැන්ද සැප ඇති, මත්තෙහිද සැප විපාක ඇති ධර්ම සමාදානයයි කියනු ලැබේ. මහණෙනි, සතර ධර්ම සමාදානයෝ මොහුය."

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**පස්වෙනිවූ චූල ධම්ම සමාදාන සූත්‍රය නිමි. (5-5)**

## 46. මහා ධම්ම සමාදාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවනලද ජෙතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

"මහණෙනි, බොහෝ සෙයින්ම සත්වයෝ, 'අපට අයහපත් වූ, සිත් නොඅලවන්නාවූ, අමනාපවූ ධර්මයෝ පිරිහෙන්නාහු නම්, යහපත්වූ, සිත් අලවන්නාවූ, මනාපවූ ධර්මයෝ විශෙෂයෙන් වැඩෙන්නාහු නම් හොඳය, යන කැමැත්ත ඇත්තෝය, ඡන්දය

ඇත්තෝය. අදහස ඇත්තෝය, මහණෙනි, මෙසේ කැමැත්තාවූ, මෙබඳු අදහස් ඇත්තාවූ මෙබඳු බලාපොරොත්තු ඇත්තාවූ ඒ සත්වයන්හට අයහපත්වූ, සිත් නොඅලවන්නාවූ, අමනාපවූ ධර්මයෝම වැඩෙති. යහපත්වූ, සිත් අලවන්නාවූ, මනාපවූ ධර්මයෝ පිරිහෙති. මහණෙනි, මීට හේතුව කුමකැයි තොප සිතන්නහුද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ ගෙන් පහළ වන්නාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිට කොට ඇත්තාහුය ස්වාමීනි, මේ කීමෙහි අර්ථය, භාග්‍යවතුන් වහන්සේටම වැටහේවා, භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුය"යි (කීවාහුය.) "මහණෙනි, එසේ වීනම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි." "එසේය, ස්වාමීනි"යි ඒ භික්ෂූහු, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "මහණෙනි, මේ ලෝකයෙහි ආර්‍ය්‍යයන් (බුද්ධාදී උත්තමයන්) නුවණැසින් නුදුටුවාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි අදක්ෂවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නුදුටුවාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, නූගත් පෘථග්ජනතෙම සේවනය කටයුතු ධර්මයන් නොදනියි. සේවනය නොකටයුතු ධර්මයන් නොදනී. භජනය කටයුතු ධර්මයන් නොදනියි, භජනය නොකටයුතු ධර්මයන් නොදනියි, සේවනය කළයුතු ධර්මයන් නොදන්නාවූ, සේවනය නොකළ යුතු ධර්මයන් නොදන්නාවූ, භජනය කටයුතු ධර්මයන් නොදන්නාවූ, භජනය නොකටයුතු ධර්මයන් නොදන්නාවූ, හෙතෙම සේවනය නොකටයුතු ධර්මයන් සේවනය කරයි, සේවනය කටයුතු ධර්මයන් සේවනය නොකරයි, භජනය නොකටයුතු ධර්මයන් භජනය කරයි, භජනය කටයුතු ධර්මයන් භජනය නොකරයි, සේවනය නොකටයුතු ධර්මයන් සේවනය කරන්නාවූ සේවනය කටයුතු ධර්මයන් සේවනය නොකරන්නාවූ භජනය නොකටයුතු ධර්මයන් භජනය කරන්නාවූ, භජනය කටයුතු ධර්මයන් භජනය නොකරන්නාවූ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඔහුට අයහපත්වූ, සිත් නොඅලවන්නාවූ, අමනාපවූ ධර්මයෝ වැඩෙති. යහපත්වූ, සිත් අලවන්නාවූ මනාපවූ ධර්මයෝ පිරිහෙති. ඊට හේතු කවරේද? මහණෙනි, අඥානයෙකුට වියයුතු පරිද්දෙන්ම එය එසේ වීමය.

3. "මහණෙනි, බුද්ධාදී ආර්‍ය්‍යයන් දක්නාවූ, ආර්‍ය්‍ය ධර්මයෙහි මනාව හික්මුනාවූ, සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි මනාව හික්මුනාවූ, උගත් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම, සේවනය කටයුතු ධර්මයන් දනියි. සේවනය නොකටයුතු ධර්මයන් දනියි, භජනය කළයුතු ධර්මයන් දනියි, භජනය නොකළයුතු ධර්මයන් දනියි, සේවනය කටයුතු ධර්මයන් දන්නාවූ, සේවනය නොකටයුතු ධර්මයන් දන්නාවූ, භජනය කටයුතු ධර්මයන් දන්නාවූ, භජනය නොකටයුතු ධර්මයන් දන්නාවූ, ඒ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සේවනය නොකටයුතු ධර්මයන් සේවනය නොකරයි. සේවනය කටයුතු ධර්මයන් සෙවනය කරයි. භජනය නොකටයුතු ධර්මයන් භජනය නොකරයි, භජනය කටයුතු ධර්මයන් භජනය කරයි, සේවනය නොකටයුතු ධර්මයන් සේවනය නොකරන්නාවූ, සේවනය කටයුතු ධර්මයන් සෙවණය කරන්නාවූ, භජනය කටයුතු ධර්මයන් භජනය කරන්නාවූ, භජනය නොකටයුතු ධර්මයන් භජනය නොකරන්නාවූ, ඔහුට අයහපත්වූ සිත් නොඅලවන්නාවූ, අමනාපවූ ධර්මයෝ පිරිහෙත්. යහපත්වූ, සිත් අලවන්නාවූ මනාපවූ ධර්මයෝ විශෙෂයෙන් වැඩෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, නුවණැත්තෙකුට සිදුවිය යුතු පරිද්දෙන්ම එය එසේ වීමය.

4. "මහණෙනි, ධර්ම සමාදානයෝ මේ සතර දෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්: මහණෙනි, වර්තමානයෙහිත් දුක්වූද, අනාගතයෙහිත් දුක් විපාක දෙන්නාවූද, ධර්ම සමාදානයෙක් ඇත. මහණෙනි, වර්තමානයෙහි සැපවූ මත්තෙහි දුක් විපාක දෙන්නාවූ, ධර්ම සමාදානයෙක් ඇත්තේය. මහණෙනි වර්තමානයෙහි දුක්වූ, මත්තෙහි සැප විපාක දෙන්නාවූ, ධර්ම සමාදානයෙක් ඇත. මහණෙනි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහි සැප විපාක දෙන්නාවූද, ධර්ම සමාදානයෙක් ඇත.

"මහණෙනි, ඒ ධර්ම සමාදානයන් අතුරෙහි වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද, යම් මේ ධර්ම සමාදානයක් වේද, ඒ ධර්ම සමාදානය අඥානවූ, අවිද්‍යාවෙන් යුක්තවූ, පුද්ගලතෙම, 'මේ ධර්ම සමාදානය වනාහි, මට දැනුත් දුක්වූද, මත්තෙහිත් දුක් දෙන්නාවූද, එකකැ'යි ඇති සැටියෙන් නොදනියි. අඥානවූ, අවිද්‍යාවෙන් යුක්තවූ පුද්ගලතෙම ඒ ධර්ම සමාදානය ඇති සැටියෙන් නොදන්නේ, ඒ ධර්මය සෙවනය කරයි. ඒ ධර්මය බැහැර නොකරයි. ඒ ධර්මය සෙවනය කරන්නාවූ, ඒ ධර්මය නොහරින්නාවූ, ඔහුට අයහපත්වූ, සිත් නොඅලවන්නාවූ අමනාපවූ ධර්මයෝ වැඩෙත්. යහපත්වූ, සිත් අලවන්නාවූ මනාපවූ, ධර්මයෝ පිරිහෙත්. ඊටහේතු කවරේද? මහණෙනි, නුවණ නැත්තෙකුට වියයුතු පරිද්දෙන්ම ඒ එසේ වීමය.

මහණෙනි, ඒ ධර්ම සමාදානයන් අතරෙහි වර්තමානයෙහි සැපවූද, මත්තෙහි දුක් විපාකවූද, යම් මේ ධර්ම සමාදානයක් වේද, එය අඥානවූ අවිද්‍යාවෙන් යුත් පුද්ගලතෙම 'මේ ධර්ම සමාදානය මට වර්තමානයෙහි සැපද, මත්තෙහි දුක් විපාකද දෙන්නේය'යි ඇති සැටියෙන් නොදනියි. අඥානවූ, අවිද්‍යාවෙන් යුක්තවූ පුද්ගලතෙම එය ඇති සැටියෙන් නොදන්නේ, ඒ ධර්මය සෙවනය කරයි. ඒ ධර්මය නොහරියි. ඒ ධර්මය සෙවනය කරන්නාවූ ඒ ධර්මය අත් නොහරින්නාවූ ඔහුට යහපත්වූ සිත් නොඅලවන්නාවූ අමනාපවූ ධර්මයෝ වැඩෙත්. යහපත්වූ, සිත් අලවන්නාවූ මනාපවූ ධර්මයෝ පිරිහෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, නුවණ නැත්තෙකුට වියයුතු පරිද්දෙන්ම ඒ එසේ වීමයි.

5. "මහණෙනි, ඒ ධර්ම සමාදාන අතරෙහි වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි සැප විපාක ඇත්තාවූද, යම් මේ ධර්ම සමාදානයක් වේද, එය නුවණ ඇත්තාවූ අවිද්‍යාවෙන් තොරවූ පුද්ගල තෙම 'මේ ධර්ම සමාදානය මට වර්තමානයෙහි දුකද, මත්තෙහි සැප විපාකද දෙන්නේය'යි ඇති සැටියෙන් දනියි. නුවණ ඇත්තාවූ අවිද්‍යාවෙන් තොරවූ පුද්ගලතෙම එය ඇති සැටියෙන් දන්නේ, සෙවනය කරයි. ඒ ධර්මය නොහරියි. ඒ

ධර්මය සෙවනය කරන්නාවූ, ඒ ධර්මය නොහරින්නාවූ ඔහුට අයහපත්වූ සිත් නොඅලවන්නාවූ, අමනාපවූ ධර්මයෝ පිරිහෙත්. යහපත්වූ සිත් අලවන්නාවූ මනාපවූ ධර්මයෝ වැඩෙත්. ඊට හේතු කවරේද? මහණෙනි, නුවණ ඇත්තාට සිදුවිය යුතු පරිද්දෙන්ම ඒ එසේ වීමයි.

"මහණෙනි, ඒ ධර්ම සමාදාන අතරෙහි වර්තමානයෙහි සැපවූද මත්තෙහි සැප විපාක දෙන්නාවූද යම් මේ ධර්ම සමාදානයක් වේද, එය නුවණ ඇත්තාවූ අවිද්‍යාවෙන් තොරවූ පුද්ගල තෙම 'මේ ධර්ම සමාදානය මට වර්තමානයෙහි සැපද මත්තෙහි සැප විපාකද දෙන්නේය'යි ඇති සැටියෙන් දනියි. නුවණ ඇත්තාවූ අවිද්‍යාවෙන් තොරවූ පුද්ගලතෙම එය ඇතිසැටියෙන් දන්නේ සේවනය කරයි. ඒ ධර්මය නොහරියි. ඒ ධර්මය සේවනය කරන්නාවූ, ඒ ධර්මය නොහරින්නාවූ ඔහුට අයහපත්වූ, සිත් නොඅලවන්නාවූ අමනාපවූ ධර්මයෝ පිරිහෙත්. යහපත්වූ, සිත් අලවන්නාවූ, මනාපවූ ධර්මයෝ වැඩෙත්. ඊට හේතු කවරේද? නුවණ ඇත්තාහට වියයුතු පරිද්දෙන්ම එය එසේ වීමයි.

**6.** "මහණෙනි, වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද, ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි සමහර සත්වයෙක් තෙම දුකින් යුක්තවම දොම්නසින් යුක්තවම, සතුන් මරන්නේ වෙයි. සතුන් මැරීම හේතුකොට ගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, නුදුන් දෙය ගනියි. නුදුන් දෙය ගැනීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයි. කාමයෙහි වරදවාහැසිරීම හේතුකොටගෙන දුක්දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, බොරුකියන්නේ වෙයි. බොරුකීම හේතු කොට ගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, කේලාම් කියයි. කේලාම් කීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, ඵරුෂ වචන කියයි. ඵරුෂ වචන කීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

දොම්නසින් යුක්තවම, හිස් බස් කියන්නේ වෙයි. හිස් බස් කීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, විෂම ලොභ ඇත්තේ වෙයි. විෂම ලොභය හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, ව්‍යාපාද සිත් ඇත්තේ වෙයි. ව්‍යාපාදය හේතු කොට ගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, මිසදිටු වෙයි. මිසදිටු බව හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. ඒ දුක් දොම්නස් විඳින්නාවූ, සත්ත්වතෙම, කය බිඳීමෙන් මරණින් මතු සැප නැති, දුක් ඇති, යටිකුරුව වැටෙන නරකයෙහි උපදියි. මහණෙනි, මේ වනාහි වර්තමානයෙහි දුක්වූද, අනාගතයෙහි දුක් විපාක දෙන්නාවූද, ධර්ම සමාදානයයි කියනු ලැබේ.

7. මහණෙනි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සැපයෙන් යුක්තවම, සොම්නසින් යුක්තවම, සතුන් මරන්නේ වෙයි. සතුන් මැරීම හේතුකොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම, සොම්නසින් යුක්තවම සොරකම් කරන්නේ වෙයි. සොරකම් කිරීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයි. කාමයන්හි වරදවා හැසිරීම හේතුකොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම බොරු කියන්නේ වෙයි. බොරු කීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම, සොම්නසින් යුක්තවම කේලාම් කියන්නේ වෙයි. කේලාම් කීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම ඵරුෂ වචන කියන්නේ වෙයි. ඵරුෂ වචන කීම හේතුකොටගෙන සැපයක් සොම්නසක් විඳින්නේ වෙයි. සැපයෙන් යුක්තවම, සොම්නසින් යුක්තවම හිස් කථා කියන්නේ වෙයි. හිස් කථා කීම හේතුකොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම දැඩි ලොභ ඇත්තේ වෙයි.

දැඩි ලොභය හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම ව්‍යාපාද සිත් ඇත්තේ වෙයි. ව්‍යාපාදය හේතු කොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුක්තවම මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයි. මිථ්‍යාදෘෂ්ටිය හේතු කොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු සැප නැති, දුක් ඇති, යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපදියි. මහණෙනි, මේ වනාහි වර්තමානයෙහි සැපවූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද, ධර්ම සමාදානයයි කියනු ලැබේ.

8. "මහණෙනි, වර්තමානයෙහි දුක්වූ, මත්තෙහි සැප විපාක දෙන්නාවූ, ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම, දුකින් යුක්තවම, දොම්නසින් යුක්තවම, සතුන් මැරීමෙන් වැළකුනේ වෙයි. සතුන් මැරීමෙන් වැළැක්ම හේතුකොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම සොරකම් කිරීමෙන් වැළකුනේ වෙයි. සොරකම් කිරීමෙන් වැළකීම හේතුකොට ගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම හේතුකොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම බොරු කීමෙන් වැලකුනේ වෙයි. බොරු කීමෙන් වැලකීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම කේලාම් කීමෙන් වැළකුනේ වෙයි. කේලාම් කීමෙන් වැලකීම හේතුකොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම ඵරුෂ වචන කීමෙන් වැලකුනේ වෙයි. ඵරුෂ වචන කීමෙන් වැලකීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම හිස් කථා කීමෙන් වැලකුනේ වෙයි. හිස් කථා කීමෙන් වැලකීම හේතුකොට ගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම දැඩි ලොභය දුරු කළේ වෙයි. දැඩි ලොභය දුරු කිරීම හේතු කොටගෙන දුක් දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම ව්‍යාපාදයෙන් වැළකුනේ වෙයි. ව්‍යාපාදයෙන් වැළකීම හේතුකොටගෙන දුක්

දොම්නස් විඳියි. දුකින් යුතුවම දොම්නසින් යුතුවම සම්‍යක් දෘෂ්ටි ඇත්තේ වෙයි. සම්‍යක් දෘෂ්ටිවීම හේතු කොට ගෙන දුක් දොම්නස් විඳියි. හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. මහණෙනි, මේ වනාහි වර්තමානයෙහි දුක්වූ, මත්තෙහි සැප විපාක දෙන්නාවූ ධර්ම සමාදානය යයි කියනු ලැබේ.

**9.** "මහණෙනි, වර්තමානයෙහි සැපවූ මත්තෙහිද සැප විපාක දෙන්නාවූ ධර්ම සමාදානය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම සතුන් මැරීමෙන් වැලකුනේ වෙයි. සතුන් මැරීමෙන් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම සොරකමින් වැලකුනේ වෙයි. සොරකමින් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුනේ වෙයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකීම හේතුකොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම බොරු කීමෙන් වැලකුනේ වෙයි. බොරු කීමෙන් වැලකීම හේතු කොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම කේලාම් කීමෙන් වැලකුනේ වෙයි. කේලාම් කීමෙන් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම ඵරුෂ වචනයෙන් වැලකුනේ වෙයි. ඵරුෂ වචනයෙන් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම හිස් කථා කීමෙන් වැලකුනේ වෙයි. හිස් කථා කීමෙන් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම දැඩි ලොභයෙන් වෙන්වූයේ වෙයි. දැඩි ලොභයෙන් වැලකීම හේතු කොටගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුතුවම සොම්නසින් යුතුවම ව්‍යාපාදයෙන් වෙන්වූයේ වෙයි. ව්‍යාපාදයෙන් වෙන්වීම හේතු කොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. සැපයෙන් යුක්තවම සොම්නසින් යුතුවම සම්‍යක්දෘෂ්ටි ඇත්තේ වෙයි.

සම්‍යක්දෘෂ්ටිය හේතු කොට ගෙන සැපයක් සොම්නසක් විඳියි. හෙතෙම කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදියි. මහණෙනි, මේ වනාහි වර්තමානයෙහි සැපවූද, මත්තෙහි සැප විපාක දෙන්නාවූද, ධර්ම සමාදානයයි කියනු ලැබේ. මහණෙනි, ධර්ම සමාදානයෝ සතරදෙන මොහුය.

10. "මහණෙනි, විෂ මිශ්‍රකළ තිත්ත ලබුගෙඩියක් වෙයිද, ජීවත්වනු කැමති, සැප කැමති, දුකට පිළිකුල් කරන්නාවූ, පුරුෂයෙක් තෙම එන්නේය. ඒ පුරුෂයාහට 'එම්බා පුරුෂය, මේ තිත්ත ලබු ගෙඩිය විෂයෙන් යුක්තය. ඉදින් කැමැත්තෙහි නම්, පානය කරව, පානය කරන්නාවූ, ඒ තට වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද සතුටක් නොවන්නේය, පානය කොටද වනාහි, මරණයට හෝ පැමිණෙන්නෙහිය. මරණය හා සමානවූ දුකට හෝ පැමිණෙන්නෙහියැ'යි කියන්නාහුය. හෙතෙම ඒ වචනය, නොසලකා පානය කරන්නේය. අත්නොහරින්නේය. එය පානය කරන්නාවූ ඔහුට වර්ණයෙන්ද ගන්ධයෙන්ද, රසයෙන්ද, සතුටක් නොවන්නේය. පානය කොටද වනාහි මරණයට හෝ පැමිණෙන්නේය. මරණය හා සමානවූ දුකට හෝ පැමිණෙන්නේය. මහණෙනි, වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද යම් මේ ධර්ම සමාදානයක් වේද, ඒ මේ ධර්ම සමාදානය මම ඊට උපමා කරමි.

11. "මහණෙනි, වර්ණයෙන් යුක්තවූ, ගන්ධයෙන් යුක්තවූ, රසයෙන් යුක්තවූ, පානය කළ යුතු මධුර පානයෙන් යුක්තවූ, රන්තලියක් වේද, ඒ රන්තලිය වනාහි, යම්සේ විෂයෙන් මිශ්‍ර කරන ලද්දේ වේද, එකල්හි ජීවත්වනු කැමැති දුක පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් එන්නේය. ඒ පුරුෂයාට, 'එම්බා පුරුෂය, වර්ණ සම්පන්නවූ සුවඳින් යුක්තවූ, රසයෙන් යුක්තවූ, මිහිරි පැන්වලින් යුක්තවූ රන් භාජනයක් වේ, ඒ රන් භාජනය විෂයන් මිශ්‍ර කරන ලද්දේය. ඉදින් කැමැත්තෙහි නම් පානය කරව, පානය කරන්නාවූ ඒ තට වර්ණයෙන්ද, සුවඳින්ද, රසයෙන්ද සතුට ඇතිවෙයි. බීමෙන් පසු මරණයට හෝ පැමිණෙන්නෙහිය, මරණය සමාන දුකට හෝ පැමිණෙන්නෙහිය'යි කියන්නාහුය. හෙතෙම ඒ වචනය නොසලකා පානය කරන්නේද,

අත්නොහරින්නේද, එය පානය කරන්නාවූ ඔහුට වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද සතුට ඇතිවෙයි. පානය කොට මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේය. මහණෙනි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහි දුක් විපාක දෙන්නාවූද, යම් මේ ධර්ම සමාදානයක් වේද, මෙය ඊට උපමා කොට කියමි.

12. "මහණෙනි, තරුණ වස්සන්ගේ මුත්‍ර අරළු, නෙල්ලි ආදී නොයෙක් ඖෂධයන් ගෙන් මිශ්‍ර කරණ ලද්දේ වේද, ඉක්බිත්තෙන් පාණ්ඩු රොගයෙන් පෙළෙන පුරුෂයෙක් එන්නේවේද, ඒ ඔහුට මෙසේ කියන්නේය. 'එම්බා පුරුෂය, මේ ගොමුත්‍රය නොයෙක් බෙහෙත්වලින් මිශ්‍රකරන ලද්දේවේ. ඉදින් කැමැත්තෙහි නම් බොව. බොන්නාවූ තට වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද සතුටක් නොවන්නේය. පානය කළායින් පසු සුවපත් වන්නෙහිය (කියායි.) හෙතෙම නුවණින් සලකා එය පානය කරන්නේය, නොහරින්නේය. ඔහුට එය පානය කරන කල්හි වරණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද සතුටක් නොවන්නේය. පානය කිරීමෙන් පසු සුවපත් වන්නේය. මහණෙනි, වර්තමානයෙහි දුක්වූද, මත්තෙහි සැප විපාක දෙන්නාවූද, යම් ධර්ම සමාදානයක් වේද, මෙය ඊට උපමාකොට කියමි.

13. "මහණෙනි, දීද, මීද, ගිතෙල්ද, උක්සකුරුද, යම්සේ එකට මිශ්‍රකරන ලද්දේ වේද, ඉක්බිති, පිත්ත අතීසාරයෙන් පෙළෙන පුරුෂයෙක් තෙම එන්නේද, ඒ පුරුෂයාහට මෙසේ කියන්නාහුය. 'එම්බා පුරුෂය, මේ ඖෂධය දීකිරිද, මීපැණි, ගිතෙල්ද, උක්සකුරුද එකට මිශ්‍ර කරන ලද්දේය. ඉදින් කැමැත්තෙහි නම් පානය කරව පානය කරන්නාවූ, ඒ තට වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද සතුටත් වන්නේය, පානය කළපසු සුවපත් වන්නෙහිය, හෙතෙම නුවණින් සලකා එය පානය කරන්නේය, පානය කරන කල්හි වර්ණයෙන්ද, ගන්ධයෙන්ද, රසයෙන්ද ඔහුට සතුටක් ගෙන දෙන්නේය. පානය කිරීමෙන් පසු සුවපත් වන්නේය. මහණෙනි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහිද සැප විපාක දෙන්නාවූද, යම් මේ ධර්ම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

සමාදානයක් වේද, ඒ මේ ධර්ම සමාදානය මම ඊට උපමාකර කියමි.

14. "මහණෙනි, වර්ෂා ඍතුවෙහි, අන්තිම මාසයෙහි හෙවත්, ඉල් මසෙහි සරත්කාලයෙහි අහසෙහි වැහි වලාකුළු නැතිවී ගිය කල්හි සූර්‍ය්‍යයා අහසට නැගී අහසෙහි සියලු අන්ධකාරය මැඩගෙන යම්සේ බබලන්නේ වේද, විශෙෂයෙන් බබලන්නේ වේද, මහණෙනි, එපරිද්දෙන්ම වනාහි, වර්තමානයෙහි සැපවූද, මත්තෙහි සැප විපාක ගෙනදෙන්නාවූද, යම් ඒ ධර්ම සමාදානයක් වේද, ඒ මේ ධර්ම සමාදානය අන්‍යවාදී බාහිරවූ බොහෝ මහණ බමුණන් මැඩ, බබලන්නේ වෙයි, දීප්තිමත් වන්නේ වෙයි, අතිශයින් බබලන්නේද වේය"යි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**හයවෙනිවූ මහා ධම්ම සමාදාන සූත්‍රය නිමි. (5-6)**

## 47. වීමංසක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටුහු විසින් කරවනලද ජෙතවන නම් විහාරයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. "ස්වාමීන්වහන්ස"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, පරසිත් නොදන්නාවූ විමසන භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ සම්‍යක් සම්බුද්ධද? නැද්ද? යි දැනගනු සඳහා තථාගතයන් වහන්සේ පිළිබඳව විමසා බැලිය යුතුය."

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ වෙතින් පහළ වන්නාහ, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණ කොට ඇත්තාහ. ස්වාමීනි, මේ වචනයෙහි අර්ථයද භාග්‍යවතුන් වහන්සේටම වැටහේවා,

භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුය.” “මහණෙනි, එසේවීනම් අසව්, මනාකොට මෙනෙහි කරව්, කියන්නෙමි.” “එසේය, ස්වාමීනි”යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. “මහණෙනි, පරසිත් නොදන්නාවූ, විමසන්නාවූ භික්ෂුව විසින් ධර්ම දෙකක් පිළිබඳව සර්වඥයන් වහන්සේ පරීක්ෂා කටයුතුයි. (එනම්) ඇසින් හා කණින් (දැකීමෙන් හා ඇසීමෙන්) දතයුතු ධර්මයන්හිය. ඇසින් හා කණින් දතයුතුවූ ක්ලෙශ සහගත යම් ධර්ම වෙත්නම්, ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි විමසිය යුතුය. ඒ මේ කාරණය විමසන්නාවූ භික්ෂුව මෙසේ දැනගනියි. (එනම්) ඇසින් හා කණින් (දැකීමෙන් හා ඇසීමෙන්) දතයුතුවූ කෙලෙස් සහගත ධර්ම තථාගතයන් වහන්සේට නැත කියාය. යම් විටෙක එසේ විමසා බලන්නේ ඇසින් හා කණින් දතයුතුවූ, කෙලෙස් සහගත ධර්ම තථාගතයන් වහන්සේට නැතැයි දකීද, ඉක්බිති තව දුරටත් විමසා බලන්නේය. ඇසින් හා කණින් දත යුතුවූ මිශ්‍රවූ යම් ධර්ම (කලකදී හොඳ, කලකදී නරක ක්‍රියා හා වචන) වෙත් නම් ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි පරීක්ෂා කරන්නේය. ඒ කාරණය පරීක්ෂා කරන්නාවූ භික්ෂුව මෙසේ දැනගනියි. (එනම්) මිශ්‍රවූ යම් ධර්ම වෙත් නම් ඒ ධර්ම තථාගතයන් වහන්සේට නැත කියාය. යම් විටෙක එසේ පරීක්ෂා කරන්නේ හොඳ නරක මිශ්‍ර ධර්ම තථාගතයන් වහන්සේට නැතැයි දැන ගනීද, ඉක්බිති තවදුරටත් සෝදිසි කරන්නේය.

3. “ඇසින් හා කණින් දතයුතුවූ යම් පිරිසිදු (කෙලෙස් රහිත) ධර්ම කෙනෙක් වෙත්නම් ඒවා තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි විමසා බලන්නේය. ඒ කාරණය පරීක්ෂා කරන භික්ෂුව මෙසේ දැන ගනියි. (එනම්) පිරිසිදුවූ (කෙලෙස් රහිත) යම් ධර්ම වෙත්නම් ඒ ධර්ම තථාගතයන් වහන්සේට ඇත කියාය. යම් විටෙක එසේ පරීක්ෂා කරන්නේ පිරිසිදුවූ ධර්ම තථාගතයන් වහන්සේට ඇතැයි දැනගනීද ඉක්බිති තව දුරටත් පරීක්ෂා කරන්නේය.

"මේ පින්වත් තෙමේ (බුදුන් වහන්සේ) බොහෝ කලක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේද නැතහොත් සුලු කාලයක් තුළ එයින් යුක්ත වූයේදැයි පරීක්ෂා කරන්නේය. ඒ මේ කාරණය පරීක්ෂා කරන භික්ෂුව මෙසේ දැන ගනියි. (එනම්) මේ පින්වත් තෙමේ බොහෝ කලක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේය. සුලු කාලයක් තුළ නොවේ කියාය. යම් විටෙක එසේ පරීක්ෂා කරන්නේ මේ පින්වත් තෙමේ බොහෝ කාලයක් මුළුල්ලෙහි මේ කුසල ධර්මයෙන් යුක්ත වූයේය, සුලු කාලයක් තුළ නොවේයැයි දැන ගනීද, ඉක්බිති තව දුරටත් පරීක්ෂා කරන්නේය.

4. "මේ පින්වත් භික්ෂුව ප්‍රසිද්ධ බවට පැමිණියේය. පිරිවර ආදී යසසට පැමිණියේය. ඔහුට මේ ලෝකයෙහි යම් යම් දොස් ඇත්දැයි පරීක්ෂා කරන්නේය. මහණෙනි, මේ ශාසනයෙහි (භික්ෂුව) යම්තාක් ප්‍රසිද්ධ බවට නොපැමිණියේ වේද, පරිවාර සම්පත්තියට නොපැමිණියේවේද, ඒතාක් ඔහුට යම් යම් දොෂයෝ ඇති නොවෙත්. මහණෙනි, යම් තැනක පටන් මහණතෙම ප්‍රසිද්ධියට පැමිණියේද, පිරිවර ආදි සම්පත්තියට පැමිණියේද, එවිට ඔහුට මේ ලෝකයෙහි යම් යම් දොෂයෝ ඇතිවෙත්. ඒ මේ කාරණය පරීක්ෂා කරන්නේ මෙසේ දනියි. මේ ආයුෂ්මත් භික්ෂු තෙමේ ප්‍රසිද්ධ බවට පැමිණියේය. ඔහුට මෙහි යම් යම් දෝෂ නැතැයි කියාය. යම්විටෙක එසේ පරීක්ෂා කරන්නේ මෙසේ දනීද, මේ ආයුෂ්මත් භික්ෂු තෙමේ ප්‍රසිද්ධ බවට පැමිණියහ. පිරිවර ආදි සම්පත්තියට පැමිණියේය. මේ ලොකයෙහි ඔහුට යම් යම් දොෂයෝ නැතැයි දැනගනීද, ඉක්බිති තව දුරටත් පරීක්ෂා කරන්නේය.

"මේ ආයුෂ්මත් තෙම නිර්භය වූයේද, මේ ආයුෂ්මත් තෙම භයින් යුක්ත වූයේ නොවේද, රාගය නැති කිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරන්නේද? කියා පරීක්ෂා කරන්නේය. ඒ මේ කාරණය පරීක්ෂා කරන්නේ මෙසේ දනියි. මේ ආයුෂ්මත් තෙම නිර්භය වූයේය. භයින් යුක්තවූයේ නොවෙයි, පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරයි. (කියා දැනගනියි) මහණෙනි, අන්‍යයෝ ඒ භික්ෂුවගෙන් මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

විචාරන්නාහුය. 'මේ පින්වත් තෙමේ නිර්භය වූයේ, භයින් යුක්ත වූයේ නොවෙයි, රාගය නැතිකිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරයි කියා කියන්නට ආයුෂ්මතුන්හට ඇති කාරණයෝ කවරහුද? අනුමාන කල්පනා කවරහුදැ'යි (අසන්නාහුය) මහණෙනි, මනාකොට ප්‍රකාශ කරන්නාවූ ඒ මහණ තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'මේ ආයුෂ්මත් තෙමේ සමූහයා අතරෙහි වාසය කරන්නේ හෝ වේද, තනිව වාසය කරන්නේ හෝ වෙයිද, එහි යම් මනාව පිළිපදින පුද්ගලයෝ වෙත්ද, නොමනාව පිළිපදින පුද්ගලයෝ වෙත්ද, සමූහයා පිරිවරා සිටින පුද්ගලයෝ වෙත්ද, ආහාර පාන ආදි ආමිසයන්හි ගිජුව වාසය කරන්නෝ වෙත්ද, ආමිසයන්හි නොඇලී වාසය කරන්නෝ වෙත්ද, මේ ආයුෂ්මත් තෙම, ඒ ඒ කාරණය නිසා ඒ ඒ පුද්ගලයාට අවමන් නොකරයි. 'මම නිර්භය වෙමි. මම භයින් යුක්තවූයේ නොවෙමි. රාගය නැති කිරීමෙන් පහවූ රාග ඇති බැවින් කාමයන් සේවනය නොකරමි'යි යන මේ කාරණය භාග්‍යවතුන් වහන්සේ වෙතින්ම අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් පිළිගන්නා ලදී.

5. "මහණෙනි, එහිලා, ඇසින් හා කණින් දතයුතු යම් ලාමක ධර්මකෙනෙක් වෙත්ද, ඔහු තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි තථාගතයන් වහන්සේගෙන්ම ඇසිය යුතුය. ප්‍රකාශ කරන්නාවූ තථාගත තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය.

"ඇසින් හා කණින් දතයුතුවූ යම් කෙලෙස් සහිත ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත. ඇසින් හා කණින් දතයුතුවූ යම් මිශ්‍රවූ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද නැද්දැයි (තථාගතයන් වහන්සේ ගෙන් ම ඇසිය යුතුය) ප්‍රකාශ කරන්නාවූ තථාගත තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇසින් හා කණින් දත යුතුවූ යම් මිශ්‍රවූ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට නැත' (කියාය.) ඇසින් හා කණින් දතයුතුවූ යම් පිරිසිදුවූ ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් වහන්සේට ඇද්ද, නැද්දැයි (තථාගතයන් වහන්සේ ගෙන්ම ඇසියයුතුයි) ප්‍රකාශ කරන්නාවූ,

තථාගතතෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇසින් හා කණින් දතයුතුවූ පිරිසිදුවූ යම් ධර්මයෝ වෙද්ද, ඒ ධර්මයෝ තථාගතයන් කෙරෙහි වෙති' (කියාය.) මම මේ ආජීවාෂ්ටමක ශීලය මාර්ගකොට ඇත්තේ වෙමි. මේ ආජීවාෂ්ටමක ශීලය ගොචර කොට ඇත්තේ වෙමි. ඒ පිරිසිදු ශීලයෙන් තෘෂ්ණා සහිත නොවෙමි. මහණෙනි, මෙසේ කියන්නාවූ ශාස්තෲන් වහන්සේ කරා ශ්‍රාවක තෙම, බණ ඇසීම පිණිස යන්නට සුදුසුය. ශාස්තෲන් වහන්සේ ඔහුට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ, අතිශයින් ප්‍රණීතවූ කුසලාකුසල ධර්ම විභාග සහිතවූ, ධර්මය දෙශනා කරති. මහණෙනි, ශාස්තෲන්වහන්සේ භික්ෂුවහට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ, අතිශයින් ප්‍රණීතවූ කුසලාකුසල විපාක විභාග සහිතවූ, ධර්මය යම් යම් ආකාරයකින් දෙසනා කෙරේද, ඒ ඒ ආකාරයෙන් හෙතෙම ඒ දෙශනාකළ ධර්මය දැන ඒ ධර්මයන් අතුරෙන් එක් ධර්මයක් දැන, ධර්මයන්හි නිෂ්ඨාවට පැමිණෙයි. භාග්‍යවතුන් වහන්සේ සියල්ල මනාව තෙමේම අවබොධකළ උත්තමයායි කියාද, භාග්‍යවතුන්වහන්සේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරනලදයයි කියාද, ආයුෂ්මත් සංඝතෙම මනාව පිළිපන්නේයයි කියාද, ශාස්තෲන් වහන්සේ කෙරෙහි පහදියි.

**6.** 'මහණෙනි, අන්‍යයෝ ඒ භික්ෂුවගෙන් මෙසේ විචාරන්නාහුය. (එනම්) 'ආයුෂ්මත් තෙමේ, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාකොට ප්‍රකාශ කරන ලද්දේය. සංඝතෙම මනාව පිළිපන්නේය යි මෙසේ කියන්නෙහිය. ආයුෂ්මත්හට එසේ කීමට ඇති අනුමාන කල්පනා කවරහුද?' මහණෙනි, මනාකොට, ප්‍රකාශ කරන්නාවූ, මහණතෙම, මෙසේ කියන්නේය. ඇවැත්නි, මෙහි මම ධර්මශ්‍රවණය පිණිස භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියෙමි. භාග්‍යවතුන් වහන්සේ ඒ මට අතිශයින් ශ්‍රෙෂ්ඨවූ අතිශයින් ප්‍රණීතවූ කුසලාකුසල ධර්ම විභාග සහිතවූ, ධර්මය දෙශනා කරන සේක. ඇවැත්නි, යම් යම් ආකාරයකින් භාග්‍යවතුන් වහන්සේ අතිශ්‍රෙෂ්ඨවූ, අතිශයින් ප්‍රණීතවූ, කුසලා කුසල ධර්ම විභාග විපාක දැක්වීම් සහිතවූ, ධර්මය දෙශනා කරත්ද, ඒ ඒ පරිද්දෙන් මම ඒ දෙශනා කළ

ධර්මය දැන, ඒ ධර්ම අතුරෙන් එක්තරා ධර්මයක් දැන ධර්මයන්හි නිමාවට පැමිණියෙමි. භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරනලදී. සංඝතෙම, මනාව පිළිපන්නේයයි ශාස්තෘන්වහන්සේ කෙරෙහි පැහැදුනෙමියි, (කියන්නේය.)

"මහණෙනි, යම් කිසිවෙකුට, ශාස්තෘන්වහන්සේ පරීක්ෂා කරන මේ ක්‍රමවලින්, මේ පදවලින්, මේ ව්‍යඤ්ජනවලින් තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටියාද, (සෝවාන් මාර්ගයට පැමිණීම් වශයෙන්) හටගත් මුල් ඇත්තීද, මහණෙනි, මේ ශ්‍රද්ධාව වනාහි කරුණු සොයා පිළිගත් හෙයින් කරුණු සහිතයයිද සෝවාන්මාර්ගය මුල්කොට ඇත්තීයයිද, ස්ථිරයයිද, ශ්‍රමණයෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ ලොකයෙහි කිසිවෙකු විසින් හෝ පැහැරගත නොහැකියයිද කියනු ලැබේ. මහණෙනි, මෙසේ වනාහි, තථාගතයන් වහන්සේ පිළිබඳ ඇති සැටියෙන් කරුණු සෙවීම වෙයි. මෙසේ වනාහි, තථාගතතෙම, ඇති සැටියෙන් මනාව පරීක්ෂා කරන ලද්දේ වේ" යයි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**හත්වෙනිවූ වීමංසක සූත්‍රය නිමි. (5-7)**

## 48. කොසම්බිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර ඝොසිත නම්වූ ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි කොසඹෑ නුවර භික්ෂූහු හටගත් ඩබර ඇතිව, හටගත් කෝලාහල ඇතිව, විවාද කර ගනිමින් එකිනෙකා වචන නමැති ආයුධවලින් ඇනගනිමින් වාසය කරති. ඔවුහු එකිනෙකාට ඇත්ත පෙන්නාදී කරුණු පැහැදිලි නොකරති. පැහැදිලි කළත් නොපිළිගනිති.

ඉක්බිති එක්තරා භික්ෂුවක්තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ

වැඩ එක පැත්තක උන්නේය. එක පැත්තක උන්නාවූ ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, මෙහි කොසඹෑ නුවර භික්ෂූහු හටගත් ඩබර ඇතිව, හටගත් කොලාහල ඇතිව, විවාද කරගනිමින් එකිනෙකා වචන නමැති ආයුධ වලින් ඇනගනිමින් වෙසෙත්. ඔවුහු එකිනෙකාට ඇත්ත පෙන්නාදී කරුණු පැහැදිලි නොකරති. පැහැදිලි කළත් නොපිළි ගනිති." ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ එක්තරා භික්ෂුවක් කැඳවූහ. "මහණ මෙහි එව, තොප මාගේ වචනයෙන් ශාස්තෲන් වහන්සේ ආයුෂ් මතුන් කැඳවන්නා හුයයි ඒ භික්ෂූන් කැඳවව"යි (කීහ.) "එසේය ස්වාමීනි"යි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට උත්තරදී ඒ භික්ෂූන් යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් ඒ භික්ෂුන්හට "ශාස්තෲන් වහන්සේ ආයුෂ් මතුන් කැඳවන්නාහ"යි කීයේය. "එසේය ඇවැත්නි"යි භික්ෂුහු ඒ භික්ෂූවට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක පැත්තක උන්නාහුය. එක පැත්තක උන්නාවූ ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "මහණෙනි, තෙපි හට ගත් ඩබර ඇත්තාහු, හටගත් කොලාහල ඇත්තාහු, විවාද කරගන්නාහු, එකිනෙකාට වචන නමැති ආයුධවලින් විදගනිමින් වාසය කරන්නාහුය. ඒ තොප එකිනෙකාට ඇත්ත පෙන්නාදී කරුණු පැහැදිලි නොකරන්නාහුය. පැහැදිලි කළත් නොපිළිගන්නාහුය. යනු සැබෑද?" (යි ඇසූහ)

"එසේය, ස්වාමීනි"

"මහණෙනි, තොපි යම් කලෙක හටගත් ඩබර ඇත්තාහු හටගත් කොලාහල ඇත්තාහු. විවාද කරගන්නාහු එකිනෙකා වචන නැමැති ආයුධ වලින් විදගනිමින් වාසය කරත් නම් එකල්හි, සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි. ඇති තැනද, නැති තැනද, මෛත්‍රී සහගත කාය කර්මය (කයින් කරන ක්‍රියා) එළඹ සිටියේයයි හෝ, සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ඇති තැනද, නැති තැනද මෛත්‍රී සහගත වචනය එළඹ සිටියේයයි හෝ, සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ඇති තැනද, නැති තැනද, මෛත්‍රී සහගත හිත එළඹ සිටියේයයි හෝ සිතන්නහුද?"

"නැත ස්වාමීනි"

2. "මහණෙනි, මෙසේ වනාහි තොපි යම් කලෙක හටගත් ඩබර ඇත්තාහු, හටගත් කොලාහල ඇත්තාහු විවාද කරගන්නාහු, එකිනෙකා වචන නැමති ආයුධ වලින් විදගනිමින් වාසය කරන්නාහු නම්, තොපට සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ඇති තැනද, නැති තැනද මෛත්‍රී සහගත කායකර්මය එළඹ නොසිටියේ වෙයි. සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රී සහගත වාක් කර්මය එළඹ නොසිටියේ වෙයි. සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ඇති තැනද නැති තැනද මෛත්‍රී සහගත මනො කර්මය එළඹ නොසිටියේ වෙයි. එසේ නම්, හිස් පුරුෂයිනි, තෙපි කුමක් දන්නාහු, කුමක් දක්නාහු, හටගත් ඩබර ඇත්තාහු හටගත් කොලාහල ඇත්තාහු, විවාද කරගන්නාහු එකිනෙකාට වචන නමැති ආයුධ වලින් පහරදෙමින් වාසය කරව්ද? තොපි එකිනෙකාට ඇත්ත පෙන්නාදී කරුණු පැහැදිලි නොකරන්නාහුය. පැහැදිලි කළත් නොපිළිගන්නාහුය. හිස් පුරුෂයිනි, මේ වනාහි තොපට බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස වන්නේය."

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළහ. "මහණෙනි, දීර්ඝ කාලයක් මුළුල්ලෙහි සිහිකටයුතුවූ, (සමාන බඹසර ඇත්තවුන්ට) ප්‍රිය බව කරන්නාවූ, ගෞරවය ඇතිකරන්නාවූ, මෙ ධර්ම හයක් සංග්‍රහ පිණිසද, විවාද නොකිරීම පිණිසද, සමගි බව පිණිසද, එකඟ බව පිණිසද, පවතිත්. කවර සයක්ද යත්:- මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුහුගේ මෛත්‍රී සහගත කාය කර්මය ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද, සමාන බ්‍රහ්ම චරියා ඇත්තවුන් කෙරෙහි එළඹ සිටියේද, මේ ධර්මය තෙමේ සිහිකටයුතුය ප්‍රිය බව කරන්නේය. ගරු බව කරන්නේය. සංග්‍රහය පිණිසද, විවාද නොකිරීම පිණිසද, සමගිය පිණිසද, එකඟ බව පිණිසද පවතියි.

4. "මහණෙනි, නැවතද අනෙකක් කියමි. භික්ෂුවගේ මෛත්‍රී සහගත වචීකර්මය ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති

තැනද සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි එළඹ සිටියේද, මේ ධර්මය තෙමේද සිහිකටයුතුය. ප්‍රිය බව කරන්නේය. ගරුබව කරන්නේය, සංග්‍රය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකග බව පිණිසද පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. භික්ෂුවගේ මෛත්‍රී සහගත මනො කර්මය ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි එළඹ සිටියේද, මේ ධර්මය තෙමේද සිහි කටයුතුය, ප්‍රිය බව කරන්නේය, ගරුබව කරන්නේය. සංග්‍රහය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකග බව පිණිසද පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම දැහැමිවූ, දැහැමින් ලැබුනාවූ, යටත් පිරිසයින් පාත්‍රයට අල්ලන පමණ වූද, යම් ඒ ලාභයෝ වෙත්ද, එබඳුවූ ලාභයන් ශිල්වත්වූ, සමාන බඹසර ඇත්තවුන් හා නොබෙදා නොවළඳන්නේවේද, ඔවුනොවුන් හා සමානව බෙදාහදා වළඳන්නේ වේද, මේ ධර්මය තෙමේද සිහි කටයුතුය ප්‍රිය බව කරන්නේය. ගරු බව කරන්නේය. සංග්‍රහය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකග බව පිණිසද පවතියි.

"මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම කඩනොවූ, සිදුරු නොවූ, පුල්ලි සහිත නොවූ, කබර හටනොගත්තාවූ තණ්හාවට යටත් නොවූ නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන ලද්දාවූ, තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ස්පර්ශ නොකරන ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ, යම් ඒ ශීලයෝ වෙත්ද, එබඳු ශීලයන්ගෙන් සබ්‍රහ්මචාරීන් සමග අභිමුඛයෙහිද, අනභිමුඛයෙහිද සමාන බවට පැමිණියේ වෙයිද, මහණෙනි, මේ ධර්මය තෙමේද සිහි කටයුතුය. ප්‍රිය බව කරන්නේය. ගරු බව කරන්නේය. සංග්‍රහය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකග බව පිණිසද පවතියි.

"මහණෙනි, නැවත අනෙකක්ද කියමි. මහණතෙම උතුම්වූ නිවන් පිණිස පවත්නාවූ, යම් මේ සම්‍යක් දෘෂ්ටියක් වේද, ඊට අනුව පිළිපදින පුද්ගලයාට හොඳින් සියලු දුක් නැති කිරීම

පිණිස පවතීද, එබඳු සම්‍යක් දෘෂ්ටියෙන් සබ්‍රම්සරුන් හා ඉදිරියෙහි ඇති තැනද, ඉදිරියෙහි නැති තැනද, සමාන බවට පැමිණියේ වේද, මේ ධර්මය තෙමේද සිහි කටයුතුය. ප්‍රිය බව කරන්නේය. ගරුබව කරන්නේය. සංග්‍රහය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකඟ බව පිණිස පවතියි. මහණෙනි, මේ වනාහි සිහි කට යුතුවූද, ප්‍රිය බව කරන්නාවූද, ගරු බව කරන්නාවූද, සංග්‍රහය පිණිසද, අවිවාදය පිණිසද, සමගිය පිණිසද, එකී භාවය පිණිසද පවත්නා ධර්ම සය වෙති.

5. "මහණෙනි, මේ සය ආකාර සිහි කටයුතු ධර්මයන් අතුරෙන් නිර්දොෂවූ, නිවන් පිණිස පවත්නාවූ යම් මේ මාර්ග සම්‍යක්දෘෂ්ටියක් වේද, ඊට අනුව පිළිපදින්නහුට හොඳින් සියලු දුක් නැති කිරීම පිණිස පවතීද එය සියල්ලට අග්‍රය. එය සියල්ල සංග්‍රහ කරන්නේය. සියල්ල ඊට සම්බන්ධය. මහණෙනි, යම්සේ කුළුගෙයක යම් මේ කැණිමඬලක් වේද, මෙය අග්‍රයි. එය යම්සේ සියලු දැව එක්කොට ගන්නේද, සියලු දැව ඊට සම්බන්ධ වන්නේද, එපරිද්දෙන්ම මේ සය ආකාර සිහි කටයුතු ධර්මයන් අතුරෙන් නිර්දොෂවූ නිවණට පමුණුවන්නාවූ යම් මේ සම්‍යක් දෘෂ්ටියක් ඒ කරන්නහුගේ හොඳින් දුක් නැති වීම පිණිස පමුණුවාද මෙය අග්‍රයි. එය සියල්ල සංග්‍රහ කරන්නේය. සියල්ල ඊට සම්බන්ධය.

6. "මහණෙනි, නිර්දෝෂවූද, නිවණට පමුණු වන්නා වූද, යම් මේ මාර්ග සම්‍යක් දෘෂ්ටියක්වේද, ඊට අනුව පිළිපදින්නහුට හොඳින් දුක් නැති කිරීම පිණිස කෙසේ නම් පවතීද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ආරණ්‍යයට ගියේ හෝ රුකක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ මෙසේ සලකයි. 'මම යම්බඳු කෙලෙස් ඉපදීමකින් මඩනාලද සිත් ඇත්තෙම් ඇති සැටියෙන් නොදන්නෙම්ද, නොදක්නෙම්ද, ඒ කෙලෙස් ඉපදීම මා තුළ පහනොවී පවතියිද? (කියාය) මහණෙනි, ඉදින් මහණතෙම කාමරාගයෙන් මඩනා ලද්දේ වේද, මඩන ලද සිත් ඇත්තේවේද, මහණෙනි, ඉදින් මහණ තෙම ව්‍යාපාද නීවරණයෙන් මඩනාලද්දේ වේද, ව්‍යාපාදයෙන් මඩනාලද සිත්

ඇත්තේ වේද, මහණෙනි, ඉදින් මහණතෙම ථීනමිද්ධයෙන් මඩනාලද්දේ වේද, ථීනමිද්ධයෙන් මඩනාලද සිත් ඇත්තේවේද, මහණෙනි, ඉදින් මහණතෙම උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද්දේවේද, උද්ධච්චකුක්කුච්චයෙන් මඩනා ලද සිත් ඇත්තේ වේද, මහණෙනි, ඉදින් මහණතෙම විචිකිච්ඡාවෙන් මඩනා ලද්දේ වේද. විචිකිච්ඡාවෙන් මඩනාලද සිත් ඇත්තේ වේද, මහණෙනි, ඉදින් මහණතෙම මෙලොව සම්පත් ගැන සිතීමෙහි යෙදුනේ වේද, එයින් මඩනාලද සිත් ඇත්තේවේද, මහණෙනි, ඉදින් මහණතෙම පරලොව ගැන සිතීමෙහි යෙදුනේවේද, එයින් මඩනාලද සිත් ඇත්තේ වේද, මහණෙනි, ඉදින් මහණතෙම හටගත් ඩබර ඇත්තේද, හටගත් කොලාහල ඇත්තේද, විවාදයට පැමිණියේද, එකිනෙකා මුඛ නමැති ආයුධ වලින් විදගනිමින් වාසය කරයිද, එයින් මඩනාලද සිත් ඇත්තේ වේද, හෙතෙම මෙසේ දනියි. මම යම්බඳු කෙලෙස් ඉපදීමක් මඩනාලද සිත් ඇත්තෙම් ඇති සැටියෙන් නොදන්නෙම්ද, නොදක්නෙම්ද, ඒ කෙලෙස් ඉපදීම මා තුළ නැති නොවී නැතැයි (දැනගනී) මාගේ සිත චතුරාර්‍ය්‍ය සත්‍ය අවබොධය පිණිස මනාකොට පිහිටුවන ලද්දේයයි (දැන ගනියි) ඔහු විසින් ආර්‍ය්‍යවූ ලොකොත්තරවූ, පෘථක්ජනයන් හා සාධාරණ නොවූ, මේ ප්‍රථම ඥානය ලබන ලද්දේ වෙයි.

7. "මහණෙනි, නැවත අනිකක්ද කියමි මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. මම මේ මාර්ග සම්‍යක් දෘෂ්ටිය සෙවනය කරන්නේ, වඩන්නේ, බහුල කරන්නේ තමා තුළ චිත්ත සමථය ලබයිද, තමා තුල කෙලෙස් සංසිඳීම ලබයිද, හෙතෙම මෙසේ දනියි. 'මම මේ මාර්ගදෘෂ්ටිය සෙවනයකරන්නේ වඩන්නේ, බහුල කරන්නේ, මාගේ චිත්ත සමථය ලබමි. මාගේ කෙලෙස් නිවීම ලබමියි (දැනගනියි) ඔහු විසින් ආර්‍ය්‍යවූ ලොකොත්තරවූ, පෘථග්ජනයන් හා සාධාරණ නොවූ, දෙවන ඥානය ලබන ලද්දේ වෙයි.

8. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. 'මම යම්බඳු ආර්‍ය්‍ය දෘෂ්ටියකින් යුක්තවූයෙම්ද,

එබඳුවූ මාර්ග දෘෂ්ටියකින් යුක්තවූ, මේ ශාසනයෙන් පිටත්වූ, ශ්‍රමණයෙක් හෝ බමුණෙක් හෝ ඇත්තේදෝ'යි. (සලකයි) හෙතෙම මෙසේ දනියි. 'මම යම්බඳු මාර්ග සම්‍යක් දෘෂ්ටියකින් යුක්තවූයෙම්ද, එබඳු දෘෂ්ටියකින් යුක්තවූ, මේ ශාසනයෙන් පිටත්වූ අන්‍යවූ, ශ්‍රමණයෙක් හෝ, බමුණෙක් හෝ නැත.' ඔහු විසින් ආර්‍යයවූ ලොකොත්තරවූ, පෘථග්ජනයන් හා සාධාරණ නොවූ මේ තුන්වන ඥානය ලබන ලද්දේ වෙයි.

**9.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනාකරයි. 'මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගල තෙම යම්බඳු ස්වභාවයකින් යුක්තවූයේ මමද එබඳු ස්වභාවයෙන් යුක්තවෙමි' (කියායි) මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලතෙම, කෙබඳු ස්වභාවයෙන් යුක්තවූයේද? මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාගේ ස්වභාවය මෙසේ වෙයි. යම්බඳු ඇවතකින් නැගීසිටීම පෙනේද, යම් හෙයකින් එබඳු ඇවතකට පැමිණියහොත් එය වහාම ශාස්තෲන් වහන්සේ වෙත හෝ, නුවණැත්තාවූ, සබ්‍රම් සරුන් වෙත හෝ දෙසනා කරයි. එළිකරයි. ප්‍රකට කරයි. දෙසා, එළිකොට, ප්‍රකට කොට මත්තෙහි සංවරයට පැමිණෙයි. මහණෙනි, යම්සේ බාලවූ, උඩුකුරුව සයනය කරන්නාවූ, ළදරු කුමාරයෙක් අතින් හෝ පයින් හෝ ගිනි අඟුරක් මිරිකා වහාම අතපය හකුළුවාද, මහණෙනි, එපරිද්දෙන්ම, මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාගේ ස්වභාවය මෙසේ වෙයි. යම්බඳු ඇවතකින් නැගීසිටීම පෙනේද, යම් හෙයකින් එබඳු ඇවතකට පැමිණියහොත් එය වහාම ශාස්තෲන් වහන්සේ වෙත හෝ නුවණැත්තාවූ, සබ්‍රහ්මචාරීන් වෙත හෝ දෙසනා කරයි. එළි කරයි. ප්‍රකට කරයි. දෙශනාකර, එළිකර, ප්‍රකට කොට මත්තෙහි සංවරයට පැමිණෙයි. හෙතෙම 'මෙසේ දනියි. මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලතෙම යම්බඳු ස්වභාවයකින් යුක්ත වේද, මමද එබඳු ස්වභාවයෙන් යුක්තවෙමි.' (කියාය) ඔහු විසින් ආර්‍යයවූ, ලොකොත්තරවූ, පෘථග් ජනයන් හා සාධාරණ නොවූ සතරවෙනි ඤාණය ලබන ලද්දේ වෙයි.

**10** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. 'මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම යම්බඳු

ස්වභාවයකින් යුක්ත වේද, මමද එබඳු ස්වභාවයකින් යුක්ත වෙමි.'

"මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම කෙබඳු ස්වභාවයකින් යුක්ත වේද, මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයාගේ ස්වභාවය මෙසේ වෙයි, සබ්‍රම්සරුන්ගේ කුඩාවූද, මහත්වූද, විමසා බලා කළයුතු කටයුතු වෙත් නම්, ඒ කටයුතු සම්පාදනයෙහි උත්සාහවත් වූයේ වෙයි. ඉක්බිති අධිශීල ශික්ෂාවෙහිද, අධිචිත්ත ශික්ෂාවෙහිද, අධිප්‍රඥා ශික්ෂාවෙහිද, බලවත් ප්‍රාර්ථනා ඇත්තේවෙයි. මහණෙනි, ළපටි වස්සකු ඇති දෙන තණකොළද කඩාකයි. වසු පැටියාද බලයි. මහණෙනි, එපරිද්දෙන්ම මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාගේ මේ ස්වභාවයයි, කිසිසේත් සබ්‍රම්සරුන්ගේ කුඩාවූද, මහත්වූද විමසා බලා කළයුතු කටයුතු වේද්ද එහි උත්සාහ ඇති බවට පැමිණියේ වෙයි. යලිත් අධිශීලයෙහිද, අධිචිත්තයෙහිද, අධිප්‍රඥාවෙහිද බලවත් ප්‍රාර්ථනා ඇත්තේ වෙයි. හෙතෙම මෙසේ දනියි. 'මාර්ගදෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම යම්බඳු ස්වභාවයකින් යුක්තවේද, මමද එබඳු ස්වභාවයකින් යුක්තවෙමි.' (කියායි) ඔහුවිසින් ආයර්‍යවූ, ලොකොත්තර වූ පෘථග්ජනයන් හා සාධාරණ නොවූ පස්වෙනි ඥාණය ලබන ලද්දේ වෙයි.

11. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආයර්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. 'මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයා යම්බඳු බලයකින් යුක්තවූයේද, මමද, එබඳුවූ බලයකින් යුක්තවෙමි. මහණෙනි, මාර්ගදෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයා කෙබඳු බලයකින් යුක්තද? තථාගතයන් වහන්සේ විසින් වදාළවූ ධර්ම විනය දෙක දෙසනා කරනු ලබන කල්හි ඉන් ප්‍රයෝජනය ගනු කැමතිව, මෙනෙහි කොට, මුලු සිතින් දරාගනිමින්, හොඳට කන්යොමා ධර්මය අසයි. හෙතෙම මෙසේ දනියි. 'මාර්ගදෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම යම්බඳු බලයකින් යුක්තවේද, මමද එබඳු බලයකින් යුක්තවෙමි'යි. ඔහු විසින් ආයර්‍යවූ ලොකොත්තරවූ පෘථග්ජනයන් හා සාධාරණ නොවූ සයවෙනි ඥාණය ලබන ලද්දේ වෙයි.

12. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආයර්‍යශ්‍රාවක තෙම මෙසේ සලකයි. 'මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයා යම් බඳු

බලයකින් යුක්ත වේද මමද එබඳු බලයකින් යුක්තවෙමි.' (කියාය) මහණෙනි, මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයා කෙබඳු බලයකින් යුක්තවූයේද? මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගලයාගේ ස්වභාවය මෙසේ වෙයි. තථාගතයන් වහන්සේ විසින් වදාළවූ ධර්ම විනය දෙසනා කරනු ලබන කල්හි, අර්ථයෙන් සතුට ලබයි. ධර්මයෙන් සතුට ලබයි. අර්ථයෙන් යුක්තවූ ධර්මයෙන් යුක්තවූ සතුට ලබයි. හෙතෙම මෙසේ දනියි. 'මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගල තෙම යම්බඳු බලයකින් යුක්ත වූයේද, මමද, එබඳු බලයකින් යුක්තවූයේ වෙමි' ඔහු විසින් ආර්‍ය්‍යවූ, ලොකොත්තරවූ, පෘථග්ජනයන් හා සාධාරණ නොවූ, මේ සත්වන ඥානය ලබන ලද්දේ වෙයි.

13. "මහණෙනි, මෙසේ අංග සතකින් යුක්තවූ, ආර්‍ය්‍ය ශ්‍රාවකයා විසින් සෝවාන් ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස ස්වභාවය මනාව සොයන ලද්දේවෙයි. මහණෙනි, මෙසේ අංග සතකින් යුක්තවූ, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම, සෝවාන්ඵලයෙන් යුක්ත වූයේ වේ."

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**අටවෙනිවූ කොසම්බිය සූත්‍රය නිමි. (5-8)**

## 49. බ්‍රහ්ම නිමන්තණික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේ පිඩු මහ සිටාණන් විසින් කරවන ලද ජේතවන නම් ආරාමයෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ. ඒ භික්ෂූහු 'ස්වාමීනි'යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

"මහණෙනි, මම එක කාලයක උක්කට්ඨා නම් නුවර සුභග නම් වනයෙහිවූ විශාල සල්ගස මුල වාසය කෙළෙමි. මහණෙනි, ඒ කාලයෙහිදී බකබ්‍රහ්මයාට මෙබඳුවූ ලාමකවූ මිථ්‍යාදෘෂ්ටි

අදහසක් උපන්නේය. (කෙසේදයත්) 'මේ බ්‍රහ්මාත්ම භාවය නිත්‍යය, මෙය ස්ථිරය, මෙය සදාකාලිකය, මෙය සියල්ල සම්පූර්ණය, මෙය නැති නොවන ස්වභාව ඇත්තක්ය. මෙහි උපන්නෙක් වනාහි නැවත නූපදියි, නොදිරයි, නොමැරෙයි, චුත නොවෙයි, නූපදියි, මෙයින් අන්‍යවූ මත්තෙහි නිර්වාණයක් නැතැ'යි කියායි. මහණෙනි, ඉක්බිතිව මම මාගේ සිතින් බක බ්‍රහ්මයාගේ සිතෙහි අදහස දැන යම්සේ බලවත් පුරුෂයෙක් හකුලන ලද අතක් දිගු කරන්නේද දිගුකළ අතක් හකුලන්නේද, එපරිද්දෙන්ම උක්කට්ඨා නම් නුවර සුභග වනයෙහි සල්ගස මුලදී අතුරුදහන්ව බ්‍රහ්ම ලෝකයෙහි පහළවීමි.

2. "මහණෙනි, එන්නාවූ මා බක බ්‍රහ්මතෙම දුරදීම දැක්කේය. දැක, මට මෙසේ කීයේය. 'නිදුකාණෙනි, එනු මැනවි. නිදුකාණෙනි, යහපත් ගමනක් වේවා, නිදුකාණනි, බොහෝ කලකින් පැමිණියෙහිය. නිදුකාණෙනි, මේ බ්‍රහ්ම ආත්මය නිත්‍යය, මෙය ස්ථිරය, මෙය සියල්ලෙන් සම්පූර්ණය. මෙය චුත නොවන ස්වභාව ඇත්තක්ය. මේ වනාහි නොම උපදියි, නොදිරයි, නොමැරෙයි, චුත නොවෙයි, නොඋපදියි. මෙයින් මත්තෙහි අන්‍යවූ නිවණක් නැත්තේය'යි (කියායි.)

"මහණෙනි, මෙසේ කී කල්හි, මම බ්‍රහ්මයාට මෙසේ කීයෙමි. පින්වත, ඒකාන්තයෙන් බක බ්‍රහ්මතෙම අවිද්‍යාවෙන් යුක්ත වූයේය. (හෙවත් මුලාවූයේය). පින්වත, ඒකාන්තයෙන් බක බ්‍රහ්මතෙම අවිද්‍යාවෙන් යුක්ත වූයේය. යමෙක් වනාහි අනිත්‍ය වූවක්ම නිත්‍යයයි කියන්නේද, ස්ථිරනොවූවක්ම ස්ථිරයයි කියන්නේද, සදාකාලික නුවූවක්ම සදාකාලිකයයි කියන්නේද, සියල්ලෙන් සම්පූර්ණ නුවූවක්ම සියල්ලෙන් සම්පූර්ණයයි කියන්නේද, චුතවන ස්වභාව ඇත්තක්ම චුත නොවන ස්වභාව ඇත්තේයයි කියන්නේද, යම් බ්‍රහ්ම ලෝකයෙක්හි උපදීද, ජරාවට පත්වේද, මැරේද, චුතවේද, උපදීද, එය මෙහි නොම උපදියි. නොදිරයි. නොමැරෙයි, චුත නොවෙයි, නොඋපදියි. මෙයින් මත්තෙහි ඇත්තාවූ නිවණක් නැත්තේයයි කියන්නේද, (එසේ කියන) බක බ්‍රහ්ම තෙම මුලා වූයේය (කියායි.)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "මහණෙනි, ඉක්බිතිව පාපී මාරතෙම එක්තරා පාරිසජ්ජ බ්‍රහ්මයෙකුට ආවෙශවී මට මෙසේ කීයේය. 'මහණ, මහණ, මේ බ්‍රහ්ම පදවියට නින්දා නොකරව, මෙයට නින්දා නොකරව, මහණ මේ බ්‍රහ්මයා වනාහි මහා බ්‍රහ්මයාය. අන්‍යයන් මැඩ පවත් වන්නාය. අනුන් විසින් නොමැඩ පවත්වන ලද්දේය, එකාන්තයෙන් සියල්ල දක්නේය. සියල්ලන් තමන් වසඟයෙහි පවත්වන්නාය. ලෝකයට අධිපතිය ලෝක කර්තෘය, සියල්ල මවන්නාය, ලෝක ශ්‍රෙෂ්ඨයාය, ලොක වාසීන් බෙදන්නාය, වසඟයෙහි පවත්වන්නාය, උපන්නාවූද, උපදිමින් සිටින්නාවූද සත්වයින්ගේ පියාය. මහණ, ඔබට පෙර ලෝකයෙහි (අනිත්‍යය දුකය යනාදීන්) පෘථිවි ධාතුවට ගරහන්නාවූ පෘථිවි ධාතුවට පිළිකුල් කරන්නාවූ, ආපො ධාතුවට ගරහන්නාවූ, අපො ධාතුව පිළිකුල් කරන්නාවූ, තෙජො ධාතුවට ගරහන්නාවූ, තෙජො ධාතුව පිළිකුල් කරන්නාවූ, වයො ධාතුවට ගරහන්නාවූ, වායො ධාතුව පිළිකුල් කරන්නාවූ, භූතයන්ට ගරහන්නාවූ භූතයන් පිළිකුල් කරන්නාවූ, දෙවියන්ට ගරහන්නාවූ, දෙවියන් පිළිකුල් කරන්නාවූ, මාරයාට ගරහන්නාවූ, මාරයා පිළිකුල් කරන්නාවූ, බ්‍රහ්මයාට ගරහන්නාවූ, බ්‍රහ්මයා පිළිකුල් කරන්නාවූ; ඔබ වැනි මහණ බමුණෝ වූහ. ඔවුහු කය බිඳීමෙන් දිවි සිඳීමෙන් සතර අපායෙහි උපන්නාහුය. මහණ, නුඹට පෙර ලෝකයෙහි පෘථිවි ධාතුව ප්‍රශංසා කරන්නාවූ පෘථිවි ධාතුවට සතුටු වන්නාවූ, ආපො ධාතුවට ප්‍රශංසා කරන්නාවූ, ආපො ධාතුවට සතුටු වන්නාවූ, තෙජො ධාතුවට ප්‍රශංසා කරන්නාවූ තෙජො ධාතුවට සතුටු වන්නාවූ, වායො ධාතුවට ප්‍රශංසා කරන්නාවූ වායො ධාතුවට සතුටු වන්නාවූ, භූතයන්ට ප්‍රශංසා කරන්නාවූ භූතයන්ට සතුටු වන්නාවූ, දෙවියන්ට ප්‍රශංසා කරන්නාවූ දෙවියන්ට සතුටු වන්නාවූ, බ්‍රහ්මයාට ප්‍රශංසා කරන්නාවූ බ්‍රහ්මයාට සතුටු වන්නාවූ, මහණ බමුණෝ සිටියහ. ඔව්හු කය බිඳීමෙන් දිවි සිඳී මෙන් බ්‍රහ්ම ලෝකයෙහි උපන්නාහුය. මහණ, එහෙයින් මම ඔබට මෙසේ කියමි. නිදුකාණෙනි, බ්‍රහ්මතෙමේ යමක් ඔබට කීයේද, ඔබ එයම කරව, ඔබ බ්‍රහ්මයාගේ වචනය, නොඉක්මවව, මහණ, ඉදින් ඔබ බ්‍රහ්මයාගේ වචනය, ඉක්මවන්නෙහි නම්, යම්සේ

පුරුෂයෙක් තමා වෙතට එන්නාවූ ශ්‍රී කාන්තාව (සිවුරියන්) මුගුරකින් තැළීමෙන් ආපසු එළවාද, මහණ, යම්සේ හෝ පුරුෂයෙක් ගැඹුරු මහ වලක වැටෙන්නේ අතින්ද, පයින්ද, පොළව අල්වා නොගන්නේද, (හෙවත් පොළොවෙහි අල්වා ගතයුතු පා තැබිය යුතු තැන් අතහැර වළට වැටෙන්නේද) මහණ, ඔබටද මෙසේම වන්නේය. නිදුකාණෙනි, එබැවින් ඔබ යමක් බ්‍රහ්ම තෙම කීයේද, එයම කරව. ඔබ බ්‍රහ්මයාගේ වචනය නොයික්මවව, මහණ, ඔබ එක් රැස්ව උන් බ්‍රහ්ම පිරිස දක්නේ නොවේද?' මහණෙනි, මෙසේ වනාහි පාපීවූ මාර තෙම මට බ්‍රහ්ම පිරිස දැක්වීය.

"මහණෙනි, මෙසේ කී කල්හි මම පාපීවූ මාරයාට මෙය කීමි. 'පාපිය, මම තා දනිමි. මා තා නොදනියයි නොසිතව පාපිය ඔබ මාරයා වෙහිය, මාරය, යම් බ්‍රහ්මයෙකුත් වේද, යම් බ්‍රහ්ම පිරිසකුත් වේද, යම් පිරිවර බ්‍රහ්මයෝත් වෙත්ද, ඒ සියල්ල තාගේ අතට අසුවූහ. ඒ සියලු දෙනාම තාගේ වසඟයට ගියාහුය. පාපීය, ඔබට වනාහි මෙබඳු අදහසක් වෙයි. මේ තෙමේත් මට අසුවූ වෙක් වන්නේය. මට වසඟවූවෙක් වන්නේය. (කියාය) පාපීය. මම වනාහි තාගේ අතට අසුවූයේ නොවෙමි. ඔබට වසඟ වූයේ නොවෙමි.

4. "මහණෙනි, මෙසේ කී කල්හි බක බ්‍රහ්මතෙම මට මෙසේ කීයේය. 'නිදුකාණෙනි, මම වනාහි නිත්‍ය වූවක්ම නිත්‍ය යයි කියමි. ස්ථිර වූවක්ම ස්ථිරයයි කියමි. සදාකාලික වූවක්ම සදාකාලිකයයි කියමි. සියල්ලෙන් සම්පූර්ණ වූවක්ම සියල්ලෙන් සම්පූර්ණයයි කියමි. චුත නොවන ස්වභාව ඇත්තක්ම චුත නොවන ස්වභාව ඇත්තක්යයි කියමි. යම්තැනක වනාහි නූපදීද, නොදිරාද, චුත නොවේද, නූපදීද, එයම මම මෙහි නූපදීයයිද, නොදිරායයිද, චුත නොවේයයිද, නොමැරේයයිද, නොඋපදීයයිද කියමි. මෙයින් අන්‍යවූ මත්තෙහි නිර්වාණයක් නැති හෙයින්ම අන්‍යවූ නිර්වාණයක් නැතැයි කියමි. මහණ, ඔබට පෙර ලොකයෙහි මහණ බමුණෝ පහළවූහ. ඔබගේ මුලු ආයුෂය යම් පමණක් වේද, ඔවුන්ගේ තපස් කිරීමේ කාලය එපමණ

විය. ඔවුහු වනාහි මෙසේ දන්නාහ: (කෙසේද?) මත්තෙහි අන්‍යවූ නිර්වාණයක් ඇත්නම් ඇත කියාද, මත්තෙහි අන්‍යවූ නිර්වානයක් නැත්නම් නැතැයි කියාද දන්නාහුය. මහණ, මම ඔබට මෙසේ කියමි. මෙයින් අන්‍යවූ මත්තෙහි නිර්වාණයක් නොදක්නෙහිය. යම්තාක් වනාහි ක්ලාන්තයට, වෙහෙසට කොටස් කාරයෙක් පමණක් වන්නෙහිය. මහණ, ඉදින් වනාහි ඔබ පෘථිවි ධාතුව තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ගැලී ගන්නෙහි නම් මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. (මා අනුව යාම ඊම ආදිය කරන්නෙක් වන්නෙහිය.) මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දකින් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය.

"ඉදින් වනාහි ඔබ ආපො ධාතුවද තෘෂ්ණා දෘෂ්ටීන්ගේ වශයෙන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය. ඉදින් ඔබ තෙජො ධාතුවද තෘෂ්ණාදෘෂ්ටීන්ගේ වශයෙන් ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය. ඉදින් ඔබ වායො ධාතුවද, තෘෂ්ණා දෘෂ්ටීන් ගේ වශයෙන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කට යුත්තෙක් වන්නෙහිය. ඉදින් ඔබ භූතයන්ද, තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දකින් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කට යුත්තෙක් වන්නෙහිය. ඉදින් ඔබ දෙවියන්ද, තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය. ඉදින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඔබ මාරයාද, තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය. මා කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය. ඉදින් ඔබ බ්‍රහ්මයාද, තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙහි නම්, මාගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නේහිය, මාගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙහිය, මා කැමැති පරිද්දක් කළ හැකියෙක් වන්නෙහිය. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙහිය'යි (කීයේය.)

5. "බ්‍රහ්මය, මමද මෙය දනිමි. ඉදින් පෘථිවි ධාතුව තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙම් නම් තොපගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමැති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙමි.

"ඉදින් ආපො ධාතුව තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙම් නම් තොපගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමැති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙමි. ඉදින් තෙජො ධාතුව තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙම් නම් තොප සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙමි. ඉදින් වායො ධාතුව තෘෂ්ණා දෘෂ්ටීන් ගැලීගන්නේනම් තොප සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. ඉදින් භූතයන් තෘෂ්ණා දෘෂ්ටීන් ගැලී ගන්නෙම් නම් තොප සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමැති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක්ද වන්නෙමි.

"ඉදින් දෙවියන් කෙරෙහිද තෘෂ්ණා දෘෂ්ටීන් ගැලීගන්නෙම් නම් තොපගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි.

තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමැති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි, අතිශයින් පහත් කට යුත්තෙක් වන්නෙමි, ඉදින් මාරයා කෙරෙහිද තෘෂ්ණා දෘෂ්ටීන් ඇලීගන්නෙම් නම් තොපගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි, තොප කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙමි, ඉදින් බ්‍රහ්මයා කෙරෙහිද තෘෂ්ණාදෘෂ්ටීන් ගැලී ගන්නෙම් නම් තොපගේ සමීපයෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොපගේ වස්තුවෙහි සයනය කරන්නෙක් වන්නෙමි. තොප කැමති පරිද්දක් කළ හැකියෙක් වන්නෙමි. අතිශයින් පහත් කටයුත්තෙක් වන්නෙමි. බ්‍රහ්මය, එසේද වුවත් මම 'බකබ්‍රහ්ම තෙම මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක, බකබ්‍රහ්ම තෙම මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක්ය, බක බ්‍රහ්මතෙම මෙසේ මහේශාක්‍යය'යි නුඹගේ ගතියද දනිමි. ආනුභාවයද දනිමි.

**6** "නිදුකාණෙනි, බකබ්‍රහ්ම තෙම මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක, බකබ්‍රහ්ම තෙම මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක, බකබ්‍රහ්ම තෙම මෙබඳු මහේසාක්‍ය වූවෙකැයි කෙසේ නම් ඔබ මාගේ ගතිය දන්නෙහිද? ආනුභාවය දන්නෙහිද?"

> "රස්මියෙන් බබලන්නාවූ චන්ද්‍රසූය්‍යී දෙදෙනා යම්තාක් ස්ථානයන්හි හැසිරෙද්ද, දිසාවන් දීප්තිමත් කෙරෙද්ද, ඒ තාක් ප්‍රමාණය සහශ්‍රී ලෝක ධාතුවයි. මේ සහශ්‍රී ලෝක ධාතුව නුඹගේ වසඟයෙහි පවතියි.
>
> "පහත් උසස් සත්වයන්ද, නැවත සරාග විරාග සත්වයන්ද, මේ සක්වලද අන් සක්වලවල් එකුන් දහසද (නවසිය අනූ නවයද) සත්වයින්ගේ ප්‍රතිසන්ධි වශයෙන් ඊමද, චුති වශයෙන් යාමද දන්නෙහිය.

"මෙසේ වනාහි බ්‍රහ්මය, බකබ්‍රහ්ම තෙම මෙබඳු මහත් ඍද්ධි ඇත්තෙක, බක බ්‍රහ්ම තෙම මෙබඳු මහත් ආනුභාව ඇත්තෙක, බක බ්‍රහ්ම තෙම මෙබඳු මහේශාක්‍යයයි මම නුඹගේ ගතියද දනිමි, ආනුභාවයද දනිමි.

7. "බ්‍රහ්මය, මෙයින් අන්‍යවූ තවත් බ්‍රහ්මලොක තුනක් ඇත්තේමය. නුඹ එය නොදන්නෙහිය, නොදක්නෙහිය. මම එය දනිමි, දකිමි, බ්‍රහ්මය යම් තැනකින් චුතව නුඹ මෙහි උපන්නේද, ඒ ආභස්සර නම් බ්‍රහ්මලොකයක් ඇත්තේය. ඒ නුඹට ඉතා දීර්ඝ කාලයක් මෙහි විසීමෙන් එහි සිට මෙහි ආබව අමතක විය, එහෙයින් නුඹ නොදන්නෙහිය, නොදක්නෙහිය, මම එය දනිමි, දකිමි, බ්‍රහ්මය මේ දැනීමෙන් මම නුඹට සම සමද නොවන්නෙමි; පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, සුභකිණ්ණක නම් බ්‍රහ්මලොකයක් ඇත්තේමය, නුඹ එය නොදන්නෙහිය, නොදක්නෙහිය, මම එය දනිමි, දකිමි, බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹට සම සමවත් නොවන්නෙමි. පහත් බවක් නම් කොයින්ද, එහෙයින් මමම නුඹට වඩා වැඩි තරම් වෙමි. බ්‍රහ්මය, වේහප්ඵල නම් බ්‍රහ්ම ලොකයක් ඇත්තේමය, නුඹ එය නොදන්නෙහිය, නොදක්නෙහිය, මම එය දනිමි, දකිමි, බ්‍රහ්මය මෙසේ දැනීමෙන්, දැකීමෙන් මම නුඹට සම සමවත් නොවන්නෙමි, පහත් බවක් නම් කොයින්ද, එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම පෘථිවි ධාතුව, පෘථිවි ධාතුව වසයෙන් දැන පෘථිවි ධාතුව විසින් පෘථිවි භාවයෙන් නොපැමිණි යමක් වේ නම් එය දැන පෘථිවි ධාතුව තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නොගනිමි, පෘථිවි ධාතුවෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් ගන්නෙක් නොවෙමි. පෘථිවි ධාතුවෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. පෘථිවි ධාතුව මගේයයි තෘෂ්ණාදෘෂ්ටීන් ගන්නෙක් නොවෙමි, පෘථිවි ධාතුව තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොකියමි. බ්‍රහ්මය මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවන්නෙමි. පහත් බවක් නම් කොයින්ද, එහෙයින් මමම නුඹට වඩා වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, මම ආපො ධාතුව ආපො ධතු වශයෙන් දැන ආපො ධාතුව විසින් ආපො භාවයෙන් නොපැමිණි යමක් වේනම් එය දැන ආපො ධාතුව තෘෂ්ණාදෘෂ්ටි වශයෙන්

නොගනිමි. ආපො ධාතුවෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. ආපො ධාතුවෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. ආපොධාතුව තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, මම වායොධාතුව වායොධාතු වශයෙන් දැන වායෝධාතු විසින් වායොධාතු භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන වායොධාතුව තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. වායොධාතුවෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. වායොධාතුවෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. වායොධාතුව තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම තෙජොධාතුව තෙජොධාතු වශයෙන් දැන තෙජොධාතුව විසින් තෙජො ධාතු භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන තෙජොධාතුව තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. තෙජොධාතුවෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. තොජොධාතුවෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. තෙජොධාතුව තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි, පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

8. "බ්‍රහ්මය, මම භූතයන්ද භූත වශයෙන් දැන භූතයන් විසින් භූත භාවයෙන් නොපැමිණි යමක් වේද එය දැන භූතයන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. භූතයන් කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. භූතයන් ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. භූතයන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මම නුඹට වඩා වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, මම දෙවියන්ද දෙව වශයෙන් දැන දෙවියන් විසින් දෙව භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මානවශයෙන් නොගනිමි. දෙවියන් කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මානවශයෙන් ගන්නෙක් නොවෙමි. දෙවියන්ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි, පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, මම මාරයාද මාර වශයෙන් දැන මාරයා විසින් මාර භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන මාරයා තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. මාරයා කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. මාරයාගෙන් පිටත ආත්මයක් ඇතැයි නොගනිමි. මාරයා තෘෂ්ණාදෘෂ්ටි මානවශයෙන් නොකියමි, බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි, පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වැඩිතරම් වෙමි.

**9.** "බ්‍රහ්මය, මම බ්‍රහ්මයාද බ්‍රහ්ම වශයෙන් දැන බ්‍රහ්මයා විසින් බ්‍රහ්මභාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන බ්‍රහ්මයා තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. බ්‍රහ්මයා කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි, බ්‍රහ්මයාගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. බ්‍රහ්මයා තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි, පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම ආභස්සර දෙවියන්ද ආභස්සර දෙවි වශයෙන් දැන ආභස්සර දෙවියන් විසින් දෙවි භාවයෙන් නොපැමිණි යමක් වේද එය දැන ආභස්සර දෙවියන් තෘෂ්ණා දෘෂ්ටි

මානවශයෙන් නොගනිමි ආභස්සර දෙවියන් කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. ආභස්සර දෙවියන්ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. ආභස්සර දෙවියන් තෘෂ්ණා දෘෂ්ටිමාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම සුභකිණ්ණක දෙවියන්ද සුභකිණ්ණක දෙවි වශයෙන් දැන සුභකිණ්ණක දෙවියන් විසින් දෙවි භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන සුභකිණ්ණක දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මානවශයෙන් නොගනිමි, සුභකිණ්ණක දෙවියන්ට ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. සුභකිණ්ණක දෙවියන්ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි. සුභකිණ්ණක දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සමවත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩි තරම් වෙමි.

"බ්‍රහ්මය, මම වේහප්ඵල දෙවියන්ද වෙහප්ඵල දෙවි වශයෙන් දැන වෙහප්ඵල දෙවියන් විසින් දෙවි භාවයෙන් නොපැමිණි යමක්වේද, එය දැන වෙහප්ඵල දෙවියන් තෘෂ්ණා දෘෂ්ටි මානවශයෙන් නොගනිමි. වේහප්ඵල දෙවියන් කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි, වෙහප්ඵල දෙවියන්ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි, වේහප්ඵල දෙවියන් තෘෂ්ණා දෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සම වත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම අභිභූ දෙවියන්ද, අභිභූ දෙවි වශයෙන් දැන අභිභූ දෙවියන් විසින් දෙවි භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන අභිභූ දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගනිමි. අභිභූ දෙවියන් කෙරෙහි ආත්මයක් ඇතැයි

තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. අභිභූ දෙවියන්ගෙන් පිටත ආත්මයක් පිහිටියේයයි ගන්නෙක් නොවෙමි, අභිභූ දෙවියන් තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සම වත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

"බ්‍රහ්මය, මම සියල්ල සියල්ල වශයෙන් දැන සියල්ල විසින් සියල්ල භාවයෙන් නොපැමිණි යමක් වේද, එය දැන සියල්ල තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොගන්නෙමි. සියල්ල කෙරෙහි ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. සියල්ලෙන් පිටත ආත්මයක් ඇතැයි තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් ගන්නෙක් නොවෙමි. සියල්ල තෘෂ්ණාදෘෂ්ටි මාන වශයෙන් නොකියමි. බ්‍රහ්මය, මෙසේ දැනීමෙන් මම නුඹ හා සම සම වත් නොවෙමි. පහත් බවක් නම් කොයින්ද? එහෙයින් මමම නුඹට වඩා වැඩිතරම් වෙමි.

10. "නිදුකාණෙනි, ඉදින් වනාහි සියල්ල සියලු භාවයෙන් නොපැමිණියේද, එසේ ඇතිකල්හි ඔබගේ වචනය හිස් නොවේවා, නිස්ඵල නොවේවා"යි. (බ්‍රහ්මතෙම කීය) 'විඤ්ඤානයෙන් නොදතහැකිවූ, අනන්තවූ හැම අයුරින්ම ප්‍රභාසම්පන්න වූ යම් නිර්වාණයක් වේද, ඒ නිර්වාණය පෘථිවි ධාතුහුගේ පෘථිවි භාවයෙන් නොපැමිණියේය. ආපො ධාතුහුගේ ආපො භාවයෙන් නොපැමිණියේය. තෙජො ධාතුහුගේ තෙජො භාවයෙන් නොපැමිණියේය. වායොධාතුහුගේ වායො භාවයෙන් නොපැමිණියේය. භූතයන්ගේ භූතභාවයෙන් නොපැමිණියේය. දෙවියන්ගේ දෙවභාවයෙන් නොපැමිණියේය. මාරයාගේ මාර භාවයෙන් නොපැමිණියේය. බ්‍රහ්මයාගේ බ්‍රහ්ම භාවයෙන් නොපැමිණියේය. ආභස්සර දෙවියන්ගේ ආභස්සර දෙවභාවයෙන් නොපැමිණියේය. සුභකිණ්ණක දෙවියන්ගේ සුභකිණ්ණක දෙවභාවයෙන් නොපැමිණියේය. වෙහප්ඵල දෙවියන්ගේ වෙහප්ඵල දෙවභාවයෙන් නොපැමිණියේය. අභිභූදෙවියන්ගේ අභිභූදෙව භාවයෙන් නොපැමිණියේය. සියල්ල සියලු භාවයෙන් නොපැමිණියේය" වදාළහ.

11. "නිදුකාණෙනි, එසේ නම්, මම ඔබට නොපෙනී සිටිමි"යි (බ්‍රහ්මයා කීය) "බ්‍රහ්මය ඉදින් හැකිනම් නුඹ මට නොපෙනී සිටුව"යි (කීමි) "මහණෙනි, ඉක්බිති බකබ්‍රහ්මතෙම 'ශ්‍රමණගෞතමයන්ට නොපෙණෙන්නෙමි'යි ශ්‍රමණ ගෞතමයන්ට නොපෙණෙන්නෙමි'යි. උත්සාහ කොට මට නොපෙනී සිටින්නට නොහැකිවිය. මහණෙනි, මෙසේ කී කල්හි මම බක බ්‍රහ්මයාට මෙසේ කීමි. 'බ්‍රහ්මය, එසේ නම් මම නුඹට නොපෙනී සිටින්නෙ'මි. 'නිදුකාණෙනි, ඉදින් හැකිනම් මට නොපෙනී සිටුව', 'මහණෙනි, ඉක්බිති මම යම් පමණකින් බ්‍රහ්ම තෙමේද බඹ පිරිසද බඹ පිරිසෙහි වූවෝද මාගේ ශබ්දය අසන්නාහුද, මා නොදක්නාහුද, එබඳුවූ ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යයක් කොට ඔවුන්ට නොපෙනී සිට මේ ගාථාව කීවෙමි.

> 12. "මම සංසාරයෙහි භය දැකම කාම භවාදී ත්‍රිවිධ භවයද විභව නම්වූ නිර්වාණය සොයන්නවුන්ගේ භවයෙහිම විසීමද දැක, කිසියම් භවයක තෘෂ්ණාදෘෂ්ටීන් නොගත්තෙමි. භව තෘෂ්ණාවද නොගත්තෙමි.

"මහණෙනි, ඉක්බිති බ්‍රහ්මයාද ප්‍රධාන බ්‍රහ්ම සමූහයාද, පිරිවර බ්‍රහ්ම සමූහයාද පුදුමයට පැමිණි සිත් ඇත්තෝවූහ. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ මහත් ඍද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයි අද්භූතයි. ශාක්‍යපුත්‍රවූ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිවූ මේ ශ්‍රමණ ගෞතම තෙම යම්සේද, මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහානුභාව ඇති අන්‍යවූ ශ්‍රමණයෙක් හෝ බමුණෙක් හෝ මීට පෙර අප විසින් නොදක්නා ලද්දේය. නොඅසන ලද්දේය. පින්වත්නි, භවයෙහි කැමැත්ත ඇති, භවයෙහි ඇලුනු. භවයෙහි සතුටුවන්නාවූ දෙව් මිනිසුන්ගේ අවිද්‍යාමුල් සහිතවූ භවය උපුටා හරින ලදී'යි (කීහ.

13. "මහණෙනි, ඉක්බිති පාපීවූ මාරතෙම බඹ පිරිසෙහිවූ එක්තරා බ්‍රහ්මයෙකුට ආවෙශවී මට මෙසේ කීයේය. 'නිදුකාණෙනි, ඉදින් ඔබ මෙසේ චතුරාර්‍ය්‍යසත්‍යය අවබොධ කෙලෙහි නම්, මෙසේ දන්නෙහි නම් ගිහි ශ්‍රාවකයන්හට හෝ

පැවිදි ශ්‍රාවකයන්හට හෝ ඒ ධර්ම නොපමුණුවව, ගිහි ශ්‍රාවකයින්ට ධර්මය දෙශනානොකරව පැවිද්දන්ට ධර්මදෙශනා නොකරව. ගිහි ශ්‍රාවකයන් කෙරෙහි ඇල්මක් නොකරව. පැවිද්දන් කෙරෙහි ඇල්මක් නොකරව. මහණ, ඔබට පෙර ලෝකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයයි කියා ගන්නාවූ මහණ බමුණෝ වූහ. ඒව්හු ගිහි ශ්‍රාවකයන් හික්මවූහ. පැවිදි ශ්‍රාවකයන් හික්මවූහ. ශ්‍රාවකයින්ට, පැවිද්දන්ට ධර්ම දෙශනා කළහ. ශ්‍රාවකයන් කෙරෙහි පැවිද්දන් කෙරෙහි ගිජුවූහ. ඔවුහු ශ්‍රාවකයන්ද, පැවිද්දන්ද හික්මවා, ශ්‍රාවකයින්ටද පැවිද්දන්ටද, ධර්මය දෙශනා කොට, ශ්‍රාවකයන් කෙරෙහිද, පැවිද්දන් කෙරෙහිද සිතින් ගිජුවූවාහු කය බිඳීමෙන් ජීවිතය සිඳීමෙන් අපායෙහි උපන්නාහුය. මහණ නුඹට පෙර ලෝකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයයි කියාගන්නාවූ මහණ බමුණෝ වූහ. ඔවුහු ශ්‍රාවකයන් නොහික්ම වූහ. පැවිද්දන් නොහික්ම වූහ. ශ්‍රාවකයින්ට, පැවිද්දන්ට දහම් නොදෙසූහ. ශ්‍රාවකයින් කෙරෙහි පැවිද්දන් කෙරෙහි ගිජු නොවූහ. ඔවුහු ශ්‍රාවකයන්ද පැවිද්දන්ද නොහික්මවා ශ්‍රාවකයින්ටද පැවිද්දන්ටද ධර්මය දෙශනා නොකොට ශ්‍රාවකයන් කෙරෙහිද පැවිද්දන් කෙරෙහිද සිතින් ගිජු නුවූවාහුය. කය බිඳීමෙන් ජීවිතය සිඳීමෙන් බ්‍රහ්මලොකයෙහි උපන්නාහුය. මහණ ඒ නිසාම ඔබට මේ කාරණය මෙසේ කියමි. නිදුකාණෙනි, එබැවින් ඔබ නිරුත්සාහ වූයේ මේ ආත්මයෙහි සැප විහරණයෙහි යෙදෙමින් වාසය කරව. නිදුකාණෙනි, ධර්මය ප්‍රකාශ නොකිරීම යහපති, අන්‍යයන්හට අවවාද නොකරව”යි. (කීයේය)

14. “මහණෙනි, මෙසේ කී කල්හි මම පාපීවූ මාරයාට මෙසේකීමි. “මාරය, මම තා දනිමි, මා තා නොදනේයයි, නො සිතව, පාපිය, නුඹ මාරයා වෙහිය. නුඹ මට හිතානුකම්පා ඇතිව මෙසේ නොකියන්නෙහිය. මාරය නුඹ හිතානුකම්පා රහිතවූයේ මෙසේ කියන්නෙහිය. මාරය නුඹට මෙබඳු අදහසක් වෙයි. ‘ශ්‍රමණ ගෞතම තෙම යම් කෙනෙකුට ධර්මය දෙශනා කරන්නේද, ඔවුහු මාගේ විෂය ඉක්මවන්නාහුය’යි (කියායි) මාරය ඒ නුඹ කී මහණ බමුණෝ අසවර්ඥ වූවාහු සර්වඥ වෙමියි

කියාගත්තාහුය. මාරය මම වනාහි සර්වඥවූයේම සර්වඥ වෙමියි, කියා ගනිමි. මාරය, තථාගතතෙම ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා කළත් එසේමය මාරය, තථාගත තෙම ශ්‍රාවකයන්ට ධර්මය දෙශනා නොකළත් එසේමය. මාරය තථාගත තෙම ශ්‍රාවකයන් හික්මවූවත් එසේමය. තථාගත තෙම ශ්‍රාවකයන් නොහික්මවූවත් එසේමය. ඊටහේතු කවරේද, මාරය සිත කෙලෙසන්නාවූ නැවත ඉපදීම ඇති කරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති, ජරා, මරණ පිණිස පවත්නාවූ යම් ක්ලේශයෝ වෙද්ද, ඒ කෙලෙස් තථාගතයන් වහන්සේට නැත. සිඳින ලද මුල් ඇත්තාහ. කපාදමන ලද තල්ගසක් මෙන් කරන ලද්දාහ. නැති කරන ලද්දාහ. මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහ. මාරය, තල්රුකක් මුදුන සිඳින ලද්දේ නැවත නොවැඩෙන්නේ යම්සේද, එපරිද්දෙන්ම මාරය, සිත කෙලෙසන්නාවූ, නැවත ඉපදීම ඇතිකරන්නාවූ, දැවිලි සහිතවූ, දුක් විපාක ඇත්තාවූ, මත්තෙහි ජාති, ජරා, මරණ පිණිස පවත්නා වූ යම් කෙලෙස් කෙනෙක් වෙද්ද, ඒ කෙලෙස් තථාගතයන් වහන්සේට නැත. සිඳින ලද මුල් ඇත්තාහ. කපන ලද තල් ගසක් මෙන් කරන ලද්දාහ. නැතිකරන ලද්දාහ. මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහ"යි. (වදාළේය)

මෙසේ මාරයා (මාරභාව වශයෙන් පෙණී සිට) කථා නොකිරීම නිසාද, බ්‍රහ්මයාගේ මන්ත්‍රනය ඇති බැවින්ද, මේ ධර්මයට, 'බ්‍රහ්ම නිමන්තණික' සූත්‍රයයි නම් ඇතිවිය.

**නවවෙනිවූ බ්‍රහ්ම නිමන්තණික සූත්‍රය නිමි. (5-9)**

## 50. මාර තජ්ජනීය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ භග්ගනම් දනව්වෙහි, සුංසුමාරගිරි නම් නුවර, භෙසකලා නම් වනයෙහි වාසය කරති. එකල්හි මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ එළිමහනෙහි සක්මන් කරමින් සිටියහ. එකල්හි පාපීවූ මාරතෙම

මහාමෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේගේ කුසට ඇතුල්වූයේ, ආමාශය ඇතුළට වැදුනේ වෙයි. ඉක්බිති මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට මෙසේ සිතුනේය. කුමක් හෙයින් මාගේ කුස උඬුබත් කෑ කලෙක මෙන් බරට දැනේද, (කියාය) ඉක්බිති ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ සක්මනින් බැස විහාරයට වැඩ පැණවූ අස්නෙහි, වැඩ හුන්නේය, වැඩහිඳ ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ තමා ගැන කල්පනා කළහ.

මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ කුසට වැදී ආමාශයට ඇතුල්වූ, පාපීවූ මාරයා දුටහ. දැක, පාපීවූ, මාරයාට මෙසේ කීහ. "පාපීය, නික්මෙව, පාපිය, නික්මෙව, තථාගතයන්ට වෙහෙස නොකරව, තථාගත ශ්‍රාවකයින්ට වෙහෙස නොකරව, නුඹට බොහෝ කලක් මුලුල්ලෙහි අහිත පිණිස දුක් පිණිස, නොවේවා යි කීහ. ඉක්බිති පාපීවූ මාරයාට මේ සිතවිය. "මේ ශ්‍රමණතෙම, මා නොදැනම නොදැකම පාපිය නික්මෙව, පාපිය නික්මෙව, තථාගතයන්ට වෙහෙස නොකරව, තථාගත ශ්‍රාවකයන්ට වෙහෙස නොකරව, නුඹට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස නොවේවා'යි මෙසේ කීයේය. ඔහුගේ යම් ශාස්තෘ කෙනෙක් වේද, හෙතෙමේද මා වහාම දැන නොගන්නේය. මේ ශ්‍රාවකතෙම කෙසේ දන්නේද", කියායි.

ඉක්බිති ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ පාපීවූ මාරයාට මෙසේ කීහ. "පාපීමාරය, මේ කාරණයෙහිලා මම තා දනිමි.

මා නොදනීයයි නුඹ නොසිතව. පාපිය, නුඹ මාරයාවෙහිය. පාපිය නුඹ මෙසේ සිතයි. 'මේ ශ්‍රමණ තෙම මා නොදැනම, නොදැකම, පාපිය නික්මෙව, පාපිය නික්මෙව, තථාගතයන්ට වෙහෙස නොකරව, තථාගත ශ්‍රාවකයන්ට වෙහෙස නොකරව, නුඹට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස නොවේවා'යි කියන්නේය. ඔහුගේ යම් ශාස්තෘ කෙනෙක් වේද, හෙතෙමේද, මා වහාම දැන නොගන්නේය. මේ ශ්‍රාවකතෙම කෙසේ නම් දන්නේද?" (කියායි.)

2. ඉක්බිති පාපීවූ, මාරයාට මෙසේ සිත්විය. “මේ ශ්‍රමණ තෙමේ මා දැනම, දැකම, පාපිය නික්මෙව, පාපිය නික්මෙව, තථාගතයන්ට වෙහෙස නොකරව, තථාගත ශ්‍රාවකයන්ට වෙහෙස නොකරව, ඔබට බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස නොවේවා’යි කියන්නේය” (යනු වෙනි)

ඉක්බිති පාපීවූ මාරතෙම ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේගේ මුවින් නික්ම කවුළුවෙන් පිටත සිටියේය. ආයුෂ්මත් මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේ කවුළුව අසල සිටියාවූ, පාපීවූ, මාරයා දුටහ. දැක පාපීවූ මාරයාට මෙසේ කීහ. “මාරය ඔතනදීද මම තා දකිමි. මා නොදකීයයි නුඹ නොසිතව පාපිය, මේ නුඹ කවුළුව අසල සිටියෙහිය.

3. “පාපිය, පෙරවූවක් කියමි. මම දූසීනම් මාරයෙක්වීමි. ඒ මට කාලීනම් නැගනියක් විය. නුඹ ඇගේ පුත්‍රයාය. ඒ නුඹ මාගේ බෑනා විය. මාරය, එකල්හි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ කකුසඳ නම් භාග්‍යවතුන් වහන්සේ ලොකයෙහි පහළ වූහ. මාරය, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ විධුරය සඤ්ජීවයයන නම් ඇති අග්‍රශ්‍රාවක දෙනමක් විය. මාරය, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ කකුසඳ භාග්‍යවතුන් වහන්සේගේ යම් පමණ ශ්‍රාවක සමූහයා අතුරෙන් ධර්ම දෙශනා කිරීමෙහි, විධුර ස්ථවිරයන් වහන්සේ හා සමානවූ කිසිවෙක් නොවූහ. මාරය මේ කාරණයෙන් ආයුෂ්මත් විධුර ස්ථවිරයන් වහන්සේට, ‘විධුරය, විධුරය, කියාම නාමය පහළ විය.

“මාරය ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේ ආරණ්‍යයට ගියේද, වෘක්ෂ මූලයකට ගියේද, ශූන්‍යාගාරයට ගියේද, ඉතා පහසුවෙන් නිරොධ සමාපත්තියට සමවදියි. මාරය, මම පෙර වූවක් කියමි. ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේ එක්තරා රුකක් මුල නිරොධ සමාපත්තියට සමවැදී සිටියහ. මාරය, ගොපල්ලෝද, වෙනත් සිව්පාවුන් රකින්නෝද, ගොවිකම් කරන්නෝද, මගියෝද, එක්තරා රුකක් මුල නිරොධ සමාපත්තියට සමවැද වැඩහුන් ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන්වහන්සේ දුටුවාහුය. දැක, ඔවුන්ට, මේ අදහස විය.

'ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයකි, පෙරනුවූ දෙයකි. මේ ශ්‍රමණ තෙම හිඳගෙනම කලුරිය කෙළේය. එබැවින් ඔහු දවමු'යි (කියාය) මාරය, ඉක්බිති ගොපල්ලෝද, වෙනත් සිවුපාවුන් රක්නෝද ගොවියෝද, මගියෝද, එක්ව තණ කොළද, දරද, වියලි ගොමද, ගෙනවුත් ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන්ගේ ශරීරය මතුයෙහි දමා ගිනිතබා ගියාහුය. මාරය ඉක්බිති, ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේ ඒ රාත්‍රිය ගෙවී ගිය පසු ඒ සමවතින් නැගිට සිවුරු ගසා දමා පෙරවරු කාලයෙහි පාසිවුරු ගෙන ගමට පිඬු පිණිස වැඩියහ. මාරය, ගවපාලකයෝද, සෙසු සිවුපාවුන් රකින්නෝද, මගියෝද, පිඬු පිණිස හැසිරෙන ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේ දුටුවාහුය. දැක ඔවුන්ට මේ සිතවිය. 'පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්‍ය්‍යයකි. ඒකාන්තයෙන් අද්භූතයකි. මේ ශ්‍රමණතෙම හිඳගෙනම, කලුරිය කෙළේය. හෙතෙම නැවත ජීවත්වෙයි, (කියාය) මාරය, මේ කාරණයෙන් ආයුෂ්මත් සඤ්ජීව ස්ථවිරයන් වහන්සේට, 'සඤ්ජීව, සඤ්ජීව, කියාම නාමය පහළ විය.

4. "ඉක්බිති මාරය, දූසීමාරයාට මෙසේ සිත්විය. මම සිල්වත්වූ යහපත් ස්වභාව ඇති මේ භික්ෂූන්ගේ ඊමක් හෝ යාමක් හෝ නොදනිමි. යම් හෙයකින් මම බමුණු ගෘහපතියන්ට ආවෙශවන්නේ නම් යෙහෙක. 'එව්. තොපි සිල්වත්වූ යහපත් ස්වභාව ඇති භික්ෂූන්ට (දසවිධ බැණුම් වලින්) බණිව් වචනයෙන් නින්දා කරව්, ගටව්, වෙහෙසව්. තොප විසින් බණිනු ලබන්නාවූ, නින්දාකරනු ලබන්නාවූ, ගටනු ලබන්නාවූ වෙහෙසනු ලබන්නාවූ, ඔවුන්ගේ සිතෙහි දූසි මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇති වන්නේ නම් මැනවි' (කියාය)

"මාරය, ඉක්බිති දූසී මාරතෙම ඒ බ්‍රාහ්මණ ගෘහපතියන්ට ආවෙශ විය. 'එව්, තොපි සිල්වත්වූ, යහපත් ගුණධර්ම ඇති භික්ෂූන්ට බණිව්, නින්දා කරව්, ගටව්, වෙහෙසව්, තොප විසින් බණිනු ලබන්නාවූ, නින්දා කරනු ලබන්නාවූ, ගටනු ලබන්නාවූ, වෙහෙසනු ලබන්නාවූ ඔවුන්ගේ සිතෙහි දූසී මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇති වන්නේනම් මැනවි, (කියාය)

"මාරය, ඉක්බිති දූසී මාරයා ආවෙශවූ ඒ බ්‍රාහ්මණ ගෘහපතියෝ සිල්වත්වූ, යහපත් ස්වභාව ඇති භික්ෂූන්ට බණිති, නින්දා කරති, ගටති, වෙහෙසති (කෙසේදයත්) 'මොහු වනාහි මුඩුවූවෝය. ශ්‍රමණ ප්‍රතිරූපකයෝය. දාසයෝය. පව් කාරයෝය. මහා බ්‍රහ්මයාගේ යටි පතුලෙන් උපන්නෝය. 'අපි ධ්‍යාන ඇත්තෙමු. අපි ධ්‍යාන ඇත්තෙමු' යයි කියමින් බිම බලා ගත්තාහු, යටිකුරු කළ මුහුණ ඇත්තාහු, කම්මැලි වූවාහු, සිත සිතා සිටිත්. කල්පනා කරමින් සිටිත්.

"යම්සේ වනාහි බකමූණා ගසක අත්තටවී ගොදුරු පිණිස මීයෙකු පරීක්ෂා කරමින්, සිටිද එපරිද්දෙන්ම, මුඩුවූ, ශ්‍රමණ ප්‍රතිරූපකයන්වූ, දාසයන් වැනිවූ, පව්කාරවූ, මහා බ්‍රහ්මයාගේ යටිපතුළෙන් උපන්නාවූ මොවුහු 'අපි ධ්‍යාන ඇත්තෙමු අපි ධ්‍යාන ඇත්තෙමු'යි කියමින් බිම බලා ගෙන යටිකුරු කළ මුහුණ ඇතිව කම්මැලි කමින් සිත සිතා සිටිත්.

"යම්සේ වනාහි හිවලා ගංතෙරටවී මසුන් සොයමින් සිතිවිල්ලේ යෙදී සිටීද, එපරිද්දෙන් මුඩුවූ, ශ්‍රමණ ප්‍රතිරූපකවූ දාසයන් වැනිවූ, පව්ටුවූ, බ්‍රහ්මපාදයෙන් උපන්නාවූ මොවුහු 'අපි ධ්‍යාන ඇත්තෙමු. අපි ධ්‍යාන ඇත්තෙමු'යි බෙල්ල නමා ගත්තාහු, යටට හෙලු මුහුණු ඇත්තාහු, අලස වූවාහු සිත සිතා සිටිත්. යම්සේ වනාහි බළලා ගෙයි මුලුවලද වැසිකිළි අසල හෝ රොඩු ගොඩක් අසලද සැඟවී මීයෙකු සොයමින් සිතිවිල්ලේ යෙදී සිටීද, එපරිද්දෙන් මුඩුවූ, ශ්‍රමණ ප්‍රතිරූපකවූ දාසයන් වැනිවූ, පව්ටුවූ, බ්‍රහ්ම පාදයෙන් උපන්නාවූ මොවුහු 'අපි ධ්‍යාන ඇත්තෙමු. අපි ධ්‍යාන ඇත්තෙමු'යි බෙල්ල නමා ගත්තාහු යටට හෙලු මුහුණු ඇත්තාහු, අලසවූවාහු, සිතිවිල්ලේ යෙදී සිටිත්.

"උසුලාගෙන ආ බරින් නිදහස්වූ කොටළුවෙක් තෙම, යම්සේ ගෙයි බිත්ති අයිනේද, වැසි කිළි අසල හෝ රොඩු ගොඩක් අසලද සිතිවිල්ලේ යෙදී සිටීද, එපරිද්දෙන් මුඩුවූ, ශ්‍රමණ ප්‍රතිරූපකවූ, දාසයන් වැනිවූ, පව්ටුවූ, බ්‍රහ්මපාදයෙන් උපන්නාවූ මොවුහු 'අපි ධ්‍යාන ඇත්තෙමු. අපි ධ්‍යාන ඇත්තෙමු'යි, බෙල්ල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

නමා ගත්තාහු, යටට හෙලූ මුහුණු ඇත්තාහු, අලසවූවාහු, සිතිවිල්ලේයෙදී සිටිත්. විශෙෂයෙන් සිත සිතා සිටිත්. (කියායි)

"මාරය එකල්හි යම් ඒ මනුෂ්‍යයෝ කලුරිය කරත්ද බොහෝ සෙයින් ඔවුහු කාය භෙදයෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුක් ඇති නරකයෙහි උපදිති.

**5.** "මාරය ඉක්බිති අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ කීහ. 'මහණෙනි, දූසී මාරයා 'එව්, තොප සිල්වත්වූ යහපත් ගුණධර්ම ඇති භික්ෂූන්ට බණිව්, නින්දා කරව්, ගටව්, වෙහෙසව්, තොප විසින් බණිනු ලබන්නාවූ, නින්දා කරනු ලබන්නාවූ, ගටනු ලබන්නාවූ, වෙහෙසනු ලබන්නාවූ, ඔවුන්ගේ සිතෙහි දූසී මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇති වන්නේ නම් මැනව'යි බ්‍රාහ්මණ ගෘහපතියන්හට ආවෙශවී සිටියි. මහණෙනි, එව් තෙපි, මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පැතිර වාසය කරව්, එසේම දෙවෙනි දිශාවද, එසේ තුන්වෙනි දිශාවද, එසේම සතර වෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වෛර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරව්.

"කරුණා සහගත සිතින් එක් දිශාවක් පැතිර වාසය කරව්. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන් වෙනි දිශාවද එසේම සතර වෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරව්.

"මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව්. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන් වෙනි දිශාවද, එසේම සතරවෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරව්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරව්. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද, එසේම සතරවෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ, උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරව්ය'යි (වදාළහ)

**6** "මාරය, ඉක්බිති ඒ භික්ෂූහු, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු, මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු, ආරණ්‍යයට ගියාහුද, වෘක්ෂ මූලයට ගියාහුද, ශූන්‍යාගාරයට ගියාහුද මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළහ. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද, එසේම සතරවෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කළහ.

"කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කළහ. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන් වෙනි දිශාවද, එසේම සතර වෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළහ."

"මුදිතා සහගත සිතින් එක්දිශාවක් පතුරුවා වාසය කළහ. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන් වෙනි දිශාවද, එසේම සතර වෙනි දිශාවද, මෙසේ උඩ යට සරස සියලු තන්හි සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළහ."

"උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කළහ. එසේම දෙවෙනි දිශාවද, එසේම තුන්වෙනි දිශාවද, එසේම සතර වෙනි දිශාවද මෙසේ උඩ යට සරස සියලු තන්හි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ, වයිර රහිතවූ, ව්‍යාපාද රහිතවූ උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කළහ.”

7. “මාරය ඉක්බිති දුසීමාරයාට මේ අදහසවිය. ‘මම මෙසේ කරන්නාවූද සිල්වත්වූ යහපත් ස්වභාව ඇති, මේ භික්ෂූන්ගේ ඊමක් හෝ යාමක් හෝ නොදනිමි. යම්හෙයකින් මම බ්‍රාහ්මණ ගෘහපතියන්ට ආවෙශ වන්නෙම් නම් යෙහෙක එව්, තොපි සිල්වත්වූ, යහපත් ස්වභාව ඇති භික්ෂූන්ට සත්කාර කරව්, ගරු කරව්, බුහුමන් කරව්, පුදව්, තොප විසින් සත්කාර කරනු ලබන්නාවූ, ගරු කරනු ලබන්නාවූ, බුහුමන් කරනු ලබන්නාවූ, පුදනු ලබන්නාවූ, ඒ භික්ෂූන්ගේ සිතෙහි දුසී මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇති වන්නේ නම් යෙහෙක, (කියාය)

“මාරය, ඉක්බිති ඒ දූසී මාරතෙම බ්‍රාහ්මණ ගෘහපතියන්හට ආවෙශවිය. ‘එව්, තොපි සිල්වත්වූ, යහපත් ස්වභාව ඇති භික්ෂූන්ට සත්කාර කරව්, ගරු කරව්, බුහුමන් කරව්, පුදව්, තොප විසින් සත්කාර කරනු ලබන්නාවූ, ගරු කරනු ලබන්නාවූ, බුහුමන් කරනු ලබන්නාවූ, පුදනු ලබන්නාවූ, ඒ භික්ෂූන්ගේ සිතෙහි දූසී මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇතිවන්නේනම් යෙහෙක’ (කියාය)

“මාරය, ඉක්බිති දූසී මාරයා ආවෙශවූ ඒ බ්‍රාහ්මණ ගෘහ පතියෝ සිල්වත්වූ, යහපත් ස්වභාව ඇති භික්ෂූන්ට සත්කාර කරත්. ගරු කරත්. බුහුමන් කරත්, පුදත්. මාරය, එකල්හි යම් ඒ මනුෂ්‍ය කෙනෙක් කලුරිය කරත්ද, ඔහු කය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි බොහෝ සෙයින් උපදිත්.

8. “මාරය, එකල්හි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ කකුසඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට මෙසේ කීහ. මහණෙනි, බ්‍රාහ්මණ ගෘහපතීන්ට දූසී මාරයා ආවෙශවිය. එව් තොපි, සිල්වත්වූ යහපත් ගුණධර්ම ඇති භික්ෂූන්ට සත්කාර කරව්, ගරු කරව්, බුහුමන් කරව්, පුදව්. තොප විසින් සත්කාර කරනු ලබන්නාවූ, ගරු කරනු ලබන්නාවූ, බුහුමන් කරනු ලබන්නාවූ,

පුදනු ලබන්නාවූ, ඔවුන්ගේ හිතෙහි දූසී මාරයාට ඉඩක් ලැබෙන පරිදි පෙරළීමක් ඇති වන්නේ නම් යෙහෙක කියාය. මහණෙනි, මෙහි එව්, තෙපි ශරීරයෙහි අශුභය අනුව දකිමින් වාසය කරව්, ආහාරයෙහි පිළිකුල් සංඥාව ඇතිව වාසය කරව්, සියලු ලොකයෙහි නොඇලීම් සංඥා ඇතිව වාසය කරව්. සියලු සංස්කාරයන්හි, අනිත්‍යය අනුව දකිමින් වාසය කරව්." (කියාය)

"මාරය ඉක්බිති, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ අවවාද කරනු ලබන්නාවූ මෙසේ අනුශාසනා කරනු ලබන්නාවූ ඒ භික්ෂූහු ආරණ්‍යයට ගියාහුද, වෘක්ෂ මූලයට ගියාහුද, ශූන්‍යාගාරයට ගියාහුද, කයෙහි අශුභය අනුව දකිමින් විසූහ. ආහාරයෙහි, පිළිකුල් සංඥා ඇතිව සියලු ලොකයෙහි, නොඇලීම් සංඥාව ඇතිව සියලු සංස්කාරයන්හි අනිත්‍යය අනුව දකිමින් වාසය කළහ.

**9.** "මාරය, එකල්හි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාසිවුරු ගෙණ පිටුපසින් ගමන්කරන ආයුෂ්මත් විධුර ස්ථවිරයන් වහන්සේ සමග පිඬු පිණිස ගමට පිවිසියහ. මාරය, ඉක්බිති දූසී මාරතෙම, එක්තරා ළමයෙකුට ආවෙශවී ගල්කැටක් ගෙන ආයුෂ්මත් විධුර ස්ථවිරයන් වහන්සේගේ හිසට පහරක් දුන්නේය. හිස පැලුනේය. මාරය, ඉක්බිති ආයුෂ්මත් විධුර ස්ථවිරයන් වහන්සේ පැළුණු හිසින් යුක්තව ගලන්නාවූ ලෙයින් යුක්තව අර්හත්වූ, සම්‍යක්සම්බුද්ධවූ කකුසඳ භාග්‍යවතුන් වහන්සේ පසු පස්සේම ගියහ. මාරය, ඉක්බිති අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, කකුසඳ භාග්‍යවතුන් වහන්සේ මේ දූසී මාරයා පමණ දැන නොගන්නේයැයි කියමින් නාගාපලොකනය (ඇතෙකු මෙන් මුළු ශරීරයෙන් ආපසු හැරී පිටුපස බැලීම) කළහ. මාරය ඒ බැලීම සමගම, දූසී මාරතෙම, ඒ ස්ථානයෙන් චුතව මහ නිරයෙහි උපන්නේය.

**10.** "මාරය, ඒ මහ නිරයට නම් තුනක් වෙත්. ඊට "ඡඵස්සායතනික" යයිද, "සංකුසමාහත" යයිද, "පච්චත්ත

වෙදනීය" යයිද කියනු ලැබේ. ඉක්බිති මාරය, මා කරා නිරය පාලයෝ පැමිණ මෙසේ කීහ. නිදුකාණෙනි, 'යම් කලෙක නුඹගේ පපුවෙහි යහුලින් යහුල එක්වන්නේද, එකල්හි නරකයෙහි පැසෙනු ලබන්නාවූ තට, අවුරුදු දහසක් සම්පූර්ණයයි දැනගනුව. මාරය, ඒ මම බොහෝ අවුරුදු ගණන්, බොහෝ අවුරුදු සිය ගණන් බොහෝ අවුරුදු දහස් ගණන්, මහ නරකයෙහි පැසුනෙමි, ඒ දස දහසක් අවුරුදු ඒ මහනිරය පිළිබඳවූ, ඔසුපත් නිරයෙහි, (කර්ම විපාකයෙන් හටගත් වෙදනා හෙයින්) "වූට්ඨානිම" නම්වූ වෙදනාව විඳිමින් පැසුණෙමි. මාරය ඒ මාගේ ශරීරය මිනිසෙකුගේ මෙන් විය. හිස මාළුවෙකුගේ මෙන් විය.

> "විධුර නම් අග්‍රශ්‍රාවකයින් වහන්සේද, කකුසඳ භාග්‍යවතුන් වහන්සේද, ගටා යම් තැනෙක, දූසී නම් මාරයා පැසුනේද, ඒ නරකය, කෙබඳු වීද?

"විධුර අග්‍ර ශ්‍රාවකයින් වහන්සේද, කකුසඳ බුදුන්ද ගටා යම් තැනක දූසීනම් මාරයා පැසුනේද, එය සියල්ල තෙමේම වෙදනා උපදවන්නාවූ, යවුල් සියයක් ඇති මෙබඳු නරකයක් විය.

"සර්වඥ ශ්‍රාවකවූ, යම් මොග්ගල්ලාන නම් භික්ෂුවක් තෙම, මේ නිරයෙහි දුක් විභාගය දනීද, මාරය, එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

11. "මහාසමුද්‍රය මැද දියමතුපිට පිහිටියාවූ, කල්පයක් පවතින්නාවූ වෛඩූර්‍ය්‍ය වර්ණ ඇත්තාවූ, සිත්කලුවූ, පර්වත මුදුනෙහි බබලන ගිනි කඳක්සේ රශ්මියෙන් යුක්තවූ, දිලිසෙන දිව්‍ය විමානයෝ වෙති. එහි බොහෝවූ, නොයෙක් පාට ඇති දිව්‍යප්සරාවෝ (දිව්‍යාංගනාවෝ) නටත්.

"තථාගත ශ්‍රාවකවූ, යම් භික්ෂුවක් තෙම, මේ විමාන වස්තු විස්තරය, දනීද, මාරය, එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

"යම් භික්ෂුවක් සර්වඥයන් වහන්සේ විසින් නියම කරන ලද්දේ, භික්ෂු සංඝයා බලා සිටිද්දී, මිගාරමාතා ප්‍රාසාදය පය මාපටැඟිල්ලෙන් (ගසා) කම්පා කෙළේද,

"සර්වඥ ශ්‍රාවකවූ, යම් මහා මොග්ගල්ලාන නම් භික්ෂුවක් මේ ඎද්ධිය දනීද, මාරය, එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

"යමෙක් තෙම, ඎද්ධි බලයෙන් උපකාර ලද්දේ විජයොත් පහය, පය මාපටඟිල්ලෙන් ගසා කම්පා කෙළේද, දෙවියන් සංවේගයට පැමිණවූයේද,

"බුද්ධ ශ්‍රාවකවූ යම් මොග්ගල්ලාන නම් භික්ෂුවක් මෙය දනීද, මාරය, තා එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

"යම් ඒ මොග්ගල්ලාන නම් භික්ෂුවක් "ඇවැත්නි, තෘෂ්ණා ක්ෂය විමුක්තිය දන්නෙහිදැ'යි, විජයොත් පහයේදී ශක්‍රයාගෙන් ප්‍රශ්න කෙළේද, ප්‍රශ්න විචාරණ ලද්දාවූ, ශක්‍රතෙම උන් වහන්සේට සර්වඥයන් වහන්සේ වදාළ පරිදි ප්‍රකාශ කෙළේය.

"බුද්ධ ශ්‍රාවකවූ යම් මොග්ගල්ලාන නම් භික්ෂුවක් මෙය දනීද, මාරය, තා එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

13. "යමෙක් තෙම, බ්‍රහ්ම ලොකයෙහි සුධර්මා නම් බ්‍රහ්ම සභාවෙහිදී, බඹුගෙන් "ඇවැත්නි, නුඹට පූර්ව කාලයෙහි යම් මිථ්‍යා දෘෂ්ටියක් වීද, නුඹගේ ඒ මිථ්‍යාදෘෂ්ටිය අදත් ඇද්දැයි ප්‍රශ්න කෙළේද, බඹලොව අන්‍ය බ්‍රහ්මයන්ගේ ආලොකය මැඩ පවත්වන්නාවූ, (ශාරීපුත්‍ර ස්ථවීරාදීන් පිරිවරා තෙජොධාතුවටසමවැදසිටි) සර්වඥයන් වහන්සේගේ ආලොකය දක්නෙහිදැයි ඇසුවේද?

"බ්‍රහ්ම තෙම උන්වහන්සේට, පිළිවෙලින් ඇතිසැටි යම්සේ නම් එසේ ප්‍රකාශ කෙළේය. 'පූර්වකාලයෙහි මට යම් ශාස්වත දෘෂ්ටියක් වීද, නිදුකානෙනි, මට ඒ දෘෂ්ටිය දැන් නැත්තේය,

"බඹලොව අනිකුත් ආලොක ඉක්ම බබලන බුද්ධා ලොකය දකිමි. "මම නිත්‍යවෙමි. සදාකාලික වෙමි"යි ඒ මම කෙසේ කියම්ද?

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"බුද්ධ ශ්‍රාවකවූ යම් මොග්ගල්ලාන නම් භික්ෂුවක් මෙය දනීද, මාරය, තා එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

12. "යමෙක්තෙම, ධ්‍යාන බලයෙන් මහාමෙරු පර්වතයෙහි මුදුන ස්පර්ශ කෙළේද, ජම්බුද්වීපයද, පූර්ව විදෙහීන්ගේ ද්වීපයද, අපරගොයාන ද්වීපය හා උත්තරකුරු ද්වීපයද ස්පර්ශ කළේද.

"බුද්ධ ශ්‍රාවකවූ යම් මොග්ගල්ලාන නම් භික්ෂුවක් මෙය දනීද, මාරය, තා එබඳු භික්ෂුවක් ගටා දුකට පැමිණෙන්නෙහිය.

"ගින්න, මම බාලයා දවමි'යි, ඒකාන්තයෙන් නොවෙළයි. බාලයාම දිලිසෙන ගින්නට පැමිණ දනු ලැබේ.

"මාරය එපරිද්දෙන්ම, නුඹද තථාගතයන් ගටා ගින්න ස්පර්ශ කරන්නාවූ, බාලයෙකු මෙන් තෙමේ දැවෙන්නෙහිය.

"මාරතෙම තථාගතයන් ගටා අකුසලයක් රැස් කෙළේය. මාරය, "මාගේ පාපය විපාක නොදෙන්නේ ය"යි සිතන්නෙහිද?

"මාරය, පව්කම් කරන්නහුගේ පාපය බොහෝ කලක් මුලුල්ලෙහි රැස්වෙයි. එහෙයින් මාරය, සර්වඥයන් වහන්සේ කෙරෙහි නොඇලී යව, භික්ෂූන් වෙහෙසන ආසාව නොකරව."

මෙසේ මහා මොග්ගල්ලාන භික්ෂූන් වහන්සේ, භෙසකලා නම් වනයෙහිදී මාරයා වෙහෙසූසේක, එයින් හටගත් නොසතුටු සිත්ඇති ඒ වසවර්ති මාරතෙම එහිම නොපෙණී ගියේය.

**දහවෙනිවූ මාර තජ්ජනීය සූත්‍රය නිමි. (5-10)**

(සාලෙයාක සූත්‍රය, වෙරංජක සූත්‍රය, මහාවෙදල්ල සූත්‍රය චූල වෙදල්ල සූත්‍රය, චූල ධම්ම සමාදාන සූත්‍රය, මහා ධම්ම සමාදාන සූත්‍රය, වීමංසක සූත්‍රය, කොසම්බිය සූත්‍රය, බ්‍රහ්ම නිමන්තණික සූත්‍රය, මාර තජ්ජනීය සූත්‍රය, යන සූත්‍ර දසයවූ)

චූල යමක වර්ගය නිමි.

**මූල පණ්ණසකය (මුල් සූත්‍ර පණස) නිමි.**

# මජ්ඣිම පණ්ණාසකය.

## කන්දරක සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ "චම්පානම්" නුවර ගර්ගරා නම් පොකුණු ඉවුරෙහි මහත්වූ භික්ෂු සංඝයා සමග වැඩ වාසය කරති. එකල්හි පෙස්ස නම්වූ හස්ත්‍යාරොහක පුත්‍ර (ඇතුන් බලන්නාගේ පුත්‍ර) තෙමේද කන්දරක නම්වූ පරිබ්‍රාජක තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ පෙස්ස නම් ඇතරුපුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක හුන්නේය. කන්දරක නම් පිරිවැජියාද භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතු වූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක පැත්තක සිටියේය. එක පැත්තක සිටියාවූ කන්දරක නම් පිරිවැජි තෙමේ නිශ්ශබ්දවූ භික්ෂු සංඝයා දෙස බලා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්‍ය්‍යයෙක, (අසුරු ගැසීමට සුදුසුය) භවත් ගෞතමයන් වහන්ස, අද්භූතයෙක, (නුවූවිරූ දෙයක) භවත් ගෞතමයන් වහන්සේ විසින් ඉතා හොඳින් භික්ෂු සංඝතෙම පිළියෙල කරන ලද්දේය.

2. "භවත් ගෞතමයෙනි, අතීතකාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වූවාහුද ඒ භාග්‍යවත්හුද මෙතරම්ම හොඳින් භික්ෂු සංඝයා පිළියෙල කළාහුය. මෙකල්හි භවත් ගෞතමයන් විසින් භික්ෂු සංඝතෙම මනාකොට පිළියෙල කරන ලද්දේ යම්සේද (එමෙනී) භවත් ගෞතමයෙනි, මතු කාලයෙහි යම් අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වන්නාහුද, ඒ භාග්‍යවත්හුද මෙතරම්ම හොඳින් භික්ෂු සංඝයා පිළියෙල කරන්නාහුය. මෙකල්හි භවත් ගෞතමයන් වහන්සේ විසින් භික්ෂු සංඝතෙම හොඳින් පිළියෙල කෙළේ යම්සේද (එමෙනැ'යි" කීයේය)

"කන්දරකය, ඒ කාරණය එසේමය, කන්දරකය, ඒ කාරණය එසේමය කන්දරකය, ඉකුත් කාලයෙහි යම් අර්හත් සම්‍යක්

සම්බුද්ධකෙනෙක් වූවාහුද, ඒ භාග්‍යවත්හුද මේ තරම්ම හොඳින් භික්ෂුසංඝයා පිළියෙල කළාහුය. මෙකල්හි මා විසින් භික්ෂු සංඝතෙමේ පිළියෙල කරනලද්දේ යම්සේද එමෙනි, කන්දරකය, මතු කාලයෙහි යම් මේ අර්හත් සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වන්නාහුද, ඒ භාග්‍යවත්හුද මෙතරම්ම හොඳින් භික්ෂු සංඝයා පිළියෙල කරන්නාහුය. මෙකල්හි මා විසින් භික්ෂු සංඝයා පිළියෙල කරන ලද්දේ යම්සේද (එමෙනි.)

3. "කන්දරකය, මේ භික්ෂු සංඝයා අතර ක්ෂය කළ ආශ්‍රව ඇති, වැස නිමවන ලද මාර්ග බ්‍රහ්මචරියාව ඇති, අවසාන කරනලද කටයුතු ඇති, බහා තබනලද කෙලෙස් බර ඇති, පිළිවෙලින් පැමිණියාවූ අර්හත් මගඇති, ක්ෂය කළාවූ භව සංයෝජන ඇති, මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ රහත් භික්ෂූහුද ඇත්තාහුමය. කන්දරකය, මේ භික්ෂු සංඝයා අතර නිතර පවත්නා සිල් ඇත්තාවූ, නිතර පවත්නා යහපත් පැවතුම් ඇත්තාවූ, නුවණ ඇත්තාවූ, නුවණින් කරන පැවතුම් ඇත්තාවූ සතර සතිපට්ඨානයන්හි මනාව එළඹ සිටි සිත් ඇති, භික්ෂූහුද වාසය කරත්. කවර සතිට්ඨාන සතරක ද යත්? කන්දරකය, මේ ශාසනයෙහි මහණ තෙම කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ මනා නුවණ ඇත්තේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලොභ දොසයන් දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ, සිහි ඇත්තේ විඳීම් රාසියෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙන විඳීම් කෙරෙහි විඳීම් නැවත නැවත බලමින් වාසය කරයි. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, යහපත් නුවණ ඇත්තේ සිහි ඇත්තේ, සිත් සමූහයෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙන සිත් කෙරෙහි සිත් නැවත නැවත බලමින් වාසය කරයි. කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ යහපත් නුවණ ඇත්තේ සිහි ඇත්තේ ධර්ම රාසියෙහි ලොභය හා දොම්නස සංසිඳුවාගෙන ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරයි." (යන සතර සතිපට්ඨානයන්හිය.)

4. මෙසේ වදාළ කල්හි පෙස්ස නම් ඇතරුපුත් තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යය,

ස්වාමීනි, අද්භූතය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සතර සතිපට්ඨානයෝ සත්වයන්ගේ විසුද්ධිය පිණිස, ශොක පරිදෙවයන්ගේ ඉක්මවීම පිණිස, දුක් දොම්නස් දෙදෙනාගේ නැසීම පිණිස, මාර්ගඥාන ලැබීම පිණිස නිවණ අවබොධ කිරීම පිණිස ඉතා හොඳින් පනවන ලද්දාහුමය. ස්වාමීනි, අපිදු ගිහිවූ සුදු වත් අඳනාහු කලින් කල මේ සතර සතිපට්ඨානයන්හි මනාව එළඹ සිටි සිත් ඇත්තෝව වාසය කරමු. ස්වාමීනි, මෙහි අපි කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව මනා නුවණ ඇතිව සිහි ඇතිව ලොකයෙහි ලොභය හා දොම්නස දුරුකොට කයෙහි කය නැවත නැවත බලමින් වාසයකරමු. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහි ඇතිව විඳීම් රාසියෙහි ලොභය හා දොම්නස සංසිඳුවා ගෙන විඳීම් කෙරෙහි විඳීම් නැවත නැවත බලමින් වාසය කරමු. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහි ඇත්තාහු සිත් සමූහයෙහි ලොභය හා දොම්නස සංසිඳුවා ගෙන සිත් කෙරෙහි සිත් නැවත නැවත බලමින් වාසය කරමු. කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව යහපත් නුවණ ඇතිව සිහි ඇතිව ධර්ම රාසියෙහි ලොභය හා දොම්නස සංසිඳුවා ගෙන ධර්මයන් කෙරෙහි ධර්මයන් නැවත නැවත බලමින් වාසය කරමු. ස්වාමීනි ආශ්චර්‍ය්‍යය, ස්වාමීනි අද්භූතය, ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ මෙසේ මිනිසුන්ගේ වැසුණු අදහස් කිලුටු අදහස් කෛරාටික අදහස් පවත්නා කල්හි සත්වයන්ට හිතවූද, අහිතවූද ප්‍රතිපදාව මැනවින් දන්නා සේක්මය. ස්වාමීනි, යම් මේ මනුෂ්‍යයෝ වෙත්ද, මොවුන්ගේ අදහස වැසුණේ මැයි (දැනගත නොහැකිමැයි) ස්වාමීනි, යම් මේ සිවුපා සත්තු වෙත්ද (මොවුන්ගේ අදහස) පැහැදිලිමය ස්වාමීනි, මම වනාහි හස්ති ධර්මය (ඇතුන්ගේ ස්වභාව) සිහි කරවන්ට හැකිවෙමි. යම්තාක් වාරයක් චම්පා නුවරට යාම් ඊම් කරන්නේද ඒ සියලු වාරයන්හි හස්ති තෙමේ සිටිනු කැමති කල්හි සිටින්නේය. පිට සිටින්නා හෙළනු කැමති කල්හි හෙළන්නේය. ආපසු යනු කැමති කල ආපසු යන්නේය. වමින් හෝ දකුණින් හෝ කෙලින් හෝ යනු කැමති කල එසේ යන්නේය. මලමුත්‍ර කරනු කැමති කල එතනම මලමුත්‍ර

කරන්නේය. ස්වාමීනි, අපගේ වනාහි දාසයෝය පණිවුඩකාරයෝය කම්කරුවෝය යන යම් කෙනෙක් වෙත්ද, ඔවුහු අන් පරිද්දකින්ම කයින් හැසිරෙත්. අන් පරිද්දකින් වචනයෙන් කථාකරත්. අන් පරිද්දකින් සිතින් සිතත්. ස්වාමීනි, අශ්චර්‍ය්‍යය, ස්වාමීනි අද්භූතය ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ මෙසේ මිනිසුන්ගේ අදහස් අපිරිසිදු බව, මෙසේ මිනිසුන්ගේ අදහස් අප්‍රකට බව, මෙසේ මිනිසුන්ගේ අදහස් කෛරාටික බව පවත්නා කල්හි සත්වයන්ට හිතවූද, අහිතවූද ප්‍රතිපදාව දන්නා සේක්මය. ස්වාමීනි, යම් මේ මිනිස්සු වෙත්ද, මොවුන්ගේ මේ අදහස අප්‍රකටමය. ස්වාමීනි, යම් මේ සිවුපා සත්තු වෙත්ද මොවුන්ගේ මේ අදහස ප්‍රකටමයයි කීයේය.

"පෙස්සය, ඒ කාරණය එසේය. පෙස්සය ඒ කාරණය එසේය. පෙස්සය යම් මේ මිනිස්සු වෙත්ද (මොවුන්ගේ) මේ අදහස අප්‍රකටය. පෙස්සය, යම් මේ සිවුපා සත්තු වෙත්ද (මොවුන්ගේ) මේ අදහස පැහැදිලිය.

5. "පෙස්සය, ලොකයෙහි මේ පුද්ගලයෝ සතරදෙනෙක් වෙත්. කවර සතරදෙනෙක්ද යත්? පෙස්සය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තවන්නේ තමහට තැවීම කරන්නාවූ පිළිවෙතෙහි යෙදුනේ වෙයි. පෙස්සය, මේ ලොකයෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේ වෙයි. පෙස්සය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තවන්නේ තමා තවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද අනුන් තවන්නේ අනුන් තවන පිළි වෙතෙහි යෙදුනේද වෙයි, පෙස්සය, මේ ලොකයෙහි වනාහී ඇතැම් පුද්ගලයෙක් තමා නොතවන්නේ තමා නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද අනුන් නොතවන්නේ අනුන් තවන පිළිවෙතෙහි නොයෙදුනේද වෙයි. තමාද නොතවන්නාවූ අනුන්ද නොතවන්නාවූ ඒ පුද්ගලතෙමේ මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ නිවුනේද සිහිල්වූයේ (ධ්‍යාන මාර්ග ඵල නිර්වාණ) සැප විඳින ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කරයි, පෙස්සය, මේ පුද්ගලයන් සතරදෙනා අතුරෙන් කවර පුද්ගලයෙක් තොපගේ සිත සතුටු කෙරේදැ"යි (ඇසූහ.)

**6.** "ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් තමා තවන්නේ තමා තවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේ වේද මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු නොකරයි, ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේ වේද මේ පුද්ගලතෙමේද මාගේ සිත සතුටුනොකරයි, ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් තමා තවන්නේ තමා තවන පිළිවෙතෙහි යෙදුනේද අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේත් වේද මේ පුද්ගල තෙමේද මාගේ සිත සතුටු නොකරයි, ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් වනාහි තමා නොතවන්නේම තමා නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද, අනුන් නොතවන්නේ අනුන් තවන පිළිවෙතෙහි නොයෙදුනේවේද තමා නොතවන්නාවූ අනුන් නොතවන්නාවූ හෙතෙම මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ කෙලෙසුන්ගෙන් මිදුනේ සිහිල්වූයේ ධ්‍යානාදී සුව විඳිමින් ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කෙරේද, මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු කෙරේය"යි කීයේය.

**7.** "පෙස්සය, කුමක් හෙයින් වනාහි මේ පුද්ගලයෝ තුන්දෙන තොපගේ සිත සතුටු නොකරද්ද"යි (ඇසූසේක) "ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක්තෙම තමා තවන්නේ තමා තවන පිළිවෙතෙහි යෙදුනේවේද, හෙතෙම සැපයට කැමතිවූ දුකට පිළිකුල් කරන්නාවූ තමා තවයි, අතිශයින් තවයි. මේ කාරණයෙන් මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු නොකරයි. ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේ වේද, හෙතෙම සැපයට කැමතිවූ දුකට පිළිකුල් කරන්නාවූ අන්‍යයා තවයි, අතිශයින් තවයි. මේ කාරණයෙන් මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු නොකරයි. ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් තමා තවන්නේ තමා තවන පිළිවෙතෙහි යෙදුනේද අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේත් වේද, හෙතෙම සැපයට කැමතිවූ දුකට පිළිකුල් කරන්නාවූ තමාද අනුන්ද තවයි, අතිශයින් තවයි. මේ කාරණයෙන් මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු නොකරයි. ස්වාමීනි, යම් මේ පුද්ගලයෙක් තමා නොතවන්නේ තමා තවන පිළිවෙතෙහි නොයෙදුනේ අනුන් නොතවන්නේ අනුන් තවන පිළිවෙතෙහි

නොයෙදුනේ වේද, තමා නොතවන්නාවූ අනුන් නොතවන්නාවූ හෙතෙම මේ ආත්මයෙහි තෘෂ්ණා රහිතවූයේ කෙලෙසුන්ගෙන් මිදුනේ සිහිල්වූයේ ධ්‍යානාදි සුව විඳිමින් ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කරයිද, මේ කාරණයෙන් මේ පුද්ගලතෙම මාගේ සිත සතුටු කරයි. ස්වාමීනි, අපි බොහෝ වැඩ කටයුතු ඇත්තෝ වෙමු. එබැවින් දැන් අපි යමු"යි කීයේය.

"පෙස්සය, ඊට දැන් තෝ කල් දනුව"යි වදාළහ. ඉක්බිති පෙස්ස නම් ඇතරු පුත්තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගෙණ අනුමෝදන්ව උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට හොඳින් වැඳ පැදකුණුකොට ගියේය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙස්ස නම් හස්ත්‍යාරොහක පුත්‍රයා බැහැර ගිය නොබෝ වේලාවකින් භික්ෂූන්ට කථා කළහ. "මහණෙනි, පෙස්ස නම් ඇතරුපුත් තෙමේ පණ්ඩිතය. මහණෙනි, පෙස්ස නම් ඇතරු පුත්තෙමේ මහත් නුවණ ඇත්තේය. මහණෙනි, ඉදින් පෙස්ස නම් ඇතරු පුත්තෙමේ යම්තාක් ඔහුට මම මේ පුද්ගලයන් සතරදෙන විස්තර වශයෙන් විභාගකොට කියම්ද, (ඒතාක්) මොහොතක් කල් උන්නේ නම් මහත්වූ අර්ථයෙන් යුක්තව යන්නේය. (සෝවන් ඵලයට පැමිණෙන්නේය.) මහණෙනි, එතකුදු වුවත් මෙතෙකිනුත් පෙස්ස නම් ඇතරුපුත් තෙමේ මහත්වූ අර්ථයෙන් යුක්තවූයේය"යි වදාළහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ පුද්ගලයන් සතරදෙන විස්තර වශයෙන් බෙදා වදාරන්නේය. භාග්‍යවතුන් වහන්සේගේ (විස්තර දෙශනාව) අසා භික්ෂූහු දරන්නාහුය, යන යමක් වේද, භාග්‍යවතුන් වහන්ස, දැන් ඊට කාලය වේ. සුගතයන් වහන්ස, මේ දෙශනාවට සුදුසු කාලය වේ." "මහණෙනි, එසේ වීනම් අසව්. මනාකොට මෙනෙහිකරව් කියන්නෙමි" "ස්වාමීනි, එසේය"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

9. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. "මහණෙනි, තමන් තවන්නාවූද තමන් තවන පිළිවෙතෙහි යෙදුනාවූද පුද්ගලතෙම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම වස්ත්‍ර නොහඳින්නේ වෙයි. හොඳ පැවතුම් නැත්තේ වෙයි. මලපහ කොට අතින් පිස දමන්නේ වෙයි. එව ස්වාමීනියි කී විට නොඑන්නේ වෙයි. සිටිනු ස්වාමීනියි කී විට නොසිටින්නේ වෙයි. පළමු කොට ගෙනෙනලද ආහාරය නොපිළිගණියි. උදෙසා කරන ලද්ද නොපිළිගණියි ආරාධනා කොට දුන් බත නොඉවසයි. හෙතෙම කළගෙඩි කටින් ගෙණ දුන් දෙය නොපිළිගණියි. සැළි කටින් ගෙණ දුන් දෙය නොපිළිගණියි. එළිපත අතර කොට දුන්දෙය නොපිළිගණියි. දණ්ඩක් අතර කොට දුන් දෙය නොපිළිගණියි. මෙහොලක් අතර කොට දුන් දෙය නොපිළිගණියි. වළඳන්නාවූ දෙදෙනෙකු අතුරෙන් කෙනෙක් දුන් දෙය නොපිළිගණියි ගැබිණියකගෙන් නොපිළිගණියි. කිරි පොවන්නියකගෙන් නොපිළිගණියි. පුරුෂයන් අතරට ගිය ස්ත්‍රියකගෙන් නොපිළිගණියි. සමාදන් කොට දුන් කල්හි නොපිළිගණියි. යම් තැනක සුනඛයෙක් සිටියේ වේද එතන්හි නොපිළිගණියි. යම් තැනක මැස්සෝ රන්වූ රන්වූ ගැවසෙත්ද එතන්හි නොපිළිගණියි. දියමස් ආහාරය නොපිළිගණියි. ගොඩමස් නොපිළිගණියි. සුරාව නොපිළිගණියි. මෙරය (මල්යුසින් කළ මත්පැන්) නොපිළිගණියි. කාඩිදිය නොබොයි. හෙතෙම එක ගෙයකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. එක පිඩකින් යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් දෙකකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. පිඩු දෙකකින් යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් සතකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. පිඩු සතකින් යැපෙන්නේ හෝ වෙයි. එකම කුඩාවූ ආහාර භාජනයකින් යැපෙයි. කුඩා ආහාර බඳුන් දෙකකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් හතකින්ද යැපෙයි. එක් දවසක් හැර දවසක්ද ආහාර ගණියි. දෙදවසක් හැර දවසක්ද ආහාර ගණියි. සත් දවසක් හැර දවසක්ද ආහාර ගණියි. මෙසේ මෙබඳු අඩමසකට වරක් ආහාර ගනිමින්ද වාර භොජනයෙහි යෙදී වාසය කරයි. හෙතෙම අමු පලා කන්නේ හෝ වෙයි. බඩ හමු අනුභව කරන්නේ හෝ වෙයි. හුරුහැල් අනුභව කරන්නේ හෝ වෙයි. සම් කසට අනුභව කරන්නේ හෝ වෙයි. මැලියම් අනුභව

කරන්නේ හෝ වෙයි. කුඩු අනුභව කරන්නේ හෝ වෙයි. දඹු බත් අනුභව කරන්නේ හෝ වෙයි. තල මුරුවට අනුභව කරන්නේ හෝ වෙයි. තණකොළ අනුභව කරන්නේ හෝ වෙයි. ගොම අනුභව කරන්නේ හෝ වෙයි. වනමුල් ඵල ආහාර කොට ඇතිව වැටුණු ගෙඩි අනුභව කරමින් එයින් යැපෙයි. හෙතෙම හන වැහැරිද දරයි. මිශ්‍රක වැහැරිද දරයි. මල සිරුරෙන් දැමූ වස්ත්‍රද දරයි. පංසුකූල වස්ත්‍රද දරයි. ගස් සුඹුලෙන් කළ වස්ත්‍රද දරයි. අඳුන් දිවි සම්ද දරයි. කුර සහිත අඳුන් දිවිසම්ද දරයි. කුසතණ වැහැරිද දරයි. කෙඳිවලින් කළ වැහැරිද දරයි. පතුරුවලින් කළ වැහැරිද දරයි. මිනිස් කෙසින් කළ කම්බිලිද දරයි. අස්ලොම් ආදියෙන් කළ කම්බිලිද දරයි. බකමුහුණු පිහාටු ගොතා කළ වස්ත්‍රද දරයි. හිසකේ රැවුල් උදුරන්නේ, ඉසකේ රැවුල් උදුරන පිළිවෙතෙහි යෙදුනේ වෙයි. ආසන ප්‍රතික්ෂෙප කරන ලද්දේ උඩ බලා සිටින්නේ වෙයි. උක්කුටිකව වීර්‍ය්‍ය කිරීමෙහි යෙදුනේ උක්කුටිකවූයේද වෙයි. කටු යහනෙහි සයනය කරයි. කටු ඇතිරියෙහි සයනය කරයි. සවස තෙවැනි කොට (දවසට තුන් වරක්) දියට බසින පිළිවෙතෙහි යෙදුනේ වාසය කරයි. මෙසේ මෙබඳු නොයෙක් ආකාරයෙන් ශරීරය තවන පෙළන තපස්කම්වල යෙදී වාසය කරයි. මහණෙනි, මේ පුද්ගලතෙම තමන් තවන්නේ තමන් තවන පිළිවෙතෙහි යෙදුනේයයි කියනු ලැබේ.

10. "මහණෙනි, අනුන් තවන්නාවූ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනාවූ පුද්ගල තෙම කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් එළුවන් මරන්නේ වෙයි. ඌරන් මරන්නේ වෙයි. ලිහිණින් මරන්නේ වෙයි. මුවන් මරන්නේ වෙයි. රෞද්‍රවූයේ වෙයි. මසුන් මරන්නේ වෙයි. සොරකම් කරන්නේ වෙයි. සොරුන් මරන්නේ වෙයි. සිරගෙවල් පාලනය කරන්නේ වෙයි. අන්‍යවූද කිසියම් දරුණුකම් කරන්නාහු මේ පුද්ගලතෙම අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේයයි කියනු ලැබේ.

11. "මහණෙනි, තමන් තවන්නාවූ තමන් තවන පිළිවෙතෙහි යෙදුනාවූද අනුන් තවන්නාවූ අනුන් තවන පිළිවෙතෙහි

යෙදුනාවූද පුද්ගලතෙමේ කවරේද? මහණෙනි, මේලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඔටුණු පළඳිනලද ක්ෂත්‍රිය රජෙක් හෝ වෙයි. මහා සාර වංශ ඇත්තාවූ මහත් වස්තුව ඇති බ්‍රාහ්මණයෙක් හෝ වෙයි. හෙතෙම නුවරට නැගෙනහිර දිශාවෙහි අළුත්වූ යාග ශාලාවක් කරවා, හිසකේ රැවුල් බහවා කුර සහිත අඳුන් දිවිසමක් හැඳ ගිතෙලින් හා තලතෙලින් ශරීරය තවරා මුවඅඟින් පිට කසමින් මෙහෙසියද පොරෝහිත බමුණාද සමග යාග ශාලාවට පිවිසෙයි. හෙතෙම එහි අතුරණලද පැදුරු ආදියක් නැති ගොම පිරිබඩකළාවූ භූමියෙහි සයනය කරයි. සමාන වස්සන් ඇති එක දෙනකගේ එක තනයෙක්හි යම් කිරක්වේද එයින් රජතෙම යැපෙයි. දෙවෙනි තනයෙහි යම් කිරක් වේද එයින් මෙහෙසිය යැපෙයි. තුන්වන තනයෙහි යම් කිරක් වේද එයින් පුරෝහිත බමුණා යැපෙයි. සිවුවන තනයෙහි යම් කිරක්වේද එයින් ගිනි පුදත්. ඉතිරිවූවකින් වසුතෙම යැපෙයි. හෙතෙම මෙසේ කියයි. යාගය පිණිස මෙපමණ වෘෂභයන් නසත්වා, යාගය පිණිස මෙපමණ නාඹු වස්සන් නසත්වා, යාගය පිණිස මෙපමණ නැඹි වැස්සියන් නසත්වා, යාගය පිණිස මෙපමණ එළුවන් නසත්වා, යාගය පිණිස මෙපමණ තිරෙළුවන් නසත්වා, යාගකණු පිණිස මෙතෙක් ගස් කපත්වා, යාග භූමිය වටකිරීම හා ඇතිරීම පිණිස මෙතෙක් කුසතණ සිඳිත්වායි. ඔහුගේ යම් ඒ දාසයෝය කියා හෝ පණිවුඩකාරයෝය කියා හෝ කම්කරුවෝය කියා හෝ කෙනෙක් වෙත්ද, ඔව්හුද දණ්ඩෙන් තැති ගත්තාහු භයින් තැති ගත්තාහු කඳුළු පිරුණු මුහුණු ඇතිව හඬමින් වැඩකරත්. මහණෙනි, මේ පුද්ගල තෙම තමන් තවන්නේ තමන් තවන පිළිවෙතෙහි යෙදුනේද අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේද වේයයි කියනු ලැබේ.

12. "මහණෙනි, තමන් නොම තවන්නාවූ, තමන් තවන පිළිවෙත නොයෙදුනාවූද අනුන් නොතවන්නාවූ අනුන් තවන පිළිවෙතෙහි නොයෙදුනාවූද පුද්ගලතෙමේ කවරේද? තමන්ද නොතවන්නාවූ අනුන්ද නොතවන්නාවූ ඒ පුද්ගල තෙම මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ කෙලෙසුන්ගෙන් නිවියේ

සිහිල්වූයේ ධ්‍යානාදී සුව විඳිමින් ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කරයි. මහණෙනි, මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, ශොභන ගමන් ඇත්තාවූ, ලෝකය දන්නාවූ, නිරුත්තර වූ, දමනය කළ නොහැකි පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙකු බඳුවූ, දෙවි මිනිසුන්ට අනුශාසනා කරන්නාවූ, චතුරාර්‍ය්‍ය සත්‍යයන් අවබෝධ කළාවූ, සියලු ක්ලේශයන් නැති කළාවූ තථාගතයන් වහන්සේ පහලවෙති. උන්වහන්සේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මේලොකයද මහණ බමුණන් සහිතවූ දෙවි මිනිසුන් සහිතවූ ප්‍රජාවද තමන් වහන්සේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරනසේක. උන්වහන්සේ මුල යහපත්වූ මැදයහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ ධර්මය දෙශනා කරනසේක. සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරන්නාහ.

13. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි පහදියි. එසේ පැහැදුණාවූ හෙතෙම මෙසේ සලකයි. ගිහිගෙයි විසීම අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් සම්පූර්ණ කොට එකාන්තයෙන් පිරිසිදු කොට ලියවනලද සකක් වැනි මේ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. මම හිසකෙස් දැළි රැවුල් කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙක කියායි. හෙතෙම පසු කාලයෙක්හි ස්වල්පවූ හෝ සම්පත් හැර, මහත්වූ හෝ සම්පත් හැර ස්වල්පවූ හෝ නෑදෑ පිරිස් හැර, මහත්වූ හෝ නෑදෑ පිරිස් හැර හිසකේ දැළි රැවුල් කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. හෙතෙම මෙසේ පැවිදිවූයේම භික්ෂු සීලයෙන් යුක්ත වූයේ ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැලකුනේ වෙයි. බහා තබන ලද දඬු ඇත්තේ පව් කිරීමට ලජ්ජා ඇත්තේ කරුණාවෙන් යුක්ත වූයේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. නුදුන් දෙය

ගැණීම හැර නුදුන් දෙය ගැණීමෙන් වැලකුනේ වෙයි. දුන් දෙය ගන්නේ දුන් දෙයෙහි බලාපොරොත්තු ඇත්තේ සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කරයි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම් ග්‍රාම ධර්මයෙන් වෙන්ව බ්‍රහ්මචාරිවේ. මුසාවාදය හැර මුසාවාදයෙන් වැලකුනේ සත්‍යවචන ඇත්තේ සත්‍යයෙන් සත්‍යය ගැළපීම් ඇත්තේ ස්ථිර වචන ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලොව මුළා නොකරන්නෙක් වෙයි. කේලාම් කීම හැර කේලාම් කීමෙන් වැලකුනේ වෙයි. මෙයින් අසා මොවුන්ගේ බිඳීම පිණිස එතන්හි නොකියන්නේවෙයි. එතනින් හෝ අසා ඔවුන්ගේ බිඳීම පිණිස මොවුන්ට නොකියන්නේ වෙයි. මෙසේ බිඳුනවුන් ගලපන්නේ හෝ සමගිවූවන්ට අනුබල දෙන්නේ හෝ සමගියෙහි ඇලුනේ සමගියට කැමතිවූයේ සමගියට සතුටුවූයේ සමගි කරණ වචන කියන්නේ වෙයි. පරුෂ වචනය හැර පරුෂ වචනයෙන් වැලකුනේ වෙයි යම් ඒ වචනයක් නිර්දෝෂද, කණට මිහිරිද, ප්‍රේමණීයද, සිත සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ සිත් ප්‍රිය කරන්නේද එබඳු වචන කියන්නේ වෙයි. සම්ඵප්‍රලාපය හැර හිස් කථා කිරීමෙන් වැලකුනේ වෙයි. කාලයට සුදුසු වචන ඇත්තේ, සත්‍යවූ වචන ඇත්තේ, අර්ථයෙන් යුත් වචන ඇත්තේ, ධර්මයෙන් යුත් වචන ඇත්තේ, හික්මීමට සුදුසු වචන ඇත්තේ සුදුසු කල්හි කියන කරුණු සහිතවූ සීමා සහිත අර්ථයෙන් යුක්තවූ සිතෙහි තැන්පත් කටයුතුවූ වචන කියන්නේ වෙයි.

14. "හෙතෙම පැලවෙන තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැලකුනේ වෙයි. එක්වේලෙහි වළඳන බත් ඇත්තේ, රාත්‍රිභොජනයෙන් තොරවූයේ, විකල් බොජුනෙන් වැලකුනේ වෙයි. මල් ගඳවිලවුන් දැරීම් සැරසීම් ගැල්වීම් යන මෙයින් වැලකුනේ වෙයි. උස්ආසන මහා ආසනයන්ගෙන් වැලකුනේ වෙයි. රන් රිදී මසු කහවනු පිළි ගැන්මෙන් වැලකුනේ වෙයි. අමු ධාන්‍ය පිළිගැන් මෙන් වැලකුනේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. දාසයන් හා දාසීන්

පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. එළුවන් හා තිරළුවන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. කුකුලන් හා ඌරන් පිළිගැන් මෙන් වැලකුනේ වෙයි. ඇතුන්ද, ගවයන්ද, අසුන්ද, වෙළඹුන්ද පිළිගැණීමෙන් වැලකුනේ වෙයි. කුඹුරු හා ඉඩම් පිළිගැණීමෙන් වැලකුනේ වෙයි. දූත මෙහෙවර හා පණිවුඩ පනත්වල යෙදීමෙන් වැලකුනේ වෙයි. බඩු විකිණීමෙන් හා මිළදී ගැණීමෙන් වැලකුනේ වෙයි. තරාදියෙන් හොරට කිරීමය, තඹ ලෝහාදියෙන් කළ දෙය රත්‍රන්යයි රැවටීමය, හොරට වඤ්චා කිරීමය යන මෙයින් වැලකුනේ වෙයි. අල්ලස් ගැණීමය රැවටීමය කෛරාටික කම් කිරීමය යන මෙයින් වැළකුනේ වෙයි. අත් පා ආදිය කැපීම මැරීම රැහැන් ආදියෙන් බැඳීම සැඟවීසිට මංපැහැරීම ගම් ආදියට පැන කොල්ලකෑම බලහත් කාරකම් කිරීම යන ආදියෙන් වැලකුනේ වෙයි. හෙතෙම කයින් පරිහරණය කරන සිවුරෙන්ද කුසින් පරිහරණය කරන ආහාරයෙන්ද සතුටුවූයේ වෙයි. හෙතෙම යම් යම් තැනෙක්හි යන්නේද (ස්වකීය අටපිරිකර පමනක්) හැරගෙනම යයි. යම්සේ නම් පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැන කට පියාඹන්නේ පියාපත් බර පමණක් ගෙන පියාඹන්නේද එපරිද්දෙන්ම මහණ තෙම කයින් පරිහරණය කරන සිවුරෙන්ද කුසින් පරිහරණය කරන ආහාරයෙන්ද සතුටුවූයේ වෙයි. යම් යම් තැනකට යන්නේද (අට පිරිකර පමණක්) හැරගෙණම යෙයි. හෙතෙම මේ උතුම්වූ ශීලයෙන් යුක්තවූයේ අධ්‍යාත්මයෙහි නිරවද්‍ය සුවය විඳියි.

15. "හෙතෙම ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නොගනියි. සලකුණු වශයෙන් නොගනියි. යම් හේතුවකින් මේ ඇසෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ සංඛ්‍යාත ලාමකවූ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ ඇසෙහි සංවරය පිණිස පිළිපදියි. චක්ෂුරින්ද්‍රිය රකියි. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක් වනසේ අල්ලා නොගනියි. යමක් හේතු කොට ගෙන ශ්‍රොතෙන්ද්‍රියය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ ශ්‍රොත ඉන්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොත ඉන්ද්‍රියරකී. ශ්‍රොත ඉන්ද්‍රියයෙහි

සංවරයට පැමිණෙයි. නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී, නැවත නැවත මතක්වනසේ සිතට නොගනී. යමක් හේතු කොටගෙන ඝ්‍රාණෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ඝාණ ඉන්ද්‍රිය රකියි, ඝාණ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"දිවෙන් රසයක් විඳ එය අරමුණු වශයෙන් නොගනියි. නැවත නැවත මතක් වනසේ නොගනී. යමක් හේතු කොට ගෙන ජිව්හෙන්ද්‍රිය සංවර නොකොට වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ජිව්හෙන්ද්‍රිය රකී. ජිව්හෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"කයින් පහසක් ස්පර්ශ කොට එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක් වනසේ නොගනී. යමක් හේතු කොට ගෙන කායෙන්ද්‍රියය සංවර නොකොට වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද එහි සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රිය රකියි. කායෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ නොගනී. යම් හේතුවකින් මේ මනින්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හෙතෙම මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳියි.

**16.** "හෙතෙම ඉදිරියට යෑමෙහිද ආපසු යාමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. ඉදිරිය බැලීමෙහිද හැරී බැලීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. සඟල සිවුර හා පාත්‍ර සිවුරු දැරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. ආහාර වැළඳීමෙහිද බීමෙහිද රස විඳීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදා ගැනීමෙහිද, නිදි දුරු කිරීමෙහිද, කථා කිරීමෙහිද, නිශ්ශබ්දව හිඳීමෙහිද මනාව දැන කරන්නේ වෙයි. හෙතෙම මේ උතුම් ශීලරාශියෙන් යුක්තවූයේ, මේ ඉන්ද්‍රිය සංවරයෙන්ද යුක්තවූයේ, මේ උතුම් සිහි නුවණ දෙකින් යුක්තවූයේ විවේකයට සුදුසුවූ ආරණ්‍යය වෘක්ෂමූලය පර්වතය කඳුරැලිය පර්වත ගුහාය සොහොනය දුරවූ වන සෙනාසනය හිස්තැන්ය පිදුරු ගොඩවල්ය යන විවේක සේනාසනයක් සෙවනය කරයි. හෙතෙම බතින් පසු පිණ්ඩපාතයෙන් වැලකුනේ ශරීරය කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි. හෙතෙම ස්කන්ධ ලෝකයෙහි ලොභය දුරු කොට දුරු කරනලද ලොභය ඇති සිතින් යුක්තව වාසය කරයි, ලොභයෙන් සිත පිරිසිදු කරයි. සිත විනාශ කරන්නාවූ ක්‍රොධය දුරුකොට ක්‍රොධ රහිත සිත් ඇත්තේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වාසය කරයි, ක්‍රොධයෙන් සිත පිරිසිදු කරයි, සිතෙහි ගිලන් බවයයි කියන ලද ථීනයද චෛතසිකයන්ගේ ගිලන් බවයයි කියන ලද මිද්ධයද හැර පහවූ ථීනමිද්ධ ඇත්තේ, ආලොක සංඥා ඇත්තේ, සිහිය හා නුවණ ඇත්තේ වාසය කරයි. ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කරයි, නොසන්සුන් බව හා පසුතැවීම හැර නොසන්සුන් නොවූයේ අද්ධ්‍යාත්මයෙහි සන්සුන් සිත් ඇත්තේ වාසය කරයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව හැර දුරුකරන ලද සැක ඇත්තේ කුශල ධර්මයන්හි මෙය කෙසේ කෙසේ වේදැයි පැවති සැක නැත්තේ වාසය කරයි. විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කරයි. හෙතෙම සිත කිළුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ පඤ්චනීවරණයන් හැර කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාරසහිතවූ විවෙකයෙන් හටගත්තාවූ ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමද්ධ්‍යානයට පැමිණ වාසය කරයි, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමාකෙරෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟබැව් ඇත්තාවූ අවිතර්කවූ අවිචාරවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියගේද නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේ, සිහිය හා නුවණ ඇත්තේද

වාසය කරයි. සුවයද කයින් විඳියි, යමක් උපෙක්ෂා ඇත්තේ සිහිය ඇත්තේ සැපවිහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි, සැපය දුරුකිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ සංසිඳීමෙන් දුක් රහිතවූ, සැප රහිතවූ උපෙක්ෂා සිහි පිරිසිදු බව ඇත්තාවූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, කෙලෙසුන් පහවගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි පෙර ජාති සිහි කරන නුවණ පිණිස සිත නමයි, හෙතෙම නොයෙක් ආකාරවූ පෙර විසීම් සිහි කරයි, එනම් එක ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශ වන හෝ හැදෙන කල්පයන්ද අසවල් තැනවීමි මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත්‍ර ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් වින්දෙම් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම ඉන් චුත වූයේ අසවල් තන්හි ඉපදුනෙමි. එහිදු මෙබඳු නම් ඇත්තෙම් මෙබඳු ගොත්‍ර ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුව දුක් වින්දෙම් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම ඉන් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි, මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ නොයෙක් ආකාරවූ පෙර ජාති සිහි කරයි.

17. හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමසිත් රහිතවූ කල්හි, පහවගිය කෙලෙස් ඇති කල්හි මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටිකල්හි, ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සත්වයන්ගේ චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිතනමයි හෙතෙම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් හීනවූද, ප්‍රණීතවූද,

යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද අයහපත්ගති ඇත්තාවූද, චුතවනු ලබන්නාවූද උපදිනු ලබන්නාවූද, සත්වයන් දකියි. 'පින්වත්නි, ඒකාන්තයෙන් මේ සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවෝය. වාග්දුශ්චරිතයෙන් යුක්තවූවෝය, මනො දුශ්චරිතයෙන් යුක්තවූවෝය, ආර්‍ය්‍යයන්ට දොස් කියන්නෝය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝය, මිථ්‍යාදෘෂ්ටික කර්ම සමාදන්වූවෝය, ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු නපුරු ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. පින්වත්නි, මේ සත්වයෝ වනාහී කාය සුචරිතයෙන් යුක්තවූවාහු වාග් සුචරිතයෙන් යුක්තවූවාහු ආර්‍ය්‍යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටික කර්ම සමාදන්වූවාහුය. ඔවුහු ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලෝකයෙහි උපන්නාහුය'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාවූ සත්වයන් දකියි, හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණවූද, දුර්වර්ණවූද, හොඳ ලොවට ගියාවූද, නරක ලොවට ගියාවූද චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දනියි.

18. "හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, පහවගිය කෙලෙස් ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, ආශ්‍රවයන් පහකිරීමේ ඥාණය පිණිස සිත නමයි, හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දනියි. මේ දුකට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනියි, මේ දුක නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් දනියි, මේ දුක් නැති කිරීමට පිළිපදින්නාවූ මාර්ගයයයි තත්වූ පරිද්දෙන් දනියි, මේ ආශ්‍රවයෝයයි තත්වූ පරිද්දෙන් දනියි, මේ ආශ්‍රවයන්ට හේතුවයයි තත්වූ පරිද්දෙන් දනියි, මේ ආශ්‍රවයන්ගේ නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් දනියි. මේ ආශ්‍රවයන් නැති කිරීමට පිළිපදින්නාවූ මාර්ගය'යි තත්වූ පරිද්දෙන් දනියි, මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රව කෙරෙන්ද මිදෙයි, භාවාශ්‍රව කෙරෙන්ද සිත මිදෙයි, අවිද්‍යාශ්‍රව කෙරෙන්ද සිත

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මිදෙයි, මිදුනු කල්හි මිදුනේය යන දැනීම වෙයි, ජාතිය ක්ෂය කරන ලද්දීය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය, සතර මාර්ගයෙන් කටයුතු දෙය කරන ලද්දේය. මෙයින් මතු කළයුතු අනිකක් නැත්තේයයි දැනගණියි, මහණෙනි, මේ පුද්ගලතෙම තමන් නොතවන්නේ තමන් නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද, අනුන් නොතවන්නේ අනුන් නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද වේයයි කියනු ලැබේ. හෙතෙම තමන් නොතවන්නාවූද, අනුන් නොතවන්නාවූද මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ කෙලෙසුන්ගෙන් නිවියේ සිහිල්වූයේ ධ්‍යානාදී සැප විඳින සුළුවූයේ ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කෙරේ”යයි වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

**පළමුවෙනිවූ කන්දරක සූත්‍රය නිමි. (1-1)**

## 2. අට්ඨක නාගර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විශාලා මහනුවර සමීපයෙහි බෙලුව නම් ගම වැඩ වාසය කරති. එකල්හි අට්ඨකනම් නුවර වැසිවූ දසම නම් ගෘහපති තෙම කිසියම් කටයුත්තක් සඳහා පැලළුප් නුවරට පැමිණියේ වෙයි. ඉක්බිති අට්ඨකනම් නුවර වැසි දසම නම් ගෘහපතිතෙම කුක්කුටාරාමය (කුක්කුට නම් සිටුහු විසින් කරවන ලද හෙයින් එනම්වූ ආරාමය) යම් තැනෙක් හිද, එක්තරා භික්ෂු නමක් යම් තැනෙකද එතනට ගියේය. ගොස් ඒ භික්ෂුවට වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ දසම නම් අට්ඨක නුවර වැසි ගෘහපති තෙම ඒ භික්ෂුවට මෙසේ කීයේය.

“ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙකල්හි වාසය කරන්නේ කොහිද? අපි ඒ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දකිනු කැමැත්තම්හ” (යනුයි.)

"ගෘහපතිය, මේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විශාලාමහනුවර සමීපයෙහිවූ බෙලුවනම් ගමෙහි වැඩවාසය කරති." (කීහ)

**2.** ඉක්බිති දසම නම් අට්ඨක නගර වැසි ගෘහපතිතෙම පැලළුප් නුවර ඒ කටයුත්ත නිමවා විශාලාමහනුවර බෙලුව නම් ගම යම් තැනෙක්හිද ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ එක්පැත්තක උන්නේය. එක පැත්තක හුන්නාවූම දසම නම් අට්ඨක නගරවැසි ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ර්‍යය ඇතිව, හරිනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවගේ කෙලෙසුන් කෙරෙන් නොමිදුනාවූ සිත හෝ මිදේද නැති නොවූ කෙලෙස් හෝ නැති වීමට පැමිණේද, නොපැමිණි නිරුත්තරවූ නිවණට හෝ පැමිණේද එබඳුවූ එකම ධර්මයක් සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකර ඇත්තේද?"

"ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇතිව, හරිනලද ආත්ම ආශා ඇතිව, වාසය කරන්නාවූ භික්ෂුවගේ කෙලෙසුන්ගෙන් නොමිදුනාවූ සිත කෙලෙසුන් ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැතිවීමට යෙද්ද, නොපැමිණියාවූ නිරුත්තරවූ නිවණට පැමිණේද, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනාකරන ලද්දාවූ (එබඳුවූ) ධර්මයක් ඇත්තේ මැයි.

"ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇතිව, හරිනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවගේ නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැතිනොවූ කෙලෙස් නැතිවීමට යෙද්ද, නොපැමිණියාවූ නිරුත්තරවූ නිවණට පැමිණේද, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ

භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කළාවූ එබඳුවූ ඒ එක් ධර්මය නම් කවරේද?"

3. "ගෘහපතිය, යම් ශාසනයෙහි මහණතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරන්නේද, හෙතෙම මෙසේ සලකයි. මේ පළමුවන ධ්‍යානය වනාහි හේතුවෙන් උපදවන ලද්දක්ය. සිතින් උපදවන ලද්දක්ය. යම් කිසිවක් වනාහි හේතුවෙන් උපදවන ලද්දේද, සිතින් උපදවන ලද්දේද එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තේ යයි දැනගනියි. හෙතෙම එහි (ඒ සමථ විදර්ශනා ධර්මයෙහි) සිටියේ කෙලෙස් නැසීමට පැමිණේ. ඉදින් කෙලෙස් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස්වැදෑරුම්වූ ඔරම්භාගියවූ සංයෝජන නැසීමෙන් එහි පිරිනිවෙන සුළුවූයේ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඖපපාතිකවෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව කෙලෙස් තවන වීය්‍යී ඇතිව, හරිනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද නැති නොවූ කෙලෙස් නැතිවීමට යෙද්ද, නොපැමිණියාවූ උතුම්වූ නිවණට පැමිණේද එබඳුවූ මේ එක් ධර්මයද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලදී.

4. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇත්තාවූ හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, හෙතෙම මෙසේ සලකයි. මේ දෙවන ධ්‍යානයද වනාහි ප්‍රත්‍යයෙන් කරන ලද්දක්ය. සිතින් උපදවන ලද්දක්ය. යම් කිසිවක් වනාහි ප්‍රත්‍යයෙන් කරන ලදද සිතින් උපදවන ලදද, එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තක්යයි දැන ගනියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙස් නැසීමට පැමිණෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඉදින් කෙලෙස් නැසීමට නොපැමිණේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස්වැදෑරුම්වූ ඔරම්භාගිය සංයෝජනයත් නැසීමෙන් එහි පිරිනිවෙන සුළුවූයේ, ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුවගේ නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැතිනොවූ කෙලෙස් නැතිවීමට යෙත්ද, නොපැමිණියාවූ නිවණට පැමිණේද, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේද එක් ධර්මයකි.

5. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රීතියෙහිද නො ඇල්මෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයිද, සිහියෙන් යුක්තවූයේ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියද්ද, ඒ තුන්වනධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි. මේ තුන්වන ධ්‍යානයද ප්‍රත්‍යයෙන් කරන ලද්දේය. සිතින් උපදවන ලද්දක්ය. යම් කිසිවක් වනාහි ප්‍රත්‍යයෙන් කරන ලද්දේද, සිතින් උපදවන ලද්දේද, එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තක්යයි දැන ගණියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙස් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස්වැදෑරුම්වූ ඔරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂූහුගේ නොමිදුනාවූම සිතත් කෙලෙසුන් ගෙන් මිදේද නැති නොවූ කෙලෙසුන් නැති වීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණෙද්ද නුවණින් දන්නාවූ නුවණැසින් දක්නාවූ අරහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එක ධර්මයද වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

6. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම සැපද දුරුකිරීමෙන් දුකද දුරු කිරීමෙන් පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිත පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි. මේ සතරවන ධ්‍යානයද රැස්කරන ලද්දක්ය. සිතින් කල්පනා කරන ලද්දක්ය. යම් කිසිවක් වනාහී රැස්කරන ලදද කල්පනා කරනලදද එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තක්යයි දැනගනියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඔරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන්නේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන්ගෙන් නොමිදුනාවූ සිත කෙලෙසුන් ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැතිවීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණෙද්ද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

7. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිසාවද එසේම තුන්වන දිසාවද එසේම සතර වන දිසාවද මෙසේ උඩ යට සරස යන සියළු තන්හි සියල්ලෙහි පැතිරීමෙන් යුත් සියල්ල ඇති ලොකය විපුලවූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූම මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි. මේ මෛත්‍රී සහගත සමාධිය හේතුවෙන් උපදවන ලද්දීය. සිතින් උපදවන ලද්දීය. යම් කිසිවක් වනාහි හේතුවෙන් උපදවන ලදද, එය අනිත්‍යය නැතිවන ස්වභාව ඇත්තක්යයි දැන ගනියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ

ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස්වැදෑරුම්වූ ඔරම්භාගිය සංයෝජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන්ගෙන් නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැතිවීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණේද්ද, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

8 "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම කරුණා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස යන සියලු තන්හි සියල්ලෙහි පැතිර පැවති සියල්ල ඇති ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි. මේ කරුණා සහගත සමාධියද හේතුවෙන් උපදවන ලද්දේය. සිතින් උපදවන ලද්දේය. යමක් හේතුවෙන් උපදවන ලදද, සිතින් උපදවන ලදද එය අනිත්‍යය, නැතිවන ස්වභාව ඇත්තක්යයි දැනගනී. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහි වූ ඇල්මෙන්, ඒ ධර්මයෙහි වූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඔරම්භාගිය සංයෝජනයන් නැතිවීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇතිව, හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන් ගෙන් නොමිදුනාවූම සිත කෙලෙසුන් ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැතිවීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණේද්ද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

**9.** "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවෙනි දිශාවද එසේම තුන්වනදිශාවද එසේම සතරවනදිශාවද මෙසේ උඩයට සරස යන සියලු තන්හි සියල්ලෙහි පැතිර පැවති සියල්ල ඇති ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි, හෙතෙම මෙසේ සලකයි. මේ මුදිතා සහගත සමාධියද හේතුවෙන් උපදවන ලද්දේය. සිතින් උපදවන ලද්දේය. යමක් හේතුවෙන් උපදවන ලදද, සිතින් උපදවන ලදද, එය අනිත්‍යය, නැතිවන ස්වභාව ඇත්තක්යයි දැනගනී. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඔරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන්ගෙන් නොමිදුනා වූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැතිවීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණේද්ද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

**10** "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම උපෙක්ෂා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස යන සියල්ලෙහි සියළු තැන පතලාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ අවෛරවූ නිදුක්වූ උපෙක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි, මේ උපෙක්ෂා සහගත සමාධියද හේතුවෙන් උපදවන ලද්දේය. සිතින් උපදවන ලද්දේය යම් කිසිවක් වනාහි හේතුවෙන් උපදවන ලදද, සිතින් උපදවන ලදද එය අනිත්‍යය නැතිවන ස්වභාව

ඇත්තේයයි දැනගනියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහි වූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහි වූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඕරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන් කෙරෙන් නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැති වීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණෙද්ද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

11. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්ම වීමෙන් ද්වාරඅරමුණු වශයෙන් හැපීම් සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාසනඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයිද, හෙතෙම මෙසේ සිතයි මේ ආකාසනඤ්චායතන සමාපත්තියද හේතුවෙන් උපදවන ලද්දේය. සිතින් උපදවන ලද්දේය. යම් කිසිවක් වනාහී හේතුවෙන් උපදවන ලදද, සිතින් උපදවන ලදද එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තක් යයි දැනගණියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඖරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ය්‍ය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂූහුගේ කෙලෙසුන් කෙරෙන් නොමිදුනාවූම සිත කෙලෙසුන් ගෙන් මිදේද, නැතිනොවූ කෙලෙස් නැතිවීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණෙද්ද, සියල්ල දන්නාවූ සියල්ල

දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

12. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම සියළු ආකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයිද හෙතෙම මෙසේ සලකයි. මේ විඤ්ඤාණඤ්චායතන සමාපත්තියද හේතුවෙන් උපදවන ලද්දේය සිතින් උපදවන ලද්දේය යම් කිසිවක් වනාහී හේතුවෙන් උපදවන ලදද සිතින් උපදවන ලදද එය අනිත්‍යය. නැතිවන ස්වභාව ඇත්තක් යයි දැන ගණියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙසුන් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස් වැදෑරුම් වූ ඔරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව, කෙලෙස් තවන වීය්‍ය්‍යීය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන් ගෙන් නොමිදුනාවූ සිතත් කෙලෙසුන්ගෙන් මිදේද, නැතිනොවූ කෙලෙස් නැති වීමට යද්ද, නොපැමිණියාවූ නිවණටත් පැමිණේද්ද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද්දාවූ මේ එකක්වූ ධර්මයද වෙයි.

13. "ගෘහපතිය, නැවත අනිකක්ද කියමි. මහණතෙම සියළු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සලකයි. මේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියද හේතුවෙන් උපදවන ලද්දේය සිතින් උපදවන ලද්දේය. යම් කිසිවක් වනාහි හේතුවෙන් උපදවන ලදද සිතින් උපදවන ලදද, එය අනිත්‍යය නැතිවන ස්වභාව ඇත්තක්යයි දැන ගනියි. හෙතෙම ඒ ධර්මයෙහි සිටියේ කෙලෙස් නැසීමට පැමිණෙයි. ඉදින් කෙලෙසුන් නැසීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිවූ ඇල්මෙන්ම, ඒ ධර්මයෙහිවූ සතුටින්ම පස්වැදෑරුම්වූ ඔරම්භාගිය සංයොජනයන් නැසීමෙන් එහි පිරිනිවෙන සුලුවූයේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තේ ඕපපාතික වෙයි. ගෘහපතිය, යම් ධර්මයෙක්හි අප්‍රමාදව වීර්‍ය්‍යය ඇතිව හරනලද ආත්ම ආශා ඇතිව වාසය කරන්නාවූ භික්ෂුහුගේ කෙලෙසුන්ගෙන් නොමිදුනාවූම සිත කෙලෙසුන්ගෙන් මිදේද, නැති නොවූ කෙලෙස් නැති වීමට යත්ද, නොපැමිණියාවූ උතුම් නිවණටත් පැමිණේද සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ රහත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද එබඳුවූමේ එකක්වූ ධර්මයද වෙයි.”

14. මෙසේ වදාළ කල්හි අට්ඨක නම් නුවර වැසි දසම නම් ගෘහපතිතෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. “ස්වාමීනි ආනන්ද ස්ථවිරයන් වහන්ස, යම්සේ පුරුෂයෙක්තෙම එක නිධානයක් සොයන්නේ එක වරම නිධාන එකොළොසක් ලබන්නේද, ස්වාමීනි, එපරිද්දෙන්ම මම එක නිවන් දොරටුවක් සොයන්නේ එකවරම නිවන් දොරටු එකොළොසක් ඇසීමට ලදිමි. ස්වාමීනි, යම්සේ පුරුෂයෙකුට දොරටු එකොළොසක් ඇති ගෙයක් වේද, හෙතෙම ඒ ගෙය ඇවිලගත් කල්හි ඒ එක එක දොරටුවකිනුත් තමා සුවපත් කරන්ට හැකිවන්නේද ස්වාමීනි, එපරිද්දෙන්ම මම වනාහි මේ එකොළොස් නිවන් දොරටු අතුරෙන් එක එක නිවන් දොරටුවකිනුත් තමා සුවපත් කරන්නට හැකි වන්නෙමි. ස්වාමීනි, මේ අන්‍යතීර්ථකයෝ නම් ආචාර්‍ය්‍යයාට (ගුරුවරයාට) ආචාර්‍ය්‍ය ධනය සොයන්නාහුය. කිමෙක්ද මම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පූජාවක් නොකරන්නෙම් දැ”යි කීයේය.

15. ඉක්බිති අට්ඨක නුවර වැසි දසම නම් ගෘහපතිතෙම පැළළුප් නුවර වැසිවූද විශාලාමහනුවර වැසිවූද භික්ෂු සංඝයා රැස් කරවා ප්‍රණීතවූ කෑයුතු දෙයින්ද බුදියයුතු දෙයින්ද සියතින් වැළඳවීය. එක එක භික්ෂුවට එක එක වස්ත්‍ර යුග්මයෙන් (දෙක බැගින්) හැඳවීය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුන් සිවුරෙන් හැඳවීය. (පිදීය) ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පන්සියයක් අගනා විහාරයක් කරවූයේය.

**දෙවෙනිවූ අට්ඨකනාගර සූත්‍රය නිමි. (1-2)**

## 3. සෙඛ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි කිඹුල්වත් පුරයෙහිවූ නිග්‍රොධාරාමයෙහි වැඩවාසය කළහ. එකල්හි කිඹුල්වත් පුරවැසි ශාක්‍ය රජුන්ගේ අලුත කරවනලද අලුත්වූ සන්ථාගාරශාලාව මහණෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ මනුෂ්‍යවූ කිසිවෙකු විසින් හෝ වාසය නොකරන ලද්දේ වෙයි. ඉක්බිති කිඹුල්වත් පුරවැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එතැනට ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්හ. එක්පැත්තක හුන්නාවූම කිඹුල්වත් පුරවැසි ශාක්‍යයෝ භාග්‍ය වතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, මෙහි කිඹුල්වත් පුර වැසි ශාක්‍යයන්ගේ අලුත කරවනලද අලුත්වූ සන්ථාගාර ශාලාව මහණෙකු විසින් හෝ බමුණෙකු විසින් හෝ කිසියම් මිනිස්වූවෙකු විසින් හෝ වාසය නොකරන ලද්දේය. ස්වාමීනි එය භාග්‍යවතුන් වහන්සේ පළමුකොට පරිභොග කෙරේවා භාග්‍යවතුන් වහන්සේ විසින් පළමු කොට පරිභොග කරන ලද, ස්නාථාගාර ශාලාව පසුව කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ පරිභොග කරන්නාහුය. එය කිඹුල්වත්පුරවැසි ශාක්‍යයන්ට බොහෝ කලක් හිත පිණිස, සැප පිණිස, වන්නේයයි" (කීහ)

2. භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවීමෙන් ඉවසූහ. එකල්හි කිඹුල්වත් පුරවැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට සන්ථාගාර ශාලාව යම් තැනකද එහි ගියහ. ගොස් සන්ථාගාර ශාලාව සියළු තන්හි ඇතිරිලි අතුරා ආසන පනවා දියසැලක් තබා තෙල් පහණක් දල්වා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක සිටියාහුය. එක් පැත්තක සිටියාවූම කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය. "ස්වාමීනි, සන්ථාගාර ශාලාව සියළු තන්හි ඇතිරිලි අතුරණලදී. ආසන පනවන ලදී. දිය සැලක් තබන ලදී. තෙල්

පහණ දල්වන ලද්දේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ දැන් එහි වැඩම වීමට සුදුසු කල්වේයයි දන්නාසේක්වා”යි (කීහ.)

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ හැඳ පෙරවා පාසිවුරු ගෙණ භික්ෂු සංඝයා සමග සන්ථාගාර ශාලාව යම් තැනකද එතැනට වැඩියහ. වැඩ පා සෝදා සන්ථාගාර ශාලාවට ඇතුල්ව එහි මැද කණුවට පිටදී පෙරදිගට මුහුණලා වැඩහුන්හ. භික්ෂු සංඝතෙමේද පා සෝදා සන්ථාගාර ශාලාවට ඇතුල්ව බටහිර දිගවූ භිත්තියට පිටදී පෙර දිගට මුහුණලා භාග්‍යවතුන් වහන්සේම ඉදිරියෙහි කොට වැඩහුන්හ. කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝද පා සෝදා සන්ථාගාර ශාලාවට ඇතුල්ව පෙරදිගවූ භිත්තියට පිටදී බටහිර දිගට මුහුණලා භාග්‍යවතුන් වහන්සේම ඉදිරියෙහි කොට හුන්නාහුය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත් පුරවැසි ශාක්‍යයන් රාත්‍රි බොහෝ වේලාවක්ම දැහැමි කථාවෙන් කරුණු දක්වා සමාදන් කරවා මනාව උත්සාහවත් කරවා සතුටු කරවා ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීහ. “ආනන්දය, කිඹුල්වත්පුර වැසි ශාක්‍ය රජ දරුවන්ට ශෛක්ෂවූ ප්‍රතිපදාව කියව මාගේ පිට රුජා කෙරෙයි. එහෙයින් මම දිග හැරෙන්නෙමි” යි (කීහ) “එසේය ස්වාමීනි”යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දෙපට සිවුර හතරට නමා අතුරා දකුණු ඇලයෙන් දකුණු පයෙහි වම්පය මදක් ඉක්මවා තබා සිහිනුවණ ඇත්තේ නැගිටිමි යන සංඥාව ඇතිව සිංහ සෙය්‍යාවෙන් සයනය කළහ.

4. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මහානාම ශාක්‍ය රජුට මෙසේ කීහ. “මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සීලයෙන් යුක්තවූයේ වෙයිද, ඉන්ද්‍රියන්හි වැසූ දොරටු ඇත්තේ වෙයිද, භොජනයෙහි පමණ දන්නේ වෙයිද, නිදි දුරුකිරීමෙහි යෙදුනේ වෙයිද, සත්වැදෑරුම්වූ සද්ධර්මයන් ගෙන් යුක්තවූයේ වෙයිද, ශ්‍රෙෂ්ඨ සිත ඇසුරුකළාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සිවු වැදෑරුම් ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේ වෙයි, සුවසේ ලබන්නේ වෙයි, මහත් වශයෙන් ලබන්නේ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම කෙසේ නම් සීලයෙන් යුක්තවූයේ වෙයිද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සිල් ඇත්තේවෙයිද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරවූයේ වේද, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තවූයේ සුළුවූද වරදෙහි භය දක්නා සුළුවූයේ වාසයකරයිද, සමාදන්ව ශික්ෂා පදයන්හි හික්මෙයිද, මහානාමය, මෙසේ වනාහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සීලයෙන් යුක්තවූයේ වෙයි.

6. "මහානාමය, කෙසේ නම් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ඉන්ද්‍රියයන්හි වසනලද දොරටු ඇත්තේවේද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ඇසින් රූපයක් දැක නිමිති වසයෙන් නොගනීද නැවත නැවත මතක්වන සේ සිතට නොගනීද යමක් හේතුකොට ගෙන මේ ඇසෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ පහළවන්නාහුද ඒ ඇස සංවරය පිණිස පිළිපදියිද, ඇස රකියිද, ඇසෙහි සංවරයට පැමිණෙයිද, කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් නොගනීද, නැවත නැවත මතක් වනසේ සිතට නොගනීද, යමක් හේතු කොට ගෙන සොතෙන්ද්‍රියය (කණ) අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද එහි සංවරය පිණිස පිළිපදියිද, සොත ඉන්ද්‍රිය රකීද, සොත ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද.

7. "නාසයෙන් ගඳක් ආඝ්‍රාණයකොට එය නිමිති වශයෙන් නොගනීද, එය නැවත නැවත මතක්වනසේ සිතට නොගනීද, යමක් හේතුකොට ගෙන ඝ්‍රාණ ඉන්ද්‍රියය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද, එහි සංවරය පිණිස පිළිපදියිද, ඝ්‍රාණ ඉන්ද්‍රියය රකියිද, ඝ්‍රාණ ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද.

8. "දිවෙන් රසයක් විඳ එය නිමිති වශයෙන් නොගනීද, නැවත නැවත මතක් වනසේ සිතට නොගනීද, යමක් හේතු කොටගෙන ජිව්හා ඉන්ද්‍රිය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ, උපදිද්ද එහි සංවරය පිණිස පිළිපදියිද, ජිව්හා ඉන්ද්‍රියය රකියිද, ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද.

9. "කයින් පහසක් ස්පර්ශ කොට එය නිමිති වශයෙන් නොගනීද, නැවත නැවත මතක් වනසේ සිතට නොගනීද, යමක් හේතු කොටගෙන කාය ඉන්ද්‍රිය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද, එහි සංවරය පිණිස පිළිපදියිද, කාය ඉන්ද්‍රිය රකියිද, කාය ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද.

10. "සිතින් ධර්මාරමුණු දැන නිමිති වශයෙන් නොගනීද නැවත නැවත මතක්වනසේ සිතට නොගනීද, යම් හේතුවකින් මේ මනින්ද්‍රියෙහි (හිතෙහි) සංවර රහිතව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද, එහි සංවරය පිණිස පිළිපදියිද, මනින්ද්‍රිය රකියිද, මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයිද, මහානාමය, මෙසේ වනාහී ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඉන්ද්‍රියයන්හි වසන ලද දොරටු ඇත්තේ වෙයි.

11 "මහානාමය, කෙසේ නම් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම භොජනයෙහි පමණ දන්නේවේද, මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නුවණින් සලකා ආහාරය ගනියිද, ක්‍රීඩා පිණිස නොම ගනියිද, මද පිණිස නොගනියිද, අලංකාරය පිණිස නොගනියිද, යම්තාක්ම මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස ශරීර පීඩා වැලැක්ම පිණිස බ්‍රහ්මචර්‍ය්‍යයට අනුග්‍රහය පිණිස (ගනියිද) මෙසේ පුරාණවූ (බඩගිනි) වේදනාවද නසමි. අළුත්වූ වේදනාවද නූපදවන්නෙමි. මාගේ ජීවිතය පැවැත්වීමද, වැරදි නැති බවද පහසු විහරණයද වන්නේය යයි ආහාර ගනියිද, මහානාමය, මෙසේ වනාහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම භොජනයෙහි පමණ දන්නේ වෙයි,

12 "මහානාමය, කෙසේ නම් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම නිදි දුරු කිරීමෙහි යෙදුනේ වේද, මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම (දාවල්) දවස සක්මනින්ද හිඳීමෙන්ද ආවරණය කටයුතු ධර්මයන්ගෙන් සිතපිරිසිදු කරයිද, රාත්‍රියේ ප්‍රථමයාමය සක්මනින්ද, හිඳීමෙන්ද ආවරණය කටයුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයිද, රාත්‍රියේ මධ්‍යම යාමයෙහි දකුණු පයෙහි වම්පස මදක් ඉක්මවා තබා සිහි ඇත්තේ නුවණ ඇත්තේ නැගිටිමි යන

සංඥාව ඇතිව දකුණු ඇලයෙන් සයනයකරයිද, රාත්‍රියේ අවසාන යාමයේ සයනයෙන් නැගිට සක්මනින්ද, හිඳීමෙන්ද ආවරණය කටයුතු ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරයිද, මහානාමය, මෙසේ වනාහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නිදි දුරුකිරීමෙහි යෙදුනේ වෙයි.

13. "මහානාමය, කෙසේ නම් ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සත් වැදෑරුම් වූ යහපත් ධර්මයන්ගෙන් යුක්තවූයේ වේද, මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ශ්‍රද්ධා ඇත්තේ වෙයිද, තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය අදහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුත් අර්හත්‍ය, සම්‍යක් සම්බුද්ධය, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, නිරුත්තරය, පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙකු බඳුය. දෙවි මිනිසුන්ට ශාස්තෘය බුද්ධය භාග්‍යවත්යයි අදහයිද, ලජ්ජා ඇත්තේ වෙයිද, කාය දුශ්චරිතයට, වාග් දුශ්චරිතයට, මනො දුශ්චරියට ලජ්ජා වෙයිද. (පිළිකුල් කෙරෙයිද) ලාමකවූ අකුසල ධර්මයන්ගේ පැමිණීමට ලජ්ජා වෙයිද, පවට භය ඇත්තේ වෙයිද, කාය දුශ්චරිතයටද, වාග් දුශ්චරිතයටද, මනො දුශ්චරිතයටද භයවෙයිද ලාමකවූ අකුශල ධර්මයන්ට භයවෙයිද ඇසූ ධර්මයන් දරන්නේ ඇසූ ධර්මයන්ගේ රැස්කිරීම ඇත්තේ බොහෝ ඇසූ පිරූතැන් (උගත්කම) ඇත්තේ වෙයිද, යම් මේ ධර්මකෙනෙක් මුල යහපත්ද, මැද යහපත්ද, කෙළවර යහපත්ද අර්ථ සහිත වෙත්ද, ව්‍යඤ්ජන සහිත වෙත්ද, සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ ධර්මයෝ මොහු විසින් බොහෝ කොට අසන ලද්දාහු දරණ ලද්දාහු වචනයෙන් පුරුදු කරන ලද්දාහු සිතින් සලකන ලද්දාහු නුවණින් මනාව අවබොධ කරන ලද්දාහු වෙත්ද, අකුසලධර්මයන්ගේ දුරුකිරීම පිණිසද කුසලධර්මයන්ගේ ලැබීම පිණිසද ශක්ති ඇත්තේ මහත් වීර්‍ය්‍ය ඇත්තේ කුසල ධර්මයන්හි බහා නොතබන ලද වීර්‍ය්‍ය ඇත්තේ පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තේ වාසය කරයිද උතුම්වූ සිහියෙන් හා දක්ෂ නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ වෙයිද, බොහෝ කලකට පෙර කරන ලද්දද බොහෝ කලකට පෙර කියන ලද්දද සිහි කරන්නේ නැවත නැවත සිහි කරන්නේ වෙයිද, කලකිරීම පිණිස පවත්නාවූ මනාව දුක් නැති කිරීම පිණිස පවත්නාවූ

විදර්ශනා නුවණින් යුක්තවූයේ ආර්‍යවූ ප්‍රඥා ඇත්තේ වෙයිද, මහානාමය, මෙසේවනාහි ආර්‍ය ශ්‍රාවක තෙම සත් වැදෑරුම්වූ යහපත් ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි.

14. "මහානාමය, කෙසේ නම් ආර්‍ය ශ්‍රාවකතෙම ශ්‍රේෂ්ඨ සිත ඇසුරු කළාවූ මේ ආත්මයෙහි සැප සේ වාසය කිරීමවූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේද, සුවසේ ලබන්නේද, මහත්සේ ලබන්නේ වේද? මහානාමය, මේ ශාසනයෙහි ආර්‍ය ශ්‍රාවකතෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇත්තාවූ හිතේ එකඟබව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවනධ්‍යානයට පැමිණ වාසය කරයිද, ප්‍රීතියෙහිද නො ඇල්මෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්තවූයේ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇති සැප විහරණ ඇත්තේ යයි ආර්‍යයෝ කියද්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, සැපය දුරු කිරීමෙන්ද දුක දුරු කිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මහානාමය, මෙසේ වනාහී ආර්‍ය ශ්‍රාවක තෙම ශ්‍රේෂ්ඨ සිත ඇසුරු කළාවූ මේ ආත්මයෙහි සැපසේ වසන්නාවූ සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේ වෙයි. සුවසේ ලබන්නේ වෙයි. මහත්සේ ලබන්නේ වෙයි.

15. "මහානාමය, යම් හේතුවකින් වනාහි ආර්‍යශ්‍රාවකතෙම මෙසේ සීලයෙන් යුක්තවූයේ වේද, මෙසේ ඉන්ද්‍රියන්හි රක්නා ලද දොරටු ඇත්තේවේද, මෙසේ භොජනයෙහි පමණ දන්නේ වේද, මෙසේ නිදි දුරු කිරීමෙහි යෙදුනේ වේද, මෙසේ සත් වැදෑරුම්වූ යහපත් ධර්මයන්ගෙන් යුක්ත වූයේ වේද, මෙසේ ශ්‍රේෂ්ඨ සිත ඇසුරු කළාවූ මේ ආත්මයෙහි සැපසේ වසන්නාවූ

සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේද සුවසේ ලබන්නේද මහත්සේ ලබන්නේද වෙයි.

"මහානාමය, මේ ආයුෂ්මත් ශ්‍රාවකතෙම ශෛක්ෂවූ ප්‍රතිපදා ඇත්තේ කුණු නොවූ බිජුවට බවට පැමිණියේ විනිවිද දැකීමට සුදුසු වූයේ අවබොධයට සුදුසුවූයේ නිරුත්තරවූ රහත්බව ලැබීමට සුදුසුවූයේ වේයයි කියනු ලැබේ.

16. "මහානාමය, යම්සේ කිකිළියගේ බිජුවට අටක් හෝ දසයක් හෝ දොළසක් හෝ වෙත්ද ඒ බිජුවට මව් කිකිලිය විසින් හොඳින් රකින ලද්දාහු හොඳින් උණුසුම් කරන ලද්දාහු හොඳින් කුකුල් ගඳ ගන්වන ලද්දාහු වන්නාහුද කිසිසේත් ඒ කිකිළියට මෙබඳු කැමැත්තක් නූපදින්නේය. 'මේ කුකුළු පැටව් පා නියතුඩින් හෝ මුව තුඩින් හෝ බිත්තර කටුව බිඳ සුවසේ නික්මෙන්නාහු නම් ඉතා යෙහෙකැ'යි (කියාය) එත කුඩු වුවත් ඒ කුකුළු පැටව් පා නියතුඩින් හෝ මුවතුඩින් හෝ බිත්තර කටුව බිඳගෙන සුවසේ නික්මෙන්ට සුදුසුවූවාහුම වෙත්ද, මහානාමය, මෙපරිද්දෙන්ම යම් හෙයකින් ආයුෂ්මත් ශ්‍රාවක තෙම මෙසේ ශීලයෙන් යුක්තවූයේ වේද, මෙසේ ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තේ වේද මෙසේ භොජනයෙහි පමණ දන්නේ වේද මෙසේ නිදි දුරු කිරීමෙහි යෙදුනේ වේද, මෙසේ සත්වැදෑරුම් යහපත් ධර්මයන්ගෙන් යුක්තවූයේ වේද, මෙසේ ශ්‍රේෂ්ඨ සිත ඇසුරු කළාවූ මේ ආත්මයෙහි සැප විහරණවූ සතර ධ්‍යානයන් කැමති පරිදි පැමිණීම සුවසේ ලැබීම මහත්සේ ලැබීම ඇත්තේ වේද, මහානාමය, මේ ආයුෂ්මත් ශ්‍රාවකතෙම ශෛක්ෂවූ ප්‍රතිපදා ඇත්තේ කුණු නොවූ බිජුවට බවට පැමිණියේ විනිවිද දැකීමට සුදුසු වූයේ මාර්ගඵල අවබොධයට සුදුසු වූයේ නිරුත්තරවූ අර්හත් ඵලය ලැබීමට සුදුසු වූයේ වේයයි කියනු ලැබේ.

17. "මහානාමය, ඒ මේ ආයුෂ්මත් ශ්‍රාවකතෙම් වනාහි මේ නිරුත්තරවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බවට පැමිණ අනෙක ප්‍රකාරවූ පෙර විසූ තැන් සිහි කරයි. එනම් එක ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුණක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති

දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද ජාති සියක් දහසක්ද නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද නොයෙක් විනාශ වන හෝ හැදෙන කල්පයන්ද අසුවල් තැන වීමි, මේ නම් ඇත්තෙම් මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම් මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන උපන්නෙමි. එහිදු මෙනම් ඇත්තෙම් මේ ගොත්‍ර ඇත්තෙම් මේ පාට ඇත්තෙම් මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමියි. මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ නොයෙක් ආකාරවූ පෙර ජාති සිහි කරයි. කුකුළු පැටවෙකුගේ බිත්තර කටුව බිඳගෙන නික්මීම වැනිවූ මේ මොහුගේ පළමුවන විනිවිද දැකීම වන්නේය.

18. "මහානාමය, ඒ මේ ආයර්‍ය ශ්‍රාවක තෙම වනාහී මේ නිරුත්තරවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බවට පැමිණ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද, පහත්වූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද යහපත් ගති ඇත්තාවූ අයහපත් ගති ඇත්තාවූද කර්මය අනුව උපදින සත්වයන් දකී. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ. වාග් දුශ්චරිතයෙන් යුක්ත වූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආයර්‍යයන් ගරහන්නෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූහ. වාග් සුචරිතයෙන් යුක්ත වූහ. මනො සුචරිතයෙන් යුක්ත වූහ. ආයර්‍යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍යය අදහන්නෝ වූහ. සත්‍ය ඇදහීම් සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයට පැමිණියෝයි. මෙසේ මිනිස් ඇස ඉක්මවූ පිරිසිදුවූ දිව ඇසින් චුතවන්නාවූද උපදින්නාවූද පහත්වූද

උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද, නරක ලොවට ගියාවූද කර්මය ලෙස පැමිණ සත්වයන්දකී. කර්මවූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැනගණියි. මේ මොහුගේ කුකුළු පැටවෙකුගේ බිත්තරය බිඳ නික්මීම වැනිවූ දෙවන විනිවිද දැකීම වන්නේ වේ.

19. "මහානාමය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම වනාහී මේ නිරුත්තරවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බවට පැමිණ කෙලෙස් නැසීමෙන් කෙලෙස් රහිතවූ චිත්ත විමුක්තියටද ප්‍රඥාවිමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි. මේ මොහුගේ කුකුළු පැටවෙකුගේ බිජුවට බිඳ නික්මීම වැනිවූ තුන්වන විනිවිද දැකීම වන්නේවේ.

20. "මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සීලසම්පන්න වෙයි යන යමක් වේද, මෙයද මොහුගේ චරණය වෙයි. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ඉන්ද්‍රියන්හි රක්නාලද දොරටු ඇත්තේ වෙයි, යන යමක් වේද මෙයද මොහුගේ චරණය වෙයි. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම භොජනයෙහි පමණ දන්නේ වෙයි යන යමක් වේද, මෙයද මොහුගේ චරණය වෙයි. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නිදි දුරු කිරීමෙහි යෙදුනේ වෙයි යන යමක් වේද, මෙයද මොහුගේ චරණය වෙයි.

"මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සත්වැදෑරුම්වූ යහපත් ධර්මයන් ගෙන් යුක්තවූයේ වෙයි යන යමක් වේද මෙයද මොහුගේ චරණය වෙයි. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම ශ්‍රෙෂ්ඨ සිත ඇසුරුකළාවූ මේ ආත්මයෙහි සැප විහරණය වන සතර ධ්‍යානයන් කැමති පරිදි ලබන්නේ සුවසේ ලබන්නේ මහත් සේ ලබන්නේ වෙයි යන යමක් වේද මෙයද මොහුගේ චරණය වෙයි.

21. මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම නොයෙක් ආකාරවූ පෙර විසූ තැන් සිහි කරයි. එනම් එක ජාතියක්ද, ජාති දෙකක්ද ජාති තුණක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් විනාශ

වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද නොයෙක් විනාශවන හෝ හැදෙන ක්ලපයන්ද, අසුවල් තැනවීමි. මෙනම් ඇත්තෙම් මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම් මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන උපන්නෙමි. එහිදු මෙනම් ඇත්තෙම් මේ ගොත්‍ර ඇත්තෙම් මේ පාට ඇත්තෙම් මේ කෑම ඇත්තෙම් මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමියි. මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ නොයෙක් ආකාරවූ පෙර විසුතැන් සිහිකරයි, යන යමක් වේද මෙයද මොහුගේ විද්‍යාව (ඥාණය) වෙයි.

22. "මහානාමය, ආයර්‍ය ශ්‍රාවකතෙම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් චුතවන්නාවූද උපන්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද කර්මයට අනුව උපදින සත්වයන් දකී. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ. වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආයර්‍යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යා දෘෂ්ටි කර්මසමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත් නැතහොත්, මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ. වාග් සුචරිතයෙන් යුක්තවූහ. මනො සුචරිතයෙන් යුක්ත වූහ. ආයර්‍යයන්ට නොගරහන්නෝවූහ. සත්‍යය අදහන්නෝවූහ. සත්‍ය ඇදහීම් සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයට පැමිණියෝයි. මෙසේ මිනිස් ඇස ඉක්මවූ පිරිසිදුවූ දිව ඇසින් චුත වන්නාවූද, උපදින්නාවූද, පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොවට ගියාවූද, නරක ලොටව ගියාවූද, කර්මය ලෙස පැමිණි සත්වයන් දකී. මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ නොයෙක් ආකාරවූ පෙර විසූ තැන් සිහිකරයි, යන යමක් ඇද්ද මෙයද මොහුගේ වීද්‍යාව (ඥාණය) වෙයි.

23. "මහානාමය, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම කෙලෙසේ නැසීමෙන් කෙලෙස් රහිතවූ චිත්තවිමුක්තියටද ප්‍රඥාවිමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි, යන යමක් ඇද්ද මෙයද මොහුගේ විද්‍යාව වෙයි.

"මහානාමය, මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ විද්‍යාවන්ගෙන් යුක්ත වූයේයයිද, චරණයන්ගෙන් යුක්ත වූයේයයිද, විද්‍යා චරණයන් ගෙන් යුක්ත වූයේයයිද කියනු ලැබේ.

24. "මහානාමය, සනත් කුමාරනම්වූ බ්‍රහ්මයා විසින්ද මේ ගාථාව කියන ලද්දීය.

> "ජන සමූහයා අතර ගොත්‍රය සිහිපත් කරවන්නාවූ යම් කෙනෙක් වෙත්ද, ඔවුන් අතුරෙන් ක්ෂත්‍රිය ගොත්‍ර ඇත්තේ ශ්‍රෙෂ්ඨ වෙයි. අෂ්ට විද්‍යාවන්ගෙන් හා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ යමෙක් වේද, දෙව් මිනිසුන් කෙරෙහි හෙතෙම ශ්‍රෙෂ්ඨ වේ" යනුයි.

"මහානාමය, ඒ මේ ගාථාව වනාහි සනත් කුමාරනම්වූ බ්‍රහ්මයා විසින් මනාකොට කියන ලද්දීය. නපුරු කොට කියන ලද්දී නොවේ. යහපත් කොට කියනලද්දීය. අයහපත් කොට කියන ලද්දී නොවේ. අර්ථයෙන් යුක්ත වූයේය. අනර්ථයෙන් යුක්තවූවක් නොවේ. භාග්‍යවතුන් වහන්සේ විසින්ද අනුමත කරන ලද්දීයයි" වදාළහ.

එකල්හි වනාහී භාග්‍යවතුන් වහන්සේ නැගිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථා කළහ. "ආනන්දය, යහපත යහපත, ආනන්දය, නුඹ යහපත් කොටම කිඹුල්වත් පුරවැසි ශාක්‍ය රජ දරුවන්ට ශෛක්ෂ්‍ය ප්‍රතිපදාව කීයෙහිය"යි වදාළහ.

ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ. ශාස්තෲන් වහන්සේ එය අනුමත කළහ. සතුටුසිත් ඇත්තාවූ කිඹුල්වත්පුර වැසි ශාක්‍යයෝ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තාහුය.

**තුන්වෙනිවූ සෙඛ සූත්‍රය නිමි. (1-3)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 4. පොතලිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන්වහන්සේ අංගුත්තරාප නම් ජනපදයෙහි අංගුත්තරාප නම් දනව් වැස්සන්ගේ ආපණ නම් නියම් ගමෙහි වැඩ වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳපෙරවා පාසිවුරු ගෙන ආපන නම් නියම් ගමට පිඩු පිණිස වැඩියහ. ආපණ නම් නියම් ගමෙහි පිඩු පිණිස හැසිර බතින් පසු කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ එක්තරා වන ලැහැබක් යම් තැනෙක්හිද එතැනට දිවා විහරණය (දවල් විවේකය) පිණිස වැඩියහ.

2. ඒ වන ලැහැබට ඇතුල්ව එක්තරා ගසක්මුල දිවා විහරණය සඳහා වැඩහුන්හ. පොතලිය නම් ගෘහපතිතෙමේද සම්පූර්ණ හැඳීම් පෙරවීම් ඇත්තේ කුඩයෙන් හා පාවහන් වලින් යුක්තව පා ගමනින් සක්මන් කරන්නේ ඒ වනලැහැබ යම් තැනෙක්හිද එතැනට ගියේය. ඒ වන ලැහැබට ඇතුල්ව භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය.

3. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතු වූ සිහි කටයුතු වූ කථාව කොට නිමවා එක් පැත්තක සිටියේය. එක් පැත්තක සිටියාවූම පොතලිය ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ "ගෘහපතිය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් ඉඳ ගනුව"යි කීහ. මෙසේ කී කල්හි පොතලිය ගෘහපති තෙම "මට ශ්‍රමණ ගෞතමතෙම ගෘහපති වාදයෙන් (ගෘහපතියාය කීමෙන්) කථා කරයි" කියා කිපුනේ නොසතුටු සිත් ඇත්තේ නිශ්ශබ්ද වූයේය. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ පොතලිය ගෘහපතියාට මෙසේ කීහ. "ගෘහපතිය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් ඉඳ ගනුව"යි කීහ. දෙවනුවද පොතලිය ගෘහපතිතෙම මට ශ්‍රමණ ගෞතම තෙම ගෘහපති වාදයෙන් කථාකරන්නේය"යි කිපුනේ නො සතුටු සිත් ඇත්තේ නිශ්ශබ්ද වූයේය. තුන් වෙනුවද භාග්‍යවතුන් වහන්සේ පොතලිය නම් ගෘහපතියාට මෙසේ කීහ. "ගෘහපතිය, ආසන ඇත්තාහ,

ඉදින් කැමැත්තෙහි නම් ඉඳ ගනුව" මෙසේ කීකල්හි පොතලිය නම් ගෘහපති තෙම මට ශ්‍රමණ ගෞතම තෙම ගෘහපති වාදයෙන් කථා කරන්නේය"යි කිපුනේ නො සතුටු සිත් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේට, "භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ මට ගෘහපති වාදයෙන් කථා කෙරෙහිය යන යමක් වේද ඒ මේ කාරණය නුසුදුසුය, ඒ මේ කාරණය නොගැලපේ"යයි කීය.

4 "ගෘහපතිය, තොපගේ ආකාරයද, සටහණද ලකුණුද ගෘහ පතියෙකුගේ මෙනි."

"භවත් ගෞතමයන් වහන්ස, එසේද වුවත් මා විසින් සියළු කර්මාන්තයෝ අත්හරින ලද්දාහ. සියළු ව්‍යවහාරයෝ (වෙළ හෙළඳාම්) සිඳ දමන ලද්දාහ."

"ගෘහපතිය, කෙසේ නම් තා විසින් සියළු කර්මාන්තයෝ අත්හරින ලද්දාහුද? සියලු ව්‍යවහාරයෝ (වෙළහෙළඳාම්) සිඳ දමන ලද්දාහුද?"

"භවත් ගෞතමයන් වහන්ස, මෙහි මාගේ ධනයක් හෝ ධාන්‍යයක් හෝ රිදීවූවක් හෝ රත්‍රන් වූවක් හෝ යමක් ඇද්ද ඒ සියල්ල පුත්‍රයන්ට දායාද කොට පාවා දෙන ලදී. එහි මම මෙසේ කරවයි, අවවාද නොකරන්නෙම් නම් මෙසේ නොකරවයි නැවත නොකියන්නෙම් නම් කෑම ඇඳීම ලැබීම පමණක් ඇත්තේ වාසය කරමි. භවත් ගෞතමයන් වහන්ස, මෙසේ වනාහි මා විසින් සියළු කර්මාන්තයෝ අත්හැරීම කරන ලද්දාහ. සියළු ව්‍යවහාරයෝ (වෙළ හෙළඳාම්) සිඳ දමන ලද්දාහ"යි කීයේය. "ගෘහපතිය, නුඹ කියන ව්‍යවහාර සිඳීම වෙන ආකාරයකින් වේ, ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාරයන්ගේ සිඳීම වෙන ආකාරයකින් වේ."

"ස්වාමීනි, කෙසේ නම් ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාරයන්ගේ සිඳීම වේද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම්සේ ආර්‍ය්‍ය විනයයෙහි ව්‍යවහාරයන්ගේ සිඳීම වේද, මට එසේ ධර්මය දෙශනා කරත්වා"යි (ඉල්ලාසිටියේය.)

"ගෘහපතිය, එසේ නම් අසව, යහපත් කොට මෙනෙහි කරව. කියන්නෙමි"යි, වදාළහ. "ස්වාමීනි, එසේය"යි කියා පොතලිය ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය ප්‍රකාශ කළහ.

**5.** "ගෘහපතිය, මේ ධර්ම අටක් ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සිඳීම පිණිස පවතිත්, කවර අටක්ද යත්: සතුන් නොමැරීම නිසා සතුන් මැරීම දුරුකටයුතුය, දුන්දෙය ගැනීම නිසා නුදුන්දෙය ගැනීම දුරුකටයුතුය, ඇත්තකීම නිසා බොරු කීම දුරුකටයුතුය, කේලාම් නොකීම නිසා කේලාම් කීම දුරු කටයුතුය, ගිජුවීමයයි කියන ලද ලොභය නොකිරීම නිසා ගිජුවීමයයි කියන ලද ලොභය දුරුකටයුතුය, නින්දා කිරීමෙන් නොගැටීම නිසා නින්දා කිරීමෙන් ගැටීම දුරු කටයුතුය, ක්‍රොධයවූ දැඩි වෙහෙස නොකිරීම නිසා ක්‍රොධය වූ දැඩි වෙහෙස දුරු කටයුතුය, අධික මානය නොකිරීම නිසා අධික මානය දුරු කටයුතුය. ගෘහපතිය, සංක්ෂෙපයෙන් කියන ලද විස්තර වසයෙන් විභාග නොකරන ලද මේ ධර්ම අට ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සිඳීම පිණිස පවතිත්" යයි වදාළහ.

**6.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් යම් මේ ධර්ම අටක් සංක්ෂෙපයෙන් කියන ලද්දාහු විස්තර වශයෙන් විභාග නොකරන ලද්දාහු ආර්‍ය්‍ය විනයෙහි ව්‍යවහාර සමුච්ඡෙදය පිණිස පවතිත්ද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මේ ධර්ම අට මට අනුකම්පා පිණිස විස්තර වසයෙන් විභාග කෙරෙත්වා"යි කීයේය.

"ගෘහපතිය, එසේ වීනම් අසව, යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමි"යි වදාළහ. "ස්වාමීනි, එසේය"යි කියා පොතලිය ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

**7.** "ප්‍රාණඝාත නොකිරීම නිසා ප්‍රාණඝාතය දුරුකටයුතු යයි, මෙසේ වනාහී මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. යම් සංයෝජන කෙනෙකුන්ගේ හේතුවෙන් මම

ප්‍රාණඝාත කරන්නෙක් වන්නෙම්ද ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස මම පිළිපන්නෙක් වෙමි. මමද වනාහි ප්‍රාණඝාත කරන්නෙක් වන්නෙම් නම් තෙමේද තම හට ප්‍රාණඝාත කිරීම නිසා ගරහන්නේය. දැන ගෙණ නුවණැත්තෝද, ප්‍රාණඝාතය නිසා ගරහන්නාහුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි ප්‍රාණඝාත හේතුවෙන් දුර්ගතියද කැමති විය යුත්තීය. යම් මේ ප්‍රාණඝාතයක් වේද, එයම සංයෝජනය වෙයි, එයම නීවරණයද වෙයි, දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් ප්‍රාණඝාත හේතුවෙන් උපදින්නාහුද, ප්‍රාණඝාතයෙන් වැළකුනාවූ මොහුට මෙසේ ඒ දුක්වූ දැවිලි ඇති ආශ්‍රවයෝද නොවෙත්. ප්‍රාණඝාත නොකිරීම නිසා ප්‍රාණඝාතය දුරුකටයුතුයි යන ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

8. "දුන්දෙය ගැනීම නිසා නුදුන් දෙය ගැනීම දුරුකට යුතුයයි මෙසේ වනාහී මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකන්නේය. යම් සංයෝජන කෙනෙකුන්ගේ හේතුවෙන් මම නුදුන් දෙය ගන්නෙක් වන්නෙම්ද මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නෙක් වෙමි. මමද වනාහී නුදුන් දෙය ගන්නෙක් වීනම් තමාද තමහට නුදුන් දෙය ගැනීම නිසා ගරහන්නේය. නුදුන් දෙය ගැනීම නිසා නුවණැත්තෝද දැන ගෙන ගරහන්නාහුය. නුදුන් දෙය ගැනීම නිසා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු දුර්ගතියද කැමතිවිය යුත්තීය. යම් මේ නුදුන් දෙය ගැණීමක්වේද එයම සංයෝජනයද වේ. එයම නීවරණයද වේ. නුදුන් දෙය ගැනීම නිසා දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහුද නුදුන් දෙය ගැනීමෙන් වැලකුණාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝද නො වෙත්. දුන් දෙය ගැනීම නිසා නුදුන් දෙය ගැනීම දුරුකටයුතුයයි මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

9. "සත්‍යවූ වචනය නිසා බොරු කීම දුරුකට යුතුයයි මෙසේ මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ

සලකන්නේය. මම වනාහි යම් සංයොජන කෙනෙකුන්ගේ හේතුවෙන් බොරු කියන්නෙක් වන්නෙම්ද මම ඒ සංයොජනයන්ගේ දුරු කිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහි බොරු කියන්නෙක් වන්නෙම් නම් තමාද තමහට බොරුකීම නිසා ගරහන්නේය. නුවණැත්තෝද දැනගෙන බොරු කීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බොරු කීම හේතු කොට දූර්ගතිය කැමතිවිය යුත්තීය. යම් මේ මුසාවාදයක්වේද එයම සංයොජනය වේ. එයම නීවරණයද වේ. මුසාවාද හේතුවෙන් දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහුද මුසාවාදයෙන් වැලකුනාවූ මොහුට මෙසේ ඒ දුක්වූ දැවිලි ඇති ආශ්‍රවයෝද නො වෙත්. සත්‍යවූ වචනය නිසා මුසාවාදය දුරුකට යුතුයයි, මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදි.

10. "කේලාම් නොකීම නිසා කේලාම් කීම දුරුකට යුතුයයි මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකන්නේය. මම වනාහි යම් සංයොජන කෙනෙකුන්ගේ හේතුවෙන් කේලාම් කියන්නෙක් වන්නෙම්ද මම ඒ සංයොජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහී කේලාම් කියන්නෙක් වන්නෙම් නම් තමාද තමහට කේලාම් කීම හේතු කොට ගරහන්නේය. නුවණැත්තෝද දැන ගෙණ කේලාම් කීම හේතු කොට ගරහන්නා හුය. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි කේලාම් කීම හේතු කොට දුර්ගතිය කැමතිවිය යුත්තීය. යම් මේ කේලාම් කීමක් වේද එයම සංයොජනයවෙයි. එයම නීවරණයද වේ. කේලාම් කීම හේතු කොට දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහුද කේලාම් කීමෙන් වැලකුනාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝද නොවෙත් කේලාම් නොකීම නිසා කේලාම් කීම දුරුකට යුතුයයි මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

11. "ලොභයෙන් ගිජුවීම නිසා ලොභයෙන් ගිජුවීම දුරු කටයුතු යයි, මෙසේ මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන

ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකන්නේය. මම වනාහි යම් සංයොජන කෙනෙකුන්ගේ හේතුවෙන් ලොභයෙන් ගිජුවීම ඇත්තෙක් වන්නෙම්ද මම ඒ සංයොජනයන්ගේ දුරු කිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහි ලොභයෙන් ගිජු වන්නෙම් නම් තමාද තමහට ලොභයෙන් ගිජුවීම නිසා ගරහන්නේය. නුවණැත්තෝද දැන ගෙන ලොභයෙන් ගිජුවීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි ලොභයෙන් ගිජුවීම නිසා දුර්ගතිය කැමති විය යුත්තීය. යම් මේ ලොභයෙන් ගිජුවීමක් වේද, එයම සංයොජනයද වේ, එයම නීවරණයද වේ, ලොභයෙන් ගිජුවීම නිසා දුක් වූ දැවිලි ඇති යම් ආශ්‍රවකෙනෙකුත් උපදින්නාහුද ලොභයෙන් ගිජුවීම නැත්තාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝද නොවෙත්. ලොභයෙන් ගිජු නොවීම නිසා ගිජුවන ලොභය දුරු කටයුතුයයි, මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

12. "නින්දා නොකිරීම හා නොකිපීම නිසා නින්දා කිරීම හා කිපීම දුරුකට යුතුයයි, මෙසේ මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මම වනාහී යම් සංයොජන කෙනෙකුන්ගේ හේතුවෙන් නින්දා කිරීම හා කිපීම ඇත්තෙක් වන්නෙම්ද මම ඒ සංයොජනයන්ගේ දුරු කිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහි නින්දා කිරීම හා කිපීම ඇත්තෙක් වන්නෙම් නම් තෙමේද තමහට ගරහන්නේය. නුවණැත්තෝද දැනගෙන නින්දා කිරීම හා කිපීම නිසා ගරහන්නාහුය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි නින්දා කිරීම හා කිපීම නිසා දුර්ගතිය කැමති විය යුත්තීය. යම් මේ නින්දා කිරීම හා කිපීමක් වේද මෙයම සංයොජනය වේ. මෙයම නීවරණයද වේ. නින්දා කිරීම හා කිපීම නිසා දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුත් උපදින්නාහුද, නින්දා කිරීම හා කිපීම නැත්තාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ නොවෙත්. නින්දා නොකිරීම නොකිපීම නිසා නින්දා කිරීම

කිපීම දුරු කට යුතුයයි, මෙසේ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

13. "දැඩි ක්‍රොධ නොකිරීමෙන් දැඩි ක්‍රොධ කිරීම දුරුකට යුතුයයි, මෙසේ මෙය කියන ලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. 'මම වනාහී යම් සංයොජන කෙනෙකුන්ගේ හේතුවෙන් දැඩි ක්‍රොධ ඇත්තෙක් වන්නෙම් නම් මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහි දැඩි ක්‍රොධ ඇත්තෙක් වන්නෙම් නම් තෙමේද තමහට දැඩි ක්‍රොධය නිසා ගරහන්නේය. නුවණැත්තෝද දැන ගෙන දැඩි ක්‍රොධය නිසා ගර්හා කරන්නාහුය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි දැඩි ක්‍රොධය නිසා දුර්ගතිය කැමති විය යුත්තීය. යම් මේ දැඩි ක්‍රොධයක් වේද, මෙයම සංයොජනය වේ මෙයම නිවරණයද වේ. දැඩිවූ ක්‍රොධය නිසා දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන් උපදින්නාහුද, දැඩි ක්‍රොධය නැත්තාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝද නොවෙත්. දැඩි කොධය නොකිරීම නිසා දැඩි ක්‍රොධය දුරු කටයුතුයයි මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

14. "අධික මානය නොකිරීම නිසා අධික මානය දුරු කටයුත්තේයයි, මෙසේ මෙය කියනලදී. කුමක් සඳහා මෙය කියන ලදද? ගෘහපතිය, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මම වනාහි යම් සංයෝජන කෙනෙකුන්ගේ හේතුවෙන් අධික මානය ඇත්තෙක් වන්නෙම්ද. මම ඒ සංයෝජනයන්ගේ දුරුකිරීම පිණිස, නැසීම පිණිස පිළිපන්නේ වෙමි. මමද වනාහි අධික මානය ඇත්තෙක් වන්නෙම් නම් තෙමේද තමහට අධික මාන හේතුවෙන් ගරහන්නේය. නුවණැත්තෝද දැනගෙන අධික මාන හේතුවෙන් ගරහන්නාහුය. ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි අධික මාන හේතුවෙන් දුර්ගතිය කැමති විය යුත්තීය. යම් මේ අධික මානයක් වේද, එයම සංයෝජනයවේ, එයම නීවරණයදවේ, අධික මාන හේතුවෙන් දුක්වූ දැවිලි ඇති යම් ආශ්‍රව කෙනෙකුන්

උපදින්නාහුද, අධික මානය නැත්තාවූ මොහුට මෙසේ දුක්වූ දැවිලි ඇති ඒ ආශ්‍රවයෝ නොවෙත්. අධික මානය නොකිරීම නිසා අධික මානය දුරුකටයුතුයයි, මෙසේ ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

**15.** "ගෘහපතිය, ආර්‍ය්‍ය විනයෙහි යම් ධර්ම කෙනෙක් ව්‍යවහාර සමුච්ඡේදය පිණිස පවතිත්ද, සංක්ෂෙපයෙන් කියන ලද්දාවූ මේ ධර්ම අට විස්තර වශයෙන් විභාග කරන ලදහ. එපමණකින්ම ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියල්ල සියලු ආකාරයෙන් ව්‍යවහාරයන්ගේ සිඳීම නොවේමය"යි වදාළහ.

"ස්වාමීනි, කෙසේ නම් ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාරයන්ගේ සිඳීම වේද, ස්වාමීනි, යම්සේ ආර්‍ය්‍ය විනයයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡේදය වේද, භාග්‍යවතුන් වහන්සේ මට එසේ ධර්මය දෙශනා කෙරේවා"යි කීය. "ගෘහපතිය, එසේවී නම් අසව, යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමි"යි වදාළහ. "ස්වාමීනි, එසේය"යි පොතලිය ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ

**16.** "ගෘහපතිය, යම්සේ බඩගිනි දුබල බැවින් පෙළුනාවූ බල්ලෙක් ගවයන් මරණ මස් ලොඹුවක් ළඟට ගොස් සිටියේ වේද, උෟට දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ මොනවට කපනලද මස් නැති, ලේ තැවරුණු ඇට කැබැල්ලක් ළඟට දමන්නේය, ගෘහපතිය, ඒ කුමකැයි හඟන්නෙහිද? ඒ බල්ලා මොනවට කපනලද මස් නැති, ලේ තැවරුණු ඒ ඇට කටුව ලෙවකන්නේ බඩ ගින්නෙන්වූ දුර්වලකම දුරු කරන්නේ දැ"යි? (ඇසූහ)

"ස්වාමීනි, එය නොවේමය." "එයට හේතු කවරේද?" "ස්වාමීනි, ඒ ඇටකටුව වනාහී මොනවට කපන ලද්දාවූ මස්නැති ලේ තැවරුණක් වෙයි. ඒ බල්ලා වනාහී ඉතා වැඩියක්ම වෙහෙසීමට දුකට කොටස් කාරයෙක් වන්නේය"යි (කීය.) "ගෘහපතිය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. කාමයෝ ඇට සැකිල්ලකට බඳු උපමා ඇත්තාහුය. බොහෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි ආදීනව බොහෝයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදහ. මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක නා නා ස්වභාව ඇත්තාවූ, නා නා ස්වභාව ඇසුරු කළාවූ යම් මේ (පඤ්චකාම ගුණයන්හිවූ) උපෙක්ෂාවක් වේද, එය දුරු කොට ඒක ස්වභාව ඇත්තාවූ ඒකත්වය ඇසුරු කළාවූ යම් මේ (චතුර්ථධ්‍යානයෙන්වූ) උපෙක්ෂාවක් වේද, යම් තැනෙක්හි සියළු ආකාරයෙන් ලොකාමිසයයි කියනලද පඤ්ච කාම ගුණයන් දැඩිව අල්වා ගැනීම් ඉතිරි නැතිව නැති වෙත්ද ඒ උපෙක්ෂාවම වඩයි.

17. "ගෘහපතිය, යම්සේ ගිජුලිහිණියෙක් හෝ ලෝ තුඩුවෙක් හෝ උකුස්සෙක් හෝ මස් පිඩක්ගෙන පියාඹන්නේද, ඌ ගිජු ලිහිණියෝද ලෝ තුඩුවෝද උකුස්සෝද ලුහුබඳිමින් මුව තුඩින් ඇන ඇන යන්නාහුද, මස් පිඩ ඇද බිම හෙලන්නාහුද, ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? ඉදින් ඒ ගිජුලිහිණියා හෝ ලෝතුඩුවා හෝ උකුස්සා හෝ ඒ මස්පිඩ වහාම නොදමන්නේ නම් හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ පැමිණෙන්නේද? මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේ දැ"යි? (ඇසූහ.) "ස්වාමීනි, එසේය" "ගෘහපතිය, එපරිද්දෙන්ම ආයර්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් මස් පිඩකට බඳුවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය, මෙහි ආදීනව බොහෝයයි වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් යහපත් නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නා නාත්වය ඇසුරුකළාවූ උපෙක්ෂාවක් වේද එය දුරුකොට යම් මේ එකත්වය ඇත්තාවූ එකත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, යම් තැනක සියළු ආකාරයෙන් ලොකාමිසයන් දැඩිකොට ගැනීම ඉතිරි නැතිව නැති වේද ඒ උපෙක්ෂාවම වඩයි.

18. "ගෘහපතිය, යම්සේ පුරුෂයෙක්තෙම ඇවුලුනාවූ තණසුලක් ගෙණ උඩුසුලඟට යන්නේද, ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? ඉදින් ඒ පුරුෂතෙම ඒ ඇවිලගත් තණ සුල ඔහුගේ අත හෝ දවන්නේය. බාහුව හෝ දවන්නේය. වෙනයම් අවයවයක් හෝ දවන්නේය. හෙතෙම ඒ හේතුවෙන් මරණයට

හෝ මරණය තරම් දුකට හෝ පැමිණෙන්නේ නොවේද?” “ස්වාමීනි, එසේය.” “ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආයර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් තණ සුලකට බඳුවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි බොහෝ ආදීනව ඇත්තේයයි වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති නා නාත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරු කොට යම් මේ එකත්වය ඇත්තාවූ එකත්වය ඇසුරු කළ වූ උපෙක්ෂාවක් වේද යම් තැනක සියලු ආකාරයෙන් ලොකාමිසයන් දැඩි කොට ගැනීම ඉතිරි නැතිව නැති වෙත්ද, ඒ උපෙක්ෂාවම වඩයි.

**19.** “ගෘහපතිය, යම්සේ මිනිස් උසකට වඩා ගැඹුරුවූ පහව ගිය ගිනිදැල් ඇති පහවූ දුම් ඇති අඟුරුවලින් පිරුණාවූ, අඟුරු වළක් වේද, ඉක්බිති ජීවත්වනු කැමැත්තාවූ, නොමැරෙනු කැමැත්තාවූ, සැප කැමැත්තාවූ, දුක් පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් එන්නේය. ඔහු ශක්තිමත්වූ පුරුෂයෝ දෙදෙනෙක් වෙන වෙන අත්වලින් ගෙන අඟුරු වළට ඇද දමන්නාහුය. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඒ පුරුෂතෙම ඒ මේ අතට ශරීරය නමන්නේද?” “ස්වාමීනි, එසේය.” “එයට හේතු කවරේද?” “ස්වාමීනි, ඉදින් මම මේ අඟුරුවළට වැටෙන්නෙම් නම් ඒ හේතුවෙන් මරණයට හෝ මැරෙණ තරම් දුකට හෝ පැමිණෙන්නෙමි යනු ඒ පුරුෂයාහට පැහැදිලිමය.” “ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආයර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින් කාමයෝ අඟුරු වළකට බඳුය, බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය. මෙහි බොහෝ ආදීනව ඇත්තේයයි, වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇතිසැටියෙන් මනාව නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති, නානාත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරු කොට, යම් මේ එකත්වය ඇත්තාවූ එකත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද යම් තැනක සියලු ආකාරයෙන් ලොකාමිසයන් දැඩි කොට ගැනීම් ඉතිරි නැතිව නැති වේද, ඒ උපෙක්ෂාවම වඩයි.

**20.** "ගෘහපතිය, යම්සේ පුරුෂයෙක් තෙම ආරාමයන් ගෙන් සිත් කළු බැව් ඇති, වනයන්ගෙන් සිත් කළු බැව් ඇති, භූමින් ගෙන් සිත් කළු බැව් ඇති, පොකුණු වලින් සිත් කළු බැව් ඇති සිහිනයක් දක්නේද, හෙතෙම පිබිදියේ කිසිවක් නොදක්නේය. ගෘහපතිය, එපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින්, සිහිනයකට බඳුවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය, බොහෝ වෙහෙස ඇත්තාහුය, මෙහි බොහෝ ආදීනව ඇත්තේයයි වදාරණ ලද්දාහුය. මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති, නානාත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරුකොට, යම් මේ එකත්වය ඇත්තාවූ එකත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, යම් තැනක සියලු ආකාරයෙන් ලොකාමිසයන් දැඩි කොට ගැනීම් ඉතිරි නැතිව නැති වේද, ඒ උපෙක්ෂාවම වඩයි.

**21.** "ගෘහපතිය, යම් සේ පුරුෂයෙක් තෙම පුරුෂයන්ට සුදුසුවූ යානාවක් හෝ උතුම් මිණි කොඬොලක් හෝ ඉල්වා ගතයුතු භොගයක් වේද, හෙතෙම ඒ ඉල්වා ගන්නා ලද භොගයන්ගෙන් සැරසුනේ පිරිවරන ලද්දේ කඩපිලකට පැමිණෙන්නේය. ඔහු දැක ජනයා 'මේ පින්වත් පුරුෂ තෙමේ එකාන්තයෙන් භොග (සම්පත්) ඇත්තෙක. මෙසේ වනාහී සම්පත් ඇත්තේ සම්පත් අනුභව කෙරෙත්'යයි කියන්නේය. වස්තු හිමියෝ යම් යම් තැනෙක්හිම ඔහු දක්නාහුද ඒ ඒ තන්හිම ස්වකීය භාණ්ඩයන් හැරගන්නාහුය. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නේද? ඒ පුරුෂයාගේ හිත නරක් වීමට ඒ ප්‍රමාණවත් යැයි සිතන්නෙහිද?" "ස්වාමීනි, එසේය". "එයට හේතු කවරේද?" "ස්වාමීනි, බඩු හිමියෝ වනාහී තම තමන්ගේ බඩු හැරගනිති." "ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. ඉල්වා ගන්නා ලද බඩු වැනිවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහුය. බොහෝ වෙහෙස ඇත්තාහුය, මෙහි බොහෝ ආදීනව ඇත්තේයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය. මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇති, නානාත්වය ඇසුරු කළාවූ

උපෙක්ෂාවක් වේද, එය දුරු කොට, යම් මේ එකත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, යම් තැනක සියලු ආකාරයෙන් ලොකාමිසයන් දැඩි කොට ගැනීම් ඉතිරි නැතිව නැති වේද, ඒ උපෙක්ෂාවම වඩයි.

22. "ගෘහපතිය, යම්සේ ගමට හෝ නියම් ගමට හෝ නුදුරු තන්හි තියුණුව වනලැහැබක් වේද, එහි මිහිරි පල ඇත්තාවූද හටගත් බොහෝ පල ඇත්තාවූද ගසක් වන්නේද, බිම වැටුනාවූ කිසියම් පල කෙනෙකුත් නොවන්නාහුද, එකල්හි පලයන්ගෙන් ප්‍රයෝජන ඇත්තාවූ, පල සොයන්නාවූ පුරුෂයෙක් පල සොයමින් එන්නේය. හෙතෙම ඒ වන ලැහැබට ඇතුල්ව මිහිරි පල ඇත්තාවූ, හටගත් බොහෝ පල ඇත්තාවූ ඒ ගස දක්නේය. ඔහුට මෙබඳු සිතක් වන්නේය. 'මේ ගස වනාහි මිහිරි පල ඇත්තේද, හටගත් බොහෝ පල ඇත්තේද, වෙයි. බිම වැටුනාවූ කිසි පලයකුත් නැත්තේය. මම වනාහී ගසට නගින්ට දනිමි. මම මේ ගසට නැග ඇති තාක් කන්නෙම් නම් ඔඩොක්කුවද පුරවා ගන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (සිතා) හෙතෙම ඒ ගසට නැගී ඇතිතාක්ම කන්නේය. ඔඩොක්කුවද පුරවා ගන්නේය.

23. "ඉක්බිති පල කැමතිවූ පල සොයන්නාවූ, දෙවෙනි පුරුෂයෙක් තෙම පල සොයමින් තියුණුවූ කෙටේරියක්ද ගෙන එන්නේය. හෙතෙම ඒ වන ලැහැබට ඇතුල්ව මිහිරි පල ඇත්තාවූද හටගත් බොහෝ පල ඇත්තාවූද ඒ ගස දක්නේය. ඔහුට මෙබඳු සිතක් වන්නේය. 'මේ ගස වනාහී මිහිරි පල ඇත්තේද හටගත් බොහෝ පල ඇත්තේද වේ. බිම වැටුනාවූ පලයකුත් නැත්තේය. මම වනාහි ගසට නගින්ට නොදනිමි. මම මේ ගස මුලින් කපා ඇතිතාක්ද කන්නෙම් නම් ඔඩොක්කුවද පුරවා ගන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (සිතා) හෙතෙම ඒ ගස මුලින් කපන්නේය, ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් ඒ මේ පුරුෂයෙක් පළමුව ගසට නැගුනේද, ඉදින් හෙතෙම වහාම නොබසින්නේ නම් ඒ ගස වැටෙන්නේ ඔහුගේ අත හෝ බිඳෙන්නේය පය හෝ බිඳෙන්නේය. එක්තරා ශරීරාවයවයක් හෝ බිඳෙන්නේය. හෙතෙම ඒ හේතුවෙන්

මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේද?” “ස්වාමීනි, එසේය.”

“ගෘහපතිය, මෙපරිද්දෙන්ම ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම මෙසේ සලකයි. භාග්‍යවතුන් වහන්සේ විසින්, ගසක ගෙඩි වැනිවූ කාමයෝ බොහෝ දුක් ඇත්තාහ. බොහෝ වෙහෙස ඇත්තාහ. මෙහි බොහෝ දොෂ ඇත්තේයයි වදාරණ ලද්දාහ. මෙසේ මෙය ඇති සැටියෙන් මනා නුවණින් දැක යම් මේ නොයෙක් ස්වභාව ඇත්තාවූ නොයෙක් ස්වභාව ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, එය දුරුකොට යම් මේ එක ස්වභාවය ඇත්තාවූ එකත්වය ඇසුරු කළාවූ උපෙක්ෂාවක් වේද, යම් තැනෙක්හි සියළු ආකාරයෙන් පඤ්චකාම ගුණයන් දැඩි කොට ගැනීම ඉතිරි නැතිව නැති වේද, ඒ චතුර්ථ ධ්‍යාන උපෙක්ෂාවම වඩයි.

24. “ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙමේ වනාහී මේ උතුම්වූ උපෙක්ෂා සිහි දෙදෙනාගේ පිරිසිදු වීමටම පැමිණ අනෙක ප්‍රකාරවූ පෙර විසූතැන් සිහි කරයි. ‘එනම් එක ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙම්’ මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් අසුවල් තැන උපන්නෙමි. එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේකෑම ඇත්තෙම් මේ සැපදුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමි’යි මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ අනෙක ප්‍රකාරවූ පෙර විසූතැන් සිහිකරයි.

25. “ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම වනාහී උතුම් වූ උපෙක්ෂා සිහි පිරිසිදු බවට පැමිණ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම

පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, සුවර්ණවූද, දුර්වර්ණවූද, සුගතවූද, දුර්ගතවූද කර්මයට අනුව උපදින සත්වයන් දකී. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූහ. වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ, මනො දුශ්චරිතයෙන් යුක්ත වූහ, ආර්‍ය්‍යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යා දෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ, ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්, නැතහොත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූහ, වාග් සුචරිතයෙන් යුක්ත වූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආර්‍ය්‍යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන් වූවෝවූහ. ඔවුහු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිවඇසින් චුතවන උපදින සත්වයන් දකී. මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිව ඇසින් චුත වන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැන ගනියි.

"ගෘහපතිය, ඒ මේ ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම වනාහී මේ උතුම්වූ උපෙක්ෂා සිහි පිරිසුදු බවට පැමිණ කෙලෙසුන් නැසීමෙන් කෙලෙසුන් ගෙන් වෙන්වූ චිත්ත විමුක්තියටද ප්‍රඥා විමුක්තියටද මේ ආත්මයෙහිම තෙමේ ශ්‍රෙෂ්ඨ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයි. ගෘහපතිය, මෙතෙකින් වනාහී ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාරයන්ගේ සිඳීමවේ. ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම්සේ ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡෙදය වේද, කිමෙක්ද නුඹ මෙබඳුවූ ව්‍යවහාර සමුච්ඡෙදය තමා කෙරෙහි දක්නෙහිද?"

**26.** "ස්වාමීනි, මම කවරෙක්ද? ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡෙදය කවරේද? ස්වාමීනි, මම ආර්‍ය්‍ය විනයෙහි සර්වප්‍රකාරයෙන් සියළු ආකාරයෙන් ව්‍යවහාර සමුච්ඡෙදයෙන් ඈත්වෙමි. ස්වාමීනි, අපි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



වනාහී පෙර අන්‍ය තීර්ථකවූ පරිබ්‍රාජකයන්ට ගිහි ව්‍යවහාර සමුච්ඡේදය නොදන්න වුන්ම දන්නවුන්යයි සැලකුවෙමු. නොදන්නවුන්ටම දන්නවුන් විසින් වැළඳිය යුතු භොජනය වැළඳවීමු. නොදන්නවුන්වම දන්නවුන්ගේ තන්හි තැබීමු. ස්වාමීනි, අපි වනාහී දන්නාවූම භික්ෂූන් නොදන්නවුන්යයි හැඟීමු. දන්නවුන්ටම නොදන්නවුන් විසින් වැළඳිය යුතු භොජනය වැළඳවීමු. දන්නවුන්ම නොදන්නවුන්ගේ තන්හි තැබීමු.

27. "ස්වාමීනි, දැන් වනාහි අපි අන්‍ය තීර්ථකවූ පරිබ්‍රාජකයන් කරුණු නොදන්නවුන්ම නොදන්නවුන්යයයි දන්නෙමු. නොදන්නවුන්ටම නොදන්නවුන් විසින් වැළඳියයුතු භොජනය වළඳවන්නෙමු. නොදන්නවුන්ම නොදන්නවුන්ගේ තන්හි තබන්නෙමු. ස්වාමීනි, අපි, භික්ෂූන් වනාහී කරුණු දන්නවුන්ම දන්නවුන්යයි දැනගන්නෙමු. දන්නවුන්ටම දන්නවුන් විසින් වැළඳියයුතු භොජනය වළඳවන්නෙමු. දන්නවුන්ම දන්නවුන්ගේ තන්හි තබන්නෙමු. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ මට ඒකාන්තයෙන් ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රේමය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ප්‍රසාදය, ශ්‍රමණයන් කෙරෙහි ශ්‍රමණ ගෞරවය ඉපදවූහ.

"ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරුකොට තබනලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසනලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමි) භාග්‍යවතුන් වහන්සේ අදපටන් දිවිහිම් කොට සරණගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වා.

**හතරවෙනිවූ පොතලිය සූත්‍රය නිමි. (1-4)**

## 5. ජීවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර (කුමාරයෙකු විසින් පොෂණය කරන ලද හෙයින්) කෝමාරභච්ච නම්වූ ජීවකයන්ගේ අඹ උයනෙහි (කරවන ලද විහාරයෙහි) වැඩ වාසය කරති. එකල්හි වනාහි ජීවක නම් කොමාරභච්ච තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක සිටියේය. එක් පැත්තක සිටි ජීවක නම් කොමාර භච්චතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මා විසින් මෙය අසනලදී. 'ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්, ශ්‍රමණ ගෞතම තෙමේ දැන ගෙන උදෙසා කරන ලද (තමන් පිණිස කරනලද) ඒ මාංසය වළඳන්නේය' යනුයි. ස්වාමීනි, යම් ඒ කෙනෙක් මෙසේ කීවාහුද? 'ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්. ශ්‍රමණ ගෞතමතෙමේ දැනගෙන උදෙසා කරනලද ඒ මාංසය වළඳන්නේයයි' (කියායි) ස්වාමීනි, කිමෙක්ද ඔවුහු භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නාහුද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් දොස් නොකියත්ද? භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද කාරණයට අනුව කරුණු කියත්ද? කිසියම් කරුණු සහිතවූ වාදානුවාදයෙක් ගැරහියයුතු තැනට නොපැමිණේදැයි" (ඇසීය)

2. "ජීවකය, යම් ඒ කෙනෙක් මෙසේ කීවාහුද? 'ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්. ශ්‍රමණ ගෞතම තෙමේ දැනගෙන උදෙසා කරනලද ඒ මාංසය පරිභොග කරන්නේ යයි' (කියායි.) ඔවුහු මා විසින් කරන ලද්දක් කියන්නාහු නොවෙත්. ඔවුහු මට බොරුවකින් දොස් කියන්නාහුද වෙත්. ජීවකය, මම වනාහී කරුණු තුනකින් යුක්තවූ මාංසය පරිභොග නොකට යුතුයයි කියමි. දක්නා ලද්දය, අසන ලද්දය, සැක කරන ලද්දය, යන තුනයි. ජීවකය, මම වනාහී මේ කරුණුතුනෙන් යුක්තවූ මාංසය පරිභොග නොකට යුතුයයි කියමි. ජීවකය, මම වනාහී කරුණු තුනකින් යුක්තවූ මාංසය පරිභොග කටයුතුයයි කියමි. නොදක්නා ලද්දය, නොඅසන

ලද්දය, සැක නොකරන ලද්දය, යන තුනයි. ජීවකය, මම වනාහි මේ කරුණු තුනින් යුක්තවූ මාංසය වැළඳිය යුතුයයි කියමි.

3. "ජීවකය, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවන දිශාවය එසේ තුන්වන දිශාවය එසේ සතරවන දිශාවය, මෙසේ උඩ යට සරස සියල්ලෙහි සියළු තැන පතළාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරයි. ඒ භික්ෂුව වෙත ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ සෙට දවස පිණිස බතින් පවරයි. ජීවකය, කැමතිවන්නාවූ මහණ තෙම එය ඉවසයි. හෙතෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පා සිවුරුගෙණ ඒ ගෘහපතියාගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණෙයි. පැමිණ පනවන ලද ආසනයෙහි හිඳියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ඔහු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවයි. ඔහුට මෙබඳු සිතක් නොවෙයි. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවයි. එය ඉතා යහපත. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ පසුවද මෙබඳු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවන්නේ නම් ඉතා යෙහෙකැයි' මෙබඳු සිතක්ද ඔහුට ඇති නොවෙයි. හෙතෙම ඒ පිණ්ඩපාතය, තෘෂ්ණාවෙන් ගැට නොගැසුනේ මූර්ඡා නොවූයේ එහි නොගිලුනේ දොස් දක්නා සුළුවූයේ නිශ්ශරණ ප්‍රඥාවෙන් යුක්තව වළඳයි. ජීවකය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම, ඒ මහණතෙම ඒ කාලයෙහි තමහට දුක් පිණිස හෝ සිතයිද? අන්‍යයන්හට දුක් පිණිස හෝ සිතයිද? දෙපසට දුක් පිණිස හෝ සිතයි"ද?

"ස්වාමීනි, එසේ නොසිතයි."

4. "ජීවකය, ඒ මහණතෙම ඒ කාලයෙහි නිවැරදිවූම ආහාරය ගන්නේ නොවේද?" "ස්වාමීනි, එසේය. ස්වාමීනි,

බ්‍රහ්මතෙම මෛත්‍රී විහරණ ඇත්තෙක යන මෙය මා විසින් අසා තිබේ. ස්වාමීනි, මෛත්‍රියෙන් යුක්තවූ භාග්‍යවතුන් වහන්සේ මා විසින් ඇසින්ම දක්නාලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහී මෛත්‍රී විහරණ ඇත්තේය.” “ජීවකය, යම් රාගයකින්, යම් ද්වේෂයකින්, යම් මොහයකින් ක්‍රොධ ඇත්තෙක් වන්නේද, තථාගතයන් වහන්සේගේ ඒ රාගය ඒ ද්වේෂය ඒ මොහය පහවූයේ සිඳින ලද මුල් ඇත්තේ මස්තකය සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ නැවත නොවීම කරන ලද්දේ, මතු නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. ජීවකය, ඉදින් තා විසින් මේ සඳහා කියන ලද්දේ නම් තට එය අනුදනිමියි” වදාළේය. “ස්වාමීනි, මා විසින් ඒ සඳහාම කියනලදී.”

5. “ජීවකය, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම කරුණාසහගතවූ සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතර වන දිශාවද, මෙසේ උඩ යට සරස සියල්ලෙහි සියලු තැන පතලාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසයකරයි. ඒ භික්ෂුව වෙත ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ සෙට දවස පිණිස බතින් පවරයි. ජීවකය, කැමති වන්නාවූම මහණතෙම එය ඉවසයි. හෙතෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍රය හා සිවුරු ගෙන ඒ ගෘහපතියාගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෙදර යම් තැනකද එතැනට පැමිණෙයි. පැමිණ පණවන ලද ආසනයෙහි හිඳියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ඔහු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවයි. ඔහුට මෙබඳු සිතක් නොවෙයි. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවයි. එය ඉතා යහපත, මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ පසුවද මෙබඳු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවන්නේ නම් ඉතා යෙහෙකැයි මෙබඳු සිතක්ද ඔහුට නොවෙයි. හෙතෙම පිණ්ඩපාතය, තෘෂ්ණාවෙන් ගැට නොගැසුනේ, මුළා නොවූයේ, එහි

නොගිලුණේ දොස් දක්නා සුලුවූයේ නිශ්ශරණ ප්‍රඥාවෙන් යුක්තව වළඳයි. ජීවකය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම, ඒ මහණ තෙම ඒ කාලයෙහි තමහට දුක් පිණිස හෝ සිතයිද? අනුන්හට දුක් පිණිස හෝ සිතයිද? දෙපසට දුක් පිණිස හෝ සිතයිද?" "ස්වාමීනි එසේ නොසිතයි." ජීවකය, ඒ මහණතෙම ඒ කාලයෙහි නිවැරදි වූම ආහාරය ගන්නේ නොවේද?" 'ස්වාමීනි, එසේය. ස්වාමීනි, බ්‍රහ්මතෙම කරුණා විහරණ ඇත්තෙක යන මෙය මා විසින් අසා ඇත. ස්වාමීනි, ඒ මේ කාරණය, මා විසින් භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව ඇසින්ම දක්නා ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි කරුණා විහරණ ඇත්තේය." "ජීවකය, යම් රාගයකින්, යම් ද්වේෂයකින්, යම් මොහයකින් ව්‍යාපාද සිත් ඇත්තෙක් වන්නේද, තථාගතයන් වහන්සේගේ ඒ රාගය, ඒ ද්වේෂය, ඒ මොහය නැතිවූයේ මුල් සිඳින ලද්දේ මුදුන සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේ, නැවත නොවීම කරන ලද්දේ, මතු නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. ජීවකය, ඉදින් තා විසින් ඒ සඳහා කියන ලද්දේද, තට එය අනු දනිමි."

"ස්වාමීනි, මා විසින් ඒ සඳහාම කියන ලදී."

**6.** "ජීවකය, මේ ශාසනයෙහි මහණතෙම එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම මුදිතා සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද, එසේම තුන්වන දිශාවද, එසේම සතරවන දිශාවද, මෙසේ උඩ යට සරස සියල්ලෙහි සියලු තැන පතළාවූ සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කරයි. ඒ භික්ෂුව වෙත ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ සෙට දවස පිණිස බතින් පවරයි. ජීවකය, කැමති වන්නාවූම මහණ තෙම එය ඉවසයි. හෙතෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍රය හා සිවුරු ගෙන ඒ ගෘහපතියාගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෙදර යම් තැනකද එතනට පැමිණෙයි. පැමිණ පණවන ලද ආසනයෙහි හිඳියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීත පිණ්ඩපාතයෙන් ඔහු වළඳවයි. ඔහුට මෙබඳු සිතක්

නොවෙයි. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවයි. එය ඉතා යහපත. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ මත්තෙහිද මෙබඳු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවන්නේ නම් ඉතා යෙහෙකැයි' මෙබඳු සිතක්ද ඔහුට නොවෙයි. හෙතෙම ඒ පිණ්ඩපාතය, තෘෂ්ණාවෙන් ගැට නොගැසුනේ මුළා නොවූයේ එහි නොගිලුණේ දොස් දක්නා සුලු වූයේ, නිශ්ශරණ ප්‍රඥාවෙන් යුක්තව වළඳයි. ජීවකය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම ඒ මහණතෙම ඒ කාලයෙහි තමහට දුක් පිණිස හෝ සිතයිද? අනුන්ට දුක් පිණිස හෝ සිතයිද? දෙපසට දුක් පිණිස හෝ සිතයිද?" "ස්වාමීනි මෙය නොවේමැ"යි, "ජීවකය, ඒ මහණ තෙම ඒ කාලයෙහි නිවැරදිවූම ආහාරය ගන්නේ නොවේද? "ස්වාමීනි, එසේය. ස්වාමීනි, බ්‍රහ්මතෙම මුදිතා විහරණ ඇත්තෙක යනමෙය මා විසින් අසනලදී. ස්වාමීනි ඒ මේ කාරණය මා විසින් භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව ඇසින්ම දක්නා ලදී. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහි මුදිතා විහරණ ඇත්තේය." "ජීවකය, යම් රාගයකින්, යම් ද්වෙෂයකින්, යම් මොහයකින් ව්‍යාපාද සිත් ඇත්තෙක් වන්නේද, තථාගතයන් වහන්සේගේ ඒ රාගය, ඒ ද්වෙෂය, ඒ මොහය නැතිවූයේ මුල් සිඳින ලද්දේ මුදුන සිඳින ලද තල් ගසක් මෙන් කරන ලද්දේය. නැවත නොවීම කරන ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. ජීවකය, ඉදින් තා විසින් ඒ සඳහා කියන ලද්දේ නම්, තට එය අනුදනිමි."

"ස්වාමීනි, මා විසින් ඒ සඳහාම කියන ලදී."

7. "ජීවකය, මේ ශාසනයෙහි මහණ තෙම එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට වාසය කරයි. හෙතෙම උපෙක්ෂා සහගතවූ සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේම දෙවන දිශාවද එසේම තුන්වන දිශාවද එසේම සතරවන දිශාවද මෙසේ උඩ යට සරස සියල්ලෙහි සියළු තැන පතලා වූ සියල්ලෙන් යුක්තවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ උපෙක්ෂා සහගතවූ සිතින් පතුරුවා වාසය කරයි. ඔහු වෙත ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ සෙට දවස පිණිස බතින්

පවරයි. ජීවකය, කැමතිවන්නාවූම මහණ තෙම ඉවසයි. හෙතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් පෙරවරු වේලෙහි හැඳ පොරවා පාසිවුරු ගෙන ඒ ගෘහපතියාගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෙදර යම් තැනෙක්හිද එතැනට පැමිණෙයි. පැමිණ පනවනලද ආසනයෙහි වැඩ හිඳියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ඔහු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවයි. ඔහුට මෙබඳු සිතක් නොවෙයි. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවයි. එය යහපත. මට මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ මත්තෙහිත් මෙබඳු ප්‍රණීතවූ පිණ්ඩපාතය වළඳවන්නේ නම් ඉතා යෙහෙකැයි මෙබඳු සිතක්ද ඔහුට නොවෙයි. හෙතෙම ඒ පිණ්ඩපාතය, තෘෂ්ණාවෙන් ගැට නොගැසුනේ මුසපත් නොවූයේ එහි නොගැලුනේ දොස් දක්නා සුළුවූයේ නිශ්ශරණ ප්‍රඥා ඇත්තේ වළඳයි. ජීවකය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම ඒ මහණ තෙම ඒ කාලයෙහි තමහට දුක් පිණිස හෝ සිතයිද? අන්‍යයන් හට දුක් පිණිස හෝ සිතයිද? දෙපසටම දුක් පිණිස හෝ සිතයිද?"

"ස්වාමීනි, මෙය නොවේමැයි."

8. "ජීවකය, ඒ මහණතෙම ඒ කාලයෙහි නිවැරදිවූම ආහාරය ගන්නේ නොවේද?" "ස්වාමීනි, එසේය. ස්වාමීනි, බ්‍රහ්මතෙම උපෙක්ෂා විහරණ ඇත්තෙක යන මෙය මා විසින් අසන ලදී. ස්වාමීනි, ඒ මේ කරුණ මා විසින් භාග්‍යවතුන් වහන්සේ පිළිබඳව ඇසින්ම දක්නාලදී."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වනාහී උපෙක්ෂා විහරණ ඇත්තේය."

"ජීවකය, යම් රාගයකින් යම් ද්වෙෂයකින් යම් මොහයකින් හිංසාව ඇත්තෙක් වන්නේද, නොසතුට ඇත්තෙක් වන්නේද, ක්‍රොධ ඇත්තෙක් වන්නේද, ඒ රාගය ඒ ද්වෙෂය ඒ මොහය තථාගතයන් වහන්සේගේ නැතිවූයේ සිඳිනලද මුල් ඇත්තේ මස්තකය සිඳිනලද තල් ගසක් මෙන් කරන ලද්දේ අභාවය කරණ ලද්දේ මතු නූපදනා ස්වභාව ඇත්තේ වෙයි. ජීවකය,

ඉදින් තොප විසින් ඒ සඳහා කියනලද නම් තට මෙය අනුදනිමි”, “ස්වාමීනි මා විසින් ඒ සඳහාම කියනලදී.”

**9.** “ජීවකය, යමෙක් වනාහි තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ උදෙසා සතෙකු මරාද, හෙතෙම කරුණු පසකින් බොහෝ පව් රැස්කරයි. හෙතෙමේ ‘යව් අසවල් සතා ගෙනෙව්’ යන යම් වචනයක් කියයිද, මේ පළමුවන කාරණයෙන් බොහෝ පව් රැස්කරයි. ඒ සතා බෙල්ලෙන් බැඳ ගෙනෙනු ලබන්නේ යම් දුකක් දොම්නසක් විඳියිද, මේ දෙවෙනි කරුණෙන්ද බොහෝ පව් රැස් කරයි. හෙතෙම ‘යව්, මේ සතා මරව්’ යන යම් වචනයක් කියයිද, මේ තුන්වන කරුණෙන්ද බොහෝ පව් රැස් කරයි. ඒ සතා මරණු ලබන්නේ යම් දුකක් දොම්නසක් විඳියිද, මේ සතරවන කරුණෙන් බොහෝ පව් රැස්කරයි. යම් හෙයකිනුත් හෙතෙම තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ නොකැපවූ දෙයින් වළඳවාද මේ පස්වන කරුණෙන් බොහෝ පව් රැස් කරයි. ජීවකය, යමෙක් වනාහි තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ උදෙසා සතෙකු මරාද, හෙතෙම මේ කරුණු පසින් බොහෝ පව් රැස් කෙරේයයි” වදාළහ. මෙසේ වදාළ කල්හි ජීවක නම් කොමාර භච්චතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. “ස්වාමීනි, ආශ්චර්‍ය්‍යයකි, ස්වාමීනි, නුවූ විරූ දෙයක්ය. ස්වාමීනි, භික්ෂූහු ඒකාන්තයෙන් කැපවූ ආහාරයක්ම වළඳත්. ස්වාමීනි, භික්ෂූහු එකාන්තයෙන් නිවැරදිවූ ආහාරයම වළඳත්. ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි ඉතා යහපත ස්වාමීනි යටිකුරු කරන ලද්දක් යම්සේ උඩුකුරු කරන්නේද වැසුමක් එලිදරව් කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද ඇස් ඇත්තෝ රූප දකිත්වායි, අඳුරෙහි තෙල් පහනක් දරන්නේද එලෙසින්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරනලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොටයමි) භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වායි” කීයේය.

**පස්වෙනිවූ ජීවක සූත්‍රය නිමි (1-5)**

## 6. උපාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ නාලන්දා නම් නුවර පාවාරික නම් සිටුහුගේ අඹ උයනෙහි කරවනලද විහාරයෙහි වැඩ වාසය කළහ. එකල්හි වනාහි නිගණ්ඨනාත පුත්‍රතෙමේ මහත්වූ නිගණ්ඨ පිරිසක් සමග නාලන්දා නුවර වාසය කරයි එකල්හි දීඝතපස්සී නම් නිගණ්ඨතෙම නාලන්දා නුවර පිඩු පිණිස හැසිර පසු බත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ පාවාරික නම් අඹ උයන යම් තැනෙක්හිද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවිය යුතුවූ සිහිකට යුතුවූ කථාව කොට නිමවා එක්පැත්තක සිටියේය. එක පැත්තක සිටියාවූම දීඝතපස්සී නම් නිගණ්ඨයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. "තපස්සීය, ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් හිඳ ගනුවයි" (කීහ.) මෙසේ කී කල්හි දීඝතපස්සී නම් නිගණ්ඨ තෙම එක්තරා මිටි අස්නක් ගෙණ එක් පැත්තක වාඩිවිය. එක් පැත්තක උන්නාවූ දීඝතපස්සී නම් නිගණ්ඨයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

2. "තපස්සීය, නිගණ්ඨනාත පුත්‍රතෙම පාපකර්මය කිරීම පිණිස පාපකර්මයාගේ පැවැත්ම පිණිස කෙතෙක් කර්ම පනවාදැයි" "(දක්වාදැයි ඇසූහ.) "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, කර්මය කර්මයයි පනවන්ට නිගණ්ඨනාත පුත්‍රයාහට පුරුද්දක් නැත. ඇවැත්නි, ගෞතමයන් වහන්ස, දණ්ඩය දණ්ඩයයිම පනවන්ට නිගණ්ඨනාත පුත්‍රයාගේ පුරුද්ද වේයයි" කීය. "තපස්සිය, නිගණ්ඨනාත පුත්‍රතෙම පාප කර්ම කිරීමට පාපකර්මයාගේ පැවැත්මට කෙතෙක් නම් දණ්ඩයන් පනවාද?" "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, නිගණ්ඨනාත පුත්‍ර තෙම පාපකර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට දණ්ඩ තුනක්ම පනවයි. එනම් කාය දණ්ඩය, වචී දණ්ඩය, මනො දණ්ඩය යන තුනයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. "තපස්සිය, කිමෙක්ද? කාය දණ්ඩය අතිකක්මද? වචී දණ්ඩය අතිකක්මද? මනො දණ්ඩය අතිකක්මද" "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, කාය දණ්ඩය අතිකක්මය, වචී දණ්ඩය අතිකක්මය, මනො දණ්ඩය අතිකක්මය." "තපස්සිය, මෙසේ බෙදන ලද්දාවූ මෙසේ වෙන් කරන ලද්දාවූ මේ දණ්ඩ තුන අතුරෙන් කවර නම් දණ්ඩයක් නිගණ්ඨනාත පුත්‍ර තෙම පාප කර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදයයි දක්වාද? ඉදින් කාය දණ්ඩය හෝ වේද ඉදින් වචී දණ්ඩය හෝ වේද? ඉදින් මනො දණ්ඩය හෝ වේද?"

4. "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, මෙසේ බෙදන ලද්දාවූ මෙසේ වෙන් කරන ලද්දාවූ මේ දණ්ඩ තුන අතුරෙන් කාය දණ්ඩය නිගණ්ඨනාත පුත්‍රතෙම පාපකර්මය කිරීමට පාප කර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදයයි දක්වයි. වචී දණ්ඩය එසේ නොදක්වයි. මනො දණ්ඩය එසේ නොදක්වයි."

"තපස්සිය, කාය දණ්ඩයයි කියන්නෙහිද?" "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, කාය දණ්ඩයයි" කියමි. "තපස්සිය, කාය දණ්ඩයයි කියන්නෙහිද?" "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, කාය දණ්ඩය"යි කියමි. "තපස්සිය, කාය දණ්ඩයයි කියන්නෙහිද?" "ඇවැත්නි ගෞතමයන් වහන්ස, කාය දණ්ඩයයි කියමි." මෙසේ භාග්‍යවතුන් වහන්සේ දීඝතපස්සී නම් නිඝණ්ඨයා මේ කීමෙහි තුන්වෙනි වර දක්වා පිහිටුවූහ.

5 මෙසේ වදාළ කල්හි දීඝතපස්සී නම් නිගණ්ඨ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ වනාහී පාපකර්මය කිරීමට පාප කර්මයාගේ පැවැත්මට කෙතෙක් දණ්ඩයන් පනවන්නෙහිද?" "තපස්සිය, තථාගතයන්ට දණ්ඩය දණ්ඩයයි පනවන්ට පුරුද්දක් නැත. තපස්සිය, කර්මය කර්මයයිම පැනවීම තථාගතයන්ගේ පුරුද්දවේ." "ඇවැත්නි, ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේ වනාහි පාපකර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට කෙතෙක් කර්මයන් පනවන්නෙහිද?" "තපස්සිය, මම වනාහි පාපකර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට කර්ම තුනක් දක්වමි. එනම්

කායකර්මය, වචීකර්මය, මනොකර්මය යන තුනයි.” “ඇවැත්නි, ගෞතමයන් වහන්ස, කිම? කායකර්මය, අනිකක්මද? වචීකර්මය අනිකක්මද? මනොකර්මය අනිකක්මද?” “තපස්සිය, කායකර්මය අනිකක්මය, වචීකර්මය අනිකක්මය. මනො කර්මය අනිකක්මය.” “ඇවැත්නි, ගෞතමයන් වහන්ස මෙසේ බෙදන ලද්දාවූ මෙසේ වෙන් කරන ලද්දාවූ මේ කර්ම තුන අතුරෙන් කවර නම් කර්මයක් පාප කර්මය කිරීමට පාප කර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදයයි දක්වන්නෙහිද? ඉදින් කායකර්මය හෝ වේද? ඉදින් වාක් කර්මය හෝ වේද? මනොකර්මය හෝ වේද?” “තපස්සිය, මම වනාහී මෙසේ බෙදන ලද්දාවූ මෙසේ වෙන් කරන ලද්දාවූ මේ කර්ම තුන අතුරෙන් මනොකර්මය පාප කර්මය කිරීමට, පාපකර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදයයි දක්වමි. කාය කර්මය එසේ නොවේ, වාක් කර්මය එසේ නොවේ.”

**6.** “ඇවැත්නි, ගෞතමයන්වහන්ස, මනො කර්මයයි කියන්නෙහිද?” “තපස්සිය, මනො කර්මයයි කියමි.” “ඇවැත්නි, ගෞතමයන් වහන්ස, මනො කර්මයයි කියන්නෙහිද?” “තපස්සිය, මනොකර්මයයි කියමි.” “ඇවැත්නි, ගෞතමයන් වහන්ස, මනොකර්මයයි කියන්නෙහිද?” “තපස්සිය, මනො කර්මයයි කියමි.” මෙසේ දීඝතපස්සි නිගණ්ඨ තෙම භාග්‍යවතුන් වහන්සේ මේ කීමෙහි තුන්වෙනි වර දක්වා පිහිටුවා හුනස්නෙන් නැගිට නිගණ්ඨනාත පුත්‍ර තෙමේ යම් තැනෙක්හිද එතැනට ගියේය.

**7.** එසමයෙහි වනාහි නිගණ්ඨනාත පුත්‍රතෙම උපාලි ගෘහපතියා ප්‍රධාන කොට ඇති බාලක නම් ගම් වැසි මහත්වූ ගිහි පිරිසක් සමග හුන්නේ වෙයි. නිගණ්ඨනාත පුත්‍ර තෙම එන්නාවූ දීඝතපස්සී නම් නිගණ්ඨයා දුරදීම දුටුයේය. දැක දීඝතපස්සී නම් නිගණ්ඨයාට මෙසේ කීයේය.

“තපස්සිය, නුඹ මේ දවල් කාලයෙහි කොහි සිට එන්නෙහිද?” “ස්වාමීනි, මම මේ ශ්‍රමණ ගෞතමයන්ගේ සමීපයෙහි සිට එමි.”

"තපස්සිය, ශ්‍රමණ ගෞතමයන් හා සමග තොපගේ කිසියම් කථාබහෙක් වූයේද?" "ස්වාමීනි, ශ්‍රමණ ගෞතමයන් හා සමග මාගේ කිසියම් කථා බහෙක් වූයේය."

"තපස්සිය, ශ්‍රමණගෞතමයන් හා සමග තොපගේ කිසියම් කථා බහෙක් කෙසේ නම් වූයේද?"

එකල්හි දීඝතපස්සී නිගණ්ඨතෙම භාග්‍යවතුන් වහන්සේ සමග පැවැත්වූ කථා සල්ලාපය යම්තාක් වීද, ඒ සියල්ල නිගණ්ඨනාත පුත්‍රයාට කීයේය.

8. මෙසේ කීකල්හි නිගණ්ඨනාත පුත්‍රතෙම දීඝතපස්සි නිගණ්ඨයාට මෙය කීයේය. "තපස්සිය, යහපත, යහපත, මනා කොටම ශාස්තෘහුගේ ශාසනය දන්නාවූ උගත් ශ්‍රාවකයෙකු විසින් යම්සේ නම් එසේම දීඝතපස්සී නම් නිගණ්ඨයා විසින් ශ්‍රමණ ගෞතමයන්හට ප්‍රකාශ කරණලදී. මෙසේ මහත්වූ මේ කාය දණ්ඩය හා සමකරන විට ලාමකවූ මනො දණ්ඩය කුමක්ද? කාය දණ්ඩයම පාපකර්ම කිරීමට පාප කර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදවේ. වාක් දණ්ඩය එසේ නොවේ. මනො දණ්ඩය එසේ නොවේයයි" (කීයේය)

මෙසේ කී කල්හි උපාලි ගෘහපතිතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි, තපස්සී තෙම යහපත, යහපත, මනාකොටම ශාස්තෘහුගේ ශාසනය දන්නාවූ උගත් ශ්‍රාවකයෙකු විසින් යම්සේද එසේම පින්වත් තපස්සී විසින් ශ්‍රමණ ගෞතමයන්හට ප්‍රකාශ කරනලදී. මේ මෙසේ මහත්වූ මේ කාය දණ්ඩය හා සම කරනවිට, ලාමකවූ මනො දණ්ඩය කුමක්ද? කාය දණ්ඩයම පාපකර්මය කිරීමට, පාප කර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරද වේ. වාක්දණ්ඩය එසේ නොවේ. මනො දණ්ඩය එසේ නොවේ. ස්වාමීනි, එබැවින් මමද යමි. ශ්‍රමණ ගෞතමයන්හට මේ කාරණයෙන් වාදය ආරෝපනය කරන්නෙමි. ඉදින් මට ශ්‍රමණ ගෞතම තෙමේ පින්වත් තපස්සී විසින් යම්සේ (ඒ කීමෙහි) පිහිටුවන ලදද, එසේ පිහිටන්නේ නම් යම්සේ බලවත් පුරුෂයෙක් දික් ලොම් ඇති එළුවෙකු ලොම් වලින් ගෙන මෙහාට අදින්නේද, තල්ලු කරන්නේද,

එහාමෙහා අදින්නේද, එපරිද්දෙන්ම මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාදකොට අදින්නෙමි. තල්ලු කරන්නෙමි. එහාට මෙහාට අදින්නෙමි. යම්සේ නම් බලවත්වූ හණවැහැරි සෝදන්නෙක් මහත්වූ සොණ්ඩිකා කළාලයක් (හණමිටියක්) ගැඹුරුවූ දියවිලෙහි බහා කොන්ගෙණ අදින්නේද, එහාට අදින්නේද මෙහාට අදින්නේද, එපරිද්දෙන්ම මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාද කොට අදින්නෙමි. එහාට අදින්නෙමි. මෙහාට අදින්නෙමි. එහා මෙහා අදින්නෙමි.

"යම්සේ නම්බලවත් වූ සුරා ධූර්තයෙක් රා පෙරන මටුලු කස්ස කොන් අල්වාගෙණ යටට පිඹින්නේද, ඉවතට පිඹින්නේද, නැවත නැවත ගසාදමන්නේද, එපරිද්දෙන්ම මම ශ්‍රමණ ගෞතමයන් වාදයෙන් වාදකොට පාතට පිඹින්නෙමි. බැහැරට පිඹින්නෙමි. ගසාදමන්නෙමි. යම්සේ නම් හැට අවුරුදුවූ හස්තියෙක් ගැඹුරුවූ පොකුණකට බැස හණදොවීම නම් ක්‍රීඩාවිශෙෂයකින් ක්‍රීඩාකෙරේද, එපරිද්දෙන්ම මම ශ්‍රමණ ගෞතමයන් හණදොවීම වැනිවූ ක්‍රීඩාවෙන් ක්‍රීඩා කරන්නෙමි. ස්වාමීනි, එබැවින් මමද යමි. ශ්‍රමණ ගෞතමයන්හට මේ කාරණයෙන් වාදය නගන්නෙමියි" කීයේය. "ගෘහපතිය, යව. නුඹ ශ්‍රමණ ගෞතමයන් සමග මේ කාරණයෙන් වාදකරව. ගෘහපතිය, මම හෝ වනාහී ශ්‍රමණ ගෞතමයාහට වාදය නගන්නෙමි. දීඝ තපස්සී නිගණ්ඨයා හෝ නුඹ හෝ (වාදකරන්නේයයි)" කීය.

**9.** මෙසේ කී කල්හි දීඝතපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්හට වාදය නගන්නේය යන යමක්වේද, මෙය මට රුචිනොවේ. ස්වාමීනි, ශ්‍රමණ ගෞතමතෙම වනාහී මායා දන්නේය. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් හරවාගනීද, එබඳුවූ පෙරළීම කරන්නාවූ මායාවක් දනීයයි" (කීය) තපස්සිය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, මෙයට කරුණු නැත්තේය. අවකාශ නැත්තේය. ශ්‍රමණ ගෞතමතෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද,

මෙයට නම් කරුණු ඇත්තේය. ගෘහපතිය, යව. නුඹ ශ්‍රමණ ගෞතමයන් හා සමග මේ කාරණයෙන් වාදකරව. ගෘහපතිය, මම හෝ වනාහි ශ්‍රමණ ගෞතමයාහට වාදය නගන්නෙමි. දීඝතපස්සි නිගණ්ඨතෙමේ හෝ (එසේ කරන්නේය) නුඹ හෝ එසේ කෙරෙහියයි" (කීයේය.)

**10.** දෙවනුවද දීඝ තපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්හට වාදය නගන්නේය යන යමක් වේද මෙය මට රුචි නොවෙයි. ස්වාමීනි ශ්‍රමණ ගෞතම තෙම මායා දන්නේය. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් පෙරලා ගණීද, එබඳුවූ පෙරලීම කරන්නාවූ මායාවක් දනී." "තපස්සීය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, මෙයට කරුණු නැත්තේය. අවකාශ නැත්තේය. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක්වේද මෙයට කරුණු ඇත්තේමය. ගෘහපතිය, යව. නුඹ ශ්‍රමණ ගෞතමයන් සමග මේ කාරණයෙහි වාද කරව. ගෘහපතිය, මම හෝ ශ්‍රමණ ගෞතමයාහට වාදය නගන්නෙමි. දීඝ තපස්සී නිගණ්ඨ තෙමේ හෝ නගන්නේය. නුඹ හෝ එසේ කෙරෙහිය." තුන්වෙනුවද, දීඝ තපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාහට මෙසේ කීවේය. "ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්හට වාදය නගන්නේය යන යමක් වේද මෙය මට රුචි නොවෙයි. ස්වාමීනි, ශ්‍රමණ ගෞතම තෙම මායා දන්නේය. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් පෙරලා ගණීද එබඳුවූ පෙරලීම කරන්නාවූ මායාවක් දනී." "තපස්සීය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක්වේද, එයට කරුණක් නැත. අවකාශයක් නැත. ශ්‍රමණ ගෞතම තෙමේ උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද මෙයට නම් කරුණු ඇත්තේය. ගෘශපතිය, යව. නුඹ ශ්‍රමණ ගෞතමයන් සමග මේ කාරණයෙන් වාද කරව. ගෘහපතිය, මම හෝ ශ්‍රමණ ගෞතමයන්හට වාදය නගන්නෙමි. දීඝ තපස්සී නිගණ්ඨ තෙම හෝ නගන්නේය. නුඹ හෝ එසේ කරන්නෙහියයි" කීයේය.

11. "ස්වාමීනි, එසේයයි" කියා උපාලි ගෘහපතිතෙම නිගණ්ඨනාත පුත්‍රයාට උත්තරදී හුනස්නෙන් නැගිට නමස්කාර කොට පාවාරික නම් අඹ උයන යම් තැනකද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක සිටියේය. එක් පැත්තක සිටියාවූ උපාලි ගෘහපතිතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, දීඝතපස්සී නිගණ්ඨ තෙම මෙහි ආයේද?" "ගෘහපතිය, දීඝතපස්සී නිගණ්ඨ තෙම මෙහි ආයේයයි" (වදාළහ.) "ස්වාමීනි, ඔබ වහන්සේගේ දීඝතපස්සී නිගණ්ඨයා සමග කිසියම් කථාබහෙක් වීදැයි" (ඇසීය). "ගෘහපතිය, දීඝතපස්සී නිගණ්ඨයා සමග මාගේ කිසියම් කථාබහෙක් වීයයි" (වදාළේය). "ස්වාමීනි, දීඝතපස්සී නිගණ්ඨයා සමග ඔබ වහන්සේගේ කෙබඳු කථාවක් වීදැයි" ඇසීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දීඝතපස්සී නිගණ්ඨයා සමග වූ කථාසල්ලාපය යම්තාක් වීද? ඒ සියල්ල උපාලි ගෘහපතියාහට කීහ.

12. මෙසේ කී කල්හි උපාලි ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, යහපත, යහපත, තපස්සී තෙම මනාකොටම ශාස්තෘහුගේ අනුශාසනය දන්නාවූ උගත් ශ්‍රාවකයෙකු විසින් යම් සේද එපරිද්දෙන්ම දීඝතපස්සී නිගණ්ඨයා විසින් භාග්‍යවතුන් වහන්සේට ප්‍රකාශ කරණලදී.

"මෙසේ මහත්වූ මේ කායදණ්ඩය හා සමකර බලනවිට ලාමකවූ මනොදණ්ඩය කුමක්ද? පාපකර්මය කිරීමට පාප කර්මයාගේ පැවැත්මට කායදණ්ඩයම ඉතා මහත් වරදවේ. වාක්දණ්ඩය එසේ නොවේ. මනොදණ්ඩය එසේ නොවේය"යි (කීයේය).

13. "ගෘහපතිය, ඉදින් නුඹ සත්‍යයෙහි පිහිටා කථාකරන්නෙහි නම් මෙහි අපගේ කථාසල්ලාපය වන්නේය"යි (වදාළහ) "ස්වාමීනි, මම සත්‍යයෙහි පිහිටා කථාකරන්නෙමි. මෙහි අපගේ කථාසල්ලාපය වේවා"යි (කීයේය). "ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? මේ ලොකයෙහි නිගණ්ඨයෙක්

හටගත් ආබාධ ඇත්තේ, දුකට පැමිණියේ, දැඩි ගිලන්වූයේ, සිහිල්දිය අත්හැරියේ උණු දිය සේවනය කරන්නෙක් වන්නේය. හෙතෙම සිහිල්දිය නොලබන්නේ කළුරිය කරන්නේය. ගෘහපතිය, නිගණ්ඨනාත පුත්‍රතෙම මොහු කොතැන්හි උපදීයැයි දක්වන්නේද?”

“ස්වාමීනි, මනොසත්ත නම් දෙවි කොටසක් ඇත්තේය. හෙතෙම එහි උපදියි.”

“එයට හේතු කවරේද?”

“ස්වාමීනි, හෙතෙම වනාහී සිත පිළිබඳ වූයේ කළුරිය කෙරේ”යයි (කීයේය). “ගෘහපතිය, ගෘහපතිය, කල්පනාකොට ප්‍රකාශකරව. නුඹගේ පළමු කීම හා පසුව කීම හෝ පසුව කීම හා පළමු කීම හෝ නොගැළපේ. ගෘහපතිය, ‘ස්වාමීනි, මම සත්‍යයෙහි පිහිටා කථා කරන්නෙමි. මෙහි අපගේ කථා සල්ලාපය වේවා’ යන මේ වචනය තොප විසින් කියන ලද්දේමය.

“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියන නමුත් කායදණ්ඩයම පාපකර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට ඉතා මහත් වරදවේ. වාක්දණ්ඩය එසේ නොවේ. මනො දණ්ඩය එසේ නොවේ”යයි (කීයේය).

14. “ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? මේ ලෝකයෙහි නිගණ්ඨයෙක් තෙම සතර ආකාර සංවරයෙන් සංවරවූයේ, සියලු පව්වලින් වැළකීමෙන් වලකින ලද පව් ඇත්තේ සියලු පව්වලින් වැලකීමෙන් යුක්ත වූයේ, සියලු පවින් වැලකීමෙන් දුරුකරන ලද පව් ඇත්තේ, සියලු පවින් වැලකීමෙන් ස්පර්ෂ කරන ලද්දෙක් වන්නේය. හෙතෙම ඉදිරියට ගමන් කරන්නේද පස්සට ගමන් කරන්නේද බොහෝවූ කුඩා සතුන් නසයි. ගෘහපතිය, නිගණ්ඨනාත පුත්‍රතෙම මොහුට කවර විපාකයක් දක්වාදැ”යි (ඇසූහ). “ස්වාමීනි, නිගණ්ඨනාත පුත්‍රතෙම නොසිතා කළ කර්මය මහාසාවද්‍ය (මහත් වරද) යයි නොදක්වන්නේය”යි (කීයේය). “ගෘහපතිය, ඉදින් සිතා කරයි නම්, (කෙසේද?) “ස්වාමීනි, මහාසාවද්‍යවේ.” “ගෘහපතිය, නිගණ්ඨනාත පුත්‍රතෙම

චෙතනාව කවර කොටසෙක්හි නියම කෙරේද?" "ස්වාමීනි, මනොදණ්ඩ කොටසෙහිය"යි (කීයේය). "ගෘහපතිය, ගෘහපතිය, කල්පනාකොට ප්‍රකාශ කරව. නුඹගේ පළමු වචනය හා පසුව කී වචනයද පසුව කී වචනය හා පළමු කී වචනයද නොගැළපේමය. ගෘහපතිය, 'ස්වාමීනි, මම සත්‍යයෙහි පිහිටා කථා කරන්නෙමි. මෙහි අපගේ කථා සල්ලාපය වේවා'යි තොප විසින් මේ වචනය කියන ලදමය." "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියන නමුත් කාය දණ්ඩයම පාපකර්මය කිරීමට පාපකර්මයාගේ පැවැත්මට මහාසාවද්‍යවේ. වාක්දණ්ඩය එසේ නොවේ. මනොදණ්ඩය එසේ නොවේ"යයි (කීයේය).

15. "ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? මේ නාලන්දාව සමෘද්ධි වූවාද ඉතා සමෘද්ධි වූවාද බොහෝ ජනයා ඇත්තීද? මිනිසුන්ගෙන් ගැවසීගන්නා ලද්දීද?" "ස්වාමීනි, එසේය. මේ නාලන්දාව සමෘද්ධි වූවාද ඉතා සමෘද්ධි වූවාද බොහෝ ජනයා ඇත්තීද, මිනිසුන්ගෙන් ගැවසීගන්නා ලද්දීද වේ. "ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? මෙහි ඔසවාගත් කඩුවක් ඇති පුරුෂයෙක් එන්නේය. හෙතෙම මෙසේ කියන්නේය. 'මම මේ නාලන්දා නුවර යම් පමණ ප්‍රාණීහු වෙත්ද, ඔවුන් එක ක්ෂණයකින් එක මොහොතකින් එකම මස් ගොඩක් එකම මස් රැසක් කරන්නෙමි'යි (කියන්නේය). ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? ඒ පුරුෂතෙම මේ නාලන්දා නුවර යම් පමණ ප්‍රාණීහු වෙත්ද, ඔවුන් එක ක්ෂණයකින් එක මොහොතකින් එකම මස් ගොඩක් එකම මස් රැසක් කරන්ට සමර්ථ වේද?"

"ස්වාමීනි, පුරුෂයන් දසදෙනෙකුත් විසිදෙනෙකුන් තිස් දෙනෙකුත් හතලිස් දෙනෙකුත් පණස් දෙනෙකුත් මේ නාලන්දා නුවර යම්තාක් ප්‍රාණීහු වෙත්ද, ඔවුන් එක ක්ෂණයකින් එක මොහොතකින් එකම මස් ගොඩක් එකම මස් රැසක් කරන්ට අසමර්ථ වෙත්. ලාමකවූ එක් පුරුෂයෙක් කෙසේ නම් සමර්ථ වේද" "ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? ඍද්ධිබල ඇති, හිත වසඟ කරගත් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මෙහි එන්නේය. හෙතෙම මෙසේ කියන්නේය. 'මම මේ නාලන්දා

නුවර එකම සිත දූෂ්‍යවීමකින් හළු කරන්නෙමි’යි (කියන්නේය). ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? ඍද්ධිබල ඇති, හිත වසඟ කරගත් එ මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ මේ නාලන්දා නුවර එකම සිත් දූෂ්‍යවීමකින් හළු කරන්ට සමර්ථ වේද?” “ස්වාමීනි, නාලන්දාව වැනි නුවරවල් දසයකුදු විස්සකුදු තිහකුදු හතලිහකුදු පණසකුදු සිත වසඟ කරගත් ඒ මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ එකම සිත් දූෂ්‍යවීමකින් හළු කරන්ට සමර්ථවේ. කුඩාවූ එකම නාලන්දා නුවර ගැන කියනු කිම?” “ගෘහපතිය, ගෘහපතිය, කල්පනා කොට කියව. නුඹගේ පළමු කීම හා පසුව කීමද පසුව කීම හා පළමු කීමද නොගැළපේමය. ගෘහපතිය, ‘ස්වාමීනි, මම සත්‍යයෙහි පිහිටා කථාකරන්නෙමි. මෙහි අපගේ කථාසල්ලාපය වේවා’යි මේ වචනය තොප විසින් කියන ලද මය.” “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙසේ කියන නමුත් කායදණ්ඩයම පාපකර්ම කිරීමට පාපකර්ම පැවැත්මට අතිශයින් මහාසාවද්‍යවේ. වචීදණ්ඩය එසේ නොවේ. මනොදණ්ඩය එසේ නොවේ”යයි (කීයේය).

**16.** “ගෘහපතිය, එය කුමකැයි හඟින්නෙහිද? දණ්ඩ කාරණ්‍යය, කාලිංගාරණ්‍යය, මෙද්ධ්‍යාරණ්‍යය, මාතංගාරණ්‍යය (යන මහවනයන්) ගම් විනාශවී මහා වනයන් වූ සැටි නුඹ විසින් අසන ලදද?” “ස්වාමීනි, එසේය. දණ්ඩකාරණ්‍යය, කාලිංගාරණ්‍යය, මෙධ්‍යාරණ්‍යය, මාතංගාරණ්‍යය ගම් විනාශ වී මහා වනයන්වූ සැටි මා විසින් අසන ලදී. “ගෘහපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? කවර කාරණයකින් ඒ දණ්ඩකාරණ්‍යය, කාලිංගාරණ්‍යය, මෙද්ධ්‍යරණ්‍යය, මාතංගාරණ්‍යය ගම් විනාශවී මහ වන වූයේ දැයි තොප විසින් අසන ලදද?” “ස්වාමීනි, ඍෂීන්ගේ සිත් දූෂ්‍යවීමෙන් ඒ දණ්ඩකාරණ්‍යය, කාලිංගාරණ්‍යය, මෙද්ධ්‍යාරණ්‍යය, මාතංගාරණ්‍යය, ගම් විනාශ වී ආරණ්‍යය වීයයි මෙය මා විසින් අසනලදී.” “ගෘහපතිය, ගෘහපතිය, කල්පනාකොට කියව. තොපගේ පළමු කීම හා පසුව කීමද පසුව කීම හා පළමු කීමද නොගැළපේමය. ගෘහපතිය, ‘ස්වාමීනි, මම සත්‍යයෙහි පිහිටා කථාකරන්නෙමි. මෙහි අපගේ කථා

සල්ලාපය වේවා'යි මේ වචනය තොප විසින් කියන ලදමයයි" (වදාළහ).

17. "ස්වාමීනි, මම පළමු උපමාවෙන්ම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සතුටු සිත් ඇත්තේ පැහැදුනෙමි. එතකුදු වුවත් මම මේ භාග්‍යවතුන් වහන්සේගේ විසිතුරුවූ ප්‍රශ්න විසඳීම් අසනුකැමැත්තේම මම භාග්‍යවතුන්වහන්සේට විරුද්ධව කථා කළ යුතුයයි හැඟීමි. ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළාවූවෙකුට මඟ කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි). භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වා"යි (කීයේය).

18. "ගෘහපතිය, සිතා බලා සුදුස්සක් කරව. සිතා බලා කිරීම නුඹ වැනි ප්‍රසිද්ධ මනුෂ්‍යයන්ට යහපත් වේ" යයි (වදාළහ). "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ 'සිතා බලා සුදුස්සක් කරව, සිතා බලා කටයුතු කිරීම තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන්ට යහපත් වෙයි, යන යමක් මට මෙසේ කීයේද, මේ කාරණයෙනුත් මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වැඩියක්ම සතුටු සිත් ඇත්තේ ප්‍රසන්න වූයේ වෙමි. ස්වාමීනි, අන්‍ය තීර්ථකයෝ වූකලී මා වැනියකු ශ්‍රාවකයෙකු (වශයෙන්) ලැබී නම් සියළු නාලන්දා නුවර උපාලි සිටුතෙම අපගේ ශ්‍රාවක බවට පැමිණියේයයි කොඩි නංවන්නාහුය. එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ මට මෙසේ වදාළහ. 'ගෘහපතිය, හිතා බලා සුදුස්සක් කරව. හිතා බලා කටයුතු කිරීම තොප වැනි ප්‍රසිද්ධ මිනිසුන්ට යහපත් වේ' (කියායි). ස්වාමීනි, ඒ මම දෙවනුත් භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි).

භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිම්කොට සරණ ගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වා"යි (කීයේය)

**19.** "ගෘහපතිය, නුඹගේ කුලය බොහෝ කලක් නිගණ්ඨයන්ට පිළියෙල කළ ළිඳක් (පැන්මඩුවක්) මෙන් වේද? එහෙයින් ගෙට ආවාවූ ඔවුන්ට ආහාර දිය යුතුයයි හඟින්නෙහිය"යි (වදාළහ). "ස්වාමීනි යම්හෙයකින් මට භාග්‍යවතුන් වහන්සේ 'ගෘහපතිය, බොහෝ කලක් තොපගේ කුලය නිගණ්ඨයන්ට පිළියෙල කළ ළිඳක් මෙන් වීද, එහෙයින් පැමිණියාවූ ඔවුන්ට ආහාරය දිය යුතු කොට හඟින්නෙහිය'යි මෙසේ වදාළේද, මෙයින්ද මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි වැඩියක්ම සතුටු සිත් ඇත්තේ ප්‍රසන්න වූයේ වෙමි.

"ස්වාමීනි, 'ශ්‍රමණ ගෞතම තෙම මටම දානය දිය යුතුයි අන්‍යයන්ට දානය දිය යුතු නොවේ. මගේම ශ්‍රාවකයන්ට දානය දිය යුතුයි. අනුන්ගේ ශ්‍රාවකයන්ට දානය දිය යුතු නොවේ. මටම දෙන ලද්ද මහත් ඵල වෙයි. අනුන්ට දෙන ලද්ද මහත් ඵල නොවෙයි. මගේම ශ්‍රාවකයන්ට දෙන ලද්ද මහත්ඵල වෙයි. අනුන්ගේ ශ්‍රාවකයන්ට දෙන ලද්ද මහත් ඵල නොවේය'යයි කියන්නේයයි මා විසින් අසන ලදී. එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ මා නිගණ්ඨයන් හටද දීමෙහි සමාදන් කරවයි. ස්වාමීනි, එහෙත් ඒ දීමෙහි අපි මෙහි කල් දනිමු. ස්වාමීනි, ඒ මම තුන්වෙනුවත් භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමි). භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වා"යි (කීයේය).

**20.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උපාලි ගෘහපතියාහට පිළිවෙල කථාව වදාළේය. එනම් දානය පිළිබඳ කථාවය, සීලය පිළිබඳ කථාවය, ස්වර්ගය පිළිබඳ කථාවය, පඤ්ච කාමයන්ගේ දොෂය, ලාමක බවය, කෙලෙසීමය, නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසය ප්‍රකාශ කළහ. භාග්‍යවතුන් වහන්සේ යම් කලක උපාලි ගෘහපතියා නිරෝගි සිත් ඇත්තෙකු, මෘදු සිත් ඇත්තකු නීවරණයන් පහව ගිය සිත් ඇත්තකු, ඔද වැඩි සිත් ඇත්තකු,

ප්‍රශන්න සිත් ඇත්තකු යයි දැනගත් සේක්ද? එකල්හි බුදුවරයන්ගේ තමන් විසින්ම අවබොධ කරගන්නාලද දුකය, දුකට හේතුය, දුක් නැති කිරීමය, දුක් නැති කිරීමේ මාර්ගය යන චතුස්සත්‍ය ධර්මයක් වේද, එය ප්‍රකාශ කළහ.

යම්සේ නම් පහව ගිය කළු පැහැ ඇති පිරිසිදු වස්ත්‍රය මනාකොටම රජනය (සායම) අල්වා ගන්නේද, එපරිද්දෙන් උපාලි ගෘහපතියා ඒ ආසනයෙහිම යම් කිසිවක් හටගැණීම ස්වභාව කොට ඇත්තේද, ඒ සියල්ල නැතිවීම ස්වභාව කොට ඇත්තේය යන රාගාදී රජස් රහිතවූ පහවූ රාගාදී මළ ඇති ධර්ම චක්ෂුස (සොතාපත්ති මාර්ග ඥානය) පහළ වූයේය.

21. ඉක්බිති උපාලි ගෘහපති තෙම දක්නා ලද ආර්‍ය්‍ය සත්‍ය ධර්ම ඇත්තේ පැමිණෙනලද සත්‍ය ධර්ම ඇත්තේ, දැන ගන්නා ලද සත්‍ය ධර්ම ඇත්තේ, බැසගත් සත්‍ය ධර්ම ඇත්තේ, තරණය කළාවූ සැක ඇත්තේ, පහවගියාවූ සැක ඇත්තේ, විශාරද බවට පැමිණියේ, ශාස්තෲ ශාසනයෙහි පරප්‍රත්‍ය රහිත වූයේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, දැන් අපියමු. අපි බොහෝ කෘත්‍ය ඇත්තෝ බොහෝ කටයුතු ඇත්තෝ වෙමු." "ගෘහපතිය, නුඹ දැන් ඊට කාලය දනුව"යි (වදාළහ.)

ඉක්බිත්තෙන් උපාලි ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ මනා කොට වැඳ ස්වකීය ගෘහය යම් තැනකද එතැනට ගියේය. ගොස් දොරටු පාලයා කැඳවීය. (කැඳවා) යහළු දොරටු පාලය, අද පටන් නිගණ්ඨයන්ට හා නිගණ්ඨීන්ට දොර වසමි. භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද දොර නොවසන ලද්දේ වෙයි. ඉදින් කිසියම් නිගණ්ඨයෙක් එයි නම් ඔහුට නුඹ මෙසේ කියව, "ස්වාමීනි, සිටුව මැනව, ඇතුල් නොවෙව, අද පටන් උපාලි සිටුතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය. නිගණ්ඨයන්ටද නිගණ්ඨීයන්ටද දොර වසනලදී. භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද

උපාසිකාවන්ටද දොර හරිනලදී. ස්වාමීනි, ඉදින් ඔබට ආහාරයෙන් ප්‍රයෝජන ඇත්තේ නම් මෙහිම සිටුව මැනව, මෙහිම ඔබට ආහාර ගෙනෙන්නාහුය’යි (කියව) “එසේය ස්වාමීනි”යි දොරටු පාල තෙම උපාලි සිටුහට උත්තර දුන්නේය.

22. දීඝතපස්සී නිගණ්ඨතෙම, උපාලි ගෘහපති තෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන්න ඇසුවේය. ඉක්බිති දීඝතපස්සී නිගණ්ඨ තෙම නිගණ්ඨනාත පුත්‍රයා යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් නිගණ්ඨනාත පුත්‍රයාට මෙසේ කීයේය. “ස්වාමීනි, උපාලි ගෘහපති තෙමේ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය. යන මෙය මා විසින් අසන ලදී.” “තපස්සිය, උපාලි ගෘහපති තෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, ඊට හේතු නැත. අවකාශ නැත. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, මෙයට කරුණු ඇත්තේය.”

23. දෙවනුවද දීඝ තපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. “ස්වාමීනි, උපාලි ගෘහපති තෙමේ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන මෙය මා විසින් අසනලදී.” “තපස්සිය, උපාලි ගෘහපති තෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, ඊට හේතු නැත. අවකාශ නැත. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණේන්නේය යන යමක් වේද, ඊට කරුණු ඇත්තේය” තුන් වෙනුවද දීඝ තපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. “ස්වාමීනි, උපාලි ගෘහපතිතෙමේ වනාහි ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන මෙය මා විසින් අසනලදී.” “තපස්සිය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක්වේද, ඊට කරුණු නැත. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද ඊටම කරුණු ඇත්තේය”යි (කීයේය.)

"එසේනම් ස්වාමීනි, මම යමි. ඉදින් උපාලි ගෘහපති තෙමේ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේ හෝ වේද, නොපැමිණියේ හෝ වේදැයි දැනගනිමි." "තපස්සිය, නුඹ යව. උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේ හෝ වේද, නොපැමිණියේ හෝ වේදැයි දැනගනුව"යි (කීයේය) එකල්හි දීඝ තපස්සී නිගණ්ඨ තෙම උපාලි ගෘහපතියාගේ ගෘහය යම් තැනෙක්හිද, එහි ගියේය.

24. දොරටුපාලතෙම එන්නාවූ දීඝ තපස්සී නම්වූ නිගණ්ඨයා දුරදීම දුටුයේය. දැක දීඝ තපස්සී නම් නිගණ්ඨයාට මෙය කීයේය. "ස්වාමීනි, සිටිනු මැනව. ඇතුල් නොවෙනු මැනව. අද පටන් උපාලි සිටුතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය. නිගණ්ඨයන්ටද නිගණ්ඨීන්ටද දොර වසනලදී. භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද දොර හරිනලදී. ස්වාමීනි, ඉදින් නුඹ වහන්සේට ආහාරයෙන් ප්‍රයෝජන ඇත්තේ නම් මෙහිම සිටිනු මැනව. මෙතැනට ගෙනෙනවා ඇතැ"යි කීයේය.

"ඇවැත්නි, මට ආහාරයෙන් ප්‍රයොජනයක් නැතැ"යි කියා එයින් පෙරළා නිගණ්ඨනාත පුත්‍රතෙම යම් තැනෙක්හිද එහි ගියේය. ගොස්, නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. 'ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන යමක් ඇද්ද එය සැබෑමය.'

25. "ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ට වාදාරෝපනය කරන්නේය යන යමක් වේද, මෙය මට රුචි නොවේමය, ස්වාමීනි, ශ්‍රමණ ගෞතම තෙමේ වනාහි මායා කාරයෙක. යම් මායාවකින් අන්‍යතීර්ථකයන්ගේ ශ්‍රාවකයන් පෙරළා ගනීද, එබඳු පෙරළාගන්නා මායාවක් දනීය"යි මා කීවිට ඔබවහන්සේගෙන් ඊට අවසර නොලැබීමි. ස්වාමීනි, නුඹවහන්සේගේ උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන් විසින් ආවර්තනිමායාවෙන් පෙරළා ගන්නාලද්දේමයයි" (කීයේය)

"තපස්සිය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, එයට හේතු

නැත. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, එයටම හේතු ඇත.”

**26.** දෙවනුවද දීඝ තපස්සි නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. “ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන යමක් වේද එය සැබෑමය. ස්වාමීනි, උපාලි ගෘහපති තෙම ශ්‍රමණ ගෞතමයන්ට වාදාරොපනය කරන්නේය යන යමක් වේද, මෙය මට රුචි නොවේමය. ස්වාමීනි ශ්‍රමණ ගෞතම තෙම මායාකාරයෙකි. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් පෙරලා ගනීද එබඳු ආවර්තනී මායාවක් දනීයයි මා කීවිට ඔබවහන්සේ ගෙන් ඊට අවසර නොලැබුනේය. ස්වාමීනි ඔබ වහන්සේගේ උපාලි ගෘහපති තෙම ශ්‍රමණ ගෞතමයන් විසින් ආවර්තනී මායාවෙන් පෙරලා ගන්නා ලද්දේයයි” කීය. “තපස්සිය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද ඊට හේතු නැත් මැයි. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද ඊටම හේතු ඇත්තේ වේ.’ තුන්වෙනුවද දීඝ තපස්සී නිගණ්ඨතෙම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය ‘ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය යන යමක් වේද, එය සැබෑමය. ‘ස්වාමීනි, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්හට වාදාරෝපනය කරන්නේය යන යමක් වේද මෙය මට රුචිනොවේමය. ස්වාමීනි, ශ්‍රමණ ගෞතම තෙමේ වනාහී මායාකාරයෙක. යම් මායාවකින් අන්‍ය තීර්ථකයන්ගේ ශ්‍රාවකයන් පෙරළාගනීද, එබඳුවූ ආවර්තනී මායාවක් දනීයයි මා කීවිට ඔබවහන්සේ ගෙන් ඊට අවසර නොලැබුණේය. ස්වාමීනි, නුඹ වහන්සේගේ උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන් විසින් ආවර්තනී මායාවෙන් පෙරළා ගන්නා ලද්දේමයයි” කීය. “තප්සසිය, උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක්වේද, ඊට කරුණු නැත්තේමය, අවකාශයක් නැත. ශ්‍රමණ ගෞතම තෙම උපාලි ගෘහපතියාගේ ශ්‍රාවක බවට පැමිණෙන්නේය යන යමක් වේද, ඊටම කරුණු ඇත. තපස්සිය, එබැවින් මමද යමි.

ඉදින් උපාලි ගෘහපතිතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේ හෝ වේද, නොපැමිණියේ හෝ වේදැයි මමම දැන ගනිමි"යි (කීය). ඉක්බිති නිගණ්ඨනාත පුත්‍රතෙම මහත්වූ නිගණ්ඨ පිරිස හා සමග උපාලි ගෘහපතියාගේ ගෘහය යම් තැනෙක්හිද එහි ගියේය.

**27.** දොරටු පාලතෙම එන්නාවූ නිගණ්ඨනාත පුත්‍රයා දුර දීම දුටුයේය. දැක නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි, සිටිනුමැනව ඇතුළු නොවෙනු මැනව. අද පටන් උපාලි සිටුතෙම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක බවට පැමිණියේය. නිගණ්ඨයන්ටද නිගන්ථීන්ටද දොර වසනලදී. භාග්‍යවතුන් වහන්සේගේ භික්ෂූන්ටද භික්ෂුණීන්ටද උපාසකයන්ටද උපාසිකාවන්ටද දොර හරිනලදී. ස්වාමීනි, ඉදින් නුඹ වහන්සේට ආහාරයෙන් ප්‍රයෝජන ඇත්තේනම් මෙහිම සිටිනු මැනව මෙතැනට ගෙනෙනවා ඇතැයි" කීය.

"යහළු දොරටු පාලය එසේවීනම්, උපාලි ගෘහපතිතෙම යම තැනකද එහි යව. ගොස් උපාලි ගෘහපතියාට මෙසේ කියව. "ස්වාමීනි, නිගණ්ඨනාත පුත්‍රතෙම මහත්වූ නිගණ්ඨ පිරිස සමග දොර කොටුවෙන් පිටත සිටියේය. හෙතෙමෙ නුඹ වහන්සේගේ දැකීම කැමැත්තේයයි. (කියව)" "එසේය ස්වාමීනි" කියා දොරටු පාලතෙම නිගණ්ඨනාත පුත්‍රයාට උත්තරදී උපාලි ගෘහපතියා යම් තැනකද එහි ගියේය. ගොස් උපාලි ගෘහපතියාට මෙය කීයේය. "ස්වාමීනි, නිගණ්ඨනාත පුත්‍රතෙම මහත්වූ නිගණ්ඨ පිරිස සමග දොරටුකොටුවෙන් පිටත සිටියේය. හෙතෙම නුඹ වහන්සේගේ දැකීම කැමැත්තේයයි" (කීය.)

"යහළු දොරටු පාලය, එසේ වී නම් මද්ධ්‍යම ද්වාරශාලාවෙහි ආසන පනවවයි" (කීය.) "එසේය ස්වාමීනි," කියා දොරටු පාලතෙම උපාලි ගෘහපතියාට උත්තරදී, මද්ධ්‍යම ද්වාර ශාලාවෙහි අසුන් පනවා උපාලි ගෘහපතිතෙම යම් තැනෙක්හිද එහි ගියේය. ගොස් උපාලි ගෘහපතියාට මෙය කීයේය. "ස්වාමීනි, මැදවූ දොරටු ශාලාවෙහි නුඹ වහන්සේට අසුන් පනවන ලදහ. එයට දැන් කල් දන්නෙහියයි" (කීයේය.)

28. ඉක්බිති උපාලි ගෘහපතිතෙම මැද ද්වාරශාලාව යම් තැනකද එහි ගියේය. ගොස් එහි යම් ආසනයක් අග්‍රවීද, ශ්‍රෙෂ්ඨ වීද, උතුම්වීද, ප්‍රණීතවීද එහි හිඳ දොරටුපාලයාට මෙසේ කීය. "යහළු දොරටුපාලය, එසේවීනම් නිගණ්ඨනාත පුත්‍රයා යම් තැනෙක්හිද, එහි යව. ගොස් නිගණ්ඨනාත පුත්‍රයාට "ස්වාමීනි, ඉදින් කැමතිනම් ඇතුල්වුව මැනවයි උපාලි ගෘහපතිතෙම කියන්නේයයි කියව", "එසේය ස්වාමීනි" කියා දොරටුපාල තෙම උපාලි ගෘහපතියාට උත්තර දී නිගණ්ඨනාත පුත්‍රයා යම් තැනෙක්හිද එහි ගියේය. ගොස් නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය.

"ස්වාමීනි, ඉදින් කැමැත්තෙහි නම් ඇතුල්වුව මැනවයි උපාලි සිටු තෙමේ කීයේය"යි කීය.

ඉක්බිති නිගණ්ඨනාත පුත්‍රතෙම මහත්වූ නිගණ්ඨ පිරිස සමග මැද ද්වාර ශාලාව යම් තැනකද එතැනට පැමිණියේය. එකල්හි උපාලි ගෘහපතිතෙම පෙර යම් නිගණ්ඨනාත පුත්‍රයෙකු දුරදීම එන්නහු යම් තැනකදී දකීද, එතැනදී පෙර ගමන්කොට එහි යම් ආසනයක් අග්‍රද, ශ්‍රෙෂ්ඨද, උතුම්ද ප්‍රණීතද, එය උතුරු සළුවෙන් පිසදමා හාත්පසින් අල්වා ගෙන හිඳුවාද, හෙතෙම දැන් එහි යම් ආසනයක් අග්‍රද, ශ්‍රෙෂ්ඨද, උත්තමද, ප්‍රණීතද, එහි තෙමේ හිඳ, නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි ආසන ඇත්තාහ. ඉදින් කැමැත්තෙහි නම් හිඳගනු මැනව"යි (යනුයි)

මෙසේ කීකල්හි නිගණ්ඨනාත පුත්‍රතෙම උපාලි ගෘහපතියාට මෙය කීයේය. "ගෘහපතිය, නුඹ උමතු වූයෙහිද? ගෘහපතිය, නුඹ ජඩවූ යෙහිද? 'ස්වාමීනි, මම යමි. ශ්‍රමණ ගෞතමයන්ට වදාරොපනය කරන්නෙමි'යි ගොස් මහත්වූ වාද බැම්මකින් වෙළී ආයේ වෙහිද? ගෘහපතිය, යම්සේ අණ්ඩහාරක පුරුෂයෙක් (සතුන් කප්පාදු කරන්නෙක්) ගොස් තමාගේ අණ්ඩය උදුරා දමනු ලැබ එන්නේද, ගෘහපතිය, යම්සේ හෝ ඇස් උදුරන්නාවූ පුරුෂයෙක් ගොස් උදුරණලද ඇස් වලින් යුක්තව එන්නේද, ගෘහපතිය, එපරිද්දෙන්ම නුඹ 'ස්වාමීනි, මම යමි. ශ්‍රමණ

ගෞතමයන්ට වාදාරොපණය කරන්නෙමි’යි ගොස් මහත්වූ වාද බැම්මකින් වෙළී ආයෙහිය ගෘහපතිය, නුඹ වනාහි ශ්‍රමණ ගෞතමයන් විසින් ආවර්තනී මායාවෙන් පෙරළා ගත්තෙහිය”යි (කීයේය.)

“ස්වාමීනි, ආවර්තනීමායාව හොඳය. ස්වාමීනි, ආවර්තනී මායාව යහපති. ස්වාමීනි, මාගේ ප්‍රිය නෑ සහ ලේ නෑයෝ මේ ආවර්තනී මායාවෙන් පෙරළෙන්නාහු නම්, එය මගේ ප්‍රියවූ, නෑ සහ ලේ නෑයන්ට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය. ස්වාමීනි, සියලු ක්ෂත්‍රියයෝ මේ ආවර්තනී මායාවෙන් පෙරළෙන්නාහු නම්, එය, ඒ සියලු ක්ෂත්‍රියයන්ට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය. ස්වාමීනි, ඉදින් සියළු බ්‍රාහ්මණයෝද මේ ආවර්තනී මායාවෙන් පෙරලෙන්නාහු නම්, ඒ සියලු බ්‍රාහ්මණයන්ටද බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය, ඉදින් සියලු වෛශ්‍යයෝද මේ ආවර්තනී මායාවෙන් පෙර ලෙන්නාහු නම්, එය සියලු වෛශ්‍යයන්ටද බොහෝ කාලයක් හිත පිණිස සැප පිණිස වන්නේය. ඉදින් සියලු ශුද්‍රයෝද මේ ආවර්තනී මායාවෙන් පෙරලෙන්නාහු නම් එය සියළු ශුද්‍රයන්ටද බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය. ස්වාමීනි, ඉදින් දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයද, මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාවද මේ ආවර්තනීමායාවෙන් පෙරලෙන්නේ නම්, එය දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ලොකයටද, මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාවටද බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය. ස්වාමීනි, එසේ වීනම් නුඹ වහන්සේට උපමාවක් කියන්නෙමි. මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ උපමාවෙන්ද කියූ දෙයෙහි අර්ථය දැනගනිත්.

“ස්වාමීනි, පෙරවූ දෙයක් කියමි. ජරාවට ගියාවූ වයස් ගතවූ මහළුවූ එක්තරා බ්‍රාහ්මණයෙකුගේ ගැබිණිවූ වැදීමට ලන්වූ තරුණ මෙනෙවි අඹුවක් විය. ස්වාමීනි, ඉක්බිති ඒ මෙණෙවිය ඒ බමුණාට මෙසේ කීය. ‘බ්‍රාහ්මණය, නුඹ යව. මාගේ කුමාරයාට සෙල්ලම් කරනු ‘පිණිස කඩ පිළෙන් වඳුරු පැටවෙකු මිළදී

ගෙනෙව' (කියාය) ස්වාමීනි, මෙසේ කීකල්හි ඒ බමුණුතෙම ඒ මෙනෙවියට මෙසේ කීයේය. 'පින්වතිය, යම්තාක් වදන්නෙහිද, ඒ තාක් බලාපොරොත්තු වෙව, පින්වතිය, ඉදින් නුඹ කුමරෙකු වදන්නෙහි නම් නුඹගේ ඒ කුමරුවාට සෙල්ලම් කරනු පිණිස කඩ පිලෙන් වඳුරු පැටවෙකු මිළදී ගෙනෙන්නෙමි. පින්වතිය, ඉදින් නුඹ කුමරියක් වදන්නෙහි නම් නුඹගේ ඒ කුමරියට සෙල්ලම් කරන පිණිස කඩපිළෙන් වඳුරු පැටවියක් මිළදී ගෙණෙන්නෙමි'යි කීයේය.

**29.** "ස්වාමීනි, දෙවනුවද ඒ මෙණෙවිය ඒ බමුණාට මෙය කීය. 'බ්‍රාහ්මණය, මගේ කුමරුවාට සෙල්ලම් කරන පිණිස කඩපිළෙන් වඳුරු පැටවෙකු මිළදී ගෙණෙව' ස්වාමීනි, දෙවනුවත් ඒ බමුණුතෙම ඒ මෙණෙවියට මෙය කීයේය. 'පින්වතිය, යම්තාක් වදන්නෙහිද ඒ තාක් බලාපොරොත්තු වෙව. පින්වතිය, ඉදින් නුඹ කුමරෙකු වදන්නෙහි නම් නුඹගේ ඒ කුමරුට සෙල්ලම් කරනු පිණිස මම කඩපිළෙන් වඳුරු පැටවෙකු මිළදී ගෙනෙන්නෙමි. පින්වතිය, ඉදින් නුඹ කුමරියක් වදන්නෙහි නම් නුඹගේ ඒ කුමරියට සෙල්ලම් කරනු පිණිස මම කඩපිළෙන් වඳුරු පැටවියක් මිළදී ගෙනෙන්නෙමි.'

**30.** "ස්වාමීනි, තුන්වනුවද ඒ මෙණෙවිය ඒ බමුණාට මෙය කීය. 'බ්‍රාහ්මණය, නුඹ යව, මගේ කුමරුවාට සෙල්ලම් කරන පිණිස කඩ පිළෙන් වඳුරු පැටවෙකු මිළදී ගෙනෙව.' ස්වාමීනි, එකල්හි ඒ බමුණුතෙම ඒ මෙණෙවිය කෙරෙහි ඇලුම් ඇත්තේ පිළිබඳ සිත් ඇත්තේ කඩපිළෙන් වඳුරු පැටවෙකු මිළදී ගෙණවුත් ඒ මෙණෙවියට මෙසේ කීයේය. 'පින්වතිය නුඹගේ කුමරුට සෙල්ලම් කරනු පිණිස නුඹට කඩපිළෙන් මේ වඳුරු පැටවා මිළදී ගෙන ආවෙමියි' කීය. ස්වාමීනි, මෙසේ කීකල්හි ඒ මෙණෙවිය ඒ බමුණාට මෙසේ කීය. 'බ්‍රාහ්මණය, නුඹ යව, මේ වඳුරු පැටවා ගෙණ රක්තපාණී නම් රජක පුත්‍රයා (සායම් ගාන්නා) යම් තැනකද එතැනට ගොස් රක්තපාණී නම් රජක පුත්‍රයාට මෙසේ කියව. යහළු රක්තපාණිය, මම මේ වඳුරු පැටවා පීතාවලෙපන නම් රන්වන් පාට කරන සායමින් සායම් කරන ලද්දකු, නැවත නැවත සායම් පොවන ලද්දෙකු දෙපස

මදින ලද්දෙකු කරනු කැමැත්තෙමියි.' (කියව) ස්වාමීනි, ඉක්බිති ඒ බමුණු තෙම ඒ මෙණෙවිය කෙරෙහි ඇලුම් ඇත්තේ පිළිබඳ සිත් ඇත්තේ ඒ වඳුරු පැටවා ගෙණ රක්තපාණී නම් රජක පුත්‍රයා යම් තැනකද එහි ගියේය. ගොස් රක්තපාණී නම් රජකපුත්‍රයාට මෙය කීයේය. 'යහළු රක්තපාණිය, මම මේ වඳුරු පැටවා රන්වන්පාට කරන පීතාවලෙපන නම් සායමින් සායම් කරන ලද්දෙකු නැවත නැවත පොවන ලද්දෙකු දෙපස මදින ලද්දෙකු කරනු කැමැත්තෙමියි කීය. ස්වාමීනි මෙසේ කීකල්හි රක්තපාණී නම් රජකපුත්‍ර තෙම ඒ බමුණාට මෙය කීයේය. 'ස්වාමීනි, නුඹගේ මේ වඳුරු පැටවා පාටකිරීමට සුදුසුය. නැවත නැවත තලා පෙවීමට සුදුසු නොවෙයි නැවත නැවත මැදීමට සුදුසු නොවේය'යි (කීයේය.)

"ස්වාමීනි, එපරිද්දෙන්ම අඥානවූ නිගණ්ඨයන්ගේ වාදය අඥානයන්ට පිටතින් පාට කිරීමට නම් සුදුසු වේමැයි. නුවණැත්තන්ට යෙදීමටවත් විමසීමටවත් සුදුසු නොවේ, ස්වාමීනි, ඉක්බිති ඒ බ්‍රාහ්මණ තෙමේ මෑත කලෙක අළුත්වූ වස්ත්‍ර දෙකක් ගෙණ රක්තපාණී නම්, රජක පුත්‍රයා යම් තැනකද එහි ගියේය. ගොස් රක්තපාණී නම් රජක පුත්‍රයාට මෙය කීයේය. 'යහළු රක්තපාණිය, මේ අළුත්වූ වස්ත්‍ර දෙක (රන්වන් පැහැයෙන් පාට කරණ ලද්දක්) නැවත නැවත තලා පොවන ලද්දක් දෙපස මදින ලද්දක් (කරනු) කැමැත්තෙමි'යි (කීය). ස්වාමීනි, මෙසේ කී කල්හි රක්තපාණී නම් රජක පුත්‍රතෙම ඒ බමුණාට මෙය කීයේය. 'ස්වාමීනි, නුඹගේ මේ අළුත්වූ වස්ත්‍ර දෙක සායම්, පෙවීමටද සුදුසුමය, පොඩිකිරීමටද සුදුසුය මැදීමටද සුදුසුයයි' (කීය) ස්වාමීනි, එපරිද්දෙන්ම ඒ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේගේ වාදය නුවණැත්තන්ට ප්‍රියවීමටද සුදුසු වේ මැයි. අඥානයන්ට ප්‍රිය නොවේ. නැවත නැවත යෙදීමටද සුදුසුවේ. විමසීමටද සුදුසු වේයයි" (කීයේය)

31. "ගෘහපතිය, රජුන් සහිත පිරිස උපාලි ගෘහපතිතෙම නිගණ්ඨනාත පුත්‍රයාගේ ශ්‍රාවකයෙකැයි දනියි. ගෘහපතිය තොප කවරෙකුගේ ශ්‍රාවකයෙකැයි දරම්දැයි" (ඇසීය) මෙසේ කී කල්හි උපාලි ගෘහපති තෙම හුනස්නෙන් නැගිට උතුරු සළුව

ඒකාංසකොට, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එදෙසට දොහොත් මුදුන්දී වැඳ නිගණ්ඨ නාත පුත්‍රයාට මෙය කීයේය. "ස්වාමීනි, එසේ වී නම් මම යමෙකුගේ ශ්‍රාවකයෙක්ද යනු අසනු මැනව.

1. "මම, පණ්ඩිතවූ, පහවූ මොහය ඇති විශෙෂයෙන් බිඳිනලද පඤ්චචෙතොඛිල (පස්වැදෑරුම් හිතේ උල්) ඇති මාරයන් පරදවා ලබනලද විජය ඇති, නිදුක්වූ මනා සමවූ සිත් ඇති, වැඩුනාවූ ආචාර සිල් ඇති යහපත් ප්‍රඥා ඇති රාගාදී විෂම තරණය කළාවූ රාගාදීමල රහිතවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

2. මම, සැක නැත්තාවූ සතුටු සිත් ඇත්තාවූ වමාරණ ලද කාම ගුණ ඇති, මෘදුවූ, කරනලද මහණදම් ඇති, අසහාය මනුෂ්‍යවූ අන්තිම ශරීරය ඇති මනුෂ්‍යවූ, උපමා රහිතවූ, පහවූ රාගාදි රජස් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

3. මම, සැක රහිතවූ දක්ෂවූ සත්වයන් හික්මවන්නාවූ උතුම් සාර්ථවාහකයෙකු බඳුවූ නිරුත්තරවූ පවිත්‍ර ධර්ම ඇත්තාවූ සැක රහිතවූ ආලොක කරන්නාවූ සිඳින ලද මානය ඇත්තාවූ වීර්‍ය්‍ය සම්පන්නවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

4. "මම, නිසභවූ (සියල්ලන්හට ශ්‍රෙෂ්ඨවූ) ප්‍රමාණ රහිතවූ ගුණයෙන් ගැඹුරුවූ, නුවණට පැමිණියාවූ නිර්භය කරන්නාවූ ඥාණය ඇත්තාවූ, ධර්මයෙහි පිහිටියාවූ සංවර කරනලද ආත්මය ඇති, රාගාදී කෙලෙස් පහකළාවූ කෙලෙසුන්ගෙන් මිදුනාවූ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

5. "මම කරුණු සතරකින් ශ්‍රෙෂ්ඨවූ, වනසෙනසුන් ඇත්තාවූ, විනාශ කරන ලද සංයෝජන ඇත්තාවූ, මිදුනාවූ, ප්‍රතිමන්ත්‍රණ ප්‍රඥාවෙන් යුක්තවූ, සෝදාහළ කෙලෙස් ඇත්තාවූ, මානය නැති කළාවූ, පහවූ රාග ඇති, දමනයවූ, ප්‍රපඤ්ච රහිතවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

6. "මම, සත්වන සෘෂිවූ, කුහකනොවූ, ත්‍රිවිද්‍යා ඇත්තාවූ, ශ්‍රෙෂ්ඨ බවට පැමිණියාවූ, සෝදාහළ කෙලෙස් ඇති, ගාථා පදකිරීමෙහි දක්ෂවූ, සැහැල්ලුවූ, දන්නාලද නුවණ ඇති, සියල්ලන්ට පළමු ධර්මදානය දුන්නාවූ, සමර්ථවූ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

7. "මම, ආයර්‍යවූ, වඩනාලද සිත් ඇති, පැමිණියයුතු ගුණයන්ට පැමිණියාවූ, විස්තරකොට අර්ථ ප්‍රකාශකරන්නාවූ, සිහි ඇත්තාවූ, විශෙෂයෙන් දක්නා නුවණ ඇති, අර්හත්වූ, දුෂ්ටනොවූ, තෘෂ්ණා රහිතවූ, වසඟභාවයට පැමිණියාවූ, ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

8. "මම, යහපත් මාර්ගයට පැමිණියාවූ, ධ්‍යාන ඇත්තාවූ, කෙලෙසුන් විසින් අනුමානය නොකරණලද සිත් ඇත්තාවූ, පිරිසිදුවූ, නොබැඳුනාවූ, ප්‍රහීණ නොවූ, උතුම් විවෙකය ඇත්තාවූ, අග්‍ර බවට පැමිණියාවූ, තෙමේ එතෙරවූ, අනුන් එතෙර කරන්නාවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

9. "මම, සාන්තවූ, පොළොවක් මෙන් පතළාවූ නුවණ ඇති, මහත්වූ ප්‍රඥා ඇති, පහව ගියාවූ ලොභ ඇති, තථාගතවූ, මනා ගමන් ඇති, සමාන පුද්ගලයන් නැත්තවූ, අසමවූ, විශාරදවූ, නිපුණවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි.

10. "මම, සිඳිනලද තෘෂ්ණා ඇති, චතුස්සත්‍යය අවබොධ කළාවූ, පහවූ කෙලෙස් දුම් ඇති, තෘෂ්ණාදෘෂ්ටි තැවරීම් වලින් නොතැවරුණාවූ, පූජා පිළිගැනීමට සුදුසු වූ, ආනුභා සම්පන්නවූ, උත්තම පුද්ගලවූ, අසමවූ, මහත් වූ, යසසින් අග පැමිණියාවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයෙක් වෙමි"යි (කීයේය.)

"ගෘහපතිය, ශ්‍රමණ ගෞතමයන්ගේ මේ ගුණයෝ තොප විසින් කවර කලෙක රැස්කරගන්නා ලද්දාහුද?" (ගොතන ලද්දාහුද?) "ස්වාමීනි, යම්සේ නොයෙක් මල් ඇති මහත්වූ මල්

රැසක් වේද, එයින් දක්ෂවූ මාලාකාරයෙක් හෝ මාලාකාරයෙකුගේ අතවැසියෙක් හෝ විසිතුරු මල් මාලාවක් ගොතන්නේද, ස්වාමීනි, එපරිද්දෙන්ම ඒ භාග්‍යවතුන් වහන්සේගේ නොයෙක් ගුණ ඇත්තාහ. නොයෙක් සිය ගණන් ගුණ ඇත්තාහ. ස්වාමීනි, කවරෙක් වනාහි ගුණ කියයුත්තාගේ ගුණ වර්ණනා නොකරන්නේදැ?"යි (කීයේය.) එකල්හි භාග්‍යවතුන් වහන්සේට කරන සත්කාරය නොඉවසන්නාවූ නිගණ්ඨනාත පුත්‍රයාගේ මුවින් එතැනම උණු ලේ පිට විය.

**හයවෙනිවූ උපාලි සූත්‍රය නිමි. (1-6)**

## 7. කුක්කුරවතිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොලිය ජනපදයෙහි 'හළිද්ද වසන' නම් කොලිය ජනපද වාසීන්ගේ නියම්ගමක් වේ. (එය ගොදුරු ගම්කොට) වැඩවෙසෙන සේක.

එකල්හි සමාදන්වූ ගොව්‍රත ඇති (ගොනෙකු මෙන් හැසිරෙන සීලය ඇති) "පුණ්ණ" නම් කොලිය පුත්‍ර තෙමේද, සමාදන්වූ සුනඛ ව්‍රතය ඇති (බල්ලෙකු මෙන් හැසිරෙන සීලය ඇති) "සෙනිය" නම් අචෙලක තෙමේද භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ, ගොන් පැවතුම් ඇත්තාවූ "පුණ්ණ" නම් කොලිය පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්නේය. බලු පැවතුම් ඇත්තාවූ "සේනිය" නම් ආචෙලක තෙම වනාහී භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා බල්ලෙකු මෙන් බිම ලැග ගෙණ එකපැත්තක හුන්නේය.

2. එකපැත්තක හුන්නාවූම ගොන් පැවතුම් ඇති පුණ්ණ නම් කොලිය පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ බලු පැවතුම් ඇති සේනිය නම් අචෙලක තෙමේ දුෂ්කරක්‍රියා කරන්නේ බිම දමන ලද්දක් කයි. ඔහුගේ ඒ බලු පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරණ ලද්දක්, සමාදන් වන

ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව උත්පත්තිය කවරේදැ"යි ඇසුවේය.

"පුණ්ණය, කම් නැත. මෙය තිබේවා. මා මෙය නොවිචාරවයි" (වදාළේය)

3. දෙවනුවද ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොලිය පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ බලු පැවතුම් ඇත්තාවූ සෙනිය නම් අචෙලක තෙම දුෂ්කර ක්‍රියා කරන්නේ බිම දමන ලද්දක් කන්නේ ඔහුගේ බලු පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරන ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව උත්පත්තිය කවරේද?"

"පුණ්ණය, කම් නැත. මෙය තිබේවා. මා මෙය නොවිචාරව." තුන්වෙනුවද ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොලියපුත්‍ර තෙම භාග්‍යවතුන්වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ බලු පැවතුම් ඇත්තාවූ සෙනිය නම් අචෙලක තෙම දුෂ්කරක්‍රියා කරන්නේ බිම දමන ලද්දක් කයි. ඔහුගේ බලු පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරණ ලද්දක්, සමාදන් වන ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව ගතිය කවරේද?"

4. "පුණ්ණය, කම් නැත. මෙය තිබේවා. මා මෙය නොවිචාරවයි, පුණ්ණය, ඒකාන්තයෙන් මම තොපගේ ඉල්ලීම නොලබමි. එහෙත් තට මම ප්‍රකාශ කරන්නෙමි. පුණ්ණය, මේ ලොකයෙහි ඇතමෙක් බලු පැවතුම් සමාදානය සම්පූර්ණකොට නිරතුරුව වඩාද, බලු ශීලය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩාද, බලු සිත සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩාද, බල්ලන්ගේ ආකාරය සම්පූර්ණකොට නිරන්තරෙයන් වඩාද, හෙතෙම බලු පැවතුම් සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩා, බලු ශීලය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩා, බලු චිත්තය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩා, බල්ලන්ගේ ආකාරය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩා, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බල්ලන්ගේ සහභාවයට පැමිණෙයි. ඉදින් වනාහී මොහුගේ මෙබඳු ඇදහීමක් වේද, 'මම මේ ශීලයෙන් හෝ පැවතුමෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හෝ, දෙවියෙක්

හෝ වන්නෙමි. දෙවියන්ගෙන් එක්තරා කෙනෙක් හෝ වන්නෙමියි' (කියායි.) එය මොහුගේ මිථ්‍යාදෘෂ්ටිය වන්නීය. පුණ්ණය, මම මිථ්‍යාදෘෂ්ටි ඇත්තහුට වනාහි නරකය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙක අතුරෙන් එක්තරා ගතියක් කියමි. පුණ්ණය, මෙසේ සම්පූර්ණ කරන්නාවූ බලු පැවතුම වනාහි බල්ලන්ගේ සහභාවයට පමුණුවයි. නරකයද විද්‍යාමාන වේ"යයි මෙසේ වදාළ කල්හි බලු පැවතුම් ඇත්තාවූ සෙනිය නම් අචෙලක තෙම හැඬුයේය. කඳුලු වැගිරවූයේය.

**5.** එකල්හි භාග්‍යවතුන් වහන්සේ ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොලිය පුත්‍රයාට මෙය කීයේය. "පුණ්ණය ඒකාන්තයෙන් මම තොපගේ ඉල්ලීම නොලබමි. පුණ්ණය, කම් නැත. පුණ්ණය මෙය තිබේවා. මා මෙය නොවිචාරවයි, කීයේ මේ නිසාය."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යමක් මට මෙසේ වදාළේද, මම මෙයට නොහඬමි. ස්වාමීනි, එසේ වුවත් මාගේ මේ බලු පැවතුම් බොහෝ කලක් සම්පූර්ණ කරණ ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ස්වාමීනි, මේ පුණ්ණ නම් කොලිය පුත්‍ර තෙමේද සමාදන්වූ ගොන් පැවතුම් ඇත්තෙකි. ඔහුගේ ඒ ගොන් පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරණ ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව උත්පත්තිය කවරේද?"

"සෙනියය, කම් නැත. මෙය තිබේවා. මා මෙය නොවිචාරවයි" (වදාළේය). දෙවනුවද, බලු පැවතුම් ඇත්තාවූ සේනිය නම් අචෙලක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ පුණ්ණ නම් කොලිය පුත්‍ර තෙම සමාදන්වූ ගොන් පැවතුම් ඇත්තේය. ඔහුගේ ඒ ගොන් පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරන ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව උත්පත්තිය කවරේද?"

"සෙනියය, කම් නැත මෙය තිබේවා. මා මෙය නොවිචාරව."

තුන්වෙනුවද, බලු පැවතුම් ඇත්තාවූ සේනිය නම් අචෙලක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ පුණ්ණ නම් කොළිය පුත්‍ර තෙම සමාදන්වූ ගොන් පැවතුම් ඇත්තේය. ඔහුගේ ඒ ගොන් පැවතුම බොහෝ කලක් සම්පූර්ණ කරන ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ඔහුගේ ගතිය කවරීද? පරලොව උත්පත්තිය කවරේද?"

"සෙනියය, කම් නැත. සෙනියය, මෙය තිබේවා. මා මෙය නොවිචාරවයි. එකාන්තයෙන් තොපගේ ඉල්ලීම මම නොලබමි. එහෙත් තට මම ප්‍රකාශ කරන්නෙමි.

**6.** "සෙනියය, මේ ලොකයෙහි ඇතමෙක් ගොන් පැවතුම් සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩාද, ගොන් ශීලය සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩාද, ගොන් චිත්තය සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩාද, ගොන් ආකාරය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩාද, හෙතෙම ගොන් පැවතුම සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩා ගොන් ශීලය සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩා ගොන් චිත්තය සම්පූර්ණ කොට නිරන්තරයෙන් වඩා, ගොන් ආකාරය සම්පූර්ණකොට නිරන්තරයෙන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු ගවයන්ගේ ස්වභාවයට පැමිණේ. ඉදින් වනාහී, මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ, දෙවියෙක් හෝ වන්නෙමි. දෙවියන්ගෙන් අන්‍යතරයෙක් හෝ වන්නෙමියි, ඔහුගේ ඇදහීම වේද, එය (ඒ ඇදහීම) ඔහුගේ මිථ්‍යා දෘෂ්ටිය වේ. සෙනියය, මිථ්‍යා දෘෂ්ටි ඇත්තහුට වනාහී මම නරකය හෝ තිරිසන් යෝනිය හෝ යන ගති දෙක අතුරෙන් එක්තරා ගතියක් කියමි. සේනියය, මෙසේ සම්පූර්ණ කරන්නාවූ ගොන් පැවතුම් වනාහි භවයන්ගේ සභභාවයට පමුණුවයි. නරකයද විද්‍යමාන වෙයි."

**7.** මෙසේ වදාළ කල්හි ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොලිය පුත්‍රතෙම හැඬුයේය. කඳුළු වැගිරවූයේය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ බලු පැවතුම් ඇත්තාවූ සේනිය නම් අචෙලකයාට මෙය වදාළේය. "සෙනියය, කම් නැත සේනියය

මෙය තිබේවා, මා මෙය නොවිචාරවයි' මෙය වනාහී තොප ගෙන් මම නොලබමි."යි කීයේ මේ නිසාය.

"ස්වාමීනි, යමක් මට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේද, මම මෙයට නොහඬමි. ස්වාමීනි, එසේවුවත් මාගේ මේ ගොන් පැවතුම් බොහෝ කලක් සම්පූර්ණ කරන ලද්දක්, සමාදන්වන ලද්දක් වෙයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් පරිද්දකින් මමද මේ ගොන් පැවතුම් දුරුකරන්නෙම්ද, මේ බලු පැවතුම ඇත්තාවූ සෙනියනම් අචෙලක තෙමේද ඒ බලු පැවතුම දුරු කරන්නේද, එපරිද්දෙන් ධර්මය දෙශනා කරන්ට සමර්ථවේනම් මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙසේ ප්‍රශන්න වූයේ වෙමියි," (කීයේය.)

8. "පුණ්ණය, එසේනම් අසව, යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමි." "එසේය, ස්වාමීනි,"යි ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොලිය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

9 "පුණ්ණය, මා විසින් තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරනලද්දාවූ මේ කර්ම සතරක් වෙත්. කවර සතරක්දයත්, පුණ්ණය, කෘෂ්ණවූ (දස අකුසල් කර්ම පථවූ) කෘෂ්ණ විපාක ඇති (අපායෙහි උපදින හෙයින් කළුවූ විපාක ඇති) කර්මයක් ඇත්තේය. පුණ්ණය, ශුක්ලවූ (දසකුසල කර්ම පථයවූ) ශුක්ල විපාක ඇති (ස්වර්ගයෙහි උපදින හෙයින් සුදුවූ විපාක ඇති) කර්මයක් ඇත්තේය. පුණ්ණය, කෘෂ්ණවූද, ශුක්ලවූද (මිශ්‍රක කර්මයවූ) කෘෂ්ණවූද, ශුක්ලවූද විපාක ඇති (සැපවූද දුක්වූද විපාක ඇති) කර්මයක් ඇත්තේය. පුණ්ණය, කෘෂ්ණ නොවූ, ශුක්ලනොවූ, කෘෂ්ණ ශුක්ලනොවූ විපාක ඇති (යම්) කර්මයක් කර්මක්ෂය කිරීම පිණිස පවතීද (එබඳුවූ) කර්මයක්ද ඇත්තේය.

10. "පුණ්ණය, කෘෂ්ණාවූ, කෘෂ්ණ විපාක ඇත්තාවූ කර්මය කවරේද? පුණ්ණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුක් සහිතවූ කාය සංස්කාරය (කාය ද්වාරයෙහි හටගන්නා දොළොස්

අකුසල්) රැස්කරයිද, දුක් සහිතවූ වාක් සංස්කාරය (වචනයෙන් පවත්නා දොළොස් අකුසල්) රැස්කරයිද, දුක් සහිතවූ මනො සංස්කාරය (සිතෙහි හටගන්නා අකුසල් චෙතනාවන්) රැස්කරයිද, හෙතෙම දුක් සහිතවූ කාය සංස්කාරය රැස්කොට, දුක්සහිතවූ වාක් සංස්කාරය රැස්කොට, දුක් සහිතවූ මනො සංස්කාරය රැස්කොට, දුක් සහිතවූ ලොකයෙහි උපදියි. දුක් සහිතවූ ලොකයෙහි උපන්නාවූම ඔහු දුක් සහිතවූ විපාක ස්පර්ශයෝ ස්පර්ශ කරත්. හෙතෙම දුක් සහිතවූ විපාක ස්පර්ශවලින් ස්පර්ශකරන ලද්දේම, දුක් සහිතවූ එකාන්තයෙන් දුක්වූ වේදනාව විඳියි. නිරයෙහි උපන් සත්වයෝ යම්සේද එමෙනි. පුණ්ණය, මෙසේවූ කර්ම හේතුවෙන් සත්වයාගේ උත්පත්තියවේ. යමක් කරයිද එයින් උපදියි. උපන්මොහු ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. පුණ්ණය, මෙසේද මම සත්වයෝ කර්මය දායාද කොට ඇත්තාහුයයි කියමි. පුණ්ණය, මෙය කෘෂ්ණවූ කෘෂ්ණවිපාක ඇත්තාවූ කර්මයයි කියනු ලැබේ.

11. "පුණ්ණය, ශුක්ලවූ ශුක්ල විපාක ඇත්තාවූ කර්මය කවරේද? පුණ්ණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිදුක්වූ කාය සංස්කාරය (කාය ද්වාරයෙහි පැවති කාමාවචර කුසල් සිත් අට) රැස්කරයිද, නිදුක්වූ වාක් සංස්කාරය (වචනයෙහි පැවති කුසල්) රැස්කරයිද, නිදුක්වූ මනො සංස්කාරය (මනොද්වාරයෙහි පැවති කුසල චෙතනාවන්) රැස්කරයිද, හෙතෙම නිදුක්වූ කාය සංස්කාරය රැස්කොට නිදුක්වූ වාක් සංස්කාරය රැස්කොට නිදුක්වූ මනො සංස්කාරය රැස්කොට නිදුක්වූ ලොකයෙහි උපදියි. නිදුක්වූ ලොකයෙහි උපන්නාවූ ඔහු නිදුක්වූ ස්පර්ශයෝ ස්පර්ශ කරත්. නිදුක්වූ ස්පර්ශවලින් ස්පර්ශ කරන ලද්දාවූම හෙතෙම නිදුක්වූ එකාන්ත සැපවූ වෙදනාව විඳියි. සුභකිණ්හ නම් දෙවියෝ යම්සේද එමෙනි. පුණ්ණය, මෙසේ වනාහී ඇතිවූ කර්මයෙන් සත්වයාගේ උත්පත්තියවේ. යමක් කරයිද එයින් උපදියි. උපන්නාවූ මොහු ස්පර්ශයෝ ස්පර්ශ කරත්. පුණ්ණය, මෙසේද, මම සත්වයෝ කර්මය දායාදකොට ඇත්තාහුයයි කියමි. පුණ්ණය, මෙය, ශුක්ලවූ, ශුක්ල විපාක ඇත්තාවූ කර්මයයි කියනු ලැබේ.

12. "පුණ්ණය, කෘෂ්ණ ශුක්ලවූ, කෘෂ්ණ ශුක්ල විපාක ඇති කර්මය කවරේද? පුණ්ණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් දුක් සහිතවූද නිදුක් සහිත වූද කාය සංස්කාරය රැස් කරයිද, දුක් සහිතවූද, නිදුක්වූද වාක් සංස්කාරය රැස් කරයිද, දුක් සහිතවූද නිදුක් සහිතවූද මනො සංස්කාරය රැස් කරයිද, හෙතෙම දුක් සහිතවූද නිදුක්වූද කාය සංස්කාරය රැස් කොට, දුක් සහිතවූද නිදුක්වූද වාක් සංස්කාරය රැස් කොට, දුක් සහිතවූද නිදුක්වූද මනො සංස්කාරය රැස්කොට දුක්සහිතවූද දුක් රහිතවූද ලොකයෙහි උපදියි. දුක් සහිතවූද දුක් රහිතවූද ලොකයෙහි උපන්නාවූම ඔහු දුක් සහිතවූද දුක් රහිතවූද ස්පර්ශයෝ ස්පර්ශ කරත්. දුක් සහිතවූද දුක් රහිතවූද ස්පර්ශයෝ ස්පර්ශ කරන ලද්දාවූම හෙතෙම දුක් සහිතවූද දුක් රහිතවූද සැපදුක් දෙකින් මිශ්‍රවූ වෙදනාව විඳියි. මනුෂ්‍යයෝද, ඇතැම් දෙවියෝද, ඇතැම් විමාන ප්‍රෙතයෝද යම්සේද, එමෙනි. පුණ්ණය, මෙසේ වනාහී ඇතිවූ කර්මයෙන් සත්වයාගේ උත්පත්තිය වේ. යමක් කරයිද, එයින් උපදියි. උපන්නාවූ මොහු ස්පර්ශයෝ ස්පර්ශ කෙරෙත්. පුණ්ණය, මෙසේද මම සත්වයෝ කර්මය දායාද කොට ඇත්තාහු යයි කියමි. පුණ්ණය, මෙය, කෘෂ්ණ ශුක්ලවූ කෘෂ්ණ ශුක්ල විපාක ඇත්තාවූ කර්මයයි කියනු ලැබේ.

13. "පුණ්ණය, කෘෂ්ණ නොවූ, ශුක්ල නොවූ, කෘෂ්ණ ශුක්ල නොවූ විපාකද නැති කර්මය කර්මක්ෂය පිණිස පවතියිද, ඒ කර්මය කවරේද? පුණ්ණය, ඒ ත්‍රිවිධ කර්මයන් අතුරෙන් කෘෂ්ණවූ කෘෂ්ණ විපාක ඇත්තාවූ යම් මේ කර්මයක් වේද, එය දුරු කිරීම පිණිස යම් චෙතනාවක් වේද, ශුක්ලවූ ශුක්ල විපාක ඇත්තාවූ යම් මේ කර්මයකුත් ඇද්ද ඔහුගේ දුරු කිරීම පිණිස යම් චෙතනාවක් වේද, කෘෂ්ණ ශුක්ලවූ කෘෂ්ණ ශුක්ල විපාක ඇත්තාවූ යම් මේ කර්මයකුත් ඇද්ද, එය දුරුකිරීම පිණිස යම් චෙතනාවක් වේද, පුණ්ණය, මෙය කෘෂ්ණද නොවූ ශුක්ලද නොවූ, කෘෂ්ණ ශුක්ල විපාකද නැති කර්මය කර්මක්ෂය පිණිස පවතියිද ඒ මේ කර්මයයි කියනු ලැබේ. පුණ්ණය, මේ කර්ම සතර වනාහි මා විසින් තමාමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන ලද්දාහුය"යි (වදාළේය.)

14. මෙසේ වදාළ කල්හි ගොන් පැවතුම් ඇත්තාවූ පුණ්ණ නම් කොළිය පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. 'ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුමක් එලිදරවු කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් දරන්නේද එලෙසින්ම භාග්‍යවතුන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ කොට ගනිමි. භාග්‍යවතුන් වහන්සේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වා"යි කීය.

15. බලු පැවතුම් ඇත්තාවූ සෙනිය නම් අචෙලක තෙම වනාහී භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසන ලද්දක් වැසුම් හරින්නේ, හෝ වේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ වේද. අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල්පහනක් දරන්නේ හෝ වේද එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලදී. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි.) ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණ කම ලබන්නෙමි. උපසම්පදාවද ලබන්නෙමියි" (කීයේය)

16. "සෙනියය, පෙර අන්‍ය තීර්ථකවූ යමෙක් වනාහී මේ ශාසනයෙහි පැවිදි වීම කැමති වේද, උපසම්පදාව කැමති වේද, හෙතෙම සාරමසක් පිරිවෙස් වෙසෙයි. සාරමසක් ගතවීමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු භික්ෂු භාවය පිණිස පැවිදි කරත්. උපසම්පදා කරත්, එතකුදුවුවත් මට මෙහි පුද්ගලයන්ගේ වෙනස් බව ප්‍රකටය"යි (වදාළේය)

"ස්වාමීනි, ඉදින් පෙර අන්‍යතීර්ථකවූවෝ මේ ශාසනයෙහි පැවිදි වීම කැමැත්තාහු උපසම්පදාව කැමැත්තාහු සාර මසක්

පිරිවෙස් වෙසෙත් නම්, සාර මසක් ගතවීමෙන් සතුටු සිත් ඇත්තාවූ භික්ෂූහු භික්ෂු භාවය පිණිස පැවිදි කරත් නම්, උපසම්පදා කරත් නම්, මම සතර අවුරුද්දක් පිරිවෙස් වසන්නෙමි. සතර අවුරුද්දක් ගතවීමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු භික්ෂුභාවය පිණිස මා පැවිදි කෙරෙත්වා, උපසම්පදා කෙරෙත්වා"යි (කීයේය.)

17. බලු පැවතුම් ඇත්තාවූ සේනිය නම් අචෙලක තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලැබූයේය. උපසම්පදාව ලැබුයේය. උපසම්පදාවූ නොබෝ කල් ඇති ආයුෂ්මත් සේනිය ස්ථවිර තෙමේ වනාහි හුදකලා වූයේ, වෙන්වූ වාසය ඇත්තේ, අප්‍රමාද වූයේ, කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, හරණලද ආත්මාලය ඇත්තේ, වාසය කරමින් නොබෝ කලකින්ම යමක් සඳහා ආචාර කුලපුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, ඒ උතුම්වූ බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇත්තාවූ (අර්හත් ඵලයට) මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන අවබොධ කොට පැමිණ වාසය කෙළේය. ජාතිය ක්ෂය කරණ ලදී. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලදී. සතර මගින් කටයුතු දෙය කරන ලදී. මෙයින්පසු අනික් කළ යුත්තක් නැතැයි මනාව දැන ගත්තේය. ආයුෂ්මත් සෙනිය ස්ථවිර තෙමේ වනාහී රහතන් ගෙන් එක්තරා කෙනෙක් වූයේය.

**හත්වෙනිවූ කුක්කුරවතිය සූත්‍රය නිමි. (1-7)**

## 8. අභය (රාජකුමාර) සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයෙහිවූ ලෙහෙනුන්ට වැටුප් දුන් හෙයින් කලන්දකනිවාප නම් වූ වේළුවනාරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහී අභය නම් රාජකුමාර තෙම නිගණ්ඨනාත පුත්‍රතෙම යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ නිගණ්ඨනාත පුත්‍රයාට වැඳ එක පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූ ම අභය නම් රාජකුමාරයාට

නිගණ්ඨනාත පුත්‍රතෙම මෙය කීයේය. "රාජකුමාරය, එව, නුඹ ශ්‍රමණ ගෞතමයන්ට වාදයක් ආරෝපනය කරව, (දොසක් නගව) 'අභය නම් රාජකුමාරයා විසින් මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන් හට වාදාරෝපනය කරන ලද්දේයයි' මෙසේ තොපගේ යහපත් ගුණ ඝොෂණයක් පැන නගින්නේය."

"ස්වාමීනි, මම වනාහී ඒ කෙසේ නම් මෙබඳු මහත් ඍද්ධි ඇති මෙබඳු මහත් ආනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන් හට වාදාරෝපනය කරන්නෙම්ද?"

2. "රාජකුමාරය, එව. නුඹ ශ්‍රමණ ගෞතම තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණෙව. පැමිණ ශ්‍රමණ ගෞතමයන්ට මෙසේ කියව. 'ස්වාමීනි, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද, අමනාපද තථාගත තෙමේ එබඳු වචනයක් කියන්නේදැයි," (අසව) ඉදින් තොප විසින් ශ්‍රමණ ගෞතම තෙම මෙසේ විචාරණ ලද්දේ 'රාජකුමාරය, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද, අමනාපද තථාගතතෙම එබඳු වචනයක් කියන්නේයයි' මෙසේ ප්‍රකාශ කෙරේ නම්, ඔහුට නුඹ මෙසේ කියව. ස්වාමීනි, එසේ ඇති කල්හි නුඹ වහන්සේගේ හා පෘථග්ජනයෙකුගේ ඇති වෙනස කවරේද? පෘථග්ජන තෙමේද වනාහී යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද, අමනාපද එබඳු වචන කියන්නේයයි කියව."

3. "ඉදින් වනාහී තොප විසින් මෙසේ විචාරණ ලද්දාවූ ශ්‍රමණ ගෞතම තෙම, 'රාජකුමාරය, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද අමනාපද තථාගත තෙම එබඳු වචනය නොකියන්නේය'යි මෙසේ ප්‍රකාශ කෙරේ නම් ඔහුට නුඹ මෙසේ කියව. 'ස්වාමීනි, එසේ ඇති කල්හි නුඹ වහන්සේ විසින් දෙවදත්ත තෙම අපායෙහි උපදින්නෙක, දෙවදත්ත තෙම නිරයෙහි උපදින්නෙක, දෙවදත්ත තෙම කල්පයක් නිරයෙහි සිටින්නෙක, දෙවදත්ත තෙම පිළියම් කළ නොහැක්කෙකැයි' කුමට ප්‍රකාශ කරන ලද්දේද? නුඹ වහන්සේගේ ඒ වචනයෙන් වනාහී දෙවදත්ත තෙම කිපියේ නොසතුටු සිත් ඇත්තේ වීය'යි (කියව.) රාජකුමාරය, නුඹ විසින් මේ උභතොකොටික ප්‍රශ්නය විචාරණ ලද්දාවූම ශ්‍රමණ ගෞතම

තෙම වමාරන්ට නොහැකිවෙයි. ගිලගන්ට නොහැකිවෙයි. යම්සේ නම් පුරුෂයෙකුගේ උගුරෙහි ඇණුනු යකඩ කොක්කක් හෙතෙම වමාරන්ටත් නොහැකි වන්නේද, ගිලින්ටත් නොහැකි වන්නේද, රාජ කුමාරය, එපරිද්දෙන්ම තොප විසින් මේ උභතොකොටික ප්‍රශ්නය අසන ලද්දාවූම, ශ්‍රමණ ගෞතම තෙම වමාරන්ටත් නොහැකිවේ, ගිලගන්ටත් නොහැකි වේය"යි (කීයේය.)

4. "ස්වාමීනි, එසේය" කියා අභය රාජ කුමාර තෙම නිගණ්ඨනාත පුත්‍රයාට උත්තර දී හුනස්නෙන් නැගිට නිගණ්ඨනාත පුත්‍රයාට වැඳ, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූම අභය රාජකුමාරයාහට හිරු දෙස බලා මෙබඳු සිතක් වූයේය. 'අද වනාහී භාග්‍යවතුන් වහන්සේට වාදාරොපනය කරන්ට කල් නොවේ. හෙට මම ස්වකීය ගෘහයෙහිදී භාග්‍යවතුන් වහන්සේට වාදාරෝපනය කරන්නෙමි'යි භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, සෙට දවස පිණිස භාග්‍යවතුන් වහන්සේ තමා සතර වෙනි කොට ඇත්තේ මාගේ බත ඉවසන සේක්වා." භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් ඉවසූසේක. ඉක්බිති අභය රාජකුමාර තෙම භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ ගියේය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ රාත්‍රිය ගතවීමෙන් පෙරවරු වේලෙහි හැඳපොරවා පාත්‍රා සිවුරුගෙණ අභයරාජ කුමාරයාගේ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණියෝය. පැමිණ පනවනලද ආසනයෙහි වැඩහුන්සේක. ඉක්බිති අභයරාජ කුමාරතෙම භාග්‍යවතුන් වහන්සේට ප්‍රණීතවූ කෑයුතු දෙයින් කටයුතු දෙයින් සියතින් වැළඳ වූයේය. සම්පවාරණය කරවූයේය. ඉක්බිති වළඳා අවසන්වූ පාත්‍රයෙන් ඉවත්කරණලද අත් ඇති භාග්‍යවතුන් වහන්සේ (වෙත) එක්තරා මිටි ආසනයක් ගෙණ එක පැත්තක උන්නේය. එක පැත්තක හුන්නාවූම අභයරාජ කුමාර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

**6.** "ස්වාමීනි, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද අමනාපද තථාගතතෙම එබඳු වචනය කියන්නේද?"

"රාජ කුමාරය, එය ඒකාන්ත නොවේ"යයි (වදාළේය) "ස්වාමීනි, මේ ප්‍රශ්නයෙහිදී නිගණ්ඨයෝ නැසුනාහුය"යි (කීයේය) "රාජකුමාරය, කුමට වනාහි නුඹ, 'ස්වාමීනි, මෙහි නිගණ්ඨයෝ නැසුනාහුය"යි මෙසේ කියන්නෙහිද?

"ස්වාමීනි, මෙහි මම නිගණ්ඨනාත පුත්‍රතෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස් නිගණ්ඨනාත පුත්‍රයාට වැඳ එකපැත්තක හුන්නෙමි. ස්වාමීනි, එක පැත්තක හුන්නාවූ මට නිගණ්ඨනාත පුත්‍රතෙම මෙය කීයේය. 'රාජකුමාරය, එව, නුඹ ශ්‍රමණ ගෞතමයන්ට දොෂයක් නගව, අභය රාජකුමාරයා විසින් මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන්ට දොෂ දක්වන ලද්දේයයි මෙසේ නුඹගේ යහපත්වූ ගුණ ඝොෂාවෙක් පැණනගින්නේය, ස්වාමීනි, මෙසේ කීකල්හි මම නිගණ්ඨනාත පුත්‍රයාට මෙය කීවෙමි.' 'ස්වාමීනි, ඒ කෙසේ නම් මම මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති ශ්‍රමණ ගෞතමයන්ට වාදාරෝපනය කරන්නෙම්ද?' 'රාජකුමාරය, එව, නුඹ ශ්‍රමණ ගෞතම තෙම යම් තැනෙක් හිද, එතැනට එළඹෙව. එළඹ, ශ්‍රමණ ගෞතමයන්ට මෙසේ කියව. 'ස්වාමීනි, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද, අමනාපද, තථාගත තෙම එබඳු වචනය කියන්නේද?' ඉදින් නුඹ විසින් මෙසේ අසන ලද්දාවූ ශ්‍රමණ ගෞතම තෙම 'රාජ කුමාරය, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද අමනාපද තථාගත තෙම එබඳු වචනය කියන්නේයයි' මෙසේ ප්‍රකාශ කරයි නම් ඔහුට නුඹ මෙසේ කියව. 'ස්වාමීනි, එසේ ඇති කල්හි, නුඹ වහන්සේගේ හා පෘථග්ජනයෙකුගේ කවර වෙනසක්ද? පෘථග්ජන තෙමේද වනාහී යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද අමනාපද, එබඳු වචනය කියන්නේයයි, කියව"

**7.** "ඉදින් වනාහී නුඹ විසින් මෙසේ විචාළාවූ ශ්‍රමණ ගෞතම තෙම 'රාජකුමාරය, යම් ඒ වචනයක් අනුන්ට අප්‍රියද අමනාපද තථාගත තෙම එබඳු වචනය නොකියන්නේයයි'

මෙසේ ප්‍රකාශ කරයි නම්, ඔහුට නුඹ මෙසේ කියව. 'ස්වාමීනි, එසේ ඇති කල්හි කුමට නුඹවහන්සේ විසින් දෙව්දත් තෙම අපායෙහි උපදින්නෙක, දෙව්දත් තෙම නිරයෙහි උපදින්නෙක, දෙව්දත් තෙම කල්පයක් නිරයෙහි සිටින්නෙක, දෙව්දත් තෙම පිළියම් කළ නොහැක්කෙකැයි' ප්‍රකාශ කරන ලද්දේද? නුඹවහන්සේගේ ඒ වචනයෙන් වනාහී දෙව්දත් තෙම කිපියේ නොසතුටු සිත් ඇත්තේ වූයේ නොවේදැයි' ඇසිය යුතුය. රාජකුමාරය, නුඹ විසින් මේ උභතොකොටික ප්‍රශ්නය අසන ලද්දාවූම ශ්‍රමණ ගෞතම තෙම වමාරන්ටත් නොහැකි වෙයි. ගිලගන්ටත් නොහැකි වෙයි. යම්සේ නම් පුරුෂයෙකුගේ බොටුවෙහි ඇවුලුනු යකඩ කොක්කක් ඔහුට වමාරන්ටත් නොහැකි වන්නේද, ගිලගන්ටත් නොහැකි වන්නේද, රාජකුමාරය, එපරිද්දෙන්ම නුඹ විසින් මේ උභතොකොටික ප්‍රශ්නය අසන ලද්දාවූම ශ්‍රමණ ගෞතම තෙම වමාරන්ටත් නොහැකි වේ. ගිලගන්ටත් නොහැකි වේයයි" (කීයේය).

8 එකල්හි වනාහි බාලවූ උඩුකුරුව සයනය කරන්නාවූ ලදරු කුමාරයෙක් අභය රාජ කුමාරයාගේ ඇකයෙහි (උකුලෙහි) හුන්නේ වෙයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අභය රාජ කුමාරයාට මෙය වදාළේය. "රාජකුමාරය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඉදින් මේ කුමරුවා නුඹගේ ප්‍රමාදයක් නිසා හෝ කිරි මවගේ ප්‍රමාදයක් නිසා හෝ ලී කැබැල්ලක් හෝ කැබිලිති කටුවක් හෝ මුඛයෙහි දමා ගන්නේ නම් එයට කුමක් කරන්නෙහිද?"

"ස්වාමීනි, මම එය හැරගන්නෙමි. ස්වාමීනි, ඉදින් මම පළමුවරම හැරගන්ට නොහැකි වන්නෙම් නම් වම් අතින් හිස අල්වාගෙණ දකුණු අතින් ඇඟිල්ල වක් කොට ලේ සහිත වුවත් හැරගන්නෙමි."

"ඊට හේතු කවරේද?"

"ස්වාමීනි, කුමරු කෙරෙහි මාගේ අනුකම්පාව ඇත්තේ යයි" (කීයේය.) "රාජකුමාරය, එපරිද්දෙන්ම තථාගත තෙම යම් වචනයක් සිදුනොවූ, සත්‍ය නොවූ අවැඩ ගෙන දෙන්නක්යයි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දනීද, ඒ වචනය අනුන්ට අප්‍රිය වේද, අමනාප වේද, තථාගත තෙම එබඳු වචනය නොකියයි. තථාගත තෙම යම් වචනයක් සිදුවූ සත්‍යවූ අවැඩ ගෙන දෙන්නක්යයි දනියිද, ඒ වචනයද අනුන්ට අප්‍රිය අමනාප වේද, තථාගත තෙම එබඳු වචනයද නොකියයි. තථාගත තෙම යම් වචනයක් වනාහී වූදෙයක්ය සත්‍යයක්ය, අර්ථ පිණිස පවතින්නක්යයි දනියිද, ඒ වචනයද අනුන්ට අප්‍රිය අමනාප වේද, එහි තථාගත තෙම ඒ වචනය ප්‍රකාශ කිරීමෙහි කල් දන්නේ වෙයි. තථාගත තෙම යම් වචනයක් නොවූ දෙයක්ය, අසත්‍යයක්ය, අවැඩ ගෙණදෙන්නක්යයි දනියිද, ඒ වචනයද අනුන්ට ප්‍රිය මනාප වේද, තථාගත තෙම එබඳු වචනයද නොකියයි. තථාගත තෙම යම් වචනයක් වූ දෙයක්ය, සත්‍යයක්ය, අවැඩ ගෙණදෙන්නක්යයි දනියිද, ඒ වචනය අනුන්ට ප්‍රිය මනාප වේද, තථාගතතෙම එබඳු වචනයද නොකියයි.

9. "තථාගත තෙම යම් වචනයක් වනාහී වූ දෙයක්ය, සත්‍යයක්ය, වැඩ ගෙණදෙන්නක්යයි දනියිද, ඒ වචනයද අනුන්ට ප්‍රිය මනාප වේද එහි තථාගතතෙම ඒ වචනය ප්‍රකාශ කිරීමෙහි කල් දන්නේ වෙයි. ඊට හේතු කවරේද? රාජකුමාරය, තථාගතයන්ගේ සත්වයන් කෙරෙහි අනුකම්පාව ඇත්තේයයි" වදාළේය.

10 "ස්වාමීනි, යම් මේ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද, ප්‍රශ්නයක් සකස්කොට තථාගතයන් වහන්සේ කරා එළඹ විචාරත්ද, ස්වාමීනි, යම් කෙනෙක් මා වෙත පැමිණ මෙසේ විචාරන්නාහුද, ඔවුන්ට මම මෙසේ විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නෙමියි පළමුකොටම භාග්‍යවතුන් වහන්සේ විසින් කල්පනා කරන ලද්දේ වේද, නොහොත් තැනට සුදුසු පරිද්දෙන්ම මෙය තථාගතයන් වහන්සේට වැටහේද?" "රාජකුමාරය, එසේ නම් නුඹගෙන්ම මේ කාරණය අසන්නෙමි. යම්සේ නුඹට වැටහෙන්නේද, එසේ එය ප්‍රකාශ කරව. රාජකුමාරය, නුඹ රථයෙහි ලොකු කුඩා අවයවවල දක්ෂයෙක්ද?'

පටුන



"ස්වාමීනි, එසේය. මම රථයෙහි කුඩා මහත් අවයවවල දක්ෂයෙක්මියි" කීය.

"රාජකුමාරය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කෙනෙක් නුඹ වෙත පැමිණ රථයාගේ මේ කිනම් අවයවයක් දැයි මෙසේ අසන්නාහුද? යම් කෙනෙක් මා වෙත පැමිණ මෙසේ අසන්නාහුද, ඔවුන්ට මම මෙසේ අසන ලද්දේ මෙසේ කියන්නෙමියි' පළමුකොටම නුඹ විසින් මෙය කල්පනා කරන ලද්දක් වන්නේද? නොහොත් තැනට සුදුසු පරිද්දෙන්ම මෙය නුඹට වැටහෙන්නේද?

"ස්වාමීනි, මම වනාහී රථයාගේ අවයව පිළිබඳ දක්ෂවූ රථ පදවන්නෙකැයි ප්‍රසිද්ධ වූයේ වෙමි. මා විසින් රථයේ සියලු අවයව දැනගන්නා ලදහ. තැනට සුදුසු පරිද්දෙන්ම මෙය මට වැටහෙන්නේයයි" (කීයේය).

"රාජකුමාරය, එපරිද්දෙන්ම යම් ඒ ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද ශ්‍රමණ පණ්ඩිතයෝද ප්‍රශ්නයක් සකස්කොට තථාගතයන් වෙත එළඹ විචාරත්ද, තැනට සුදුසු පරිද්දෙන්ම මෙය තථාගතයන්ට වැටහේ. ඊට හේතු කවරේද? රාජකුමාරය, යම් ධර්ම ස්වභාවයක් මනාකොට අවබොධ කිරීම හෙතුකොටගෙන ස්ථානොචිත නුවණින්ම මෙය තථාගතයන්ට වැටහේද, ඒ ධර්ම ස්වභාව වනාහි තථාගතයන් වහන්සේ විසින් මනාකොට අවබොධ කරන ලද්දේයයි" වදාළේය.

11. මෙසේ වදාළ කල්හි අභය රාජකුමාර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, මෙපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ස්වාමීනි,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යමි, ධර්මයද, භික්ෂු සංඝයාද (සරණකොට යමි) භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණගියාවූ උපාසකයෙකැයි මා දරණ සේක්වා" (කීය.)

අටවෙනිවූ අභය (රාජකුමාර) සූත්‍රය නිමි. (1-8)

## 9. බහුවෙදනීය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙන සේක. එකල්හි වනාහී (වෑය, පොරොව, නියන, මිටිය, දැලිනූල යන අංග පසකින් යුක්ත හෙයින්) පඤ්චකංග නම්වූ (දෙටු) වඩු තෙම ආයුෂ්මත් (පණ්ඩිත) උදායි ස්ථවිර තෙමේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට වැඳ, එක පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූම පඤ්චකංග නම් වඩුතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙය කීයේය. "ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් කෙතෙක් වේදනාවෝ වදාරණ ලද්දාහුද?"

"ථපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාවය දුක් වේදනාවය, දුක්ද නොවූ සැපද නොවූ වේදනාවයයි වේදනා තුනක් වදාරණ ලද්දාහුය. ථපතිය, මේ වේදනා තුන වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය."

"ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් නොවදාරණ ලද්දාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය, දුක් වේදනායයි වේදනා දෙකක් වදාරණ ලද්දාහ. ස්වාමීනි, යම් මේ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් වේද, මෙය ශාන්තවූ ප්‍රණීතවූ සැපයෙහි (ඇතුළත් කොට) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දීය."

2. දෙවනුවද ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම පඤ්චකංග නම් වඩුවාට මෙය කීයේය. "ථපතිය, භාග්‍යවතුන් වහන්සේ

විසින් වේදනා දෙකක් නොවදාරණ ලද්දාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය, දුක් වේදනාය, දුක්ද නොවූ සැපද නොවූ වේදනායයි වේදනා තුනක් වදාරණ ලද්දාහ. ථපතිය, මේ වේදනා තුන වනාහී භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණ ලද්දාහුය." දෙවනුවද පඤ්චකංග නම් වඩුතෙම "ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් නොවදාරණ ලද්දාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය, දුක් වේදනායයි වේදනා දෙකක්ම වදාරණ ලද්දාහ. ස්වාමීනි, යම් මේ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් වේද, ඕතොමෝ ශාන්තවූ ප්‍රණීතවූ සැපයෙහි (ඇතුළත් කොට) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දීය."

3. තුන්වෙනුවද ආයුෂ්මත් උදායි ස්ථවිරතෙම පඤ්චකංග නම් වඩුවාට "ථපතිය, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා දෙකක් නොවදාරණ ලද්දාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් සැප වේදනාය, දුක් වේදනාය, දුකද නොවූ, සැපද නොවූ වේදනායයි වේදනා තුනක් වදාරණ ලද්දාහ. ථපතිය, මේ වේදනා තුන වනාහී භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දාහුය"යි කීය. තුන් වෙනුවද පඤ්චකංග නම් වඩුතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට "ස්වාමීනි, උදායි ස්ථවිරයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් වේදනා තුනක් නොවදාරණ ලද්දාහ. භාග්‍යවතුන් වහන්සේ විසින් දුක් වේදනාය, සැප වේදනායයි වේදනා දෙකක්ම වදාරණලද්දාහ. ස්වාමීනි, යම් මේ දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් වේද, මෙය ශාන්තවූ ප්‍රණීතවූ සැපයෙහි (ඇතුළත්කොට) භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දී යයි" කීය. ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ පඤ්චකංග නම් වඩුවාට හඟවන්ට නොමහැකි වූයේය. පඤ්චකංග නම් වඩු තෙමේද ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට හඟවන්ට නොහැකි වූයේය.

4. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන් වහන්සේත් පඤ්චකංගනම් වඩුවාත් අතර ඇතිවූ මේ කථා සල්ලාපය ඇසුවේමය. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට

පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ, එක පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම ආයුෂ්මත් උදායි ස්ථවිරයන් හා පඤ්චකංග නම් වඩුවා අතර ඇතිවූ කථාසල්ලාපය යම් පමණ වූයේද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට කීයේය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය වදාළේය. "ආනන්දය, පඤ්චකංග නම් වඩු තෙම උදායි විසින් කියනලද ඇති කාරණයට සතුටු නොවීය. උදායි තෙම පඤ්චකංග නම් වඩුවා විසින් කියනලද ඇති කාරණයට සතුටු නොවීය.

**5.** "ආනන්දය, මා විසින් කාරණා වශයෙන් වේදනා දෙකක්ද කියන ලදහ. මා විසින් කාරණාවශයෙන් වෙදනා තුනක්ද කියන ලදහ. මා විසින් කාරණා වශයෙන් වේදනා පසක්ද කියන ලදහ. මා විසින් කාරණා වශයෙන් වේදනා සයක්ද කියන ලදහ. මා විසින් කාරණා වශයෙන් වේදනා අටළොසක්ද කියන ලදහ. මා විසින් කාරණා වශයෙන් වේදනා සතිසක්ද කියන ලදහ. මා විසින් කාරණා වශයෙන් වේදනා එකසිය අටක්ද කියන ලදහ. ආනන්දය, මා විසින් ධර්මය තෙම කාරණා වශයෙන් දෙශනා කරනලදී. ආනන්දය, මා විසින් ධර්මය මෙසේ කාරණා වශයෙන් දෙශනා කරන ලද කල්හි යම් කෙනෙක් ඔවුනොවුන් යහපත් කොට කියන ලදද, මනාකොට කියන ලද්ද නොඅනුදනිත්ද, එකඟ නොවෙත්ද, සතුටු නොවෙත්ද, ඔවුන් හටගත් ඩබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විවාදයට පැමිණියාහු, ඔවුනොවුන් මුඛ නමැති හුල්වලින් අනිමින් වාසය කරන්නාහුය යන මෙය කැමති විය යුතුයි. ආනන්දය, මා විසින් ධර්මය තෙම මෙසේ කාරණා වශයෙන් දෙශනා කරන ලදී. ආනන්දය, මා විසින් ධර්මය මෙසේ කාරණා වශයෙන් දෙශනා කරන ලද කල්හී යම් කෙනෙක් ඔවුනොවුන් යහපත්කොට කියන ලද්ද මනාකොට කියන ලද්ද අනුදන්නාහුද, මනාකොට හඟින්නාහුද, මනාකොට අනුමෝදන් වන්නාහුද, ඔවුන් සමගි වූවාහු, සතුටු වන්නාහු, විවාද නොකරන්නාහු, කිරි හා දිය මෙන් වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇස් වලින් බලමින් වාසය කරන්නාහුය, යන මෙය කැමති විය යුතුයි.

6 "ආනන්දය, මේ කාම ගුණ පසක් වෙත්. කවර පසක්ද යත්: ඇසින් දැනගත යුතුවූ ඉෂ්ටවූ කැමතිවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇළුම් කටයුතුවූ රූපයෝ වෙත්. කණින් දතයුතුවූ ඉෂ්ටවූ කැමතිවූ මනාප වූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම් කටයුතුවූ ශබ්දයෝ වෙත්. නාසයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කැමතිවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම් කටයුතුවූ ගන්ධයෝ වෙත්. දිවෙන් දතයුතුවූ ඉෂ්ටවූ කැමතිවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇලුම් කටයුතුවූ රසයෝ වෙත්. කයින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාවවූ ඇලීමෙන් යුක්තවූ ඇලුම් කටයුතුවූ ස්පර්ශ යෝ වෙත්. ආනන්දය, මේ වනාහී කාමගුණ පස වෙත්. ආනන්දය, මේ පඤ්චකාම ගුණයන් නිසා යම් සැපයක් සතුටක් උපදීද, මේ කාම සැපයයි කියනු ලැබේ.

7. "ආනන්දය, යමෙක් වනාහි සත්වයෝ මේ උසස්ම සැපය විඳිත් යයි මෙසේ කියන්නේද, ඔවුන්ගේ ඒ කීමට එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා ඉතා යහපත්වූද ඉතා ප්‍රණීතවූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, මේ සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී එකී සැපයට වඩා ඉතා යහපත්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වේ.

8. "ආනන්දය, යමෙක් වනාහී සත්වයෝ මේ උසස්ම සැපය විඳිත්යයි මෙසේ කියන්නේද, ඔහුගේ ඒ කීමට එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, මේ සැපයට වඩා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද, අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇත්තාවූ

චිත්තයාගේ එකඟ බව ඇති තර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ආනන්දය, මේ වනාහී එකී සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වේ.

9. "ආනන්දය, යමෙක් වනාහි සත්වයෝ මේ උසස්ම සැපය විඳිත්යයි මෙසේ කියන්නේද, ඔහුගේ ඒ කීමට එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? ආනන්දය, මේ සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, මේ සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි, මහණ තෙම ප්‍රීතියගේද වැලක්මෙන් උපෙක්ෂා ඇත්තේ සිහිඇත්තේ මනාදැනුම් ඇත්තේ වාසය කරයි. සැපයද කයින් විඳියි. යමක් ආර්‍ය්‍යයෝ උපෙක්ෂා ඇත්තේය, සිහි ඇත්තේය, සැප විහරණ ඇත්තේ යයි කියත්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී එකී සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වේ.

10 "ආනන්දය, යමෙක් වනාහි සත්වයෝ මේ උසස්ම සැපය විඳිත්යයි මෙසේ කියන්නේද, ඔහුගේ ඒ වචනයට එකඟ නොවෙමි. ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සුඛයාගේද දුරු කිරීමෙන් දුක්ඛයාගේද දුරු කිරීමෙන් පළමුකොටම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහි මෙකී සැපයට වඩා ඉතා යහපත්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් සැපය වේ.

11. "ආනන්දය, යමෙක් වනාහි සත්වයෝ මේ උසස්ම සැපය විඳිත්යයි මෙසේ කියන්නේද? ඔහුගේ ඒ වචනයට එකඟ නොවෙමි ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා

ඉතා යහපත්වූද, අතිශයින් ප්‍රණීතවූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද ඉතා උතුම්වූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි, මහණ තෙම සියළු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මීමෙන් ප්‍රතිඝ සංඥාවන් නැසීමෙන් නානාත්ව සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් අනන්තවූ ආකාශයයි ආකාශාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී මෙකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයවේ.

12. "ආනන්දය, යමෙක් වනාහී සත්වයෝ මේ උසස්මවූ සැපය විඳිත්යයි, මෙසේ කියන්නේද, ඔහුගේ ඒ කීමට එකඟ නොවෙමි.

"ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සියළු ආකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා අනන්තවූ විඤ්ඤාණයයි විඤ්ඤාණඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයවේ.

13. "ආනන්දය, යමෙක් වනාහී සත්වයෝ මේ උසස්මවූ සැපය, විඳිත්යයි මෙසේ කියන්නේද? ඔහුගේ ඒ කීමට එකඟ නොවෙමි.

"ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සියළු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයවේ.

14. "ආනන්දය, යමෙක් වනාහී සත්වයෝ මේ උසස්ම සැපය, විඳිත්යයි මෙසේ කියන්නේද, ඔහුගේ ඒ කීමට එකඟ නොවෙමි.

"ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපය කවරේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සියළු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී මෙකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයවේ.

15. "ආනන්දය, යමෙක් වනාහී සත්වයෝ මේ උසස්ම සැපය, විඳින්නේයයි මෙසේ කියන්නේද, ඔහුගේ ඒ වචනයට එකඟ නොවෙමි.

"ඊට හේතු කවරේද? ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයක් ඇත්තේය. ආනන්දය, එකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපය කවරේද, ආනන්දය, මේ ශාසනයෙහි මහණ තෙම සියළු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරයි. ආනන්දය, මෙය වනාහී මෙකී සැපයට වඩා ඉතා යහපත්වූද, ඉතා උතුම්වූද අනික් සැපයවේ.

16. "ආනන්දය, අන්‍ය තීර්ථකවූ පරිව්‍රාජකයෝ ශ්‍රමණ ගෞතම තෙම සඤ්ඤාවෙදයිතනිරොධය කියයි. එය සැපයයිද පනවයි. ඒ කුමක්ද? එය කෙසේ වන්නක් දැයි මෙසේ කියන්නාහුය යන යමක් වේද, මීට කරුණු ඇත්තේය. ආනන්දය, එසේ කියන්නාවූ අන්‍ය තීර්ථක පරිව්‍රාජකයන්ට මෙසේ කියයුතුය. ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ සැපවූ වේදනාව සඳහාම සැපයයි නොම පනවයි. ඇවැත්නි, එතකුදුවූවත් යම් යම් කාරණයෙක්හි යම් යම් තැනක සැපය ලැබේද, ඒ ඒ කරුණු තථාගතතෙම සැපයෙහි පනවා යයි (වදාළසේක.)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

නවවෙනිවූ බහුවෙදනීය සූත්‍රය නිමි. (1-9)

## 10. අපණ්ණක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසොල් දනව්වල මහත්වූ භික්ෂු සංඝයා සමග සැරිසරා වඩනාසේක් කොසොල් දනව් වැස්සන්ගේ ශාලානම් බමුණුගම යම් තැනෙක්හිද එතැනට වැඩිසේක. ශාලානම් ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය වංශයෙන් පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතම තෙම වනාහී කොසොල් දනව්වල මහත්වූ භික්ෂු සංඝයා සමග සැරිසරණසේක් ශාලානම් ගමට පැමිණියේ වෙයි. ඒ භවත් ගෞතමයන්ගේ මෙබඳු යහපත්වූ කීර්ති ශබ්දයක් උස්ව නැංගේ වෙයි.

"ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධහ අෂ්ටවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තයහ. යහපත් ගති ඇත්තාහ. සියලු ලොකයන් දන්නාහ. ශ්‍රෙෂ්ඨයහ. හික්මවිය යුතු පුරුෂයන් හික්ම වීමෙහි රියැදුරෙකු වැනියහ. දෙව් මිනිසුන්ට ශාස්තෘහ, චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අවබොධ කළහ. භාග්‍යවත්හ. ඒ තථාගතයන්වහන්සේ දෙවියන් සහිතවූ, මාරයන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා තමන් උසස් ඥානයෙන් දැන පැහැදිලිකොට ප්‍රකාශ කරන්නාහ. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ අර්ථ සහිතවූ, ව්‍යංජන සහිතවූ, සියලු ලෙසින් සම්පූර්ණවූ, පිරිසිදුවූ ශාසන මාර්ග බ්‍රහ්මචරියාව ගෙන හැර දක්වති. එබඳුවූ රහතුන්ගේ දැකුම් යහපත්ය"

2. ඉක්බිති ශාලානම් ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියාහුය. පැමිණ, සමහරු භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පැත්තක

හුන්නාහුය. සමහරු භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ සිහි කටයුතුවූ කථාව කොට නිමවා එක පැත්තක උන්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද ඒ දෙසට ඇඳිලි බැඳ (අත් එකට තබා වැඳ) එක පැත්තක උන්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි නාම ගොත්‍රය අස්වා එක පැත්තක උන්හ. සමහරු නිශ්ශබ්දවූ වාහු එක පැත්තක උන්හ. එක පැත්තක උන්නාවූම ශාලානම් ගම්වැසිවූ බ්‍රාහ්මණ ගෘහ පතියන්ට භාග්‍යවතුන්වහන්සේ මෙය වදාළේය "ගෘහපතියෙනි, යමෙකු කෙරෙහි නුඹලා විසින් කරුණු සහිතවූ ශ්‍රද්ධාවක් ලබන ලද්දීද, තොපට එබඳුවූ මනාපවූ කිසියම් ශාස්තෘවරයෙක් ඇත්තේද?"

"ස්වාමීනි, යමෙකු කෙරෙහි අප විසින් කරුණු සහිතවූ ශ්‍රද්ධාවක් ලබන ලද්දීද, අපට එබඳුවූ මනාපවූ කිසියම් ශාස්තෘවරයෙක් නැත්තේය."

"ගෘහපතියෙනි, මනාපවූ ශාස්තෘවරයෙකු නොලබන්නාවූ තොප විසින් මේ ඒකාන්තවූ ධර්මය සමාදන්ව පැවතිය යුතුයි. ගෘහපතියෙනි, ඒ ධර්මය වනාහී සම්පූර්ණ කරන ලද්දේ සමාදන් වන ලද්දේ එය තොපට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය.

3. "ගෘහපතියෙනි, ඒකාන්තවූ ධර්ම තෙම කවරේද? ගෘහපතියෙනි, මෙසේ කියන්නාවූ, මෙසේ දෘෂ්ටි ඇත්තාවූ සමහර මහණ බමුණෝ ඇත්තාහ. දුන් දෙයෙහි විපාක නැත. කරන ලද පූජාවෙහි විපාක නැත. මෙහෙයීමෙන් කරනලද සත්කාරයෙහි විපාක නැත. කුසල කර්මයන්ගේ ඵලයක් නැත. විපාකයක් නැත. මෙලොවක් නැත. පරලොවක් නැත. මවට උපකාර අපකාර කිරීමේ විපාක නැත. පියාට උපකාර අපකාර කිරීමේ විපාක නැත. ඕපපාතික සත්වයෝ නැත. ලෝකයෙහී යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙද්ද, එබඳු යහපත් මාර්ගයෙහි ගමන් කරන්නාවූ මනා කොට පිළිපදින්නාවූ මහණ බමුණෝ නැතැයි ගෘහපතියෙනි, ඒ මහණ බමුණන්ට සමහර මහණ

බමුණෝ කෙළින්ම විරුද්ධවාද ඇත්තෝ වෙත්. ඔව්හු මෙසේ කියත්. දුන් දෙයෙහි විපාක ඇත. කරන ලද පූජාවෙහි විපාක ඇත මෙහෙයීමෙන් කරණලද සත්කාරයෙහි විපාක ඇත. කුසලාකුසල කර්මයන්ගේ ඵලයක් විපාකයක් ඇත. මෙලොවක් ඇත. පරලොවක් ඇත. මවට උපකාර අපකාර කිරීමේ විපාක ඇත. පියාට උපකාර අපකාර කිරීමේ විපාක ඇත. ඕපපාතික සත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ යහපත් මග ගමන් කරන්නාවූ මනාව පිළිපන්නාවූ මහණ බමුණෝ ලොකයෙහි ඇත්තාහ'යි. ගෘහපතියෙනි, ඒ කුමකැයි හඟිව්ද? මේ මහණ බමුණෝ ඔවුනොවුන්ට කෙළින්ම විරුද්ධවාද ඇත්තෝ නොවෙත්ද?"

"එසේය, ස්වාමීනි."

4. "ගෘහපතියෙනි, එහි යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහුවෙත්ද (එනම්) 'දුන් දෙයෙහි විපාක නැත. කුසලා කුසලා කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. මෙලොවක් නැත. පරලොවක් නැත. මවට සංග්‍රහ කිරීමේ විපාක නැත. පියාට සංග්‍රහ කිරීමේ විපාක නැත. ඕපපාතික සත්වයෝ නැත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ යහපත් මග ගමන් කරන්නාවූ මනා කොට පිළි පන්නාවූ මහණ බමුණෝ ලොව නැත්තාහයි' කියත්ද, ඔවුන් යම් මේ කයින් මනාව හැසිරීමය, වචනයෙන් මනාව හැසිරීමය, සිතින් මනාව හැසිරීමය, යන මේ කුසල ධර්ම තුන දුරුකොට යම් මේ කයින් නොමනා හැසිරීමය, වචනයෙන් නොමනා හැසිරීමය, සිතින් නොමනා හැසිරීමය, යන මේ අකුසල ධර්මතුන සමාදන්ව පවතින්නාහුය, යන මෙය කැමතිවිය යුතුයි. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය ලාමක බව කෙලෙසීම, කුසල ධර්මයන්ගේද නෛෂ්ක්‍රම්‍යයෙහි, (අත්හැර දැමීම) ආනිශංසය පිරිසිදු පක්ෂය නොමදකිත්. ඇත්තාවූම පරලොව පරලොවක් නැතැයි ඔහුගේ දෘෂ්ටිය වෙයි. එය මොහුගේ මිථ්‍යා දෘෂ්ටිය වේ. ඇත්තා වූම පරලොව (ගැණ)

පරලොවක් නැතැයි කල්පනා කරයි. එය ඔහුගේ මිථ්‍යා කල්පනාව වේ. ඇත්තාවූම පරලොව (ගැන) පරලොවෙක් නැත යන වචනය කියයි. එය මොහුගේ මිථ්‍යා වචනයවේ. ඇත්තාවූම පරලොව (ගැන) පරලොවෙක් නැතැයි කියයි. යම් ඒ පරලොව දන්නාවූ රහත්හු වෙත්ද ඔවුන්ට මෙතෙම විරුද්ධ වෙයි. ඇත්තාවූම පරලොව (ගැන) පරලොවෙක් නැතැයි අනුන්ට හඟවයි. ඒ ඔහුගේ අසත්‍ය ධර්මය හැඟවීමවේ. ඒ අසත්‍යවූ ධර්මය හැඟවීමෙන්ද තමන් උසස් කෙරෙයි. අනුන් පහත් කෙරෙයි. මෙසේ පළමු කොටම ඔහුගේ සිල්වත් බව දුරුවූයේ වෙයි. දුශ්ශීල භාවය එළඹ සිටියේ වෙයි. මේ මිථ්‍යා දෘෂ්ටියද, මිථ්‍යා කල්පනාවද, මිථ්‍යා වචනයද, ආර්‍ය්‍යයන්ට විරුද්ධවීමද, අසත්‍යවූ ධර්මය හැඟවීමද, තමා උසස් කිරීමද, අනුන් පහත් කිරීමදැයි මෙසේ ඔහුට මේ නොයෙක් ලාමකවූ අකුසල ධර්මයෝ මිථ්‍යා දෘෂ්ටි හේතුවෙන් හටගණිත්.

5. "ගෘහපතියෙනි, එහි නුවණැති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. ඉදින් වනාහී පරලොවෙක් නැත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් තමහට සුවයක් කරන්නේය. ඉදින් වනාහී පරලොවෙක් ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුක් වන්නාවූ විනාසයට පත් වන්නාවූ නරකයෙහි උපදින්නේය. ඒකාන්තයෙන් පරලොවෙක් නොතිබේවා ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යවේවා. එතකුදුවුවත් මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම, මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුවූයේ වෙයි. දුශ්ශීලවූ පුරුෂ පුද්ගලතෙම නාස්තිකවාද ඇති මිථ්‍යා දෘෂ්ටිකයෙක් වෙයි, ඉදින් වනාහී පරලොවෙක් ඇත්තේ නම් මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුය, යන යමක් ඇද්ද ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුක් වන්නාවූ විනාසයට පත්වන්නාවූ නරකයෙහි උපදින්නේය, යන යමකුත් ඇද්ද, මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලයාගේ දෙලොව පරාජය ගන්නේවේ. මෙසේ මොහුගේ මේ ඒකාන්ත ධර්මය තෙම

නපුරුකොට සම්පූර්ණ කරන ලද්දේ සමාදන්වන ලද්දේ එක් කොටසක් පැතිර සිටියි. කුසල්වූ කාරණය හිස්වෙයි.

**6.** "ගෘහපතියෙනි, එහි යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, (එනම්) දුන් දෙයෙහි විපාක ඇත. කරනලද පූජාවෙහි විපාක ඇත. මෙහෙයීමෙන් කළ සත්කාරයෙහි විපාක ඇත. මනාව කළ නොමනාව කළ කර්මයන්ගේ ඵලයක් විපාකයක් ඇත. මෙලොවක් ඇත. පරලොවක් ඇත මවට උපකාර කිරීමේ විපාක ඇත. පියාට උපකාර කිරීමේ විපාක ඇත. ඔපපාතික සත්වයෝ ඇත්තාහ. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ යහපත් මග ගමන් කරන්නාවූ මනාව පිළිපන්නාවූ මහණ බමුණෝ ලොකයෙහි ඇත්තාහ, ඔවුන් පිළිබඳව මෙය කැමති වියයුතුයි. යම් මේ කයින් නොමනා හැසිරීමක් වේද, වචනයෙන් නොමනා හැසිරීමක් වේද, සිතින් නොමනා හැසිරීමක් වේද, මේ අකුසල ධර්මතුන දුරු කොට යම් මේ කයින් මනා හැසිරීමක් වේද, වචනයෙන් මනා හැසිරීමක් වේද, සිතින් මනා හැසිරීමක් වේද, මේ කුසල ධර්ම තුන සමාදන්ව පවතින්නාහුය. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය ලාමක බව කෙලෙසීමද, කුසල ධර්මයන්ගේද නෛෂ්ක්‍රම්‍යයෙහිද ආනිසංසය පිරිසිදු පක්ෂය දකිත්මය. ඇත්තාවූම පරලොව (ගැන) පරලොවක් ඇතැයි ඔහුගේ දෘෂ්ටිය වෙයි. ඕ තොමෝ ඔහුගේ සම්‍යක් දෘෂ්ටිය වේ. ඇත්තාවූම පරලොව (ගැණ) පරලොවක් ඇතැයි කල්පනා කරයි. හෙතෙම මොහුගේ සම්‍යක් කල්පනාව වේ. ඇත්තාවූම පරලොව (ගැණ) පරලොවක් ඇත යන වචනය කියයි. එය මොහුගේ (යහපත් වචනය) සම්‍යක් වාචාවවේ ඇත්තාවූම පරලොව ගැණ පරලොවක් ඇතැයි කීයේද පරලොව දන්නාවූ යම් ඒ රහත්හු වෙත්ද, ඔවුන්ට මෙතෙම විරුද්ධවූවෙක් නොවෙයි.

"ඇත්තාවූම පරලොව (ගැන) පරලොවක් ඇතැයි අනුන්ට හඟවාද එය මොහුගේ සත්‍යවූ ධර්මය හැඟවීම වේ. ඒ සත්‍යවූ

ධර්මය හැඟවීමෙන්ද තමා නොම උසස් කෙරෙයි. අනුන් නොම පහත් කෙරෙයි. මෙසේ පළමු කොටම මොහුගේ දුශ්ශීල භාවය දුරුවූයේ වෙයි. සුසීල භාවය එළඹ සිටියේ වෙයි. මේ සම්‍යක් දෘෂ්ටියද, සම්‍යක් කල්පනාවද, සම්‍යක් වචනයද, ආර්‍ය්‍යයන්ට විරුද්ධ නොවීමද, සත්‍යවූ ධර්මය හැඟවීමද, තමා උසස් නොකිරීමද, අනුන් පහත් නොකිරීමදැයි මෙසේ මොහුට මේ නොයෙක් කුසල ධර්මයෝ සම්‍යක් දෘෂ්ටි හේතුවෙන් හටගණිත්.

7. "ගෘහපතියෙනි, ඔවුන් අතරෙහි නුවණැති පුරුෂයෙක් මෙසේ කල්පනා කරයි. ඉදින් වනාහී පරලොවක් ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දිව්‍ය ලොකයෙහි උපදින්නේය. ඒකාන්තයෙන්ම පරලොවක් නොවේවා, ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍ය වේවා. එතකුදුවූවත් මේ පින්වත් පුරුෂ පුද්ගල තෙම මේ ආත්මයෙහි නුවණැත්තන්ගේ ප්‍රශංසාවට සුදුසුවේ. සිල්වත්වූ පුරුෂ පුද්ගල තෙම අස්තිකවාද ඇත්තේ, සම්‍යක් දෘෂ්ටිකයෙක් වෙයි, ඉදින් වනාහී පරලොවක් ඇත්තේමද මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලයාගේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ පැසසීමට සුදුසුය යන යමක්වේද, ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති දෙව්ලොව උපදින්නේය යන යමකුත් වේද, යන මේ දෙලොවෙහි ජය ගැණීම වේ. මෙසේ මොහුගේ මේ එකාන්ත ධර්මය තෙම මනාව සම්පූර්ණ කරන ලද්දේ සමාදන් වන ලද්දේ දෙපසම පැතිර සිටියි. අකුසලය හිස්වේ.

8. "ගෘහපතියෙනි, මෙබඳු වාද ඇත්තාවූ, මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ, ඇතැම් මහණ බමුණෝ වෙත්. (එනම්) 'කරන්නාහට, කරවන්නාහට, සිඳින්නාහට, සිඳුවන්නාහට, දන්ඩෙන් පීඩා කරන්නාහට, පීඩා කරවන්නාහට, සෝක කරවන්නාහට, ක්ලාන්ත කරන්නාහට, කම්පනය කරන්නාහට, කරවන්නාහට, සතුන් මැරීම කරන්නාහට, කරවන්නාහට, නුදුන් දෙය ගන්නාහට, ගම් පහරන්නාහට, මං පහරන්නාහට, මහත්වූ පැහැර ගැණීම් කරන්නාහට, එක ගෙයක් වට කොට පැහැර ගන්නාහට,

මංකොල්ල කෑමෙහි සිටින්නාහට, අනුන්ගේ අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට කරන්නාහට, පාපයක් නැත. මුවහත් කෙළවර ඇති චක්‍රයකින්ද යමෙක් මේ පෘථුවියෙහි ප්‍රාණීන් එක මස් ගොඩක් එක මස් රැසක් කරන්නේද, ඒ හේතුවෙන් පවක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. ගංගානම් ගඟේ දකුණු ඉවුරටද නසමින් විනාශ කරවමින් සිඳිමින් පීඩා කරමින් යන්නේද ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. ගංගා නම් ගඟේ උතුරු ඉවුරටද දෙමින් දෙවමින් පුදමින් පූජා කරවමින් යන්නේද, ඒ හේතුවෙන් පිනක් නැත. පින් පැමිණීමක් නැත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංවරයෙන් සත්‍ය වචනයෙන් පිනක් නැත පින් පැමිණීමක් නැත' කියායි.

**9.** "ගෘහපතියෙනි, ඒ මහණ බමුණන්ටද ඇතැම් මහණ බමුණෝ කෙළින් විරුද්ධ වාද ඇත්තෝ වෙත්. ඔව්හු මෙසේ කීවාහුය. 'කරන්නාහට, කරවන්නාහට, සිඳින්නාහට සිඳවන්නාහට, පෙළන්නාහට, පෙළීම කරවන්නාහට, ශොකය කරවන්නාහට, ක්ලාන්ත කරවන්නාහට, කම්පනය කරන්නාහට, කරවන්නාහට, සතුන් මරන්නාහට, මරවන්නාහට, නුදුන් දෙය ගන්නාහට, ගම්පහරන්නාහට, බලාත්කාරකමින් ගන්නාහට, එක්ගෙයක් පැහැර ගැනීම කරන්නාහට, මං පැහැරීමෙහි සිටින්නාහට, අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කරන්නාහට පාපය ඇත. මුවහත් කෙළවර ඇති චක්‍රයකින් යමෙක් මේ පෘථිවියෙහි ප්‍රාණීන් එක මස් ගොඩක්, එක මස් රැසක් කරන්නේද, ඒ හේතුවෙන් පාපය ඇත්තේය. පාපයාගේ පැමිණීම ඇත්තේය. ගංගානම් ගඟේ දකුණු ඉවුරද නසමින් නැසීම කරවමින්, සිඳිමින්, සිඳවමින්, පෙළමින්, පෙළවමින් යන්නේද, ඒ හේතුවෙන් පාපය ඇත්තේය. පාපයාගේ පැමිණීම ඇත්තේය ගංගානම් ගඟේ උතුරු ඉවුරදක්වා දෙමින්, දෙවමින්, පුදමින්, පුදවමින්, යන්නේද, ඒ හේතුවෙන් පිනක් ඇත්තේය. පින් පැමිණීම ඇත්තේය. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීල සංවරයෙන් සත්‍ය වචනයෙන් පින ඇත්තේය. පින් පැමිණීම ඇත්තේය, (කියායි.)

"ගෘහපතියෙනි, ඒ කුමකැයි හඟිව්ද, මේ මහණ බමුණෝ ඔවුනොවුන්ට කෙළින් විරුද්ධ වාද ඇත්තෝ නොවෙත්ද? "එසේය ස්වාමීනි"

10. "ස්වාමීනි, ඔවුන් අතුරෙහි යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, (එනම්) කරන්නාහට කරවන්නාහට, සිඳින්නාහට, තළන්නාහට, තළවන්නාහට, ශොක ඇති කරන්නාහට, ශොකය ඇතිකරවන්නාහට, ක්ලාන්ත කරවන්නාහට, කම්පා කරන්නාහට කරවන්නාහට, සතුන් මරන්නාහට මරවන්නාහට, නුදුන්දෙය ගන්නාහට බලාත්කාරයෙන් ගන්නාහට, එක් ගෙයක් පැහැර ගැනීම කරන්නාහට, මං පහරන්නාහට, අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, කිසියම් පවක් කරමියි සිතා කළත් පවු නැත. කෙළවර මුවහත් ඇති චක්‍රයකින්ද යමෙක් මේ පොළවෙහි ප්‍රාණීන් එක මස් රැසක් කරන්නේද, ඒ හේතුවෙන් පාපයක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. ගංගා නම් ගඟේ දකුණු ඉවුර දක්වා නසමින්, නැසීම කරවමින්, සිඳිමින්, සිඳීම කරවමින්, තලමින් තැළීම කරවමින් යන්නේ නම්, ඒ හේතුවෙන්ද පවක් නැත. පාපයාගේ පැමිණීමක් නැත. ඉදින් ගංගා නම් ගඟේ උතුරු ඉවුර දක්වාද දෙමින්, දෙවමින්, පුදමින්, පුදවමින් යන්නේ නම් ඒ හේතුවෙන් පිණක්ද නැත. පුණ්‍යයාගේ පැමිණීමක්ද නැත. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් සීලසංවරයෙන් සත්‍ය වචනයෙන් පිණක් නැත. පුණ්‍යයාගේ පැමිණීමක් නැත. කියා'යි.

11. "ඔවුන් පිළිබඳව මෙය කැමති විය යුතුයි. යම් මේ කයින් මනා හැසිරීමක් වේද, වචනයෙන් මනා හැසිරීමක් වේද, සිතින් මනා හැසිරීමක් වේද, මේ කුශල ධර්ම තුන දුරු කොට යම් මේ කයින් නොමනා හැසිරීමක් වේද, වචනයෙන් නොමනා හැසිරීමක් වේද, සිතින් නොමනා හැසිරීමක්වේද මේ අකුශල ධර්ම තුන සමාදන්ව වසන්නාහුය. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය, ලාමකබව, කෙලෙසීමද කුසල ධර්මයන්ගේද කම් සැප අත්හැරීමෙහිද ආනිසංසය, පිරිසිදු බව නොදකිත්මය.

12. "ඇත්තාවූම පව් පින් කිරීම නැත යනු මොහුගේ දෘෂ්ටිය වෙයි. මෙය ඔහුගේ මිථ්‍යා දෘෂ්ටිය වේ. ඇත්තාවූම ක්‍රියාව (ගැන) පව් පින් කිරීම නැතැයි කල්පනා කරයි. එය මොහුගේ මිථ්‍යා කල්පනාව වෙයි. ඇත්තාවූම පව් පින් කිරීම නැත යන වචනය කියයි. මෙය මොහුගේ මිථ්‍යා වචනය වෙයි. ඇත්තාවූම කිරීමක් නැතැයි කීය. යම් ඒ රහත් කෙනෙක් ක්‍රියා වාද ඇත්තෝ වෙත්ද, ඔවුන්ට හෙතෙම විරුද්ධ වෙයි. ඇත්තාවූම ක්‍රියාව ගැන ක්‍රියාවක් නැතැයි අනුන්ට හඟවයි. මෙය මොහුගේ අසත්‍යවූ ධර්මය හැඟවීම වේ. ඒ අසත්‍යවූ ධර්මය හැඟවීමෙන්ද තමන් උසස් කරයි. අනුන් පහත් කරයි. මෙසේ පළමුකොටම මොහුගේ සුසීල භාවය දුරුවූයේ වෙයි. දුශ්ශීල භාවය එළඹ සිටියේ වෙයි. මේ මිථ්‍යාදෘෂ්ටියද, මිථ්‍යා කල්පනාවද, මිථ්‍යා වචනයද, ආර්‍ය්‍යයන්ට විරුද්ධවීමද, අසත්‍යවූ ධර්මය හැඟවීමද, තමා උසස් කිරීමද, අනුන් පහත් කිරීමදැයි මෙසේ මොහුට නොයෙක් ලාමකවූ අකුසල ධර්මයෝ මිථ්‍යාදෘෂ්ටි හේතුවෙන් හටගනිත්.

13. "ගෘහපතියෙනි, ඒ කාරණයෙහි නුවණැති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. ඉදින් ක්‍රියාවක් නැත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගල තෙම ශරීරයාගේ භෙදයෙන් තමහට සුවයක් කරන්නේය. ඉදින් ක්‍රියාවක් ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගල තෙම ශරීර භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ දුක් වන්නාවූ විපතට පත්වන්නාවූ නරකයෙහි උපදින්නේය. එකාන්තයෙන්ම ක්‍රියාවක් නොවේවා. ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යවේවා. එතකුදු වුවත් මේ පින්වත් පුරුෂ පුද්ගල තෙමේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුවේ. දුශ්ශීලවූ පුරුෂ පුද්ගල තෙම අකිරියා වාද ඇත්තාවූ මිථ්‍යාදෘෂ්ටිකයෙක කියායි. ඉදින් ක්‍රියාව ඇත්තේම නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලයාගේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුය, යන යමක් වේද, ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ, නපුරු ගති ඇත්තාවූ, විපතට පත්වන්නාවූ නරකයෙහි උපදින්නේය, යන යමකුත් වේද, මේ දෙලොවින්ම පරාජය ගන්නේ වේ. මෙසේ මොහුගේ මේ එකාන්ත ධර්ම තෙම නපුරුකොට සම්පූර්ණ

කරන ලද්දේ, සමාදන් වන ලද්දේ එක් පසක් පැතිර සිටී, කුසලස්ථානය හිස්වේ.

14. "ගෘහපතියෙනි, ඔවුන් අතරෙහි යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තෝ, මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, (එනම්) කරන්නාහට, කරවන්නාහට, සිඳින්නාහට, සිඳවන්නාහට, පෙළන්නාහට, පෙළවන්නාහට, ශොක කරන්නාහට, ශොක ඇති කරවන්නාහට, ක්ලාන්ත කරවන්නාහට, කම්පා කරන්නාහට, කම්පා ඇති කරවන්නාහට, සතුන් මරන්නාහට, මරවන්නාහට, නුදුන් දෙය ගන්නාහට, ගෙවල් බිඳින්නාහට, බලහත්කාරයෙන් ගන්නාහට, එක් ගෙයක් පැහැර ගැණීම කරන්නාහට, මං පැහැරීම කරන්නාහට, අන් අඹුවන් කරා යන්නාහට, බොරු කියන්නාහට, පාපය ඇත. කෙළවර මුවහත් ඇති චක්‍රයකින්ද යමෙක් මේ පොළොවෙහි ප්‍රාණීන් එක මස් ගොඩක්, එක මස් රැසක් කරන්නේද, ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. ඉදින් ගංගානම් ගඟේ දකුණු ඉවුරටද, මරමින්, මරවමින්, සිඳිමින්, සිඳවමින්, පෙළමින්, පෙළවමින් යන්නේ නම් ඒ හේතුවෙන් පාපයක් ඇත. පාපයාගේ පැමිණීමක් ඇත. ඉදින් ගංගානම් ගඟේ උතුරු ඉවුර දක්වාද, දෙමින් දෙවමින් පුදමින්, පුදවමින් යන්නේ නම් ඒ හේතුවෙන් පිනක් ඇත.

15. "ඔවුන් පිළිබඳව මෙය කැමති විය යුතුයි. යම් මේ කයින් අයහපත් හැසිරීමක් වේද, වචනයෙන් අයහපත් හැසිරීමක් වේද, සිතින් අයහපත් හැසිරීමක් වේද, මේ අකුසලධර්ම තුන දුරුකොට යම් මේ කයින් යහපත් හැසිරීමක් වේද, වචනයෙන් යහපත් හැසිරීමක් වේද, සිතින් යහපත් හැසිරීමක් වේද, මේ කුසල ධර්ම තුන සමාදන්ව වසන්නාහුය. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය, ලාමක බව කෙලෙසීමද, කුසල ධර්මයන්ගේද කාමයන්ගේ වෙන්වීමෙහිද, ආනිසංසය, පිරිසිදු බවද දකිත්මය.

16. "ඇත්තාවූම ක්‍රියාව (ගැන) ක්‍රියාවක් ඇතැයි මොහුගේ දෘෂ්ටිය වේ. මෙය මොහුගේ (යහපත් ඇදහීම) සම්‍යක්දෘෂ්ටිය වේ. ඇත්තාවූම ක්‍රියාව ගැන ක්‍රියාවක් ඇතැයි කල්පනා කරයි.

හෙතෙම මොහුගේ යහපත් කල්පනාව වේ. ඇත්තාවූම ක්‍රියාව ගැන ක්‍රියාවක් ඇතයන වචනය කියයි. එය මොහුගේ සම්‍යක්වචනය වේ. ඇත්තාවූම ක්‍රියාව ගැන ක්‍රියාවක් ඇතැයි කීයේය. යම් මේ රහත්හු ක්‍රියා වාද ඇත්තෝ වෙත්ද, ඔවුන්ට මෙතෙම විරුද්ධ නොවෙයි. ඇත්තාවූම ක්‍රියාව ගැන ක්‍රියාවක් ඇතැයි අනුන්ට හඟවයි. එය මොහුගේ සත්‍යවූ ධර්මය හැඟවීම වේ. ඒ ධර්මය හැඟවීමෙන්ද තමන් උසස් නොකෙරෙයි. අනුන් පහත් නොකෙරෙයි. මෙසේ පළමු කොටම මොහුගේ දුශ්ශීල භාවය දුරුවූයේ වෙයි. සුසීල භාවය එළඹ සිටියේ වෙයි. මේ සම්‍යක්දෘෂ්ටියද, සම්‍යක් කල්පනාවද, සම්‍යක් වචනයද ආර්‍ය්‍යයන්ට විරුද්ධ නොවීමද, සත්‍යවූ ධර්මය හැඟවීමද තමන් උසස් නොකිරීමද අනුන් පහත් නොකිරීමදැයි මෙසේ මොහුට මේ නොයෙක් කුසල ධර්මයෝ සම්‍යක්දෘෂ්ටි හේතුවෙන් හටගණිත්.

17. "ගෘහපතියෙනි, ඔවුන් අතරෙහි නුවණැති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. ඉදින් ක්‍රියාව ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේය. එකාන්තයෙන්ම ක්‍රියාව නොවේ නම් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍ය වේවා. එතකුදු වූවත් මේ පින්වත් පුරුෂ පුද්ගල තෙම ඉහාත්මයෙහිම නුවණැත්තන්ගේ ප්‍රශංසාවට සුදුස්සෙක් වේ. සිල්වත්වූ පුරුෂ පුද්ගල තෙම ක්‍රියා වාද ඇත්තාවූ සම්‍යක්දෘෂ්ටිකයෙක කියායි. ඉදින් ක්‍රියාව ඇත්තේම නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලයාගේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ප්‍රශංසාවට සුදුසුය යන යමක් වේද, ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නේය යන යමකුත් වේද, මේ දෙලොවින්ම ජයගැණීම වේ. මෙසේ මොහුගේ මේ එකාන්තවූ ධර්මය තෙම මනාව සම්පූර්ණ කරන ලද්දේ, සමාදන්වන ලද්දේ, දෙපසම පැතිර සිටියි. අකුසල්වූ කාරණය හිස් වේ.

18. "ගෘහපතියෙනි, මෙබඳු වාද ඇත්තාවූ, මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ වෙත්. සත්වයන්ගේ

කෙලෙසීමට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්වයෝ කෙලෙසෙන්නාහුය. සත්වයන්ගේ පිරිසිදුවීමට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්වයෝ පිරිසිදු වෙත්. බලයක් නැත. වීර්‍ය්‍යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියළු සත්වයෝ සියළු ප්‍රාණීහු සියළු භූතයෝ සියළු ජීවයෝ අවසඟන වූවාහු බලයක් නැත්තාහු වීර්‍ය්‍ය නැත්තාහු නියමය සංගමය ස්වභාවය යන මෙයින් නොයෙක් ප්‍රකාරයට පැමිණියාහු සවැදෑරුම්වූම ජාතිවල සැප දුක් විඳිත්යයි, දෘෂ්ටි ඇත්තෝ වෙත්. ගෘහපතියෙනි, ඒ මහණ බමුණන්ටම සමහර මහණ බමුණෝ කෙළින්ම විරුද්ධ වාද ඇත්තෝ වෙත් ඔව්හු මෙසේ කීහ. 'සත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් ඇත. ප්‍රත්‍යයක් ඇත. හේතුවක් ඇතිව ප්‍රත්‍යයක් ඇතිව සත්වයෝ කිළුටුවන්නාහ. සත්වයන්ගේ පිරිසිදු වීමට හේතුවක් ඇත. ප්‍රත්‍යයක් ඇත. හේතුවක් ඇතිව ප්‍රත්‍යයක් ඇතිව සත්වයෝ පිරිසිදු වෙත්. බලයක් ඇත. වීර්‍ය්‍යයක් ඇත. පුරුෂ ශක්තියක් ඇත. පුරුෂ පරාක්‍රමයක් ඇත. සියළු සත්වයෝ සියළු ප්‍රාණීහු සියළු භූතයෝ සියළු ජීවයෝ වසඟ වූවාහු බලයක් නැත්තාහු වීර්‍ය්‍යයක් නැත්තාහු නියමය සංගමය ස්වභාවය යන මෙයින් නානාප්‍රකාර බවට පැමිණියාහු සවැදෑරුම්වූ ජාතිවල සැප දුක් නොවිඳිත්යයි' ගනිත්, ගෘහපතියනි, ඒ කුමකැයි හඟිව්ද? මේ මහණ බමුණෝ ඔවුනොවුන්ට කෙළින්ම විරුද්ධ වාද ඇත්තෝ නොවෙත්ද?" "එසේය, ස්වාමීනි."

**19.** "ගෘහපතියෙනි, ඔවුන් අතරෙහි යම් මේ මහණ බමුණෝ මෙබඳුවාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, (එනම්) සත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්වයෝ කෙලෙසෙන්නාහ. සත්වයන්ගේ පිරිසිදු වීමට හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්වයෝ පිරිසිදුවෙත්. බලයක්නැත. වීර්‍ය්‍යයක් නැත පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියළු සත්වයෝ සියළු ප්‍රාණීහු සියළු භූතයෝ සියළු ජීවයෝ වසග නොවන්නාහු බලයක් නැත්තාහු වීර්‍ය්‍යයක් නැත්තාහු නියමය සංගමය

ස්වභාවය යන මෙයින් නොයෙක් ප්‍රකාර බවට පැමිණියාහු සවැදෑරුම්වූ ජාතිවල සැපදුක් විඳිත් යයි ගනිත්ද, ඔවුන් පිළිබඳව මෙය කැමති වියයුතුයි. යම් මේ කයින් යහපත් හැසිරීමක් වේද, වචනයෙන් යහපත් හැසිරීමක් වේද, හිතින් යහපත් හැසිරීමක් වේද, මේ කුසල ධර්ම තුන දුරුකොට යම් මේ කයින් අයහපත් හැසිරීමක් වේද, වචනයෙන් අයහපත් හැසිරීමක් වේද, සිතින් අයහපත් හැසිරීමක් වේද, මේ අකුසල ධර්මතුන සමාදන්ව වසන්නාහුය. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය, ලාමක බව, කෙලෙසීමද, කුසල ධර්මයන්ගේද, කාමයන්ගෙන් වෙන්වීමෙහිද ආනිශංසය, පිරිසිදු බව නොදකිත්මැයි. ඇත්තාවූම හේතුවක් නැතැයි මොහුගේ දෘෂ්ටියවෙයි. මෙය මොහුගේ මිථ්‍යා දෘෂ්ටියවේ. ඇත්තාවූම හේතුවක් නැතැයි කල්පනා කරයි. හෙතෙම මොහුගේ මිථ්‍යා කල්පනා වේ. ඇත්තාවූම හේතුව හේතුවක් නැත යන වචනය කියයි. ඒ මොහුගේ මිථ්‍යා වචනයවේ. ඇත්තාවූම හේතුව, හේතුවක් නැතැයි කියයි. යම් මේ රහත්හු හේතුවාද ඇත්තෝ වෙත්ද, ඔවුන්ට මෙතෙම විරුද්ධ වෙයි. ඇත්තාවූම හේතුව, හේතුවක් නැතැයි අනුන්ට හඟවයි එය මොහුගේ අසත්‍යවූ ධර්මය හැඟවීමවේ. ඒ අසත්‍යවූ ධර්මය හැඟවීමෙන්ද තමා උසස් කරයි. අනුන් පහත් කරයි. මෙසේ පළමුකොටම මොහුගේ සුසීල භාවය දුරුවූයේ වෙයි දුශ්ශීල භාවය එළඹ සිටියේ වෙයි. මේ මිථ්‍යා දෘෂ්ටියද මිථ්‍යා කල්පනාවද මිථ්‍යා වචනයද, ආර්‍ය්‍යයන්ට විරුද්ධවීමද, අසත්‍යවූ ධර්මය හැඟවීමද, තමන් උසස් කිරීමද අනුන් පහත් කිරීමදැයි මෙසේ මොහුට මේ නොයෙක් ලාමකවූ අකුසල ධර්මයෝ මිථ්‍යා දෘෂ්ටි හේතුවෙන් හටගණිත්.

**20.** "ගෘහපතිවරුනි, ඔවුන් අතර නුවණැති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. ඉදින් හේතුවක් නැත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් තමහට සුවයක් කරන්නේය. ඉදින් හේතුව ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂපුද්ගලතෙම ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු සැප

නැත්තාවූ නපුරු ගති ඇත්තාවූ විපතට පත්වන්නාවූ නරකයෙහි උපදින්නේය. ඒකාන්තයෙන්ම හේතුව නොවීද, ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යවේවා. එතකුදු වූවත් මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම මෙ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුවේ. දුශ්ශීලවූ පුරුෂ පුද්ගලතෙම අහේතුවාද ඇත්තාවූ මිථ්‍යා දෘෂ්ටියෙක කියායි. ඉදින් හේතුවක් ඇත්තේම නම් මේ පින්වත් පුරුෂ පුද්ගලයාගේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ගැරහීමට සුදුසුය යන යමක් ඇද්ද ශරීරයාගේ භෙදයෙන් මරණින්මතු සැප නැත්තාවූ නපුරු ගති ඇත්තාවූ විපතට පත්වන්නාවූ නරකයෙහි උපදින්නේය යන යමකුත් ඇද්ද, මේ දෙලොවෙන්ම පරාජය වේ. මෙසේ මොහුට මේ ඒකාන්තවූ ධර්මය තෙම අයහපත් කොට සම්පූර්ණ කරන ලද්දේ, සමාදන්වන ලද්දේ එක්පැත්තක පැතිර සිටියි. කුසල කාරණය හිස් වෙයි.

21. "ගෘහපතියෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද (එනම්) සත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් ඇත ප්‍රත්‍යයක් ඇත. හේතු සහිතව ප්‍රත්‍ය සහිතව සත්වයෝ කිළුටු වන්නාහ. සත්වයන්ගේ පිරිසිදුවීමට හේතුවක් ඇත. හේතු සහිතව ප්‍රත්‍ය සහිතව සත්වයෝ පිරිසිදුවෙත්. බලයක් ඇත. වීර්‍ය්‍යයක් ඇත. පුරුෂ ශක්තියක් ඇත. පුරුෂ පරාක්‍රමයක් ඇත. සියළු සත්වයෝ සියළු ප්‍රාණය ඇත්තෝ සියළු හටගැණීම ඇත්තෝ සියළු ජීවය ඇත්තෝ වසඟ නොවන්නාහු බල නැත්තාහු වීර්‍ය්‍ය නැත්තාහු නියමය සංගමය ස්වභාවය යන මෙයින් නොයෙක් ප්‍රකාර බවට පැමිණියාහු සවැදෑරුම්වූ ජාතිවල සැපදුක් නොවිඳිත්ය කියායි. ඔවුන් ගැන මෙය කැමතිවිය යුතුයි. යම් මේ කයින් අයහපත් හැසිරීමක් වේද වචනයෙන් අයහපත් හැසිරීමක් වේද සිතින් අයහපත් හැසිරීමක් වේද, මේ අකුසල ධර්මතුන දුරුකොට යම් මේ කයින් යහපත් හැසිරීමක් වේද වචනයෙන් යහපත් හැසිරීමක් වේද, සිතින් යහපත් හැසිරීමක් වේද, මේ කුසල ධර්ම තුන සමාදන්ව වසන්නාහුය. ඊට හේතු කවරේද? ඒ පින්වත් මහණ බමුණෝ අකුසල ධර්මයන්ගේ දොෂය ලාමක බව කෙලෙසීම

කුසල ධර්මයන්ගේ, කාමයන්ගෙන් වෙන් වීමෙහිද ආනිසංසය පිරිසිදු බව දකිත්මැයි. ඇත්තා වූම හේතුවගේ හේතුවක් ඇතැයි මොහුගේ දෘෂ්ටිය වෙයි. මෙය මොහුගේ සම්‍යක් දෘෂ්ටියවේ. ඇත්තාවූම හේතුව, හේතුවක් ඇතැයි කල්පනා කරයි. එය මොහුගේ සම්‍යක් සංකල්පය වේ. ඇත්තාවූම හේතුව, හේතුවක් ඇතැයි යන වචනය කියයි. ඒ මොහුගේ සම්‍යක් වචනයවේ. ඇත්තාවූම හේතුව හේතුවක් ඇතැයි කීය. යම් මේ රහත්හු හේතු වාද ඇත්තෝද ඔවුන්ට මෙතෙම විරුද්ධ නොවෙයි. ඇත්තාවූම හේතුව හේතුවක් ඇතැයි අනුන්ට හඟවයි. එය මොහුගේ සත්‍යවූ ධර්මය හැඟවීමවේ. ඒ සත්‍යවූ ධර්මය හැඟවීමෙන්ද තමන් උසස් නොකරයි. අනුන් පහත් නොකරයි. මෙසේ පළමුකොටම මොහුගේ දුශ්ශීල භාවය දුරුවූයේ වෙයි. සුසීල භාවය එළඹ සිටියේ වෙයි. මේ සම්‍යක් දෘෂ්ටියද සම්‍යක් සංකල්පයද සම්‍යක් වචනයද ආර්‍ය්‍යයන්ට විරුද්ධ නොවීමද සත්‍යවූ ධර්මය හැඟවීමද තමන් උසස් නොකිරීමද අනුන් පහත් නොකිරීමදැයි මෙසේ මොහුට මේ නොයෙක් කුසල ධර්මයෝ සම්‍යක් දෘෂ්ටි හේතුවෙන් හට ගණිත්.

22. ගෘහපතියෙනි, ඔවුන් අතර නුවණැති පුරුෂතෙම මෙසේ කල්පනා කරයි. ඉදින් හේතුව ඇත්නම් මෙසේ මේ පින්වත් පුරුෂ පුද්ගල තෙම ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ ස්වර්ග ලොකයෙහි උපදින්නේය. එකාන්තයෙන්ම හේතුවක් නොවේද, ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍ය වේවා. එතකුදු වුවත් මේ පින්වත් පුරුෂ පුද්ගලතෙම මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ප්‍රශංසාවට සුදුසුවේ. සිල්වත්වූ පුරුෂ පුද්ගල තෙමේ හේතු වාද ඇත්තාවූ සම්‍යක් දෘෂ්ටියෙක කියායි. ඉදින් හේතුව ඇත්තේම නම් මෙසේ මේ පින්වත් පුරුෂපුද්ගලයාගේ මේ ආත්මයෙහිම නුවණැත්තන්ගේ ප්‍රශංසාවට සුදුසුය යන යමක් ඇද්ද ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේය යන යමකුත් ඇද්ද මේ දෙලොවෙන්ම ජය ගැණීම වේ. මෙසේ මොහුගේ මේ එකාන්ත ධර්මය තෙම මනාකොට

සම්පූර්ණ කරන ලද්දේ සමාදන්වන ලද්දේ දෙපසම පැතිර සිටියි. අකුසල කාරණය හිස් වේ.

23. "ගෘහපතියෙනි, මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ සමහර මහණ බමුණෝ වෙත්. සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්ම ලෝක නැතැයි කියායි.

"ගෘහපතියෙනි, ඒ මහණ බමුණන්ටම ඇතැම් මහණ බමුණෝ කෙළින්ම විරුද්ධ වාද ඇත්තෝ වෙත්. ඔව්හු මෙසේ කීහ. සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්මලෝක ඇත' යනුයි. ගෘහපතියෙනි, ඒ කුමකැයි හඟිව්ද? මේ මහණ බමුණෝ ඔවුනොවුන්ට කෙළින්ම විරුද්ධ වාද ඇත්තෝ නොවෙත්ද?"

"එසේය, ස්වාමීනි"

"ගෘහපතියෙනි, ඔවුන් අතුරෙහි නුවණැති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. යම් ඒ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) 'සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්ම ලෝක නැත යනුයි. මෙය මා විසින් නොදක්නා ලදී. යම් ඒ පින්වත් මහණ බමුණෝද මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්මලොක ඇත යනුයි. මෙය මා විසින් නොදක්නා ලදී. මමද වනාහී නොදන්නෙම් නොදක්නෙම් මෙයම සත්‍යය අනික හිස්යයි ඒකාන්තයෙන් ගෙණ ව්‍යවහාර කරන්නෙම්ද, මෙය මට සුදුසු නොවන්නේය.' යම් මේ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්මලොක නැත යනුයි. ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍ය නම්, මේ කරුණ විද්‍යමාන වේ. යම් ඒ රූපාවචර දෙවියෝ ධ්‍යාන සිතින් උපන්නාහු වෙත්ද, එහි මාගේ ඉපදීම ඒකාන්ත වන්නේය. යම් ඒ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) සියළු ආකාරයෙන් අරූප බ්‍රහ්මලෝක ඇත යනුයි. ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යය නම්, මේ කරුණ විද්‍යමාන වේ. යම් ඒ අරූපාවචර දෙවියෝ

අරූපාවචර සංඥාවෙන් උපන්නාහු වෙත්ද, ඒකාන්තයෙන් මාගේ එහි ඉපදීම වන්නේය. රූපය හේතු කොට ගෙන දඬු ගැණීම ආයුධ ගැණීම, කලහ කිරීමය, ඩබර කිරීමය, විරුද්ධ වාදය, නුඹය නුඹය කීමය, කේලාම් කීමය, බොරු කීමය, යන මොහු දක්නා ලැබෙත්මය. මෙය වනාහි සියළු ආකාරයෙන් අරූප ලෝකයෙහි නැතැයි හෙතෙම මෙසේ කල්පනාකොට රූපයන්ගේම කලකිරීම පිණිස නො ඇලීම පිණිස නැති කිරීම පිළිපදින්නේ වෙයි.

"ගෘහපතියෙනි, මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ සමහර මහණ බමුණෝ වෙත් (එනම්) 'සියළු ආකාරයෙන් භව නිරොධයක් (උත්පත්තිය නැති කිරීමක්) නැත යනුයි. ගෘහපතියෙනි, ඒ මහණ බමුණන්ටම සමහර මහණ බමුණෝ කෙළින්ම විරුද්ධ වාද ඇත්තෝ වෙත්.' ඔවුහු මෙසේ කීවාහුය. සියළු ආකාරයෙන් භවනිරෝධයක් ඇත යනුයි. ගෘහපතියෙනි, ඒ කුමකැයි හඟිව්ද? මේ මහණ බමුණෝ ඔවුනොවුන්ට විරුද්ධ වාද ඇත්තෝ නොවෙත්ද?" "එසේය ස්වාමීනි"

**24.** "ගෘහපතියෙනි, ඔවුන් අතර නුවණැති පුරුෂ තෙමෙ මෙසේ කල්පනා කරයි. යම් මේ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) 'සියළු ආකාරයෙන් භවනිරොධයක් නැත යනුයි. මෙය මා විසින් නොදක්නා ලදී.' යම් මේ මහණ බමුණෝද මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, (එනම්) 'සියළු ආකාරයෙන් භවනිරොධයක් ඇත යනුයි. මෙය මා විසින් නොදන්නාලදී. මමද වනාහී නොදන්නෙම් නොදක්නෙම්, මෙයම සත්‍යය. අනික හිස්යයි ඒකාන්තයෙන් ගෙන ව්‍යවහාර කරන්නෙම්ද මෙය මට සුදුසු නොවන්නේය.' යම් මේ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද (එනම්) 'සියළු ආකාරයෙන් නිවණක්, භව නිරොධයක් නැත යනුයි. ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යය නම් මේ කාරණය

විද්‍යමාන වේ. යම් ඒ අරූපාවචර දෙවියෝ ධ්‍යාන සංඥාවෙන් උපන්නාහුවෙත්ද, ඒකාන්තයෙන් මාගේ එහි ඉපදීම වන්නේය.' යම් ඒ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, (එනම්) 'සියළු ආකාරයෙන් භවනිරොධයක් ඇත යනුයි. ඉදින් ඒ පින්වත් මහණ බමුණන්ගේ වචනය සත්‍යය නම් මේ කාරණය විද්‍යමාන වේ. මේ ආත්මයෙහිම පරිනිර්වාණයට පැමිණෙන්නෙමි. 'යම් ඒ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, (එනම්) 'සියළු ආකාරයෙන් භවනිරොධයක් නැත යනුයි.' ඔවුන්ගේ මේ දෘෂ්ටිය රාගයාගේ සමීපයෙහි, සංයොජනයාගේ සමීපයෙහි, ආශාවෙන් සතුටුවීමගේ සමීපයෙහි, ක්ලෙශයන්හි බැසගැනීමගේ සමීපයෙහි, උපාදානයන්ගේ සමීපයෙහි වේ. යම් ඒ පින්වත් මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු, මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද? (එනම්) 'සියළු ආකාරයෙන් භවනිරොධයක් ඇත යනුයි.' ඔවුන්ගේ මේ දෘෂ්ටිය නොඇලීමගේ සමීපයෙහි නොබැඳීමගේ සමීපයෙහි, ආශාවෙන් සතුටු නොවීමගේ සමීපයෙහි, ක්ලෙශයන්හි බැසනොගැනීමගේ සමීපයෙහි, අනුපාදානයන්ගේ සමීපයෙහි වේයයි.' හෙතෙම මෙසේ කල්පනා කොට භවයන්ගේම කලකිරීමට, නොඇලීමට, නැති කිරීමට පිළිපදින්නේ වෙයි

25. "ගෘහපතියෙනි, මේ පුද්ගලයෝ සතරදෙනෙක් ලොකයෙහි ඇත්තාහු විද්‍යමාන වෙත්. කවර සතරදෙනෙක්දයත්? ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තවන්ගේ තමන් තැවීමෙහි යෙදුනේ වෙයි. ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් අනුන් තවන්නේ, අනුන් තැවීමෙහි යෙදුනේ වෙයි. ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් තවන්නේ, තමන් තැවීමෙහි යෙදුනේද, අනුන් තවන්නේ, අනුන් තැවීමෙහි යෙදුනේද වෙයි. ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් තමන් නොතවන්නේ තමන් තැවීමෙහි නොයෙදුනේද, අනුන් නොතවන්නේ අනුන් තැවීමෙහි නොයෙදුනේද වෙයි. හෙතෙම තමන්ද නොතවන්නේ

අනුන්ද නොතවන්නේ ඉහාත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ නිවියේ සිහිල්වූයේ සැප විඳින සුළුවූයේ ශ්‍රෙෂ්ඨවූ ආත්මයෙන් යුක්තව වාසය කරයි.

**26.** "ගෘහපතියෙනි, තමන් තවන්නාවූ, තමන් තැවීමෙහි යෙදුනාවූ පුද්ගල තෙම කවරේද? ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් නිර්වස්ත්‍ර වෙයි, හරණලද ආචාර ඇත්තේ වෙයි, අත ලෙවකෑම නොහොත් මලපහකොට අතින් පිස දැමීම කරන්නේ වෙයි. 'එව ස්වාමීනි,' කීවිට නොඑන්නේ වෙයි. 'සිටිනු ස්වාමීනියි,' කීවිට නොසිටින්නේවෙයි, පළමුකොට දුන් දෙය නොපිළිගනියි, උදෙසා කරන ලද්ද නොපිළිගනියි, පැවරීම නොඉවසයි, හෙතෙම සැළි මුවින් ගෙන දුන් දෙය නොපිළිගනියි, භාජන මුවින් ගෙන දුන් දෙය නොපිළිගනියි, එළිපත අතර කොට දුන් දෙය නොපිළිගනියි, දණ්ඩක් අතර කොට දුන් දෙය නොපිළිගනියි, මොහොලක් අතර කොට දුන්දෙය නොපිළිගනියී, වළඳන්නාවූ දෙදෙනෙකු අතුරින් දුන් දෙය නොපිළිගනියි, ගැබිණියකගෙන් නොපිළිගනියි, කිරි පොවන්නියකගෙන් නොපිළිගනියි, පුරුෂයන් අතරට ගිය තැනැත්තියකගෙන් නොපිළිගනියි, සමාදන් කොට දුන් කල්හි නොපිළිගනියි, යම් තැනක සුනඛයෙක් සිටියේද එතන්හි නොපිළිගනියි, යම් තැනක මැස්සෝ රංචු රංචු ගැවසෙත්ද එතැන්හි නොපිළිගනියි, මත්ස්‍ය ආහාරය නොපිළිගනියි, මස් නොපිළිගනියි, මත්පැන් නොපිළිගනියි, කාඩිදිය නොබොයි, හෙතෙම එක ගෙයකින් ලැබුන ආහාර ඇත්තේ හෝ වෙයි, එක පිඩකින් යැපෙන්නේ හෝ වෙයි, ගෙවල් දෙකකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි, පිඩු දෙකකින් යැපෙන්නේ හෝ වෙයි, ගෙවල් සතකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි, පිඩු සතකින් යැපෙන්නේ හෝ වෙයි, එකම දත්තියකින් (කුඩාවූ ආහාර භාජනයකින්) ද යැපෙයි, දත්ති දෙකකින්ද යැපෙයි, දත්ති සතකින්ද යැපෙයි, එක් දවසක් හැර දවසක්ද ආහාරය ගනියි, දෙදවසක් හැර දවසක්ද ආහාරය ගනියි, මෙසේ මෙබඳු අඩ මසක් හැර දවසක්ද පයඝාය භක්ත භොජනානුයොගයෙහි යෙදුනේ වාසය කරයි. හෙතෙම අමු

කොළ අනුභව කරන්නේ හෝ වෙයි, බඩ අමු අනුභව කරන්නේ හෝ වෙයි, ඌරු හැල් අනුභව කරන්නේ හෝ වෙයි, සම් කසට අනුභව කරන්නේ හෝ වෙයි, මැලියම් අනුභව කරන්නේ හෝ වෙයි, කුඩු අනුභව කරන්නේ හෝ වෙයි, දඹු බත් අනුභව කරන්නේ හෝ වෙයි, තල මුරුවට අනුභව කරන්නේ හෝ වෙයි, තණකොළ අනුභව කරන්නේ හෝ වෙයි, ගොම අනුභව කරන්නේ හෝ වෙයි, වනයෙහි අල වර්ග හා ගෙඩි වර්ග ආහාර කොට ඇත්තේ වැටුනු ඵල අනුභව කිරීම ඇත්තේ එයින් යැපෙයි.

"හෙතෙම හණ වැහැරිද දරයි. මල සිරුරෙන් දැමූ වස්ත්‍රද දරයි, පාංශුකූල වස්ත්‍රද දරයි, රිටි සුඹුලෙන් කළ වස්ත්‍රද දරයි, අඳුන් දිවි සම්ද දරයි, කුර සහිත අඳුන් දිවි සම්ද දරයි, කුස තණ වැහැරිද දරයි, කෙඳිවලින් කළ වැහැරිද දරයි, පතුරු වලින් කළ වැහැරිද දරයි, මිනී කෙස්වලින් කළ කම්බිලියද දරයි, අස් ලොම් ආදියෙන් කළ කම්බිලියද දරයි, බකමුහුණු පිහාටු ගොතා කළ වස්ත්‍රද දරයි, හිසකේ රැවුලු ඉදිරීමයයි කියනලද පිළිවෙතෙහි යෙදුනේ වෙයි, ආසන ප්‍රතික්ෂෙප කරන ලද්දේ උඩ බලා සිටින්නේ වෙයි, උක්කුටික වූයේද වෙයි, කටු ඇතිරියෙහිද සයනය කරයි, දවසට තුන්වරක් දියට බසින පිළිවෙතෙහි යෙදුනේ වාසය කරයි. මෙසේ මෙබඳු අනෙක ප්‍රකාරවූ ශරීරය තවන අතිශයින් තවන පිළිවෙතෙහි යෙදුනේ වාසය කරයි. ගෘහපතියෙනි, මේ පුද්ගල තෙම තමන් තවන්නේ, තමන් තවන පිළිවෙතෙහි යෙදුනේ යයි කියනු ලැබේ.

27 "ගෘහපතියෙනි, අනුන් තවන්නාවූ, අනුන් තවන පිළිවෙතෙහි යෙදුනාවූ පුද්ගලතෙම කවරේද? ගෘහපතියෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් එළුවන් මරා ජීවත්වන්නෙක්වේද, ඌරන් මරා ජීවත් වන්නෙක් වේද, ලිහිණින් මරන්නේ වෙයිද. මුවන් මරන්නේ වෙයිද, රෞද්‍රවූයේ වෙයිද, මසුන් මරන්නේ වෙයිද, සොරකම් කරන්නේ වෙයිද, සොරකම් පිණිස මිනිසුන් මරන්නේ වෙයිද, සිරගෙවල පාලකයෝදවෙත්ද, අනාවූද යම්කිසි ක්‍රෑර කර්මාන්ත ඇත්තේ වෙත්ද, ගෘහපතියෙනි,

මේ පුද්ගලතෙම අනුන් තවන්නේ, අනුන් තැවීමෙහි යෙදුනේයයි කියනු ලැබේ.

28. "ගෘහපතියෙනි, තමන් තවන්නාවූ, තමන් තවන අනුයෝගයෙහි යෙදුනාවූද, අනුන් තවන්නාවූ අනුන් තවන අනුයෝගයෙහි යෙදුනාවූද පුද්ගලතෙම කවරේද? ගෘහපතිවරුනි, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ක්ෂත්‍රියවූ මස්තකයෙහි අභිෂෙක කළාවූ රජෙක් හෝ වෙයි. මහාසාර බ්‍රාහ්මණයෙක් හෝ වෙයි. හෙතෙම නුවරට පෙරදිග අළුත්වූ යාග ශාලාවක් කරවා හිසකේ රැවුල් බහවා කුරසහිත අඳුන් දිවි සමක් ඇඳ ගිතෙලින් හා තල තෙලින් සිරුර තවරා මුව අගින් පිට කසමින් මෙහෙසියද පෙරෙවි බමුණාද සමග යාග ශාලාවට පිවිසෙති. හෙතෙම එහී නොඅතුරනලද ගොම පිරිබඩ කළාවූ බිම නිදයි. ස්වරූපයෙන් සමාන වස්සන් ඇති එක දෙනකගේ තනයෙක්හි යම් කිරක් වේද, එයින් රජ තෙම යැපෙයි. දෙවෙනි තනයෙහි යම් කිරක් වේද, එයින් මෙහෙසිය යැපෙයි. තෙවන තනයෙන් යම් කිරක් වේද, එයින් පෙරෙවි බමුණා යැපෙයි. සිව්වන තනයෙහි යම් කිරක් වේද එයින් ගිනි පුදත්. ඉතිරි වූවකින් වස්සා යැපෙයි. හෙතෙම මෙසේ කියයි. යාගය පිණිස මෙපමණ ගවයෝ නසත්වා. යාගය පිණිස මෙපමණ බලවත් වස්සෝ නසත්වා යාගය පිණිස මෙපමණ බලවත් වැස්සියෝ නසත්වා. යාගය පිණිස මෙපමණ එළුවෝ නසත්වා. යාගය පිණිස මෙපමණ තිරෙළුවෝ නසත්වා යාග කණු පිණිස මෙපමණ රුක් සිඳිත්වා. යාග භූමිය වට කිරීම පිණිස හා ඇතිරීම පිණිසද මෙතෙක් කුසතණ සිඳිත්වා ඔහුගේ යම් ඒ දාසයෝය කියා හෝ පණිවුඩ කාරයෝය කියා හෝ කම්කරුවෝය කියා හෝ කෙනෙක් වෙත්ද, ඔවුහුද දණ්ඩෙන් තැතිගත්තාහු භයින් තැතිගත්තාහු කඳුළු පිරුණු මුහුණු ඇත්තාහු හඬමින් පරිකම් කරත්. ගෘහපතියෙනි, මේ පුද්ගලතෙම තමාත් තවන්නේ තමන් තැවීමෙහි යෙදුනේද අනුන් තවන්නේ අනුන් තැවීමෙහි යෙදුනේද වේයයි කියනු ලැබේ.

**29.** "ගෘහපතිවරුනි, තමන් නොමතවන්නාවූද තමන් නොතැවී මෙහි යෙදුනාවූද අනුන් නොතවන්නාවූද අනුන් නොතැවීමෙහි යෙදුනාවූද පුද්ගල තෙම කවරේද? හෙතෙම තමන්ද නොතවන්නේ අනුන්ද නොතවන්නේ මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ නිවියේ සිහිල්වූයේ සැප විඳින සුලුවූයේ ශ්‍රෙෂ්ඨවූ ආත්මයෙන් යුක්තව වාසය කරයි.

**30.** "ගෘහපතියෙනි, එසේම මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ යහපත් ගති ඇත්තාවූ, සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනයකිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙව් මිනිසුන්ට ගුරුවරයෙක්වූ, චතුස්සත්‍ය අවබොධ කළාවූ තථාගත කෙනෙක් මොලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙව් මිනිසුන් සහිතවූ, මේ ලොකය ස්වකීය විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරයි. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ අවසානය යහපත්වූ අර්ථ සහිතවූ, දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ, ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරති.

"ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද ඔහු ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. ගිහි ගෙයි විසීම අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු අකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුල කපාදමා සිවුරු හැඳ ගිහි ගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙමි නම් ඉතා යහපතැයි කියායි.

31. "ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් හැර, ස්වල්පවූ හෝ බොහෝවූ හෝ නෑපිරිස් හැර, කෙස් දැලි රැවුලු කපාදමා, සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නේය. එසේ මහණවූ හෙතෙම භික්ෂු සීලයෙන් යුක්තවූයේ, ප්‍රාණවධ හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුධ ඇත්තේ පව් කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළකුණේ. දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමති වන්නේ, සොර නොවූ, පිරිසිදු සිතින් යුක්තව වාසය කෙරේ. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරීවේ. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, සැබෑ වචන කියන්නේ, සැබවින් සැබව ගළපන ගති ඇතුව ස්ථිරකථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. පිසුනු බස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, මෙතැනින් අසා ඔවුන් බිඳීම පිණිස එතැන නොකියන ගති ඇත්තේ, එතැනින් අසා මොවුන් බිඳීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේ, මෙසේ භෙද වූවන් ගළපන්නේ සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ සමගිය ඇති කරණ වචන කියන්නේය ඵරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, යම් වචනයක් නිදොස් වේද, කණට මිහිරිද, ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රියකරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ වචනම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්තවූ විනයයෙන් යුක්තවූ වචන කියන්නේ සුදුසු කල්හි, උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

32. "හෙතෙම තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැළකුණේ වෙයි, එක් වේලක් වළඳන්නේ රාත්‍රි භොජනයෙන් වැළකුණේ විකාල භොජනයෙන් වැළකුණේ වෙයි. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළකුණේ වෙයි. මල්, ගඳ, විළවුන් පැළඳීම, ඉන් සැරසීම අඩු තැන් පිරවීම අලංකාර කිරීම යන මෙයින් වැළකුණේ වෙයි, උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළකුණේ වෙයි. රන් රිදී මසු කහවණු පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. ස්ත්‍රීන් තරුණියන් පිළිගැන්මෙන් තොරවූයේවෙයි, එළුවන් බැටළුවන් පිළිගැන්මෙන් වැළකුණේවෙයි. ඌරන් කුකුළන් පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. ඇතුන් ගවයින්, අසුන්, වෙළඹුන්, පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. කෙත්, වත්, පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන්ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් වැළකුණේ වෙයි. විකිණීම මිළට ගැණීම යන මෙයින් වැළකුණේ වෙයි. තරාදියෙන් හොර කිරීම, රන් නොරන් කිරීමාදියෙන් හොර කිරීම මැනීමෙන් හොර කිරීමාදියෙන් වැළකුණේ වෙයි. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොග යන මෙයින් වැළකුණේ වෙයි. කැපීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාර කමින් වස්තු පැහැර ගැන්මය, යන මෙයින් වැළකුණේ වෙයි.

33. "හෙතෙමේ යම්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වන්නේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් ඒ ඒ තැනට එය ගෙන යන්නේ වෙයි යම්සේ පක්ෂියෙක් යම් තැනකට පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය වැසීමට ප්‍රමාණවූ සිවුරෙන්ද යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටු වන්නේවේ. ඔහු යම් තැනකට

යා නම් ඒ ඒ තැන එය රැගෙණම යයි. හෙතෙමේ මේ උතුම් සීලයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි නිරවද්‍යවූ සැපය විඳින්නේය.

34. “හෙතෙමේ, ඇසින් රූපයක් දැක එහි මහත් සටහන් සිතට ගන්නේ නැත. කුඩා සටහන් සිතට ගන්නේ නැත. චක්ෂු ඉන්ද්‍රියෙහි අසංවරව වසන්නහුට යමක් හේතු කොට ගෙන ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එහි සංවරය පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ චක්ෂු ඉන්ද්‍රියය රකී චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

“කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් ගන්නේ නොවේ. නැවත නැවත මතක්වනසේ අල්ලා ගන්නේ නොවේ. යමක් හේතු කොට ගෙන ශ්‍රොතෙන්ද්‍රිය (කන්) අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිද්ද ඒ ශ්‍රොතෙන්ද්‍රියන් සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොතෙන්ද්‍රිය රකී. ශ්‍රොතෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

“නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ සිතට නොගනී. යමක් හේතු කොට ගෙන ඝ්‍රානෙන්ද්‍රිය (නාසය) අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ඝ්‍රානෙන්ද්‍රිය රකියි. ඝ්‍රානෙන්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. දිවෙන් රසක් විඳ එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ නොගනී. යමක් හේතු කොට ගෙන ජිව්හේන්ද්‍රිය සංවර නොකොට වාසය කරන්නාහට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ජිව්හෙන්ද්‍රිය (දිව) ආරක්ෂාකරයි. ජිව්හෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

“කයින් පහසක් ස්පර්ශකොට නිමිති වශයෙන් නොගනියි නැවත නැවත මතක්වනසේ සිතට නොගනී. යමක් හේතු කොට කායෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

ධර්මයෝ උපදිත්ද, ඒ කායෙන්ද්‍රිය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රිය ආරක්ෂාකරයි. කායෙන්ද්‍රියේ සංවරයට පැමිණෙයි. සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවතත් මතක්වනසේ සිතට නොගනී. යම් හෙයකින් සිත අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ මනින්ද්‍රිය (සිත) සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකී. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හෙතෙමේ මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳින්නේය.

35. "හෙතෙමේ ඉදිරියට යාමෙහිද ආපසු යාමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගුකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. සඟල සිවුර සහ පාත්‍ර සිව්රු දැරීමෙහි නුවණින් යුක්තවූයේ වෙයි. අනුභව කිරීමය, පානය කිරීමය, රස විඳීමය යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින් යුක්ත වූයේ වෙයි. යැම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද වීම් යන මෙහිද නුවණින් යුක්ත වූයේ වෙයි.

36. "උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, පර්වතද, කඳුරැලිද, ගල් ගුහාද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑද හිස්තැන්ද, පිදුරු ගොඩවල්ද යන මේ විවේක සෙනාසන භජනය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළකුණේ, පයඞ්කය බැඳ, ශරීරය කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි.

37. "ඔහු ස්කන්ධ ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව වාසය කරයි. සියලු සතුන් කෙරෙහි

හිතානුකම්පා ඇතිව වාසය කරයි. ක්‍රොධයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරු කොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරු කොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. සැකය දුරු කොට, පහකළ සැක ඇත්තේ කුශල ධර්ම විෂයෙහි එසේද මෙසේදැයි සැක නැතිව විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

"හෙතෙම සිත කිලුටු කරන්නාවූද, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංච නීවරණයන් දුරුකොට, කාමයන් ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ගෘහපතියෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුලත පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ගෘහපතියෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්ත වූයේ, නුවණින් යුක්ත වූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආය්‍ර්‍යයෝ යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇති, සැප විහරණ ඇත්තේයයි කියද්ද, ඒ තෘතියධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ගෘහපතියනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද (ධ්‍යානය ලැබීමට) පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන්, දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"හෙතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේද යත්? "එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, අසුවල් තැන උපන්නෙමි, එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි වීමි. ඒ මම එයින් චුතවූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි.

38. "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත නමයි. හේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳලොව උපදින්නාවූද නරක ලොව උපදින්නාවූද කර්මයට අනුව උපදින්නාවූ සත්වයන් දකී. 'මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ, වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආර්‍ය්‍යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මිථ්‍යාදෘෂ්ටිකර්ම සමාදන්වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ, වාග් සුචරිතයෙන් යුක්තවූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආයර්‍ය්‍යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන්වූවෝ වූහ. ඔව්හු මරණින් මතු යහපත් ගතිඇති ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුත වන උපදින සත්වයන් දකී. මෙසේ පිරිසිදුවූ, මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද සත්වයන් දනී.

**39.** "ඔහු මෙසේ සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, ආශ්‍රව කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගනී. මේ දුක් ඉපදීමේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැන ගණී, මේ දුක් නැති කිරීමේ මාර්ගයයයි තතු ලෙස දැනගණී, මේ ආශ්‍රව ක්ලෙශයන්ගේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැති කිරීමයයි තතු ලෙස දැනගණී, මම ඒ කෙලෙස් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී.

"මෙසේ දන්නා දක්නා ඔහුගේ සිත කාම ආශ්‍රවය කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවය කෙරෙන්ද මිදේ, අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද මිදේ, මිදුනු කල්හි මිදුනේය යන ඥානය පහළ වෙයි. ඉපදීම නැති විය. උතුම් හැසිරීමෙහි වසනලදී. කටයුත්ත කරණ ලදී, මින් පසු මේ සඳහා කළ යුත්තක් නැතැ'යිද දැනගණී.

"ගෘහපතියෙනි, මේ පුද්ගලතෙම තමාද නොතවන්නේ, තමන් නොතවන ප්‍රතිපදාවෙහි යෙදුනේ, අනුන්ද නොතවන්නේ, අනුන් නොතවන ප්‍රතිපදාවෙහි යෙදුනේයයි කියනු ලැබේ.

හෙතෙම තමන්ද නොතවන්නේ, අනුන්ද නොතවන්නේ මේආත්මයෙහිම තෘෂ්ණා රහිත වූයේ, නිවියේ, සිහිල් වූයේ, සැප විඳිනසුළු වූයේ, ශ්‍රේෂ්ඨවූ ආත්මයෙන් යුක්තව වාසය කෙරේයයි" වදාළේය.

**40.** මෙසේ වදාළ කල්හි ශාලා නම් ගම්වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවාහුය.

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, මෙපරිද්දෙන්ම භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. මේ අපි භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමු. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමු). භවත් ගෞතම තෙමේ අප අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයන්යයි දරණ සේක්වා."

**දසවැනිවූ අපණ්ණක සූත්‍රය නිමි. (1-10)**

(කන්දරක සූත්‍රය, අට්ඨකනාගර සූත්‍රය, සෙඛසූත්‍රය, පොතලිය සූත්‍රය, ජීවක සූත්‍රය, උපාලි සූත්‍රය, කුක්කුරවතිය සූත්‍රය, අභය රාජකුමාර සූත්‍රය, බහුවෙදනීය සූත්‍රය, අපණ්ණක සූත්‍රය යන සූත්‍ර දසයවූ)

**පළමුවැනි ගෘහපති වර්ගයයි**

## 11. අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කලන්දකනිවාප නම් වෙළුවන විහාරයෙහි වැඩ වාසය කළහ. එකල්හි ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් වහන්සේ අම්බලට්ඨිකාවෙහි (වේළුවනාරාමය අසල පිහිටි වඩා විවෙක ඇති ආවාසයක) වාසය කරති. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගීසිට අම්බලට්ඨිකාව යම් තැනෙක්හිද ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් යම් තැනෙක්හිද එහි වැඩියහ. ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙමේ එන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුවේය. දැක ආසනයක් පැනවීය. පා සේදීමට දිය තැබීය. භාග්‍යවතුන් වහන්සේ පැමිණ පැනවූ අසුනෙහි වැඩහුන්හ. හිඳ පාදයන් සේදූහ. ආයුෂ්මත් රාහුල ස්ථවිරතෙමේද භාග්‍යවතුන් වහන්සේ වැඳ, එකපැත්තක හුන්නේය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ (පා සෝදා) දිය ස්වල්පයක් දිය බඳුනෙහි ඉතිරිකොට තබා ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගෙන් මෙසේ ඇසූහ. "රාහුලය, තොපි දිය බඳුනෙහි ඉතිරිකොට තබන ලද මේ දිය ස්වල්පය දක්නහුද?"

"එසේය, ස්වාමීනි"

"රාහුලය, යම් භික්ෂුවකට දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද, ඔහුගේ මහණකමද මෙසේ ස්වල්පයෙකි."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ ඉතිරිව තුබූ දිය ස්වල්පය ඉවත් කොට ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගෙන් මෙසේ ඇසූහ. "රාහුල, තොපි ඉවත දමන ලද ඒ ඉතිරිවූ දිය ස්වල්පය දක්නහුද?"

"එසේය, ස්වාමීනි."

"රාහුලය, යම් භික්ෂුවක් දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද, ඔවුන් විසින් මහණකම්ද මෙසේ ඉවත දමන ලද්දේය."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ දියබඳුන යටිකුරු කොට මුණින් නවා ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගෙන් මෙසේ ඇසූහ.

"රාහුලය, ඔබ යටිකුරු කළ මේ දියබඳුන දක්නහුද?" "එසේය, ස්වාමීනි." "රාහුලය, යම් භික්ෂුවකට දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද ඔහුගේ මහණකම මෙසේ මුණින් නමන ලද්දේය."

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ දිය බඳුන උඩුකුරු කොට ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්ගෙන් මෙසේ ඇසූහ "රාහුලය, තොපි හිස්වූ කිසිවක් නැති මේ දිය බඳුන දක්නහුද?" "එසේය, ස්වාමීනි." "රාහුලය, යම් භික්ෂුවකට දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද ඔහුගේ මහණකමත් මෙසේ හිස්ය. (මහණකමට අයත් ගුණ කිසිවක් නැත.)

3. "රාහුලය, යම්සේ රජුගේ, රියකඳක් පමණ මහදළ ඇති උස මහත ඇති ජාතිසම්පන්න, යුදයට බැසගත් ඇතෙක් වේද, ඒ ඇතා යුදයට ගොස් ඉදිරි පාදවලින්ද වැඩකරයි. පසු පාදවලින්ද වැඩ කරයි. ඉදිරි කයින්ද වැඩ කරයි. පසු කයින්ද වැඩ කරයි. හිසින්ද වැඩ කරයි. කණින්ද වැඩ කරයි. දත්වලින්ද වැඩ කරයි. වලිගයෙන්ද වැඩ කරයි. (නමුත්) සොඬ රකී. එහිදී ඇතුන් බලන්නාට මෙවැනි අදහසක් වෙයි. මහ දළ ඇති උස මහත ඇති ජාතිසම්පන්න, යුදයට බැසගත් රජුගේ මේ ඇතා යුදයට ගොස් ඉදිරි පාදයෙන්ද වැඩ කරයි. පසු පාදයෙන්ද වැඩ කරයි. ඉදිරි කයින්ද වැඩ කරයි. පසු කයින්ද වැඩ කරයි. හිසින්ද වැඩ කරයි. කණින්ද වැඩ කරයි. දත්වලින්ද වැඩ කරයි. වලිගයෙන්ද වැඩ කරයි. (නමුත්) සොඬ රකී. රජුගේ ඇතාගේ ජීවිත පරිත්‍යාගය නොකෙළේය යනුයි.

"රාහුලය, යම් හෙයකින් මහ දළ ඇති උස මහත ඇති ජාතිසම්පන්න යුදයට බැසගත් රජුගේ ඇතා යුදයට ගොස් ඉදිරි පාදවලින්ද වැඩ කරයි. පසු පාදවලින්ද වැඩ කරයි. ඉදිරි කයින්ද වැඩ කරයි. පසු කයින්ද වැඩ කරයි. හිසින්ද වැඩ කරයි. කණින්ද වැඩ කරයි. දත්වලින්ද වැඩ කරයි. වලිගයෙන්ද වැඩ කරයි. සොඬවැලෙන්ද වැඩ කරයි. එහිදී ඇතුන් බලන්නාට මෙබඳු සිතක් වෙයි. මහ දළ ඇති උස මහත ඇති ජාතිසම්පන්න,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

රජුගේ මේ ඇතා යුදයට ගොස් ඉදිරි පාදවලින්ද වැඩ කරයි. පසු පාදවලින්ද වැඩ කරයි. ඉදිරි කයින්ද වැඩ කරයි. පසු කයින්ද වැඩ කරයි. හිසින්ද වැඩ කරයි. කණින්ද වැඩ කරයි. දත්වලින්ද වැඩ කරයි. වලිගයෙන්ද වැඩ කරයි. සොඬවැලෙන්ද වැඩ කරයි. රජුගේ ඇතාගේ ජීවිත පරිත්‍යාගයද කෙළේය යනුයි. දැන් රජුගේ ඇතා විසින් කළ යුතු අන්දෙයක් නැත. රාහුල, එපරිද්දෙන් යම්කිසිවෙකුට දැන දැන බොරු කීමෙහි ලජ්ජාවක් නැද්ද, ඔහුට නොකළ හැකි කිසි පාපයක් ඇතැයි මම නොකියමි. රාහුලය, එහෙයින් සිනහ වීමටවත් බොරු නොකියන්නෙමියි ඔබ මෙසේ හික්මිය යුතුයි.

4. "රාහුලය, එය කුමක්යයි සිතන්නෙහිද? කැඩපත කවර ප්‍රයොජනයක් පිණිසද?" "ස්වාමීනි, (එය) මුහුණ බැලීම පිණිසයි." "රාහුලය, එලෙසින් බලව. (නුවණින්) බල බලා කයින් කටයුතු කළ යුතුය. (නුවණින්) බල බලා වචනයෙන් කටයුතු කළ යුතුය. (නුවණින්) බල බලා සිතින් කටයුතු කළ යුතුය.

"රාහුල, තොප කයින් යම් කටයුත්තක් කරන්ට කැමති වෙහිද, තොප විසින් ඒ කයින් කරන කටයුත්ත සලකා බැලිය යුතුය. "මම කයින් යම් මේ කටයුත්තක් කරණු කැමැත්තෙම්ද, මාගේ මේ කයින් කරන කටයුත්ත තමන්ට පීඩා පිණිස පවත්නේද, අනුන්ට පීඩා පිණිස පවත්නේද, දෙදෙනාටම පීඩා පිණිස පවතියිද? මේ කයින් කරන කටයුත්ත අකුසල්ද, දුක් රැස්කරන්නේද, දුක් විපාක ඇති කරන්නේද, රාහුලය, (එසේ) සලකා බලන්නාවූ ඔබ මෙසේ දැනගන්නෙහිද, 'මම යම් මේ කයින් කරන කටයුත්තක් කරන්ට කැමැත්තෙම්ද, මාගේ මේ කයින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස පවත්නේය. අනුන්ට පීඩා පිණිස පවත්නේය. තමන්ට හා අනුන්ට පීඩා පිණිස පවත්නේය. මේ කයින් කරන කටයුත්ත අකුසල්ය. දුක් රැස් කරන්නේය. දුක් විපාක ඇතිකරන්නේය. (යැයි දැනගන්නෙහිද) රාහුලය, තොප විසින් එබඳු කයින් කරන කටයුත්තක් ඒකාන්තයෙන් නොකළ යුතුය. රාහුල, ඉදින් ඔබ සලකා

බලන්නේ මෙසේ දැනගන්නෙහිද, 'මම යම් මේ කයින් කරන කටයුත්තක් කරන්ට කැමැත්තෙම්ද, මාගේ මේ කයින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස නොපවත්නේය. අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. තමන්ට හා අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. මේ කයින් කරන කටයුත්ත කුසල්ය. සැප රැස්කරන්නේය. සැප විපාක ඇති කරන්නේය.' රාහුලය, තොප විසින් එබඳු කයින් කරන කටයුතු කළ යුතුය.

**5.** "රාහුලය, කයින් කටයුත්තක් කරන කල්හිද තොප විසින් ඒ කයින් කරන කටයුත්ත සලකා බැලිය යුතුය. මම යම් මේ කයින් කටයුත්තක් කරම්ද, මාගේ මේ කයින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස පවත්නේද? අනුන්ට පීඩා පිණිස පවත්නේද? තමහට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද? මේ කයින් කරන කටයුත්ත අකුසල්ද දුක් රැස්කරන්නේද? දුක් විපාක ඇතිකරන්නේද? යනුවෙනි. රාහුලය, ඉදින් මෙසේ සලකන්නාවූ ඔබ මෙසේ දන්නෙහිද. 'මම කයින් යම් මේ කටයුත්තක් කරම්ද, මාගේ මේ කයින් කරන කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේය. අනුන්ට පීඩා පිණිසද පවතින්නේය, තමාට හා අනුන්ට පීඩා පිණිසද පවත්නේය, මේ කයින් කරන කටයුත්ත අකුසල්ය. දුක් රැස් කරන්නේය, දුක් විපාක ඇති කරන්නේය.' රාහුලය, ඔබ එබඳු කයින් කරන කටයුත්තක් නොකරන්නෙහිය. රාහුලය, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද, මම කයින් යම් මේ කටයුත්තක් කරම්ද, මාගේ මේ කයින් කරණ කටයුත්ත තමහට පීඩා පිණිස නොපවත්නේය, අනුන්ට පීඩා පිණිස නොපවත්නේය, තමාට හා අනුන්ට පීඩා පිණිස නොපවත්නේය, මේ කයින් කරනකටයුත්ත කුසල්ය. සැප රැස් කරන්නේය. සැප විපාක ඇතිකරන්නේයයි දන්නෙහිද, රාහුල, ඔබ එබඳු කයින් කරන කට යුත්ත නොනවත් වන්නෙහිය.' නැවත නැවත කරන්නෙහිය.

**6.** "රාහුල, තොප විසින් කයින් කටයුත්තක් කොටද, ඒ කයින් කළ කටයුත්ත සලකා බැලිය යුතුය. 'මම යම් මේ කයින්

කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ කයින් කළ කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේද? අනුන්ට පීඩා පිණිසද පවත්නේද? තමාට හා අනුන්ට පීඩා පිණිසද පවත්නේද? මේ කයින් කළ කටයුත්ත දුක් රැස් කරන්නේද? දුක් විපාක ඇති කරන්නේද? යනුවෙනි. රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද, 'මම යම් මේ කයින් කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ කයින් කළ කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේය, අනුන්ට පීඩා පිණිසද පවත්නේය, තමන්ට හා අනුන්ට පීඩා පිණිසද පවත්නේය, මේ කයින් කළ කටයුත්ත අකුසල්ය, දුක් රැස් කරන්නේය, දුක් විපාක ඇති කරන්නේය.' රාහුල, තොප විසින් එබඳු කයින් කළ කටයුත්තක් ශාස්තෘන් වහන්සේ වෙත හෝ නුවණ ඇති සමානව ඇසුරු කරන්නන් වෙත හෝ පැමිණ කියයුතුයි, විවෘත කළ යුතුයි, ප්‍රකට කළ යුතුයි, (එසේ) කියා, විවෘත කොට, ප්‍රකට කොට, නැවත සංවරයට පැමිණිය යුතුයි, රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද, 'මම යම් මේ කයින් කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ කයින් කළ කටයුත්ත තමාට පීඩා පිණිස නොපවතී. අනුන්ට පීඩා පිණිස නොපවතී, තමාට හා අනුන්ට පීඩා පිණිස නොපවතී. මේ කයින් කළ කටයුත්ත කුසල්ය. සැප රැස් කෙරෙයි. කියා රාහුල, ඔබ එයින් (ඇතිවූ) ප්‍රීතියෙන් හා සන්තොෂයෙන් වාසය කරන්නෙහිය, රෑ දාවල් දෙක්හි කුසල ධර්මයන්හි හික්මෙන්නෙහිය.

7. "රාහුල, ඔබ වචනයෙන් යම් කටයුත්තක් කරන්ට කැමති වෙහිද, (එවිට) තොපගේ ඒ වචනයෙන් කරන කටයුත්ත සලකා බැලිය යුතුයි, (කෙසේද?) 'මම වචනයෙන් යම් මේ කටයුත්තක් කරනු කැමැත්තෙම්ද, මාගේ මේ වචනයෙන් කරන කටයුත්ත තමාට පීඩා පිණිස පවත්නේද, අනුන්ට පීඩා පිණිස පවත්නේද, තමාට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද? මේ වචනයෙන් කරන කට යුත්ත අකුසල්ද? දුක් රැස් කරන්නේද? දුක් විපාක ඇති කරන්නේද?' (කියායි) රාහුල, ඉදින් (එසේ) සලකා බලන්නේ මෙසේ දැන ගන්නෙහිද, 'මම වචනයෙන් යම් මේ කටයුත්තක්

කරනු කැමැත්තෙම්ද, මාගේ මේ වචනයෙන් කරන කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේය. අනුන්ට පීඩා පිණිසද පවත්නේය, තමාට හා අනුන්ට පීඩා පිණිස පවත්නේය, මේ වචනයෙන් කරන කටයුත්ත අකුසල්ය, දුක් රැස් කරන්නේය, දුක් විපාක ඇත්තේය,' (කියායි) රාහුල, තොප විසින් එබඳුවූ වචනයෙන් කරන කටයුත්ත ඒකාන්තයෙන් නොකළ යුතුය, රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දැන ගන්නෙහිද 'මම වචනයෙන් යම් මේ කටයුත්තක් කරනු කැමත්තෙම්ද, මේ මාගේ වචනයෙන් කරන කට යුත්ත තමහට පීඩා පිණිසද නොපවත්නේය, අනුන්ට පීඩා පිණිස නොපවත්නේය, තමාට හා අනුන්ට පීඩා පිණිස නොපවත්නේය, මේ වචනයෙන් කරන කටයුත්ත කුසල්ය, සැප රැස් කරන්නේය, සැප විපාක ඇත්තේය,' (කියායි) රාහුලය, තොප විසින් එබඳු වචනයෙන් කරන කටයුත්ත කළ යුතුය.

8. "රාහුලය, වචනයෙන් කටයුත්තක් කරන කල්හිද ඔබ විසින් ඔබගේ එම වචනයෙන් කරන කටයුත්ත සලකා බැලිය යුතුයි. 'මම යම් මේ වචනයෙන් කට යුත්තක් කරම්ද මාගේ මේ වචනයෙන් කරන කටයුත්ත තමාට පීඩා පිණිස පවත්නේද, අනුන්ට පීඩා පිණිස පවත්නේද, තමාට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද? මේ වචනයෙන් කරණ කටයුත්ත අකුසල්ද? දුක් රැස් කරන්නේද? දුක් විපාක ඇති කරන්නේද, (යනුවෙනි.) රාහුල, ඉදින් මෙසේ සලකන්නාවූ ඔබ මෙසේ දන්නෙහිද? 'මාගේ මේ වචනයෙන් කරන කටයුත්ත තමාට පීඩා පිණිස පවත්නේය. අනුන්ට පීඩා පිණිස පවත්නේය. තමාට හා අනුන්ට පීඩා පිණිස පවත්නේය. මේ වචනයෙන් කරන කටයුත්ත අකුසල්ය දුක් රැස් කරන්නේය. දුක් විපාක ඇති කරන්නේය. රාහුල ඔබ එබඳු වචනයෙන් කරන කටයුත්ත නොකරන්නෙහිය.

"මම වචනයෙන් යම් මේ කටයුත්තක් කරන්නෙම්ද මේ මාගේ වචනයෙන් කරන කටයුත්ත තම හට පීඩා පිණිසද නොපවත්නේද, අනුන්ට පීඩා පිණිසද නොපවත්නේද, තමාට

හා අනුන්ට පීඩා පිණිසද නොපවත්නේද, මේ වචනයෙන් කරන කටයුත්ත කුසල්ද, සැප රැස් කරන්නේද, සැප විපාක ඇත්තේද' (කියායි.) රාහුල එබඳු වචනයෙන් කරන කටයුතු නිතර කරන්නෙහිය.

"රාහුල, වචනයෙන් කටයුත්තක් කළ කල්හිද, තොප තාගේ එම වචනයෙන් කළ කටයුත්ත සලකා බැලිය යුතුය 'මම යම් මේ වචනයෙන් කරන කටයුත්තක් කෙළෙම්ද, මේ මාගේ වචනයෙන් කළ කටයුත්ත තමහට පීඩා පිණිසද පවත්නේද, අනුන්ට පීඩා පිණිසද පවත්නේද, තමන්ට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද, මේ වචනයෙන් කළ කටයුත්ත දුක් රැස් කරන්නේද, දුක් විපාක ඇති කරන්නේද කියායි. රාහුල ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද? 'මම කයින් යම් මේ කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ කයින් කළ කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේය. තමන්ට හා අනුන්ට පීඩා පිණිස පවත්නේය. මේ වචනයෙන් කළ කටයුත්ත අකුසල්ය. දුක් රැස් කරන්නේය. දුක් විපාක ඇති කරන්නේයයි දන්නෙහිද? රාහුල, තොප විසින් එබඳු මේ වචනයෙන් කළ කටයුත්ත ශාස්තෘන් වහන්සේ වෙත හෝ නුවණ ඇති සමානව ඇසුරු කරන්නන් වෙත හෝ පැමිණ කිය යුතුයි. විවෘත කළ යුතුයි. ප්‍රකට කළ යුතුයි. (එසේ) කියා විවෘත කොට ප්‍රකට කොට නැවත සංවරයට පැමිණිය යුතුයි. ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද 'මම වචනයෙන් යම් මේ කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ වචනයෙන් කළ කටයුත්ත තමාට පීඩා පිණිසද නොපවතී. අනුන්ට පීඩා පිණිසද නොපවතී. තමාට හා අනුන්ට පීඩා පිණිස නොපවතී. මේ වචනයෙන් කළ කටයුත්ත කුසල්ය. සැප රැස් කරයි. සැප විපාක ඇති කරයි.' රාහුල, කුශල ධර්මයන්හි රෑ දාවල් දෙකේ හික්මෙමින් එම ප්‍රීතියෙන් හා සන්තොෂයෙන් ඔබ වාසය කරන්නෙහිය.

**9.** "රාහුල, ඔබ සිතින් යම් කටයුත්තක් කරනු කැමැත්තේ වෙහිද? ඔබගේ එම සිතින් කරන කටයුත්ත සලකා බැලිය

යුතුය, 'මම යම් මේ සිතින් කටයුත්තක් කරනු කැමැත්තෙම්ද, මාගේ මේ සිතින් කරන කටයුත්ත තමහට පීඩා පිණිසද පවත්නේද. අනුන්ට පීඩා පිණිස පවත්නේද? තමහට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද? මේ සිතින් කරන කටයුත්ත අකුසල්ද? දුක් රැස් කරන්නේද? දුක් විපාක ඇති කරන්නේද?' යනුවෙනි, රාහුලය, (එසේ) සලකා බලන්නාවූ ඔබ මෙසේ දැනගන්නේද, 'මම සිතින් යම් මේ කටයුත්තක් කරන්ට කැමැත්තෙම්ද? මාගේ සිතින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස පවත්නේය. අනුන්ට පීඩා පිණිස පවත්නේය. තමහට හා අනුන්ට පීඩා පිණිස පවත්නේය. මේ සිතින් කරන කටයුත්ත අකුසල්ය. දුක් විපාක ඇති කරන්නේය.' රාහුලය, තා විසින් එබඳු සිතින් කරන කටයුත්ත එකාන්තයෙන් නොකළ යුතුයි.

"රාහුල ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දැනගන්නෙහිද? 'මම යම් මේ සිතින් කරන කටයුත්තක් කරන්ට කැමැත්තෙම්ද, මාගේ මේ සිතින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස නොපවත්නේය. අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. තමහට හා අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. මේ සිතින් කරන කටයුත්ත කුසල්ය. සැප රැස් කරන්නේය. සැප විපාක ඇති කරන්නේය' කියායි.

රාහුල, ඔබ විසින් එබඳු සිතින් කරන කටයුත්ත කළ යුතුය.

**10.** "රාහුල, සිතින් කටයුතු කරන්නාවූ ඔබ විසින් ඔබගේ එම සිතින් කරන කටයුත්ත සලකා බැලිය යුතු.

"මම සිතින් යම් මේ කටයුත්තක් කරම්ද, මාගේ මේ සිතින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස පවත්නේද, අනුන්ට පීඩා පිණිස පවත්නේද? තමහට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද, මේ සිතින් කරන කටයුත්ත අකුසල්ද, දුක් රැස් කරන්නේද, දුක් විපාක ඇති කරන්නේද,' යනුවෙනි. රාහුලය, ඉදින් මෙසේ සලකන්නාවූ ඔබ මෙසේ දන්නෙහිය. 'මම සිතින් යම් මේ කටයුත්තක් කරම්ද, මාගේ මේ සිතින් කරන කටයුත්ත අනුන්ට පීඩා පිණිස පවත්නේය. තමහට පීඩා පිණිස පවත්නේය. තමහට

හා අනුන්ට පීඩා පිණිස පවත්නේය. මේ සිතින් කරන කටයුත්ත අකුසල්ය. දුක් රැස් කරන්නේය. දුක් විපාක ඇති කරන්නේය.' කියායි. රාහුල, ඔබ එබඳු සිතින් කරන කටයුත්ත නොකරන්නෙහිය.

"රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිය. 'මම යම් මේ සිතින් කරන කටයුත්තක් කරම්ද, මාගේ මේ සිතින් කරන කටයුත්ත තමහට පීඩා පිණිස නොපවත්නේය. අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. තමහට හා අනුන්ට පීඩා පිණිස නොපවත්නේය. කුසල්ය. සැප රැස් කරන්නේය. සැප විපාක ඇති කරන්නේය, (යනුවෙනි.)

"රාහුල, ඔබ එබඳු සිතින් කරන කටයුත්ත නිතර කරන්නෙහිය.

11. "රාහුල, සිතින් කටයුත්තක් කොටද, ඔබගේ එම සිතින් කරන කටයුත්ත සලකා බැලිය යුතු, (කෙසේද?) 'මම සිතින් යම් මේ කටයුත්තක් කෙළෙම්ද' මාගේ මේ සිතින් කළ කටයුත්ත තමහට පීඩා පිණිස පවත්නේද, අනුන්ට පීඩා පිණිස පවත්නේද, තමාට හා අනුන්ට පීඩා පිණිස පවත්නේද, මේ සිතින් කළ කටයුත්ත අකුසල්ද, දුක් රැස් කරන්නේද, දුක් විපාක ඇති කරන්නේද,' යනුවෙනි. රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද? 'මම යම් මේ සිතින් කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ සිතින් කළ කටයුත්ත තමාට පීඩා පිණිසද පවත්නේය. අනුන්ට පීඩා පිණිසද පවත්නේය. තමහට හා අනුන්ට පීඩා පිණිසද පවත්නේය. මේ සිතින් කළ කටයුත්ත අකුසල්ය. දුක් වන්නේය. දුක් විපාක ඇති කරන්නේය' (කියායි.) රාහුල, ඔබ විසින් එබඳු සිතින් කළ කටයුත්ත ශාස්තෲන් වහන්සේ වෙත හෝ නුවණ ඇති සමානව ඇසුරුකරන්නන් වෙත හෝ පැමිණ කිය යුතුයි. විවෘත කළ යුතුයි. ප්‍රකට කළ යුතුයි, කියා විවෘත කොට, ප්‍රකට කොට නැවත සංවරයට පැමිණිය යුතුයි.

"රාහුල, ඉදින් ඔබ සලකා බලන්නේ මෙසේ දන්නෙහිද, 'මම සිතින් යම් මේ කටයුත්තක් කෙළෙම්ද, මාගේ මේ සිතින්

කළ කටයුත්ත තමාට පීඩා පිණිස නොපවතී, අනුන්ට පීඩා පිණිස නොපවතී, තමාට හා අනුන්ට පීඩා පිණිස නොපවතී. මේ සිතින් කළ කටයුත්ත කුසල්ය, සැප රැස් කරයි. සැප විපාක ඇති කරයි' යනුවෙනි.

"රාහුල, ඔබ එම ප්‍රීතියෙන් හා සන්තොෂයෙන් කුශල ධර්මයන්හි දාවල් රෑ දෙකේ හික්මෙමින් වාසය කරන්නෙහිය.

12 "රාහුල, අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කරන කටයුතු පිරිසිදු කළාහුද, වචනයෙන් කරන කටයුතු පිරිසිදු කළාහුද, සිතින් කරන කටයුතු පිරිසිදු කළාහුද, ඒ සියල්ලෝ එපරිද්දෙන්ම සලක සලකා කයින් කරන කටයුතු පිරිසිදු කළාහුය. සලක සලකා වචනයෙන් කරන කටයුතු පිරිසුදු කළාහුය. සලක සලකා සිතින් කරන කටයුතු පිරිසුදු කළාහුය.

"රාහුල, අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කරන කටයුතු පිරිසිදු කරන්නාහුද, වචනයෙන් කරන කටයුතු පිරිසුදු කරන්නාහුද, සිතින් කරන කටයුතු පිරිසුදු කරන්නාහුද, ඒ සියල්ලෝද එපරිද්දෙන්ම සලකා සලකා කයින් කරන කටයුතු පිරිසුදු කරන්නාහුය. සලක සලකා වචනයෙන් කරන කටයුතු පිරිසුදු කරන්නාහුය. සලක සලකා සිතින් කරන කටයුතු පිරිසුදු කරන්නාහුය. රාහුල, මේ කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කරන කටයුතු පිරිසුදු කරත්ද, වචනයෙන් කරන කටයුතු පිරිසුදු කරත්ද, සිතින් කරන කටයුතු පිරිසුදු කරත්ද, ඒ සියල්ලෝ සලක සලකා කයින් කරන කටයුතු පිරිසුදු කරත්. සලක සලකා වචනයෙන් කරන කටයුතු පිරිසුදු කරත්. සලක සලකා සිතින් කරන කටයුතු පිරිසිදු කරත්.

"රාහුල, එබැවින් 'සලක සලකා කයින් කරන කටයුතු පිරිසුදු කරන්නෙමු. සලක සලකා වචනයෙන් කරන කටයුතු පිරිසුදු කරන්නෙමු. සලක සලකා සිතින් කරන කටයුතු පිරිසුදු කරන්නෙමු'යි ඔබ මෙසේ හික්මිය යුතුයි."

13. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටුවූ ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු විය.

**පළමුවෙනිවූ අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රය නිමි. (2-1)**

## 12. මහා රාහුලොවාද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු මහ සිටුහුගේ ජේතවන නම්වූ ආරාමයෙහි වැඩ වාසය කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා පා සිවුරු ගෙණ සැවත් නුවරෙහි පිඬු පිණිස වැඩියහ. ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙමේද පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා පා සිවුරු ගෙණ භාග්‍යවතුන් වහන්සේගේ පිටුපසින් ගියේය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් දෙස හැරී බලා මෙසේ කීහ.

"රාහුල, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද තමා තුළ පිහිටියාවූ හෝ බාහිරවූ හෝ ඔලාරික (මහත්) වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ උසස්වූ හෝ යම් කිසි රූපයක් වේද, දුරෙහිවූ හෝ සමීපයෙහිවූ හෝ යම් රූපයක් වේද ඒ සියලු රූපය මාගේ නොවේය. ඒ මම නොවෙමි, ඒ මාගේ ආත්මය නොවේයයි, මෙසේ ඇති සැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි.

"භාග්‍යවතුන් වහන්ස, රූපය පමණක්ද? සුගතයන් වහන්ස, රූපය පමණක්ද?

"රාහුල, රූපයද; රාහුල, වේදනාවද; රාහුල, සංඥාවද; රාහුල, සංස්කාරයෝද; රාහුල, විඥානයද (එසේය.)"

2. ඉක්බිති ආයුෂ්මත් රාහුල ස්ථවිරතෙමේ "භාග්‍යවතුන් වහන්සේ හමුවෙන් අවවාදයක් ලැබූ කවරෙක් ගමට පිඬු පිණිස යන්නේදැ"යි (සිතා) එයින් නැවතී එක්තරා රුකක් මුල අරමිනිය ගොතාගෙන කය කෙළින් තබා සිහිය ඉදිරි කොට උපදවා

හුන්නේය. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේද එක්තරා රුකක් මුල අරමිනිය ගොතාගෙන කය කෙළින් තබා සිහිය ඉදිරිකොට උපදවා වැඩහුන් ආයුෂ්මත් රාහුල ස්ථවිරයන් දැක, ආයුෂ්මත් රාහුල ස්ථවිරයන්හට මෙසේ කීහ. "රාහුල, ආණාපාණසති භාවනාව වඩව. රාහුල, ආණාපාණසති භාවනාව වඩව. රාහුල, ආණාපාණසතිය වඩන ලද්දී, බහුල වශයෙන් කරණ ලද්දී, මහත්ඵල වෙයි. මහානිශංස වෙයි."

3. ඉක්බිති ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙම සවස් කාලයෙහි සිත එකඟ කිරීමෙන් නැඟී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, කෙසේ වඩනලද, කෙසේ බහුල වශයෙන් කරණලද ආණාපාණසතිය මහත්ඵල මහානිශංස වේද?"

"රාහුල, තමා කොට ගන්නා, තමා තුළ පවත්නා ජීවිතෙන්ද්‍රිය සහිතවූ යම් කර්කශ බවක්, තද බවක් වේද, එනම්: කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩුව, හෘදයමාංශය, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, අතුනු (බඩවැල), අතුනුබහන් (බඩවැල දරණු), නොපැසුණු ආහාර, ආහාර මල යන මොහුයි. තමා කොට ගන්නා එයින් අන්‍යවූ ජීවිතෙන්ද්‍රිය සහිත යම් කිසි තදබවක්, රළු බවක් වේද, රාහුල, මේ තමා තුළ පවත්නා පෘථිවිධාතුව යයි කියනු ලැබේ. යම් තමා තුළ පවත්නා පෘථිවිධාතුවක් වේද, යම් බාහිර පෘථිවිධාතුවක් වේද, මේ දෙකම පඨවි ධාතුවමැයි. එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි. මෙසේ එය තත්වූ පරිදි (ඇතිසැටියෙන්) යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි. මෙසේ එය ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් (නුවණින්) දැක පඨවි ධාතුවෙහි කලකිරෙයි. පඨවි ධාතුවෙහි සිත නොඇලෙයි.

4. "රාහුල, ආපො ධාතුව කවරීද, අධ්‍යාත්ම ආපො ධාතුවක් වන්නේය. බාහිර ආපො ධාතුවක් (ද) වන්නේය. රාහුල, අධ්‍යාත්ම

**5.** "රාහුල, තෙජො ධාතුව කවරීද, අධ්‍යාත්මික තෙජො ධාතුවක්ද වන්නේය. බාහිර තෙජො ධාතුවක්ද වන්නේය. රාහුල, අධ්‍යාත්මික තෙජො ධාතුව කවරීද, තමා තුළ පවත්නා ජීවිතෙන්ද්‍රිය සහිත යම් උෂ්ණසුමක්, උෂ්ණසුම් බවක් වේද, එනම්: යම් උෂ්ණසුමකින් තැවේද, යම් උෂ්ණසුමකින් ශරීරය දිරවයිද, යම් උෂ්ණසුමකින් දැවිලි කරයිද, යම් උෂ්ණසුමකින් කන බොන ලද ආහාර පාන දිරවයිද, මෙයින් අන්‍යවූ තමා තුළ පවත්නාවූ ජීවිතෙන්ද්‍රිය සහිත යම් උෂ්ණසුමක්, උෂ්ණසුම් බවක් වේද, රාහුල, මේ අධ්‍යාත්මික තෙජො ධාතුව යයි කියනු ලැබේ. රාහුල, යම් අධ්‍යාත්මික තෙජො ධාතුවක් වේද, බාහිරවූ යම් තෙජො ධාතුවක් වේද, මේ දෙකම තෙජො ධාතුව මැයි. එය මාගේ නොවේය, එය මම නොවෙමි, එය මාගේ ආත්මය නොවෙයි,' මෙසේ එය ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි. මෙසේ එය ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දැක තෙජො ධාතුවෙහි කලකිරෙයි. තෙජො ධාතුවෙහි සිත නොඇලෙයි.

**6.** "රාහුල, වායො ධාතුව කවරීද, අධ්‍යාත්මික වායො ධාතුවක්ද වන්නේය. බාහිර වායො ධාතුවක්ද වන්නේය. රාහුල, අධ්‍යාත්මික වායො ධාතුව කවරීද, තමා තුළ පවත්නා ජීවිතෙන්ද්‍රිය සහිතවූ යම් වාතයක්, වායුවක් වේද, එනම් උඩට නගින වාතය, පහලට බස්නා වාතය, කුසෙහි (බඩෙහි) පවතින වාතය, බඩවැල් තුළ පවතින වාතය, අඟ පසඟ ක්‍රියා කරන වාතය, ආශ්වාස ප්‍රශ්වාස වාතය යන මේයි. මෙයින් අන්‍යවූද තමා තුළ පවත්නාවූ ජීවිතෙන්ද්‍රිය සහිත යම් වායුවක් වාතයක් වේද රාහුලය, මේ අධ්‍යාත්මික වායො ධාතුවයයි කියනු ලැබේ. අධ්‍යාත්මික යම් වායො ධාතුවක් වේද, බාහිරවූ යම් වායො ධාතුවක් වේද, මේ දෙකම වායො ධාතුව මැයි.' 'එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි.' මෙසේ එය ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි. මෙසේ එය ඇතිසැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දැක වායො ධාතුවෙහි කලකිරෙයි. වායො ධාතුවෙහි සිත නොඇලෙයි.

7. "රාහුල, ආකාශධාතුව කවරීද, අධ්‍යාත්මික ආකාශ ධාතුවක්ද වන්නේය. බාහිරවූ ආකාශ වස්තුවක්ද වන්නේය.

"රාහුල, අධ්‍යාත්මික ආකාශ ධාතුව කවරීද, තමා තුළ පවත්නාවූ ජීවිතෙන්ද්‍රිය සහිත යම් ආකාශයක්, සිදුරක් වේද, එනම්ඃ කන් සිදුර, නැහැ සිදුර, මුවදොර, යම් තැනෙකින් අනුභව කරන, බොන කන ලොවින දෙය ගිලෙයිද යම් තැනෙක අනුභව කරණ බොන කන ලොවින දෙය සිටීද (නවතීද) යම් තැනෙකින් අනුභවකරණ බොන කන ලොවින දෙය යට කොටසින් නික්මේද, යන මේයි. මෙයින් අන්‍යවූද තමා තුළ පවත්නාවූ ජීවිතෙන්ද්‍රිය සහිත යම්කිසි ආකාශයක්, සිදුරක් වේද, රාහුල, මේ අධ්‍යාත්මික ආකාශ ධාතුයයි කියනු ලැබේ. යම් අධ්‍යාත්මික ආකාශ ධාතුවක් වීද, යම් බාහිර ආකාශ ධාතුවක් වීද, ඒ දෙකම ආකාශ ධාතුවමැයි. එය මාගේ නොවේය. එය මම නොවෙමි. එය මාගේ ආත්මය නොවෙයි. මෙසේ මෙය ඇති සැටියෙන් යහපත් ප්‍රඥාවෙන් දත යුතුයි. මෙසේ එය ඇති සැටියෙන් යහපත් ප්‍රඥාවෙන් (නුවණින්) දැක ආකාශ ධාතුවෙහි කලකිරෙයි. ආකාශ ධාතුවෙහි සිත නොඇලෙයි.

8. "රාහුල, පොළොව හා සමකොට භාවනාව වඩව. පොළොව හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල්සිත විනාශකොට නොසිටිත්. රාහුල, යම්සේ පොළොවෙහි පිරිසිදු දෙයද දමත්, අපිරිසිදු දෙයද දමත්, මුත්‍රද දමත්, කෙලද හෙළත්, සැරවද දමත්, ලෙහෙද දමත්, එයින් පොළොව අප්‍රිය හෝ නොකරයි. පිළිකුල් හෝ නොකරයි. රාහුල එපරිද්දෙන්ම තොප පොළොව හා සමකොට භාවනාව වඩව්. පොළොව හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශකොට නොසිටිත්.

9 "රාහුල, ජලය හා සමකොට භාවනාව වඩව, ජලය සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශ කොටගෙන නොසිටිත්. රාහුල, යම්සේ දියෙහි පිරිසිදු දෙයද සෝදත්, අපිරිසිදු දෙයද සෝදත්,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

අශුචිද සෝදත්, මුත්‍රද සෝදත්, කෙලද සෝදත්, සැරවද සෝදත්, ලෙහෙද සෝදත්, එයින් දිය අප්‍රිය හෝ නොවෙයි. පිළිකුල් හෝ නොකරයි. රාහුල, එපරිද්දෙන්ම ඔබ දිය හා සමකොට භාවනාව වඩව. රාහුල, දිය සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශ කොට ගෙන නොසිටිත්.

10. "රාහුල, ගිනි හා සමකොට භාවනාව වඩව. ගිනි හා සමකොට භාවනා වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශකොටගෙණ නොසිටිත්. රාහුල, යම්සේ ගින්න පවිත්‍ර දෙයද දවයි. අපවිත්‍ර දෙයද දවයි, අශුචිද දවයි, මුත්‍රද දවයි, කෙලද දවයි, සැරවද දවයි, ලෙහෙද දවයි, එයින් ගින්න අප්‍රිය හෝ නොවෙයි. පිළිකුල් හෝ නොකරයි. රාහුල, එපරිද්දෙන්ම ගින්න හා සම කොට භාවනාව වඩව, රාහුල, ගින්න හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශ කොට ගෙණ නො සිටිත්.

11. "රාහුල, වාතය හා සමකොට භාවනාව වඩව, රාහුල, වාතය හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාපවූද අමනාපවූද ස්පර්ශයෝ කුසල් සිත විනාශ කොට ගෙන නොසිටිත්. රාහුල, යම්සේ වාතය පිරිසිදු දේද ගෙන යයි, අපිරිසිදු දේද ගෙනයයි, අශුචිද ගෙනයයි, මුත්‍රද ගෙනයයි, කෙලද ගෙනයයි, සැරවද ගෙනයයි, ලෙහෙද ගෙනයයි. වාතය එයින් අප්‍රිය හෝ නොවෙයි. පිළිකුල් හෝ නොකෙරෙයි. රාහුල, ඔබ එපරිද්දෙන්ම වාතය හා සමකොට භාවනාව වඩව, වාතය හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශකොට ගෙණ නොසිටිත්.

12. "රාහුල, අහස හා සමකොට භාවනාව වඩව, රාහුල, අහස හා සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශකොට ගෙණ නොසිටිත්. රාහුල, යම්සේ අහස කොතැන්හිවත් නොපිහිටියේද, රාහුල,

එපරිද්දෙන්ම ඔබ අහස හා සමකොට භාවනාව වඩව. 'රාහුල, අහස සමකොට භාවනාව වඩන්නාවූ ඔබට උපන් මනාප අමනාප ස්පර්ශයෝ කුසල් සිත විනාශකොට ගෙණ නොසිටිත්.

13. "රාහුල, මෛත්‍රී භාවනාව වඩව. රාහුල, මෛත්‍රී භාවනාව වඩන්නාවූ ඔබගේ යම් ක්‍රෝධයක් වේද, එය නැතිවී යන්නේය.

"රාහුල, කරුණා භාවනාව වඩව. රාහුල, කරුණා භාවනාව වඩන්නාවූ ඔබගේ යම් හිංසාවක් වේද, එය නැතිවී යන්නේය.

"රාහුල, මුදිතා භාවනාව වඩව. රාහුල, මුදිතා භාවනාව වඩන්නාවූ ඔබගේ යම් නොඇලීමක් වේද, එය නැතිවී යන්නේය.

"රාහුල, උපෙක්ෂා භාවනාව වඩව. රාහුල, උපෙක්ෂා භාවනාව වඩන්නාවූ ඔබගේ යම් ප්‍රතිඝයක් ද්වෙෂයක් වේද, එය නැතිවී යන්නේය.

14. "රාහුල, අසුභ භාවනාව වඩව. රාහුල, අසුභ භාවනාව වඩන්නාවූ ඔබගේ යම් රාගයක් වේද, එය නැතිවී යන්නේය.

15. රාහුල, අනිච්චසඤ්ඤා භාවනාව වඩව. රාහුල, අනිච්චසඤ්ඤා (-ඇතිව නැතිවෙයි යන හැඟීම) භාවනාව වඩන්නාවූ ඔබගේ යම් 'මම වෙමි' යන මානයක් වේද, එය නැතිවී යන්නේය.

16. "රාහුල, ආණාපාණසති (-හුස්ම ගැණීම හැරීම දෙක පිළිබඳ) භාවනාව වඩව. රාහුල, ආණාපාණසති භාවනාව වඩනාලද්දී, බහුලවශයෙන් කරණලද්දී, මහත් ඵල මහානිශංස වේ. රාහුල, කෙසේ වඩනාලද කෙසේ බහුල වශයෙන් කරණ ලද ආණාපානසතිය මහත්ඵල මහානිශංස වේද, රාහුල, මේ ශාසනයෙහි භික්ෂුවක් වනයට ගියේ හෝ රුක් මුලට ගියේ හෝ හිස් ගෙයකට ගියේ හෝ එරමිණිය ගොතා කය ඍජුව තබා සිහිය ඉදිරිපත් කොට උපදවා හිඳියි, ඒ භික්ෂුව සිහි ඇතිවම හුස්ම ගණී, සිහි ඇතිව හුස්ම හරී, දික් හුස්ම ගන්නේ දිගට හුස්ම ගනිමියි දනියි. දිගට හුස්ම හරින්නේ දිගට හුස්ම හරිමියි දනියි. කොටින් හුස්ම ගන්නේ කොටින් හුස්ම ගනිමියි දනී.

කොටින් හුස්ම හරින්නේ කොටින් හුස්ම හරිමියි දනී. හුස්ම ගැණිීම මුල සිට අග තෙක් සම්පූර්ණයෙන් දැන හුස්ම ගණිමියි හික්මෙයි. (-පුරුදු වෙයි) හුස්ම හැරීම මුල සිට අගතෙක් සම්පූර්ණයෙන් දැන හුස්ම හරිමියි හික්මෙයි. මහත්කොට හුස්ම ගැනීම ධ්‍යාන ප්‍රීතිය දැනගනිමින් හුස්ම ගනිමියි හික්මෙයි. මහත්කොට හුස්ම හැරීම ධ්‍යාන ප්‍රීතිය දැනගනිමින් හුස්ම හරිමියි හික්මෙයි. ධ්‍යාන සැපය දැනගනිමින් හුස්ම ගණිමියි හික්මෙයි. ධ්‍යාන සැපය දැනගනිමින් හුස්ම හරිමියි හික්මෙයි. චිත්ත ව්‍යාපාරය දැනගනිමින් හුස්ම ගණිමියි හික්මෙයි. චිත්ත ව්‍යාපාරය දැනගනිමින් හුස්ම හරිමියි හික්මෙයි. චිත්ත ව්‍යාපාරය සංසිඳුවමින් හුස්ම ගණිමියි හික්මෙයි. චිත්ත ව්‍යාපාරය සංසිඳුවමින් හුස්ම හරිමියි හික්මෙයි. සිත දැනගනිමින් හුස්ම ගණිමියි හික්මෙයි. සිත දැනගනිමින් හුස්ම හරිමියි හික්මෙයි. සිත විශෙෂයෙන් තුටුකරමින් හුස්ම ගණිමියි හික්මෙයි. සිත විශෙෂයෙන් තුටු කරමින් හුස්ම හරිමියි හික්මෙයි. සිත මනාකොට තබමින් හුස්ම ගණිමියි හික්මෙයි. සිත මනාකොට තබමින් හුස්ම හරිමියි හික්මෙයි. සිත කෙලෙසුන්ගෙන් මුදවමින් හුස්ම ගණිමියි හික්මෙයි. සිත කෙලෙසුන්ගෙන් මුදවමින් හුස්ම හරිමියි හික්මෙයි. අනිත්‍යය අනුව බලමින් හුස්ම ගණිමියි හික්මෙයි. අනිත්‍යය අනුව බලමින් හුස්ම හරිමියි හික්මෙයි නොඇලීම අනුව බලමින් හුස්ම ගණිමියි හික්මෙයි. නොඇලීම අනුව බලමින් හුස්ම හරිමියි හික්මෙයි. නිරොධය අනුව බලමින් හුස්ම ගණිමියි හික්මෙයි. නිරොධය අනුව බලමින් හුස්ම හරිමියි හික්මෙයි. දුරලීම අනුව බලමින් හුස්ම ගණිමියි හික්මෙයි. දුරලීම අනුව බලමින් හුස්ම හරිමියි හික්මෙයි.

17. "රාහුල, මෙසේ වඩනලද මෙසේ බහුල වශයෙන් කරන ලද ආනාපාන සතිය මහත්ඵල මහානිශංසවේ. රාහුල, මෙසේ වඩනලද මෙසේ බහුල වශයෙන් කරණ ලද ආනාපාන සතිය කරණකොට ඔබගේ යම් අවසාන හුස්ම ගැනීමක් හැරීමක් වෙත්ද, ඒවාද දැනගෙනම නැතිවී යත්. නොදැන නැතිවී නොයත්."

භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. ආයුෂ්මත් රාහුල ස්ථවිර තෙමේ සතුටු වූයේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටු විය.

**දෙවෙනිවූ මහා රාහුලොවාද සූත්‍රය නිමි. (2-2)**

## 13. චූල මාලුංක්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඩු මහ සිටුහුගේ ජෙතවන නම්වූ ආරාමයෙහි වැඩ වාසය කළහ. එකල්හි රහසිගතව සිත එකඟ කළ මාලුංක්‍ය පුත්‍ර තෙරුන් වහන්සේට සිත පිළිබඳ මෙබඳු කල්පනාවක් පහළ විය. (එනම්) 'ලෝකය සදාකාලිකය කියාද, ලෝකය සදාකාලික නොවේය කියාද, ලෝකය කෙළවරක් ඇත්තේය කියාද, ලෝකය කෙළවරක් නැත්තේය කියාද, ඒ ජීවයම ඒ ශරීරයයි කියාද, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියාද, සත්වයා මරණින් පසු ඇතිවේය කියාද, සත්වයා මරණින් පසු ඇති නොවේය කියාද, සත්වයා මරණින් පසු ඇතිවේද ඇතිනොවේද කියාද, සත්වයා මරණින් පසු ඇතිනොවේය ඇති නොවන්නේත් නොවේය කියාද, භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ නොකරන ලද, තබන ලද, ප්‍රතික්ෂෙප කරන ලද යම් මේ දෘෂ්ටීහු වෙත්ද, භාග්‍යවතුන් වහන්සේ මට ඒ දෘෂ්ටි ප්‍රකාශ නොකළහ. භාග්‍යවතුන් වහන්සේ මට යම් දෘෂ්ටි ප්‍රකාශ නොකළෝද මට එය රුචි නොවෙයි. මට එය ඉවසිය නොහැක. ඒ මම භාග්‍යවතුන් වහන්සේ වෙත ගොස් ඒ කාරණය විචාරන්නෙමි. ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ, ලෝකය සදාකාලික නොවේය කියා හෝ, ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති

නොවේද කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ කරන්නේ නම් එවිට මම භාග්‍යවතුන් වහන්සේ වෙත මහණකම් කරන්නෙමි.

"ඉදින් මට භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ, ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ නොකරන්නේ නම් එවිට මම පැවිදිකම හැර ගිහිවන්නෙමි" (කියායි.)

2. ඉක්බිති ආයුෂ්මත් මාලුංක්‍ය පුත්ත ස්ථවිර තෙම සවස් කාලයෙහි සිත එකඟ කිරීමෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි ගියහ. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තෙක හුන්නේය. එක් පැත්තක හුන් මාලුංක්‍ය පුත්ත ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

"ස්වාමීනි, මෙහි රහසිගතව සිත එකඟ කළ මට සිත පිළිබඳ මෙබඳු කල්පනාවක් පහළ විය. (එනම්) ලෝකය සදාකාලිකය කියාද, ලෝකය සදාකාලික නොවේය කියාද, ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවය ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ කරන්නේ නම් මම භාග්‍යවතුන් වහන්සේ වෙත මහණකම් කරන්නෙමි. ඉදින් මට භාග්‍යවතුන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ, ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවය ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ නොකරන්නේ නම් එවිට මම පැවිදිකම හැර ගිහිවන්නෙමි"යි (කියායි).

3. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය'යි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට ලෝකය සදාකාලියයි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලික නොවේයයි දනීද, මට භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලික නොවේයයි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ ලෝකය සදාකාලික නොවේය කියා හෝ නොදනීද (එසේ) නොදන්නහුගේ හා නොදක්නහුගේ යම් මේ නොදනිමි නොදකිමි'යි යන මෙයම (-මේ කීමම) ඍජුකම වේ.

4. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය කෙළවරක් ඇත්තේය කියා දනීද, භාග්‍යවතුන් වහන්සේ මට ලෝකය කෙළවරක් ඇත්තේය'යි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය කෙළවරක් නැත්තේය කියා දනීද, භාග්‍යවතුන් වහන්සේ මට ලෝකය කෙළවරක් නැත්තේය'යි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ නොදනීද, එසේ නොදන්නහුගේ හා නොදක්නහුගේ යම් මේ 'නොදනිමි නොදකිමි'යි යන මෙයම (මේ කීමම) ඍජුකම වේ.

5. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ ඒ ජීවයම ඒ ශරීරය'යි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට ඒ ජීවයම ඒ ශරීරය'යි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ජීවය අනිකෙක, ශරීරය

අනිකෙකැයි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට ජීවය අනිකෙක ශරීරය අනිකෙකැයි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ ඒ ජීවයම ශරීරය'යි කියා හෝ ජීවය අනිකෙක ශරීරය අනිකෙකැයි කියා හෝ නොදනීද, නොදන්නහුගේ හා නොදක්නහුගේ යම් මේ නොදනිමි නොදකිමි'යි යන මෙයම (-මේ කීමම) ඍජුකම වේ.

6. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිවේය'යි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට සත්වයා මරණින් පසු ඇතිවේය'යි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇති නොවේය'යි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට සත්වයා මරණින් පසු ඇති නොවේය'යි ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ නොදනීද, නොදන්නහුගේ හා නොදක්නහුගේ යම් මේ නොදනිමි නොදකිමි'යි යන මෙයම (මේ කීමම) ඍජුකම වේ.

7. "ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිවේය'යිද ඇති නොවේය'යිද දනීද, මට භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිවේය'යිද ඇති නොවේය'යි ද ප්‍රකාශ කෙරේවා. ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිනොවේය ඇති නොවන්නෙත් නොවේය'යි දනීද, භාග්‍යවතුන් වහන්සේ මට සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේයයි ප්‍රකාශ කෙරේවා ඉදින් භාග්‍යවතුන් වහන්සේ සත්වයා මරණින් පසු ඇතිවේ යයිද ඇති නොවේය'යිද නොදනීද සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය'යිද නොදනීද නොදන්නහුගේ හා නොදක්නහුගේ යම් මේ නොදනිමි නොදකිමියි යන මෙයම (මේ කීමම) ඍජුකම වේ."

8. "මාලුංක්‍යපුත්‍රය, කිමද? ඔබට මම මෙසේ කීයෙම්ද? 'මාලුංක්‍යපුත්‍රය, මම ඔබට ලෝකය සදාකාලිකය කියා හෝ,

ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරයයි කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ කරන්නෙමි. (මෙහි) එව මා වෙත බඹසර (බ්‍රහ්මචරියායෙහි) හැසිරෙව පැවිදිවෙව"(යි කීයෙම්ද)

"ස්වාමීනි, එබඳු කීමක් නැත."

**9.** "ඔබ හෝ මට, 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට ලෝකය සදාකාලිකය කියා හෝ ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේ කියා හෝ ප්‍රකාශ කරන්නේ නම් මම භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නෙමියි පැවිදිවන්නෙමි'යි මෙසේ කීයෙහිද?"

"ස්වාමීනි, එබඳු කීමක් නැත."

**10.** "මාලුංක්‍යපුත්‍රය, මම ඔබට ලෝකය සදාකාලිකය කියා හෝ, ලෝකය සදාකාලික නොවේය කියා හෝ, ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇති වේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ

සත්වයා මරණින් පසු ඇති නොවේය ඇතිනොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ කරන්නෙමි. එව ඔබ මා වෙත බඹසර හැසිරෙව පැවිදිවෙව යි, මාලුංක්‍යා පුත්‍රය, මම ඔබට මෙසේත් නොකීවෙමි. ඔබ මට 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවය ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ ප්‍රකාශ කරන්නේ නම් මම භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නෙමියි, පැවිදිවන්නෙමි'යි කීයෙහිත් නොවෙයි. පුරුෂය, මෙසේ ඇති කල්හි (මෙසේ නම්) කවරෙක් කවරෙකු යදින්නෙහිද? (කවරෙකු ඉල්වන්නා හෝ ඉල්වනු ලබන්නාවෙහිද)

11. "මාලුංක්‍යා පුත්‍රය, යමෙක් මට 'භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ, ලෝකය සදාකාලික නොවේය කියා හෝ, ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ, ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවයම ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය ඇති නොවන්නේත් නොවේය කියා හෝ යම්තාක් ප්‍රකාශ නොකරන්නේද, ඒතාක් මම භාග්‍යවතුන් වහන්සේ වෙත පැවිදි නොවන්නෙමියි. මෙසේ කියන්නේ නම්, මාලුංක්‍යා පුත්‍රය, තථාගතයන් වහන්සේ විසින් එය ප්‍රකාශ නොකරණ ලද්දේම වන්නේය. ඉක්බිති ඒ පුද්ගල තෙම කළුරිය කරන්නේය. (ධර්මයෙන් ප්‍රතිකාර නොකළ හැක්කෙක් වන්නේය).

12. "මාලුංක්‍ය පුත්‍රය, යම්සේ පුරුෂයෙක් තදින් විෂ පෙවූ ඊතලයකින් පුරුෂයෙක් විදින ලද්දේ වන්නේද, (එතැනට) ඔහුගේ මිත්‍ර නෑදෑයෝ ශල්‍යවෛද්‍යයෙකු ඉදිරිපත් කරන්නාහුය (එවිට) ඔහු මෙසේ කියන්නේය. 'යමෙකු විසින් විදින ලද්දේ වෙම්ද (ඒ) ක්ෂත්‍රියයෙක්ද, බ්‍රාහ්මණයෙක්ද, වෛශ්‍යයෙක්ද, ශූද්‍රයෙක්දැයි යම්තාක් ඒ පුරුෂයා ගැන නොදනිම්ද, ඒතාක් (දැනගන්නාතුරු) මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යමෙකු විසින් විදින ලද්දේ වෙම්ද, (ඒ) මේ නම් ඇත්තෙක, මේ ගොත්‍ර ඇත්තෙකැ'යි යම් තාක් ඒ පුරුෂයා ගැණ නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යමෙකු විසින් විදින ලද්දේ වෙම්ද, ඒ උස කෙනෙක, මිටි කෙනෙක, මධ්‍යම තරමේ කෙනෙකැ'යි යම්තාක් ඒ පුරුෂයා ගැන නොදනිම්ද ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යමෙකු විසින් විදින ලද්දේ වෙම්ද, (ඒ) කලු කෙනෙක, සුදු කෙනෙක, මගුරුවන් (තලේලලු) කෙනෙකැයි යම්තාක් ඒ පුරුෂයා ගැන නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යමෙකු විසින් විදින ලද්දේ වෙම්ද, (ඔහු) අසවල් ගමේ හෝ නියම්ගමේ හෝ නුවර හෝ යයි' යම්තාක් ඒ පුරුෂයා ගැණ නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යමකින් විදින ලද්දේ වෙම්ද, (එය) ඉදින් මහ දුන්නක්ද, ඉදින් කුඩා දුන්නක්දැයි ඒ දුන්න (ගැණ) යම්තාක් නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යම් දුනු දිය (දුන්නේ බැඳි ලණුව) කින් විදින ලද්දේ වෙම්ද, (ඒ) වරා නූලින් කරන ලද්දක්ද,

හණ නූලින් කරන ලද්දක්ද, නහරවලින් කරන ලද්දක්ද, මරුවවරා නූලින් කරන ලද්දක්දැ'යි දුනුදිය (ගැණ) යම්තාක් නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යම් ඊතලයකින් විදිනලද්දේ වෙම්ද, (එය) ඉදින් පර්වත දියකඩක හටගන්නක්ද, රෝපණය කළ දෙයකින් සාදන ලද්දක්දැ'යි යම්තාක් ඊතලය ගැන නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යම් ඊතලයකින් විදින ලද්දෙම්ද, (එය) යම් පක්ෂියෙකුගේ පියාපත්වලින් වෙලන ලදද, ඒ ඉදින් ගිජුලිහිණියකුගේද, ඉදින් ලෝතුඩුවකුගේද, උකුස්සෙකුගේද, මොණරකුගේද, කරහීන් ලිහිණියකුගේදැ'යි යම්තාක් නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි'

"ඔහු මෙසේ කියන්නේය. "යම් ඊතලයකින් විදින ලද්දේ වෙම්ද, (එය) යමෙකුගේ නහරවලින් වෙළන ලදද (ඒ) ඉදින් ගොණෙකුගේද, ඉදින් මීමෙකුගේද ඉදින් කලු සිංහයකුගේද, ඉදින් මුවකුගේදැයි ඒ ඊතලය (ගැණ) යම්තාක් නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

"ඔහු මෙසේ කියන්නේය. 'යම් ඊතලයකින් විදින ලද්දේ වෙම්ද, (එය) ඉදින් ඊතලයක්ද, ඉදින් තියුණු ඊතලයක්ද, ඉදින් වෙකණ්ඩයක්ද, ඉදින් නාරාචයක්ද, ඉදින් වසුදතක්ද, ඉදින් කණේරු පතක්දැ'යි ඊය (ගැණ) යම්තාක් නොදනිම්ද, ඒතාක් මම මේ ඊතලය නොගලවන්නෙමි.'

13. "මාලුංක්‍යපුත්‍රය, ඒ පුරුෂයා විසින් (යටකී) කරුණු නොදන්නා ලද්දේම වන්නේය. එකල ඒ (විදුම්ලද) පුරුෂයා කළුරිය කරන්නේය.

"මාලුංක්‍යපුත්‍රය, එපරිද්දෙන්ම යමෙක් යම්තාක් මට භාග්‍යවතුන් වහන්සේ ලෝකය සදාකාලිකය කියා හෝ ලෝකය සදාකාලික නොවේය කියා හෝ ලෝකය කෙළවරක් ඇත්තේය කියා හෝ ලෝකය කෙළවරක් නැත්තේය කියා හෝ, ඒ ජීවය

ඒ ශරීරය කියා හෝ, ජීවය අනිකෙක, ශරීරය අනිකෙක කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇති නොවේය කියා හෝ, සත්වයා මරණින් පසු ඇතිවේද ඇති නොවේද කියා හෝ සත්වයා මරණින් පසු ඇති නොවන්නේය. ඇති නොවන්නේත් නොවන්නේයයි ප්‍රකාශ නොකරන්නේද, ඒතාක් මම භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර නොහැසිරෙන්නෙමියි, පැවිදි නොවන්නෙමි යි කියන්නේද, එකල්හිද ඒ පුද්ගලතෙම මැරෙන්නේය. (ධර්මයෙන් වෙන් වන්නේය.)

14. "මාලුංක්‍ය පුත්‍රය, ලෝකය සදාකාලිකයයි, දැක්ම ඇති කල්හි හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීම වන්නේද? එසේ නොවේ. මාලුංක්‍ය පුත්‍රය, ලෝකය සදාකාලික නොවේය කියා දැකීම ඇති කල්හි හෝ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීම වන්නේද? එසේත් නොවේය. මාලුංක්‍ය පුත්‍රය, ලෝකය සදාකාලිකයයි දැක්ම ඇති කල්හිද, ලෝකය සදාකාලික නොවේයයි දැක්ම ඇති කල්හිද, ඒ මම මේ ආත්මයේදී යමක් විනාශයයි පැනවීම්ද (ඒ) ඉපදීම ඇත. ජරාව ඇත. මරණය ඇත. ශොක, වැලපීම්, දුක්, දොම්නස්, උපායාසයෝ ඇත්තාහ.

15. "මාලුංක්‍ය පුත්‍රය, ලෝකය කෙළවරක් ඇත්තේයයි දැක්ම ඇති කල්හි හෝ බඹසර වස වන්නේද? එසේ නොවේ. මාලුංක්‍ය පුත්‍රය, ලෝකය කෙළවරක් නැත්තේය කියා දැකීම ඇති කල්හි හෝ බඹසර වස වන්නේද? එසේත් නොවේමය. මාලුංක්‍ය පුත්‍රය, ලෝකය කෙළවරක් ඇත්තේයයි දැකීම ඇති කල්හි හෝ ලොකය කෙළවරක් නැත්තේයයි දැකීම ඇති කල්හි හෝ ඒ මම මේ ආත්මයේදී යමක් විනාශය යි පැනවීම්ද ඒ ඉපදීම ඇත. ජරාව ඇත. මරණය ඇත. ශොක වැලපීම් දුක් දොම්නස් උපායාසයෝ ඇත්තාහ.

16. "මාලුංක්‍ය පුත්‍රය, ඒ ජීවයම ඒ ශරීරය'යි දැක්ම ඇති කල්හි බඹසර වස වන්නේද? එසේ නොවේ. මාලුංක්‍ය පුත්‍රය, ජීවය අනිකක ශරීරය අනිකකැ'යි දැකීම ඇති කල්හි

බඹසර වසවන්නේද? එසේද නොවේය. මාලුංක්‍යා පුත්‍රය, ඒ ජීවය ඒ ශරීරය'යි දැකීම ඇති කල්හිද, ජීවය අනිකක, ශරීරය අනිකකැයි දැකීම ඇතිකල්හිද ඒ මම මේ ආත්මයේදී යමක් විනාශයයි පැනවීම්ද, (ඒ) ඉපදීම ඇත, ජරාව ඇත, මරණය ඇත, ශොක වැලපීම් දුක් දොම්නස් උපායාසයෝ ඇත්තාහ.

17. "මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින් පසු ඇතිවේයයි දැකීම ඇති කල්හි හෝ බඹසර වස වන්නේද? එසේ නොවේ. මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින් පසු ඇති නොවේයයි දැකීම ඇති කල්හි හෝ බඹසර වස වන්නේද? එසේත් නොවේය. මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින් පසු ඇතිවේය'යි දැකීම ඇති කල්හිද, සත්වයා මරණින් පසු ඇති නොවේයයි දැකීම ඇතිකල්හි හෝ ඒ මම මේ ආත්මයේදී යමක් විනාශයයි පැනවීම්ද, ඒ ඉපදීම ඇත, ජරාව ඇත, මරණය ඇත. ශොක, වැළපීම්, දුක්, දොම්නස් උපායාසයෝ ඇත්තාහ.

18. "මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින් පසු ඇතිවේද, ඇති නොවේදැයි දැකීම ඇතිකල්හි හෝ බඹසර වස වන්නේද? එසේ නොවේ. මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින්පසු ඇති නොවේ. ඇතිනොවන්නේත් නොවේය'යි දැකීම ඇති කල්හි බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරීම වන්නේද? එසේත් නොවේය. මාලුංක්‍යා පුත්‍රය, සත්වයා මරණින් පසු ඇතිවේද ඇතිනොවේ දැයි දැකීම ඇති කල්හිද ඇති නොවේ, ඇති නොවන්නේත් නොවේය කියා දැකීම ඇති කල්හිද, ඒ මම මේ ආත්මයෙදී යමක් විනාශයයි පැනවීම්ද (ඒ) ඉපදීම ඇත, ජරාව ඇත. මරණය ඇත. ශොක, වැලපීම්, දුක්, දොම්නස් උපායාසයෝ ඇත්තාහ.

19. "මාලුංක්‍යා පුත්‍රය, එහෙයින් මෙහි මා විසින් ප්‍රකාශ නොකරණ ලද්ද, ප්‍රකාශ නොකරණ ලද්ද වශයෙන් දරව්. මා විසින් ප්‍රකාශ කරණ ලද්ද, ප්‍රකාශ කරණ ලද්ද වශයෙන් දරව්. මාලුංක්‍යා පුත්‍රය, මා විසින් කුමක් ප්‍රකාශ නොකරණ ලදද? මාලුංක්‍යා පුත්‍රය, මා විසින් ලෝකය සදාකාලිකයයිද ප්‍රකාශ නොකරන ලදී. මා විසින් ලෝකය සදාකාලික නොවේයයිද

ප්‍රකාශ නොකරනලදී. මා විසින් ලෝකය කෙළවරක් ඇත්තේය'යිද ප්‍රකාශ නොකරන ලදී. මා විසින් ලෝකය කෙළවරක් නැත්තේයයිද ප්‍රකාශ නොකරන ලදී. මා විසින් ඒ ජීවයම ඒ ශරීරයයිද ප්‍රකාශ නොකරනලදී. මා විසින් ජීවය අනිකක ශරීරය අනිකකැයිද ප්‍රකාශ නොකරනලදී. මා විසින් සත්වයා මරණින් පසු ඇතිවේය'යිද ප්‍රකාශ නොකරන ලදී. මා විසින් සත්වයා මරණින් පසු ඇති නොවේය'යිද ප්‍රකාශ නොකරණ ලදී. මා විසින් සත්වයා මරණින් පසු ඇතිවේය ඇති නොවේය' යිද ප්‍රකාශ නොකරණ ලදී. මා විසින් සත්වයා මරණින් පසු ඇති නොවේය, ඇති නොවන්නේත් නොවේයයිද ප්‍රකාශ නොකරන ලදී. මාලුංක්‍යා පුත්‍රය, කවර හෙයකින් මා විසින් එය ප්‍රකාශ නොකරන ලදද? මාලුංක්‍යා පුත්‍රය, එය අර්ථයෙන් යුක්ත (-ප්‍රයෝජනයක් ඇති දෙයක්) නොවේ, එය මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල්වන (-ශීල මාත්‍රයකුදු) නොවේ. එය සසර කලකිරීම පිණිස, සසර නොඇලීම පිණිස, කෙලෙස් නැතිකිරීම පිණිස, කෙලෙස් සංසිඳුවීම පිණිස, නුවණින් දැනීම පිණිස, සත්‍යාවබොධය පිණිස, නිර්වාණය පිණිස නොපවතී. එහෙයින් මා විසින් එය ප්‍රකාශ නොකරන ලදී.

**20.** "මාලුංක්‍යා පුත්‍රය, මා විසින් කුමක් ප්‍රකාශ කරන ලදද? මාලුංක්‍යා පුත්‍රය, මා විසින් මේ දුකයයි ප්‍රකාශ කරන ලදී. මා විසින් මේ දුක් උපදවන හෙතුවය'යි ප්‍රකාශ කරන ලදී. මා විසින් මේ දුක් නැතිකිරීමයයි ප්‍රකාශ කරන ලදී. මා විසින් මේ දුක් නැතිකිරීමට පමුණුවන පිළිපැදීමය'යි ප්‍රකාශ කරන ලදී. මාලුංක්‍යා පුත්‍රය, මා විසින් එය කවර හෙයකින් ප්‍රකාශ කරන ලදද? මාලුංක්‍යා පුත්‍රය, එය වනාහී අර්ථයෙන් යුක්ත වේ. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාවට මුල් වන්නේ වේ. එය සසර කලකිරීම පිණිස, සසර නොඇලීම පිණිස. කෙලෙස් නැති කිරීම පිණිස, කෙලෙස් සංසිඳුවීම පිණිස, නුවණින් දැනගැනීම පිණිස, සත්‍යාවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතී. මාලුංක්‍යා පුත්‍රය, එහෙයින් එය මා විසින් ප්‍රකාශ කරන ලදී. මාලුංක්‍යා පුත්‍රය, එහෙයින් මෙහි මා විසින් ප්‍රකාශ නොකරණ ලද්ද, ප්‍රකාශ නොකරණ ලද්ද

වශයෙන් දරව්. මා විසින් ප්‍රකාශ කරණ ලද්ද, ප්‍රකාශ කරණ ලද්ද වශයෙන් දරව්."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති මාලුංක්‍ය පුත්‍ර ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු විය.

**තුන්වෙනිවූ චූල මාලුංක්‍ය සූත්‍රය නිමි. (2-3)**

## 14. මහා මාලුංක්‍ය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර අනේපිඬු මහ සිටුහුගේ ජේතවන නම්වූ ආරාමයෙහි වැස වාසය කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථාකළහ. "ස්වාමීනි"යි භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

"මහණෙනි, තොපි මා විසින් දෙසන ලද ඔරම්භාගීය සංයොජනයන් (යට කොටසයයි කියනු ලබන කාම ලොකය භජනය කරන සංයොජනයන්) දරන්නා හුද"

2. මෙසේ ඇසූ කල්හි මාලුංක්‍ය පුත්‍ර ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනලද පඤ්ච ඔරම්භාගීය සංයෝජනයන් සිතින් දරමි."

"මාලුංක්‍ය පුත්‍රය, තෙපි මා විසින් දෙසනලද පඤ්චඔරම්භාගීය සංයෝජනයන් කෙසේ දරන්නා හුද"

"ස්වාමීනි, මම ආත්මයක් ඇත යන භාග්‍යවතුන් වහන්සේ විසින් ඔරම්භාගීය සංයෝජනය වශයෙන් දෙශනා කරන ලද සක්කාය දිට්ඨිය දරමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් ඔරම්භාගිය සංයොජන වශයෙන් වදාළ විචිකිච්ඡාව දරමි

ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසනාකළ ඕරම්භාගීය සංයෝජන වශයෙන් සීලබ්බත පරමාසය දරමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් ඕරම්භාගිය සංයොජන වශයෙන් දෙශනාකළ කාමච්ඡන්දය දරමි.

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් ඕරම්භාගිය සංයෝජන වශයෙන් වදාළ ව්‍යාපාදය දරමි. ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් දෙසන ලද පඤ්චඕරම්භාගීය සංයෝජනයන් මෙසේ දරමි."

3. "මාලුංක්‍ය පුත්‍රය තොප මා විසින් කවරෙකුට දෙසන ලද පඤ්චඕරම්භාගිය සංයොජනයන් මෙසේ දරයිද? මාලුංක්‍ය පුත්‍රය, අන්‍ය දෘෂ්ටික පැවිද්දෝ දොස් නගත හැකි මේ ළදරු උපමාවෙන් දොස් නගන්නාහු නොවෙත්ද? (කෙසේද) මාලුංක්‍ය පුත්‍රය, උඩුකුරුව නිදන බිළිඳු කුඩා දරුවෙකුට ස්වකීය ශරීරය යන හැඟීමක් නැත. ඔහුට මම යන දෘෂ්ටියක් කොහින් උපදීද? ඔහුට අනුශය වසයෙන් පවත්නා සක්කාය දෘෂ්ටියම ඇත්තේය. මාලුංක්‍ය පුත්‍රය, උඩුකුරුව නිදන බිලිඳු කුඩා දරුවෙකුට ධර්මයෝයයි හැඟීමක් නැත. ධර්මයන්හි සැකයක් කොයින් උපදීද? ඔහුට අනුශය වශයෙන් පවත්නා විචිකිච්ඡාවම ඇත්තීය. මාලුංක්‍ය පුත්‍රය, උඩුකුරුව නිදන බිලිඳු කුඩා දරුවෙකුට සීලයයි හැඟීමක් නැත. ඔහුට වරදවා ගන්නා සීලයක් ව්‍රතයක් කොහින් උපදීද? අනුශය වශයෙන් පවත්නා සීලබ්බතපරාමාසයම ඇත්තේය. මාලුංක්‍ය පුත්‍රය, උඩුකුරුව නිදන බිළිඳු කුඩා දරුවෙකුට කාමයයි හැඟීමක් නැත. ඔහුට කාමයෙහි කැමැත්ත කොහින් උපදීද? ඔහුට අනුශය වශයෙන් පවත්නා කාමච්ඡන්දයම ඇත්තේය මාලුංක්‍ය පුත්‍රය, උඩුකුරුව නිදන බිළිඳු දරුවෙකුට සත්වයෝයයි හැඟීමක් නැත. එවිට සත්වයන් කෙරෙහි කෝපයක් කොයින් උපදින්නේද? ඔහුට අනුශය වශයෙන් පවත්නා ව්‍යාපාදයම ඇත්තේය. මාලුංක්‍ය පුත්‍රය, අන්‍ය දෘෂ්ටික පැවිද්දෝ දොස් නගන හැකි මේ ළදරු උපමාවෙන් දොස් නගන්නාහු නොවෙත්ද?"

4. මෙසේ කී කල්හි ආනන්ද ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "භාග්‍යවතුන් වහන්සේ යම් හෙයකින් පඤ්චඔරම්භාගීය සංයොජනයන් දෙසත් ද භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්ද, (-ඉගෙණ ගණිත්ද) භාග්‍යවතුන් වහන්ස, මේ එයට කාලයයි. සුගතයන් වහන්ස, මේ එයට කාලයයි."

"ආනන්දය, එසේ නම් අසව, හොඳින් සිහි කරව. කියන්නෙමි," "එසේය, ස්වාමීනි"යි ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළෝය.

5. "ආනන්දය, මේ ලෝකයෙහි ආය්‍ර්‍යයන් නොදක්නා, ආය්‍ර්‍ය ධර්මයෙහි අදක්ෂ, ආය්‍ර්‍ය ධර්මයෙහි නොහික්මුනු, නොදක්නා සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු, නූගත් පෘථග්ජනයා සත්කාය දෘෂ්ටියෙන් මඩනාලදුව උපන් සත්කාය දෘෂ්ටිය ඇති සිතින් වාසය කරයිද, උපන් සත්කාය දෘෂ්ටියගේ නැතිකිරීම ඇතිසැටියෙන් නොදනීද, ශක්තිමත්වූ දුරුකිරීමට අපහසුවූ ඔහුගේ සක්කාය දිට්ඨිය ඔරම්භාගීය සංයෝජනයක් වෙයි.

"සැකයෙන් මඩනාලදුව, උපන් සැකය ඇති සිතින් වාසය කරයිද, උපන් සැකයේ නැති කිරීම ඇතිසැටියෙන් නොදනීද, ශක්තිමත්වූ දුරුකිරීමට අපහසුවූ ඔහුගේ විචිකිච්ඡාව ඔරම්භාගීය සංයෝජනයක් වෙයි.

6. "සීලබ්බත පරාමාසයෙන් මඩනා ලදුව, උපන් සීලබ්බත පරමාශය ඇති සිතින් වාසය කරයිද. උපන් ශීලව්‍රත පරාමාශයේ නැති කිරීම ඇතිසැටියෙන් නොදනීද, ශක්තිමත්වූ දුරු කිරීමට අපහසුවූ ඔහුගේ සීලබ්බත පරාමාසය ඔරම්භාගීය සංයොජනයක් වෙයි.

"කාම රාගයෙන් මඩනා ලදුව, උපන් කාම රාගයෙන් යුත් සිතින් වාසය කරයිද, උපන් කාම රාගයේ නැති කිරීම

ඇතිසැටියෙන් නොදනීද, ශක්තිමත්වූ දුරු කිරීමට අපහසුවූ ඔහුගේ ඡන්ද රාගය ඔරම්භාගීය සංයෝජනයක්වේ.

"කෝපයෙන් මඩනා ලදුව, උපන් කෝපයෙන් යුත් සිතින් වාසය කරයිද, උපන් කෝපයේ නැති කිරීම නොදනී, ශක්තිමත්වූ දුරු කිරීමට අපහසුවූ ඔහුගේ ව්‍යාපාදය ඔරම්භාගීය සංයෝජනයක් වෙයි.

"ආනන්දය, ලෝකයෙහි ආර්‍ය්‍යයන් දක්නා ආර්‍ය්‍ය ධර්මයෙහි දක්ෂ ආර්‍ය්‍ය ධර්මයෙහි හික්මුනු සත්පුරුෂයන් දක්නා සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි හික්මුනු උගත් ආර්‍ය්‍ය ශ්‍රාවකයා සත්කායදෘෂ්ටියෙන් නොමඩනා ලද, සත්කායදෘෂ්ටිය නූපන් සිතින් වාසය කරයිද, උපන් සත්කාය දෘෂ්ටි නැති කිරීම ඇතිසැටියෙන් දනීද අනුශය සහිතවූ ඔහුගේ ඒ සත්කායදෘෂ්ටිය නැතිවී යන්නේය.

"සැකයෙන් නොමඬනා ලද, සැකය නූපන් සිතින් වාසය කරයි. උපන් සැකයේ නැති කිරීම ඇතිසැටියෙන් දනී. ඔහුගේ අනුශය සහිතවූ ඒ සැකය නැතිවීයයි,

"ශීලව්‍රත පරාමාශයෙන් නොමඩනා ලද, ශීලව්‍රත පරාමාශය නූපන් සිතින් වාසය කරයි. උපන්නාවූ ශීලව්‍රත පරාමාශයේ නැති කිරීම ඇතිසැටියෙන් දනී. ඔහුගේ අනුශය සහිතවූ ඒ ශීලව්‍රත පරාමාශය නැතිවී යන්නේය.

"කාම රාගයෙන් නොමඩනා ලද, නූපන් කාම රාගය ඇති සිතින් වාසය කරයි. උපන් කාම රාගයේ නැති කිරීම ඇතිසැටියෙන් දනී, ඔහුගේ අනුශය සහිත ඒ කාම රාගය නැතිවී යයි.

"කෝපයෙන් නොමඩනා ලද, නූපන් කෝපය ඇති සිතින් වාසය කරයි. උපන් කෝපයේ නැති කිරීම ඇතිසැටියෙන් දනී, ඔහුගේ අනුශය සහිත ඒ කෝපය නැතිවීයයි.

7. "ආනන්දය, පඤ්චොරම්භාගීය සංයෝජනයන් නැති කිරීමට යම් මගක්, යම් පිළිපැදීමක් වේද ඒ මගට ඒ පිළිපැදීමට නොපැමිණ පඤ්චොරම්භාගීය සංයෝජනයන් දැනගන්නේය

හෝ දක්නේය හෝ පහකරන්නේය හෝ යන මේ කාරණය සිදු නොවන්නකි.

"ආනන්දය, යම්සේ කෙලින් සිටින හරය ඇති මහ ගසක පොත්ත නොසිඳ එලය නොසිඳ හරය කපන්නේය යන මේ කාරණය සිදුනොවන්නක් වේද, ආනන්දය, එපරිද්දෙන්ම පඤ්චොරම්භාගීය සංයෝජනයන් නැතිකිරීමට යම් මගක් යම් පිළිපැදීමක් වේද ඒ මගට ඒ පිළිපැදීමට නොපැමිණ පඤ්චොරම්භාගීය සංයෝජනයන් දැනගන්නේය හෝ දකින්නේය හෝ නැතිකරන්නේය හෝ යන මේ කාරණය සිදු නොවන්නකි.

"ආනන්දය, පඤ්චොරම්භාගීය සංයොජනයන්ගේ නැති කිරීමට යම් මගක් යම් පිළිපැදීමක් වේද, ඒ මගට ඒ පිළිපැදීමට පැමිණ පඤ්චොරම්භාගීය සංයොජනයන් දැන ගන්නේය, කියා හෝ දකින්නේය කියා හෝ නැති කරන්නේය, කියා හෝ යන මේ කාරණය සිදුවන්නකි.

8. "ආනන්දය, යම්සේ කෙළින් සිටින හරය ඇති මහ ගසක පොතු කපා එලය කපා හරය කපන්නේය යන මේ කාරණය සිදුවන්නක් වේද, ආනන්දය, එමෙන් පඤ්චොරම්භාගීය සංයෝජනයන් නැති කිරීමට යම් මගක් යම් පිළිපැදීමක් වේද, ඒ මගට ඒ පිළිපැදීමට පැමිණ පඤ්චොරම්භාගීය සංයොජනයන් දැන ගන්නේය හෝ දකින්නේය හෝ නැති කරන්නේය හෝ යන මේ කාරණය සිදුවන්නකි.

9. "ආනන්දය, යම්සේ කවුඩෙකුට කර නොනමා පානය කළහැකිසේ දෙඉවුර සමව දිය පිරුණු ගංගාවක්වේද, ඉක්බිති මම මේ ගංගාවේ දිය පහර අතින් සිඳගෙන පහසුවෙන් සරස එතරට යන්නෙමි'යි දුබල මිනිසෙක් එන්නේද ඔහු ගංගාවේ දියපහර අතින් සිඳගෙන පහසුවෙන් සරස එතරට යන්ට නොහැකි වන්නේද, ආනන්දය, එමෙන්ම යම්කිසිවෙකුට සක්කාය දෘෂ්ටිය නැති කිරීමට ධර්මය දෙශනා කරණ කල්හි

එහි බැස නොගනීද, නොපහදීද, නොසිටීද, (කෙළෙසුන් ගෙන්) නොමිදේද, ඒ දුබල මිනිසා යම්සේද ඔවුහුද එසේද දත යුත්තාහ.

10. "ආනන්දය, යම්සේ කවුඩෙකුට කර නොනමා පානය කළ හැකිසේ දෙඉවුර සමව දිය පිරුණු ගංගාවක්වේද, ඉක්බිති මම මේ ගංගාවේ දිය පහර අතින් සිඳගෙන පහසුවෙන් සරස එතර යන්නෙමි'යි බලවත් මිනිසෙක් එන්නේය. ඔහු ගංගාවේ දිය පහර අතින් සිඳගෙන පහසුවෙන් එතර යන්ට හැකි වන්නේය. ආනන්දය, එමෙන් යම්කිසි වෙකුට සක්කාය දෘෂ්ටිය නැති කිරීමට ධර්මය දෙශනා කරන කල්හි සිත එහි බැසගනියිද, පහදීද, සිටීද, (කෙළෙසුන්ගෙන්) මිදේද, ඒ බලවත් මිනිසා යම්සේද, ඔහුද එසේද දත යුත්තාහ.

11. "ආනන්දය, පඤ්චොරම්භාගිය සංයොජනයන් නැති කිරීමේ මාර්ගය කවරේද? පිළිපැදීම කවරීද?

"ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුව උපධි විවේකයෙන් (-පස්කම් ගුණයෙන් වෙන් වීමෙන්-) අකුසල ධර්මයන්ගෙන් වෙන්ව (-නීවරණයන් දුරලීමෙන්) ශරීරයේ අලස බව සංසිඳවීමෙන්, කාමයන්ගෙන් වෙන්වම, අකුශලයන්ගෙන් තොරව, විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානය පැමිණ වාසය කරයි. ඒ පුද්ගලයා එහි රූපයට අයත් වේදනාවට අයත් සංඥාවට අයත් සංස්කාරයන්ට අයත් විඥානයට අයත් යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් රෝගයක් වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන් ආබාධයක් වශයෙන්, තමාට අයත් නොවන දෙයක් වශයෙන්, බිඳෙන දෙයක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කොට යම් මේ සියලු සංස්කාරයන්ගේ සංසිඳීමක් වේද, සියලු උපධීන්ගේ දුරලීමක් වේද, තෘෂ්ණාව නැති කිරීමක් වේද, නොඇලීමක් වේද, නැති කිරීමක් වේද, නිර්වාණයක් වේද, මෙය සාන්තය, මෙය ප්‍රණීතයයි අමෘතය නම් නිර්වාණයෙහි

සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂයකිරීමට පැමිණෙයි. ආශ්‍රවයන් ක්ෂයකිරීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහිම ඇලීමෙන් ඒ ධර්මයෙහි කැමතිවීමෙන් පඤ්චොරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් ඖපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් නැවත මෙහි නොඑන ස්වභාවය ඇත්තේ වෙයි. ආනන්දය, පඤ්චොරම්භාගිය සංයොජනයන්ගේ නැති කිරීම පිණිස මේ මාර්ගයයි මේ පිළිපැදීමයි.

12. "ආනන්දය, නැවත අනිකක් කියමි. භික්ෂුව විතර්ක විචාරයන් සංසිඳවීමෙන් සිතේ සතුට ඇතිකරන සිතේ එකඟ බව ඇති කරණ අවිතර්ක අවිචාර සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ පුද්ගලයා එහි රූපයට අයත් වෙදනාවට අයත් සංඥාවට අයත් සංස්කාරයන්ට අයත් විඥානයට අයත් යමක්වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන් තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශවන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත්කොට යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක් වේද, තණ්හාව නැති කිරීමක් වේද, නොඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද මෙය ශාන්තය මෙය ප්‍රණීතය නිර්වාණයයි සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් නැතිකිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් නැති කිරීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහි ඇලීමෙන්, ඒ ධර්මය කැමතිවීමෙන් පංච ඕරම්භාගිය සංයෝජනයන් නැති කිරීමෙන් ඖපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් මෙහි නොඑයි. ආනන්දය, පංචඕරම්භාගිය සංයොජනයන් නැති කිරීමට මේ මාර්ගයයි, මේ පිළිපැදීමයි.

13. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. භික්ෂුව ප්‍රීතියේද නොඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන්

යුක්තවූයේ නුවණින් යුක්ත වූයේ ශරීරයෙන් සුවය විඳින්නේද යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්‍යයෝ කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ පුද්ගලයා එහි රූපයට අයත්, වේදනාවට අයත්, සංඥාවට අයත්, සංස්කාරයන්ට අයත්, විඥානයට අයත් යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රොග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන්, තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශවන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන් ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කොට, යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක් වේද, තණ්හාව නැති කිරීමක් වේද, නොඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද මෙය ශාන්තය මෙය ප්‍රණීතය නිර්වාණයයි සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණියේ නම්, ඒ ධර්මයෙහි ඇලීමෙන් ඒ ධර්මයෙහි කැමති වීමෙන් පංචඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් ඖපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් මෙහි නොඑයි ආනන්දය, පංච ඔරම්භාගිය සංයොජන නැති කිරීමට මේ ධර්මයයි, මේ පිළිපැදීමයි.

14. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. භික්ෂුව සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද පළමුව සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ පුද්ගලයා එහි රූපයට අයත් වේදනාවට අයත්, සංඥාවට අයත්, සංස්කාරයන්ට අයත්, විඥානයට අයත් යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන්, තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශ වන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් දකී.

ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන් ගෙන් සිත ඉවත් කොට, යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක් වේද, තණ්හාව නැති කිරීමක් වේද, නො ඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, නිර්වාණයයි සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණේ නම්, ඒ ධර්මයෙහි ඇලීමෙන්, ඒ ධර්මයෙහි කැමැත්තෙන්, පංච ඔරම්භාගිය සංස්කාරයන් නැති කිරීමෙන් ඖපපාතික වෙයි එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් මෙහි නොඑයි. ආනන්දය, පංච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමට මේ මාර්ගයයි, මේ පිළිපැදීමයි.

15. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. භික්ෂුව සර්වප්‍රකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන් ප්‍රතිඝ සංඥාවන් දුරලීමෙන් නානත්ත සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් 'ආකාශය අනන්තය'යි ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කරයි. ඔහු එහි වෙදනාවට අයත් සංඥාවට අයත් සංස්කාරයට අයත් විඥානයට අයත් යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන්, තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශ වන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනාත්ම වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත්කොට යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක්වේද, තණ්හාව නැතිකිරීමක් වේද, නො ඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, නිර්වාණයයි සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහි ඇලීමෙන් ඒ ධර්මයෙහි කැමැත්තෙන් පංච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් ඖපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් නොඑන ස්වභාව ඇත්තේ වෙයි. ආනන්දය,

පඤ්චොරම්භාගිය සංයොජනයන් නැති කිරීමට මේ මාර්ගයයි, මේ පිළිපැදීමයි.

16. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. භික්ෂුව සර්වප්‍රකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. ඔහු එහි වෙදනාවට අයත් සංඥාවට අයත්, සංස්කාරයන්ට අයත්, විඥානයට අයත්, යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රොග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන්, තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශවන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනාත්ම වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන්ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන් ගෙන් සිත ඉවත් කොට යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක් වේද, තණ්හාව නැති කිරීමක් වේද, නො ඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, නිර්වාණයයි, සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණියේ නම්, ඒ ධර්මයෙහි ඇලීමෙන්, ඒ ධර්මයෙහි කැමැත්තෙන් පංච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් ඔපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් නැවත නොඑන ස්වභාවය ඇත්තේ වෙයි. ආනන්දය, පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමට මේ මාර්ගය වෙයි. මේ පිළිපැදීම වෙයි.

"ආනන්දය, නැවත අනිකක්ද කියමි. භික්ෂුව සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. ඔහු එහි වෙදනාවට අයත්, සංඥාවට අයත්, සංස්කාරයන්ට අයත්, විඥානයට අයත් යමක් වේද, ඒ ධර්මයන් අනිත්‍යවශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, දුකක් වශයෙන්, ආබාධයක් වශයෙන්, තමන්ට අයත් නොවූවක් වශයෙන්, විනාශ වන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනාත්ම

වශයෙන් දකී. ඔහු ඒ ධර්මයන් ගෙන් සිත ඉවත් කරයි. ඔහු ඒ ධර්මයන් ගෙන් සිත ඉවත් කොට යම් මේ සියලු සංස්කාරයන්ගේ දුරලීමක් වේද, තණ්හාව නැතිකිරීමක් වේද, නො ඇලීමක් වේද, නිරුද්ධ කිරීමක් වේද, නිර්වාණයක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතය, නිර්වාණයයි සිත යොදවයි. ඔහු එහි සිටියේ ආශ්‍රවයන් ක්ෂය කිරීමට පැමිණෙයි. ඉදින් ආශ්‍රවයන් ක්ෂය කිරීමට නොපැමිණියේ නම් ඒ ධර්මයෙහි ඇලීමෙන්, ඒ ධර්මයෙහි කැමැත්තෙන් පංච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් ඕපපාතික වෙයි. එහි පිරිනිවෙයි. ඒ ලොකයෙන් නොඑන ස්වභාව ඇත්තේ වෙයි. ආනන්දය, පඤ්ච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීම පිණිස මේ මාර්ගය වේ. මේ පිළිපැදීම වේ.

17. "ස්වාමීනි, ඉදින් පංච ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමට මේ මාර්ගය, මේ පිළිපැදීම වේ නම් කවර හෙයින් ඇතැම් භික්ෂූහු චිත්ත විමුත්තිය ඇත්තාහු, ඇතැම් භික්ෂූහු පඤ්ඤා විමුත්තිය ඇත්තාහු වෙත්ද, ආනන්දය, ඒ කාරණයෙහි මම ඔවුන්ගේ ඉන්ද්‍රියන් පිළිබඳ වෙනස් බවයයි කියමි."

18. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇති ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු වූහ.

**හතරවෙනිවූ මහා මාලුංක්‍ය සූත්‍රය නිමි. ( -4)**

## 15. භද්දාලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර අනේපිඬු මහ සිටුහුගේ ජේතවන නම්වූ ආරාමයෙහි වැඩ වාසය කළහ. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථා කළහ "පින්වතුන් වහන්ස"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

2. "මහණෙනි, මම වනාහි උදය කාලයේ ආහාරයම වළඳමි. මහණෙනි, මම උදය කාලයේ ආහාරයම වළඳන්නෙම් ආබාධ නැති බවද, නිදුක් බවද, ශරීර සැහැල්ලු බවද, කාය බලයද, ශරීරයේ සැප විහරණයද ලබමි. මහණෙනි, එව්, තොපිද උදය කාලයේ ආහාරයම වළඳව්. මහණෙනි, තොපිද උදය කාලයේ ආහාරයම වළඳන්නාහු ආබාධ නැති බවද, නිදුක් බවද, ශරීර සැහැල්ලු බවද, කාය බලයද, ශරීර සැප විහරණයද ලබව්" යයි වදාළහ.

3. මෙසේ වදාළ කළ, ආයුෂ්මත් භද්දාලි නම් භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, මම පෙරවරු (පමණක්) ආහාර වළඳීමට නොහැකිවෙමි. ස්වාමීනි, පෙරවරු (පමණක්) ආහාර වළඳන්නාවූ මට (ජීවත් විය හැකිදැයි) සැකයක් වන්නේය, කණගාටුවක් වන්නේය."

"භද්දාලිය, එසේ නම් ඔබ යම් තැනෙක ආරාධනා කරන ලද්දේ වන්නෙහිද, එහිදී කොටසක් අනුභවකොට, කොටසක් ගෙණ ගොස් වළඳව, එසේ වළඳන ඔබ යැපෙන්නෙහිය."

"ස්වාමීනි, මම එසේද වළඳන්ට නොහැකි වෙමි. ස්වාමීනි, එසේද වළඳන්නාවූ මට (ජීවත්විය හැකිදැයි) සැකයක් වන්නේය. කණගාටුවක් වන්නේය." ඉක්බිති ආයුෂ්මත් භද්දාලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේ විසින් (විකාල භොජනය) ශික්ෂාපදය පනවනු කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන්වනු ලබන කල්හි (එය රැකීමට) නොහැකි බව පළ කළේය. ඉක්බිති ශාස්තෲ ශාසනයෙහි ශික්ෂාව නොපුරන්නෙක් යම්සේද එමෙන් ආයුෂ්මත් භද්දාලි භික්ෂුව තෙමසක් මුළුල්ලෙහි භාග්‍යවතුන් වහන්සේ හමුවීමට නොපැමිණියේය.

4. ඒ කාලයෙහි බොහෝ භික්ෂූහු සිවුරෙහි කටයුතු නිමවූ පසු තෙමසකින් භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි වඩිතියි භාග්‍යවතුන් වහන්සේගේ සිවුරක් මසත්.

ඉක්බිති ආයුෂ්මත් භද්දාලි භික්ෂුව, ඒ භික්ෂූහු යම් තැනකද එහි ගියේය. එහි ගොස් ඒ භික්ෂූන් සමග සතුටුවිය. සතුටු විය

යුතු සිහි කළ යුතු කථාව කොට එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් භද්දාලි භික්ෂුවට ඒ භික්ෂූහු මේ කාරණය කීවාහුය. "සිවුරෙහි කටයුතු නිමවූ පසු තුන් මාසයකින් භාග්‍යවතුන් වහන්සේ චාරිකාවෙහි වඩින හෙයින් භාග්‍යවතුන් වහන්සේගේ සිවුරක් මසනු ලැබේ. (කියායි.)

"ආයුෂ්මත් භද්දාලිය, එබැවින් ඒ අපරාධය (-වරද ශික්ෂා පදය පැනවීමෙදී නොපිළිගැනීම) හොඳින් සිහිකරව ඔබට පසුව දුෂ්කරයක් නොවේවා"යි (කීහ.)

**5.** ආයුෂ්මත් භද්දාලි භික්ෂුව, "එසේය ඇවැත්නි"යි ඒ භික්ෂූන්ට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. (එහි) පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් භද්දාලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය. "ස්වාමීනි, යම් බඳුවූ මම භාග්‍යවතුන්වහන්සේ විසින් ශික්ෂාපදය පනවන කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන්වන කල්හි, අනුත්සාහය පළ කෙළෙම්ද, (ඒ) වරද බාලයකුසේ, මුළාවූවකුසේ, අව්‍යක්තයකුසේ, මා ඉක්ම පැවැත්තේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ වරද නැවත නොකරනු පිණිස මාගේ වරද වරද වශයෙන් පිළිගන්නා සේක්වා" කියායි

**6.** "භද්දාලිය, මා විසින් ශික්ෂාපදය පණවනු ලබන කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි යම් බඳුවූ ඔබ අනුත්සාහය පළ කළෙහිද එබැවින් බාලයකුසේ, මුළාවූවකුසේ, අව්‍යක්තයකුසේ, ඔබ වරද ඉක්ම පැවැත්තෙහිය. භද්දාලිය, ඔබ විසින් කාලයද දැන නොගන්නා ලද්දේය, භාග්‍යවතුන් වහන්සේද සැවැත්නුවර වසති, භද්දාලි භික්ෂුව ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාවන් නොපුරන්නෙකැ'යි භාග්‍යවතුන් වහන්සේද මා දැනගන්නාහයි යන මේ කාලය (වේලාව) භද්දාලිය, ඔබ විසින් දැනනොගන්නා ලද්දේය.

"භද්දාලිය, ඔබ විසින් කාලයද දැනනොගන්නා ලද්දේය. බොහෝ භික්ෂූහු සැවැත්නුවර වස් වැසුවාහුය, භද්දාලිය භික්ෂුව

ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාවන් නොපුරන්නෙකැයි ඒ භික්ෂූහුද භද්දාලි නම් භික්ෂුව ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව නොපුරන්නෙකැයි මා දැනගනිත් යන මේ කාලයද ඔබ විසින් දැන නොගන්නා ලද්දේය.

"භද්දාලිය, ඔබ විසින් කාලයද දැනනොගන්නා ලද්දේය, බොහෝ භික්ෂුණීහුද සැවැත්නුවර වස් එළඹියාහුය, භද්දාලි නම් භික්ෂුව ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව නොපුරන්නෙකැ'යි ඒ භික්ෂුණීහුද මා දැනගන්නාහ යන මේ කාලය භද්දාලිය, ඔබ විසින් දැනනොගන්නා ලද්දේය.

"භද්දාලිය, ඔබ විසින් කාලයද දැනනොගන්නා ලද්දේය, බොහෝ උපාසකයෝ සැවැත්නුවර වෙසෙත්. භද්දාලි භික්ෂුව ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාවන් නොපුරන්නෙකැ'යි ඔව්හුද මා දැනගන්නාහුය යන මේ කාලය, භද්දාලිය, ඔබ විසින් දැන නොගන්නා ලද්දේය.

"භද්දාලිය, ඔබ විසින් කාලයද දැනනොගන්නා ලද්දේය, බොහෝ උපාසිකාවෝ සැවැත්නුවර වෙසෙත්. භද්දාලි නම් භික්ෂුව ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාවන් නොපුරන්නෙකැ'යි ඒ උපාසිකාවෝද මා දැනගන්නාහ යන මේ කාලය භද්දාලිය, ඔබ විසින් දැන නොගන්නා ලද්දේය.

"භද්දාලිය, ඔබ විසින් කාලයද දැනනොගන්නා ලද්දේය, නොයෙක් අන්‍ය තීර්ථක මහණ බමුණෝ සැවැත්නුවර වස් එළඹියාහුය. භද්දාලි නම් භික්ෂුව ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවක තෙරුන් අතරෙන් කෙනෙක්වද ශාස්තෘන් වහන්සේගේ ශාසනයෙහි ශික්ෂාවන් නොපුරන්නෙකැ'යි ඔවුහුද මා දැනගන්නාහ යන මේ කාලය භද්දාලිය, ඔබ විසින් දැන නොගන්නා ලද්දේය."

7. "ස්වාමීනි, යම්බඳුවූ මම භාග්‍යවතුන් වහන්සේ විසින් ශික්ෂාපදය පනවන කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි අනුත්සාහය පළ කෙළෙම්ද (ඒ) වරද බාලයකුසේ,

මුළාවූවකුසේ, අව්‍යක්තයකුසේ, මා ඉක්ම පැවැත්තේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ වරද නැවත නොකරණු පිණිස මාගේ වරද වරද වශයෙන් පිළිගන්නා සේක්වා."

"භද්දාලිය, මා විසින් ශික්ෂාපදය පනවනු ලබන කල්හි භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි යම්බඳුවූ ඔබ අනුත්සාහය පළ කෙළෙහිද එබැවින් බාලයකුසේ මුළාවූවකු සේ, අව්‍යක්තයකුසේ ඔබ වරද ඉක්ම පැවැත්තෙහිය.

"භද්දාලිය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ ශාසනයෙහි (චිත්ත, පඤ්ඤා යන) දෙපසින් මිදුනු හෙයින් උභතොභාග විමුත්තවූ භික්ෂුවක් වේද, මම ඒ භික්ෂුවට 'භික්ෂුව, ඔබ මාවෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව (එසේ) සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

8. "භද්දාලිය, ඒ කුමකැයි සිතන්නෙහිද? මේ ශාසනයෙහි පඤ්ඤාවිමුක්ත භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'මහණ, ඔබ මාවෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

"භද්දාලිය, ඒ කුමකැයි සිතන්නේද? මේ ශාසනයෙහි කායසක්ඛි භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'මහණ, ඔබ මා වෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

**9.** "භද්දාලිය, ඒ කුමකැයි සිතන්නේද? මේ ශාසනයෙහි දිට්ඨිප්පත්ත භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'මහණ, ඔබ

මා වෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

"භද්දාලිය, ඒ කුමකැයි සිතන්නේද? මේ ශාසනයෙහි සද්ධාවිමුත්ත භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'මහණ, ඔබ මා වෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

10. "භද්දාලිය, ඒ කුමකැයි සිතන්නේද? මේ ශාසනයෙහි ධම්මානුසාරී භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'මහණ, ඔබ මා වෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේය."

"භද්දාලිය, ඒ කුමකැයි සිතන්නේද? මේ ශාසනයෙහි සද්ධානුසාරී භික්ෂුවක් වන්නේද, මම ඒ භික්ෂුවට 'භික්ෂුව, ඔබ මා වෙත එව, මේ මඩෙහි සක්මන් කරවයි කියන්නෙම් නම්, ඉදින් ඒ භික්ෂුව (එසේ) සක්මන් කරන්නේද, අන් දෙසකට හැරී යන්නේද, නොහැකියයි කියන්නේද?" "ස්වාමීනි, එසේ නොවන්නේය."

"භද්දාලිය, ඒ කුමකැයි සිතන්නෙහිද? භද්දාලිය, ඉදින් ඔබ ඒ කාලයෙහි උභතොභාග විමුත්තයෙක් හෝ, පඤ්ඤා විමුත්තයෙක් හෝ, කායසක්ඛී වූවෙක් හෝ, දිට්ඨප්පත්තයෙක් හෝ, සද්ධාවිමුත්තයෙක් හෝ, ධම්මානුසාරී වූවෙක් හෝ, සද්ධානුසාරී වූවෙක් හෝ වූයෙහිද, "එසේ නො වූයේය.' භද්දාලිය, එකල්හි ඔබ හිස්වූයෙක් නොවේද? බැහැර කරන

ලද්දෙක් නොවේද, වරද කරන ලද්දෙක් නොවේද?" "එසේය, ස්වාමීනි. ස්වාමීනි, යම් බඳු මම භාග්‍යවතුන් වහන්සේ ශික්ෂාපදය පනවන කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි අනුත්සාහය පළ කෙළෙම්ද, බාලයකුසේ මුළාවූවකුසේ, අදක්ෂයකුසේ වරද මා ඉක්ම පැවැත්තේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ඒ මාගේ වරද වරද වශයෙන් නැවත සංවරය පිණිස පිළිගන්නාසේක්වා."

11. "භද්දාලිය, යම්බඳු ඔබ මා විසින් ශික්ෂාපදය පනවන කල්හි, භික්ෂු සංඝයා ශික්ෂාපදය සමාදන් වන කල්හි, අනුත්සාහය පළකෙළෙහිද, එබැවින් ඔබ බාලයෙකුසේ මුළාවූවකුසේ, අදක්ෂයකුසේ වරද ඉක්මවා ගියේය. භද්දාලිය, ඔබ වරද වරද වශයෙන් දැන ධර්මයවූ පරිදි පිළියම් කෙරෙහිද, ඔබගේ ඒ වරද අපි පිළිගණිමු. භද්දාලිය, යමෙක් වරද වරද වශයෙන් දැක ධර්මයවූ පරිදි පිළියම් කරයිද, නැවත සංවරයට පැමිණේද, එය ආර්‍ය්‍යවිනයයි කියනලද මේ ශාසනයෙහි දියුණුවවේ.

"භද්දාලිය, මේ ශාස්තෘ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ශික්ෂාපදයන් නොරකින්නෙක් වේද, ඔහුට මෙබඳු සිතක් වෙයි. 'මම මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ අර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ විශෙෂ ඥානයක් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් ඉතා යෙහෙකි. (එය ලැබීමට) ආරණ්‍යය, රුක්මූලය, කඳුරැලිය, පර්වතය, ගුහාය, සොහොන්ය, පිදුරුබිස්සය යන විවේක ඇති සෙනසුන් භාවිතය කරන්නෙම් නම් යෙහෙකි' (කියායි.)

"(ඉක්බිති) ඒ භික්ෂුව ආරණ්‍යය, රුක් මූලය, පර්වතමූලය කඳු රැලිය, පර්වත ගුහාය, සොහොනය, වනයෙහි ඉතා දුර සෙනසුනය, අභ්‍යවකාසය, පිදුරුබිස්සය යන විවේක ඇති සෙනසුන් භාවිතය කරයි. එසේ විවේකව වසන ඒ භික්ෂුවට ශාස්තෘන් වහන්සේද දොස් කියයි, එකට වසන නුවණැති සමාන බඹසර ඇති භික්ෂූහුද, කාරණය දැන දොස් කියත්. දේවතාවෝද දොස් කියත්. තමාම තමාට දොස් කියයි. ඒ භික්ෂුව

ශාස්තෘන් වහන්සේ විසින්ද දොස් කියන ලද්දේ, නුවණ ඇති එකට වසන සමාන බඹසර ඇත්තවුන් විසින්ද දොස් කියන ලද්දේ දේවතාවන් විසින්ද දොස් කියන ලද්දේ, තමාවිසින්ම තමහට දොස් කියන ලද්දේ, මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්‍ය්‍ය භාවය කිරීමට සමර්ථ විශෙෂඥානයක් ප්‍රත්‍යක්ෂ නොකරයි. ඊට හේතු කවරේද? භද්දාලිය, ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ නොකරන්නාහට එය එසේම වෙයි.”

12. “භද්දාලිය, මේ ශාස්තෘ ශාසනයෙහි, ඇතැම් භික්ෂුවක් ශික්ෂාපද රකින්නෙක් වේද, ඔහුට මෙබඳු සිතක් වෙයි. ‘මම මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ ආර්‍ය්‍ය භාවය කිරීමට සමර්ථ විශෙෂඥානයක් ප්‍රත්‍යක්ෂ කරන්නෙම් නම් ඉතා යෙහෙකි. (එය ලැබීමට) ආරණ්‍යය, රුක්මූලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාවය, සොහොනය, ඉතා දුර වනය, අභ්‍යවකාශය, පිදුරු බිස්සය යන විවේක ඇති සෙනසුන් භාවිතය කරන්නෙම් නම් යෙහෙකි’ (කියායි.) ඉක්බිති ඒ භික්ෂුව ආරණ්‍යය, රුක්මුලය, පර්වතය, කඳුරැලිය, පර්වත ගුහාය, සොහොනය, වනයෙහි ඉතා දුර වනය, අභ්‍යවකාශය, පිදුරුබිස්සය යන විවේක ඇති සෙනසුන් භාවිතය කරයි. එසේ විවේකව වසන ඒ භික්ෂුවට ශාස්තෘන් වහන්සේ දොස් නොකියයි. නුවණ ඇති එකට වසන සමාන බඹසර ඇති භික්ෂූහුද දොස් නොකියත්. දේවතාවෝද දොස් නොකියත්. තමාම තමහට දොස් නොකියයි. (ඉක්බිති) ඒ භික්ෂුව ශාස්තෘන් වහන්සේ විසින්ද දොස් නොකියන ලද්දේ, නුවණ ඇති එකට වසන සමාන බඹසර ඇති භික්ෂූන් විසින්ද දොස් නොකියන ලද්දේ, දේවතාවන් විසින්ද දොස් නොකියන ලද්දේ, මා විසින්ද තමාට දොස් නොකියන ලද්දේ, මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ ආර්‍ය්‍යභාවය කිරීමට සමර්ථ විශෙෂ ඥානයක් ප්‍රත්‍යක්ෂ කරයි. ඒ භික්ෂුව කාමයන්ගෙන් වෙන්ව විතර්ක සහිත විචාර සහිත ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. එයට හේතු කවරේද, භද්දාලිය, ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

13. "නැවතද භද්දාලිය, භික්ෂු තෙම විතර්ක විචාරයන් සංසිඳවීමෙන් සිත තුළ පැහැදීම ඇති, සිතේ එකඟ බැව් ඇති අවිතර්ක අවිචාර සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇත් ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඊට හේතු කවරේද, භද්දාලිය, ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

"නැවතද, භද්දාලිය, භික්ෂු තෙම, ප්‍රීතියේ නො ඇලී උපෙක්ෂා ඇත්තෙක්ව වාසය කරයි. සිහියෙන් යුත්ත වූයේ යහපත් නුවණ ඇතිව කයින් සැපවිඳී, ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් උපෙක්ෂාව ඇත්තෙක්ව සිහි ඇත්තෙක්ව සැප විහරණය ඇත්තෙකැයි කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඊට හේතු කවරේද, භද්දාලිය, ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

"නැවතද භද්දාලිය, භික්ෂු තෙම සැපදුක් හැර පළමුවම සොම්නස් දොම්නස් දුරුකොට දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසුදු බව ඇති චතුර්ථ ධ්‍යානයට එළඹ වාසය කරයි. ඊට හේතු කවරේද? භද්දාලිය, ශාස්තෘ ශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

14. "ඒ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසුදුවූ කල්හි, කෙළෙස් නැති කල්හි, කෙලෙස් රහිත කල්හි, මොලොක්වූ කල්හි, කටයුත්තට සුදුසුව පැවති කල්හි, ස්ථිරව සිටි කල්හි, නොසැලෙන කල්හි, පෙරවිසූ කඳපිළිවෙළ දැන ගැනීමට සිත නමයි (මෙහෙයවයි.) ඒ භික්ෂුව නොයෙක් ආකාර පෙර විසූ කඳ පිළිවෙළ (උපන් ආත්ම පරම්පරාව) සිහි කරයි. කෙසේද? එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතලිසක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද නොයෙක් විනාස වෙමින් පවතින කල්පයන්ද නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, අසුවල් තැන වීම් මෙනම් ඇත්තෙම්

මේ ගොත්‍ර ඇත්තෙම් මේ පාට ඇත්තෙම් මේ කෑම ඇත්තෙම් මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන උපන්නෙමි. එහිදු මෙනම් ඇත්තෙම් මේ ගොත්‍ර ඇත්තෙම් මේ පාට ඇත්තෙම් මේ කෑම ඇත්තෙම් මේ සැප දුක් වින්දෙම් මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම් මෙහි උපන්නෙමියි. මෙසේ ආකාර උද්දෙස සහිත නොයෙක් ආකාර පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරයි. ඊට හේතු කවරේද? භද්දාලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

15. "ඒ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, හාත්පසින් පිරිසිදුවූ කල්හි, කෙලෙස් රහිත කල්හි, කෙලෙස් උවදුරු නැති කල්හි, මොලොක්වූ කල්හි, කටයුත්තට සුදුසුව පැවති කල්හි, ස්ථිරව සිටි කල්හි, නොසැලෙන කල්හි. ඒ භික්ෂුව පිරිසුදු මිනිස්බව ඉක්මවූ දිවැසින් චුතවන (මැරෙන) උපදින හීන (පහත්). ප්‍රණීත (උසස්) සුවර්ණ (හොඳ පාට ඇති) දුර්වර්ණ (නරක පාට ඇති) යහපත් ගතිවලට ගියාවූ අයහපත් ගතිවලට ගියාවූ, කර්මයට අනුව උපදින සත්වයන් දකී. මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ. වාග්දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්ත වූහ. ආයර්‍ය්‍යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූහ. වාග් සුචරිතයෙන් යුක්ත වූහ. මනො සුචරිතයෙන් යුක්ත වූහ. ආයර්‍ය්‍යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍යය අදහන්නෝ වූහ. සත්‍ය ඇදහීම් සමාදන් වූවෝ වූහ. ඔවුහු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයට පැමිණියෝයි. මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්වයන් දකී. මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිව ඇසින් චුත වන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූ නරක

ලොවට ගියාවූද කම්වූ පරිදි මියපරලොව ගිය සත්වයන් දනී, ඊට හේතු කවරේද? භද්දාලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

16. "ඒ භික්ෂුව මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි කෙලෙස් රහිත කල්හි, කෙලෙස් උවදුරු නැති කල්හි, මොලොක්වූ කල්හි, කටයුත්තට සුදුසුව පැවති කල්හි, ස්ථිරව සිටි කල්හි නොසැලෙන කල්හි, ආශ්‍රවයන් ක්ෂය කරන නුවණ පිණිස සිත නමයි (යොමුකරයි). ඒ භික්ෂුව මේ දුකයයි ඇති සැටියෙන් දනී. මේ දුක් ඉපදීමේ හේතුවයයි ඇති සැටියෙන් දනී. මේ දුක් නැතිකිරීමයයි ඇති සැටියෙන් දනී. මේ දුක් නැති කිරීමේ මාර්ගයයි ඇති සැටියෙන් දනී. මේ ආශ්‍රවයයි තතුලෙස දනී. මේ ආශ්‍රවයන්ගේ හේතුවයයි තතු ලෙස දනී. මේ ඒ ආශ්‍රවයන් නැති කිරීමයයි තතු ලෙස දැනගනී. මේ ආශ්‍රවයන් නැති කිරීමට පමුණුවන පිළිවෙතයයි තතුලෙස දනී. මෙසේ දන්නාවූ ඒ භික්ෂුවගේ සිත කාමාසාවයෙන් (කාමයේ ඇල්මෙන්) ද වෙන් වෙයි. භව (භවයේ ඇල්මෙන්) ආසාවයෙන්ද වෙන්වෙයි අවිජ්ජාසවයෙන් (මෝහයෙන්) ද වෙන්වෙයි. සිත ඔවුන්ගෙන් වෙන්ව ගිය කල (ඔවුන්ගෙන්) වෙනස්විය යන දැනීම ඇති වෙයි. (එවිට) ඉපදීම නැතිකරණ ලද්දීවෙයි. බඹසර (ශ්‍රේෂ්ඨ හැසිරීමෙහි) වාසය කිරීම අවසන් කරණ ලද්දී වෙයි. කටයුත්ත කරණ ලද්දේ වෙයි. මේ ආත්ම භාවයෙන් පසු නැවත ඉපදීමක් නැතැයි දැන ගණී. ඊට හේතු කවරේද? භද්දාලිය, ශාස්තෘශාසනයෙහි ශික්ෂාව සම්පූර්ණ කරන්නාහට එය එසේම වෙයි.

17. "මෙසේ කී කල්හි ආයුෂ්මත් භද්දාලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීය. "ස්වාමීනි, යම් හෙයකින් මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් සුළු වරදෙහිද නිග්‍රහ කොට හික්මවත්. ඊට හේතු කවරහුද? එයට ප්‍රත්‍යය (කරුණු) මොනවාද? ස්වාමීනි, යම් හෙයකින් මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් නැවත නැවත අවවාද කොට නොහික්ම වත්. ඊට හේතුකවරහුද?

එයට ප්‍රත්‍යය (කරුණු) මොනවාද?' "භද්දාලිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් නිතර ඇවැත්වලට පැමිණෙන්නෙක් වෙයි. ඇවැත් බහුල වූවෙක් වෙයි. භික්ෂූන් විසින් අවවාද කරන ලද්දාවූ ඒ භික්ෂුව අන් කරුණකින් ඒ කාරණය වසාදමයි. කථාව අන් අතකට හරවයි. කෝපය, ද්වෙෂය, නොසතුට ඇති කරයි. මනා කොට නො පවතී. මනා පැවැත්මට අනුව නො පවතී. ඉක්මණින් ඇවතෙන් නැගී සිටීමට කැමති ඇත්තෙක් නොවෙයි. යමකින් සංඝයා සතුටු වෙයිද, එය නොකරම්යි කියයි. භද්දාලිය, එකල්හි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. 'ඇවැත්නි, මේ භික්ෂුව නිතර ඇවැත්වලට පැමිණෙන්නෙක, ඇවැත් බහුල වූවෙක, භික්ෂූන් විසින් අවවාද කරන ලද්දාවූ ඒ භික්ෂුව අන් කරුණකින් ඒ කාරණය වසාදමයි. කථාව අන් අතකට හරවයි. කෝපයද, ද්වෙෂයද, නොසතුටද, ඇතිකරයි. මනාකොට නොපවතී. මනාපැවැත්මට අනුව නොපවතී. ඉක්මණින් ඇවතින් නැගී සිටීමට කැමති ඇත්තෙක් නොවෙයි. යමකින් සංඝයා සතුටු වෙයිද, එය කරම්යි නොකියයි. ඇවැත්නි, මේ භික්ෂුවගේ මේ අධිකරණය (නඩුව) යමසේ වහා නොසංසිඳේද එසේ ඒ ඒ ආකාරයෙන් කල් දම දමා විනිශ්චය කිරීම යෙහෙකැයි සිතා, භද්දාලිය, භික්ෂූහු යම්සේ ඒ භික්ෂුවගේ මේ අධිකරණය වහා නොසංසිඳේද ඒ ඒ ආකාරයෙන් කල් දම දමා විනිශ්චය කරත්.

18. "භද්දාලිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් නිතර ඇවැත්වලට පැමිණෙන්නේ වෙයිද, ඇවැත් බහුල වූවෙක් වෙයිද, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරන ලද්දේ අන් කරුණකින් කරුණ වසා නොදමයිද, කථාව අන් අතකට නොහරවයිද, කෝපය, ද්වෙෂය, නොසතුට ඇති නොකරයිද මනාකොට පවතීද, මනා පැවතුමට අනුව පවතියිද, ඉක්මණින් ඇවතින් නැගී සිටීමට කැමති වෙයිද, යමකින් සංඝයා සතුටු වෙයිද එයකරම්යි කියයිද, භද්දාලිය, එකල්හි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. 'ඇවැත්නි, මේ භික්ෂුව නිතර ඇවැත්වලට පැමිණෙන්නෙක, ඇවැත් බහුල වූවෙක, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරන ලද්දේ අන් කරුණකින් කරුණ වසා

නොදමයි. කථාව අන් අතකට නොහරවයි. කෝපයද, ද්වෙෂයද, නොසතුටද, ඇති නොකරයි. මනාකොට පවතී. මනා පැවතුමට අනුව පවතී. ඉක්මණින් ඇවැතින් නැගී සිටීමට කැමති වෙයි. යමකින් සංඝයා සතුටු වෙයිද, එය කරමියි කියයි. ඇවැත්නි, මේ භික්ෂුවගේ මේ අධිකරණය (නඩුව) යම් සේ වහා සංසිඳේද ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කිරීම යහපත්යයි සිතා, (ඉක්බිති) භද්දාලිය, භික්ෂූහු යම් සේ ඒ භික්ෂුවගේ මේ අධිකරණය වහා සංසිඳේද ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කරත්.

**19.** "භද්දාලිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් වරින්වර ඇවැත්වලට පැමිණෙන්නේ වෙයිද, ඇවැත් බහුලකොට ඇත්තේ නොවෙයිද, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරන ලද්දේ අන් කරුණකින් කරුණ වසා දමයිද. කථාව අන් අතකට හරවයිද කෝපය, ද්වෙෂය, නොසතුට ඇති කරයිද, මනාකොට නොපවතීද, මනා පැවැත්මට අනුව නොපවතීද, ඉක්මණින් ඇවැතින් නැගී සිටීමට කැමති නොවෙයිද. යමකින් සංඝයා සතුටු වෙයිද, එය කරමියි නොකියයිද, භද්දාලිය, එහි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. 'ඇවැත්නි, මේ භික්ෂුව වරින්වර ඇවැත්වලට පැමිණෙන්නෙක, ඇවැත් බහුල නොවූවෙක, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරන ලද්දේ අන් කරුණකින් කරුණ වසාදමයි, කථාව අන් අතකට හරවයි. කෝපයද, ද්වෙෂයද, නොසතුටද ඇතිකරයි. මනාකොට නොපවතියි. මනාපැවැත්මට අනුව නොපවතියි. ඉක්මණින් ඇවැතින් නැගී සිටීමට කැමැති නොවෙයි. යමකින් සංඝයා සතුටු වෙයිද, එය කරමියි නොකියයි. ඇවැත්නි, මේ භික්ෂුවගේ මේ අධිකරණය යම් සේ වහා නොසංසිඳේද, ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කිරීම යෙහෙක කියායි. (ඉක්බිති) භද්දාලිය, භික්ෂූහු යම් සේ ඒ භික්ෂුවගේ මේ අධිකරණය වහා නොසංසිඳේද, ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කරත්.

**20.** "භද්දාලිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් වරින් වර ඇවැත්වලට පැමිණෙන්නේ වෙයිද, ඇවැත් බහුලකොට

ඇත්තේ නොවෙයිද, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරන ලද්දේ අන් කරුණකින් කරුණ වසා නොදමයිද, කථාව අන් අතකට නොහරවයිද, කෝපය, ද්වෙෂය, නොසතුට ඇති නොකරයිද මනාකොට පවතීද, මනා පැවතුමට අනුව පවතීද, ඉක්මණින් ඇවතින් නැඟී සිටීමට කැමති වෙයිද, යමකින් සංඝයා සතුටු වෙයිද, එය කරමියි කියයිද, භද්දාලිය, එහි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. ඇවැත්නි, මේ භික්ෂුව වරින් වර ඇවැත්වලට පැමිණෙන්නෙක. ඇවැත් බහුල නොවූවෙක, ඒ භික්ෂුව භික්ෂූන් විසින් අවවාද කරනලද්දේ අන් කරුණකින් වසා නොදමයි. පිටතින් කථාවක් ඉදිරිපත් නොකරයි. කෝපයද, ද්වෙෂයද, නොසතුටද ඇතිනොකරයි. මනාකොට පවතියි. මනා පැවතුමට අනුව පවතියි. ඉක්මණින් ඇවතින් නැඟීසිටීම කැමති වෙයි. යමකින් සංඝයා සතුටු වෙයිද එය කරමියි කියයි. ඇවැත්නි, මේ භික්ෂුවගේ මේ අධිකරණය යම්සේ වහා සංසිඳේද, ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කිරීම යෙහෙක කියායි, (ඉක්බිති) භද්දාලිය, භික්ෂූහු යම්සේ ඒ භික්ෂුවගේ මේ අධිකරණය වහා සංසිඳේද ඒ ඒ ආකාරයෙන් විනිශ්චය කරත්.

21. "භද්දාලිය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක් ආචාර්ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි ඇති සුලු භක්තියකින් සුලු ආදරයකින් මහණ කම් කරයිද, භද්දාලිය, එහි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. ඇවැත්නි, මේ භික්ෂුතෙම ආචාර්ය්‍ය උපාධ්‍යායයන් කෙරෙහි ඇති සුලු භක්තියකින් සුලු ආදරයකින් මහණකම කරයි. භක්ති මාත්‍රයෙන් ප්‍රෙම මාත්‍රයෙන් මහණකම කරයි (කියායි.)

22. "භද්දාලිය, යම්සේ පුරුෂයෙකුගේ එක් ඇසක්වේද, ඔහුගේ මිත්‍රයන් හා එක ලේ ඇති නෑයෝ ඔහුගේ යම් ඒ ඇසක් වීද එයින්ද නොපිරිහෙවයි. ඒ එක ඇස රක්නාහුද, භද්දාලිය, එමෙන්ම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂූවක් භක්ති මාත්‍රයකින් හා ප්‍රේම මාත්‍රයකින් මහණකම් කරයි. භද්දාලිය, එහි භික්ෂූන්ට මෙබඳු සිතක් වෙයි. ඇවැත්නි, මේ භික්ෂුව භක්ති

මාත්‍රයකින් හා ප්‍රේමමාත්‍රයකින් මහණකම් කරයි. ඒ භික්ෂුවගේ යම් භක්තිමාත්‍රයක් ප්‍රේමමාත්‍රයක් වී ද එයින්ද නොපිරිහෙවයි. නැවත නැවත අවවාද කරන්නෙමු (කියායි.) භද්දාලිය, යම් හෙයකින් මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට නැවත නැවත අවවාද කරයි නම් මේ ඊට හේතුවවේ. මේ ප්‍රත්‍යයවේ. භද්දාලිය, යම් හෙයකින් මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවකට එසේ නැවත නැවත අවවාද නොකරත් නම් මේ ඊට හේතුවයි. මේ ප්‍රත්‍යයයි.

22. "ස්වාමීනි, යම් හෙයකින් පෙර ශික්ෂාපද ස්වල්පයක් වූහ. බොහෝ භික්ෂූහු රහත්වූහ. ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද? දැන් ශික්ෂාපද බොහෝ වෙත්. භික්ෂූන් ටිකදෙනෙක් රහත් වෙත්. ඊට හේතු කවරේද? ප්‍රත්‍යය කවරේද?"

"භද්දාලිය, එය එසේ වෙයි සත්වයන් ධර්මයෙන් පිරිහෙන කල්හි, ප්‍රතිපත්තිය පිරිහෙන කල්හි, ශික්ෂාපද බොහෝ වෙත්. භික්ෂූහු ස්වල්ප දෙනෙක් රහත් වෙත්. භද්දාලිය, මේ ශාසනයෙහි සංඝයා කෙරෙහි ආශ්‍රවයන්ට හෙතුවූ ඇතැම් කරුණු පහළ නොවෙත්ද, ඒතාක් ශාස්තෲන් වහන්සේ ශ්‍රවකයන්ට ශික්ෂාපද නොපනවත්, භද්දාලිය, යම් දිනක පටන් සංඝයා කෙරෙහි ආශ්‍රවයන්ට හෙතුවූ කරුණු ඇති වෙත්ද, ශාස්තෲන් වහන්සේ ඒ වැරදි නැති කරණු පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්.

"භද්දාලිය, මේ ශාසනයෙහි සංඝයා යම්තාක් බොහෝ බවට නොපැමිණියේද, ඒතාක් සංඝයා අතර වැරදි පහළ නොවෙත්. භද්දාලිය, යම් දිනෙක පටන් සංඝයා බොහෝ බවට පැමිණියේද, ඉක්බිති මේ ශාසනයෙහි ඇතැම් වැරදි ඇති වෙත්. ඉක්බිති ශාස්තෲන් වහන්සේ ඒ වැරදි නැති කරණු පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්.

"භද්දාලිය, යම්තාක් සංඝයා ලාභයෙන් අගතැන් නො පැමිණේද එතාක් මේ ශාසනයෙහි සංඝයා අතර වැරදි ඇති නොවෙත්. භද්දාලිය, යම් දිනෙක පටන් සංඝයා ලාභයෙන්

අග්‍ර වේද, එකල්හි මේ ශාසනයෙහි සංඝයා අතර ඇතැම් වැරදි ඇති වෙත්. එකල්හි ශාස්තෲන් වහන්සේ ඒ දොෂයන් නැති කිරීම පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පණවත්.

"භද්දාලිය මේ ශාසනයෙහි සංඝයා යම්තාක් යසසින් අග්‍ර බවට නොපැමිණේද ඒතාක් සංඝයා අතර වැරදි පහළ නොවෙත්. භද්දාලිය, යම් දිනක පටන් සංඝයා යසසින් අග්‍ර බවට පැමිණේද, එකල්හි මේ ශාසනයෙහි සංඝයා අතර ඇතැම් වැරදි ඇති වෙත්. එකල්හි ශාස්තෲන් වහන්සේ ඒ දොෂයන් නැති කිරීම පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්.

"භද්දාලිය, මේ ශාසනයෙහි සංඝයා යම් තාක් බොහෝ දැන ඉගෙනගත් බවට නොපැමිණේද, ඒ තාක් සංඝයා අතර වැරදි පහළ නොවෙත්. භද්දාලිය, යම් දිනක පටන් සංඝයා දැන ඉගෙනගත් බවට පැමිණේද, එකල්හි මේ ශාසනයෙහි සංඝයා අතර වැරදි පහළ වෙත්. එකල්හි ශාස්තෲන් වහන්සේ ඒ දොෂයන් නැතිකිරීම පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්.

"භද්දාලිය, මේ ශාසනයෙහි සංඝයා යම්තාක් කල් ගිය බවට නොපැමිණේද එතාක් සංඝයා අතර වැරදි පහළ නොවෙත්.

"භද්දාලිය, යම් දිනෙක පටන් සංඝයා කල්ගිය බවට පැමිණේද, එකල්හි මේ ශාසනයෙහි සංඝයා අතර ඇතැම් වැරදි ඇතිවෙත්. ඉක්බිති ශාස්තෲන් වහන්සේ ඒ වැරදි නැති කරුණු පිණිස ශ්‍රාවකයන්ට ශික්ෂාපද පනවත්.

24. "භද්දාලිය, යම් දිනෙක මම තොපට අජානීය අශ්වයාගේ උපමාව දේශනා කෙළෙම්ද ඒ කාලයෙහි තොපි ස්වල්පදෙනෙක්වූහ. භද්දාලිය එය ඔබට මතක ඇත්තෙහිද?" "නැත. ස්වාමීනි" "භද්දාලිය, එය කුමක් නිසාදැයි සිතන්නෙහිද?"

"ස්වාමීනි, ඒ මම ශාස්තෘ ශාසනයෙහි බොහෝ කාලයක් ශික්ෂාපද නොපුරන්නෙක් වීම්ද?" (ඒ නිසායයි සිතමි) "භද්දාලිය,

එයම හේතුව නොවේ. එයම ප්‍රත්‍යය (කරුණු) නොවේ. තවද භද්දාලිය, මේ හිස් පුරුෂ තෙම මා ධර්මය දෙශන කල්හි අර්ථයෙන් යුක්ත කොට සිතෙහි තබා ගෙන සියල්ල සිතට ඇතුලත් කරගෙන කන් යොමා බණ නොඅසා යයි ඔබගේ සිත මගේ සිතින් පිරිසිඳ දැන ගන්නා ලද්දේය. භද්දාලිය, නැවතත් අජානීය අශ්වයා උපමාකළ ධර්ම ක්‍රමය ඔබට දෙසමි. එය අසව. මනා කොට මෙනෙහි කරව. මම කියන්නෙමි." "එසේය, වහන්සැ'යි ආයුෂ්මත් භද්දාලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

**25.** "භද්දාලිය, යම්සේ දක්ෂ අශ්වයන් දමනය කරන්නෙක් යහපත් ආජානීය අශ්වයකු ලැබ පළමු කොට කටකලියාව දැමීමේ හික්මවීම කරයි. ඒ කටකලියාව දැමීමෙන් හික්මවනු ලබන අශ්වයාගේ පෙර නොකරනු ලැබූ දෙයක් කරන කල්හි යම් යම් දැගලුම් නොහික්මුම් ඇතිවෙත්. හික්මවීම නිසා ඒ කාරණයෙන් හික්මෙන්නේය.

"භද්දාලිය, යම් හෙයකින් යහපත් ආජානීය අශ්වතෙම නිතර හික්මවීමෙන් පිළිවෙළින් හික්මවීමෙන් ඒ කාරණයෙන් හික්මුණේ වේද අශ්වයන් දමනය කරන්නා ඒ අශ්වයා නැවත යුගය (-වියකර) තැබීමෙහි හික්මවයි, ඒ විය කර තැබීම පුරුදු කරන කල්හිද, පෙර නොකරන ලද දෙයක් කරවනු ලබන අශ්වයාගේ යම් යම් දැගලුම් නොහික්මුම් ඇතිවෙත් . ඒ අශ්වයා නිතර කිරීමෙන් පිළිවෙළින් කිරීමෙන් එහිද හික්මෙන්නේය.

"භද්දාලිය, යම් හෙයකින් යහපත් ආජානීය අශ්වතෙම නිතර කිරීමෙන්, පිළිවෙළින් කිරීමෙන් එහි හික්මුණේ වෙයිද, අශ්වයන් දමනය කරන්නා ඒ අශ්වයා නැවත සිවුපා එකට ඔසවා තැබීමෙහිද, (බිම වැටුනු දෙයක් ගත හැකිසේ) නැමීමෙහිද, බුර අගින් යාමෙහිද, සීඝ්‍ර ධාවනයෙහිද, (යුදයෙහි ඇතිවන) ශබ්දයන්ට බිය නොවීමෙහිද, රජු විසින් දතයුතු ගුණයෙහිද, අශ්වරාජ වංශයෙහිද, ජවසම්පත්තියෙන් (-ශ්‍රේෂ්ඨ වේගයෙහි)

ශ්‍රෙෂ්ඨ අශ්වයෙක් වීමෙහිද, මෘදු වචනයට කීකරු වීමෙහිද, (යන කරුණු දසය) පුරුදු කරවයි. ජවසම්පත්තියෙහි හික්මවීමෙහිද ශ්‍රෙෂ්ඨ අශ්වයෙක් කිරීමෙහිද, මෘදු වචනයට කීකරු කිරීමෙහිද පෙර නොකළ දෙයක් කරන අශ්වයාටද යම් යම් දැගලීම් නොහික්මීම ඇතිවෙත්මය. ඒ අශ්වයා නිතර කිරීමෙන් පිළිවෙළින් කිරීමෙන් එහි නික්මෙන්නේය, භද්දාලිය යම්හෙයකින් අශ්වතෙමේ නිතර කිරීමෙන් පිළිවෙළින් කිරීමෙන් අශ්වයා හික්මුනේවෙයිද අසුන් දමනය කරන්නා නැවත ඒ අශ්වයා තැලීම විදීම ආදී අශ්ව දමන කර්ම විශෙෂයන්ට ඇතුල් කරයි. (-යොදවයි) භද්දාලිය, මේ දශ අංගයන් ගෙන් යුත් යහපත් ආජානීය අශ්වයා රජුන්ට සුදුසු වේ රජු විසින් පරිභොග කළ යුතුවේ. රජුගේ අංගය යන සංඛ්‍යාවට ඇතුළත් වෙයි.

**26.** "භද්දාලිය, එමෙන්ම දසවිධ ධර්මයන්ගෙන් යුත් භික්ෂුව ආහුනෙය්‍ය (-දුරසිට ඇවිත් පිදියයුතු) වෙයි, පාහුණෙය්‍ය (-අභිනව දෙයින් පිදියයුතු) වෙයි, දක්ඛිණෙය්‍ය (-පින් කැමතිව පිදියයුතු) වෙයි, වැඳියයුතු වෙයි, ලෝකයාට උතුම් පිංකෙත වෙයි, කවර දසයකින්ද, භද්දාලිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම අසෙඛ (-හික්මී අවසානවූ) සම්මාදිට්ඨියෙන් (-යහපත් දැකීමෙන්) යුතු වෙයි, අසෙඛ සම්මාසංකප්පයෙන් (-යහපත් කල්පනාවෙන්) යුතු වෙයි, අසෙඛ සම්මාවාචායෙන් (-යහපත් වචනයෙන්) යුතුවෙයි. අසෙඛ සම්මාකම්මන්තයෙන් (-යහපත් කර්මාන්තයෙන්) යුතුවෙයි. අසෙඛ සම්මා ආජීවයෙන් (-යහපත් දිවි පැවැත්මෙන්) යුතුවෙයි අසෙඛ සම්මාවායාමයෙන් (-යහපත් උත්සාහයෙන්) යුතුවෙයි. අසෙඛ සම්මාසතියෙන් (යහපත් සිහියෙන්) යුතුවෙයි. අසෙඛ සම්මාසාමධියෙන් (-යහපත් සිත එකඟ කිරීමෙන්) යුතුවෙයි අසෙඛ සම්මාඤාණයෙන් යුතු වෙයි, අසෙඛ සම්මාවිමුත්තියෙන් යුතුවෙයි. භද්දාලිය මේ දසවිධ ධර්මයන්ගෙන් යුත් භික්ෂුව ආහුණෙය්‍ය (-දුරසිට ඇවිත් පිදියයුතු) වෙයි, පාහුණෙය්‍ය (-අභිනව දෙයින් පිදියයුතු) වෙයි,

දක්ඛිණෙය්‍ය (පින් කැමතිව පිදියයුතු) වෙයි, වැඳියයුතු වෙයි, ලොවට උතුම් පින් කෙත වෙයි.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දෙසූ සේක සතුටු සිත් ඇති ආයුෂ්මත් භද්දාලි භික්ෂුව භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු විය.

**පස්වෙනිවූ භද්දාලි සූත්‍රය නිමි. (2-5)**